සුජීව ප්‍රසන්න ආරච්චි

# ඡායා

1 සහ 2



WWW.EXPRESSLANKA.TK 1

# 1

වායා ළිඳ ළඟින් එද්දී පාන්දර අහසේ ලා රත්තරන් පැහැගත් ඡායාව යංතමින් දිස්ව වැටී තිබුණි. ඇය එදෙස බලා දෙතුන් විටක්ම සිනාසුනාය. පාන්දර නැවේ කාලෙකිනි. ඒ නිසා වායා උන්නේ ගැහී ගැහීය. දිය රෙද්දේ තෙත පිපුන ළැමට වඩා වඩාත් තදට දැනුණි. වායා රෝස පැහැගත් තුවාය පපුවටත් ගෙළටත් උත්ඩි කරගෙන පඩිය නැඟ උඩට ආවාය. කොණ්ඩයෙන් එන මෘදු සබන් සුවඳ ඇගේ හිතට නැවුම් හැඟීමක් ගෙන ආවේය. නිසා හිතට දැනෙන නැවුම් පිවිතුරු හැඟීමට ඇය කවදත් ආශා කළාය. නාගෙන පැයක් පමණ ගතවන තුරු ඒ නැවුම් බව හදවතට දැනෙයි.

ළිඳ ළඟින් එද්දී හමුවෙන කෝපි ගස් තුන හතර ළඟදී වායාගේ දෙපා ඉබේටම නැවතුණි. කෝපි ගස් වල මල් පිරී තිබුණි. කෝපි ගස්වල එක් මලක් පමණක් කඩා වායා නැහැයට ළංකර සිපගත්තාය. මේයැයි කියා හඳුනාගත නොහැකි අමුතුම සුවඳක් කෝපි මල් වල ඇතැයි ඇය සිතුවාය.

කෝපි ගස් වල මේතරම් පිති පිරී ඇත්තේ ඊයේ පසොළොස්වක නිසා වන්නට ඇත. හඳ එළියට තෙත පිණි රැස් ලෝබකමක් නොමැතිවම

WWW.EXPRESSLANKA.TK 2

දේරේ ගලයි. චායා කරට වඩා මඳක් පහළට වැටී තිබූ කෙටි කොණ්ඩය බැඳ එය උඩින් තුවාය කවාකාරව ඔතාගත්තාය. නාගත් පසු කොණ්ඩය පුංචිවේ. යන්නට කලින් එය කෙසේ හෝ වියලාගත යුතුය. කොණ්ඩය බාගෙට වියළී ගියවිට ඇතිවන තෙත තට්ටු තට්ටු ස්වභාවයට චායා ප්‍රිය කළාය. කොණ්ඩය හැමදමත් එහෙම තියෙනවානම් කියා ඇයට සිතෙයි. එහෙත් වියළී ගිය පසු කොණ්ඩයට ඒ සුන්දර තෙත් බව නැත. ඇරත් තෙත කොණ්ඩයෙන් වැඩි වේලාවක් චායාට ඉන්නට ඉඩ ලැබෙන්නේද කලාතුරකිනි. නාගෙන කොහේ හිටියත් අම්මා තුවායක් රැගෙන පැමිණ චායාගේ කොණ්ඩය පිසදමයි.

"අම්මා තමයි මගේ කොණ්ඩේ කැත කරන්නේ.. ලස්සනට තිබ්බා.. මධූරිගේ වගේ.."

චායා සිතාසී කියන්නේ අම්මා හිස පිස දමද්දී දැනෙන ආශ්වාදයද විඳිමින්ය.

"හොඳ ලස්සන.. කොණ්ඩ ගස් වල මුල් පණුනැති වෙලා හැලෙන්න ගත්තාම තේරෙයි ස්ටයිල් එක.."

අම්මා හිස පිසද අහවර කරද්දී චායාට ලෝබ සිතෙයි. තෙත නැතත් අම්මා ඔහේ ඔළුව අතගගා ඉන්නවානම් චායා කැමතිය.

"මේ හරියේ කහනවා කහනවා වගේ අම්මේ.. උකුණෙක්ද දන්නෑ.. චූට්ටක් බලන්නකෝ.."

අම්මා චායාගේ මේ කපටිකම් දන්නීය. වෙලාවක් තිබුනොත් පැය දෙකක් වුව එක දිගට ඇය චායාගේ කොණ්ඩය පිරිමදියි.

"ඔහේ ඇති උකුණෙක් නෑ දරුවෝ.. උකුණෙක් තියා ලේඩියෙක් වත් නෑ."

"ඉන්නවා කියලා හිතලා අතගාන්නකෝ. නාලා ඔළුවේ කැක්කුමද කොහෙද.."

චායා වඩාත් සුරක්ෂිත ලෙස අම්මාගේ උකුලට බරවෙයි. තව පැයකටවත් ඇයගෙන් මිදෙන්නට තමාට බැරිබව අම්මා අත්දැකීමෙන් දන්නීය. චායාගේ හිස අතගාද්දී පද්මාගේ පපුව ඇය වෙනුවෙන් උපන් සෙනෙහසින් මොලොක් වෙයි. චායා උකුලේ දෙනෙත් පියාගෙන උන්නොත් පද්මා ඒ අහිංසක මුහුණ දෙස බලාගෙනම ඉඳියි.

WWW.EXPRESSLANKA.TK 3

මගේ කෙල්ලගේ අනාගතේ මොකක් වෙයිද... ඒ හැම විටකම ඇගේ පපුවේ ඒ ප්‍රශ්නය ගින්දරක් මෙන් දැවෙයි. පපුවේ කොනකින් පටන් ගන්නා ඒ ගින්දර මුළු නහර වැල් පුරාම දුවන්නට ගතවන්නේ කුඩා කාලයකි. හේතුවක් නැතුවම පද්මාගේ දෙනෙත් මේ හැම විටකම තෙත්වෙයි.

"අම්මේ.. අම්මා අඬනවා නේද.."

හිටිවනම අම්මාගේ හීල්ලුමක උණුහුම කම්මුල් වලට දැනී ඇහැරී වායා අසන්නීය. පද්මා ඒ මොහොතට කඳුළු පිහදාගත්තේ හිටියටත් වඩා දුක්බර හිනාවකින් ඇස් පරයාගෙනය.

"අපි දෙන්නා ගැන හිතනකොට වෙලාවකට හරි දුකයි.. නේද අම්මේ.."

වායා කියන්නේ දෙනෙත් පියාගෙනමය. මොහොතකින් පියවුන දෙනෙත් දොරවල් අතරින් තෙත කඳුළක් පතියි. නිදාගෙන ඉන්නා නිසා ඒ කඳුළු ගලන්නේ දෙනෙත් දෙකොළවරිනි.

"මට මං ගැන නෙවේ.. ඔයා ගැන බයයි පුතේ.."

පද්මා දෝතම වායාගේ පුංචි කම්මුල් වලට තියා කියන්නීය. අම්මාගේ අත්වල මේ තරම් සනීපයක් ඇත්තේ ඇයිදැයි වායා එය විඳිමින් සිතුවාය.

"ඉස්සර තාත්තා වැඩ ඇරිලා එන්නේ මේ වෙලාවටනේ.. සමහර වෙලාවට දොරකඩට වෙලා ඉඳිද්දී මට හිතෙනවා තාත්තා දැන් එයි දැන් එයි කියලා.. වෙලාවකට තරහත් එක්ක පරක්කු වෙනවා කියලා. ඒත් සාලෙට ඇවිත් බලද්දී මල් මාලේ දාපු පින්තූරේ පේනවා.. ඒ වගේ දවසට කන්නවත් හිත නෑ අම්මේ."

අම්මාටත් දුවටත් එකවර හැඬුණි. පද්මා දියණියගේ ගෙල යටින් දෑතම යවා ඇගේ තිකට පිරිමැද්දය. චන්ද්‍රසිරි සිහිවී දවසකට කීවතාවක් පපුව පැලී කඳුළු ගලනවාදැයි දුව දන්නේ නැතැයි පද්මා සිතුවාය.

"අතක් පයක් කැඩිලාහරි අන්ධවෙලා හරි අපි ළඟට වෙලා උන්නනම් හිත හරි පිරිලා. මේ පුටුවල පවා තාත්තගේ සුවඳ තියෙනවා වගේ.."

WWW.EXPRESSLANKA.TK 4

'තාත්තා කොහේ හරි හොඳ තැනක ඇති අම්මේ.. අඬන්න එපා...'

වායා අම්මාට අඬන්නට එපා කීවද ඇගේ දෙනෙත්වලද කඳුළු විය. ජීවිත අහසේ පුරපස දැල්වුන එකම සඳ ගිලී මියගියද සිට මේ ඇස්වල කඳුළු වලට වඩා සැනසිල්ලක් තිබුනේ නැත.

තාත්තාට සිහිවී ප්‍රථමවත් අම්මා ගැන දුක සිතී දෙවනුවත් වායාගේ පපුව දෙවතාවක්ම ඇවිලිණ. ඇය කඩාගත් කුඩා කෝපිමල් කෝපි මල් පොකුරෙම රඳවා සෙමෙන් සෙමෙන් කුස්සිය පැත්තට ඇවිදගෙන ගියාය. කුස්සියට යන්නටත් ප්‍රථම අම්මා හදන කැකුළු කිරිබතේ සුවඳ වායාට දැනුණි. ඇගේ හිස් බඩම ඒ සුවඳින් පිරුණි. දත් නම් නොකෑවත් කමක් නෑ.. බඩ පිරුණා යැයි ඇයට සිතුණි.

වායා කුස්සියේ උළුවස්ස ළඟ නතරවී අම්මා කුඩා කෙසෙල් දල්ලට කිරිබත් දමා තවන අයුරු බලාඋන්නාය. එය පුංචි කිරිබතකි. වැඩිම උනොත් ඉන් කැපිය හැක්කේ කෑලි හතරකි. කොහොමටත් එක වේලකට ඉදෙන්නේ හාල් හුණ්ඩුවකි. නැත්නම් හුණ්ඩු එකහමාරකි. අම්මාටත් දුවටත් එය හොඳටම ඇතිය. එයත් වැඩිවන දවස් වෙයි. ඉඳහිට බත් මදිවෙයි. ඒ හොඳට තක්කාලි දමා කරවල හොද්දක් හැදූ දිනටය. එදිනට වායා කොහොමටත් දෙතුන් විටක් බෙදගෙන ආශාවෙන් කන්නීය. එය දන්නා පද්මා කරවල හොද්දක් හැදූ දවසට වැඩිපුර හාල් ලිපේ තබයි.

කිරිබත තවා වටේ රවුම් කොට පද්මා වායා දෙස බැලුවාය. දැනම පපුවට ගෙතැත් දුව දකිද්දී ඇගේ පපුව අනුකම්පාවෙන් කඩා වැටුණි.

'තෙත රෙදි ඇඳගෙන සීතලේ ඉන්න හොඳ නෑ.. යන්න දැන්මම ඇඳගන්න පටන්ගන්න. සාරිය අඳින්න ඔයාට පැයක් වත් යයි.'

සාරිය ගැන මතක්වී වායාගේ පපුව අලුතින් සැලී ගියාය. අද නම් කුමක් හෝ කරදරයක් තමාට වනබව නම් ඇයට විශ්වාසය. ඒ තරමටම ඇය සාරිය අඳින්නට උත්තේ බියෙනි.

'මටනම් බයේ බෑ ඇඳගෙන යන්න. ජූවර් ඕක කොයි වෙලාවක හරි කඩා වැටෙනවා. [illegible]'

WWW.EXPRESSLANKA.TK 5

වායා ඇඩුම්බර හඬින් කීවේ අම්මා එය තමාට බලෙන් අන්දවන්නාක් මෙන් සිතාය. එහෙත් සම්මුඛ පරීක්ෂණයට යා යුත්තේ සාරියක් ඇඳගෙනමය. ගවුමක් අඳිනවානම් එය කැලි තුනක අලුත්ම විලාසිතාවේ එකක් වියයුතුය. ඒ සඳහා වෙනම සපත්තු ගත යුතුය. ඒ කිසිවක් වායාට නැත. අඩු වියදමෙන් පිරිමසා ගෙන හොඳට පෙනුමක් ගතහැකි එකම ඇඳුම සාරියය.

'යන්න ඔයා අඳින්න පටන් ගන්න.. මං ලුණු මිරිස් ටික තලලා එන්නම්.'

පද්මා ගලට මිරිස් කරල් දෙක තුනක් දමා කීවාය.

'රස්සාව හම්බ උනොත් නෑ අම්මා කිරිබත් හදනවා.. සවදහරි ඉන්ටවීව් බඩගාලා බඩගාලා හම්බ උන දවසට කිරිබත් හදන්න.'

'මං බාරෙකුත් උනා.. ඔයා හිත කලබල කරගන්නැතුව යන්නකෝ..'

'ඒක තමයි අමාරුම වැඩේ..'

වායා අම්මා කිරිබත් සැදූ කුඩා මුට්ටියේ ඉතිරිවී තිබූ කිරිබත් දංකුඩ කැබැල්ලක් කටට දමාගෙන කුස්සි කැල්ලෙන් පිටවූවාය. කිරිබත් දංකුඩ වල ඇත්තේ අමුතුම රසකි.. පොඩි කාලේ ඔයා හොඳ කිරිබත් එපා කියලා දංකුඩ හූරලා ඉල්ලනවා. මං එපා කියද්දී තාත්තා දංකුඩ හූරලා ඔයාට දෙනවා.. අම්මා දවසක් කියූ කතාවක් ඇයට සිහිවිය. මං ගිය ආත්මෙත් මේ වගේම දුප්පත් කෙල්ලෙක් වෙන්නැති... වායා සිතුවාය.

වායා කාමරයට ගොස් නෙත කොණ්ඩය ලිහා දමා හිය පාක්කර එය හෙම්හිට පිසදමනා අතර කැඩපතට එබුනාය. ඇය නෙත රෙද්ද උනාදමා තුවාය ඇඳගෙන වඩාත් ළංව කැඩපතින් තම මුහුණදෙස බැලුවාය... මගේ මූණේ තියෙන අසරණකමවත් බලලා අද මට රස්සාව ලැබෙනව නම්.. වායා දිග සුසුමක් හෙලාසිතුවාය. දෛවය තමාට විශාල දෙයක් නොදෙන බව වායා දැනඋන්නාය. එහෙත් අඩුම තරමේ තමාටත් අම්මාටත් සැනසිල්ලේ ජීවත්වන්නට තරම් කුඩා බලාපොරොත්තුවක් වත් ජීවිතයට නොදෙන තරම් දෛවය තමාට අසා... ... ... ... ... ඇය සිතුවා. අඳින්

WWW.EXPRESSLANKA.TK 6

වසර හතරකට පෙර චායාගේ පියා මියගියේ ඔවුන්ට රීමාවූ නිහඬ වාම් නිස්කලංක ලෝකයක් තනාගෙන එහි සතුටින් ජීවත්වෙද්දීය. සැප සම්පත් කිසිවක් නොවුනද ලැබෙන දෙයක් කා තියෙන හැටියකට ඇඳ ජීවත්වූ ඒ අහිංසක යුගයට චායා මුළු හදවතින්ම ආදරය කළාය. ජීවිතයේ සතුට යනු ඒ අහිංසක කුඩා දේ බව ඇය හොඳින් දන උන්නාය. ජීවිතය ඝන අන්ධකාරය මැද පහන් වැටියක් සේ තුන් ලොවම එළිය කළ තාත්තා මියගියේ චායාගේත් අම්මාගේත් ජීවිත සදකාලික අඳුරක ගිල්වමිනි. ලොව මිනිසුන්ගේ ජීවිත වල අභිම් කරගන්නට ඕනාතරම් සරුවපිත්තල දේ තිබියදී මේ දුප්පත් ජීවිතයේ යන්තකයට තිබූ එකම අහිංසක බලාපොරොත්තුව නැති කරන්නට තරම් දෙවියන් අසාධාරණ වූයේ ඇයිදැයි චායා දස දහස් වාරයක් සිතුවාය. තාත්තා මියගිය දිනයේ පටන් අද දක්වා ජීවිතයේ මොකක්දෝ අඩුවක් නොපිරුන බවක් චායාට දැනුනි. ඒ කුමක්දැයි ඇය නොදන්නාය. සමනල කන්ද හොරු ගෙන ගියාක් බඳු පාළුවක් තනිකමක් අසරණ බවක් මේ ජීවිත දෙකට උරුම වූයේ ඒ සිදුවීමෙන් පසුය. ඉන්පසු උදවූ හැම දවසකම මේ දෙදෙනා ජීවත්වූයේ එකිනෙකාගේ හදවත් වල ඇවිලෙන දුක.. වේදනාව.. එකිනෙකා අතගාගෙන සනසාගෙනය. අම්මා නිසා තමාත් තමා නිසා අම්මාත් ජීවත් වන්නට හිත හදගත් බව චායා සිතුවාය. ඇයට අවශ්‍ය අනාගතයේදීත් එසේ ජීවත්වන්නටය. මේ දුකට.. පාළුවට.. එහා ජීවිත වත්කමක් නොලැබෙන බව චායා දැන උන්නාය. ජීවත්වන්නට අන් යමක් නැත්නම් එය පවා ඇතැයි දුවත් අම්මාත් සිතුවේ වෙන කළ හැකි දෙයක්නොවූ නිසාය. පෙනෙන නෙක් මානයක බලාපොරොත්තුවක එළියක් නැති ජීවිත වාලුකාවේ පැතුමක් සොයා දිවීම තවත් අසරණ වන දෙයකි. එහෙත් මල්පෙති පාටවී ඒ මැද රෝන් පුණු තැන්පත්ව වසන්තයේ ඇයවත් නුදුටු ලස්සනක් ඇයටත් නොදැනී ඇගේ ජීවිතයට.. යෞවනයට.. පැමිණ තිබුණාය. දුප්පත් කමේ හිහන මල්කම් වලටවත් ඒ ලස්සන මකාදමන්නට පුළුවන් වූයේ නැත. ලස්සන ලස්සනමය.

"අ...ම්...මේ.."

චායා දෙතුන් වරක් වැරදුන සාරිපොට අසරණව අතේ තියාගෙන කැගැසුවාය. මෙය නම් පණ යන වැඩකි. දිනපතාම රැකියාවට සාරි

WWW.EXPRESSLANKA.TK 7

ඇඳිය යුතුනම් මේ රස්සාව නොලැබෙන තරමට හොඳය.

'ඉක්මනට එන්නකෝ.. මේ මල වදේ ලිහෙනවනේ..'

අම්මා වෙත සාරිය පා වායා ඇඩුම්බරව කීවාය. පද්මා සිනාසෙමින් සාරිය සම්පූර්ණයෙන් ගලවා ගාණට පිඹිදූන වායාගේ බඳ වටා දෙතුන් විටක් එතුවාය.

'ඔයා ටිකක් උස නිසා සාරිය ලස්සනයි.'

පද්මා ඇතුළු හදවතින් ආඩම්බරයක් විඳිමින් කීවාය. වායා බලා උන්නේ අම්මා අතේ ඇඟිලි මනාව හසුරවමින් පොට ගන්නා ලස්සනය. ඒ හුරුව තමාට නොපිහිටන්නේ ඇයි..

'අම්මා ඔච්චර ලස්සනට සාරි අන්දවන්න දන්නේ කොහොමද..'

වායා සිනාසී ඇසුවාය.

'ඉස්සර තාත්තාට කොහේ හරි යන්න මං සාරියක් අඳින්නම ඕනේ.. බඳිනකොට මටත් බෑ.. පස්සේ පුරුදු උනා.'

'තාත්තා නැති උනාට පස්සෙ අම්මා සාරියක් ඇන්දෙම නෑ.'

වායා බිම බලාගෙන කීවාය. අම්මාගේ මුහුණ කඩාගෙන වැටෙනු දුක ඇය කම්පා වූවාය. අම්මා අන්තිම වතාවට සාරියක් ඇන්දේ තාත්තාගේ මරණය වෙනුවෙනි. ඒ සුදු සාරියකි.

'මටත් එක්ක හරියන්න ඔයා දූන් අඳින්නකෝ...'

පද්මා දුක පසුතුරේ සඟවාගෙන කීවාය. ඇගේ නෙත් වල 'මගේ හැඩ බලන්න දන් කෙනෙක් නෑ..' වැන්නක් ලියවී තිබුණි. විවාහක ගැහැණියකගේ කැඩපත සැමියාය. ඔහු නොවූවිට ඇයට හැඩ වුවද එය බලාගන්නට කෙනෙක් නැත. ලස්සන කියන්නට කෙනෙකු නැත.

'අම්මා ලස්සනම පාටක් තෝරලා තියෙන්නේ.'

වායා අම්මා සාරිය අන්දවා අවසාන වූ පසු කැඩපත ඉදිරියේ කැරකී කීවාය. ලා තැඹිලි පාට සාරියට තද තැඹිලි පාට කුඩා මල් ඉහින ඒ සාරිය ඇත්තටම ලස්සනය.

'ඔයාට මොන එක ඇන්දත් ලස්සනයි.'

'අම්මා මාව මුරුගා අත්තේ තියලා ඇරලා එනනදී බිමට කඩං

WWW.EXPRESSLANKA.TK 8

වැටෙයි..'

'ඉන්න චූට්ටක් කැරකෙන්නැතුව..'

පද්මා පොට ඨගෙන වායාගේ වම් උරහිසින් පහළට දමා බිම වාඩිවී සාරිය ඇද්දය. අනතුරුව කුඩා සමනලයින් දෙන්නෙක් වූ සාරි කට්ට හැට්ටයත් පොටත් අල්ලා ගැසුවාය.

'කොණ්ඩෙට මුකුත් කරන්න ඕනේ නෑ නේද අම්මේ.'

වායා ඇඟිලි තුඩු යවා කොණ්ඩය දෙඋරහිසින් ඉදිරියට ගෙන ඇසුවාය.

'ඕනේනම් පෝනි ටේල් එකක්දන්න. ඒත් ඔහොම ලස්සනයි. මෙයත් එහෙමනේ ඉන්නේ..'

පද්මා වායාගේ ඇඳ අද්දර ඇය ගසාගෙන උන් මධූරිගේ කුඩා පින්තූරය පෙන්වා කීවාය. වායා ඒ පින්තූරය දෙස දෙතුන්වරක් බලා අනතුරුව කැඩපතේ ඇඳුන තම රුව දෙස බැලුවාය.

'හරි.. හරි.. දැන් ඇති. එයා වගේ තමා. කෝ අර ගෙනාපු පවුඩර් එක.'

පද්මා සිනාසී ඇසුවාය. අම්මා අහන්නේ රෝස පවුඩර් ගැනය. එය දුන්නේ වායාගේ පාසැල් මිතුරියක වූ රන්දිකාය. ඇය දැන් කුඩා සැලෝන් එකක් කරන්නීය. වායා ඇය හමුවන්නට ගියේ තිකමටය. රන්දිකා පැයක් පමණ වේලාගෙන වායාගේ දෙබැම සූත්දරව සකස් කොට කොණ්ඩයද සැකසුවාය.

'උඹ මැරීගෙන ඕවා කළාට දෙන්න සල්ලි නම් දැන් මා ගාව නෑ.. රස්සාව හරි ගියොත් පළවෙනි පඩියෙන් දෙන්නම්..'

වායා සිනාසී කීවාය. දුප්පත් කම් සඟවන්නට තරම් උඩඟු සිතක් ඇය වෙත තොවීය.

'මට උඹගෙන් සල්ලි එපා කෙල්ලේ.. පුළුවන් වෙලාවට ඇවිත් හෙයාකට් එකක් ගනිං.. ඔය ලස්සන තිකං අපරාදේ නැති කරගන්නෙපා.. උඹව ලස්සන කරන්න වැඩි දෙයක් කරන්න ඕන නෑ.'

රන්දිකා අවංක හදවතින් කීවාය. වායා එන්නට ලෑස්ති වෙද්දී රන්දිකා ඇයට ලිප්ස්ටික් කූරකුත් රෝස පවුඩර් ටිකකුත් දුන්නාය.

WWW.EXPRESSLANKA.TK 9

'උඹ මෙච්චරක් කරලා.. අනේ පව්නේ රන්දි..'

වායා කීවේ දුකෙනි. රන්දිකා මනාව කැපූ වායාගේ දෙබැම යට ක්‍රීම් ස්වල්පයක් ගෑවාය.

'ඕවලටත් පුරුදු වෙයන්.. රස්සාවලට යනකොට හිඟන්නී වගේ යන්නෙපා. එතකොට කැපෙනවා.. තව මොනාහරි ඕනනම් ඇවිත් කියපන්..'

වායා එන්නට හදද්දී රන්දිකා කීවාය. වායා අපමණ කෘතඥතාවයෙන් යුතුව රන්දිකාගේ පුරත අල්ලා ගත්තාය.

'යන ගමන් අයිබ්‍රෝ පෙන්සිල් එකක් අරගෙන පලයන්.. මං ගාව තිබ්බ ඒවා ඉවර වෙලා.'

'උඹට පින් රන්දි..'

වායාගේ දෙනෙත්වල කඳුළු පිරුණි. ඒ තෙතමනය යට ඇත්තේ අහිංසකම හදවතක් බව රන්දිකා දැනැත්තාය.

'පාට වැඩි වගේද අම්මේ.. මට නම් හරි අමුතුයි.'

වායා තොල් ආලේපනය ගල්වා අම්මා දෙස බලාකීවාය.

'ඒ ඔයා අලුතෙන්ම ගාපු නිසා.. මේකේ ඇති තදක් නෑ. පාට ලස්සනයි.'

'රන්දි මට කෝලං පාටක් දෙන්නෙත් නෑනේ නේද..'

'දූන් ඔෆිස් යන ගෑණු ළමයි දම් පාටත් ගාගෙන යනවා මම දැකලා තියෙනවා..'

'ෂි..ස්..සු.. කෙල්ලෝ..'

වායා තමාටම කියාගත්තාය. වැඩි අරුමෝසම් නැතත් වාමෙට යමක් කරන්නට ඇයද කැමතිය. අම්මා ගෙනා වළලු දෙක වායා අතට ගත්තේ දුකෙනි. තාත්තාගේ දඩිය කඳුළු.. ඇයට හීල්ලීන. මේ තෑග්ග ඔහු ගෙනා දවස ඇයට අද මෙන් මතකය. ඒ ඇගේ විසිඑක් වෙනි උපන්දිනයටය. මිය යන්නට මාස හයකට කළිනි.

'පව් තාත්තා ඒවත් හදලා දීලා නැතිඋනේ..'

වායා දුක්බරව කීවාය.

WWW.EXPRESSLANKA.TK 10

'ඕනනම් ඔය චේන් එකට මේ පෙන්ඩන්ට් එක දගන්න.'

'එපා..'

අම්මා මලක් වැනිවූ පෙන්ඩන්ට් එකදෙද්දී වායා කීවාය.

'මේක ලස්සනයි.'

කුඩා හාට් එක ඇය ප්‍රිය කළාය. එය වාමිය. සුන්දරය.. තමාගේ හදවත තරම්ම අහිංසකය.

අම්මා කිරිබත් ටිකක් දීසියකට බෙදගෙන විත් වායාගේ මුවේ තැබුවාය.

'ඇති. මේවා යනවා.. ඇවිත් කන්න තියන්න.'

'තැන මතකයි නේද.. එකසිය තිස්අටේ ගිහිල්ලා තුන් මුල්ලෙන් බැහැලා ගාලුපාර පැත්තට යනකොට හම්බවෙන්නේ නේද..'

'මට මතකයි අම්මේ. මං දැකලා තියෙනවා. අනික කව්රුත් දන්නවා කලම්බු පැෂන් කම්ප්ලෙක්ස් කිව්වහම..'

'පත්තරෙත් අරගෙන යන්න.'

වායා සකි අන්න පත්තර පිටුව දෙකට තුනට නවා හෑන්ඩ් බෑගයේ දමාගත්තාය. ගන්නට එහෙමම සහතිකයක් නැත. උසස් පෙළ සහතිකයත් තවත් පාසලේ සහතික දෙක තුනකුත් ඇය වේලාසනම ෆයිල් කවරයකට දමාගෙන තිබුනාය.

'මං යන්නම් අම්මේ..'

වායා දෙදණ ඔබා වඳින්නට යද්දී පද්මා ඇයව දෙඋරහිසින් අල්ලා නැගිට්ටවූවාය.

'ඇඳුම් සවුත්තු වෙනවා. බුදු සරණයි පුතේ.'

දෙදෙනාගේම ඇස්වල කඳුළු පිරුණි.

'තාත්තා මට කොහේ හරි ඉඳලා බනිනවත් ඇති.. එයා උන්න නම් ඔයාව රස්සාවලට අරින්නෑ.'

පද්මා දෙනෙත් පොඩිකර කීවාය. වායා දෙනෙත් තෙත් වේගෙන එද්දී එය පිටි අත්ලෙන් හිම්හිට තවාගත්තාය.

'මං අකමැත්තෙන් කරන්න යනවා නෙවේනේ. මාත් ආසයි

WWW.EXPRESSLANKA.TK 11

පොඩි ජොබ් එකක් කරන්න. අනික කවුද දන්නේ මේක ලැබෙයිද කියලා. තාත්තාගේ පැන්ෂන් එකෙන් පිරිමහගන්න අමාරුයිනේ අම්මේ..'

'ඒත් කමක්නෑ.. ඔච්චර අමාරුනම් එහෙම කරමු.. තව මොනාහරි කරන්නත් පුළුවන්නේ.'

'හරි අපි ඒක පස්සෙ බලමුකෝ..'

ඡායා සාලයට පැමිණ සාලයේ බිත්තියේ ගසා තිබූ තාත්තාගේ ඡායාරූපයට වැන්දය. වැඳ ඒ දෙස මොහොතක් බලාඋන්නාය.

'යන්නම් අම්මේ..'

'මේක හැම වෙලාවෙම පැනලා පේන්න බලනවා.. කොයි වෙලාවෙත් බල බල හදන්න ඕනේ..'

පද්මා සාරි හැට්ටයෙන් එළියට පැන තිබූ යට ඇඳුමේ පටිය හැට්ටයට යට කරනා අතරතුර කීවාය. පද්මා දියණිය ගුරු පාරෙන් හැරී නොපෙනී යනතුරුම බලා උන්නාය. තාත්තා සමඟ ඡායා හුරතලේට හැදුනේ ඊයේ පෙරේද වාගේය. දෛවය ජීවිතයේ බර මේ අහිංසක කෙල්ල පිටින් තැබුවේ ඇයිදැයි පද්මා සිතුවාය. සියුම් කටු කම්බි පොටකින් පපුව වටකොට හිර කළාක් මෙන් පද්මාගේ පපුව ඇඳුම් කෑවේය. කොහේ කොතනක ගියත් කරදරයක් දුකක් වෙන්නට එපායැයි පද්මා පැතුවාය. ඇය සාලයට ඇවිදගෙනවිත් සැමියාගේ ඡායාරූපය දෙස බැලුවාය. 'මොනවා කරන්නද කියලා මට තේරෙන්නෑ.. හීනෙන් හරි ඇවිත් මටයි මේ දුප්පත් කෙල්ලටයි මේ ජීවිතේ ගලපලා දීලා යන්න... ඇගේ කඳුළු පිරුන නෙත්වල වූයේ එවන් බැගෑපත් ඉල්ලීමකි. එය ගණන් නොගත්තාක් මෙන් ඔහු දිගටම සිනාසීගෙන ඇයදෙස බලාඋන්නේය. පද්මා නිවී තිබූ බුදු පහන යළිත් දැල්වූවාය.

WWW.EXPRESSLANKA.TK 12

# 2

පිටකොටුවට යන පුද්ගලික බස්රථ පටන් ගන්නා හෝමාගම ප්‍රධාන නැවතුම් පළෙන්ම නැග්ග නිසා වායාට අසුනක් ලබාගන්නට හැකිවිය. ඒත් වායා බස් රියට ගොඩවූයේ දෙතුන් දෙනෙකුගේ තල්ලු කිරීම්වලට හසුවූ පසුය. ඇයට බිය සිතුනේ සාරිය ගැනය. පිරිමි උරහිස් වල ශක්තියෙන් දුර්වල ගැහැණු ශරීර තල්ලු කරමින් බසයට ගොඩවී වීරයන්මෙන් අසුනක ඉඳගතිති. දරුවෙකු ලැබෙන්නට ඉන්නා අක්කා කෙනෙකු තල්ලුවී ගෙන දෙරටුව ළඟින් ඈත්වෙද්දී වායාගේ පපුව ඇවිලිනි. මිනිස්සු යක්කුමෙනි.

වායා බසයට ගොඩවූයේ ගැබිණි කාන්තාවට බසයට නගින්නට උදව්දීමෙන් අනතුරුවය. බඩට මාස හතක් අටක් පමණ වන්නට ඇත. ඒතරමට එය ලොකුය. එහෙත් රැකියාවට යායුතුය. අද්ද අද්ද ඇය ගොස් අසුනක අමාරුවෙන් ඉඳගත්තාය. ජීවත්වීම දුකක්ද.. සටනක්ද.. කුරිරු දඬුවමක්ද.. කුමක් හෝ වේවා ඉදිරි දිනවලදී එය තමාටත් දැනෙන බව වායාට සිතුනි.

ඉඳගත් පසු වායා සාරියේ අගමුල අතගා බැලුවාය. අම්මා කිව්වා හරිය.. [illegible] වායා

WWW.EXPRESSLANKA.TK 13

අතයවා එය සකස් කරගත්තාය. අම්මා මතක්වී ඇගේ පපුව අළුතින් ඇවිලිනි. තමා රැකියාවකට යනවාට අම්මා කොහෙත්ම කැමති නැතිබව වායා දනී. තාත්තා නැතිවී වසරකින් පමණ අම්මාද විවිධ රැකියාවල් සෙව්වාය. කිසිවක් හරිගියේ නැත. මාසයකට දවස් තුන හතරක් ආහාරපාන සපයන කේටරින් ආයතනයක ඉවුම් පිහුම් සඳහා උදව් වීමට අම්මාට ලැබෙයි. එයද දිනපතා ලැබෙන්නේ නැත. අම්මා රැකියාවක් කරනවාට වායාද කැමති නොවුනාය. අම්මා ඉන්නේ වැඩකළ හැකි වයසක නොවේ. තාත්තා මෙන්ම අම්මාද නැතිවෙතැයි ඇගේ ඇතුළු හදවතේ බියක් ඇත. ඉඳහිට අම්මා ලෙඩ වූ කල ඒ බිය දෙගුණ තෙගුණ වී වායාට දනෙයි. අම්මාගේ ඇඳ අද්දර ඉන්නා වායා නිතර නිතර ඇගේ හුස්ම වැටේදැයි බලන්නේ බියෙනි.

මේ යන රැකියාව ගැනත් ලොකු බලාපොරොත්තුවක් වායාට නැත. සම්මුඛ පරීක්ෂණ වලට එන්නේ තමාට වඩා බොහෝ සුදුසුකම් ඇති යුවතියන් බව වායා දන්නීය. අද යුවතියක් පාසැලින් පිටවූ පසුවිවිධාකාර පාඨමාලා කරති. ඉංග්‍රීසි පංති යති. පරිඝණක පාඨමාලා හදරති. රූපලාවන්‍ය පාඨමාලා කරති. ඒ කිසි සුදුසුකමක් වායාට නැත. උසස් පෙළ විභාගයෙන් පසු කිසිවක් ඉගෙන ගන්නට තරම් මානසික හෝ ආර්ථික ශක්තියක් ඇයට තිබුනේ නැත.

පුස්තකාලයෙන් පොත් ටිකක් රැගෙන විත් ඉංග්‍රීසි ටිකක් ඉගෙන ගන්නට වායා උත්සාහ කළේ රැකියාවක් කළයුතුම යැයි සිතාගත් පසුය. අමාරුවෙන් කළ ඒ දෙයින් කවුරු හෝ සාමාන්‍යයෙන් කියනා දෙය තේරුම් ගන්නටත් වචන දෙක තුනක් ගලපා කතා කරන්නටත් වායාට හැකිවිය. සති අන්ත පුවත් පත් කිහිපයක් ගෙන රැකියා සඳහා ඉල්ලා තිබූ ආයතන වලට වායා අයදුම් පත්‍රමුයේ ඉන්පසුය. ඉන් පිළිතුරු ලැබුණේ එක ආයතනයකින් පමණි. ඒ පුහුණුවන කාර්යාලීය ලිපිකාරිනියක් ඉල්ලා තිබූ කලම්බු පැෂන් කම්ප්ලෙක්ස් ආයතනයෙනි. එය අගනුවර තරමක් ජනප්‍රිය කාන්තා හා ළමා විලාසිතා ගාරයකි. එහි රැකියාවක් ලැබෙතැයි විශාල විශ්වාසයක් වායා තුල නොතිබුනද පුහුණුවන යන වචනය ඇයව දිරිමත් කළේය. පුහුණුවක් නැතත් රැකියාවක් දෙන්නේ එහෙමත් නැතකය. රැකියාවට බඳවා ගත්පසු ඕනාදෙයක් පුහුණුවන්නට පුළුවන. වායාට අවශ්‍ය

WWW.EXPRESSLANKA.TK 14

බලාපොරොත්තුවක් පමණි. දුක මහන්සිය ඇයට අලුත් දෙයක් නොවේ.

බසින්නට අවශ්‍ය තැන පසුවේ යැයි වායාට බිය සිතුණි.

'මේ තුන් මුල්ල හන්දිය මේකද..'

ඇය එහා පැත්තේ උන් කාන්තාවකගෙන් ඇසුවාය..

'මේ තිඹිරිගස්යාය.. එහා හෝල්ට් එකේ බහින්න.'

වායාට සැනසිල්ලක් දැනුණි. ඇය බස් රථය දෙස බැලුවාය. මේ සෙනඟ අස්සෙන් කෙසේ බසින්න දැයි ඇය සිතුවාය. ඇඟිල්ලක් ගසන්නට තරම් ඉඩක් නැත.

'දැන්මම නැගිටලා ඉස්සරහට යන්න.. නැත්නම් බහින්න බැරිවෙයි.'

කාන්තාව කාරුණිකව කීවාය. 'ගැහැණියකගේ දුක දන්නේ ගැහැණියක්ම විතරයි..' වායා සිතුවාය. ඇය කාන්තාව දෙස ස්තුති පූර්වක බැල්මක හෙලා සිනාසී නැගිට්ටාය. මිනිස්සු ඉන්නේ අනුරාධපුර ගල් කණු මෙනි. ඉන්නා තැනින් හෙළවෙන්නවත් ඔවුන් කැමති නැත. වායා පසුවට අතක් තබාගෙන අමාරුවෙන් මිරිකී දොර දක්වා ආවාය.

'තුම්මුල්ල කැම්පස් බහින්න.'

බස්රියෙන් බිමට බැස වායා මොහොතක් තම වත දෙස බැලුවාය. සාරියේ කුමක් හෝ දෙයක් කාගේ හෝ ඇඟක ඇමිණෙන තරමට සෙනඟය. මුහුණ පුරා ආ තුනී දහදිය යංතමට පිසදාගෙන ඇය ගාලුපාර දෙසට යොමුවූ මාවත දිගේ ඇවිදගෙන ගියාය. බස්වල ඇඹරෙනවාට වඩා පයින් යාම සුන්දරය.

"COLOMBO FASHION COMPLEX"

රත්තරන් පාට මහත අකුරු වලින් ගසා තිබූ නාම පුවරුව දකිද්දී වායාගේ සිතට ආවේ චකිතයකි. තරමක් විශාල ඒ විලාසිතාගාරය දුටුවනම තමාට රැකියාව නොලැබෙතැයි ඇය අනුමාන කළාය. දෙමහල් සාප්පු සංකීර්ණයේ දොරටුව ළඟ උන් ආරක්ෂක නිළධාරියා ළඟ වායා නැවතිණි.

'ම..ම.. මේ ඉන්ටර්විව් එකකට ආවේ..'

වායා හෙමිහිට ඔහුට කීවාය.

'නාම මැඩමුයි සරුයි ආවේ නෑ. මිස් ඔහොමම ඇතුලට ගිහිල්ලා පඩිපෙළෙන් උඩට නැගලා උඩ තට්ටුවට යන්න. එතන

WWW.EXPRESSLANKA.TK 15

ඉන්ටවීව් එකට ආපු අනිත් මිස්ලත් ඉන්නවා.. එතන ඉඳගෙන ඉන්න.'

චායාගේ සිත බියෙන් පිරුණි. 'ගොඩාක් ඇවිත් ඇති.. මට තිබුනේ මීට වඩා පොඩි රස්සාවකට යන්න..' ආපු එකේ ඉඳලා බලනවායැයි අනතුරුව ඇය සිතුවාය. සාප්පු සංකීර්ණයේ ප්‍රධාන දොරටුවෙන් ඇතුල්වී චායා සුන්දර ලෙස සකස්කර තිබූ ඇඳුම් රාක්ක දෙස බැලූවාය. තැන තැන ප්ලාස්ටික් කාන්තා රූපවලට ඇඳුම් අන්දවා සිටුවා තිබුණි. උදේ නිසා තවම සාප්පුව පාළුය. තරමක් විශාල හෝල් එක මැදින් ගොස් ඇය පියගැට පෙළ නැග ඉහළ මාලයට ගියාය. එක පෙළට දැමූ ප්ලාස්ටික් පුටුවල යුවතියන් දහයක් පහළවක් පමණ අසුන්ගෙන උන්නෝය. ඒ හැමෝම චායා එද්දී හැරී ඕනෑකමින් ඇයදෙස බැලූවෝය. චායා බිම බලාගත්තේ අසීරුවෙනි. 'මට සාරියක් අන්දවලා අම්මා එව්වේ අපරාදේ.. හැමෝම ඇවිත් ඉන්නේ ත්‍රී පිස් කිට් ඇඳලා..' චායා පුටුවක ඉඳගෙන අන් යුවතියන් දෙස හොරැහින් බලා සිතුවාය. සමහරු ඩෙනිම් ජීන්ස් ඇඳගෙන විත් තිබුණි. ඔවුන්ගේ නිරාවරණය වූ අත්ගොබ ඕනෑවටත් වඩා සරාගී යැයි චායාට සිතුණි. 'මෙහෙම තැන් වලට ගන්නේ එහෙම ගර්ස්ලා වෙන්න ඇති.. මං සාරියක් ඇඳගෙන එද්දී හැමෝම බැලුවේ ඒකයි..' චායා අසරණව සිතුවාය. ජීවිතයේ ප්‍රථම වතාවට තමාගේ පෙනුම ගැන ඇඳුන හීනමානයක් දැනුණි. සරමක පෙනුමට වඩාත් සමාන දිග අමුතුම හැඩයේ සායකට බඩ පෙනෙන කෙටි ටී ෂර්ට් එකක් ඇඳගෙන උන් යුවතියක් පැමිණ චායා අසලින්ම ඉඳගත්තාය. ඇගේ වතින් හමා ආ සැර විලවුන් සුවඳ චායාට දැනුනේ වඩාත් තදිනි. ඇය කකුලක් පිට කකුලක් දමාගෙන අතවූ ප්ලාස්ටික් ෆයිල් කවරය දිගහැර ඉංග්‍රීසිනේ ලියූ සහතික පත් තුන හතරක් ගෙන යළිත් බැලූවාය. ඇගේ පපුව කොනක සිට ආත්මානුකම්පාවෙන් බරවිය. 'මට මුකුත්නෑ..' චායා සිතුවේ තමා ගැනම උපන්දූකෙනි. යුවතිය හැන්ඩ් බෑග් එකේ තිබූ කුඩා කැඩපතක් ගෙනමුහුණ දෙසට අල්ලා තොල් පිට පෙරලා යළිත් 'එය ඇතුලට දමා චායා දෙස බැලුවාය.

'ඊස් ඉන්ටර්වීව් ස්ටාට්.. ?'

ඇය අමුතුම ආකාරයට ඉංග්‍රීසියෙන් ඇසුවාය.

'නාම...'

WWW.EXPRESSLANKA.TK 16

වායා සිංහලෙන් පිළිතුරු දුන්නාය. ඇය අහක බලාගත්තේ තමා සමඟ කතා කර පලක් නොවන බව සිතා මෙන්යැයි වායාට සිතුණි. මෙවැනි තැනකට ගැළපෙන්නේ මෙවැන්නියකැයි වායා නිකමට සිතුවාය. ඊයේ පෙරේද පැමිණි සියළුම විලාසිතා ඇගේ වත පුරාවිය. ඇය පැළඳගෙන උන් කළු මහත ලොකු මුහුණතක් ඇති අත් ඔරලෝසුව පවා අලුත්විලාසිතාවක් විය යුතුයැයි වායා සිතුවාය. වායාගේ වමත සැරසී ඇත්තේ අදින් වසර හයකට පමණ පෙර උසස් පෙළවිභාගයට ලියන්නට යද්දී තාත්තා රැගෙන දුන් හීනි රන් පැහැගත් අත් ඔරලෝසුවය. එය පවා වායා බැන්දේ එහෙමත් ගමනකටය.

තරමක් මහත නමුත් කරුණාබර මුහුණක් තිබූ වයස අවුරුදු විසි පහක් පමණ වන යුවතියක් පැමිණ ඉඳගෙන උන් සියළු යුවතියන් හා සිනාසී ඒ අසළ වූ මේසයේ ඉඳගත්තාය. මල් බඳුනක් තබා තිබූ තරමක් උස ඒ මේසයේ ඉඳගත් කල පෙනෙන්නේ ඇගේ මුහුණේ උඩ කොටස පමණි. ඇය පිළිගැනීමේ නිළධාරිනිය විය යුතුයැයි වායා සිතුවාය. පුදුමයකට මෙන් ඇය ඇඳගෙන උන්නේ සාරියකි. වායාගේ සිතට තුනී සැනසිල්ලක් දැනුණි.

ඇය ඉදිරිපිට තබා තිබූ දුරකථන වරින් වර එක දිගට නාදවෙන්නට පටන්ගත්තේ තිබූ නිහඬතාවය බිඳිමිනි. පිළිගැනීමේ කවුන්ටරය උඩ තබා තිබූ ඕකිඩ්මල් බඳුන දෙස වායා බලාඋන්නාය. ඒ මල් වල මේ පැහැය සුන්දරය.

එක් ඇමතුමකට ඇය පිළිතුරු දෙද්දී යුවතියන් සියළු දෙනාත් වායාත් වඩාත් උනන්දුවෙන් ඊට සවන් දුන්නෝය. එය ආවේ විලාසිතාගාරයේ අධිපතිනියගෙන් වියයුතුය.

"ගුඩ් මෝනින් මැඩම්.. ඔව් මැඩම්.. මාත් දැන් ආවේ.."

ඇගේ හඬ වඩාත් ගෞරව සම්පන්නය. විනීතකම ඕනාවටත් වඩා ඒ හඬ තුළ ගැබ්ව තිබුණි.

"තිලකයි මයුරියි කෝසලයි ඇවිත් තිබුනා. අනූෂා අද නිවාඩු යනවයි කියලා මැඩම්ට ඊයේ කිව්වා කියලා කිව්වා."

තරමක කාර්ය මණ්ඩලයක් මෙහි සේවය කරන බව වායා ඒ වචන වලින් දැනගත්තාය.

"ම්.. [illegible] මැඩම්.."

WWW.EXPRESSLANKA.TK 17

ඇය චායා ඇතුළු අනෙක් යුවතියන් දෙස එක දිගටබැල්මක් හෙලා කීවාය.

'මංද.. මට හිතාගන්න බෑ.. මැඩමුයි සරුයි ඇවිත්ම බලන්න.'

ඇය සිනාසී කීවාය. පැමිණ සිටිනා යුවතියන් කවරාකාරදැයි.. හොඳදැයි මැඩම් අසන්නට ඇතිබව චායා අනුමාන කළාය.

'මැඩම් තේරුවොත් හරියට හරි.. හරි මැඩම්.. මං තියන්නම්.'

ඇය දුරකථනය තබා යළිත් යුවතියන් දෙස බැලුවාය.

'ඔයාලා වාඩිවෙලා ඉන්න.. මැඩමුයි සරුයි මහ එනවා.'

චායා සිනාසුනාය. එතැන උන් එක් යුවතියක් නැඟිට ඇයවෙත ගොස් අනෙක් යුවතියන්ට නොඇසෙනා ලෙස යම් යම් දේ අසන්නට වූවාය.

'ඒක කියන්න බෑ.. ඉඳලම බලන්නකෝ. ඉඳගෙන ඉන්න.'

ඇය පල්වූවා යැයි චායාට සිතුණි. යුවතිය මූහුණ අඳුරු කරගෙන විත් යළිත් ඉඳගත්තාය.

ටික වෙලාවකින් වයස අවුරුදු පනහක් පමණවූ කාන්තාවක් පඩිපෙළ නැගගෙන ෆයිල් කවර කිහිපයක්ද අතැතිව උඩුමහලට ආවාය. ඉතා වටිනා යැයි කිවහැකි සාරියක් ඇඳගෙන ආ ඇය දකිද්දී චායාට සිතට සැනසිල්ලක් දැනුණි. ඇය උපැස් යුවල අතරින් යුවතියන් දෙස බලා මඳ සිනාවක් පෑවාය.

'ගුඩ් මෝනින් මැඩම්..'

පිළිගැනීමේ කාන්තාව අසුනෙන් නැඟිට කීවාය.

'මෝනින් කෙල්ලේ..'

ඇය මැඩම්ගේ අතින් ඇය අත තිබූ ෆයිල් කවර ටිකත් බෑග් එකත් ගත්තාය.

'කෝ මැඩම් සර්..'

'එද්දී වාහනේ හුරගත්තා.. ඒකට මං බැන්නා කියලා මා එක්ක තරහ වෙලා.'

ඇය සිනාසී අනුකම්පාවෙන් කීවාය. මැඩම්ට ඇත්තේ කරුණාබර මුහුණකැයි චායා සිතුවාය. සර් කියන්නේ මැඩම්ගේ සැමියා විය යුතුය.

WWW.EXPRESSLANKA.TK 18

'මට කෙල්ලේ දිසානායක මහත්තයට කෝල් එකක් අරගෙන දෙන්න. ඊයේ ගෙනාපු බිලවුස් ඔක්කොගෙම එක්ස්ට්‍රා බටින් ගැදර් කරලා නෑ.'

'හා මැඩම්..'

මැඩම් කළුපැහැගත් වීදුරු දොරකින් ඇතුලට ගියාය. පිළිගැනීමේ නිළධාරිනියත් ඒ අනුව ඇතුලට ගොස් බෑග් එකතබා ආපසු ආවාය.

'පැය බාගයකින් ඔයාලට කතාකරයි. පහන් පත්තු කරලා ඉවරවෙලා තමයි මැඩම් වැඩ පටන් ගන්නේ.'

චායාට පුදුම සිතුණි. ඇය සිතුවේ මේ පැළැන්තියට දෙවියන් බුදුන් අමතක වී ඇතැයි කියාය. මැඩම් හිතුවාටත් වඩා වෙනස් සිතුම් පැතුම් ඇති කාන්තාවකැයි චායාට සිතුණි. ඒත් සමඟම සෙලියුලර් දුරකතනයක් කනේ ගසාගෙන අවුරුදු තිහක පමණ තරුණයෙක් ඉහළ මාලයට ආවේය. ලා කොළ පැහැගත් කමිසයකට කොළ සහ රතු ඩොට් වැටුන ටයි පටියක් පැළඳගෙන උන් ඔහු වෙතින් හමා ආ පිරිමි විලවුන් සුවඳ මුළු ඉහළ මාලය පුරාම විහිද යන්නට ගතවූයේ මිනිත්තුවකි. යුවතියන් සියළු දෙනාම ඔහුදෙස බැලුවේ එක බැල්මෙනි. චායා වරක් පමණක් හිස ඔසවා බලා බිම බලාගත්තාය.

'ගුඩ් මෝනින් සර්..'

පිළිගැනීමේ නිළධාරිනිය කියද්දී චායාට යළිත් හිස එසැවිනි. සර්.. සර්.. කියූවේ මැඩම්ගේ මහත්තයාට නොවන බව ඇය මොහොතකින් සිතාගත්තාය. වාහනේ හජ්පා ගෙන බැණුම් ඇසුවේ මොහු විය යුතුය. සමහර විට මේ මැඩම්ගේ පුතා වියයුතුය.

'මෝනින් තිලංකා.. කෝ අම්මා.'

චායා හිතුවා හරිය.. මේ මැඩම්ගේ පුතාය.

'ඇතුලට ගියා.. උදෙන්ම සර් බැණුම් ඇහුවා නේද..'

තිලංකා කියූවේ සිනාසෙමිනි. හාම්පුතාලා හා සේවකයින් අතර ඇත්තේ සමීප සබඳකමකි.

'අම්මට පිස්සු.. මේ චුට්ටක් හීරුනේ.. කිරිබබා වගේ වාහන තියාගන්න පුළුවන්ද මේ කොළඹ..'

WWW.EXPRESSLANKA.TK 19

ඔහු එසේ කියා එතැන තිබූ අඳුනේ ඉඳගත්තේය. එය කැරකෙන කුඩා පුටුවකි. ඔහු එහි වටයක් කැරකී යුවතියන් දෙස බැලුවේය. එක එක මුහුණට නෙත් ගෙන ගිය පසු අවසානයේ චායා දෙස බැලුවේය. චායාට ඉබේම බිම බැලුනි. තමා කළේ වරදකැයි ඇයට සිතුණි. හැම යුවතියක්ම සිනාසෙද්දී තමාට බිම බැලුනේ ඇයි.. ඇය ඒ වැරැද්ද නිවැරදි කරගැනීමට මෙන් යළිත් හිස ඔසවා ඔහුදෙස බැලුවාය. එවර ඔහු උන්නේ ඇමතුමකය. චායා නොපැතූ මොහොතක ඔහු ඇමතුමේ සිටිනා ගමන්ම ඇයදෙස බැලුවේය. එවර ඇය මෘදු ලෙස සිනාසුනාය. ඇමතුම අනුව වෙනස්වන ඔහුගේ මුහුණේ හැඟීමත් නිශ්චිතව සොයාගන්නට නොහැකිවිය.

'මෙච්චරද තිලංකා ඇවිත් තියෙන්නේ.'

ඔහු රිසිවරය තබා ඇසුවේය.

'ඔව්..'

ඒවනවිට තවත් යුවතියන් තිදෙනෙක් පමණ පෝලිමට එකතුවී උන්නෝය. චායා බිම බලාගෙන ඔවුන්ගේ කතාවට ඇහුම් කන් දුන්නාය.

'තිලංකාට කියන්න පුළුවන්ද අම්මා තෝරගත්තේ කාවද කියලා.'

ඔහු අහද්දී චායාට හිස එසවිනි. ඔහු මෘදුව සිනාසී තවත්වරක් යුවතියන් දෙස බැලුවේය. එවරද චායාව ඔහුගේ නෙතට හසුවිය. එවර නම් ඇය බිම බලාගත්තේ නැත.

'බෑ.. සර්ට පුළුවන්ද..'

තිලංකා ගෞරවාන්විතව ඇසුවාය. ඔහුගේ මුහුණේ වූයේ ආඩම්බර පෙනුමකි.

'අපේ අම්මව මං දන්නැද්ද..'

'කවුද..'

චායාගේ පපුව ගැස්සිනා. එහෙම ගැස්සිල්ලක් හැම යුවතියකගේම පපුවේ විය. ඔහු මේසය මත තිබූ කොළ කැබැල්ලක් ගෙන කමිසයේ ගසාගෙන උන් පෑන අතට ගත්තේය. එහි යමක් ලියා ඔහු එය තිලංකා අතට දුන්නේය.

'සුවර්ද සර්ට..'

WWW.EXPRESSLANKA.TK 20

'ෂුවර්.. එයාව තෝරගත්තේ නැත්නම් මම හෙට ඉඳලා ඔෆිස් එන්නෑ.. බලන්නකෝ නිලංකා..'

ඔහු අසුනෙන් නැගිට මේසය මත අත්දෙකම තබා ඇයට කීවේය. කොළයේ ලියා තිබුනේ කවුරු ගැනද.. චායා අසරණව සිතුවාය. මෙවන් අයගේ තේරීම් ලිස්ට් වල තමා වැනි දුප්පත් කෙල්ලෙක් සිටිය නොහැක. කතා කිරීම පවා මෝඩකමකි. චායාට ගෙදර යන්නට සිත්විය.

'මැඩම්ගේ තේරීමද. සර්ගේ තේරීමද..'

නිලංකා හිමිහිට ඇසුවාය.

'ප්‍රසිඩන්ට් තෝරන ඒවා ප්‍රයිම්මිනිස්ටර්ට හොල්ලන්නවත් බෑ.. අකමැති උනත් කැමති වෙන්න වෙනවා. අපේ අම්මත් ඒ වගේ තමා...'

ඔහු සිනාසී කීවේය. නිලංකා ඔහු ලියා දුන් කොළ කැබැල්ල නවා ලාච්චුවේ දැමුවාය. ලාච්චුව ඇර එය බලන්නට ඇත්නම්.. චායාට සිතුණි. බැලුවා නම් ඉක්මනින් ගෙදර යා හැක. තවත් පසුව පුච්ච ගන්නේ මොකටද.

ඔහු මේසය මත තිබූ දුරකථනයත් රැගෙන හැරුනේය. යද්දී ඒ ඇස් චායා වෙතටත් ඉබේ යොමුවිය. ඇගේ පපුව සීතල විය.

ඔහු ඇතුලට ගියපසු නිලංකා යළිත් අර කොළකැබැල්ල ගෙන බැලුවාය. යුවතියන් සියළු දෙනාම ඒ දෙස බැලුවේ විමතියෙනි. නිලංකා රවුමට ඇස් කරකවා සියල්ලන් දෙස බැලුවාය. චායා දෙස බැලුවේ අන්තිමටයි..

'නිලංකා.. එක එක්කෙනා එවන්න..'

මැඩම් දෙර යංතමට ඇර කීවාය. චායාගෙ පපුව යළිත් ඇවිලිනි. 'තෝරගන්න කෙනා දන්නව නම් අනිත් අයව මහන්සි නොකර යැව්වනම් හරිනේ..' චායා කණගාටුවෙන් සිතුවාය...

WWW.EXPRESSLANKA.TK 21

# 3

'යන්න..'

වායාගේ වාරය ආපසු නිලංකා සුන්දර සිනාවක් පා වායාට කීවාය. වායා නැගිට්ටේ ආත්මානුකම්පාවෙනි. 'සමහර විට අර සර් කියපු කෙනා දැනටමත් තෝරගෙනත් ඇති.. අපිව හරවලා යවන්න බැරිකමට කතාකරනවා..' වායා කළුවීදුරු දොර අරින ගමන් සිතුවාය.

දෙදෙනාගේම නෙත් එකඑල්ලේ යොමුව තිබුනේ වායා වෙතය. ඇගේ දෙපා වෙව්ලන්නාක් මෙනි. තරමක් විශාල ඔෆිස් කාමරය ඇත්තෙන්ම සුන්දරය. එහි මැද තිබූ විශාල පුටුවක මැඩමුත් ඊට එහා අසුනක ඔහුත් අසුන්ගෙන උන්නෝය. ජීවිතයේ ප්‍රථම වරට වගකිව යුතු සමාජයකට පයතැබූ විට දැණෙන නොඉඳුල් සබකෝලය වායා තුළ විය.

වායා මේසය අද්දරටම පැමිණ තමාට පුරුදු මෘදු හිනාව පමණක් පෑවාය. අමුතුවෙන් සිනාවක් මවාගන්නට ඇයට අමතක විය.

'ගුඩ් මෝනින් මැඩම්.. මෝනින් සර්..'

'මෝනින්.. ඉඳගන්න.'

මැඩම් කීවාය. ඔහු මේසය මත තිබූ වීදුරු බෝලයක් කරකවනා ගමන් වායා දෙස බලාගෙනම උන්නේය.

'මොකක්ද මේ ළමයගේ නම..'

මැඩම් අයදුම් පත් මිටිය ගෙන එය තෝරනා අතරතුර ඇයදෙස බලාඇසුවාය. මැඩම්ට ඕනා වූයේ ඇයව නෙත් පුරා දැකගන්නටය.

'වායා කල්පනී රණසිංහ..'

වායා කියූයේ වඩාත් බරවය. මැඩම් අයදුම් පත් ගොඩෙන් ඇගේ අයදුම් පත තෝරද්දී ඇය ඔහු දෙස බලා ගෞරවාන්විතව සිනාසුනාය.

WWW.EXPRESSLANKA.TK 22

'පුතා සෙට්ෆිකට් බලන්න..'

ඔහු උඩ බලාගෙන ඉඳිද්දී මැඩම් කීවාය. ඔහු චායා දෙසට දෑතද දෑසද දිගු කළේය. චායාගේ පපුව දෙවන වතාවටත් ආත්මානුකම්පාවෙන් පිරුනි.

ඔහු ෆයිල් කවරය විවර කර ඔහේ පෙරළන අතරතුර චායාදෙස තවත් වතාවක් බැලුවේය. එවර ඇයට බිම බැලුනි. මේ සහතික ටික අරගෙනද රස්සාවලට ආවේයැයි ඔහු සිතනවා විය යුතුයැයි ඇයට සිතුණි.

'මේ ළමයා හෝමාගම කොහෙද..'

මැඩම් චායා අත් අකුරින් ලියා එවූ අයදුම් පත අතට ගෙන ඇසුවාය. තමාට එය ටයිප් කර වත් එවන්නට බැරිවුනා නේදැයි ඇයට සිතුණි.

'හෝමාගමට චුට්ටක් එහා මැඩම්.. ගොඩගම.'

'මීට කලින් කොහෙද වර්ක් කළේ..'

'කොහෙවත් නෑ මැඩම්.. මේ පළවෙනි වතාවට ජොබ් එකකට ඇප්ලිකේෂන් දැම්මේ..'

චායාගේ දෑස්වල තිබූ අවංකබව ඇගේ කටහඬේද විය. මැඩම් ඒ දෙස තියුණුව බැලුවාය.

'අම්මයි තාත්තයි මොනවද කරන්නේ..'

චායාගේ පපුව ඇවිළිනි.

'තාත්තා අවුරුදු හතරකට කළින් නැතිඋනා.. අම්මා විතරයි ඉන්නේ.'

චායාගේ දෑස් තෙත්වන්නට ළංවිය. ඇය ආයාසයෙන් කඳුළු නවතාගත්තාය. මේ ජීවිතය ගැන අනුකම්පාවෙන් සිතිය යුතු මොහොතක් නොවේ.

'තාත්තා මොනවා වෙලාද නැතිඋනේ.'

'හොඳට උන්නා.. හිටපු ගමන් අසනීප වෙලා නැතිඋනා. ඩොක්ටර්ස්ලා හරියට ලෙඩක් කිව්වෙත් නෑ.'

WWW.EXPRESSLANKA.TK 23

වායා මැඩම්ගේ දෙනෙත් දෙසම බලාගෙන කීවාය. මැඩම් හැරී තම පුතා දෙස වරක් බැලූවාය.

'තාත්තා මොනවද ජොබ් එකට කළේ..'

'තාත්තා ඉංජිනේරු ඩිපාට්මන්ට් එකේ ඩිසයිනර් කෙනෙක් විදිහට වැඩකළේ.'

'තාත්තා නැතිවෙන කොට මේ ළමයට වයස කීයද..'

'විසි එකයි..'

තාත්තා ගැන මේ තරම් අහන්නේ ඇයිදැයි වායා දූකෙන් සිතුවාය. එය ඇගේ පපුව පෑරීමකි.

'අම්මා මොනවද කරන්නේ.'

'අම්මා රස්සාවක් කරන්නෑ.'

'පවුලේ තව අයියලා අක්කලා ඉන්නවා ඇති..'

'නෑ මං විතරයි..'

'මේ ළමයයි අම්මයි විතරයි.'

'ඔව්..'

'එතකොට මේ ළමයයි අම්මයි ජීවත් වෙන්නේ.'

මේ මහා පුදුමාකාර සම්මුඛ පරීක්ෂණයකි. වායාට පුදුමය.

'තාත්තගේ පෙන්ෂන් එක ලැබුනා. අම්මත් පුංචි පුංචි දේවල් කළා.'

වායාට සියල්ල කියවෙයි. ඇය උන්නේ මෝහනයට පත්වූවෙකු මෙන් තමාව අමතකවය.

'මොනවද..'

'කේටරින් තැනක වැඩකළා.. තව පොඩි පොඩි ඒවා..'

ඇය අසරණව වචන ගැලපුවාය. ඔහු අම්මා දෙසම බලා උන්නේය. මේ කෙල්ලගෙන් මේවා අහන්නේ අහවල් දේකටදැයි ඔහු සිතුවේය.

'ඉතින් ජීවත් වෙන්න මදිනේ..'

'පුළුවන් විදහට පිරිමහ ගත්තා.. අම්මයි මායි විතරනේ..'

WWW.EXPRESSLANKA.TK 24

'ගෑණු දෙන්නෙක්ට තනියම ජීවත් වෙන්න බෑනේ...'

එහෙත් පසුගිය වසර හතර පුරාම වූයේ එය බව චායා දනී. කෙසේ වුවද මේවා මෙතනට අදාළද.

'අම්මයි තාත්තයි නෑදෑයෝ වැඩිය ආශ්‍රය කළෙත් නෑ. නැන්දා කෙනෙක් විතරක් ඉන්නවා. බැඳපු නැති. එයා ඉඳලා හිටලා එනවා..'.

මැඩම්ගේ දෙනෙත් යංතමට පුංචි විය. චායා අසරණව සිනාසුනාය. කොයි මොහොතක හෝ දූත් යන්න.. දන්වලා එවන්නම්.. යැයි කියන තුරු ඇය අමාරුවෙන් ඉවසා උන්නාය.

'ඇයි ඉතින් රස්සාවක් කරන්න හිතුවේ.'

චායා තත්පර තිහක් හතළිහක් පමණ නිහඬව උන්නාය. 'මාව අඩවන්න ඔය යන්නේ..' ඇය සිතුවාය.

'දූත් ටිකක් අමාරුයි.. අම්මටත් ඉඳහිට අසනීප වෙනවා.'

එක්කෝ මේ ප්‍රශ්න වලට බොරු කිව යුතුය. 'රස්සාවක් කරන්න ආසයි..'.. 'මේ ෆීල්ඩ් එකට කැමතියි..' වගයෙන් කිව යුතුය. නැත්නම් යායුතුය. චායා අහනා දේට ඔහේ උත්තර දුන්නේ එයවඩාත් පහසු නිසාය. මොනතරම් දුප්පත් වුවද ජීවිතය මවා පෙන්වන්නට ඇගේ දිව නොනැමෙයි.

'මේ රස්සාවට දන්න හිතුනේ ඇයි.'

'පත්තරේ තිබ්බ තුන හතරකට දැම්මා.. දෙකකින්නුයි ආවේ..'

'අනිත් එක මොකක්ද ජොබ් එක..'

'ඒක කරන්න අමාරු එකක්..'

'ඇයි.'

'රෑ දහය එකොළහ වෙනකම් වැඩ. එච්චර රෑ වෙලා බයයි.. අම්මත් එපා කිව්වා.'

චායා ඔහු දෙසත් බලා කීවාය. ඔහු කිසිවක් අසන්නේ නැත. බලා ඉන්නවා පමණි.

'චායාට මේ රස්සාව ගැන මොනවද දන්නේ..'

චායා බිම බලාගත්තාය. උසස් පෙළට ගිණුම් විෂය ඉගෙන

WWW.EXPRESSLANKA.TK 25

ගත් නිසා තරමක දැනීමක් පමණක් ඇයට ඇත.

'ම්..මම.. වැඩිය දන්නැ. පුහුණුවෙන කෙනෙක් කියලා තිබ්බ නිසා පුරුදු උනොත් කරන්න පුළුවන් කියලා හිතුනා.'

ඒ ඇස් අසරණය. උකුලේ තියෙන ඇගේ දෑත් වල ඇඟිලි තුඩු එකට වෙලී හුදෙකලාවේ තිබුණි.

'ඕන දේකට පුරුදු වෙන්න පුළුවන්ද.'

'පුළුවන් මැඩම්..'

'මං චායාට කිව්වොත් මේ ඔෆිස් එක අතුගාන්න කියලා..'

චායා හිස ඔසවා සිනාසුනාය.

'ඇයි හිනාවෙන්නේ.'

'ඒක පුරුදු වෙන්න ඕනැ නෑ.. මට හොඳට පුළුවන්.'

'මේ කට්ටිය.. අර පහල ඉන්න ළමයි.. තිලංකා. ඒ සේරම බලාගෙනනේ.. ලැජ්ජ නැද්ද චායාට..'

'එහෙම නෑ.. මට පුළුවන්..'

මැඩම් සිනාසී තම පුතු දෙස බැලුවාය. ඔහුද ඒ අනුව සිනාසී චායාදෙස බැලුවේය. චායා අසරණව බිම බලාගත්තාය.

'මේ චායගේ අත් අකුරුද..'

මැඩම් චායා එවූ අයදුම්පත පෙන්වා ඇසුවාය. එය ලියා තිබුනේ ඉංග්‍රීසියෙනි.

'ඔව්..'

'දවස්හතේම වැඩ කරන්න උනොත්.. නිවාඩු දවස්වලත්..'

'කමක්නෑ.. ගෙදරත් නිකං ඉන්නේ.. මං වැඩ කරන්න ආසයි.'

මීට කලින් ඇතුළට ආ යුවතියන්ව මේ තරම් කාලයක් තබාගත්තේ නැතිබව චායා පුදුමයෙන් සිතුවාය. ඇය කල්පනා කරන අතරතුර මැඩම් ඇය දෙසම බලා උන්නාය. චායා ටික වෙලාවකට පසු හිසඔසවා මෘදු ලෙස සිනාසුනාය.

ඒහිනාව ඇතුලේ සියළු අව්‍යාජකම් ලියැවී ඇතැයි රණතුංග මහත්මියට සිතුණි. ඇය තම පුතු දෙස බැලුවේ ඒ සිනහව හඳුනාගත්තැද්ද... WWW.EXPRESSLANKA.TK 26

දෙස බලා සිනහසුනේ සුන්දර ලෙසය. අසංක අම්මා හිතන්නේ මොනවාදැයි දන්නේය.

"මේ ළමයා පඩි කීයක් විතර බලාපොරොත්තු වෙනවාද."

ඒ ප්‍රශ්නයට දියහැකි පිළිතුරක් ඇය වෙත නොවීය.

"මං එහෙම මුකුත් හිතුවේ නෑ."

"ඇයි.. රස්සාවකට එනකොට පඩි ගැන බලන්න ඕනනේ.."

"මං මුකුත් දන්නෑ.. පුහුණුවෙන්න හිතාගෙනයි ආවේ.."

"සාමාන්‍යයෙන් ඔයා කීයක් විතර.."

වායා අහිංසක අසරණ හිනාවක් පෑවාය.

"මං දන්නෑ.. මැඩම් දෙන දෙයක්."

"හරි ළමයෙක්නේ..."

රණතුංග මැතිණිය සුන්දරව සිනාසී කීවේය. වියපත් වුවද ඒ සිනහව තරුණයැයි වායාට සිතුණි.

"කවුද ඔය සාරිය ඇන්දෙව්වේ.."

වායාගේ සිත ලැජ්ජාවෙන් බරවිය. කොහේ කොතනක හෝ වැරැද්දක් සිදුවී ඇත. මැඩම් එයම ඇසුවේ සමච්චලයට විය යුතුයැයි ඇය සිතුවාය.

"මං සාරි අඳලා නෑ මැඩම්. අම්මා උදේ ඇන්දුවේ.."

වායා සාරිය දෙස නෙත් යොමා කීවාය. ජීවිතයේ මොන දේවලින් වත් කිළිටි නොවූ නිකළැල් බවක් ඇය තුළ වීනැයි රණතුංග මහත්මියගේ වියපත් හදවතට සිතුණි.

"ලස්සනයි.. සාරිය ඇඳලා තියෙනවා.. ඒකයි ඇහුවේ."

වායගේ පසුවට සැනසිල්ලක් දැනුණි. ඇය දෙකුන් වතාවක් අම්මාට පින් දුන්නාය.

"බෝයි ෆ්‍රෙන්ඩ් මොනවද කරන්නේ..."

වායා ඒ ප්‍රශ්නයෙන් වඩාත් කැළඹුනාය. ඇය තත්පර දෙක තුනකට පසුව හිස එසවූයේ අර පුරුදු සිනාවෙන්මය.

"එහෙම කෙනෙක් නෑ."

ඇය හිමිහිට කීවාය. රණතුංග මහත්මිය එය පිළි නොගන්නා

WWW.EXPRESSLANKA.TK 27

අයුරින් සිනාසුනාය. වායා අසරණව ඒ හිනාව දෙස බලාඋන්නාය.

'මෙච්චර ලස්සන කෙල්ලෙකුට කොල්ලෙක් නෑ.. පුතා විශ්වාස කරනවද..'

අසංක ඒ දෑස් දෙස බැලුවේය. වායා පුදුමයෙන් දෙදෙනාම දෙස බලා බිම බලාගත්තාය.

'හිටියට කමක් නෑ.. කියන්න.. අපි හැමෝගෙන්ම අහනවා.. ඒක වරදක් නෙමේනේ..'

ඒ අසංක කතාකළ ප්‍රථම වතාවය. වායා නෙත් ඔසවා ඔහුදෙස බලා ඒ දෙනෙත් ලොකු කරගත්තාය.

'මං ඇත්ත සර් කියන්නේ. එහෙම කව්රුත් මට නෑ. මගේ අම්මා විතරයි මට ඉන්නේ.'

රණතුංග මහත්මියගේ පපුව හෝස් ගා ඇවිලිනි. බොහෝ යුවතියන්ගේ කටහඬ තුළ නැති අවංක නිර්මල බවක් මේ හඬ තුළ ඇතැයි ඇය සිතුවාය.

'ඇයි ඒවා ගැන හිතුවේ නැත්තේ.'

අනතුරුව ඇය සන්සුන්ව ඇසුවාය.

'මට අම්ම ඉන්නවා.. අම්මට මම ඉන්නවා.. මට ඒ ඇති මැඩම්..'

'අම්මා ඔයාගේ මැරේජ් එකගැන කතා කරන්නෑ ඔයා එක්ක.'

වායා' නැහැයි' කියන්නට මෙන් හිසවැනුවාය.

'ඇයි ඒ..'

'අම්මා හිතනවා ඇති. මට කියන්නෑ.. තාත්තා නැති උනාට පස්සේ අපි ගොඩාක් තනිවුනා.'

යුවතියගේ දෙනෙත් ලාවට තෙත්ව තිබෙනු රණතුංග මහත්මිය දුටුවාය. 'අසරණ කෙල්ල තවත් හිටියොත් අඬනවා..' ඇයට සිතුණි.

'වායාට මේ රජසාව ලැබෙයි කියලා විශ්වාසයක් තියෙනවද.'

වායා අසරණව සිනාසුනාය.

'දන්නෑ මැඩම්..'

WWW.EXPRESSLANKA.TK 28

එසේ කියා ඇය ඔහුදෙස බැලුවේ.. 'සර් නම් දන්නවා කවුද තෝරගන්නේ.' කියා කියන්නට මෙනි. අසංග වඩාත් විශ්වාසවන්ත ලෙස සිනාසුනේය.

'අම්මී.. මං පහළට ගිහිල්ලා එන්නම්.'

අසංක නැගිට්ටේ වායා දෙස තවත් වරක් බලාය.

'තව තුන් හතර දෙනෙක් ඉන්නවනෙ පුතා.'

'අම්මා එයාලට කතාකරලා යවන්න.'

රණතුංග මහත්මිය කිසිවක් කීවේ නැත. වඩාත්ම වැදගත්දේ කෙනෙකු තෝරා ගැනීම නම් ඒ තීරණය ගෙන හමාර බව අසංක දනී. තවත් කාලය කාදැමිය යුතු නැත.

'හරි.. වායා හෙට හරියටම උදේ දහයත් දෙළහත් අතර මට කතාකරන්න.. වරද්දන්න එපා... අර රිසෙප්ෂන් එකේ තිලංකාගෙන් නම්බර් එක ඉල්ලගෙන යන්න.'

අසංක දුරකථන අංකය ලබාගන්නට පවත් දෙද්දී රණතුංග මහත්මිය කීවාය.

'හොඳයි මැඩම්.. මං යන්නම්.. යන්නම් සර්..'

ඇය අසංක දෙස බලා මෘදුව කීවාය. අසංක හිසවනා කාමරයෙන් පිටවිය.

'වරද්දන්නෙපා.. කතාකරන්න.'

වායාගේ පපුව වඩාත් තදින් සැලෙයි. ඇය කාමරයෙන් පිටට යද්දී වෙනම කොනක ගසා තිබූ බුදුරුව දෙස බැලුවාය. එහි පහනක් දල්වෙයි. බුදු හාමුදුරුවෝ වැරදිලාවත් මං දිහාව බලලද.. වායා පුදුමයෙන් සිතුවාය.

වායා එළියට යද්දී එහි තවත් යුවතියන් හතර දෙනෙක් පමණ රැඳී උන්නෝය. ඔවුන් සියල්ලම ඇය දෙස බැලුවේ කෝන්තියෙන්මෙනි. වායා බිම බලාගත්තාය. අසංක තිලංකා ළඟ හිටගෙන උන්නේය. ඇයද දුරකථන අංකය ලබාගන්නට තිලංකා ළඟ නැවතුනාය. අසංග එවර නොත්පුරා වායාව දකගත්තේය. වායා අපහසුතාවයෙන් බිම බලාගත්තාය.

WWW.EXPRESSLANKA.TK 29

'මෙයා සාරිය ඇඳලා තියෙනවා ලස්සනද නිලංකා..'

අසංක සිනාසී ඇසුවේය. වායාගේ පපුව පත්තුවිය. 'මාව විහිළුවට අරගෙන හැමෝම..' නිලංකා වායා දෙසබැලුවාය. ඇගේ ඇස් අසරණව බිමට පාත්විය.

'ලස්සනයි සර්.. ඇයි සර් එහෙම ඇහුවේ.'

'අම්මා සැට්ටිෆිකට් එකක් දුන්නනේ.. ඔය ආඩම්බරකමට ඉන්නේ.'

වායා යංතමට සිනාසී ඔහුදෙස බැලුවාය.

'මැඩම් එහෙමයි..'

නිලංකා අවංක හඬින් කීවාය.

'නිලංකාගේ මොකක්ද ලස්සනයි කියන්නේ.'

ඔහු අහද්දී වායාට සිනායන්නට ආවාය. ඔහුට ඇත්තේ පුදුමාකාර ගතිගුණය.

'කටහඬ.. ටෙලිෆෝන් එකෙන් කතා කරනකොට ඇන්ජලින් වගේලු..'

අසංක සිනාසුනේ මහ හඬිනි. වායාද සිනාසුනාය.

'බොරු නෙවේ සර්..'

'ඇත්ත. ඇත්ත.. මටත් දවසක් කිව්වා. මං කිව්වා නිලංකාව දලා කැසට් එකක් කරමු කියලා.'

නිලංකා බිම බලාගත්තාය. ඔහුට දන්නේ කෙනෙක් අසරණ කරන්නට පමණි.

මට ටෙලිෆෝන් නම්බර් එක ඉල්ල ගන්න කිව්වා.

වායා අතරවාරයෙන් ලද මොහොතේ කීවාය. නිලංකා පුදුමයෙන් මෙන් අසංග දෙස බලා දෙනෙත් ලොකු කර ගත්තාය. කාටවත් දුරකථන අංක දෙන්නට කීවේ නැත.

'මෙයාට දෙන්න කිව්වා. කාඩ් එකක් දෙන්න.'

නිලංකා කාඩ් එක වායා අත තැබුවාය.

'මං යන්නම් සර්...'

'හොඳයි.'

WWW.EXPRESSLANKA.TK 30

ඔහු සිනාවක් පා කීවේය.

'යන්නම්..'

චායා නිලංකා දෙසද බලාකීවාය.

'හොඳයි මැඩම් කිව්ව වෙලාවට කෝල් කරන්න.'

'හා..'

චායා බිම බලාගෙනම එතනින් ඇවිදගෙන ගියාය. අසංක ඇගේ ලතාවකට යන ගමන දෙසම බලාඋන්නේය. නිලංකා බලාඋන්නේ ඒදෙස බලා ඉන්නා අසංග දෙසය.

'කෙල්ල හරි ලස්සනයි නේද සර්..'

නිලංකා මඳ සිනාවක් පා ඇසුවාය. අසංක මේසයට තට්ටු කොට සිනාසුනේය.

'හ්ම්. හ්ම්..'

ඔහුගේ හඬත් සමගම හිසද වැනුනි. චායා පඩිපෙළේ අන්තිම පඩිය බැස හැරී බැලුවාය. අසංකගේ දෙනෙත් ඇයට ඈතදී හමුවිය. චායා බිම බලාගෙන එතනින් පහලට ගියාය.

'කෝ අර මං ලියලා දුන්න කොළේ.'

අසංක ආඩම්බරයෙන් නිලංකාට කීවේය. නිලංකා ලාච්චුවේ දමාගෙන උන් කොළය අතට ගත්තාය.

'නැඹිලි පාට සාරිය ඇඳගෙන ඉන්න සුදු ගර්ල්..'

එහි ලියා තිබුනේ එපමණකි. නිලංකාට ඇත්තටම පුදුමය.

'දැන් මොකද කියන්නේ නිලංකා..'

අසංක ඇසුවේය.

'මැඩම් ඇත්තටම තෝර ගත්තද සර්..'

'තෝර ගත්තා විතරක් නෙවේ ඒ කෙල්ල අනිද්ද ඉඳලා වැඩ.. බොරුද බලන්න.'

අසංක සෙලියුලර් දුරකථනයත් යතුරත් අතට ගෙන කීවේය.

'මටනම් ඇත්තටම පුදුමයි.'

'මාව අම්මා ඇහුවොත් ශාන්ති විහාර් එකට කන්න ගියා

WWW.EXPRESSLANKA.TK 31

කියන්න.'

අසංක එසේ පවසා පහළට බැස්සේය. ඔහු වාහනය තුළට නැග්ගේ යතුරද කරකවා ගෙනය. 'චායා' ඒ නම නිකමට මෙන් අසංකට නැවත වතාවක් සිහිවිය.

# 4

අසංක ඩබල් කැබ් රථය තුන්මුල්ල වට රවුමෙන් හරවා ශාන්ති විහාර් අවන්හල පැත්තට හැරවුවේය. ගාලුපාර පැත්තේ සිට සෙමෙන් සෙමෙන් තුම්මුල්ල පැත්තට එන චායාව ඔහු දුටුවේ එවිටය. අසංග මොහොතකට වාහනය නවතා බලා උන්නේය. අම්මාට ලස්සන යැයි කියන්නට තිබුනේ සාරිය නොව ඒ මුහුණයැයි අසංගට සිතුණි.

ඔහු ඕනා තරම් කෙල්ලන්ව දැක ඇත. ඒ මුහුණු වලට ළංළංව බලාඇත. ඒත් ඒ කිසි මුහුණක නොදුටු ලස්සනක් මේ මුහුණේ ඇතැයි අසංකට සිතුණි. උදේ ඒ මුහුණ දුටුවිටම අම්මා ඇයව තෝරාගනීයැයි අසංකට ඇත්තටම සිතුනේ නැත. නමුත් අම්මා යුවතියකගේ සොයන යම් යම් දේ ඇය තුළ විතැයි අසංකට සිතුනි. ඒත් අම්මාට වඩා ඔහුගේ හිත ඇයව තෝරාගත්තේය.

ඒ තෝරාගැනීම කුමකටදැයි අසංක දන්නේ නැත. ඔහු සම්මුඛ පරීක්ෂණය පුරාම කළේ ඒ මුහුණදෙස බලා ඉඳීම පමණි. පෙම්වතෙකු ගැන ඇසූ ප්‍රශ්නයෙදී පමණක් ඇගෙන් ඉක්මනින් පිළිතුරක් ලබාගන්නට ඔහුට අවශ්‍යවිය. එතනදී පමණක් ඔහු කට දැම්මේ ඒනිසාය.

ඈතට පෙනෙන මේ රුව තව එක්වරක් ළඟට බලාගැනීමේ බොළඳ ආශාවකින් ඔහුගේ පිරිමි සිත පිරුණි. ඔහු ගීතයක පදයක් මුමුණා වාහනය වට රවුමෙන් අනිත් පැත්තට දමාගත්තේය. චායා යන්නේ හෝමාගමට නම් ඇය යා යුත්තේ අනිත් අතටය. කෙල්ල කොළඹ පාරවල්වල අතරමංව ඇතැයි අසංකට සිතුණි. ඔහු චායා

ඇවිදගෙන ආ පදික වේදිකාව සමීපයට වාහනය ගෙන වේගය බාල කළේය. වායා හිය ඔසවා බැලුවේ නැත. ඇය උන්නේ බර කල්පනාවකය. අසංග වාහනය රේස් කළේය.

වායා හිස ඔසවා බැලුවාය. අසංක අහම්බෙන් ඇයව දුටුවාක් මෙන් සිනාසී වාහනයේ එහා අසුනේ වීදුරුව ස්වයංක්‍රීය බොත්තමෙන් පහළට දැමුවේය. වායා නැවතුනාය. නොවේනම් ඇගේ දෙපා නැවතිණි.

'සර්..'

වායා මිමිණුවාය. ඇය ඔහුදෙස බැලුවේ පුදුමයෙනි.

'කොහාටද බස් එකගන්නේ.'

ඔහු නොදන්නා ලෙසට ඇසුවේය.

'හෝමාගමට සර්..'

'බස් නවත්තන්නේ අතන.. ලක්සල ළඟ.. ඔය පැත්තේ තියෙන්නේ කැම්පස් එක..'

අසංක සිනාසී කීවේය. ඒ මුහුණ දැන් සමීප රූපයක්ව වාහනේ ඇරුණු වීදුරුව අතරින් පෙනෙයි. කාගෙදෝ මුහුණක ඡායාවක්.. අසංක සිතුවේය.

'තැන්කියූ සර්.. මං දන්නෑ නැත.'

වායා වඩාත් අහිංසකව ඔහු දෙස බලා කීවාය. තව ටිකක් ඇයදෙස බලා ඉන්නට ඔහුට සිතුණි.

'හෙට මතක ඇතුව අම්මට කතාකරන්න.'

ඔහු කීවේය.

'හා සර්..'

'හරි.. මං යනවා.'

'හොඳයි සර්..'

වායා බලා ඉඳිද්දීම අසංක වාහනයේ වීදුරුව යළිත් වසාගත්තේය. වීදුරුව අතරින් ඒ රුව පෙනුනේ වඩාත් සුන්දරවය. ඔහු ගියරය දමා වේගයෙන් ඉදිරියට ගියේය. වායා තවමත් නැවතී උන්නැනමය. ඇයට මේ කිසිවක් තේරුම් ගත නොහැක.

තවමත් වායාට මේ සියල්ල අවිශ්වාසය. විශ්වාසය නැබිය

WWW.EXPRESSLANKA.TK 33

හැකිදේ අනන්ත වූවද ඇගේමෝඩ හිත ඒ සත්‍ය බාරගන්නට සූදානමක් නැත. සම්මුඛ පරීක්ෂණයට ආ යුවතියන් විසි දෙනාගෙන් සමහර විට අඩුම සුදුසුකම් ඇත්තේ තමාට විය යුතුය. උසස් පෙළ සමත් විභාග ප්‍රතිඵල සටහන අද කාලයේ ගණන් ගන්නේවත් නැති සහතිකයකි.

සම්මුඛ පරීක්ෂණයට ආ අයගෙන් කතා කරන්න කියා ඇත්තේ තමාට පමණි. එයද පුදුමාකාරය.

ජීවිතයේ බොහෝ දේ නොදනීම අභිමිවූ තමා වැනි සාමාන්‍ය යුවතියකට මෙවැන්නක් හිමිවෙතැයි සිතීම එක අතකින් පුදුමාකාරය. මේ කෙනෙකුගේ බාහිර දිස්නයෙන් ආටෝප වලින් මවාගත් වටිනාකම් වලින් මිනිසුන් මනිනා යුගයකි. බොහෝ මිනිසුන්ට කෙනෙකුගේ ආත්මයේ ඇතුලාන්තය දැනගැනීමට අවශ්‍ය නැත. අවශ්‍ය වන්නේ මතුපිට විච්චූර්ණ පමණි. එවන් තත්වයක් තුළ මැඩම් ඇසූ ප්‍රශ්න පුදුමාකාරයැයි වායා සිතුවාය. ගෙදර ගොස් අම්මා සමගවත් කතාකර මේ බර නිදහස් කරගත යුතුයැයි වායා තුන් මුල්ලෙන් පාරපැන බස් නැවතුමට යන අතරතුර සිතුවාය.

වායා බස්රියකට නැග අසුනක ඉඳගත්තේ සැනසුම් සුසුමක් හෙළමිනි. ටිකට් පත ලබාගෙන ඇය කවුළුවට බරව කලම්බු ෆැෂන් කම්ප්ලෙක්ස් වෙත ගිය මුල්ම තත්පරයේ පටන් දුන් මොහොතකට කලින් වූදේ දක්වා සියල්ල සිහිකළාය. සම්මුඛ පරීක්ෂණයට ආ කිසිම යුවතියකට තමා මුහුණ දුන් අත්දැකීම් වලට මුහුණ දෙන්නට නොවූ බව ඇයට විශ්වාසය.

එක්කෝ තමා වැනි කෙල්ලෙකු නිකම් කම්මැලිකම යන්නට මැඩවූවා වත්ද කියා ඇය සිතුවාය. එහෙත් එවැනි රැවටීමක් වංචාවක් ඔප්පු කරන්නට තරම් සාක්ෂි ගෙවුන පැය එකහමාර තුළ සොයාගන්නට ඇය අසමත්වූවාය.

වායා ඉඳගෙනම තම සාරිය දෙස නැවතත් බැලුවාය. එය ලස්සනයැයි.. ඔවුන් කීවේ විහිළුවටද.. නැත්නම් ඇත්තටම ලස්සන නිසාද.. වායා සිතුවිලි ගොඩක අතරමංවූවාය.

සර්.. අම්මා තෝරා ගත්තේ මෙයාව යැයි.. ලියා නිලංකාට කොළයක් දුන්නේය. එහි ලියන්නට ඇත්තේ කාගැනද.. රැකියාව

ලැබුනද නොලැබුනද තමාගේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණය නම් මහ පුදුමාකාර එකකැයි චායා සිතුවාය.

චායා ගෙට ඇතුළු වූයේ සාරි පොට මූහුණට තබාගෙනය. අම්මා පෙනෙත්තට උන්නේ නැත. චායා කුස්සිය දක්වා ගියාය. පද්මා දවල්ට උයන්නට හාල් මැස්සන් කරවලගෙන එහි ඔළු කඩමින් උන්නාය. චායා දුටුවනම පද්මා දෙස බලා කුතුහලයෙන් සිනාසුනාය.

'මොකද රත්තරන් උනේ...'

චායා වෙහෙසබර සිනාවක් පා කුඩා පුටුවේ ඉඳගත්තාය. පද්මා දිගටම දුවදෙස බලා උන්නාය. 'පව්.. දහක් බලාපොරොත්තු තියං ගිහිල්ලා හිස් අතින් එන්න ඇති.' පද්මා වේදනාවෙන් සිතුවාය.

'අනේ මන්ද අම්මේ. මේක පුදුම ඉන්ටර්වීව් එකක්. මටම පුදුමයි.'

චායා හුල්ලා කීවාය. පද්මා කල්පනාවෙන් ඇයදෙස බැලුවාය.

'ඇයි පුතේ...'

'මං විස්තර කියන්නම් අම්මේ.. කෝ කිරිබත් හරි බඩගිනියි..'

චායා කරේ දමාගෙන උන් හැන්ඩ් බෑග් එක කරින් ගලවා බිම තැබුවාය. පද්මා කිරිබත් කෑලි දෙකකට ලුණු මිරිස් දමා ඇය අත තැබුවාය.

'දැන් තමයි කිරිබත් වල නියම රහ එන්නේ..'

ඇය සිනාසී කීවාය. පද්මා දිගටම දුවදෙස බලා උන්නාය. මේ ජීවිතය බර වැඩිය. ඒ බර දරන්නට තරම් ඇය තවම මෝරා නැත.

'තේ එකකුත් හදන්නද පුතේ.'

'අම්මත් කීලා නෑ නේද.'

'මමත් ඔයා එනකල් උන්නේ.'

'එහෙනම් හදන්න..'

චායා කිරිබත්කෑලි දෙක අන්තිම වෙනතුරු කා බෑග් එකත් රැගෙන කාමරයට ගියාය. පද්මාට දුවගේ හැසිරීම ප්‍රශ්නයකි. ලෝකේ ගැන අත්දැකීමක් නෑ. පොඩි දේටත් හිත හෙල්ලෙනවා.. තාත්තා හුරතලේටනේ හැදුවේ.. ඇය සිතුවාය.

WWW.EXPRESSLANKA.TK 35

චායා කාමරයට ගිය වනම කන්නාඩි මේසය ළඟ ඉඳගෙන සාරියේ හැඩ බැලුවාය. මැඩම් ලස්සනයි කියන්නට ඇත්තේ බොරුවට නොවිය යුතුය. එයම තිලංකාද අනුමත කළාය.

පද්මා තේකකුත් රැගෙනම කාමරයට ආවාය. චායා උන්නේ සාරියේ පොට හදමින් එය කැඩපතින් බලමිනි.

"දැන් ඕකගලවලා දන්න.. මහන්සිත් ඇතිනේ."

පද්මා සිනාසී කීවාය. චායා අම්මා දෙසටම හැරී වෙනස්ම ලෙස සිනාසුනාය.

"අම්මා හරි ලස්සනට මට සාරිය අන්දලා..."

"ඇයි කවුරුහරි කිව්වද.."

අම්මා එකවරම අසද්දී චායාට පුදුම සිතුනි.

"අම්මා කොහොමද දන්නේ.."

"ඔයාට කවදාවත් ඔයාගේ ලස්සන පේන්නෑ.. කවුරුහරි කිව්වාම ඉතින් හරි අගෙයි.. ආවගමන් කන්නාඩිය ළඟ කැරකෙන්නේ ඒකනේ."

"ඇත්තටම අම්මේ.. සාරිය ලස්සනයි කියලා කෙනෙක් කිව්වා."

"කවුද.."

"මාව ඉන්ටවීව් කරපු මැඩම්.. ෆැෂන් කම්ප්ලෙක්ස් එකේ අයිතිකාර මැඩම්..."

චායා දෙනෙත් ලොකු කර සිනාසී කීවාය.

"පුදුමයි.. ඉන්ටර්වීව් කරන අය එහෙම දේවලුත් කියනවද.."

"ඒකනේ පුදුමේ.. මගෙන් ඇහුවා කවුද ඇන්දුවේ කියලා."

"ඉතින්."

"මං කිව්වා මං ඇන්දෙන් අදමයි.. මේක ඇන්දුවේ අම්මා කියලා."

"මෝඩ ළමයා.. ඔයාට තිබ්බේ ඔයා ඇන්ද කියලා කියන්නනේ.. මාව ඔතනට මොකටද.. ඔයානේ ලකුණු දගන්න තිබ්බේ.. බොරුවක් කියන්න තිබුනා."

පද්මා කියද්දී චායා දෙනෙත් බිමට බර කරගත්තාය.

WWW.EXPRESSLANKA.TK 36

'බොරු කියන්න බැරි ගොඩක් ප්‍රශ්ණ මැඩම් ඇහුවා අම්මේ...'

වායා ඇඳමත ඉඳගෙන බිම බලාගෙන හැඟීම්බරව කීවාය. පද්මා දූවට වඩාත් කිට්ටු වූවාය.

'ඒ මොකටද..'

වායා කලම්බු ෆැෂන් කම්ප්ලෙක්ස් එකට ඇතුළුවූ තැනසිට සිදුවූ සියල්ල ඒ ලෙසම විස්තර කළාය. සිදුවූ සියල්ල පද්මාට මවාගන්නට අපහසු නොවීය.

'මැඩම් හරි පුදුම කෙනෙක් අම්මේ.. සර්රුත් එහෙමයි. මං බලාපොරොත්තු උන විදිහේ නෙවෙයි. හරි පුදුමයි.'

වායාගේ හඬ අසරණය.

'සමහර විට කලාකුරකින් හම්බවෙන විදිහේ හොඳ කරුණාවන්ත කෙනෙක් වෙන්න ඇති මැඩම්..'

පද්මා කීවේ සන්සුන්ව දූවගේ කතාව අසා ඉඳය.

'මටත් එහෙම නම් හිතුනා ඒත්..'

'සමහර විට පුතාට ඔය රස්සාව ලැබෙයි. ඔයාගේ මූණේ ඒ වාසනාවන්ත පාට තියෙනවා.'

වායා බිම බලා සිනාසුනාය.

'ගොඩාක් බලාපොරොත්තු තියාගන්න බයයි අම්මේ.. හෙට කෝල් කරන්න කිව්වනෙ. කෝල්කරලා බලනවා.'

'හැමදම පහන තියන බුදු හාමුදුරුවෝ වත් අපි දිහා බලනවානම් පුතාට ඔය රස්සාව ලැබෙන්න ඕන.'

පද්මා නෙත්වූ දෙනෙත්වලින් දූවදෙස බලාකීවාය.

'මටත් ඕක හිතුනා. ඔෆිස් එකේ මැඩම් පත්තු කරන බුදු පහන දැකලා. වැරදිලාවත් මං දිහා බලලද කියලා.'

'මෙච්චර කාලෙකට දුක මිසක් අපට කිසි දෙයක් ලැබිලා නැහැ. අපි වරදක් කරලත් නැහැ. අපි හෙට කෝල් කරලා බලමු.. දැන් ඔය ඇඳුම් ගලවලා දලා ඉන්න.'

WWW.EXPRESSLANKA.TK 37

පද්මා දියණියගේ හිස හෙමිහිට අතගා නැගිට්ටාය. චායා වළලු දමූ අත අම්මා වෙත පෑවාය.

'මේක ගලවලා අරන් තියන්න අම්මේ..'

පද්මා එය ගැලවූයේ නැත.

'අද දාගෙන ඉන්න. අතේ තියෙනකොට ලස්සනයි.'

චායා සිනාසුනාය. ඔරලෝසුව ගලවද්දී ඇයට සම්මුඛ පරීක්ෂණයට යුවතිය පැළඳගෙන ආ තඩි අත් ඔරලෝසුව සිහිවිය.

ඒක හොඳයි මේසේ උඩ තියන ටයිම් පීස් එකකට ගන්න.. ඇය සිතුවාය.

'අම්මා මොනවද දවල්ට හදන්නේ..'

'හාල් මැස්සෝ උයලා කතුරුමුරුංගා කොළ සම්බෝල හදනවා.'

අම්මා ගිය පසු චායා සාරිය ගලවා සැහැල්ලු ගවුමක් දාගෙන ඇඳේ පෙරළුනාය. කොට්ටයේ සතීපයට ඇගේ නෙත් ලාවට පියවිනි. මෙච්චර ලස්සන කෙල්ලෙක්ට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක්නෑ.. පුදුමයි.. මැඩම් ගේ වචන තුනී ඉරක්සේ චායාගේ හදවත මතුපිට ඇඳුනි. ඇය ලැජ්ජාවෙන් මෙන් දෙනෙත් තවත් තදකොට පියාගත්තාය. මැඩම් ජීවිතයේ මෙතෙක් දවසක් නොතිබූ නොහිතූ දෙයක් සිහිකොට තමාව අවුල් කළා යැයි චායා සිතුවාය.

# 5

චායා දහය වනතුරු උන්නේ නොඉවසිල්ලෙනි. ඔරලෝසුවේ කටිට අද දුවන්නේ බැටරි නැතුවදැයි ඇය දෙතුන් විටක්ම සිතුවාය. පාන්දර ඇහැරුනු වෙලේ සිට ඇය ඉන්නේ තැන තැනාය. එකතැනකට වී ඉන්නට තරම් සැනසීමක් හිතට නැත. තමා මේ නිකම් බොරුවට

හිත කලබල කරගෙන වැඩිවිදිනවා නේදැයි වායා සිතුවාය.

අම්මා උණු උණුවේම ඉඳි ආප්ප ගෙනවිත් කිරි හොදි තනා තිබුනාය. එහෙත් කන්නට පිරියක් වායාට තිබුනේ නැත..

'මං කෝල් කරලා ඇවිත්ම කන්නම් අම්මේ.. වහලා තියන්න.'

පද්මාට දියණිය ගැන දුක සිතුණි. ජීවිතය මේ කෙල්ලට වද දෙනවා නොවේදැයි ඇය වේදනාවෙන් සිතුවාය. ජීවිතය බලාපොරොත්තු වලින් නොපිරුන කල ඉතාම කුඩා දෙයකට පවා හිත ලෝබවී බලාපොරොත්තු පස්සේ ඇදවැටෙයි. ඒවා ඉටු නොවුන කල සිත තිබූනාටත් වඩා අසරණව කඩා වැටෙයි. ඒ අසරණකම දුව විඳිනවා දකින්නට පද්මා අකමැතිවූවාය.

'ඕක ඔච්චර හිතන්න එපා මැණික.. ලැබෙන දෙයක් තියෙනවා නම් ලැබෙයි. නොලැබෙන දෙයක් නම් නොලැබෙයි.'

ඇය එසේ කීවේ දුවව මානසිකව සුරක්ෂිත කරනු සඳහාය. ජීවිතයෙන් ඇද වැටෙන්නට තවත් අගාධයක් නොවුනද මේ නිස්කලංක පදූව පිච්චෙනවා ඇයට බලාඉන්නට නොහැක.

'මාත් ඒක දන්නවා අම්මේ.. ඒත් මට මොකක්ද වගේ.. අනේ මන්ද.'

'ලෝකේ හරි ලොකුයි පුතේ... අපිට තියෙන්නේ ගිනිපෙට්ටියක් වගේ ජීවිතයක් හරිම පුංචි.. ඒකයි පූතාට ඕවා ඔයතරම් හිතෙන්නේ.'

'මිනිස්සුන්ට නම් අපේ දූප්පත් ජීවිත පේනවා ඇත්තේ එහෙම තමයි අම්මේ.. අම්මට මතකද අපි තාත්තා ඉන්න දවස්වල සිරීපාදේ ගියා. අර මට කකුල් අමාරුවත් හැදුනේ.'

'ඔව්..'

'උඩම මළුවට ගියාම පහත නවත්තලා තියෙන බස් පේනවා ගිනි පෙට්ටි වගේ.. මිනිස්සු ඉන්නේ සිරීපාදේ වගේ කඳුවල අම්මේ.. අපිව එයාලට පේන්නේ ඒ වගේ තමා.'

දියණිය තමා හිතනා තරම් කුඩා කෝණයකින් ජීවිතය දෙස බලනා යුවතියක් නොවන බව පද්මා සිතුවාය. ඒ ගැන ඇය සතුටුද

WWW.EXPRESSLANKA.TK 39

උනාය.

'සල්ලි ටිකක් තිබුන නම් මොනවා හරි ගෙදර ඉඳලා කරන්න තිබුනා. එතකොට ඔයාට බස්වල රස්තියාදු වෙලා නන්නාඳුනන තැන්වල රස්සාවල් කරන්න ඕනනෑ. ඔයාව යැව්වට මටත් දුකයි.'

'ගෑණු අපි දෙන්නට කරන්න පුළුවන් මොනවද අම්මේ.. අඩුම ගානේ අපිට මල්ලි කෙනෙක් හරි අයියා කෙනෙක් හරි ඉන්න තිබුනා.'

වායා මීදුල දෙස බලා කීවාය. ඒ හැඟීම ඇයට දහ දෙළොස් වතාවක් සිතී තිබුනි.

'නොලැබුන දේවල් ගැන ඔයාකාරව හිතන්න එපා.. අපි දෙන්නා හාල් හුණ්ඩුවක් හරි උයාගෙන කාලා ඉන්නවනේ පුතේ.'

'අනාගතේදී ඒක කරන්න බැරිකමක් නෑ අම්මේ.. ඒත් නැත්නම් තේකක් බීලා හරි මට ඉන්න පුළුවන්.'

වායා දෙනෙත් කෙළවරක නැඟුන කඳුළ අම්මාට නොපෙන්නුවාට දුව අඩනා බව පද්මා දන්නීය. දියණියගේ ජීවිතට කඳුළුම පමණක් උරුමය වෙතැයි පද්මා බියවූවාය. දුප්පත්කමට හෝ බෙදා හදාගන්නට ජීවිතයක්.. වසන්තයක්.. ආදරයක්.. තමාට තිබුණි. ඒ අයිතිය දුවටත් දෙන්නට බැරිවීම ගැන ඇය දස දහස් වාරයකින් තැවුනාය. ජීවිතයේ කවර හෝ පරිත්‍යාගයක් කර ඒ සන්තකය ඇයට උරුම කරන්නට ඇත්නම් යැයි පද්මා සිතුවාය.

'මං රස්සාවට යන්නේ මගේ ජීවිතේ ගැන ලොකු බලාපොරොත්තු තියාගෙන නෙමේ අම්මේ.. ඒක නැතිඋනා කියලා මට අමුතුවෙන් නැතිවෙන්න දෙයක්නෑ.'

දෛවය මේ අසරණ ජීවිතයට මීට වඩා දෙයක් දුන්නා නම් කොතරම් අපූරුදැයි පද්මා සිතුවාය. අනාගතයක්.. හෙට දවසක් නැති ගැහැණු දරුවෙකුගේ ආත්මය අම්මා කෙනෙකුට බරකි. ඊටත් වඩා දුකකි. දුන්වායාට ලබන්නේ විසි හයය. මේ තරුණියක් විවාහ වියයුතු වයසය. ඒ ගැන හිතනා හැම මොහොතකම පද්මාගේ පපුව දැවීයයි. එක්කෝ කුමක් හෝ අභාග්‍ය සම්පන්නදෙයක් වී දෙදෙනාටම ජීවිතය

WWW.EXPRESSLANKA.TK 40

නැතිවියයුතුය. නැතහොත් මහා ප්‍රාතිහාර්යයක් වී සියල්ල සුන්දරව සොළවර විය යුතුය. ඒ දෙකම නොවේ.. පද්මාට දුක ඒ ගැන...

චායාගේ හිත තිබුනේ ෆැෂන් කොම්ප්ලෙක්ස් වලය. මැඩම් තවමත් කාර්යාලයට ඇවිත් නැතුවා වියයුතුය. කියූ වේලාවට කලින් කතා කර කරදර කිරීම චාරයක් නැති දෙයකි.

අම්මා ගෙනා කහට තේ කෝප්පය චායා තොල ගෑවේ විකින්විකය. අන්තිම උගුර බොද්දී එය හොඳටම ඇල්වී තිබුණි. ජීවිතය පිළිබඳව වූ ඉතාම කුඩා බලාපොරොත්තුවක් මුළු පපුවම හිර කර ඇතැයි චායා සිතුවාය. මීට වඩා වැඩි දෙයක් තම ජීවිතයේ වුවහොත් එය නිසැකවම දරාගන්නට අසීරුවෙනු ඇත.

චායා නැවතත් කාමරයට පැමිණ ඇඳේ ඇලවුනාය. නෙත් පියාගන්නට ඇයට බයය. චායා ඊයේ ඇඳි සාරිය අතට ගෙන එය සෙමින් සෙමෙන් ඇඟිලි තුඩුවලින් පිරිමැද්දය.

නියපොතු වලට කියුටෙක්ස් ටිකක් වත් සම්මුඛ පරීක්ෂණයට යද්දී ගාගෙන යන්න බැරිවූ බව ඇයට සිහිවූයේ දැන්ය. ජීවිතයේ බොහෝ දේ තමාට අමතක වූ බව දැන් චායාට සිතෙයි. ඒවා මතක් නොවෙනා එක එක අතකට හොඳයැයි දෙවනුව චායාට සිතුණි.

චායා මැඩම්ගේ කාඩ්පත අතට ගෙන යළිත් බැලුවාය. ශ්‍රියා රණතුංග.. ඒ නම ඇය දෙතුන්වරක්ම හිතින් ඇමතුවාය. දුනා මොන රණතුංගදැයි චායා සිතන්නට උත්සාහ ගත්තාය. නම් දෙක තුනක් සිතා ඇය ඒ අදහස අත්හැරියාය. නමුදු ඊයේ මහදී ඔහු වාහනය නැවැත්වූ මොහොතේ පපුවට දැනුන බර යළිත් ඇගේ හිතට දැනුනි.

නමයයි හතළිස් පහ වෙද්දී චායා කාඩ්පත රැගෙන අම්මාටත් කියාගෙනම පාරට බැස්සාය. ඇමතුමක් ගන්නට ගොඩගම හන්දියට යායුතුය. එයද පයින් යන දුරය. අසල ගෙයක දුරකථනයක් ඇතත් චායා ඒ කරදරය කිසි දිනයක නොකළාය.

'වේලාව කීයද..'

ඇය දුරකථන කුටියේ උන් යුවතියගෙන් ඇසුවාය.

'දහයට පහයි.'

ඇය කීවාය. තව විනාඩි පහක් තියෙනවා.. කමක්නෑ ගන්නවා

WWW.EXPRESSLANKA.TK 41

යැයි චායා සිතුවාය.

'මේ නම්බර් එක..'

චායා උඩම අංකය පෙන්වා කීවාය. පසුව උඩින් කෝච්චියක් යන්නාක්මෙන් පසුව ගැහෙන්නට විය..

'ලයින් එක එන්ගේජ්.. චුට්ටක් ඉන්න..'

ඇයට හීල්ලින. වෙනදෙයක්වී හමාර උනානම් සැනසිල්ලේ ගෙදර යා හැක. මේ වන්නේ පිච්චි පිච්චී ඉන්නටය. එය පුදුමාකාර වදයකි.

'ආයිත් ගමුද..'

'බලමු..'

චායා නොඉවසිල්ලෙන් ඇයදෙස බලාඋන්නාය.

'රින්ග් වෙනවා.. ඔය ෆෝන් එකගන්න..'

චායා වීදුරු නාප්පයට මෙහා තිබූ රිසිවරය අතට ගත්තාය. නවමත් නාදවෙයි.

'හෙලෝ.. ගුඩ් මෝනින්.. කලම්බු ෆැෂන් කම්ප්ලෙක්ස්...'

චායාගේ පසුව මොහොතකට සැලුනි. ඇය කෙළ පොදකින් දිවග තෙමාගත්තාය.

'හෙලෝ.. මට මැඩම්ට කතාකරන්න පුළුවන්ද..'

එහා කොනින් කතාකරන්නේ තිලංකා විය යුතුය. මැඩම් කියුවා ඇත්තය. ඒ හඬ ඇන්ජලීන්ගේ හඬට සමානය.

'කවුද කතාකරන්නේ කියනවද..'

'මම.. ඊයේ ඉන්ටවිව් ආපු ගර්ල් කෙනෙක්.'

'නම කියන්න.'

'චායා කල්පනී රණසිංහ.'

චායා මුළු නමම කීවාය.

'හලෝ.. චායා.. ඔයානේ.'

චායාට සැනසිල්ලක් දැනුණි. තිලංකා තමාව හඳුනාගෙන ඇත.

'මගේ සුබ පැතුම් බබා..'

තිලංකා කියද්දී චායාට පළමු සිතුණි. ඇයට කිසිවක් හිතාගත

WWW.EXPRESSLANKA.TK 42

නොහැකි විය.

'මොනාටද..'

වායා අසරණව ඇසුවාය. නිලංකා එහා පැත්තේ සිට සිනාසුනාය.

'මං කියන්නද.. එක්කෝ මින්නෑ.. ඔයා සර්ගෙන්ම අහන්න.. මං සර්ට දන්නම්.'

වායාට කිසිවක් සිතාගත නොහැක. ඇයි සර්ට දන්නේ.. ඇය සිතුවාය.

'ඇයි මැඩම් නෑ..'

'මැඩම් පොඩි හදිස්සියකට තව ලෝකෙට ගියා. සර්ට කියලා ගියේ මං හිතන්නේ ඔයාට කතා කරන්න කියලා.. මං දන්නම් ලයින් එකේ ඉන්න හොඳේ..'

වායාට උන් තැනින් පොළව පලාගෙන ගිලා බහිනා සෙයක් දැනුණි. මේ වන්නේ මොනවාද.. ඇය අසීරුවෙන් පපුවට අතක් තබාගෙන දුරකථනය වඩාත් තදකොට කණට කර අල්ලා ගත්තාය. තවමත් ඇසෙන්නේ සංගීත රාවයක් පමණි.

'හෙ..ලෝ..'

ඒ හඬ ඇය හඳුනාගත්තාය. වායාගේ උගුර මොහොතකට වියළිනි.

'කවුද කතාකරන්නේ..'

'සර්.. මම ඊයේ ඉන්ටවීව් ආපු කෙනෙක්.'

'ඔ..ව්.. මොනවද දැනගන්න ඕනේ..'

ඒ ප්‍රශ්නයෙන් වායාව අසරණ විය. මෙයාලා මා එක්ක සෙල්ලම් කරනවා, ඇති..

'සර් මට ඊයේ මැඩම් කිව්වා කතා කරන්න කියලා. මම වායා කල්පනී රණතුංග..'

අයංක එය වේලාසනම දැන උන්නේය. ඔහුට ඕනෑවූයේ වායාව අසරණ කර ඒ හඬ අහන්නටය.

'වා..යා.. කවුද මේ..'

වායාට හැඬෙන්නට මෙන් ආවාය. රිසීවරය තබාගෙන උන්

WWW.EXPRESSLANKA.TK 43

අනාගැහෙන්නට විය.

'සර්.. මම ඊයේ යනකොට සර් හෝල්ට් එකක් පෙන්නුවේ හෝමාගමට යන්න..'

ඇගේ හඬ බයාදු අසරණ එකක්විය. ඒත් ඔහුට තවත් ඇයව අඬවන්නට දුක සිතුණි. එය සිතනාවිටත් චායාගේ දෑස් තෙත්ව ගොස් හමාරය.

'සොරි.. මං විහිළුවක් කළේ..'

අසංක මඳ සිනාවක් පා කීවේය. චායා පපුවට අතක් තබාගත්තාය. ඔහුට විහිළු..

'මැඩම් ඔයාට කියන්න කිව්වා ඔයාව තෝරගත්තා කියලා.'

චායාගේ දෙනෙතේ කැටි කැටී තිබූ කඳුළු සටස් ගා පිට පැන්නාය ඇගේ මුළු උගුරම හිරවුනාක් මෙන් විය. මේ තවත් විහිළුවක් විය යුතුය. කමා වැනි දුප්පත් අසරණ කෙල්ලෙකු ඒ පුංචි රැකියාවට පවා තෝරාගැනීම දුර්ලභය.

'සමාවෙන්න සර්.. සර් විහිළුවට නේද කියන්නේ.'

චායගේ කතාවට අසංක සිනාසුනේ මෘදුලෙසය. මටත් උනේ කොටි ආවා.. කියලා කියපු එකාට උනදේ.. දැන් ඇත්ත කිව්වමත් පිළිගන්නෑ.. ඔහු සිතුවේය.

'බොරු නෙවෙයි. මැඩම් හොස්පිට්ල් එකට ගියා ඔයාට කියන්න කිව්වා හෙට ඉඳලා වැඩට එන්න කියලා. උදේ හතයි හතලිස් පහ වෙද්දී ඔෆිස් එකේ ඉන්න ඕන. අනිත් ඒවා මං දන්නෑ.. ඇවිත් මැඩම්ගෙන් අහලා දැනගන්න.. හරිද..'

චායාට වචනයක්වත් කතා කරගන්නට නොහැකි විය. තවමත් ඒ ඇස්වල කඳුළුය..

'ඇයි ප්‍රශ්නයක්ද..'

අසංක ඇසුවේ එක එල්ලේය. චායා තිගැස්සුනි.

'නෑ සර්.. සොරි.. සර්.. මට අදහාගන්න බෑ. ඉන්ටවිව් ආපු අය අතර ගොඩාක් හොඳ කොලිපිකේෂන්ස් තියෙන ඩිසන් ගර්ස්ල් උන්නනේ.. ඇයි මං ව...

WWW.EXPRESSLANKA.TK 44

වායාගේ කටහඬ මහදී බිඳුනි.

'තියෙන්න ඕන කොලිෆිකේෂන් මොනවද ගර්ල් කෙනෙක්ගේ ඩීසන්සි එක මොකක්ද කියලා තෝරන්නේ මැඩම්.. සෝ විල් යූ ආස්ක් මයි අම්මා.. වට් කොලිෆිකේෂන්ස් යූ හැව් ඇන්ඩ් වට් ඩීසන්සි විත් යූ ටු අපොයිමන්ට්.. යූ ඕකේ..'

වායා අසරණව අසා උන්නාය.

'ඕ..කේ.. සර්..'

'තව ප්‍රශ්න තියෙනවද ඔයාට..'

'මං එනකොට තව මොනාහරි සහතික එහෙම සර් ගේන්න ඕනෙද..'

අසංක තතියම සිනාසෙමින් කල්පනා කළේය.

'ම්.. මම මේ ඔයාගේ සර් හැටියට නෙමේ.. යාළුවෙක් විදිහට හිතලා කියන්නේ.. අම්මා ඔයාට කැමති වෙච්ච දේවල් ටිකක් තියෙනවා.. ඒ නිසා ඔයා එද්දි කතාකරපු විදිහට ඉන්න. වෙනස් කෙනෙක් වෙලා මෙතනට වැඩට එන්න එපා.. අම්මට එපාවෙයි.. අන්ඩර්ස්ටෑන්ඩ්..'

'යස් සර්.. තැන්කියූ සර්.. ගොඩක් ස්තූතියි සර්..'

වායා දෙවන වතාවටත් අසංකට ස්තූති කළාය. දුරකථනය තැබිය යුතුය. ඔහු තබන තුරු ඉඳිය යුතුද කියා ඇය නොදන්නාය.

'හරි එහෙනම් හෙට හතයි හතලිස් පහ වෙනකොට ඔෆිස් එකට එන්න.. මං තියනවා.'

දුරකථනය විසන්ධිවී ගියෙන් වායා එය තැබුවාය. ඇයට තවමත් කිසිවක් තේරුම් ගත නොහැක. ජීවිතයේ සියල්ල සිහිනයක්ව.. ඈතට පාව ගිය දෛවයක මෙසේ විය හැකිද.. හදවත නැවත නැවතත් මේ සත්‍ය පිළිගන්නට සාක්ෂි ඉල්ලයි. වායා අසරණව යළිත් දුරකථනය දෙස බැලුවාය.

'මට මේ නම්බර් එකට ආයිත් කෝල් එකක් අරගෙන දෙන්න.'

දුරකථනය එහා පැත්තෙන් ගත්තේ නිලංකාය. වායාට සැනසිල්ලක් දනුණි.

WWW.EXPRESSLANKA.TK 45

'මිස් තිලංකා.. මං චායා.. දැන් කතාකළේ.'

'ඉස්සෙල්ලම මිස් කැල්ල කපලා දුන්න.. හරි.. දැන් අහගත්තද සර්ගෙන්.'

'ඔ..ව්..'

ඇය බියවී කීවාය.

'ඇයි මොකෝ..'

'මට අදහාගන්න බැ. ඒකයි ආයිත් ඔයාට ගත්තේ.. අනේ කියන්න මාව තෝරගත්තද..'

'ඇයි ළමයෝ.. සර් කිව්වේ ඇත්ත.. හෙට ඉඳලා වැඩට එන්න කිව්වා.'

'අර ආපු කට්ටිය ඔයත් දැක්කනේ.'

'ම්.. ඔක්කොමල්ලා දැක්කා. ඒත් ඔයා විතරයි. ඕන නැ..'

තිලංකා කියන්නට ගියදේ ගිලගත්තාය.

'ඇයි..'

'ඒවා ආවම අපි කතාකරමු. නැත්නම් අගේ නැ. මැඩම් කිව්වා උදේනම් එන්න කියන්න කියලා. සර් කියන්නැතිනේ..'

'ඔව්.. නරක නැ නේද මෙහෙම අහනවට.. මැඩම් කිව්වා අඳුගාන්න උනත් පුළුවන්ද කියලා. ඒක නිසා මං සාරියක්ම ඇඳගෙන එන්නෝන නැ නේද..'

තිලංකාගෙ පපුව ඇවිලිනි.

'අපෝ. මෝඩ ළමයා.. මැඩම් එහෙම අහන්නේ ඔයාව මනින්න.. මැඩම් ආසයි එයාගේ දරුවෝ වගේ සේවකයින්ට සලකන්න. හැබැයි සේවකයොත් ඒවගේ ඉන්න ඕන. දරුවෝ අතුත් ගානවනේ. මගෙනුත් ඔය විදිහට ඇහුවා.'

'ඔව්. මං දන්නවා. මට ඒක ප්‍රශ්නයක් නෙවේ. මං කිව්වේ සාරිය.'

WWW.EXPRESSLANKA.TK 46

'ඇයි එද ලස්සනට ඇඳගෙන ආවේ.. ඇත්තටම හරිම ලස්සනයි.'

'ඒත් හරි බයයි.. කොයි වෙලාවේ හරි වැටෙයි කියලා.'

'වැටුනොත් අහුලල දෙන්නම්. සාරියම ඇඳලා එන්නකෝ...'

'ඔයාට ගොඩක් ස්තූතියි.. මං තියන්නම්.. හොඳේ.'

'හරි.. බායි.'

චායා දුස් පොඩිකර ගත්තාය. ඇය ඉක්මණට ඇමතුමට මුදල්දී එළියට බැස්සාය. සිහින ලෝවක තමාව පාව යන්නාක් මෙන් චායාට දැනුණි. ඇය තමාව පාලනය කරගත්තාය.

චායා ගෙදර යද්දී ග්‍රොසරියකින් කුඩා බටර් කේක් එකක් ගත්තාය. එයත් තුරුල් කරගෙන ඇය ගෙදරට ඇවිදගෙන ගියේ වේගයෙනි.

'අම්මා විශ්වාස කරන එකක් නෑ.'

චායා ආශාවෙන් සිතුවාය..

# 6

චායාට තවමත් කිසිවක් අදහාගත නොහැක. මේ කුඩා රැ කියාව ලෝකයට නම් නොහිතිය යුතු තරම් පුංචි නොවැදගත් දෙයක් බව ඇයද දන්නීය. එහෙත් එය තමාත් අම්මාත් ජීවත්වන දුප්පත් පුංචි ජීවිතයට මහා දෙයකි. මේ ජීවිත කාලයේදී තමාට මොන මොනවා අහිමි වුවාද කියාවත් කිසි දිනයක චායා සිතා නැත. අහිමිවීම් වල වේදනාව දුක විඳින්නට මිසක ඒවා ඔස්සේ දිගින් දිගට සිතන්නට ඇය කිසි දිනයක ඉගෙන ගෙන නැත. පහන් කණුු එක දිගට නිවීගිය

WWW.EXPRESSLANKA.TK 47

ජීවිත මාවතේ කුඩා කුප්පි ලාම්පුවක් දල්වාගෙන වායාත් අම්මාත් ජීවිතයට මුහුණ දුන්නෝය.. හෙටක් උදවෙන බව මිස ඒ හෙට තුළ ජීවිතයට මුහුණ දියයුතු ආකාරයක් ගැන දුවවත් අම්මාවත් දන්නේ නැත.

ජීවිතය නැවතී තිබූ බව... නැතිවී තිබූ බව වායාට වැටහෙන්නේ දැන්ය. තාත්තා නැතිවූ පසු ගෙවීගිය වසර හතරේ තමාත් අම්මාත් කෙසේ ජීවත්වූවාදැයි දැන් වායාට පුදුමය. හව්හරණක් රැකවරණයක් නැති අඳුපිළක ජීවිතය වැටී තිබෙන්නට ඇත. දැන් එය අහුලාගත යුතුය. ජීවිතය පටන්ගත යුතුය. මෙතුවක් දවසක් ජීවිතය පටන්ගන්නට පවා තැනක් සොයාගන්නට වායාට පුළුවන් කමක් නොවීය. ඊයේද අද වාගේය. හෙටද අද වාගේම වනු ඇත. අලුතින් සිතන්නට යමක් ජීවිතයේ තිබුනේ නැත.

බලාපොරොත්තුවක්.. හෙටක්.. අනාගතයක් නැති ලෝකයක තමාත් අම්මාත් ජීවත්වූයේ මොනතරම් පාළුවෙන්දැයි වායාට සිතෙන්නේ දැන්ය. මහා හයියෙන් කෑගසා සිනාසෙන්නට යමක් දෙන්නයැයි ඇය කිසිදිනයක තම දෛවයෙන් ඉල්ලා නැත. එවැන්නක් දෛවය නොදෙන බවත් වායාට විශ්වාසය. ඇයට ඕනාවූයේ නිස්කලංක ජීවිතය තුළ සැහැල්ලුවෙන් ජීවිතය දරාගන්නට පමණි. වායා තමාටත් වඩා තමාගේ අනාගතය ගැන සිත සිතා හූල්ලන අම්මා ගැන දුක්වූවාය.

මේ කුඩා රැකියාව ගැන මේතරම් කැළඹීමක් කලබලයක් වායාගේ හිතතුළ ඇතිවූයේ ඇගේ සීමිත ජීවිතය තුළ සිදුවූ එකම වැදගත් දේ එය නිසාය. ඊටත් වඩා මේ රැකියාව තමාට ලැබුන ආකාරය ඇයට පුදුමය. තමා වැනි සාමාන්‍ය යුවතියක් තුළින් ඔවුන් දුටු විශේෂත්වය කුමක්දැයි වායාට තවමත් වැටහෙන්නේ නැත. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණි අන් යුවතියන් තුළ නොතිබූ තමා තුළ තිබූ සුදුසුකම කුමක්දැයි වායාට තේරුම් ගැනීම අපහසුය. 'සමහර විට මං හරි දුප්පත් කෙල්ලෙක්නේ කියලා හිතලා අනුකම්පාවෙන් රස්සාව දෙන්න ඇති.. පිනක් කියලා..' වායා ඒ සිදුවීම හදවතින් දරාගත්තේ එසේ සිතාය. වායා සිතුවේම ඇයට ඇත්තේ අසරණ දුප්පත් පෙනුමක් කියාය. ඇතැම් විටෙක එය අහිංසක පෙනුමක් වන්නටත් හැකියැයි ඇය ඊළඟට සිතුවාය.

WWW.EXPRESSLANKA.TK 48

එහෙත් යුවතියක් තුළින් පළවන සාමාන්‍ය සුන්දරත්වය පරයන අසාමාන්‍ය ප්‍රසන්න බවක් ඇය තුළ විය. කෙනෙකුගේ සිතක ආදරය මුසුවූ මෘදු මොලොක් බවක් ඇතිකරන්නට සමත් දුර්ලභ චමත්කාරයක් ඇගේ සිනහවේ විය. "උදේ ඔයාගේ මූණයි හිනාවයි දක්කහම දවසම ලස්සනයි.." පාසැල් වියේදී පන්ති භාර මුදුන්කොටුව මිස් කියූ අයුරු චායාට සිහිවිය. ඒත් චායාට රැකියාව ලැබුනේ ඒ නිසාම නොවේ. කෙනෙකුගේ දෙනෙතක් දෙස එක් වරක් පමණක් බලා ඔහුවෙත වූ අවංකත්වය පිළිබඳව නිගමනයකට එළඹීමේ සුවිශේෂී දක්ෂතාවය රණතුංග මහත්මිය වෙත තිබුණි. චායාගේ කතාබහින්.. හැසිරීමෙන්.. ඒ බැල්මෙන් ඇය චායා තුළ පාට නොකළ නිර්මල අවංකත්වයක් දුටුවාය. තමාගේ ඇතුළු හදවත කාලාන්තරයක් තිස්සේ සෙවූ චරිතය තමාට හමුවූ බවක් රණතුංග මහත්මිය චායා සමඟ කතාකළ පළමු විනාඩි දෙක තුනේදීම සිතාගත්තාය. අවශ්‍ය ප්‍රමාණයට වඩා නොදෙල් වන ගැහැණු ළමයින්ගේ ව්‍යාජ විනීත බව ඇය පිළිකුල් කළාය. එසේම බලෙන් මවාගත් එය නළලේ මැද තබාගත් සුඛ ආඩම්බර හැසිරීමද ඇය පිළිකුල් කළාය. ඇය සෙවූයේ විවෘත හදවතකින් සිනාසෙන යුවතියකි. චායා තුළ ඒ විවෘත නිරහංකාර බව ඕනාවටත් වඩා තිබුණි. ඇයට රැකියාව ලැබුනේද ඒ නිසාය. චායා ඒ බවක් නොදනී.

දුව එන්නේ සතුටුදයක පුවතක් රැගෙන බව පද්මා චායා ඈත එද්දීම දැනගත්තාය. ලඟාවකට එන චායා දෙස පද්මා බලාඋන්නේ හදපුරා නැගෙන අහිංසක ආඩම්බරයක්ද ඇතිවය. මේ ලස්සන බලන්නට ඉන්න තිබුනේ ඇගේ තාත්තා යැයි මොහොතකට පද්මාට සිතුණි. "කෙල්ලගේ හිත කැඩෙන දෙයක් නම් වෙන්න එපා.." යැයි ඇය චායා ගෙදරින් එළියට යද්දී පැතුවාය. කිසිවක් නොලැබුනද දුකක් නැත. වේදනාවක් එන්නේ ජීවිතයේ තිබූ දේවල් නැතිවූ විටය.

චායා ගෙට ගොඩවූයේ සිනාසීගෙනමය. ඒ සිනාව පුළුල් තිරයෙන් දැකගන්නේ බොහෝ කාලයකට පසුව යැයි පද්මා සිතුවාය. චායා තම අත රැඳි බටර් කේක් පෙට්ටිය අම්මාටදී අම්මාගේම ගවුමෙන් පාත්වී මුහුණ පුරා රැඳි තුනී දහදිය පිසදා ගත්තාය. පද්මා පුදුමයෙන් මෙන් චායා දෙස බලාඋන්නාය.

'මොකද පුතේ උනේ..'

පද්මා ඇසුවේ වායාගේ දිලිසෙන දෙනෙත් දෙස බලාගෙනය. ඒවා යංතමට තෙමී ඇත.

'අම්මට මොකද හිතෙන්නේ..'

වැඩි බලාපොරොත්තු පපුවට ගන්නට පද්මාට බයය..

'ඉතින් ප්‍රශ්න පත්තර දෙන්නැතුව කියන්න ටෙලිෆෝන් කළාද..'

'ඔව්..'

'ඉතින්..'

'අද මැඩම් උන්නෑ.'

'අනේ...'

පද්මාගේ පපුව කඩා වැටිණ..

'ඒ වුනාට සර් උන්නා.. මැඩම්ගේ පුතා..'

'ඔයා එයාටද කතාකළේ.'

'ම්..'

යමක් සිදුවී ඇතිබව දුව වචන රස කරන හැටියෙන්ම පද්මා තේරුම් ගත්තාය. හුරතල් කෙල්ලෙකුට ඕන කරන ඔක්කොම තියෙනවා.. පද්මා සිතුවාය.

'මාව රස්සාවට තෝරගෙන අම්මේ..'

වායාට එය කියද්දී කඳුළු පිටවිය. ඒවා එළියට පනින බව පද්මාද දැනගත්තාය. කාන්තාරයක ජීවත්වන්නෙකුට තුන්හිරි ගසක් හීයකි.. ඇගේ පපුව දුව කියූ දේ නිසා පිපිරෙන්නට තරම් විය.

'දෙයියෝ වැරදිලා හරි අපි දිහා බලලා අම්මේ..'

වායා හඬමින් කීවාය. පද්මාගේ පපුව ඇවිලිනි.

'දැන් හාඩා ඉන්න.. මොනවද උනේ කියලා මට කියන්න.'

'මොනවත් තේරුම් ගන්න බෑ.. හෙට උදේ ඉඳලා වැඩලු...'

'හෙ...ට.. උදේ ඉඳලා..'

'ඔව්.. හරි පුදුමයි නේද අම්මේ..'

'පුදුම වෙන්න දේකුත් නෑ පුතේ.. අපිට ඉර පෑව්වත් පුදුමයි..'

WWW.EXPRESSLANKA.TK 50

වායා පුටුවට වැටුනේ අම්මා දෙසම බලාගෙනය. පද්මා දුව අසළින්ම ඉඳගත්තාය.

'මං බාරෙකුත් උනා.. ඔය අවුරුදු ගාණකින් උනාමයි.. ගිහින් ඔප්පු කරන්න ඕනේ.'

'එහෙනම් ඒක වෙන්නැති..'

'ඔයාව ලෝකෙට ඇරියේ නැත්තේ ඔයා නාස්ති වෙයි කියන බයට.. ඒත් වාසනාව ඔයාගේ මූණේ පිරිලා තියෙනවා... ඒක අපේ දුප්පත් කම් වලින් වහන්න බෑ.'

පද්මා බොඳවූ දෙනෙත් වලින් වායා දෙස බලා කීවාය. අම්මටත් දුවටත් නොහඬා වචන දෙක තුනකට වඩා කොහොමටත් කතා කළ නොහැක. එහෙත් මෙතුවක් දවසක් ඇඬුවේ දුකටය. අද ඇඬෙන්නේ සතුටටය.

'මොන වගේ රස්සාවක්ද.. ගිහිල්ලා මොනවා කරන්න වෙයිද.. පඩි කීයක් ලැබෙනවද.. ඒ මොනවත් මං දන්නෑ.. වෙලාවකට හරි බයකුත් එනවා..'

වායා අවංකවම කීවාය. ඇයට අම්මා සමඟ කතාකළ නොහැකි දෙයක් නැත. ඇගේ හදවතින් අඩක් නොවේනම් මුළු හදවතම අම්මාගේ හදවතේ කොටසකි.

'එහොම තමයි පුතේ.. ජීවිතේ මොනාවක් දැනගෙන වෙන්නෑ.. ඔයා බැන්ඳ කියලා හිතන්න.. ඒ ජීවිතේ ගත කරන හැටි ඔයා දන්නවද.. නෑ.. ඒත් පිරිමියෙක්ගේ මූණවත් හරි කෙලින් බලලා නැති ගෑණු ළමයි හොඳට පවුල් කනවා. ඒ ජීවිතේ හැටි..'

මෙහෙමවත් ජීවිතය කියාදෙන අම්මා කෙනෙකු තමාට සිටීම ගැන වායා සැනසුනාය.

'සර් කියනවා මැඩම් මට කැමති වෙච්ච දේවල් ටිකක් තියෙනවලු.. එද ආපු කෙනා විදිහටම එන්නලු.. වෙනස් කෙනෙක් වෙලා මෙතනට එන්නත් එපාලු..'

වායා ප්‍රශ්නාර්ථයක් තබා අම්මා දෙස බලා කීවාය. තමා

WWW.EXPRESSLANKA.TK 

සිතුවා හරියැයි පද්මාට සිතුණි. මෙතුවක් දවසක් ඇය සිතුවේ දියණියගේ අහිංසක බව.. චාම් චමත්කාරය දුටුවේ තමා පමණක් කියාය. පිනකට මෙන් එය තවත් කෙනෙකු දෙන්නෙකු හඳුනාගෙන ඇත. කවද හෝ චායාට ඇගේ ඉරණම්කරුත් එම විශේෂත්වය හඳුනාගෙනම හමුවේනම් කියා ඇය සිතුවාය.

'ඉන්ටර්වීව් ගිය විදිහටම එන්න කියන්නේ ඇයි අම්මේ..'

පද්මා දුවදෙස බලාගත්වනම බලාඉඳ සිනාසුනාය.

'එක රජ කුමාරයෙක් උන්නලු..'

පද්මා කතාවක් කියන්නට පටන් ගත්තාය. චායා ආශාවෙන් අම්මා දෙස බලා උන්නාය.

'ම්..'

'මේ රජ කුමාරයට සරණ පාවාදෙන්න ඒ රාජ කුමාරයාගේ පිය රජතුමා රාජ කුමාරිකාවෝ හැම තැනින්ම බැලුවලු.. එකකටවත් අර රාජ කුමාරයා කැමති නැලු..'

'ඉතින්..'

'දවසක් මේ රාජකුමාරයා ගමනක් යද්දි පුංචි පැල්පතක් ළඟ උන්න සාමාන්‍ය කෙල්ලෙක්ව දැකලා නතර වුනාලු.. රාජ කුමාරයා හරි ආශාවෙන් ඒ කෙල්ල දිහා බලා උන්නලු.'

'ඉතින්..'

'රාජ කුමාරයා එවේලේම හිතුවලු.. මම බලාපොරොත්තු වෙන්නෙ මෙන්න මේවගේ කෙල්ලෙක්ව කියලා. තෑනයි කෙල්ලවයි මතක තියාගෙන ගිහිල්ලා අර රාජ කුමාරයා මේක ගිහිල්ලා පිය රජතුමාට කිව්වලු..'

'පියරජතුමා හොඳට බණින්න ඇති.'

චායා ඇස් ලොකු කර කීවාය.

'එහෙම උනේ නෑ.. එයා හොඳ පිය රජතුමෙක්. පුතාගේ සතුට තේද කියලා ඒ කෙල්ලව කුමාරයාට විවාහ කර දෙනවා කියලා

WWW.EXPRESSLANKA.TK 52

පියරජතුමා හිතාගත්තලු.'

'පස්සෙ..'

රජ පවුල් වල සිරිතක් තියෙනවා විවාහ දීනේ වෙනකල් මනමාලිව බලන්න දෙන්නෑ.. ඉතින් රජ වාසලේ කට්ටිය හොරෙන්ම අර කෙල්ලව කුමාරයට හොරෙන් ගෙනල්ලා මංගල්ලෙට සූදානම් උනා..

'ඉතින්..'

ඡායාගේ කුතුහලය දැන් තවත් වැඩිවිය.

'මංගල්ලේ දවස උදාවුනා. හරි ඉහළින් මංගල්ලේ කටයුතු රජතුමා පිළියෙල කරලා තිබුනා. ඔන්න සළුවකින් වහලා මනමාලිව පරිවාර ස්ත්‍රීන් ගෙනාවා. අපේ රජ කුමාරයා බලා ඉන්නවා.'

'හ්ම්..'

'මනමාලිව අන්දවලා තිබ්බේ රජ වාසලේ සම්ප්‍රදායික ඇඳුම් වලින්. රජ කුමාරයා ළඟටම මනමාලිව ගෙනල්ලා අර සළුව ඉවත් කළා. කෙල්ලගේ මූණ දැක්ක ගමන් රජ කුමාරයගේ මූණ අඳුරු උනා. ටික වෙලාවක් බලං ඉඳලා රජ කුමාරයා පිය රජතුමා ළඟට ගිහින් කියනවා... 'මං විවාහ වෙන්න කැමතියි කිව්වේ මෙයාට නෙමේ.. මට මේක කරන්න බැහැ..' කියලා.. හැමෝම බලා ඉද්දිදී රජකුමාරයා මංගල මණ්ඩපයෙන් නැගිටලා ගියා.'

'ඇයි ඒ.. පියරජතුමා සපටි කමට වෙන කුමාරිකාවක් අර කෙල්ලව වගේ සරසලා ගේන්න ඇති.'

ඡායා කීවාය.

'නෑ.. එහෙම නෙවී උනේ..'

'එහෙනම්..'

'රජ වාසලෙන් අර අසරණ අහිංසක කෙල්ලව සම්පූර්ණයෙන් වෙනස් කරලා.. ඇඳුමෙන් පැළඳුමෙන් කතාවෙන් බැල්මෙන් හැම එකකින්ම අර කෙල්ලව රජකුමාරිකාවක් කරන්න රජ වාසල උත්සාහ කළා.. කුමාරයට ඕන උනේ අර එයාගේ අහිංසක කෙල්ලව දකින්න..

WWW.EXPRESSLANKA.TK 53

ඒත් ඒ කෙල්ල සම්පූර්ණයෙන්ම වෙනස්වෙලා.. කුමාරයාට ඒ කෙල්ලයි අර කලින් බලපු කෝලං රාජකුමාරිකාවෝයි අතර වෙනසක් පෙනිලා නැහැ. ඒකයි කුමාරයට උනේ..'

පද්මා සිනාසී කීවාය. චායා ඒ කතාව තමාගේ කතාවට ආදේශ කරගන්නට උත්සාහ ගත්තාය.

'ඔයාව වැඩට ගන්න එයාලා හිතන්න ඇත්තේ ඔයාගේ තියෙන මොකක් හරි විශේෂත්වයකට.. සමහර වෙලාවට අපි නොහිතන පුංචි දේකට.. ඔයා එහෙනදි කිව්ව වචනෙකට වෙන්න පුළුවන්.. බයවෙන්න එපා. ඔයාට මුකුත් ප්‍රශ්නයක් වෙන්නෑ. බය නැතුව හෙට යන්න ලෑස්ති වෙන්න.. අපි හවසට පන්සලටත් ගිහිල්ලා එමු..'

පද්මා දියණියගේ හිස අතගා කීවාය.

'සංතෝෂෙටද බටර් කේක් එකකුත් ගෙනාවේ.'

පද්මා චායා ගෙන ආ බටර් කේක් එක අතට ගෙන ඇසුවාය. චායා සිනාසී හිස වැනුවාය. ජීවිතයේ කුඩා කුඩා දේවලින් සතුටක් ලබන තම දියණියගේ අහිංසක ජීවිතය ගැන පද්මාට දුක සිතුණි. 'ඔහොම එළියට පහළියට බැහැලා එයාට හිතට අල්ලන කොනෙක්ව එයාම හොයාගන්නවා නම් හොඳයි..' පද්මා සැටියේ ඇලවූ චායා දෙස බලා සිතුවාය.

'මේක කපලා තිකම් තේකක් හැදුවා නම් රසයි.'

පද්මා සිනාසී කීවාය.

'අම්මේ ලතා අක්කගේ පුංචි උන් දෙන්නටත් කෑලි තුන හතරක් යවන්න.'

'අනේ ඔව් පුතේ.. ගෙදර මොනා හැදුවත් දීසියක දාගෙන උස්සන් එනවා චායා නංගිට දෙන්න කිය කියා.. ඒ ගෑනිට දෙන්න අපිට මුකුත් නෑ.'

'ලතා අක්ක මුකුත් බලාපොරොත්තු වෙන්නෙත් නෑ අම්මේ. කීයක් හරි ලැබුන දවසට මොනාහරි දෙයක් අරන් දෙනවා.'

අම්මා කුස්සියට ගියපසු චායා එහෙම්මම සැටියේ දිගාවී

පත්තට හිස තබා දෙනෙත් පියා ගත්තාය. අම්මා මොහොතකට කලින් කියූ රාජ කුමාරයාගේ කතාව වායා සිතින් මවාගත්තාය. 'ඒක කතාවක් විතරයි.. කෙල්ලෙක්ගේ අහිංසක අසරණ පාටට කැමති රාජකුමාරයෝ කොහෙද ඉන්නේ..' වායා සිතුවාය.

# 7

'දිගටම සාරි අඳින්න නම් සාරි පහ හයක් වත් තියෙන්න ඕනේ.. ඒවලට හරියන්න හැට්ටත් මහ ගන්න ඕනේ..'

වායා සම්මුඛ පරීක්ෂණය සඳහා ඇඳි තැඹිලි පැහැගත් සාරිය වතට තබා හැඩ බලද්දී පද්මා කාමරයට පැමිණ කීවාය. දියණියව හැකි පමණින් පිරිච්ච පාටට රැකියාවට යවන්නට ඇය ආශා කළාය.

'අම්මගෙත් සාරි ටිකක් තියෙනවනේ..'

වායා ඇඳගෙන උන් ගවුමට උඩින් සාරි පොට පටලවාගෙන එය 'ඇඳීමේ අසාර්ථක උත්සාහයක නියැලෙමින් කීවාය.

'ඒවා පරණ පැටන් පුතේ.. දැන් ලොකු බෝඩර් තියෙන සාරි අඳින්නෑ.. ඔෆිස් එකට ගැළපෙන්නේ චාම් ඩිසයින් තියෙන ලා පාට ජෝජට් සාරි.. මේ වගේ.'

පද්මා වායා අත තිබූ සාරියේ පොටක් අල්ලා කීවාය.

'පාට නම් මොනා උනත් කමක් නෑ.. මොන පාටත් ඔයාට හැඩයි...'

'ඉතින් මොකද කරන්නේ..'

'හෙට අනිත් සාරිය ඇඳගෙන යන්න.. අපි සාරි දෙක තුනක්වත් ගමු..'

'එතකොට වියදම් වැඩියි අම්මේ..'

WWW.EXPRESSLANKA.TK 55

'එහෙම කියලා බැහේ.. මා ළඟ ඉතුරු කරගත්ත සල්ලි ටිකක් තියෙනවා..'

චායාට අම්මා ගැන දුක සිතුණි. සමන්කමක් තිබුනා නම් අම්මා තමාව රාජ කුමාරිකාවක මෙන් සරසන බව ඇය දන්නීය.

'අම්මේ පාන්දරම නැගිටින්න වෙයි.. මොනා නැතත් කමක්නෑ අම්මා මගේ සාරිය අන්දවන්න.'

'දෙයක් කෙනෙක් ලස්සනයි කිව්වට පස්සෙ හරි වදේ තමා.. ඊට පස්සේ ඒක ඒ විදිහටම පවත්වාගෙන යන්න වෙනවා.'

පද්මා සිනාසී කීවාය.

'කැන උනොත් හිතට හරිනෑ නේද..'

චායා අම්මාගේ මුහුණ දෙස බලාකීවාය.

'ඔයත් ටික දවසක් ඇඳලා පුරුදු වෙන්න.'

'අනේ බෑ.. අම්මා හදන්නේ මාව පල් කරන්න.. මං ඇඳගෙන ගියොත් එදාට වැඩක් කරගන්න බැරි වෙයි..'

චායා පැවසුවේ මවාගත් බයකිනි. මේ රැකියාවට පවා යන්නේ හිත අඩමානයට තබාගෙනය. එහෙව් එකේ අඳිනා ඇඳුමත් පැළඳුමක් වත් හිතට ඇල්ලිය යුතුය.

'නැත්දේ..'

දොරකඩින් ඇසූනේ ලතාගේ කටහඬය. ඒ හඬ දවසකට දෙතුන් වරක් ඇසෙන නිසා පද්මාට ලතා ගෙදර කෙනෙකු මෙන්ය. එහෙමවත් ගොඩවී මේ දෙදෙනාගේ දුක සැප බලන්නේ ඇය පමණි.

'අපි කාමරේ ලතා අක්කේ.. එන්න.'

චායා කෑ ගසා කීවාය. ලතා දොර රෙද්ද මෑත් කර කාමරයට එබුනේ පුරුදු සිනාවෙන්මය.

'මං හෙට ඉඳලා ජොබ් එකකට යන්න ලතා අක්කේ..'

චායා දැරියකගේ හඬින් කීවාය.

'මට නැන්ද කේක් දීලා කිව්වා.. මං ආවෙත් ඒකමයි.. මොනවද නංගිට මගෙන් කෙරෙන්න ඕන..'

WWW.EXPRESSLANKA.TK 56

චායා ඇඳමත ඉඳගත් ලතා දෙස බලා අනතුරුව අම්මා දෙස බැලුවාය.

"උදේ ඉඳලා හවස් වෙනකල් මං නෑ.. අම්මා තනියම.. අක්කා වුවටක් මේ පැත්ත වැඩියෙන් බලන්න.."

ලතා චායාගේ කතාවට උණුවීගිය දෙනෙතින් පද්මා දෙස බැලුවාය.

"ඒක ගැන හිතන්නෙපා.. ඔයා පරිස්සමින් ගිහිල්ලා එන්නකෝ... හැබැයි හරි පාළු වෙයි මේ පැත්තම.."

ලතා අවංක හඬකින් පැවසුවාය. ලතාගේ සැමියා වූ මහින්ද සේවය කළේ උතුරේ ක්‍රියාත්මක මෙහෙයුම් මැදය. මහින්ද ගෙදර ආවේ මාසයකට හෝ දෙමාසයකටය. ඒද දින දෙක තුනකටය. ඒ අතරවාරයේ ගෙවුන හැම දවසකම ලතාත් දරු දෙදෙනාත් ජීවත් වූයේ පාළුවෙනි. ඇයටද තනි නොතනියට උන්නේ චායාත් පද්මාත් පමණි. දෙයාකාරයකින් තනිවූ මේ ගැහැණු තිදෙනා ස්වභාවයෙන්ම දෛවය උරුම කළ තනිකමින් හෘදයාංගමව එකට බැඳී උන්නෝය. ලතාගේ දරුවෙකුට අසනීපයක් වුවද පද්මාත් චායාත් ඒ ගෙදරට වී රෑ නිදිමැරුවේ කිසිඳු අහිතක් නැතිවමය. ඇතැම් දිනයක ලතා උදෙන්ම පැමිණ "නැන්දේ අද දවල්ට උයන්නෙපා. හොඳ පොළොස් ගෙඩියක් හම්බඋනා.. මං උයලා බත් ගේන්නම්.." කියා යන්නීය. කියූ ලෙසම ඇය දවල් දොළහට එකට එන්නේ දීසි දෙක තුනකට හොඳි මාළු බෙදාගෙන බත් පිඟන් දෙකක්ද අතැතිවය. එවන් දිනයක ඇය ඇගේ බත් පතද බෙදාගෙන විත් කන්නේ චායලාගේ ගෙදර ඉඳගෙනමය.

"දූන් නංගි සාරිද අඳින්නේ වැඩට.."

"ඔව් අක්කේ.. ඒක තමයි මේ ජොබ් එකේ මං ආසම නැති වැඩේ.."

WWW.EXPRESSLANKA.TK 57

චායා අසරණව කීවාය.

'ආ.. ඒක කොච්චර හොඳද.. දැන් ඉතින් නංගිට සාරි තැහැනේ..'

'ඒක තමයි ලතෝ මේ මායි මෙයයිත් කතා උනේ.. ගන්න ඕන.. මගේ සාරිත් පරණ පැට්න්..'

ලතා මොහොතක් කල්පනා කළාය. එකවරම ඇය නැගිට්ටාය.

'මං ගෙදට්ට දුවලා එන්නම් නැන්දේ..'

පද්මා ලතා ගියපසු චායා දෙස බැලුවාය.

'ඔය ගිහිල්ලා දැන් මොනා හරි උස්සන් එයි..පුදුම කෙල්ලෙක්.. ගිය ආත්මෙක ඔයාගේ අක්ක කෙනෙක් වෙන්න ඇති.'

'ඔය හිනාවෙලා උන්නට අම්මේ ලතා අක්කා ඉන්නේ හරි බයෙන්.. ඊයෙත් මං යද්දී සාලෙට වෙලා අඬනවා.. කොහෙද කෑම්ප් එකකට කොටි ගහලා... මහින්ද අයියත් ඉන්නේ ඊට කිට්ටු කෑම්ප් එකකලු..'

චායාට ලතා ගැන ඇත්තටම දුකයි. ජීවත්වීමේ ප්‍රශ්න විසින් ජීවිතය අසරණ අනියත ඉරණමකට තල්ලු කර ඇත. මේ යුද්ධය ගැහැණු කී දෙනෙකුගේ පපුවට ගින්දර දෙනවා ඇත්ද..

ලතා කාමරයට ගොඩවුනේ අලුත්ම පාට සාරි දෙකක්ද අතැතිවය. ඒ දැක චායා අසරණ දෑසින් අම්මා දෙස බැලුවාය. ඇය කියුවා හරිය.. මේ නම් පූර්ව ආත්මෙක ලේ බැඳීමක් තිබූ කෙනෙකු විය යුතුය.

'ඇයි අක්කේ මේ..'

ගියපාර මල්ලි සාජා වල ඉඳලා එද්දී මට සාරි තුනක් ගෙනල්ලා දුන්නා. කලින් මං ගත්ත ඒවත් පහක් හයක් තියෙනවා. මහින්දත් අවුරුද්දට සාරිමයි ගේන්නේ.. කොහාට අඳින්නද නැන්දේ.. කා එක්ක මේවා ඇඳන් යන්නද.. නංගි මේ දෙක ගන්න.

ලතා හෘදයාංගම සිනහවකින් මුවසරයාගෙන මනාව නැවූ සාරි දෙක චායා අතට දුන්නාය. එකක් චොකලට් පාටය. අනෙක ලා මෙරූන් පාටය.

'අනේ අක්කේ.. අක්ක අපිට කරන ඒවා මදිද.. මේ ගොඩක්

WWW.EXPRESSLANKA.TK 58

වටින සාරිනේ.. අතික අක්කට තෑගි ලැබුන ඒවා.'

වායා වේදනාබරව කීවාය.

'උදව් කරනවයි කියන කතාව කියන්නෙපා නංගි.. මට කවුද ඉන්නේ.. ඔයාලා.. ඔයාලා මේ ගෙදර නැත්නම් මං මේවා වහලාදලා අම්මලා ළඟට ගිහිල්ලා.. වෙලාවකට හරි කරුම ජීවිතයක් නංගි.. ඒක කමක් නෑ.. මේ වලට හැට්ට මහන කෑල්ල සාරියේම තියෙනවා. ඒකෙන් මහගන්න. මේ..'

ලතා සාරියේ එක් කොනක තිබූ තුනී පැහැගත් කොටස පෙන්වා කීවාය. වායා ඒ සාරියක් නැහැයට තබාගත්තේ ආශාවෙනි.

'රට සුවඳ එනවා නමයි.'

ලතා සිනාසුනාය. වායා සාරිය පපුවට තබා හැඩ බලනා අයුරු ලතාබලා උන්නේ ආශාවෙනි. සාරිය ලස්සන දූන්යැයි ඇයට සිතුණි.

'කවදහරි වෙඩින් සාරියට හරි ලස්සනට ඉඳී..'

ලතා කියුවේ අවංක හඬිණි.

'ඔන්න ලතාක්කත් අපේ අම්මා වගේ වෙන්න යනවා.'

'එහෙම කියන්නෙපා.. රස්සාවක් වගේම පරෂ්නාවකුත් හදිස්සියේම වෙයි.'

'දැනට මට රස්සාවක් විතරක් ඇති.'

'එයා හිතන් ඉන්නේ හැමදාම මෙහෙම ඉන්න.. තාත්තා හිටියනම් මෙළහකටත් බන්දලා දීලා.. මට මේවා තනියම කරන්න බැරිඋනාට..'

පද්මාගේ දෙනෙත් බොඳවිය. ලතා පද්මාගේ උරහිසට අතක් තබා ඇය දෙස බලා උන්නාය.

'නැත්ද ඕවා හිතන්නෙපා. බලන්නකෝ හෙට අනිද්දම කෙල්ල හොඳ කොල්ලෙක්ව හොයාගනී.. මටනම් ෂුවර්.'

වායා කැඩපත දෙස බලා සිනාසුනාය.. 'ඒක හිතන තරම් ඉක්මනට වෙන එකක් නෑ..' ඇය සිතුයේ අවංකවමය. හදවත එවැන්නක් සඳහා කිසිම සුදානමක් නැත.

www.EXPRESSLANKA.TK 59

'දැන් හැමදාම බත් එකක් ගෙනියන්න වෙයි නේද..'

ලතා කතාව වෙනතකට යොමුකළාය. චායාටද එය සිහිවූයේ දැන්ය. අලුත් ජීවිතයට අලුතින්ම හැඩ ගැසිය යුතුව ඇත.

'කොහොමටත් මං පාන්දර ඇහැරෙනවා නේ.. මෙයා හැඩවෙනකොට මට දෙපාරක් උයන්න පුළුවන්..'

'තාත්තට බත් දීලා අම්මා රෙකෝඩ් එකක් තියලා තියෙන්නේ.. තාත්තා කියන්නෙත් එයා කවදාවත් දවල්ට පිටින් කාලා නැහැලු.'

චායා තාත්තා ඒ දිනවල නිතරම කියූ කතාවක් සිහිකොට පැවසුවාය.

'අසනීප උනත් මං පොල් සම්බෝලයක් හදලා හරි බත් එක දුන්නා. නැත්නම් දවල්ට නොකා බඩගින්නේ ගෙදර එනවා.'

අම්මාට කඳුළු එන්නට තාත්තාව මතක් කිරීම පමණක් සෑහේ. කඳුළු ආවද.. දුක සිතුනද ඇය ඒ මතකයේ වෙලෙන්නට ආශා කරන බව චායා දනී.

මාත් පුළුවන් දවසට බත් එකක් දෙන්නම්..

චායා ලතා දෙස බැලුවේ කෘතවේදීවය. ජීවිතයේ අසරණ අනාථ දිනවල එකට ඉන්නා මිනිසුන් රන් පිඩි හා සමානය. ආත්ම ගාණකට පැතිය යුත්තේ එවැනි මිනිසුන්ය. ඇවිදින කාලයේදී පාලම් තනා දෙන මිනිසුන්ට වඩා දණගාන යුගයේදී අතදෙන මිනිසුන් වටින්නේය. එහෙත් එවැනි මිනිසුන් ජීවිත කාලයේ හමුවන්නේ කලාතුරකිනි. බොහෝ කලාතුරකිනි.

හවස චායා අම්මාද සමඟ පන්සල් ගියාය. කලබලව තිබූ සිත පන්සල් බිමේදි නිවී සැනසෙන අයුරු පුදුමාකාරය. ඇය විහාරගෙයි බිම වාඩිවී සුදු බුදුරුව දෙස බොහෝ වේලාවක් බලාගෙනම උන්නාය. විශේෂයෙන් හිතන්නට තරම් දෙයක් නොතිබුනද අලුත් ජීවිතය හැකිතරම් සාමාන්‍ය දෙයක් වේවායැයි ඇය පැතුවාය.

රස්සාවක් ලැබීම නිසාම ජීවිතයේ මහා දේවල් තමාට හිමි නොවන බවචායාට විශ්වාසය. ඒ මහා දේවල් මොනවාද කියාවත් ඇය දන්නේ නැත. නන්නාඳුනනා පරිසරයක් මැද නොදන්නා මිනිසුන් පොකුරක් මැද.. ආත්මානුකම්පාවක්... අසරණකමක්.. හිතට නොදැනී

WWW.EXPRESSLANKA.TK 60

හිස කෙළින් තබාගෙන ඉන්නට පමණක් හැකිවේවා කියා වායා පැතුවාය.

නන්නාඳුනනා ලෝකයක් මැද තමා හඳුනන එකම දේ තම හදවත පමණක් බව වායා සිතුවාය. අඩුම තරමේ එයවත් නිරවුල්ව තිබිය යුතුය. කාර්යාලය යනු මහා ලොකු තැනක් නොවුනද එය තමා මෙතෙක් ජීවත්වූ කාමර දෙකේ කුඩා නිවහනට වඩා විශාල බව ඇය දන උන්නාය.

'පුතේ මේකට අතගහන්න..'

අම්මා ගෙන ආ සුදුමල් දමූ මැටි කලයට වායා දේතම තබා වැන්දය. මළුව වටා කැරකි තැරකී තම ජීවිතය වෙනුවෙන් පැතුම් වඩන අම්මා දෙස වායා බලාඋන්නේ ඉතිරී ගිය සෙනෙහසිනි. අම්මා නැතිදකට ජීවිත ඉරණම පාළුවට යනු ඇත. වායාගේ සිතට මොහොතකට බියක් දනුණි. නැත.. මේ දේවල් සිදුකරන්නට දෙවියන් ඒතරම් කුරිරු නොවනු ඇත.

අම්මා බෝධිපූජාව තබනතුරු වායා වැලි මළුවේ ඉඳගෙන ඔහේ බෝගස දෙස බලාඋන්නාය. පන්සල පුරා වූයේ නිවී පහන්වී ගිය බවකි. මළුව වටා දල්වූ ලා කහ පැහැගත් විදුලි පහන් වල ආලෝකය ලා කොළපත් මතට වැටී තිබුනේ වඩාත් මෘදුලෙසිනි.

රෑ අටට පමණ පද්මාත් වායාත් පන්සලේ සිට ගෙදර එන්නට පිටත්වූයේ පයින්මය.

'මොන වැඩේ උනත් කමක් නෑ ඔයාට කරන්න පුළුවන් උපරිම මහන්සියෙන් කරන්න. ගන්න පඩියට පවක් නොවෙන්න වැඩ කරන්න.. නැත්නම් එයාලා පඩියක් දෙන්නේ හුල්ල හුල්ල.. ඒවා යාදෙන්නේ නෑ පුතේ..'

එද්දී පද්මා වායාට කරුණාබරව කීවාය.

'මම වැඩ කරන්න ආසයි අම්මේ.'

'වෙන කාටවත් නෙමේ.. ඔයාට රස්සාව දුන්න මැඩම්ටයි සර්ටයි පක්ෂපාතිව වැඩ කරන්න.. දහ පහළොස් දෙනෙක්ගෙන් හරි ඔයාව එයාලා තෝරගත්තනේ.. ඒක හොඳ තේරීමක් කියලා එයාලට ඔප්පු

කරන්න ඕන ඔයා..'

'මම පුළුවන් ඉක්මනට වැඩ ඉගෙන ගන්නවා.'

'වැඩ වල්ටත් වඩා පුතේ ලොකු අය පක්ෂපාතීත්වය බලාපොරොත්තු වෙනවා. එයාලා දන්නවා පඩිගෙවනව නම් වැඩ කරන්න මිනිස්සු ගන්න පුළුවන් කියලා. ඒත් තමන්ට ආදරේ කරන ගෞරව කරන සේවකයො හම්බ වෙන්නේ ටිකයි.. ඒ ගොඩට වැටෙන්න බලන්න ඕන.'

'මැඩමුයි සර්රුයි ගැන දැනටමත් මගේ හිතේ තියෙන්නේ ලොකු ගෞරවයක් අම්මේ.'

චායා ගෙදර පැමිණ අලුත් රැකියාවට යාමට ඇඳුම් පැළඳුම් ලෑස්ති කර ඒවා නැවත නැවතත් අතපත ගා බැලුවේ ආශාවෙනි. පාසැල් යුගයේ ජනවාරි මාසයේ අලුත්ම පංතියකට යද්දීත් තිබුනේ මේ ආශාවම බව ඇයට සිහිවිය. බ්‍රවුන් පේපර් වලින් කවර දමා නම් ලියූ අලුත් මොනිටර් ඇක්සයිස් පොත් දහ දෙළොස් වතාවක් ඉඹ නිදාගත් හැටි චායාට මතකය. ඒ පොත්වල ප්‍රථම පිටුව ලියන්නට ඉස්සර තිබුනේ පුදුම හදිස්සියකි. බොහෝ දෙනෙකුට ප්‍රථම පිටුව ලියද්දී තිබූ ආශාව, හදිස්සිය පසු පිටුවලට යන විට තිබුනේ නැත. වරද එතැනය. හැමදමත් ජීවිතේ උදාවෙන්නේ අලුත්ම පිටුබව සිතන්නට පුළුවන්නම් ඒ හැම පිටුවකම අලුත්ම ආශාවකින් යමක් ලියන්නට පුළුවන්නම් ජීවිතය ඇත්තටම සුන්දරය. එහෙත් බොහෝ දෙනාගේ පටන්ගත් ලස්සන පසුවට නැත.

චායා ඇඟ සෝදාගෙන රෑ ඇඳුම දාගත්තේ රෑ දහයට පමණය. ඒද නින්දක් පිළිබඳ ආශාවක් සිතට දැනුනේ නැත. අම්මා අවදිව සිටිනු දැක චායා කුස්සිය දෙසට ගියේ නිවී යැනහුනු සිතිනි. පද්මා උන්නේ වම්බටු කපා ලුණු කලවම් කළ කහ වතුරට දමමිනි.

'අම්මා ඔය උදේට හදන්නද..'

චායා බංකුවේ ඉඳගන්නා අතරතුර ඇසුවාය.

'ඔව් පුතේ.. එනකොට ලේසියි.'

'බැදලා උයන්නද..'

WWW.EXPRESSLANKA.TK 62

'ඔව් ඇයි.'

'උදේට එච්චර හරියක් කරන්න බෑනේ.. ඔය දෙකක් ඇති.'

'එහෙම බෑනේ පුතේ. ඔයා තනියම දවල්ට කන්නෑනේ.. අනික් අය ඉස්සරහ බත් එක දිග අරින්නේ..'.

'මට ඒක ලැජ්ජාවක්නෑ අම්මේ.. අම්මා මහන්සි වෙන්නෙපා.'

'ආසාවෙන් බත් මුලක් ගැට ගහලා දෙන එක මහන්සියක් නෑ දරුවෝ.. ගිහින් නිදාගන්න. දැන් රෑ වෙලා.'

'නින්ද යන්නෑ අම්මේ..'

චායා නැගිට්ටේ එසේ කියමිනි. ඇය කාමරයට නොයා ඉදිරිපස දොර ඇරගෙන මිදුලට බැස්සාය. තුනී රෑ සඳ පාන අහිංසකව දහස් පෙතියා මල් පඳුරට වැටී තිබුණි. ඒ මල්වල සුවඳ මෘදු ලෙස පරිසරයට එක්කාසු වී තිබුණි. චායා දෑත් බැඳගෙන ඔහේ මිදුල පුරා සක්මන් කළාය. 'හෙටින් ඇරඹෙන ජීවිතය මොනවගේ වෙයිද..' එසේ සිතුවද චායාට කිසිවක් සිතාගන්නට බැරිවිය.

# 8

චායා විලවුන් කුප්පිය ගෙන ඉන් බිංදු කිහිපයක් ගෙළ දෙපැත්තට විදගත්තාය. මොහොතකින් කාමරය පුරා විහිදී ගිය සමන් මල් සුවඳ චායාගේ සිතට ගෙන ආවේ වෙනස්ම චමත්කාර හැඟීමකි. ඇඳගත්තා චේලාසන වැඩිදැයි ඇයට සිතුනේ පරිසරය නවමත් මෘදු අඳුරෙන් වැසී තිබුන නිසාය. ඇය කැඩපත ඉදිරියේ කිහිප වතාවක් කැරකී විවිධ කෝණයන්ගෙන් තම රුවදෙස බැලුවාය. හැඩ බලන්නට මේ කන්නාඩිය පොඩිවැඩියැයි ඇයට සිතුණි. එද ෂොප් එකේ තිබූ

WWW.EXPRESSLANKA.TK 63

විශාල කැඩපතින් තම රුව පෙනුන හැටි චායාට මතකය.

'පාන්දර වැඩී නැද්ද පුතේ..'

පද්මා බත් එකත් රැගෙන කාමරයට පැමිණ ඇසුවාය.

'තව පරක්කු උනාම බස්වල සෙනඟ අම්මේ.. වේලාසන යන තරමට හොඳයි.'

චායා අම්මා වෙත හැරී විලාසිතා නිරූපනයකදී මෙන් ඇවිදගෙන ආවාය. පද්මා සිනාසුනේ දුවගේ ළඳ බොළඳ හැසිරීමටය.

'ආ බත් එක..'

චායා අම්මා දුන් බත් පාර්සලය නැහැයට තබා ඉඹ බැලුවාය. දැන්මම ලිහා කන්නට තරම් සුවඳක් ඉන් හමා ආවේය.

'මං යන්නම් අම්මේ..'

චායා පහත්වී අම්මාට වැන්දය. පද්මා දියණියගේ හිස අතගෑවේ ආදරය පිරුන හැඟීමෙනි. අද සිට මුළු දහවලම පාළුය.

'මේකත් බෑග් එකේ දාගෙන යන්න. උදේට ගිහිල්ලා මැඩම්ට වඳින්න.. කව්රුත් ඉන්න තැන වඳින්න එපා..'

පද්මා බුලත් හුරුල්ල ගත්තේ ඊයේ පන්සල ළඟිනි.. මිල මුදල් සැපසම්පත් නොවුනද මිනිස්කම් වලින් ඈත්වීම හොඳ දෙයක් නොවේ.

'සර්ටත් වඳින්න ඕනද..'

චායා දැඩි අසීරුතාවයකට පත්ව ඇසුවාය. පද්මා සිනාසුනාය. එය ඇයටද ප්‍රශ්නයකි.

'තරුණ වයසේ කෙනෙක්ට නම් වඳින්න එපා.. හොඳ නෑනේ.'

චායා උන්නේ අම්මා කිව්වා නම් ඔහුටත් වඳින්නටය. වැන්ද නම් ඔහු ඒකටත් කුමක් හෝ කියනු ඇත. චායා මිදුලට බැස තවත් වරක් අම්මා දෙස බලා සිනාසුනාය. ඊයේ සන්සුන් කරගත් සිත අද පාන්දරම යළිත් කලබල විය.

'ලතා අක්කේ..'

චායා කෙටි තාප්පය ළඟ නැවතී ලතාට කතාකළාය.

'නංගි යන්නද.'

'ඔව් අක්කේ.'

WWW.EXPRESSLANKA.TK 64

'කෝ මෙහාට එන්න.. පවුඩර් චුට්ටක් වැඩියි.'

ලතා වායා සමීපයට පැමිණ සුරතින් ඇගේ මුහුණ අතගා පවුඩර් වැඩි හරිය පිස දැමුවාය.

'හොඳ වෙලාවට අක්කා දැක්කේ.'

'නෑ එහෙමම වැඩි නෑ.. කොහොමටත් පවුඩර් වැඩිය දන්න එපා.. බය් වල ගිහිල්ලා බහිනකොට පිපෙනවා. ඔයා කොහොමටත් සුදුයි නංගි..'

'යන්නම් අක්කේ.'

වායා හෘදයාංගමව කිව්වාය. ලතා අවසාන වතාවටත් වායාගේ සාරිය යකය් කළාය.

'දෙයියන්ගේ පිහිටයි.. ගිහින් එන්න.'

වායා කෙටි ගුරු පාරදිගේ යන අයුරු පද්මාත් ලතාත් බලාඋන්නේ ආශාවෙනි.

'පව්.. අහිංසක කෙල්ල.. බත් එක ගෙනිච්චද නැත්දේ..'

ලතා උණුවී ගිය හඬින් ඇසුවාය.

'ගත්තා ගත්තා.. වැඩිය ඕවල අත්දැකීමුත් නෑ.. මට බය මොනවා මේ දරුවට කරන්න වෙයිද කියලා.'

පද්මා කීවේ කණගාටුවත් වේදනාවත් මුසුවූ හඬවතිනි.

'නැත්ද හිතනවාට වඩා වායාගේ හිත හයියයි.. කෙල්ලෝ ඉක්මණට මෝරනවා අපිට තේරෙන්නෑ.'

'ලතා එක්ක කතාකරනකොට ඔය පිරිමි ළමයි ගැන එහෙම මොනවද කියන්නේ...'

පද්මා කරුණාබරව සිනාසී ඇසුවාය.

'තාම කෙල්ලගේ හිතට එහෙම දෙයක් වැටිලා නෑ. කවදහරි එහෙම දෙයක් පිළිවෙලට කරලා ඉවර කරපු දවසට තමයි නැත්දගේ හිත නිදහස් නේද..'

'ඒකනේ.. හිහත්නෙක් උනත් කමක් නෑ. එයාට ආදරේ කෙනෙක්

WWW.EXPRESSLANKA.TK 65

හොයාගත්තොත් මගේ හිත නිදහස්..'

'වායා වගේ කෙල්ලෙකුට කොල්ලෙක් හම්බ උනොත් හරියට ආදරේ කරයි. මටනම් ඒක නිතරම හිතෙනවා.'

පද්මා ගෙට ගියේ බරවූ හදවතිනි. මුළු නිවසම පාළුය. දැන් මේ පාළුව හවස පහ හය වනතුරු තිබෙනු ඇත. පද්මා කාමරයට ගොස් වායා උදේ ගලවා තැබූ රෑ ඇඳුම් ගෙන සිප එය යළිත් නවා තැබුවාය.

සාමාන්‍ය අතට හැරී තිබූ වායාගේ හෘද ස්පන්දනය වෙනස් වන්නට පටන්ගත්තේ කලම්බු ෆැෂන් දෙරටුව අභියසදීය. අදින් පසුව ජීවිතයේ වැඩි පැය ගණනක් ගෙවිය යුත්තේ මේ වහළ යටය. ඒ යට කුමක් සිදුවුවද එය දරාගත යුතුය. ඇය ප්‍රධාන දෙරටුවෙන් ඇතුළු වූයේ ප්‍රථම රැකියාව කෙරේ උපන් බැහිබර සිතුවිලි පපුවේ පුරවාගෙනය. ආරක්ෂක නිළධාරියා වායා හා අභිංසකව සිනාසුනේය.

'ගුඩ් මෝනින් මිස්..'

'මෝනින්..'

වායා ප්‍රසන්න ලෙස සිනාසුනාය.

'මිස් අද ඉඳලා වැඩ නේද.'

'දන්නේ කොහොමද..'

'ඊයේ නිලංකා මිස් කිව්වා.'

'නිලංකා මිස් ඇවිත්ද.'

'නාම නෑ.. දැන් එයි.. මිස් උඩට යන්න.'

වායා උඩු මහලට යන දෙරටුව ළඟ නැවතී පහළ ඇඳුම් විලාසිතාගාරය දෙස මොහොතක් බලා උන්නාය. කිසිවෙකු තවම පැමිණ නැත. එක පෙළට එල්ලා තිබූ විවිධ විලාසිතාවන්ගේ ඇඳුම් පැළඳුම් මැද ඇගේ යොවුන් සිත මොහොතකට අතරමං විය. මෙවැනි සාප්පුවකට පැමිණ ඇඳුමක් ගත් කාලයක් මතක නැත..

ඉහළ මාලයට නගිද්දී කුමක් හෝ හේතුවක් නිසා වායාට සිහිවූයේ අයංකාවය. එද මේ පියගැට පෙළබැස යද්දී ඔහු තමා දෙසම

බලාඋන් අයුරු ඇයට මතකය. ඊටත් පසු පාරේදී හෝමාගමට යන බස් නැවතුම පෙන්වූ අයුරු ඇයට සිහිවිය. මේ මහළ යටට පැමිණියේ මීට පෙර එක් දිනයක් වුවද ඒ දිනය තමාට නම් ජීවිතය පවතින තුරාවට අමතක නොවනා බව නම් වායාට සහතිකය. ඒතරම් සිතන්නට දේවල් ඇගේ කුඩා සිතට එද සිදුවිය.

උඩු මහළ තිබුනේ පාළුවට ගොස්ය. සියළු කාමර වසා තිබුණි. වායා පෙරදින ඉඳගත් පුටුවට බරවිය. එද මෙතන ඉඳගෙන සිටිද්දීත් අද ඉඳගෙන සිටිද්දීත් ඇති වෙනස ඇය සිතුවාය. දෛවය තමාව ගෙනවිත් ඇත්තේ හිතුවාටත් වඩා අඩි තුන හතරක් ඉදිරියට බව වායා දැන උන්නාය. ඇය හූදෙකලාවෙම අත් බෑගයට දැනම තබා ඔහේ බලාඋන්නාය. අම්මාගේ බත් එකේ රස්නය අත්බෑගයේ ලෙදර් රෙද්ද පළාගෙන සුරතට දැනෙයි. ‘අද මේක කන්න වෙයිද දන්නෙත් නෑ..’ වායා සිතුවේ සැකයෙනි.

‘ගුඩ් මෝනිං වායා..’

වායා නිලංකාගේ මියුරු හඬින් ගැස්සී නැගිට්ටාය.

‘මෝ..නි..ං.’

‘මට සිරිසේන අන්කල් කිව්වා.. ඔයා ආවා කියලා. මොකද අද මෙතනම ඉඳගත්තේ. අද ඉන්ටවීව් නෑ..’

නිලංකා සැහැල්ලුවෙන් කීවාය. වායාද ඒ සිනහවට එකතුවූවාය.

‘මට නිකම්ම එතනම ඉන්දවුනා.’

‘ලකී ප්ලේස් එකනේ නේද.’

නිලංකා එසේ කියා බැලුවේ වායාගේ වත දෙසය. වායාද ඒ අනුව තම වත දෙය කුතුහලයෙන් බැලුවාය.

‘ඇයි..’

‘නෑ මං බැලුවේ සාරිය ලස්සනයි කියනවද.. ඔයා ලස්සනයි කියනවද කියලා.’

වායා ලැජ්ජාවෙන් බිම බලාගත්තාය. නිලංකා ඒ අහිංසක වත දෙස බලාසිනාසුනාය.

'දෙරවල් අරින්නේ මැඩමුයි සර්රුයි ආවම.. ඔයාට ඉන්න වෙන්නේ ඇතුලේ.. එතකල් මං ළඟ ඉන්න..'

නිලංකා පිළිගැනීමේ කවුන්ටරය ළඟ තිබූ පුටුව ඇද චායාට පෑවාය. නිලංකා කුඩා මේසයේ ලාච්චු එක පෙළට හැර යමක් හදිස්සියෙන් සෙව්වාය.

'මොනා හරි නැතිවෙලාද..'

චායා පහත් හඬින් ඇසුවාය. නිලංකා ෆයිල් කවර අතපත ගාන අතර තුර චායාදෙස බලා සිනාසුනාය.

'නෑ.. ඔයාට තියෙනවා බඩ්ඩක් පෙන්නන්න.. මං මේ ඒක සෙව්වේ..'

නිලංකා සොයන්නේ කුමක්දැයි චායාද කුතුහලයෙන් බලාඋන්නාය. අවසානයේ නිලංකා දෙකට කුනට නවාතිබූ කොළ කැබැල්ලක් අතට ගත්තාය.

'මේක මතකද..'

නිලංකා කොළ කැබැල්ල පෙන්වාඇසුවාය. චායාට එය හොඳට මතකය. එදා අසංක සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගන්නේ කාවදැයි කියා වේලාසනම ලියා නිලංකාට දුන්නේ මේ කොළ කැබැල්ලය.

'මතකයි...'

'මොකක්ද..'

නිලංකා සීරුවට චායාගේ දෙනෙත් දෙස බලා ඇසුවාය.

'එදා සර් මැඩම් තෝරගන්නේ මෙයාව කියලා ලියලා ඔයාට දුන්නේ...'

'හරියට හරි.. දන්නවද මේකේ ලියලා සර් දුන්නේ කා ගැනද කියලා.'

චායා අහිංසකව කිම බලාගත්තාය. සමහරවිට ඔහු තෝරාගන්නට ඇත්තේ වෙන කෙනෙකු වන්නට ඇත.

'ද..න්..නෑ.. එදා ගොඩාක් අය ඇවිත් උන්නනේ. එයින් එක්කෙනෙක් ගැන..'

ඇය

WWW.EXPRESSLANKA.TK 68

'මං මේක පෙන්නුවා කියලා ආඩම්බර වෙන්නෙපා. ඔයා මගේ නංගි කෙනෙක් වගේ කියලා හිතලා මං මේක පෙන්නන්නේ.. ආ.. බලන්න.'

වායා ඒ කඩදාසි කොළය අතට ගත්තේ ගැහෙනා සුරතිනි. එහි ලියා තිබූ වැකිය දකිද්දී ඇගේ මුළු පපුවම සීතල විය.

'නැඹිලි පාට සාරිය ඇඳගෙන ඉන්න සුදු ගර්ල්ව..'

වායා මොහොතක් අදහාගත නොහැකිව ඒ පිළිවෙලක් නොවූ සිංහල අකුරු දෙස බලා උන්නාය. අනතුරුව ඇය තිලංකා දෙස බැලුවේ මහා පුදුමයෙනි.

'පුදුමයි නේද.'

'ඉන්ටවිව් කරන්නත් කළින් කොහොමද සර් දන්නේ.'

වායා අසරණව ඇසුවාය. ඇත්තටම ඇයට එය ප්‍රශ්නයකි.

'ඒ ඇයි කියලා ඔයාට වැඩ කරන කොට තේරෙයි.. අදට ඔය ඇති.. පුළුවන්තරම් මැඩම්ටයි සර්ටයි ආදරෙන් ඉන්න.. ඔයාට වරදින් නෑ.'

කාර්යාල වලදී හමුවන බොහෝදෙනා කුහකය. කවුරුත් බලන්නේ එන කෙනෙකු කපා හෝ හාම්පුතුන්ට ළං වන්නටය. ඒ අතින් වායාට තිලංකා ගැන පුදුමය.

'මැඩම් ඔයාව ගත්තේ ලොකු විශ්වාසයකින්.. කවදාවත් ඒ විශ්වාසේ කඩන්නෙපා... මෙහෙම තැනක වැඩ කරන්න අපි වගේ දුප්පත් කෙල්ලන්ට ලැබෙන එකම පුරුවේ පිනක්.. ඔයාව ඔය ගන්න තැනට මැඩම් මීට කළින් ගර්ල්ස්ලා දෙතුන් දෙනෙක්ම ගත්තා. දවස් දෙක තුන යනකොට මගේවත් මූණ බලන්නැ.. ඒත් මම හිනාවෙලා ළඟට ගිහිල්ලා කතාකළා. අද ඒ අය නෑ. ඒත් මම ඉන්නවා.. ඔයා එහෙම වෙන්නැ කියලා මට හිතෙනවා. අද මැඩම් නිසා චුට්ටක් හරි ඔළුව උස්සලා උන්නට වායා, මාත් හරි දුප්පත් කෙල්ලෙක්.. මැඩම් මට ඔයා ගැනත් කිව්වා. ඕන ප්‍රශ්නයක් මට කියන්න.. මං මට පුළුවන් විදිහට උදව් කරන්නම්. අපි ආවේ කොහතින්ද කියලා විතරක්

WWW.EXPRESSLANKA.TK 69

මතක තියාගන්න.. තරහ නැතේ මං මේවා කිව්වට..'

තිලංකා ඇස් පුංචි කර ඇසුවාය.

'අනේ නෑ.. කොච්චර දෙයක්ද මෙහෙමවත් මට කියපු එක.. මං හරි බයෙන් අර ගේට්ටුවෙන් උනත් ඇතුල් උනේ.. ඔයාව දැක්කහමයි හිතට චුට්ටක් සැනසීමක් ආවේ.'

'මං දන්නවා චායා.. මැඩම්ට.. සර්ට.. වගේ මූණ බලලා නම් කියන්න මං දන්නෑ.. ඒත් මට හිතෙනවා ඔයා ගොඩාක් කාලයක් අපි ළඟ 'ඉඳී කියලා.'

චායාට සැනසිල්ලක් දැනුණි. ඇයට තිලංකා ගැන ඇතිවූයේද ප්‍රසාදයකි. තම කුළුදුල් රැකියාව දන්ම සුන්දර යැයි චායා ප්‍රථම වරට සිතුවාය. ඒත් සමගම වාගේ රණතුංග මහත්මියත් ඇය පිටුපස අසංකත් උඩුමහලට ගොඩවිය. චායාත් තිලංකාත් නැගිට්ටේ එකමවිටය.

'ගුඩ් මෝනින් මැඩම්.. ගුඩ් මෝනින් සර්..'

දෙදෙනාම කීවේ එකම විටය.

'මෝනිං දරුවනේ.. මොකද මගේ අලුත් කෙල්ලව තිලංකා රිසෙප්ෂන් වැඩේට ගත්තද..'

රණතුංග මහත්මිය ඇසුවේ සිනාසීගෙනමය. අසංක කොණක සිට චායාදෙස බලාඋන්නේය.

'චායා මටත් කළින් ඇවිල්ලා මැඩම්..'

'ඒක හොඳයි.. ඉන්න මං චුට්ටකින් කතා කරන්නම්..'

රණතුංග මහත්මිය කාර්යාලය ඇතුළට ගිය පසු අසංක චායා වෙත වරක් පමණක් බලා පිළිගැනීමේ කවුන්ටරය අසළ තිබූ කැරකෙන කුඩා පුටුවේ වාඩිවිය. ඔහු අභියස ඉඳගෙන ඉන්නට තරම් ශක්තියක් නොවූ නිසා චායා හිටගෙනම උන්නාය. නැවත වරක් අසංක බලද්දී චායා සුන්දර ලෙස ඔහු හා සිනාසුනාය. අසංකගේ සිත මොහොතකට අවුල් විය.

'මෙයා ඊයේ විශ්වාස කළේනෑ නේද තිලංකා මම කිව්වාම.'

ඔහු එය කියා චායා දෙස නව වරක් බලන්නට අවස්ථාවක් යොද ගත්තාය. චායා තිලංකා දෙසත් ඔහු දෙසත් සමාව අයදින්නාක්

WWW.EXPRESSLANKA.TK 70

බඳු බැල්මක් හෙළුවාය.

'අනේ නෑ සර්... කෙල්ල විශ්වාස කළා. ඒකනේ ආවේ.'

යමක් කිවයුතුද.. නැත්නම් නිහඬව සිටිය යුතුද කියා සිතාගන්නට වායාට නොහැකි විය.

'මට හර්ෂණීට කෝල් එකක් ගන්න නිලංකා.'

එවර ඔහු උන්නේ බිම බලාගෙනමය. වායා තවමත් හිටගත් ගමන්මය.

'හර්ෂණී මිස් මෙච්චර උදෙන් නැගිටලා නැතුව ඇති.'

'නැගිටලා නැත්නම් නැගිට්ටවන්න ඕන.. ඔයා ගන්න.'

හර්ෂණී අසංකගේ පෙම්වතිය වියයුතුයැයි වායා නිකමට අනුමාන කළාය.

'රින්ග් වෙනවා.. සර්ම කතාකරන්න... අනිත් පාර මට බනියි.. නින්ද කැඩුවා කියලා.. ආ..'

නිලංකා රිසිවරය අසංක අතට දුන්නාය. ඔහු කල්පනා බරව එය කනට කර තබාගෙන උන්නේය.

'අදත් නින්ද කැඩුවනේද.. සොරි බබා..'

ඔහු කතාකළේ මෘදුවය. තමා සිතුවා හරිය. මේ ඔහුගේ පෙම්වතිය විය යුතුය...

'හවසට මොකද කරන්නේ...'

'හරි මං එන්නම්.. කෝ ලොකු මාමා ගෙදර ඉන්නවද..'

ඇය අසංකගේ ඥාති සොයුරියක වියයුතු යැයි ඊළඟ වර වායා සිතුවාය.

'දැන් ආයිත් කොට්ටේ බදාගන්නැතුව ගිහිල්ලා මූණ හෝදගන්නවා.'

ඔහු දුරකථනය තබා යළිත් වායා දෙස බැලුවේය. එවරද ඇය සිනාසුනා පමණී.

'නිලංකා මං අහන්නමයි හිටියේ.. මොකද අර මයුරි බලන බලන වෙලාවට සාප්පුවේ කොනක් අල්ලගෙන වාඩිවෙලා ඉන්නේ.. ෂෝරූම් ගර්ල්ස්ලා ගන්නේ වාඩිවෙලා සැප විඳින්න නෙමේනේ...'

අසංක [illegible] වූයේය. වායා බිම බලාගෙනම උන්නාය.

WWW.EXPRESSLANKA.TK 71

'සර් මයුරිට බබෙක් ලැබෙන්න.. මුල් සතිවල ටිකක් කලන්තේ වගේ එනවානේ.. ඒකයි.. මං හිතන්නේ.'

'ඇත්තද.. බබාලා ලැබෙන්න ඉන්නකොට එච්චර අමාරු වෙනවද..'

ඔහු ඇසුවේ තිලංකා දෙස පමණක් නොව චායා දෙසද බලාය. ඒ බැල්මේ වූයේ ඔයාලටත් ඒක දනිලා තියෙනවද වැනි හැඟීමකි.

'චූට්ටක් අමාරුයි සර්.. කන්න බෑ. උදේ වරුවෙම වමනේ එනවා.. කලන්තේ වගේ.'

'අම්මට තාම කියලා නැද්ද.'

'මටත් කිව්වේ පෙරේද.. හෙට අනිද්ද කියයි..'

'ගෑණු ළමයින්ට වැඩට ගන්නම තියෙන කරදර.. ඔයත් ඉන්නේ බබෙක් හදගන්නද..'

අසංක තිලංකා දෙස බලාඅහද්දී ඔහු චායා දෙසද බැලුවේය. චායා වඩා පුළුල්ව සිනාසුනාය. ඔහුට අවශ්‍ය වූයේ මේ උදෑසනේ ඒ හිනාව වැඩියෙන් දකගන්නටය.

'බබාල හදගන්න ඉස්සෙල්ල බඳින්න එපැයිනේ සර්..'

තිලංකා සිනාව සඟවා කීවාය. එකවරම ඇමතුමක් ආවෙන් තිලංකා දුරකථනය ගත්තාය. ඒ අවසරයෙන් අසංක තව එක්වරක් පමණක් චායා දෙසබලා නැගිට්ටේය. සාප්පුව පුරා මෙතුවක් දවසක් නොතිබූ පිරුණු බවක් අද ඇතැයි ඇතුළට යද්දී අසංකට සිතුනි.

'මැඩම් ඔයාට එන්නලු..'

තිලංකා දුරකථනය අතැතිව කීවාය. චායා අත්බෑගය කරට දමාගෙන තිලංකා දෙස තවවරක් බලා වීදුරු දෙර හෙමිහිට තල්ලු කළාය.

WWW.EXPRESSLANKA.TK 72

# 9

වායා.. රණතුංග මහත්මිය වෙත ගියේ අත්බෑගයේ දමාගෙන ආ බුලත් හුරුල්ලද රැගෙනමය. ඇය තරමක් කුලෑටිබවින් මේසය අසලින් ගොස් රණතුංග මහත්මිය අතට බුලත් හුරුල්ල දී දණ ගසා වැන්දය. රණතුංග මහත්මියට කිසිවක් අදහාගත නොහැකි විය. ඇය බුලත් හුරුල්ල අතට ගත්තේද හුහුරටය. අවුරුදු විස්සක විසි දෙකක තරම්වූ තම ව්‍යාපාරික ජීවිතයේදී මෙවැන්නක් අත්දුටු ප්‍රථම අවස්ථාව මෙය විය. වායා ඇයට වැඳ නැගිට්ද්දී රණතුංග මහත්මිය වායාගේ දෙනෙත් දෙසම අප්‍රමාණ කරුණාවකින් බලාඋන්නාය.

ජීවිත කාලයේදී තමාට හමුවූ හොඳම සේවිකාව දැන් තමාගේ ඉදිරිපිට ඉන්නා බව රණතුංග මහත්මිය ඉවකින් මෙන් තේරුම් ගත්තාය. ඇය මොලොක් ලෙස වායාගේ උරහිසට අත තබා මේසය ඉදිරිපස තිබූ පුටුව වායාට පෙන්වූවාය.

රණතුංග මහත්මිය වායා දුන් බුලත් හුරුල්ල දෙස මොහොතක් බලාඋන්නාය. සිංහල අවුරුද්දකට වත් තම සේවකයෙකු තමාට නොවැන්ද බව ඇයට සිහිවූයේ දැන්ය. කෙනෙකු මවා පෙන්වන මිනිස්කම් සහ හදවත ඇතුලාන්තයෙන් එන හෘදයාංගම බව අතර ඇති වෙනස පිළිබඳව ව්‍යාපාරිකාවක වූ රණතුංග මහත්මිය හොඳින් දැන උන්නාය. අවුරුදු විසි පහක් හයක් තරම්වූ මේ යුවතියගේ දෙනෙත් තුළින් ඇය දුටුවේ ගඳ ගහන සමාජයේ පිළී වලින් අපිරිසිදු නොවූ නිකැළැල් බවකි. ඇය තමාගේ තේරීමේ ගුණය ගැනජීවිතයේ ප්‍රථම වතාවට මුළු හදවතින්ම සතුටුවූවාය.

මේ සියල්ල එහා කාමරයේ සිට ලාවට අඳුරු කළ වීදුරු අතරින් අසංක බලාඋන්නේය. ඔහුගේ සිතටද මහා අමුත්තක් ඇතුළුවී තිබුණි. එයද මතුපිටින් අතගා බැලිය නොහැකි වෙනමම හැඟීමකි.

'අම්මා මොකද සිව්වේ ළමයෝ..'

රණතුංග මහත්මිය සාමාන්‍ය තත්වයට පත්ව ඇසුවාය.

WWW.EXPRESSLANKA.TK 73

'හරියට සතුටු වුනා. මැඩම්ට ගොඩාක් පින් දුන්නා.'

චායා අවංක හඬින් කීවාය. ඇය සිනාසුනේ චායාගේ කතාවටය.

'රස්සාවක් දෙන්නේ පින් ගන්න නෙවී චායා.. අදත් සාරිය ඇන්දුවේ අම්මද..'

'ඔව්..'

චායා රණතුංග මහත්මිය දෙස බයාදුව බලා කීවාය.

'අම්මත් චායා වගේම ලස්සන ඇති..'

එවරද චායා සිනාසුනා පමණි. ඇගේ සිත ටිකෙන් ටික සන්සුන් විය. රණතුංග මහත්මිය උදේම පැමිණ දල්වූ හඳුන්කූරු වල සුවඳ කාර්යාල කාමරය පුරා මෘදුව විසිරී තිබුණි. 'හරි පින් වුවඳයි..' චායාට සිතුණි.

'චායා ඉන්නෙ අර මේසේ..'

කාර්යාල කාමරයේ කොනක අසංක ඉන්නා කාමරයට තරමක් සමීපව තිබූ කුඩා මේසය පෙන්වා රණතුංග මහත්මිය කීවාය.

'වැඩ ගොඩක් තියෙනවා.. මං ඒවා ඩෝං ඩෝං ගාලා ඔයාට පටවන්නැ.. ටිකෙන් ටික චායා ඉගෙන ගන්න. තොතේරෙන දෙයක් තියෙනවනම් මගෙන් හරි සර්ගෙන් හරි අහගන්න. අනික චායා මේ කාමරේ ඇතුලේ සිද්ධ වෙන්නේ ගොඩාක් වැදගත් දේවල්. ඒවා පිටට යන්න බෑ. ඒ විශ්වාසය ඔයා රකින්න ඕනා.'

'ඔව් මැඩම්.'.

චායා ගෞරව පූර්වකව පිළිතුරු දුන්නාය.

'ගොඩාක් දෙනෙක් ඔයා ඉන්න තැනට ආවා.. එයාලා ඇවිත් වැඩ අවුල් කළා. මට මහ බරක් වුනා. මම ආස නැහැ චායාත් එහෙම කෙනෙක් වෙනවට.. අද මම චායට කරන්න පොඩි වැඩක් දෙන්නම්.. අපි හිම්හිට පුරුදු වෙමු.. දවල්ට කන්න කෑම ගෙනාවද..'

'ඔව් මැඩම්..'

'මොනවද ඉව්වේ අම්මා උදේ..'

WWW.EXPRESSLANKA.TK 74

චායාට පුදුම සිතුණි. බොරුවක් කරන්නට ඇගේ දිව නොනැමුණි.

'පරිප්පු තෙම්පරාදුයි.. වම්බටුයි.. මාළුයි.'

රණතුංග මහත්මිය ආශා කළේ මේ සරල අව්‍යාජ බවටය. ඇය කෙනෙකු තුළ රැඳුන අව්‍යාජ බව රසවිඳිය හැකි කෙනෙකි.

'අම්මට රහට උයන්න පුළුවන්ද..'

'පුළුවන් මැඩම්..'

'දවසක අපිත් ගෙනල්ලා කමුකෝ.. මං නම් ආස කිරි කොස් හදලා කරෝල තෙල්දලා ගොටුකොළ සම්බෝල එක්ක කන්න..'

මැඩම් කියද්දී චායාගේ මුවටත් කෙළ ඉනුවේය. අසංක එහාපැත්තේ සිට සිනාසෙනු චායා නෙත් කොනින් දුටුවාය.

'සර් ආස මොනාටද දන්නවද..'

රණතුංග මහත්මිය කියද්දී අසංක හිස හරවා ගත්තේය. අම්මාට කවුරු හෝ කමක් නැත. කියවන්නට ආසනම් සියල්ල කියවයි. චායා රණතුංග මහත්මියගේ මුවදෙසම බලාඋන්නාය.

'අල හොදියි.. බිත්තර ඔම්ලට්ටුයි.. බතුයි කන්න.. පොඩි කාලේ පුරුද්ද..'

'එහෙමත් රසයි මැඩම්..'

චායා නිකමට කීවාය. අසංකගේ හිතට සහනයක් දැනුණි. ඒ ඇයි කියා ඔහු දන්නේ නැත.

'කෑම කද්දී නිලංකා එක්ක කන්න. අවශ්‍ය දෙයක් උනොත් ඇරෙන්න චායා පහළට යන්නෙපා.. තේරුනාද.'

'ඔව් මැඩම්..'

'යන්න සර් ගාවටත් ගිහිල්ලා කතා කරලා එන්න..'

අසංකට කිසි දිනයක මේ තරම් බරක් දැනී නැත. මේ ආයතනයේ සේවිකාවන් තිහ හතළිහක් සමඟ ඔහු මූහුණට මුහුණ වැඩ කර ඇත. එහෙත් මේ තරම් කැලඹීමක් හිතට දැනුනු මොහොතක් ඔහුට මතක් නොවෙයි.

චායා කළු වීදුරු කාමරයට ඇතුල් වූයේ අසංක දෙස වරක්

WWW.EXPRESSLANKA.TK 75

පමණක් හිස ඔසවා බලා සුන්දර ලෙස සිනාසීය. චායා ඇතුල්වූ පසු කුඩා කාමරය පුරා විහිදී ගිය සමන් මල් සුවඳ ඔහු විඳගත්තේ කලබල වූ සිතිනි.

තමාගේ මේසය ඉදිරිපිට සිටගෙන ඉන්නා යුවතිය තමා ජීවිතයේ දුටු සුන්දරම යුවතිය බව අසංකට සහතිකය. එවන් මොහොතකදී ඕනෑම තරුණයෙකුගේ පපුවේ ඇතිවන නුහුරු චමත්කාරය ඔහුගේ ළයටත් දැනී තිබුණි.

'අම්මා කිව්ව ඒවා චායට මතකයි නේද..'

'ඔව් සර්..'

චායා හිස ඔසවා ඔහුදෙස බලා පිළිතුරු දුන්නාය. ඔහු කතා කරන්නේ ටයි පටිය මැද ගසා ඇති රන් පින්තාරු කළ කුඩා කටුව අල්ලාගෙනය.

'පුළුවන් නම් කවදාවත් අර පුටුව හිස්ව තියන්න එපා.. ඒක හරි මූසලයි.. අනික අපි ඔෆිස් එකට ආවට පස්සේ මේ කාමරේට ඇතුල් වෙන්න ඉන්නත් එපා. මැඩම් ඒ දෙකටම ආස නැහැ. චායාට

WWW.EXPRESSLANKA.TK 76

තේරුණාද.'

'ඔව් සර්..'

'බෝයි ෆ්‍රෙන්ඩ් එක්ක ගමනක් යන්න ඕනනම් නිවාඩු දවස්වල එයාට එන්න කියන්න.. තේරුණාද..'

චායා බිම බලාගෙන සිනාසුනාය. අසංක එය ඇසුවේ හිතාමතාය. ඒ මුහුණේ ඉරියව් බලන්නටය.

'එහෙම කොහෙත් නෑ සර්.. ඒ හින්ද මට ප්‍රශ්නයක් නෑ.. හැමදම එන්න පුළුවන්.'

චායා වඩාත් පැහැදිලි ලෙස පිළිතුරු දුන්නාය. අසංක ඒ තියුණු දෙනෙත් දෙස මොහොතක් බලාඋන්නේය.

'නිලංකා හොඳ කෙල්ල. එයා එක්ක කතා කළාට කමක් නෑ. අනික් අය වැඩිපුර ඕන නෑ.'

'මට තේරුණා සර්..'

'අල හොදියි ඔම්ලට්ටුයි බතුයි රහයි කියලා දන්නේ කොහොමද..'

ඔහු එකවරම ඇසුවේය. චායා දෙතොල්පට නදකර සිනාසුනාය.

'මං එහෙම කාලා තියෙනවා සර්..'

චායා අමාරුවෙන් වචන එකතු කර කීවාය.

'හරි.. එහෙනම් යන්න.. මං ඕන උනාම මේ වීදුරුවට තට්ටු

WWW.EXPRESSLANKA.TK 77

කරනවා.. හරිද.'

'හරි සර්..'

චායා ගියේ ඔහුගේ මේසය මත තවත් සිනහවක් ඉහිරුවාය. කාර්යාල කාමරය තුළ ඉන්නටත් බැරි නොඉන්නටත් බැරි අමුතුම හැඟීමක් අසංකට දැනුණි.

චායා කුඩා මේසයේ ඉඳගත්තේ මල් ආසනයක ඉඳගන්නාක් බඳු භක්තිමත් හැඟීමෙනි. ඇය මේතරම් විශාල දෙයක් බලාපොරොත්තු නොවූවාය. තමාට මේ රැස්සාව කරගෙනයාමට නොහැකි වේයැයි ඇයට බිය සිතුනි. ඇය හිස ඔසවා රණතුංග මහත්මිය දෙස බැලුවේ ඒ හැඟීමෙන් පිරුන දෙනෙතිනි.

'චායා මෙහේ එන්න..'

රණතුංග මහත්මිය කතා කරන්නේ ලතාවකටය. චායා මොහොතකින් ඇය ඉදිරිපිට උන්නාය. රණතුංග මහත්මිය උන්නේ අලුතින්ම හඳුන්වා දෙන සාය විලාසිතාවක සාම්පල් පරීක්ෂා කරමිනි. ඒවා සිතාගන්නටත් බැරි තරම් කෙටිය.

'දෙන්නද එකක් චායාට අඳින්න..'

ඇය සිනාසී චායාදෙස බලා කීවාය. චායා මෘදු ලෙස සිනාසුනාය. එය ඇන්ද කල සළුවා වලින් හරි අඩක් එළියේය.

'කෙල්ලෝ ලස්සනට අඳින්න ඕන තමා.. ඒත් මේතරම් අසංවරව හොඳ නෑ.. මොනා කරන්නද මේවා තමයි මාකට්.. මේ පේන්නැද්ද ඒ මදිවට පිටිපස්සෙනුත් අඟල් දෙකක් කට් කරලා.. ඊට වඩා හොඳයි යට කළිසම ඇඳගෙන ගියානම්..'

චායාට බැලුනේ අසංක දෙසය. ඔහු උන්නේ දුරකථන ඇමතුමකය.

'මේ සායවල් වල මේ ප්‍රයිස් ටැග් ක්ලිප් කරන්න ඕනේ.. පස්සෙ ලාර්ජ්..මීඩියම්.. ස්මෝල් එක්ස්ට්‍රා ලාජ් කියලා වෙන් කරලා ඒ වලින් කීයක් තියෙනවද කියලා මේ පොතේ ලියන්න ඕන. මේ කලින් කරපු එකක් තියෙනවා. ඒක බලලා කරන්න. ටැග් ක්ලිප් කරන ගමන් ඩූට්ටක් එහාට මෙහාට කරකවලා බලන්න ඩැමේජ්ද කියලා..

WWW.EXPRESSLANKA.TK 78

වායාට තේරුණාද..

ඔව් මැඩම්.. හැම සයිස් එකකටම එකම ප්‍රයිස්ද මැඩම් ගහන්නේ.

ඔව්.. ඔක්කොම ලියලා ඉවර වෙලා සර්ට කියලා එතන අත්සන් දාගන්න. හරිද..

හරි මැඩම්..

වායා සායවල් තොගයම තම මේසය ළඟට ගෙන ගියාය. එය ඇත්තටම ඉතා පහසු වැඩකි. හැම වැඩක්ම මෙසේ නම් ඇත්තටම ප්‍රශ්නයක් නැත. වායා එකින් එක පරීක්ෂා කර මිල සඳහන් කාඩ් පත් අමුනා වෙන් වෙන්ව ලිව්වාය. අවසානයේ විකිණීමට නුසුදුසු තත්වයේ තිබූ සායද පොතද රැගෙන අසංක වෙත ගියාය.

සර් මේක ඩැමේජ්..

අසංක වායා දුන් සාය අතට ගත්තාය. ඔහු එය තුන්හතර පැත්තට කරකවා බැලුවේය. පෙනෙන්නට එවැන්නක් නැත. අසංක සිනාසී වායා දෙස බැලුවේය.

කොහෙද ඩැමේජ්..

වායා උන් තැන සිට අසංකට එය පහදන්නට අමාරුය.. ඇය ඔහු ඉන්නා පැත්තට ගොස් සාය අතට ගත්තේය.

සර් ඩිසයින් එක එන්නේ සිපර් එකයි පිටිපස්සේ කට් එකයි එකම පැත්තට.. මේකේ සිපර්එක පිටිපස්සේ.. කට් එක ඉස්සරහ.. ඒක ඩැමේජ් නේද සර් එතකොට..

අසංක ඒ අඩවන් දෑස දෙස බලා සිනාසුනේය. වසර පහ හයක ඇඟලුම් අත්දැකීම් ගැන ඔහුට ලැජ්ජාවක් දැනුණි.

ඒකත් අලුත් පැටන් එකක්ද දන්නෑ..

ඔහු සුන්දරව සිනාසී කීවේ වායාදෙස බලාය.

ඉස්සරහින් කට් එක දන්නෑ සර්..එයාලට වැරදිලා.. එහෙම තියෙන්නේ ස්ලිට් ස්කර්ට් වල විතරයි.. ඒත් පැත්තකින්..

අසංක අම්මාගේ තේරීම ගැන දෙවන වතාවටත් සතුටුවිය. ඔහු සිනාසී [illegible] වායාගේ වටකුරු [illegible] අත් [illegible] දෙස

WWW.EXPRESSLANKA.TK 79

බලාඋන්නේය. ඒ මක තම කැත අකුරු ලියන්නට ඔහුට ලෝබ සිතුනි.

අසංක කෙටි අත්සනක් තබා පොත නැවතත් වායා අතට දුන්නාය.

'කලර්ස් කීයකින් තිබුනද වායා..'

'තුනකින් සර්.. ඒත් බ්ලැක් අඩුයි.. පර්පල් වැඩියි..'

'එතකොට..'

'ගෑණු ළමයි වැඩිය ගන්නේ බ්ලැක් ස්කට් සර්..'

වායා සිනාසී කීවාය.

'ඇයි ඒ..'

'එතකොට සර් ඒක ගොඩාක් බ්ලවුස් වලට මැච් කර කර අඳින්න පුළුවන්.. පර්පල් වගේ කලර් එකක් මැච් කරන්න අමාරුයි.'

අසංක එහා පැත්තේ උන් තම අම්මා දෙස බැලූවේය. ඇයද උන්නේ මේ කතාව අහගෙනය. වායාගේ සාමාන්‍ය දැනීම ගැන ඇය ඇත්තටම සතුටුවූවාය.

'ඇත්ත පුතා.. ගිය පාර අර රෙඩී වෙයා ගාමන්ට් එකෙන් ගෙනාපු පර්පල් ස්කර්ට්ටුත් තාම තියෙනවා. අනිත් පාර බ්ලැක් වැඩි කරන්න.'

අසංක අම්මාගේ කතාවට වායා දෙසට හැරී සිනාසුනාය. වායා නිහඬව අසංක අත තිබූ ඩැමේජ් සාය අතට ගත්තාය.

'මැඩම් මේවා හැගර් කරන්නද..'

'වායා දන්නවද ඕකට ගහන හැගර් එක මොකක්ද කියලා.'

රණතුංග මහත්මිය පරීක්ෂාකාරීව වායා දෙස බලා ඇසූවාය. වායා හිස වැනුවාය.

'මොකක්ද.'

'ෂෝට් ක්ලිප් හැගර් මැඩම්.'

'කොහොමද දන්නේ..'

ඇය විමසිලිමත්ව වායාගෙන් ඇසුවාය.

'අම්මයි මායි කාලයක් චූටි බබාලගේ ඇඳුම් මැහුවා. ඒ කාලේ

පමුණුවට ගිහිල්ලා බඩු ගෙනාවේ මම..'

'ඇයි ඒක නැවැත්තුවේ..'

'බඩු ගෙනියන අය අපිට සල්ලි දුන්නෑ මැඩම්..'

'අනේ පව්..'

රණතුංග මහත්මිය කීවේ ඇත්තටම වේදනාවෙනි.

'අතන ස්ටොක් කාමරේ හැගර් තියෙනවා. ඒ නැතත් ඔහොම අතුල අනේ පහළට යැව්වත් කමක් නෑ.. පල්මලහා අය ඒක කරයි.'

'නෑ මැඩම් මට පුළුවන්..'

රණතුංග මහත්මියට ලෝබ සිතුනේ වායාගේ මේ බුහුටිකමටය. අතනට මෙතනට පනිමින් උද්යෝගයෙන් වැඩ කරනා සේවකයින් දකීම හාම්පුතෙකුට උතුරායන ප්‍රීතියකි. වායා ඒ අතින් ඒ සතුට දිය හැකි දුර්ලභගණයේ සේවිකාවක් වනුඇතැයි ඇයට සිතුනි.

වායා සාය වලට හැඟර් දමුයේ අසංකගේ කාමරයට යාබදව තිබු කුඩා මේසයේ සිටය. එකවරම කාර්යාල කාමරයේ වීදුරු දෙරින් ඇතුළු වූ යුවතිය දක වායා හිස ඔසවා මොහොතක් බැලුවාය.

'ආ.. මොකෝ කෙල්ලට මේ පැත්ත මතක් උනේ..'

ඇය දුටුවනම් රණතුංග මහත්මිය ඇසුවාය. ඇය රණතුංග මහත්මියගේ අසුන අද්දරටම පැමිණ ඇගේ කම්බුලක් සිපගත්තාය.

'මං ආවොත් ඇන්ටි අහන්නේ ඒක..'

'හර්ෂණීට ඉතින් මාව නෙමේනේ මතක් වෙන්නේ... අර ඉන්නේ..'

උදේ අසංක කතාකළේ ඇයට බව වායා තේරුම් ගත්තාය. ඩෙනිම් ජීන්ස් කලිසමක් හා සාත ටී ෂර්ට් එකක් ඇඳ උන් ඇගෙන් පළවූයේ බටහිරට හුරු දඟකාර සුන්දරත්වයකි.

'ඇන්ටි තාත්තා කිව්වා අසංකයියා එක්ක පොඩි ගමනක් යන්න කියලා.'

ඔහුගේ නම අසංක බව වායා මුල්වරට දැනගත්තේ දැන්ය. ඒ නම ඇය දෙතුන් විටක් හදවතින් පුනරුච්චාරණය කළාය.

'ඒ කොහෙද..'

'මේ මගේ යාළුවෙකුගේ එන්ගේජ්මන්ට් එකක්.. පොඩ්ඩක් විෂ් කරලා එන්න.. තනියම යන්න බෑ ඇන්ටී..'

රණතුංග මහත්මිය මොහොතක් කල්පනා කරව උන්නාය.

'එක්කගෙන ගිහිල්ලා ඉක්මණට එවන්න... මෙහෙත් වැඩ ගොඩ ගැහිලා. සීයත් නාලෙනේ..'

'හරි ඉක්මනට එවනවා..'

'ඉතින් ඔයා එන්ගේජ්මන්ට් එකට යන්නේ ඕක ඇඳගෙනද.'

රණතුංග මහත්මියගේ කතාවට හර්ෂණී තම වත දෙස නැවත වතාවක් බැලුවාය.

'ඇයි ඇන්ටී.. මේ හොඳ නැද්ද...'

'හරි හරි හොඳයි.. හොඳයි..'

ඇය එපමණක් කියා වෙනත් වැඩක නිරතවූවාය. එවැනි උත්සවයකට මේ ඇඳුම් කොහෙත්ම නොගැළපෙන බව චායා සිතින් තීරණය කළාය. මේ ඇඳුම ගැළපෙන්නේ සරල ගමනකට පමණි. හර්ෂණී අසංකගේ කාමරයට යන අතරවාරයේදී චායා දෙස බැලුවාය. ඒ බැල්ම එතනින් නතර නොවී ඇය දෙර පසුකරන තෙක්ම එලෙසම චායාවෙත යොමුව තිබුණි. චායා එක්වරක් පමණක් හිස ඔසවා සාමාන්‍ය සිනහවක් පමණක් පෑවාය.

'අසංකයියා යත්.'

ඇගේ හඬ උස්ය. එහි පාලනයක් නැත.

'ඕකට යන්නම ඕනෙද..'

'නැත්නම් මං ඔයාව හොයාගෙන එනවයැ.. හරි.. බැරිද..'

'වැඩත් ගොඩ ගැහිලා හෂී..'

අසංක ගැන චායාට දුක සිතුණි.

'ඇයි ඔය ඉන්නේ වැඩ කරන්න අය...'

ඇය කියූවේ තමාට බව චායා තේරුම් ගත්තාය. ඇය බලා ගිය බැල්ම පවා ඒතරම් සුබ එකක් නොවේ. බාහිර දේවල් ගැන සිතීම අවශ්‍ය නැති දෙයකි. තමාට අදාලවන්නේ මැඩමුත් සර්රුත්

WWW.EXPRESSLANKA.TK 82

පමණි. ඊකියාවේ බැඳී ඇත්තේ ඒ දෙදෙනා සමඟය.

'හරි චුට්ටක් ඉන්න.. මං පටගාලා කොණ්ඩේ පීරගෙන එන්නම්.'

ඒ අතරවාරයේ හර්ෂණී කාමරයෙන් එළියට පැමිණ වායා ප්‍රයිස් මාක් අල්ලමින් උන් සායක් අතට ගත්තාය.අනතුරුව එය ඇගේ වතට තබා බැලුවාය. ඒ කිසිම වෙලාවක ඇය වායා දෙස බැලුවේ නැත. හර්ෂණී එක් සායක් තෝරාගෙන රණතුංග මහත්මිය දෙස බැලුවාය.

'ඇන්ටි මං මේ ස්කර්ට් එකක් ගන්නද...'

'ගන්න ළමයෝ ගන්න.'

ඇය උන්නේ වෙන වැඩකය.. හර්ෂණීගේකතාවට ඇය පිළිතුරු දුන්නේ ඒ දෙසවත් නොබලාය. හර්ෂණී තෝරාගත් සාය දෙකට තවා ගත්තාය. එවර ඇය හිස ඔසවා වායාදෙස බැලුවාය.

'මිස්ට ඕක චූට්ටක් ලොකුවෙයි.. මේක ගන්න.'

වායා විනීත ලෙස මධ්‍යම ප්‍රමාණයේ සායක් තෝරා ඇයවෙත පා කීවාය.

'ඔයා කොහොමද දන්නේ..'

හර්ෂණී වායා දෙසවත් නොබලා මවාගත් ආඩම්බර බවකින් ඇසුවාය.

'ඉණ ටිකක් ලොකුවෙයි නේද මිස්.. මීඩියම් වේස්ට් එකක් හරියන්නේ..'

හර්ෂණී වායා කියූදේ ගණනකට ගත්තේ නැත. ඇය එතැනින් ඉවත්ව ගියේ ඇය තෝරාගත් සායම රැගෙනය. වායා කිසිවක් නොකියා බිම බලාගෙන ඇගේ වැඩේ කළාය. හර්ෂණී පරාජය පිළිගන්නට කැමති නැතැයි වායා සිතුවාය. එහෙත් ඇත්ත එය නොවේ. ඇය උන්නේ හිස පුරා නැගි ඊර්ෂ්‍යාවකින් දැවෙමිනි. වායා වැනි ලස්සන යුවතියක් මෙතනට කඩා පාත්වූයේ කෙසේදැයි ඇය යටි සිතින් සිතුවාය.

'වායා මට කෝල් ආවොත් පණිවිඩේ අහලා කවුද කියලා අහලා මගේ මේයේ උඩ තියෙන පොතේ ලියන්න..'

අසංක ගියේ හර්ෂණී බලා ඉඳිද්දීම වායාට එසේ කියාය. ඇය

WWW.EXPRESSLANKA.TK 83

වඩාත් ගෞරව පූර්වක ලෙස හිස වැනුවාය.

"ඒ මගේ අයියගේ බාල දුව.. හර්ෂණී.."

ඔවුන් ගියපසු රණතුංග මහත්මිය චායාට නිකමට මෙන් කීවාය. මෙතන සිටිනවානම් මේ සියල්ල ඇය දැනගත යුතුය. "අසංක සර් බඳින්න ඉන්නේ එයාවද්දයි" අසන්නට ඇයට සිතුණි. එහෙත් තමාට ඒවා අවශ්‍ය නැත.

"මේ ළමයා මොකක්ද අරගෙන යන්නද කියලා ඇහුවා නේද. මොනවද ඒ..."

ඇය කරමින් උන් වැඩය නිමා කර දිග සුසුමක් හෙලා ඇසුවාය. චායා සිනාසුනාය.

"මේ ස්කර්ට් එකක් මැඩම්.."

චායා ඇය අතවූ කෙටි සායක් පෙන්වා කීවාය.

"මේ ෂෝට් ස්කට් එකක්.."

ඇය ඇසුවේ පුදුමයෙනි.

"ඔව් මැඩම්. ඒත් අපරාදේ මිස්ගේ ඉණට ඒක ලොකුයි මං හිතන්නේ.."

"මෙච්චර කොට සායවල් ඇඳලා මේ කෙල්ල කොහේ යන්නද.."

චායා නිහඬ වූවාය. ඇයට දුක තමා හරියට තෝරා දුන් සාය ඇය නොගැනීම ගැනය. එය ඇගේ හිතට හරිමදිය. රණතුංග මහත්මිය දුරකථනය අතට ගත්තාය.

"තිලංකා ඔය සර් ගිහින් නැත්නම් එවන්න පොඩ්ඩක්..."

චායා බිම බලාගෙනම සිදුවන්නට යන්නේ කුමක්දැයි සිතුවාය. මොහොතකින් අසංක කාමරයට ගොඩවිය.

"අනවශ්‍ය ප්‍රශ්න දගෙන මට අන්තිමට ලොකු මාමවත් නැති කරන්න එපා හොඳද.. අනික ඔය වැඩි ගමන් බිමන් මං තීරණයක් ගන්නකම් ටිකක් පුතා අඩු කරන්න ඕනේ.. හැම දෙයක්ම අවුල් කරන්න බෑ හරිද.."

රණතුංග මහත්මිය කීවේ සැරෙන් නොවේ.. කරුණාවෙනි.

WWW.EXPRESSLANKA.TK 84

අසංක ඩායා දෙසද හොරැහින් බැලුවේය.

'මං මොනා කරන්නද අම්මා.. ලොකු මාමනේ එවලා තියෙන්නේ.'

'හරි.. දැන් යන ගමන යන්න.'

අසංක එළියට ආවේ බරවූ හදවතිනි. අම්මා කියන්නේ සැබෑය. ජීවිතය ගැන තීරණයක් ගතයුතුය. එහෙත් කුමන තීරණයක් ගතයුතුදැයි ඔහුටත් නොවැටහේ.

'ඇයි..'

අසංක පහළ මාලයට එද්දී හර්ෂණී ඇසුවාය. අසංක කිසිවක් කීවේ නැත.

'ඇයි ඇන්ටි කතාකළේ...'

'එන ගමන් ඕඩර්ස් වගයක් චෙක් කරන්න දුන්නා...'

අසංක වාහනයට නගිමින් කීවේ නොරිස්සුමෙනි.

'මොකක්ද අයියේ.. දැන්වත් අම්මට පැන්ෂන් ගන්න කියන්නකෝ.. ලෝබකමට බදං ඉන්නැතුව.. ඔයාට බැරිද ඕක මැනේජ් කරන්න..'

'අම්මා තරම් මං බිස්නස් ගැන දන්නෑ හෂී.'

අසංක ඉවත බලාගෙන කීවේය.

'කවුද අර ඇතුලේ ඉන්න කෝස් එක.'

හර්ෂණී අහද්දී අසංකට සිනා ආවේ ඉබේටමය. ඔහුට පුදුම ඇය මේ ප්‍රශ්නය මුලින්ම නැඟූ එකය.

'අලුතින් ගත්ත ළමයෙක්.. වැඩ හොඳයි.'

අසංක කීවේ ඩායාගේ රුව මනයේ ඇඳගෙනය.

'කවුද ඔයාද ඉන්ටර්වීව් කළේ.'

හර්ෂණී හරහට මෙන් ඇසුවේ වාහනයේ වීදුරුවෙන් එපිට බලාගෙනය. අසංක ඒ මුහුණ දෙස සූපරීක්ෂාකාරීව බැලුවේය.

'මං කළත් ගන්නේ එයාවම තමයි. ඒත් අම්මා කළේ.. අදමයි වැඩට ආවේ..'

අසංක වඩාත් සැහැල්ලු වෙමින් වාහනය පැදවූවේය. හිතන්නට යමක් නැතත් හිත බරය. ඔහු වාහනයේ කැසට් රෙකෝඩරය වාදනය කළේය. එයින් ගලා ආවේ අම්මා නිතර අහන ලතා මංගේෂ්කාර්ගේ

WWW.EXPRESSLANKA.TK 85

ගීතයකි.

'මේ මොන මළ ජරාවක්ද..'

හර්ෂණී එකවරම කැසට් යන්ත්‍රය වසා කීවාය.අසංක කිසිවක් කීවේ නැත. ඔහු උන්නේ වෙනමම ලෝකයකය.

'මොකද අද වෙලා තියෙන්නේ..'

හර්ෂණී අසංකගේ මූහුණ දෙසම බලා නොරිස්සුමෙන් ඇසුවාය.

# 10

වායා මුළු හදවතින්ම තම කුළුඳුල් රැකියාවට ආදරය කළාය. ඊටත් වඩා ඇය නොහිතූ තරම් ඉක්මනින් අලුත් රැකියාවේ අත්දැකීම් එකතු කර ගත්තාය. වායා ජීවත්වූයේ රැකියාව පිළිබඳ සිතුවිලි වලමය. ඇය තම කුළුඳුල් රැකියාව ආත්මයෙන්ම කළාය. ඒ බව වෙනකාටත් වඩා තේරුම් ගත්තේ රණතුංග මහත්මියයි. ළතැවෙන මළකඳක් වැනි සේවිකාවන් සමඟ වැඩ කර කළකිරී උන් ඇයට වායාව පෙනුනේ දස දෙනෙකු එකතු කර තැනූ එක් අයෙකු මෙන්ය. වායා රැකියාවේ වැඩ කටයුතු පමණක් නොව රණතුංග මහත්මියගේත් අසංකගේත් ජීවන ශෛලියද තේරුම් ගත්තාය. වායා රැකියාවට එන්නේ රණතුංග මහත්මියත් අසංකත් එන්නට පැයකට පමණ පෙරය. ඒ පැයට ඇය සෑහෙන වැඩ ප්‍රමාණයක් අහවර කළාය. එපමණක් නොව පෙරද අවුල්ව දමාගිය කාර්යාලයද ඇය ඇගේ අතින්ම අස් කළාය.

'ඔයා මෙච්චර දවසක් කොහෙද රත්තරනේ හැංගිලා හිටියේ.. වේලාසනම මම ළඟට එන්න තිබුනනේ..'

රණතුංග මහත්මිය දවසක උදයේ කීවේ වායා බුදු පහනට අවශ්‍ය සියල්ල පිළියෙල කර තබනු දුටු විටය. ඇයට තිබුනේ පහන

WWW.EXPRESSLANKA.TK 86

දල්වා වඩින්නට පමණි.

ව්‍යාපාරික ජීවිතයේදී අතපසුවූ බොහෝ සියුම් කාරණා ඇයටත් අයංකටත් මතක් කර දුන්නේ චායා විසිනි. ඒ සියුම් දැනුම ගැන රණතුංග මැතිණිය එළිපිටම චායාට ප්‍රශංසා කළාය.

'මැඩම් අර රත්තරු ගාමන්ට් එකේ බඩු ගොඩක් ගන්නෙපා.. එයාලා මේ පොඩි පොඩි ෂොප් වලටත් දද යන්නේ.. මම දකිනවා ගර්ස්ලා හැමෝම ඇඳගෙන යනවා. මං පහළත් බැලුවා. ඒවා ඔක්කොම ඉතුරුයි.. අනික බඩුත් හරි බාලයි.. හරිම ඒකාකාරී ඩිසයින්ස්..'

'පුතා මේ ඇත්තද කියන්නේ.. බලලා නෙවේද ගන්නේ.'

'ඔව් අම්මේ.. චායාත් කියන්නේ දැන්නේ..'

'ඇයි ළමයින් සර්ට කිව්වේ නැත්තේ.'

'මට බය හිතුනා මැඩම්..'

'අනිත් දවසේ එහෙම බෑ හොඳේ... මගේ හරි මොකක් හරි වැරැද්දක් දැක්කොත් කියන්න ඕන. ඔයාට අපිට නොපෙනෙන දේවල් පේනවා.'

චායා අයංග දෙස බලා සමාව ඉල්ලන්නාක් බඳුව සිනාසුනාය.

'මාව අම්මට අල්ලලා දුන්න නේද..'

අසංක චායා තමා වෙත ආ මොහොතක ඇසුවේය. චායා බිම බලාගෙන සිනාසුනාය.

'මං හිතලා කිව්වා නෙවී.. සර්ටනේ කවදහරි ඕවල පාඩුව..'

'අනිත් දවසේ අම්මට කියන්න කලින් මට කියන්න හොඳේ..'

'ම්..'

චායා දෙතොල්පට තද කර සුන්දර ලෙස සිනාසී කීවාය. ඒ සිනහව දෙස බලන්නට අසංක ඇත්තටම ආශා කළේය. ඔහු ලෝබකමින් මෙන් ඒ සිනාව දෙස මොහොතක් බලාඋන්නේය.

'මං චායාට බඩුවක් කියන්නද.'

අසංක අම්මාට නොඇසෙන්නට ඇසුවාය. ඒ වචන වලට නොව එය ඇසූ හැටියට චායාගේ පපුව සීතල වීගෙන ගියේය.

WWW.EXPRESSLANKA.TK 87

'මො..ක..ක්..ද.. සර්..'

'නෑ.. ඕන් නෑ.. චායා යන්න.'

අසංක මෘදුව සිනාසී තම පුටුවේ අනිත් ඇලයට බරවිය. චායා බිම බලාගෙනම කාමරයෙන් පිටවූවාය. අසංක වඩාත් මෘදුලෙස චායාගේ වතින් තික්මුන සුවඳ නිස්කලංකයේ විඳගත්තේය. ඇය මේ කාමරයට එන වාරයක් වාරයක් පාසා ඔහුගේ සිත අවුල්ව විසිර යයි.

එක දිගට වැඩකර ඉඩක් ලැබෙන මොහොතකදී චායා නිලංකා ළඟට ගියාය. චායා එනතුරු නිලංකා බලාඉන්නේ ඇත්තටම ආශාවෙනි.

'හරි බඩගින්නේ උන්නේ..ඇයි පරක්කු උනේ..'

චායා නිලංකා ළඟ ඇති පුටුවට වැටෙන්නේ සිනාසීගෙනමය.

'යන්.. සූට් වගයක් ටැග් කරන්න තිබ්බා. කරලම ඉවර කළා.. එතකොට මට ලේසියි...'

චායා හති අරිමින් කීවාය.

'දැන් මැඩම්ටයි සර්ටයි ඔයාව නැතිවම බෑ.. ඔයා දිනුම්.. කාටවත් බැරිඋනා ඔය තත්වෙට එන්න.. මට නම් ඊරිසියත් එක්ක.'

නිලංකා එසේ කීවද ඇගේ තුන් හිතකවත් එවැන්නක් නැති බව චායා දනී.

'ඔයා මට මේ හැම දෙයක්ම කියලා දුන්නා. මම පළවේනි පඩිය ගන්නකල් ඉන්නේ ඔයාට පුංචි තෑග්ගක් දෙන්න.'

චායා නිලංකාගේ උකුල මත තිබූ අත මත සුරත තබා කීවාය.

'මම පහළට ගිහිල්ලා කෑම මොනවා හරි ගේන්නද..'

නිලංකා පුටුවෙන් නැඟිටින ගමන්ඇසුවාය.

'එපා.. අම්මා උදේ සීනිසම්බෝල හදලා පාන් වලට දාලා දුන්නා. මං ඔයාටත් එක්ක ගෙනාවේ..'

චායා සීනි සම්බෝල දමූ පාන් පෙති පාර්සලය දිග හැරියාය. සීනි සම්බෝල සුවඳින් පළාතම සුවඳවත් විය.

'අම්මේ.. සුවඳ ඇති පාන් රාත්තලක් විතර කන්න.'

නිලංකා පාන් පෙත්තක් අතට ගෙන කීවාය.

WWW.EXPRESSLANKA.TK 88

'දන්නවද මැඩම් කිව්ව කතාවක්..'

'නෑ..'

චායා පුදුමයෙන් මෙන් තිලංකා දෙස බැලුවාය.

'චායා ආව දවසේ ඉඳලා ඔෆිස් එකම හරි එළියයිලු.. හරි ආශාවෙන් තමයි එහෙම කිව්වේ.. ඒ හැඟීම නැතිකරගන්නෙපා.. අපරාදේ..'

'මම මට පුළුවන් විදිහට මැඩම්ට වැඩ කරනවා තිලංකා.. ඔයා මං ආව දවසෙම කිව්වේ.. අපි හරි දුප්පත් කෙල්ලෝ. මේ රස්සාව මට ලැබුනේ නැත්නම් තාමත් මායි අම්මයි තාත්තගේ පැන්ෂන් එකෙන් ගැට ගගහ ජීවත්වෙන්නේ. ඒත් අසරණ කෙල්ලෙකුට රස්සාවක් දීලා මැඩම් කළේ ලොකු පිනක්.'

චායාගේ දෙනෙත් බොඳවිය. තිලංකා ඉදිරියේම ඒ කඳුළු ගලාගියේය.

'ඔන්න අඬනවා..'

'හිනාවෙන්න ඕන වෙලාවක අඬලා වැඩක් නෑ.'

'මං ජීවිතේ මේ තරම් ආශාවෙන් කිසි දෙයක් කරලා නෑ තිලංකා..'

'එහෙම කළාය කියලා නරකක් වෙලත් නැනේ චායා..'

සියල්ලම මේකරම්ම යහපත් වනු ඇතැයි චායා කිසිම දිනයක නොහිතුවාය. මෙතුවක් අත්විඳි ජීවිතය පැත්තෙන් ගත්කල මේ චායාට විශාල හිමිවීමකි. ඒ හිමිවීම හැම පැත්තෙන්ම අහිමි නොවී තබාගැනීමට ඇය අසරණ සටනක නියැලුනාය.

'මං අම්මටත් ඔයා ගැන කිව්වා. දවසක එන්න අපේ ගෙදර..'

චායා තිලංකාට කීවාය.

'මටත් ආසයි අම්මව බලන්න.'

'මම ගෙදර ගියාම හැමදෙයක්ම අම්මට කියනවා. ඔයාව මැඩම්ව සර්ව මං අපේ අම්මට මවලා තියෙන්නේ.'

තිලංකා යමක් [illegible] මෙන් [illegible] යළිත් බිම බලාගත්තාය.

WWW.EXPRESSLANKA.TK 89

මොකක්ද අහන්න ගිහිල්ලා ගිලගත්තා. ඇත්ත කියන්න.

'සර්ට අම්මට මවල තියෙන්නේ කොහොමද..'

නිලංකා සඟවාගත් පැනය ඇසුවාය. චායා මොහොතක් නිලංකා දෙස බලා ඉඳ සිනාසුනාය.

'මං කියලා තියෙන්නේ සනත් ගුණතිලක වගේ කියලා.. හරි නේද..'

'ම්.. මැඩම් කියන්නේ ඇත්ත.. ඔයාට හොඳට මැච් කරන්න පුළුවන්..'

චායා පාන් එතූ කඩදාසිය ගුලිකර නැගිට්ටේ නිලංකා තවත් යමක් කියන්නට ප්‍රථමය. දෙදෙනාම අත සෝදගෙන එද්දී අසංක පිළිගැනීමේ කවුන්ටරය ළඟ ඉඳගෙන උන්නේය. 'ඇත්ත තමා.. සනත් වගෙයි..' නිලංකා සිතුවාය. ඇය චායාදෙස බැලුවේ ඒ සිතුවිල්ලෙන්මය.

'දෙන්නත් එක්ක හොඳට සීනි සම්බල් කාලා සුවඳ විතරක් තියලා ගියා නේද.. අපි ඇවිත් සුවඳ විතරක් ඉඹ ඉඹ ඉන්න ඕන..'

අසංක කීවේ විහිළුවටය. එහෙත් චායාට දුක සිතුණි. 'දන්නවනම් සීනි සම්බෝල කන්දක් හදලා ගෙනත් දෙනවා..'..

'සර් උදේට කන්නේ ශාන්ති විහාර් එකේ තෝසෙනේ.. නේද..'

'ඒකත් එපාවෙලා නිලංකා..කවුද සීනි සම්බෝල හැදුවේ..'

අසංක ඇසුවේ චායාදෙස බලාය.

'අම්ම සර්..'

WWW.EXPRESSLANKA.TK 90

'හරි සුවඳයි කියලා සර් කිව්වා කියන්න.. රස බලන්න මං උන්නැනේ..'

අසංක මවාගත් වේදනාවකින් කීවේය. වායාගේ පපුව පත්තුවිය.

'අනේ සර්..'

'අනේ සර් නෙමේ.. දන් තිලංකා එක්කෙනෙක්ගේ පළවෙනි පඩිය එනවා සිකුරාද.. මොනවද දන්නෑ අපිට දෙන්නේ.'

අසංකගේ කතාවට වායා බිම බලාගත්තාය. ඔහු හදන්නේ කොහොත් හෝ තමාව කොටු කර අසරණ කරන්නටය.

'කියන්න.. කියන්න.. මොනවද දෙන්නේ.'

'සර්රුයි මැඩමුයි මට කරපු උපකාරෙට මං මොනවයින් කියලා සළකන්නද.. චූටි දෙයක් දුන්නොත් ඒක පව්.. ලොකු දෙයක් දෙන්න මට වත්කමක් නෑ.'

වායාගේ ඇස්වල කඳුළු පිරුණි. අසංක තිලංකා දෙස බැලුවේ වේදනාව මුසුවූ බැල්මකිනි. 'සර් ආවොත් මේ කෙල්ලව අඩවනවා..' තිලංකාගේ ඇස්වල තිබුනේ එවන් කතාවකි.

'මටනම් මේවගේ සුවඳ තියෙන සීනි සම්බෝලයක් දලා.'

අසංක වායාව සිනාගස්සන්නට සිතා කියාගෙන ගියේය.

'පාන්පෙති තුන හතරක් තිබ්බාම ඇති..'

වායා කඳුළු අතරින් සිනාසුනාය. ඒ ලස්සන අසංකගේ හදවත මොහොතකට කඩා ඉහිරවිය.

'සර් මට විහිළු කරනවා.'

'කව්රුවත් මං කියන දෙයක් විශ්වාස කරන්නෑ.. අනේ මන්ද.. අපේ අම්මත් එකයි ඔයාලත් එකයි.. මං යනවා.'

අසංක තවත් එක්වරක් වායා දෙස බලා පහළට ගියේය. වායා තිලංකා දෙස බැලුවාය.

'මෝඩි මොකටද ඇස්වල කඳුළු පුරවා ගත්තේ.. සර් විහිළු කරන්නේ.'

'සර්ටයි මැඩම්ටයි මොනාහරි ගේන්න මාත් ආසයි.. ඒත් බයයි

නිලංකා.'

මං මැඩම්ගෙන් අහන්නම්.. ඔයා මොනාහරි ගේන්න අහනවා මොනවද හොඳ කියලා.

# 11

චායාට සැනසීමක් දැනුණි. අසංක යළි එද්දී චායා උන්නේ හිස බිමට නැඹුරු කරගෙනය. කාර්යාලය පුරා තිබුනේ තුනී නිහඬතාවයකි.

'චායා.. මං බැංකුවට යනවා.. කෝල්ස් වලට ආන්සර් කරන්න හොඳේ..'

චායා හිස වැනුවාය. මැඩම් ගොස් තත්පර ගෙවී යද්දී ඇය නිකමට මෙන් හිස ඔසවා අසංකගේ කාමරය දෙස බැලුවාය. ඔහු ලා අඳුරු වීදුරුව අතරින් චායා දෙස බලාගත්වනම බලා උන්නේය. චායාගේ දෙපාත්තයේ සිට හිය දක්වා සීතල විය.

'චායා.. පොඩ්ඩකට එන්න..'

අසංක වඩාත් මෘදු ලෙස කතාකළේය. තම කාමරයට එන චායාගේ මුවේ ඇති මෘදු සිනහව දෙස අසංග බලාගත්වනම බලාඋන්නේය. ඔහුගේ ළය කවදාවත් නැති තරම් මොලොක්විය.

චායා පැමිණ නතර වූයේ අසංකගේ මේසයේ දකුණු දරය අසළය. ඇය මේසයේ දරය මත දතම තබා අසංක දෙස වඩාත් පැහැදිලිව බැලුවාය. එහෙත් අසංක බලා උන්නේ මේසය මත තිබූ චායාගේ දත දෙසය. ඇගේ නිය මත ගැල්වූ ලාරෝස පැහැගත් නිය ආලේපනය නිසා ඒ දත තවත් සුන්දරවී ඇත. යුවතියකගේ මෘදු දතක් පවා රස විඳිය හැකි බව අසංක මුල් වරට තේරුම් ගත්තේ අදය. අසංක දිගටම දත දෙස බලා සිටිනු දැක චායා ඇඟිලි කුඩු අත්ලේ සඟවා ගත්තාය. අසංක සිනාසී චායා දෙස බැලුවේය.

'ලස්සනයි..'

WWW.EXPRESSLANKA.TK 92

අසංක හෙමිහිට වායාදෙස බලා කීවේය. වායා බිම බලාගත්තේ ලැජ්ජාවෙනි. ලස්සනයි කිව්වේ අතටද මුහුණටද කියා ඇයට තේරුමක් තිබුනේ නැත.

වායාට එන්නට කිව්වේ ඇයිද්දැයි අසංක සිතුවේය. එහෙත් කාරණාවක් සිතාගන්නට ඔහුට පුළුවන් වූයේ නැත. දරාගත නොහැකි කෙටි නිහඬතාවයක් කුඩා කාමරය පුරා සීරුවට පැතිර ගියේය. අසංකගේ මේසය මත තිබූ කුඩා ටයිම්පීස් ඔරලෝසුවේ තත්පර කටුව මහා ශබ්දයක් මෙන් දෙදෙනාටම ඇසුණි. අසංක තමාට කතාකළේ ඇයිද්දැයි වායා ඒ අතරවාරයේ සිතුවාය.

'වායාට රස්සාව හොඳයිද..'

අසංක අමාරුවෙන් ප්‍රශ්නයක් තනාගත්තේය. වායා දෙනෙත් ඔසවා අසංක දෙස බලා පැහැදිලි ලෙස සිනාසුනාය. ඒ සිනහවේ මේ උදෑසන රසබර කරන රසවත් යමක් ඇතැයි අසංකට සිතුනි.

'හොඳයි සර්.. ගො..ඩා..ක්.. හොඳයි.'

'ටික දවසක් යනකොට වායාට එපාවෙයි. ඊට පස්සේ දමලා ගහලා වායා යයි.. ඉස්සර හිටපු අය කළේ එහෙම..'

'අනේ නෑ සර්.. සර්ලා මාව අයින් කරන කල් මං ඉන්නවා.'

ඔහුගේ පපුව ඇත්තටම උණුවිය.

'ඉස්සරහට එන්නේ අලුත් අවුරුදු සීසන් එක. ගොඩාක් වැඩ කරන්න වෙයි. පහට ගෙදර දුවන්නත් බැරිවෙයි.'

'වැඩ තියෙනව නම් මට කීය උනත් කමක් නෑ සර්.. මට කරලා යන්න පුළුවන්..'

අසංක වායා දෙසම බලාඋන්නේය. ඔහුගේ දෙනෙත් තව මොනවා මොනවා හෝ ඒ මුහුණෙන් අහුලා ගන්නට ආශාවෙන් බලාඋන්නේය.

'ගෑණු ළමයින්ට රෑ පාතේ ගමන් එච්චර හොඳ නෑ.. පල්ලෙහා සේල්ස් ගර්ල්ස්ලා සීසන් කාලෙට ගෙදර යනකොට රෑ නමය දහය වෙනවා.. වායාට එච්චර රෑ වෙනකල් ඉන්න පුළුවන්ද.'

'කමක් නෑ සර්.. අම්මට හෝල්ට් එකට ඇවිල්ලා ඉන්න කියනැකි.'

ඇය අසරණ ලෙස පිළිතුරු දුන්නාය.

WWW.EXPRESSLANKA.TK 93

'ඇයි ඒ ටිකත් තනියම යන්න පුළුවන්නේ..'

අසංකගේ කතාවට චායා බිම බලාගෙන සිනාසුනාය.

'ඇයි..'

'නෑ සර්.. ඒ ටික යන්න බයයි.. ඒ පාරේ ලයිට් නෑ. මං රෑ ගිහිල්ලත් නෑ.. අම්මා ඇවිත් ඉදියි..'

'අම්මට වද දෙන්නැතුව ඇරලවන්න තනියට කෙනෙක් හොයාගන්න පුළුවන්නේ..'

ඔහු කීවේ වඩාත් විමසිලිමත්ව ඒ මුහුණ දෙස බලාය.

'කෙනෙක්ව හොයාගන්න ඕනේ ඔය චුට්ටට විතරක් තනියට එන්න කෙනෙක් නෙමේ සර්..'

චායාගේ හඬ තුළ වූයේ අවංක අසරණ බවකි.

'එහෙනම්..'

'ඊට වඩා ගොඩාක් දුර තනියම යන්න... එන්න.. ගොඩාක් කල්..'

'චායාට එහෙම කෙනෙක් හම්බ වෙලා නැද්ද තාම..'

'ම්හ්.. නෑ.'

'ඉතින් හොයාගන්න එපැයිනේ..'

චායා කිසිවක් නොකියා සිනාසුනාය. උත්තරයකට ඒ සිනහව ප්‍රමාණවත් මදියැයි ඔහුට සිතුණි.

'ආ.. චායා..'

ඔහු යළිත් ඇසුවේය.

'එහෙම කෙනෙක් හොයාගන්න බෑ සර්..'

'එහෙනම්.'

'ලැබෙන්න ඕනා.'

'චායාට ලැබෙයිද එහෙම කෙනෙක්.'

ඇය යළිත් සිනාසුනාය. කිසිවක් සිතාගත නොහැකිව චායා නියපොතු තුඩින් මේසය සීරුවාය.

'දන්නෑ සර්.. මං හිතන්නෑ.'

'අනාගතේ ගැන වායා මුකුත්ම හිතලා නැද්ද..'

කිසිවෙකු තමාගේ හදවතේ ඇතුළු පතුල අතපත ගාන්නාක් වැනි හැඟීමක් වායාට දැනුණි. ඒ හැඟීම මීට පෙර කෙදිනකවත් ඇයට දැනී තිබුනේ නැත.

'අනාගතයක් ගැන කියලා විශේෂයෙන් හිතන්න මං දන්නෑ සර්..'

'අම්මා වායාගේ විවාහේ ගැන මොනවවත් කතා කරන්නැද්ද වායා එක්ක.'

වායා තොල් පිට පෙරලා කෙළ බිඳක් ගිල ගත්තාය. ඒ තරමටම දිව කට වියැළී තිබුණි.

'තවම නෑ..'

'එහෙනම් හෙට අනිද්ද පටන්ගනී. මං කොල්ලෙක් වෙලා අපේ අම්මා මට වද දෙනවා.'

වායා සැහැල්ලු ලෙස අසංක දෙස බලා සිනාසුනාය. ප්‍රශ්නය තමාගේ පැත්තෙන් අනිත් පැත්තට මාරු වීම ගැන ඇය සතුටු වූවාය.

'සර්ට අනාගතේ ගැන අලුතින් හිතන්න ඕන නැනේ.. හැම දෙයක්ම හරිනේ.'

අසංක පුටු ඇන්ද මත වැලමිට තබා සුරතේ ඇඟිලි පහම කම්බුලට තබා සිර කර ගත්තේය.

'මොනවද මගේ හරි..'

'හැම දෙයක්ම හරිනේ..'

'නිලංකත් කිව්වා සර්ගේ වෙඩින් එක ළඟදීම මැඩම් ගනියි කියලා.'

මෙතුවක් වෙලා අසංකගේ හිත පුරා රැඳුන සැහැල්ලු බව මොහොතකට පලා ගියේය. ඇත්තටම තමාගේ අනාගතය ගැන සිතන්නට කිසිවක් ඉතිරි වී නැත්ද.

'මොනවද නිලංකා කිව්වේ.'

ඔහු වචනත් ගැඹුරු ලෙස ඇසුවේය. වායාගේ සිතට මොහොතකට බියක් දැනුණි.

WWW.EXPRESSLANKA.TK 95

'නෑ සර්.. හර්ෂණී මිස්ගෙයි සර්ගෙයි වෙඩින් එක..'

ඡායා වචන එකතුකර කීවාය. තමා අනවශ්‍ය කතාවක පැටලුනායැයි ඇය පසු තැවුනාය.

'නිලංකට පිස්සු.. මං දන්නම බඳින්නෑ... ඡායා...'

ඔහු පොඩි ළමයෙකු මෙන් කීවේය. ඡායා නිහඬ වූවාය. තමාට එන්නට කිව්වේ ඇයිදැයි අසන්නට දෙවන වතාවටත් ඡායාට සිතුණි. එහෙත් ඇය නිහඬ වූවාය. හාම්පුතෙකුට සේවකයෙකුට කතාකරන්නට හේතුවක් අවශ්‍යම නැත.

'සර් ඇත්තටම සිංහල අවුරුද්දට රෑ වෙනකල් ඉන්න වෙනවද..'

'නැතුව ළමයෝ.. ෂොප් එක රෑ හත අට වෙනකල් වත් ඇරලා තියන්න එපායැ... බිස්නස් තියෙන්නේ ඒ දවස් වලටනේ.. පැයෙන් පැයට ඩිසයින් පිල් කරන්න ඕන.'

'ඇයි..'

අසංක අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ඡායාව බය කර ඇසුවේය.

'එක්කගෙන යන්න දන්නමම කෙනෙක් හොයාගන්න.. එතකොට හරි.. තව මාසයක් විතර තියෙනවනේ..'

'මට අම්මා ඉන්නව සර්.. ඒ ඇති.'

'මම මැඩම්ට කියන්නම් ඡායාව ටිකක් වේලාසන අරින්න කියලා..'

'අනේ එපා සර්.. මට පුළුවන් ඉන්න.. ඇරත් මං ආසයි.'

ඡායා එසේ පවසා තවත් වරක් අසංක දෙස බැලුවාය.

'සර් මට කතාකළේ..'

ඔහු ඇඟිලි තුඩින් නළලට තට්ටු කර සිනාසුනේය.

'මට දන් මතක නෑ ඡායා..'

'එහෙනම් මං යන්නම් සර්..'

ඡායා යන්නට හැරුනාය.

WWW.EXPRESSLANKA.TK 96

'ආ.. චායා..'

අසංක ඔහුගේ මේසය කොනක තිබූ ඇඳුම් ගොඩක් ගෙන චායා උන් පැත්තට දැමුවේය. එහි තිබුනේ කාන්තා යට කළිසම් කිහිපයකි. චායාගේ දෙතොළකට ආ තුනී සිනහව අසංක සීරුවෙන් දුටුවේය.

'ඔය උදේ ගෙනාපු සාම්පල් වගයක්.. සාම්පල් චෙක් කරලා මැඩම්ට දෙන්න.. මට තේරෙන්නේ නෑ.. තෝරන්න.. චායාට පුළුවන් නේද ඕඩර් ෂීට් එක හදන්න.'

චායා ඒ යට කළිසම් පොකුරම ගෙන දේතින් ළමැදට තබා ගත්තාය.

'පුළුවන් සර්..'

චායා හැරුනේ එසේ කියා සිනාසීගෙනමය. ඇයට අසංකගේ කාමරයෙන් පිටවන්නටවත් නොලැබිණි. හර්ෂණී කාර්යාලය මැදින් පැමිණ චායා දැක දෙරළඟ නැවතුනාය. ඇය වඩාත් සමීපව දුටුවේ චායාගේ සිනහවයි. චායා වරක් බිම බලා යළිත් හිස ඔසවා ගෞරවාන්විතව හර්ෂණී දෙස බලා සිනාසී ඇය කාමරයට ඇතුල් වූ පසු ඉන් පිටවූවාය. අමාරුවෙන් චායා ඇඳගත් සිනහව තත්පරයකට වඩා තිබුනේ නැත.

WWW.EXPRESSLANKA.TK 97

# 12

අසංක හර්ෂණීගේ පැමිණීම ඉවසුවේ අමනාපයෙනි. ඔහුට ඕනාවී තිබුනේ තනිවෙන්නටය. සිතන්නට අලුතින් යමක් ඇතැයි ඔහුට සිතුණි. එහෙත් ඒ කුමක්දැයි ඔහුවත් දැනගෙන උන්නේ නැත.

හර්ෂණී අසංක ඉදිරියේ තිබූ පුටුවක් වේගයෙන් ඇද එයට කඩා වැටුනාය. ඇය අතතිබූ කුඩා හෑන්ඩ් බෑගය මේසයට දැමුවේද ශබ්දයක් නගමිනි.

"අර කේස් එකට ඔයාගේ කාමරේ ඇරෙන්න වෙන වැඩක් කරන්න තැනක් නැද්ද..."

ඇය ඇසුවේ සමච්චල් සිනහවක්ද මුව මත තබාගෙනය.

"ඒ ළමයා සාම්පල් වගයක් අරන් යන්න ආවේ.. ඉතින් ඔයා ආවේ ඇයි.."

අසංක ඇසුවේ තරමක නොසැළකිල්ලෙන් තම මේසය මත තිබූ ෆයිල් කවර කිහිපය එක තැනකට දමමිනි. මේසය මෙන්ම සිතද හැඩිවී ඇත.

"ඇයි දූන් අයියට මං එන එකත් ප්‍රශ්නයක්ද.. වෙනද අහන්නේ ඇයි ආවේ නැත්තේ කියලා."

අසංක ප්‍රළුල් සිනාවක් පා පුටුවේ හරිබරි ගැසුනේය.

"සොරි.. සොරි.. ඉතින් කියන්නකෝ.. මගේ වචන අල්ලාගෙන ගෝරි දන්නැතුව.."

හර්ෂණී කතාකළේ නැත. ඒ වෙනුවට ඇය කළේ පුටු ඇඳි දෙකට දෑතම තබා මඳ වේලාවක් බිම බලාගෙන ඉඳීමයි.

"මොකෝ හෂී... ඇයි ප්‍රශ්නයක්ද..."

අසංක සාවදනව ඇසුවේය.

"මට අසංකයියත් එක්ක ටිකක් කතාකරන්න ඕන."

WWW.EXPRESSLANKA.TK 98

ඇය කීවේ මවාගත් බැරෑරුම් බවකිනි.

'ආ යූ සීරියස්..'

අසංක මඳ සිනාවක් පා ඇසුවේය.

'ම්.. වෙරි සීරියස්.. අපි කොහාට හරි එළියට යන්..'

'අම්මත් නෑ හඹී.. අපි මෙහෙම කතාකරමු.. කව්රුත් නෑ ප්‍රයිවෙට් ඇන්ඩ් කන්ෆිඩෙන්ෂල්....'

'ඉස්සරනම් කන්ෆිඩෙන්ෂල් තමා. ඒත් දැන් නැතෝ.. තව අයත් මෙතන ඉන්නවනේ ඇන්ටනා දාගෙන..'

හර්ෂණී කීවේ කාමරයෙන් එපිට වූ චායා දෙස බලා තොරිස්සුමෙනි. අසංක එය ගණනකට ගත්තේ නැත.

'පිස්සු නැතුව කියන්න හඹී.. ඒ ළමයට අපේ කතාවලින් වැඩක් නෑ.. එයාට ඊට වඩා වැඩ තියෙනවා.'

'එයාගේ වැඩ එළියට ගිහිල්ලා කරන්න කියන්න. ඔයාට බැරිනම් මම කියන්නම්.'

අසංක කරබාගෙනම උන්නේය. හර්ෂණී පුටුවෙන් නැගිට අසංකගේ කාමරයේ වීදුරු දොර ළඟට පැමිණ චායාදෙස බැලුවාය. චායා ඇය දෙස බලාඉන්නා බවක් නොදැන දිගටම යමක් ලියමින් උන්නාය.

'මේ.. පොඩ්ඩක් එළියට යන්න.. කතා කරනකල් එන්නෙපා.'

හර්ෂණීගේ හඬින් චායා ගැස්සුනාය. ඇය අතතිබූ සී ආර් පොතත් කුඩා කැල්කියුලේටරයත් ගෙන නැගිට්ටාය.

'දොර වහගෙනම යන්ඩ...'

'හොඳයි මිස්..'

චායාට කාමරයෙන් පිටවෙද්දී ඉබේටම අසංක දෙස බැලුණි. ඔහු ඇයට පිටුපා සිවිලිම දෙස බලාගත්වනම බලාඋන්නේය.

'ඇයි චායා.'

චායා පොතක් රැගෙන පැමිණ නිලංකා අද්දරින් වූ පුටුවේ ඉඳගනිද්දී ඇය ඇසුවාය. චායා නිලංකා දෙස බලා අසරණ ලෙස

WWW.EXPRESSLANKA.TK 99

සිනාසුනාය.

'නෑ මුකුත් නෑ නිලංකා..'

'මුකුත් නැති වෙන්න බෑ.. ඇයි චායා..'

'නෑ විශේෂයක් නෑ.. හර්ෂණී මිස් පොඩ්ඩකට එළියට යන්න කිව්වා.'

නිලංකා තොල් පිට පෙරලා චායා දෙස බලා උන්නාය.

'ඔයා ඕවා හිතන්නෙපා.. සර් ළඟවත් නැති මැඩම් ළඟවත් නැති ගෑස් එයා ළඟ තියෙන්නේ.. මේවා ඔක්කොගෙම අනාගත උරුමක්කාරි එයානේ... ඒක තමා ඔය පෙන්නන්නේ..'

'ඒක වැරදිත් නැනේ නිලංකා.. අනික ඒ දෙන්නගේ පෞද්ගලික දෙයක් කතා කරද්දි කව්රු උන්නත් වදයක්නේ...'

'ඒකම තෙමේ..'

නිලංකා සිනාසී කීවාය.

'එහෙනම්..'

'ඔයා වගේ ලස්සන කෙල්ලෙක් ඔතන ඉන්න එක එයාගේ ඔළුවට වදයක්..'

'අනේ මගේ ලස්සන.. මං වගේ හිඟන කෙල්ලෙක් ගැන ඒ මිස් මොනා හිතන්නද නිලංකා.. ඒක නෙවේ මං ඔයාගෙන් අහන්නමයි උන්නේ.'

'මොකක්ද.'

'අවුරුදු සීසන් දවස්වලට ගෙදර යද්දි රෑ වෙනවද..'

'අපෝ ඔව්.. සමහර දවස්වලට රෑ දහයත් වෙනවා. හිටගෙන ඉඳලම එපාවෙනවා.. කට්ටිය වැඩි උනාම මැඩම් මාවත් පහළට දානවා. පල්ලෙහා කෙල්ලෝ විඳින දුක ඇත්තටම තේරෙන්නේ ඒ වෙලාවට..'

'ඉතින් රෑ වෙලා යන්නේ කොහොමද..'

'කට්ටියක්ව වෑන් එකේ ගෙදරට ඇරලවනවා.. සර් රෑයි

WWW.EXPRESSLANKA.TK 100

මැඩමුයි යද්දිත් ඒ වාහනෙන් කාව කාව හරි ඇරලවනවා.. ඇයි බයවුනාද රෑ වෙලා තනියම යන්න...'

'බය නැත්තෙමත් නෑ.. ඒත් එහෙම කියලා ඒක නොකර ඉන්නත් බෑනේ.. මාවත් බස්සයිද..'

'බයවෙන්නෙපා.. කාව නොබැස්සුවත් ඔයාව බස්සවයි.'

'ආ.. මොකටද මට විශේෂයක්.'

'ඒත් මං නම් හිතන්නෙ ඔයාව බස්සවන එකකුත් නෑ..'

නිලංකා නැවත වරක් කීවාය.

'ඇයි ඒ..'

'මැඩම් ඔයාව ඒ දවස් ටිකට ගෙදර නවත්තගනී. ඒතරම් වැඩ..'

'ඇත්තටම එහෙම වෙයිද..'

චායා බියෙන් ඇසුවාය.

'ඇයි..'

'අම්ම තනියම කොල්ලේ..'

'එහෙනම් රෑ වෙලා හරි ඔයාව බස්සවයි.'

'ඒත් ඉන්න කිව්වොත් ඉන්නවා.'

'ඒ ගෙදර දවසක් උන්නත් සැපයි චායා.. ගෙයක් නෙවේ ඒක මාළිගාවක්..'

'නිලංකා ගිහිල්ලා තියෙනවද..'

'දවස් දෙකක් ගිහිල්ලා තියෙනවා. එක දවසක් සර්ගේ තාත්තට පින්දීලා කරපු පිරිත දවසේ.. අනිත් එක සර්ගේ බර්ත්ඩේ එකකට..'

නිලංකා කියද්දී චායා සිනාසුනාය.

WWW.EXPRESSLANKA.TK 101

'මේ අපේ සර්ගේ..'

'ඔව්.. ඇයි.'

'එච්චර ලොකු අයගෙත් බර්ත් ඩේ පාටි ගන්නවද..'

'අපිට ලොකු උනාට මැඩම්ට තාම යර් ප්‍රංචියි... කේක් එකකුත් කැපුවා.'

'ඉටි පන්දම් කීයක් ගැහුවද.'

'හරියටම තිස් එකයි.'

තිලංකා එසේ කියා වායාදෙය බලාගෙනම උත්තාය. වායා දෙනෙත් ඔසවද්දී ඇය දුටුවේ තමා දෙසම බලාඉන්නා තිලංකාවය. දෙදෙනාම සිනාසුනේ වඩාත් මිහිරි ලෙසය.

'ඇයි...'

වායා ඇසුවාය.

'අර ඇතුලේ ඉන්න කපල් එක ගැළපෙන්නෑ.. කිසිම මැච් එකක් නෑ.'

තිලංකා කීවාය.

'කොයි..'

'ඇතුලේ තවත් කපල් එකක් ඉන්නවද මෝඩී... මං කිව්වේ සර්රුයි හර්ෂණී මිස් ගැනයි.'

තිලංකා වඩාත් පහත් හඬින් කීවාය.

'ඇයි..'

'මට එහෙම හිතෙනවා.. සර්වයි තව එක්කෙනෙක්වයි තිබ්බානම් මාර මැචින්..'

තිලංකාගේ කතාවට වායා හිස ඔසවා පුදුමයෙන් බැලුවාය. තිලංකා දිවමඳක් එළියට දමා වායාට සුන්දර ලෙස ඇද කළාය.

'කවුද..'

'පස්සෙ කියන්නම්..'

'පිස්සු.. අන්න කෝල් එකක් ඇවිත්.. එක එක්කෙනාව මැච්

WWW.EXPRESSLANKA.TK 102

කර කර ඉන්නැතුව ආන්සර් කරන්න..'

චායා නිලංකාගේ දණ හිසට ගසා එසේ කියා කැල්කියුලේටරයට වමත තබා දකුණතට පෑන ගත්තාය.

**********************

අසංක සිතාමතාම හර්ෂණීගේ බැල්ම මඟ හරින්නට උත්සාහ ගත්තේය. මොහොතකට කළින් ඔහු අත්විඳි නිස්කලංක රසබර බවට ඒ බැල්ම වදයකැයි ඔහුට සිතුණි.

'අපේ ආශ්‍රේට මීතින් එකක් තියෙන්න ඕන නේද අසංකයියේ..'

හර්ෂණී වඩාත් පැහැදිලි ලෙස ඇසුවාය. අසංක එයට පිළිතුරු දෙන්නට වෙලාගත්තේය. කඩඉම් ප්‍රශ්න වලට ඔහු ඇත්තටම ප්‍රියකළේ නැත.

'මොන මීතින් එකක්ද..'

ඔහු ගණනකට නොගෙන ඇසුවේය. හර්ෂණී ඔහු අත තිබූ පෑන ගෙන පෑන් රඳවනයේ තැබුවාය.

'ඔයා ප්‍රශ්නෙන් පිට පනිනවා. මාව ගණන් ගන්නෙත් නෑ.. මාත් තීරණයක් ගන්න ඕන අසංකයියේ..'

'මොනවා ගැනද..'

'මගේ ජීවිතේ ගැන..'

'ඉතින් මං ඒකට බාධා කෙරුවයැ... මෙච්චර කල් ඔයා තීරණ ගත්තේ.. මගෙන් අහලයැ ඒවා ගත්තේ.. කාලයක් එයාර් හොස්ටර්ස් කෙනෙක් වෙන්න හිතුවා.. පස්සෙ ඒක අතඇරලා මොඩලින් කරන්න ඕන කියලා කළා. ඇඩ් දෙක තුනකත් උන්නා නේද.. ඊට පස්සේ තව මොන මොනවද කළා නේද.. මං ප්‍රශ්නයක් උන්නෑනේ බබා නේද..'

'හරි.. ඔක්කොම හරි.. ඒත් මේ තීරණේ ඊට වඩා වෙනස්.. ඒ තීරණේ ගන්න ඕන ඔයත් එක්ක.'

'මොන තීරණේද..'

අසංක වඩාත් තිගැස්සුණු ලෙස ඇසුවේය. හර්ෂණී සැහෙන වෙලාවක්

WWW.EXPRESSLANKA.TK 103

ඔහුදෙස බලා උන්නාය.

'අපේ මැරේජ් එක ගැන..'

අසංකගේ පපුව අළුතින් තිගැස්සින. මේ තීරණාත්මක තැනට කවදා හෝ එන බව ඔහු දනගෙන උන්නේය. එහෙත් අද ඒ තීරණය ගන්නට හදවතට එඩිතර බවක් නැත්තේ ඇයි..

'ඇයි කතා කරන්නැත්තේ අසංකයියේ..'

'හෂී දන්නවනේ.. මගේ ජීවිතේ තීරණ ගන්නේ මම නෙමේ.. අම්මා.'

'මං අහන්නේ ඔයාගේ තීරණේ ගැන.. මං ගැන ඔයා මොකක්ද ගත්ත තීරණේ.. අපි සෑහෙන කාලයක් ආශ්‍රය කළා..'

'ඇත්ත. ඒත් මං කිව්වනේ..'

'ඇයි තීරණයක් ගන්න බැරි දෙයක් දන් ඔයාට තියෙනවද..'

අසංක ඒ කතාවෙන් ඇත්තටම කලබල වූවේය. ඔහුගේ සිත ආගන්තුක බියකින් ඇලලී ගියේය.

'මගේ ඔළුව මේ දවස්වල ඇත්තටම හරි කලබලයි හෂී... මේ ඩීසත් එක පතිනකල් ඉන්න.. අම්මා මාව හිර කරලා.'

'අම්මා ඔයාව හිරකරනවා.. ඔයා මාව හිර කරනවා.. මාත් අම්මට තාත්තට මුණ දෙන්න ඕන අසංකයියා.. එයාලත් මගෙන් එක එක ඒවා අහනවා.'

'මාමලට එච්චර හදිස්සිද ඔයාව බන්දලා දෙන්න.'

'එයාලට විතරක් නෙමෙයි.. මටත් ඕන සෙට්ල් වෙන්න.'

'ඇයි තව ටික කාලයක් එන්ජෝයි කරන්න හිතුවේ නැද්ද..'

'මාව හදන්නනේ ඕවා කියන්නේ.. ආසයි එන්ජෝයි කරන්න. ඒත් තනියම නෙමේ..'

'එහෙනම්..'

'ඔයා එක්ක... අපි ඉක්මණට මැරි කරමු..'

හර්ෂණී පුටුවෙන් නැගිට විත් අසංකගේ වම් උරහිසට බරවී

ඔහුගේ කම්මුලක් සිපගත්තාය. ඊටත් පසු ඔහුගේ මුහුණටම එබුනාය.

"මේ සීසන් එක විතරක් දෙන්නම්... අලුත් අවුරුද්දට මම කොහොමත් නෑ.. අම්ම එක්ක ඉන්දියා යනවා."

"අර මොකටද."

"නිකං... ඔයත් යන්..."

"පිස්සුද බබා.. ආසාවට සිංදුවක්වත් අහන්න විවේකයක් නෑ.. ඒ දවස් ටිකට මොන ඉන්ඩියාද.."

"ඔයා හිතාගෙන ඉන්නේ බැන්දට පස්සෙත් මේ නාඩගමම නටන්නද.."

"ඒවා එදාට බලමුකෝ.. මොනා හරි බොමු.."

හර්ෂණී අසංකගේ මේසයට නුදුරින් එල්ලා තිබූ කාන්තා ඇඳුම් කිහිපයක් තම වතට තබා බලද්දී අසංක දුරකතනය අතට ගත්තේය.

"තිලංකා බොන්න මොනා හරි එවන්න."

අසංක දුරකථනය තබා හර්ෂණී දෙස බැලුවේය. මේ තමා ඉදිරිපිට ඉන්නා යුවතිය තමාගේ අනාගත සහකාරිය විය යුතුමදැයි ඔහු මොහොතකට සිතුවේය. එහෙත් එතනින් එහා සිතා ගන්නට ඔහුට ශක්තියක් තිබුනේ නැත.

මොහොතකින් වායා කුඩා ට්‍රේ එකක් මත තබාගත් තේ දෙකක් රැගෙන අසංකගේ කාමරයට ඇතුළු වූවාය. වායා අසංකගේ තේ කෝප්පය ඔහුගේ මේසය මත තිබූ කුඩා රවුමක තබා ඉතිරි තේකත් රැගෙන හර්ෂණී වෙත ගියාය. වායා ආ බව දත දනත් හර්ෂණී උන්නේ ඇඳුම් තෝරමිනි.

"මිස් තේ එක.."

වායා විනීත ලෙස කීවාය. හර්ෂණී තේ කෝප්පය දෙස මොහොතක් බලා යංනමට දෙනෙත් හරවා වායාදෙස බැලුවාය.

"මට තේ එපා.."

වායා ඇත්තටම අසරණ වූ බව වඩාත් හොඳින් තේරුම් ගත්තේ අසංකය.

"වායා ඕක ඔහොම තියලා යන්න."

WWW.EXPRESSLANKA.TK 105

අසංක වායාගේ දෙනෙත් දෙස නොබලා කීවේය. ඔහුට ඇත්තටම ඇය දෙස බලන්නට දුක සිතුණි. වායා ට්‍රේ එකත් සමඟම තේ කෝප්පය තබා කාමරයෙන් පිටවූවාය.

"දූත් ඔයාට තේ හදන්නෙත් එයාද.."

"කවුරු හැදුවාම මොකද ළමයෝ.. බොන්න."

"මට එපා... මං යන ගමන් මොනාහරි බොනවා.. කවද්ද එහේ එන්නේ."

හර්ෂණී ඇසුවේ තේ කෝප්පය බොමින් උන් අසංක දෙස දූත් බැඳගෙන බලා ඉන්නා ගමන්මය.

රණතුංග මහත්මිය ළඟටම එනතුරු වායා ඇයව නොදුටුවාය. ඇය උන්නේ ඇත්තටම හිතේ බරකිනි. ඇය දැනුවත්ව හර්ෂණීට ඇය අතින් වරදක්වී නැත.

"වායා... මොකෝ ළමයෝ ඔය එළියට වෙලා ගණන් හදන්නේ.. ඇයි ලයිට් ගිහිල්ලද.."

රණතුංග මහත්මියගේ වදනින් වායා ගැස්සී සිටගත්තාය. ඇයට බැලුනේ නිලංකා දෙසය.

"සොරි මැඩම්.. මේ සර්ට තේකක් හදන්න එළියට ආපු ගමන්.."

"මේ බැංකුවලට ගියාම එපාවෙනවා වායා... ඔයාවවත් මේවට පුරුදු කරන්න ඕන.. අනේ කෙල්ලේ මටත් තිකන් තේකක් හදන්න කරදරයක් නැත්නම්."

"මං හදලා ගේන්නම් මැඩම්.."

රණතුංග මහත්මිය කාමරයට යද්දී නිලංකා වායා දෙස බැලුවාය.

"ඔයාට කියන්න තිබුනේ හර්ෂණී මිස් එළියට දැම්මා කියලා."

"පිස්සුද නිලංකා.. එහෙම පව්නේ..කොල්ලා එක්ක නිදහසේ කතාකරන්නනේ අනේ.. මං උනත් ආස නැහැ ඒ වෙලාවට කව්රුවත් අහගෙන ඉන්නවට.."

වායා සිනාසී කීවාය.

"උඹට කොල්ලෙක් ඉඳලා ඇති එහෙනම්.. ඇත්ත කියපන්.."

WWW.EXPRESSLANKA.TK 106

‘අනේ.. ඇත්තටම නෑ.. මං කිව්වේ උත්තර නම්..’

‘උත්තර නම් ඔයාව ඉතුරු කරන එකක් නෑ.’

තිලංකා මනමාල සිනාවක් පා කීවාය.

‘ඇයි ඒ..’

‘එහෙම තමා..’

‘පිස්සු.. මං යනවා තේක හදන්න..’

වායා පොත වසා දමා එයත් තුරුල් කරගෙනම නැගිටිනා අතරවාරයේ කීවාය.

හර්ෂණීව දුටුවනම වායා එළියට යන්නට ඇත්තේ කවරක් නිසාදැයි රණතුංග මහත්මිය අනුමාන කළාය. එහෙත් ඇය චේතනාවක් නොපෙන්වාම තම පුතුගේ කාමරයට ඇතුළු වූවාය.

‘කෙල්ල චූට්ටක් මහත් වෙලා තියෙන්නේ.. කකා නිදාගන්නවද මේ දවස්වල..’

රණතුංග මහත්මිය හර්ෂණීගේ අතක් අල්ලාගෙනම වාඩිවී ඇසුවාය.

‘වෙන මොනවා කරන්නද ඇන්ටි.. කෝ ඔයා මට මොනාහරි බිස්නස් වැඩක්වත් දෙන්නෑනේ..’

‘අනේ රත්තරන් ඔයා නාම පොඩි වැඩියි මේවා කරන්න.. හෙමිහිට පුරුදු වෙන්නකෝ..’

රණතුංග මහත්මිය ළෙන්ගතුව කීවාය.

‘මට ඇන්ටි එක්ක ලොකු කතාවක් තියෙනවා කරන්න.. හැබැයි මේ ශංකාර නැතුව...’

හර්ෂණී කියද්දී අසංක සිනාසී බිම බලාගත්තේය.

‘ඉන්නකෝ.. ඉන්නකෝ.. මේ මාස දෙක ඉවර වෙලා මං එන්නම් සතියක් ඔයා එක්ක කතා කරන්න.’

‘ඇන්ටි එන්නෙපා.. මං එහේ එන්නම්..’

‘ඒකට තව කල් තියෙනවනේ..’

ඒත් [illegible] රණතුංග මහත්මියගේ [illegible]

WWW.EXPRESSLANKA.TK 

රැගෙන කාමරයට ආවාය. හර්ෂණී ඇයදෙස බැලුවේ 'අපිට වචනයක් කතා කරන්න බෑනේ මෙයත් එක්ක..' වැනි හැඟීමෙනි.

'ඔයාගේ නෝක බිව්වාම බත් කන්න ඕනෙත් නෑ කෙල්ලේ...'

රණතුංග මහත්මිය කියද්දී අයංකට බැලූහේ හර්ෂණී දෙසය. ඇය අයංකට ඔරවාමෙන් ඉවත බලාගත්තාය.

# 13

සිකුරාදා සවස ප්‍රථම පඩි පත රණතුංග මහත්මියගේ අතින් අතට ගනිද්දී චායාගේ ඇස්වල කඳුළු පිරුනේ ඉබේටමය. අද ජීවිතයේ ප්‍රථම වරට මේ ජීවිතය වෙනුවෙන් තමා යමක් උපයා ගත්තා නේදැයි ඇයට සිතුණි.

චායාගේ ඇස්වල පිරුන කඳුළු රණතුංග මහත්මිය හොඳින් දුටුවාය. 'ඇයි කඳුළු ආවේ යැයි..' අසන්නට තරම් මිනිස් හැඟීම් ගැන නොදන්නා හිරි වැටුන මනසක් ඇය වෙත තිබුනේ නැත. ජීවිතයේ කුඩාම දෙයකින් පවා අසීමිත ලෙස සතුටුවන අහිංසක දුප්පත් කෙල්ලෙකුගේ නිර්ව්‍යාජ ආත්මයක සේයාව ඇය චායාගේ ඇස් වලින් දුටුවාය. මේ දෙන පඩියට වඩා ඔයාව ගොඩාක් වටිනවා කියන තරමටම රණතුංග මහත්මියගේ හදවත මොලොක් වුවද ඇය තුළ නිදා උන් ව්‍යාපාරිකාව ඒ හැඟීම මැඩ ගත්තාය.

'ඔය කඳුළු පිහදගන්න මෝඩ දරුවෝ..'

ඇය චායා අත්සන් කළ වැට්ටුප් වවුචරය අතට ගෙන කීවාය.

'මැඩම්ට ගොඩාක් පින්..'

එපමණක් අමාරුවෙන් ගලපාගන්නට චායාට හැකිවිය. ඒවචන වල අසීමිත භක්තියක් සැඟවී තිබුණි.

WWW.EXPRESSLANKA.TK 108

‘පින්දෙන්න මං පිං පඩියක් ඔයාට දුන්නෑ ළමයෝ.. දැන් මොකද පඩි අරගෙන කරන්නේ.’

ඇය සැහැල්ලු ලෙස ඇසුවාය. වායා තෙත්වූ දෙනෙත් බිමට බර කළාය.

‘ඒකනම් දන්නෑ මැඩම්.. මෙහෙමම ගිහිල්ලා අම්මගේ අතට දෙනවා.’

‘එහෙම බෑනේ වායා.. ආස කරන දෙයක් ඕකෙන් ගන්න.. තරුණ ළමයිනේ.. ටිකක් දිස්නෙට හුරතලේට හෙළවෙන්න එපැයිනේ..’

වායා සිනාසුනා පමණි. ජීවිතයට මේ ඇති දුප්පත් එළිය ඇරෙන්නට අමුතුවෙන් ළං කරගතයුතු දිස්නයක් ඇත්දැයි ඇය සිතුවාය.

‘වායාගේ බැංකු පොතක් තියෙනවද...’

‘තියෙනවා මැඩම්.. තාත්තා ඉන්න කාලේ පටන්ගත්තු එකක්.’

‘ඒකෙත් ටිකක් මාසෙන් මාසෙට දාගන්න.’

‘අම්මා ගිහිල්ලා මේකම ඒකේ දායිද කියලයි මටත් බය..’

‘එහෙමත් එපා කියන්න.. ඉතුරු කරනවා කියලා නොකා නොබී අඳින්නේ පළඳින්නේ නැතුව ඉතුරු කරලත් වැඩක් නෑ.. බයවෙන්න එපා ඔයාට මොකක් හරි කරදරයක් උනොත් මම බලනවා.’

‘මං දන්නවා මැඩම්..’

වායාගේ කඳුළු අලුත් වෙන්නාක් මෙන්ය. ඉඳහිට හෝ ලෝකයෙන් ලබන මෙවන් කරුණාවක් ඇගේ හිතට වාවාගත නොහැක.

‘අවුරුදු සීසන් එකේ ටිකක් රෑ වෙනකල් ඉන්න වෙනවා රජෝ.. අම්මට කියලා තියන්න.. බයවෙන්න එපා ඒ දවස්වලට මම බස්වල යවන්නෑ..’

‘මම අම්මට කියලා තියෙන්නේ මැඩම්..’

‘ඔයා අද පහ හය වෙනකල් ඉන්න ඕන නෑ වේලාසන යන්න.’

වායා පඩිපත අත තබාගෙන තම මේසය වෙත යද්දී ඇයට බැලුනේ අසංකගේ කාමරය දෙසය. මේ ලැබීම වෙනුවෙන් ඔහුටද ස්තුති කළයුතු බව ඇය සිතුවාය. කළහැකි එකම දේ එය පමණි.

WWW.EXPRESSLANKA.TK 109

වායා අසංකගේ කාමරය වෙත පිය නැඟුවේ තරමක බියෙනි. වායාගේ රුව මේසය ඉදිරියේ දකිද්දී අසංක හිස ඔසවා බැලුවේ පුදුමයෙනි.

'ඇයි වායා..'

'සර්... අද මම පඩි ගත්තා සර්..'

'ඉතින්.. මටත් ලෝන් එකක් ඕන වෙලාවක ගන්න පුළුවන් නේද..'

අසංක සැහැල්ලු ලෙස ඇසුවේය.

'සර් මට විහිළු කරනවා.. මං තැන්කියු කියලා යන්න ආවේ.'

'ඒ මොකටද..'

වායා අසරණ විය.

'සර්ලා මට රස්සාවක් දීලා මෙහෙම පඩියක් දුන්නට..'

'රස්සාවක් දීලා පඩිනොදී ඉන්නවද ළමයෝ.. අනික ඔයා කොච්චර වැඩ කළාද..'

'මං තාම වැඩ පුරුදු වෙනවනේ සර්..'

වායා පැවසුවේ ඇත්තටම අවංකවය.

'ඔයා සමහර දේවල් පුරුදුවෙනවා නම් තමයි. හැබැයි.. සමහර දේවල් අපිට පුරුදු කරනවා.'

වායා නිහතමානී ලෙස බිම බලාගත්තාය.

'ඔයාට නම් පඩි ලැබුනා. මං මේ බලං ඉන්නේ මගේ පඩිය ලැබෙනකල්..'

අසංක කියද්දී වායා සිනාසී පුදුමයෙන් ඔහුදෙස බැලුවාය.

'සර්ට පඩි..'

'නැතුව.. අපේ අම්මා මටත් පඩියක් දෙන්නේ.. පඩිය ඇරෙන්න සතයක් මට අපේ අම්මා දෙන්නෑ..'

'මැඩම් එහෙම කරන්නේ ඉතුරු කරලා සර්ටම දෙන්න.. මං යන්නම් සර්..'

වායා තවත් වරක් අසංක දෙස බලා කෘතඥතා පූර්වක ලෙස

WWW.EXPRESSLANKA.TK 110

සිනාසුනාය. චායා යනදෙස බලා ඉන්නට ඔහුට සිතුනද අසංක ඒ හැඟීම මැඩගෙන අරමුණක් හෝ ඇමතිය යුතු කෙනෙක් නොමැතිව දුරකථනය අතට ගත්තේය.

චායා තම වැටුප රැගත් කවරය දිගහැර බැලුවේ බජ්රියට නැඟ එහි අසුනක වාඩිවූවාටත් පසුය. කොළ පැහැගත් අලුත් දහේ කොළ කිහිපය දකිද්දී ඇයට පුදුම සිතුණි. චායා ඇඟිලි තුඩු යවා එය ගැන්නාය. එහි හරියටම රුපියල් හත්දහක් තිබුණි. චායාට ඇත්තටම අදහාගන්නටවත් බැරිවිය. වෙන කිසිවෙකුගේ හෝ වැටුපක් තමාට වැරදී පැමිණ ඇත්දැයි සැක ඇර දනගන්නට මෙන් චායා කවරයේ මුහුණත දෙස නැවත බැලුවාය. එහි පැහැදිලි ඉංග්‍රීසි අකුරින් CHAYA KALPANI RANASINGHE යනුවෙන් ලියවී තිබුණි.

මෙපමණ වැටුපක් චායා සිහිනෙන්වත් බලාපොරොත්තු නොවූවාය. අම්මාද නිතරම කීවේ පුහුණුවන කාලයේ කිසිම තැනක වැඩි වැටුපක් ලබාගැනීම දුෂ්කර බවය. ඇය නවත් වරක් මුළු හදවතින්ම රණතුංග මහත්මියගේ දෙපා වැන්දය. තමා වැනි ලෝකයේ හසරක් නොදත් යුවතියකට රැකියාවක් දීම පමණක් නොව මෙපමණ වැටුපක් දීමද ඇයට තවමත් අදහාගත නොහැක.

චායා තම වැටුප නැවතත් කවරය තුළට බහා එය අත්බෑගයේ සුරක්ෂිත තැනක තැන්පත් කළාය. පඩිපත අම්මා අතට දෙනතුරු ඇයට ඉවසිල්ලක් තිබුනේ නැත. අම්මත් එක්ක ගිහිල්ලම අම්මට මොනාහරි අරගෙන දෙනවා... චායා සිතුවාය.

චායා ගෙට ගොඩවෙද්දී පද්මා උන්නේ කුස්සියේ බංකුවට වී කන්කුන් මිටියක් සුද්ධ කරමිනි. චායා කුස්සියට ඇතුළු වෙද්දීම දියණියගේ මුහුණේ රැඳුන සිනාව පද්මාගේ හිත පුරවා දමුවේය. ඇය ඇඳගෙන ආ ඇඳුම පිටින්ම කුඩා බංකුව රැගෙන අම්මා අසළම ඉඳගත්තාය. අත් බෑගය තිබුනේ ඇගේ ඔඩොක්කුවේය.

'මොකෝ අද හිනාව මඟ දිගටම හලාගෙන..'

පද්මා දියණිය දෙස බලා ඇසුවාය. චායා දෙනොලම මුව තුළට දමාගෙන ආඩම්බර සිනහවක් මවාගෙන ඔඩොක්කුවේ තිබූ හැන්ඩ් බෑගයට අතදමා පඩිපත අතට ගත්තාය.

'ම්.. ගන්න..'

චායා සුදු දිග කවරය අම්මා වෙතට දිගුකර ආඩම්බරව සුන්දරව සිනාසුනාය. පද්මා සුදු කවරය දෙසත් දූවගේ මුහුණ දෙසත් පුදුමයෙන් බලාඋන්නාය.

'මොකක්ද පුතේ..'

'මගේ පළවෙනි පඩිය.. ඉතින් ගන්නකෝ..'

පද්මා එය අතට ගත්තේ ඇඟිවතින් දැතම පිසදය.

'ඇරලා බලන්න..'

දියණියගේ අහිංසක ආශාව ගැන පද්මාට දුක සිතුණි. ඇය පඩිපත ඇර බැලුවාය. චායාට එය ප්‍රමාණවත් නොවේ. චායා අමනාපයෙන් මෙන් පඩිපත අතට ගෙන එහිවූ දහේ කොළ කිහිපය අතට ගත්තාය.

'අම්මා හිතන්නේ මෙතන කීයක් තියෙනවද..'

'ඉතින් අගේ නොකර ඔයාම කියන්නකෝ..'

'අම්මා හිතලා ගාණක් කියන්නකෝ..'

'තුන් දහක් විතර.'

චායා සිනාසුනාය.

'ඒක දෙකෙන් වැඩි කරන්න.. එතකොට කීයද..'

'හය දහයි..'

'ඒකට දහක් එකතු කරන්න.'.

'හත් දහයි..'

'හරි... මෙන්න හත්දහ.. හරිද..'

පද්මා දුවදෙස බැලුවේද පුදුමයෙනි. චායා අම්මාගේ මුහුණේ රැඳි විස්මය රස වින්දය.

'එ..වි..එ..ර...'

'ම්.. මටත් පුදුමයි අම්මේ.. මට හිතුනා වැරදිලා වෙන කාගේහරි පැකට් එකක් ඇවිල්ලද කියලා. ඒත් නම ගහලා තියෙන්නේ

WWW.EXPRESSLANKA.TK 112

මගේ...'

'ඔයාගේ වැඩ ගැන මැඩම් පැහැදිලා ඇති.. සති දෙක තුනෙන් ඔයා වැඩ අල්ලා ගත්තනේ...'

'මට වටින්නේ ඔය කොළ හත නෙමේ අම්මේ..'

පද්මා වායාදෙස බලාගන්වනම බලාඋන්නාය.

'හිතට ලොකු සැනසිල්ලක් දැනෙනවා.'

වායා දණහිස මත දෑතම තබා ඒ මත හිස ඇලකර කීවාය.

'ආ.. ඔයා ළඟම මේක තියාගන්න.'

පද්මා දියණිය වෙත කවරය දිගු කළාය.

'මට සල්ලි එපා අම්මේ.. අම්ම ළඟ තියාගන්න... කංකුන් කඩන්නෙ රෑට උයන්නද..'

'ඔව්..'

'ඕක තියන්න.. අපි ටවුමට ගිහිල්ලා මොනාහරි අරගෙන කන්න දේකුත් අරගෙන එමු..'

'මොනා ගන්නද..'

'කියනදේ අහලා අම්මා ඇඳගන්නකෝ.. මං ඇඟ හෝදගෙන එන්නම්..'

'පඩි ගත්තා කියලා අල්ල පනල්ලේ වියදම් කරලා දන්නද යන්නේ... එකතු කරලා රත්තරං බඩුවක් ගමු.. පොතටත් ටිකක් දගන්න මැණික..'

'ඒවා පස්සෙ කරමු.. කාලෙකින් සාප්පුවකට ගිහිල්ලා නෑ. කියනදේ අහලා ඇඳගන්නකෝ.. තව කංකුන් දණ්ඩක් අල්ල අල්ල ඉන්නේ..'

වායා.. අම්මා කඩමින් උන් කංකුන් මිටිය වට්ටිය සමඟම ගෙන පැත්තකට දමා නැගිට්ටෙව්වාය.

WWW.EXPRESSLANKA.TK 113

# 14

අසංක මහරගම තරුණසේවා සංකීර්ණය අසළ වාහනය නතර කළේ ඔහුගේ සමීපම මිතුරෙකුගේ ඒක පුද්ගල ප්‍රසංගයකට සහභාගී වීමට නියමිතව තිබූ නිසාය. පාසැල් වියේ සිටම අසංක ඇසුරු කළ නාලක ඉතා අහිංසක ගතිගුණ වලින් පිරුන මිතුරෙකු විය. ගායකයෙකු වන ලකුණු නාලක පෙන්නුම් කළේ පාසැල් යන කාලයේ පටන්මය. මේ ප්‍රසංගය පැවැත්වීම සඳහා යැහෙන පමණ මුදලක් ඔහු අත තබන්නට අසංක අමතක නොකළේ එවැනි දෙයකින් හදවතට දැනෙන කුළුණු රසය අන් දෙයකින් ලබන්නට නොහැකි නිසාය. නාලක වැනි දූප්පත් මිතුරෙකු ළඟදී ඔහුට දැනෙන සැහැල්ලුව තිවී සැනසූන බව ඔහු ඇසුරු කරන බොහෝ මිතුරන්ගෙන් අසංක ලබා නැත.

මිනිසෙකුගෙන් සුවඳක් විහිදෙන්නේ කලාතුරකිනි. ඒ සුවඳ තවත් කෙනෙකුට දැනෙන්නේද කලාතුරකිනි. ඒ දෙකටම වාසනා ගුණයක් තිබිය යුතුය. අසංක හිතට බරක් දැනෙන හැම මොහොතකදීම නාලකව හමුවන්නේ ඒ නිසාය. අසංක තරුණසේවා සංකීර්ණය අසළ වාහනය නවතා රඟහල වෙත යාමට ඉන් ගොඩ බැස්සේ ඒ තිවී සැනසුන හදවතිනි. නාලකගේ ගීත හොඳ මට්ටමක තිබේනම් ඔහු වෙනුවෙන් කැසට් පටයක් කර දිය යුතුයැයි අසංක සිතාගෙන උන්නේය. තමා ඒ දේ නොකළද නාලක කවදහෝ මේ රටේ සංවේදී තරුණ හදවත් නලවන ගායකයෙකු වන බව ඔහු සහතිකවම දත උන්නේය.

අසංක තරුණ සේවා සංකීර්ණයට ඇතුළු වන්නට යද්දීම වාගේ අසළ වූ සාප්පුවකින් එළියට ආ පුරුදු රුවක් දැක නැවතුනේය. සාප්පුවෙන් විහිදී ආ මඳ එළියෙන් ඒ වායා බව ඔහු ඉඳුරාම සහතික කරගත්තේය. ඔහුට හඳුනාගන්නට පමාවූයේ වායා සාමාන්‍ය ඇඳුමකින් සැරසී උන් නිසාය. සාරියට වඩා එවැනි සරල ඇඳුමකට ඒ සුන්දරත්වය තවත් සුන්දරයැයි අසංකට සිතුණි. වායා ළඟින්ම යන්නේ ඇගේ අම්මා විය යුතු බව අසංකට සිතුණි. ඔවුන් වෙත ගොස් කතා

WWW.EXPRESSLANKA.TK 114

කරන්නට සිතුනද ඔහුගේ සිත මදක් පසුබෑවේය.

අසංක රඟහල වෙත යන ගමන නවතා කරුණාසේවා දොරකඩට වී ඩායාදෙස බලාගත්වනම බලා උන්නේය. ඔහුගේ ඇතුළු හදගැබ වෙතද නැති රස්නයකින් උණුවෙනු ඔහුට දැනෙයි. 'අද කෙල්ල පඩි අරගෙන බඩු ගන්න එන්නැති..' අසංකගේ සිත ඒ සිතුවිල්ලෙන් මොලොක් විය.

අසංක ඇසි පියලන නිමේෂයකින් ඩායා මවත් සමඟම පාර පනින පිරිස අතරට එකතු වූවාය. ඇය පාරේ එහා පැත්තට ගියපසු එකපෙළට ඇතිවූ වාහන තදබදය නිසා ඔහුගේ දර්ශන පථයෙන් ඇය ඉවත්විය. දෙනෝ දහක් පිරුන නගරය මැද ඔහුට මහා පාළුවක් හිස් බවක් දැනුණි. අසංක තවත් විනාඩි දහයක් පහළවක් පමණ පාර දෙස ඔහේ බලාඋන්නේය. ඔහු රඟහල වෙත පිය නැගුවේ අඳුර තවත් දැඩිවූ පසුය. රඟහල වෙත යන මාවත පුරා සිටවූ අරලියා ගස්වල පිපුන සුදු අරලියා මල් වලින් නික්මුන අලුත් මල් සුවඳ ඔහුගේ සිත අලුතින් පිබිදවිය.

අසංක රඟහල වෙත යද්දී නාලකපොල්තෙල් පහන දල්වන්නට ඔහු එනතුරු බලාගෙන උන්නේය.

'උඹ නැත්නම් මට මේ ෂෝ එක කරන්න වෙන්නෑ..'

පොල්තෙල් පහන දල්වද්දී නාලක අසංකගේ සුරත අල්ලා කීවේය.

'පිස්සු කියවන්නැතුව සිංදුවක් කියපන් අහලා යන්න..'

'කෝ හර්ෂණී එක්කගෙන ආවේ නැද්ද..'

'උඹට මං නේ ඕනේ.. මං ආවා...'

නාලක රඟහල පිටුපසට යද්දී අසංක සෙනඟ පිරුන රඟහලේ ඉදිරිපසම වූ අසුනකට බර වූවාය.

සැන්ද අහසින් තනිය මකා ගමී..

මැදියම් සිසිලෙන් හද පුරවාගමී..

රහසින් ඔබ දෙස බලා සිනාසෙමී..

දවසින් දවසට ඔබම පතා ඉමී..

නාලකගේ හඬ.. ඒ වචන.. චිත් නැන්වත් වූයේ අසංකගේ

පපුවේ ඔහුවත් නොදන්නා තැනකය. ඔහුගේ හදවත පුරා මොහොතකට කළින් දුටු වායාගේ මූහුණ පූර්ණව ඇඳුණි. ඇතුළු හදවතට දැනෙන්නේ කලබලයක්ද නොවේනම් සැනසිල්ලක්ද කියා ඔහුට තේරුම් ගතනොහැක.

ඒදෙනා විට ඔබ ළඟ ළඟ මා ළඟ..
සැලෙනා බව දැනෙතත් මගෙ ළමැදට...
දැස පියාගම් මවා ඔබේ රුව..
ළඟ නැත මේ මහා පාළු අමාවක..

නාලක අද ගයන්නේ තමාටමද කියා අසංක පුදුමයෙන් සිතුවේය. ඒ තරමටම ඔහුගේ හදවත ඒ හඬට ආත්මීයව බැඳී තිබුණි. මේ ගීතය රචනා කළේ කවුදැයි පසුව අසන්නට ඔහු සිතාගත්තේය.

ජීවිතයේ ඇති සිව් සැට රසවිත..
දෙවා ගන්න ඔබ එක කැල්මක් ඇත...
ආදරයේ අති නිර්මල මධුවිත..
පූරවා ගන්නට ඔබ පමණක් ඇත..

ඒ ගීතය නිමාවෙද්දී අසංක පිරිසත් සමහම වේගයෙන් අත් පොළසන් දුන්හ.

අසංක අතරමැද වූ විරාමයේදී වේදිකාව පිටුපසට ගියේය. ඇතදීම නාලකව දකිද්දී අසංක සිනාසී ඔහු වෙතට තම දඹරැඟිල්ල කෙළින් කර පෙන්වූවේය.

'ෂුවර් එකටම මම උඹේ කැසට් එක කරලා දෙනවා.. ෂුවර්...'.

අසංක සෙනෙහෙබරව කීවේය. නාලකගේ දෑස් තෙත්ව ගියේය.

'ඒ වචනේ ඇති මචං..'

'ඒකනෙවේ අර පළවෙනි සිංදුව ලිව්වේ කවුද..'

අසංක මෘදුව සිනාසී ඇසුවේය. අසංක ලේසියෙන් යමක් හාර හාර නොඅසන බව නාලක හොඳින් දනී.

'ඇයි උඹේ හිතට වැදුනද..'

නාලක සිනාසී ඇසුවේය.

'කවුද කියපන් ලිව්වේ..'

'පද රචනය, තනුව, ගායනය.. ඔක්කොම මම.. කොහොමද

WWW.EXPRESSLANKA.TK 116

හොඳද..'

'උඹට හොඳ අනාගතයක් තියෙනවා.'

'මොකද උඹ ඒ ගැන විශේෂයෙන් ඇහුවේ.'

'එහෙම විශේෂත්වයක් නෑ.. ඇයි උඹ එහෙම ඇහුවේ.'

අසංක සාමාන්‍ය ලෙස සිනාසුනේය.

'උඹ වගේ එකෙක් කලාවට බර වෙන එක ගැන විශේෂයෙන් හිතන්න ඕන.'

'වැඩිය හිතන්න එපා.. මං ටිකක් වේලාසන යනවා.. අපි පස්සෙ හම්බවෙමු.'

අසංක රඟහලෙන් පිටත්වූයේ නාලක නැවතත් වේදිකාවට නැඟ ගීතයක් ගැයීමෙනුත් පසුවය. ඔහු අවසාන වතාවට ගයමින් උන් ගීතය පෙර ගීතයටත් වඩා අසංකගේ හදවත කලබල කළේය.

කොහේද.. කොතනද.. පිපුනේ මල ඔබ..

හොරෙන්ම ඇවිදින් හිත ළඟටම ඔබ..

සුවඳ දනෙනවා රෑ තුන්යම මට..

පිපෙන්න ආසයි ඔබත් එක්ක මට..

අසංක නැවතත් වාහනයට නැග්ගේ බරවූ හදවතිනි. ඔහු රඟහලට යද්දී ජනාකීර්ණව තිබූ නගරය දැන් පාළුය. තමාගේ සිතත් මේ පාළුවූ නගරය වැනිමයැයි අසංකට සිතුණි. ඔහු වාහනය ඔහේ පදවාගෙන ගියේය.

නොදැනුවත්වම ඔහුට වාහනය හැරවුනේ දියවන්නා ඔයට සමගාමීව තිබූ පාර්ලිමේන්තු මාවතටය. පාළු දියවන්නාව මැද අලංකාර විදුලි බුබුළු දල්වී දිලෙන පාර්ලිමේන්තු සංකීර්ණය දෙස ඔහු වාහනය පදවනා අතරවාරයේ බලා උන්නේය. අද හදවතද ඒතරම්ම දර්ශනීයව කලබලව ඇතැයි අසංකට සිතුණි. ඔහු පාර්ලිමේන්තු සංකීර්ණය ඉදිරිපිට වූ පාර්ලිමේන්තු උද්‍යානය අසළ වාහනය නවතා ඉන් බැස්සේය.

වාහනයේ බඳට බරවී අසංක ඔහේ අවට පරිසරය දෙස බලාගත්වනම බලාඋන්නේය. පරිසරය පුරා රැඳුන පාළු බව ඔහුගේ සිත තවත් තනි කළේය. මෙතුවක් දවසකට ජීවිතයේ නොදැනුනු

WWW.EXPRESSLANKA.TK 117

තනිකමක් පාළුවක් අද දැනෙනැයි අසංකට සිතුණි. හිත කවදාවත් නැති තරම් මේ හැටි තොදෙල් වන්නේ කුමකටදැයි ඔහුට තේරුමක් නැත.

අසංක ගෙදර ගියේ බොහෝ රෑ බෝවීය. රණතුංග මහත්මිය පුතා එනතුරුම නොකා බලාගෙන උන්නාය. ඔහුගේ ජීවිතය සම්බන්ධව ළඟදීම තීරණයක් ගතයුතු බව අසංක වාහනය ගරාජයට දමද්දීම වාගේ ඇය සිතුවාය. "ඔහොම දිගටම ඉන්න දුන්නොත් නාස්ති වෙනවා.." ඇය සිතුවාය.

"අම්..මේ.. දූන් රෑ වෙලානේ.. ඇයි කෑවේ නැද්ද."

ඔහු ඇසුවේ දෙරකඩට ආ අම්මා දෙස බලමිනි.

"කොහෙද පුතා මෙච්චර රෑ වෙනකල් ගියේ..."

"නාලකගේ ෂෝ එකනේ අම්මේ.. යූත් සෙන්ටර් එකේ.. මරු සිංදු ටික අම්මේ.. පසුව කඩලා යනවා."

ඔහු අවංක කටහඬින් කීවේය. අසංකගේ මිතුරන් අතරින් ඇය නාලකට විශේෂයෙන් කැමතිය.

"අනේ පව්.. මටත් ඉන්වයිට් කළා නේද.."

"ඒකනේ අම්මට මතක නෑ."

"මං මොකටද අර ළමයව එක්කගෙන යන්න තිබුනනේ.."

"කවුද හෂීටද.. එයා උඹට කැමති නෑ."

රණතුංග මහත්මිය කිසිවක් නොකීවාය.

"යන්න ගිහිල්ලා ඇඟ සෝදගෙන එන්න... කෑම කන්න.. රමා මේ කෑම ටික ආයිත් රත් කරන්න."

අසංක නාන කාමරයට වැදී විනාඩි දහයක් පමණ ඇඟ සේදුවේය. ඔහුගේ හදවත වෙන වෙනස් නැවුම් බවකින් පිරී තිබුණි. අලුත් බතික් සරමක් හා සුදු අත් කොට ටී ෂර්ට් එකක් ඇඳගෙන අසංක කැඩපත ඉදිරියට ගියේය. ඔහු කැඩපතේ ඇඳුන තම රුව දෙස බලා උන්නේ "මොකෝ උඹට වෙලා තියෙන්නේ.." වැන්නක් අසන්නාක්

WWW.EXPRESSLANKA.TK 118

මෙනි.

"අවුරුද්දෙන් පස්සේ ඔය ගමන් බිමන් ටිකක් අඩු කළොත් හොඳයි පුතා. දැන් නැටුවා ඇති.. ඔයාට ඕනවටත් වඩා මම කල් දුන්නා.. අවුරුදු තිස් එකක් කියන්නේ කොල්ලෙක් එහෙම නෙවේ.. මිනිහෙක් තේරුනාද.."

අසංක හිස ඔබාගෙන සිනාසුණේය. රණතුංග මහත්මිය ඔහුගේ පිඟානට තව තලපත් මාළු කැබැල්ලක් දැමුවේය.

"ඔයා ඉක්මණට මේවා බාරගන්න.. මමත් බිස්නස් කිය කිය හැප්පුනා හොඳටම ඇති.. මමත් ආසයි පන්සලකට ගිහිල්ලා මලක් පූජ කරලා හිතේ නිස්කලංකෙන් ඉන්න."

"අම්ම ඔහොම කිව්වට අම්මට තිවාඩු දවසකටවත් ගෙදරට වෙලා ඉන්න බැහේ."

"එහෙම ආදරේ කරලා තමයි පුතා ඕවා ගොඩනැඟුවේ.. තාත්තා කරපු චූටි ෂොප් එක ඔයාට මතක නැද්ද.. අද එහෙමද.."

"මාත් අම්මත් එක්ක කතාකරන්න හිටියේ.."

රණතුංග මහත්මිය එකවර තම පුතු දෙස බැලුවාය.

"මොකක්ද.."

"හම්ත් නිතර ඇවිත් කියවනවා.. මටත් ලොකු වදයක්.."

"එහෙම කතා කරන්නත් එපා.. එයා අපි පුංචි කාලේ ඉඳලා දන්න ළමයා.. ඕන කෙල්ලෙක්ගේ අඩුපාඩුකම් තියෙනවා. අනික කනී කෙල්ල.. ඔයත් ඒ ළමයට බලාපොරොත්තු තියාගන්න විදිහටනේ හැසිරුනේ.. දැන් මං එක්ක තව මොනවත් කතා කරන්න එපා. සීසන් එකෙන් පස්සේ මං මාමත් එක්කත් කතා කරනවා.."

අසංක කරබාගත්තේය. ඔහුගේ සිතට නිවනක් සැනසීමක් තිබුනේම නැත.

"අඩුපාඩුකම් තියෙනව නම් හදගන්න බලන්න. ඒ කෙල්ල ටිකක්

WWW.EXPRESSLANKA.TK 119

හිතුවක්කාරයි තමා.. හැබැයි නරක කෙල්ලෙක් නෙමේ..'

අසංක කිසිවක් කීවේ නැත. හර්ෂණීගේ ජීවිතය පිළිබඳ ගැඹුරට කිඳා බසින්නට තරම් තමා ඇයට ළංවී ඇත්දැයි අසංක සිතුවේය.

'අනික.. මට මොන ප්‍රශ්නේ ආවත් මාමව අමතක කරන්න බෑ.. ඔයාගේ තාත්තා නැතිවෙන කොට මට අවුරුදු තිහයි.. ජීවිතේ ගැන මෙලෝ දෙයක් දන්නෑ.. ඔයාවත් හදාගෙන බිස්නසුත් දියුණු කරගෙන මේ ගෙවල් දොරවල් හදාගන්න මට උදව් කළේ මාමා.'

ඒ වෙනුවෙන් වත චන්දිය තමා හර්ෂණී සමග විවාහවීම දැයි අසන්නට අසංකට සිත්විය. එහෙත් අම්මාගේ සිත රිදවන්නට ඔහුට ලෝබය.

'පුතාට හදිස්සියේ මොකද හර්ෂණීව වදයක් උනේ.'

අම්මා හදිස්සියේම අසද්දී අසංක ගැස්සී ඇයදෙස බැලුවේය.

'නෑ.. එහෙම දෙයක්නෑ.. ඒත් තව ටිකක් පරක්කු වෙලා මැරි කරන්න මං කැමතියි.'

'පුතා හදන්නේ මගේ ජීවිතේ අන්තිම කාලේ සැනසිල්ලක් නැති කරන්න.. මං ජීවිතේ කළේ වැඩ විතරයි.. ඔයාගේ දරුවෙක්ව නලවලා හුරතල් කරලා මැරෙන්න මාත් ආසයි පුතා..'

රණතුංග මහත්මියගේ දෑස කඳුළින් පෙඟී ගියාය. අසංකගේ පසුව කොතනක සිට උණුවිය. තමා මේ සම්බන්ධයෙන් ආත්මාර්ථකාමී වනවා වැඩියැයි ඔහුට සිතුනි.

'සොරි අම්මා...'

'ඔයා ඉස්කෝලෙන් අයින්වුනේ දැන් අවුරුදු දෙළහකට කලින්. මං ඔයාට හැම සැප සම්පතක්ම දුන්නා. ඔයාට නිදහසේ සතුටු වෙන්න දුන්නා. දැන් ඇති පුතා.. හොඳටම ඇති.'

'අම්මා කැමති දෙයක්.. මට නිදිමතයි මං නිදාගන්න යනවා.'

අසංක බොහෝ දිනකට පසු සමහරවිට වසර ගණනාවකට පසු නින්දට යාමට පෙර අම්මාගේ දෙපා වැඳ කාමරය බලා ගියේය. රණතුංග මහත්මියගේ කඳුළු අලුත්විය.

WWW.EXPRESSLANKA.TK 120

'රමා.. පුතාට කිරි එකක් ඕනද කියලා අහලා හදලා දෙන්න. මේ බත් ටික කෑවෙත් නෑ.'

රණතුංග මහත්මිය කීවේ අසංක බාගයක් පමණක් කෑ පිඟාන දෙස දුකෙන් බලමිනි. තමා ගොඩනැගූ අනාගතය තුළ අසංකගේ ජීවිතය වඩාත් සුරක්ෂිතයැයි ඇය සිතුවාය. කේන්දර නැකැත් ශාස්ත්‍ර කෙරේ දැඩිව විශ්වාස කරන රණතුංග මහත්මිය කාමරයට ගොස් අසංකගේ කේන්දර කොපිය ගත්තේ හෙට සෝමචන්ද්‍ර ගෙන්වා එය බලවා ගතයුතු යැයි සිතාය.

ඇඳට වැටුන ඉක්මණින් අසංකගේ දෙනෙතට නින්ද ආවේ නැත. ඔහු කාමරයේ වූ විදුලි පංකාව ක්‍රියාත්මක කරවා වේගයෙන් කැපී එන සුළඟට මුහුණ හරවා ගෙන උන්නේය. මොහොතකින් අසංකට සීතලක් දැනුණි. ඔහු කොට්ටයේ මුහුණ ඔබාගෙන ඉන් සුවඳක් හෙව්වේය. ඒ සුවඳ තිබුනේ කොට්ටයේ නොව ඔහුගේ සිතේය. සිත කොනකය. ඒ සුවඳේ උරුමක්කාරිය කව්දැයි අසංක සිතුවාය.

දවස් දෙක තුනක සිට හිත කුමක්දෝ ඉව කරමින් ඉන්නවා යැයි අසංකට සිතුණි. ඒ ගැන සිතන්නට ඔහුට බියක් දැනුණි. මේ හිත ගැස්සුනේ කවද සිටදැයි ඔහු අඳුරේ දෙනෙත් දල්වාගෙන සිතුවේය.

වායාව මුල්ම වරට කාර්යාලය අභියසදී දුටු මොහොත අසංකට සිහිවිය. හදවතේ එතෙක් ඇර නොතිබූ කවුළුවක දෙපියන්පත් දෙපසට වී විවර වූයේ එදයැයි අසංකට සිතුණි. ඒ බැල්ම.. ඒ මෘදු සිනහව.. ඒ කතාව මොහොතකට අසංකට සිහිවිය. හිත මුල්ම වරට ගැස්සුනේ එදය. තවමත් එය ගැස්සුනු ගමන්මය. ජීවිතය වටා ඇති බැඳීම් මොහොතකට ඔහුට අමතක විය. ඇයටම ආවේනික වූ අරුමැසි ලතාවකින් වායා තම හදවත මත ඇවිදිනු ඔහුට දැනුනි.

අසංක ඇඳෙන් නැගිට කාමරය පුරා සක්මන් කළේ හිත ඒතරමටම කලබලව තිබූ නිසාය. හිත මේ තරම් නොසන්සුන් වූ දවසක් ගැන සිතාගන්නට ඔහුට නොහැකි විය. ජීවිතයේ සියළුම තීරණ ඒ මුහුණ දකින්නට පෙර ගත්තේ අපරාදේ යැයි අසංකට සිතුණි. එහෙත් ජීවිතය වට කළ බැඳීම් කවරක් වුවද හදවතට දැනෙන ලෝබකම පලවා හරින්නට තරම් ශක්තිමත් පිරිමි ළයක් ඔහුට නොතිබුණි. [illegible] ආ[illegible]කින් අසංකගේ

WWW.EXPRESSLANKA.TK 121

ළය දැවී ගියේය. අසංක කාමරයට එපිටින් වූ දොර ඇරගෙන බැල්කනියට ආවේ තව පැය දෙක තුනකටවත් නින්ද තමා වෙත නොඑනා බව දැනගෙනය. බැල්කනියේ තබා තිබූ පුටුවට බරවී අසංක අවට පරිසරය දෙස නෙත් යොමාගෙන උන්නේය. ගහකොළ මත යංතමට පතිත වූ සඳ රැස් මේතරම් ලස්සන බවක් ඔහුට මීට පෙර දැනී නැත. රාත්‍රියද වෙනදාට වඩා ලස්සන යැයි ඔහුට සිතුණි.

බොහෝ වෙලාවකට පසු අසංක කාමරයට පැමිණ ඇඳට වැටුනේ හෙට ඉක්මණට එළිවෙනවා නම් හොඳයැයි සිතමිනි. ඔහු කොට්ටය බදගෙන ඇඳ අසල ටීපෝව මත තබා තිබූ ගුවන් විදුලි යන්ත්‍රය නෙත් පියාගෙනම දැමුවේය. ඉන් ගලා ආවේ ඔහු කෙදිනකවත් මීට පෙර අසා නොතිබූ ජෝතිපාලයන්ගේ ගීතයකි.

නව මිණි රන් මුතු ඇත පිරිලා..
කප් රුක මැවිලා අතු ලියලා..
ඔබෙ ප්‍රතිමාවක් නැති රජ දහනක
කුමටද සක්විති රජෙකු වෙලා..

ඒ ගීය අලුතින් අසංකගේ හදවත මොලොක් කළේය.

# 15

අසංකට ඇහැරුනේ පාන්දරමය. ඔහු වේලාසනම නාන කාමරයට වැදී සෑහෙන වෙලාවක් ගෙන නෑවේය. නාන කාමරයෙන් එළියට එද්දී අසංකට දැනුණේ වෙනදා නොදැනෙන නැවුම් බවකි. කාමරයට ආ සැනින් ඔහු අල්මාරිය ඇර එහි දමා තිබූ අලුත්ම කමිසයක් අතට ගත්තේය. තවමත් පොලිතින් ඇසුරුම පිටින් ඇති ඒ කමිසයට අසංක වඩාත් ආශා කළේය. ඔහු එය අරන් නැබුවේ

WWW.EXPRESSLANKA.TK 122

කොහේ හෝ වැදගත් ගමනක් යද්දී අඳින්නටය. රෝස පැහැගත් පසුබිමට රතු පැහැයින් ඉරිවැටී තිබූ ඒ කමිසය ඇඳ අසංක යැහෙන වේලාවක් කැඩපතින් තම රුවදෙස බලා උන්නේය.

අලුත් කමිසය ඇඳ උන් අසංකගේ හැඩ බැලුවේ ඔහුටත් වඩා ඔහුට නොපෙනෙනා ලෙස ඔහුදෙස බලාඋන් රණතුංග මහත්මියයි. ඇය බලා ඉන්නා බවක් නොදැන අසංක සෑහෙන වෙලාවක් කන්නාඩිය ළඟ එහාට මෙහාට හැරෙමින් හැඩ බැලුවේය. අසංකට ඇත්තේ කෙනෙකුගේ හදවතක් මොලොක් කරන අහිංසක ලස්සනකැයි රණතුංග මහත්මියට සිතුණි.

'ලස්සනයි පුතේ ලස්සනයි.. දැන් කොච්චර වෙලා හැඩ බැලුවද.. කොයි පැත්තට බැලුවත් ඔයා ලස්සනයි..'

රණතුංග මහත්මිය කියද්දී අසංක ලැජ්ජාවෙන් රතුවිය. අම්මගේ පැමිණීම නොදැනෙන තරමටම තමාගේ සිහිය අවුල් වූයේ කෙසේද කියා ඔහු සිතුවේය.

'ලස්සන ෂර්ට් එක.. ඔයාටම කියලා මහලාවගේ.. මොකෝ අද හැඩට ඇඳලා හැඩ බලන්න හිතුනේ.'

අම්මගේ කතාවෙන් ඔහුගේ හිත මොහොතකට ගැස්සුනි. ඔහු අම්මා දෙසට හැරුනේ වෙනසක් නොපෙන්වාය.

'උදේ තවා ඇඳුම් අතගාලම අලුත් ඇඳුමක් අගේනැ අම්මේ.. ඒකයි ඇඳලා බැලුවේ..'

'ඔයා වගේ කොල්ලෙක් නෙවේ.. මට කෙල්ලෙක් ඉන්න තිබ්බේ.. එහෙනම් ඕනතරම් ඇඳුම්..'

'ඇයි අම්මා ඇඳගන්නැද්ද.. පරක්කු වෙනවනේ අම්මේ..'

රණතුංග මහත්මිය ඇඳ නොගෙන සිටිනු දැක අසංක ඇසුවේය. අම්මා පමාවෙද්දී ඔහුගේ හිත දුකෙන් බරවිය. ඔහුට අවශ්‍ය වූයේ ඉක්මණින්ම කාර්යාලයට ගොස් චායා දැකගන්නටය.

'මම ටිකක් අද දවල් වෙලා එන්නම් පුතා.. ඔයා යන්න.. ඇහට ටිකක් හරි මදි..'

WWW.EXPRESSLANKA.TK 123

'ඇයි අම්මේ.. අසනීපද..'

'නෑ.. එහෙම දෙයක් නෑ.. ටිකක් ඔළුවත් බරයි.. පුතා යන්න.'

අම්මගේ නොපැමිණීම ගැන අසංක යටි සිතින් සතුටු විය. ඔහු වාහනයේ යතුර අතට ගත්තේ නිදහස් සිතිනි.

වෙනදාට වඩා සෑහෙන වේලාසනින් අසංක සාප්පුව වෙත ආවේය. නිලංකා අසංක දැක ඇතදීම සිනාසුනාය. සර් අද ලස්සනයි.. කියන්නට ඇගේ මුවගට ආවද නිලංකා ඒ හැඟීම මැඩගෙන ඒබව සිනාවෙන්ම පලකළාය.

'කෝ සර් මැඩම්..'

'පරක්කු වෙලා එයි.. ඇඟට හොඳ නෑ කිව්වේ.'

'වායා පැමිණ ඇත්දයි..' අසන්නට අසංකට සිතුනද ඔහු අත තිබූ යතුරු කැරැල්ලෙන් කාර්යාලයේ යතුර තෝරා නිලංකා දෙස බැලුවේය.

'කෝ අද ඔයාගේ යාළුවා ඇවිත් නැත්ද..'

'වායද.. මේ කෙල්ල තවම නෑ සර්.. වෙනදාට නම් ඇවිත්... බස් එක හිරවෙලා ඇති..'

අසංකගේ සිත කඩා වැටුණි. පාන්දරම ඒ මුහුණ බලාගන්නට ඔහු ආශාවෙන් උන්නේය. අසංක දොර ඇර තම ආසනය වෙත ගියේ හිස්වූ වායාගේ අසුන දෙස දුක්බරව බලාය. පුටුවේ ඉඳගත්තද වැඩක් කරන්නට තරම් සිතක් ඔහුවෙත තිබුනේ නැත. අසංක දිගටම බලාඋන්නේ දොර දෙසය. එය හුළඟින් සෙලවෙද්දී පවා ඔහුගේ හදවත සැලෙන්නට විය.

කාර්යාලයේ බිත්තියේ ගසාතිබූ ඔරලෝසුවේ උදෑසන අටයි පහළොව සටහන් වෙද්දී අසංකගේ සිත වඩාත් කලබල විය. ඔහු අසුනෙන් නැගිට කාර්යාලයේ දොර ඇරගෙන එළියට ආවේය. නිලංකා හිස ඔසවා අසංක දෙස පරීක්ෂාකාරීව බලා යළිත් බිම බලාගත්තාය. ඔහු මොහොතකින් ඇතුළට ගොස් යළිත් අටයි තිහට එළියට ආවේය. ඒ මුහුණේ ඇති නොසන්සුන් බව නිලංකා හොඳින් දුටුවාය. එහෙත් ඒ ගැන අසන්නට තරම් දිරියක් ඇය වෙත තිබුනේ නැත.

අසංක කොරිඩෝව දිගේ ගොස් පහළ මාලය දෙස මොහොතක්

WWW.EXPRESSLANKA.TK 124

බලා උන්නේය. ඒද විනාඩි ගණනකි.. ඊටත් පසු ඔහු ඉහළ මාලයේ වීදුරු කවුළුවෙන් පහළ ගේට්ටුව දෙස බලා උන්නේය. චායාගේ පමාවීමත් අසංකගේ මුහුණේ රැඳුන නොසන්සුන් බවත් අතර සම්බන්ධයක් ඇතැයි නිලංකා නිකමට සිතුවාය. යුවතියකට ස්වභාවයෙන් ලැබෙන ඉව ඔස්සේ ගොස් ඒබැව් නිලංකා අනුමාන කළාය.

'අද මේ කෙල්ල එන්නැතුවවත්ද දන්නෑ සර්.. කවදාවත් මේ තරම් නම් ලේට් වෙලා නෑ.'

නිලංකා සුපරීක්ෂාකාරීව අසංකගේ මුහුණ දෙස බලා කීවාය.

'හයිලෙවල් පාරේ ට්‍රැෆික් නේ..'

අසංක එපමණක් කීවේය. ඒ ගැන දිගින් දිගට අහන්නට ඔහුට ඕනාකමක් තිබුනද අසංක ඒතරම් උනන්දුවක් පෙන්වූයේ නැත.

'අද නිවාඩු ගන්නවා කියලා මැඩම්ට කිව්වද දන්නෑ..'

නිලංකා කිව්වේ ඇගේ අනුමානය හරියට හරිදැයි අසංකගේ මුහුණින්ම දැනගැනීමේ ආශාවෙනි. ඒ මුහුණේ ඉරියව් බලා ඉඳිද්දී වෙනස් වෙනු නිලංකා බලා උන්නේ සීරුවෙනි.

'අද ඕඩර්ස් වගයක් යවන්නත් තියෙනවා.. නිවාඩු අරගෙන බැහැ.'

ඔහු එසේ කීවේ තමාට නොව ඔහුගේම හිත සනසා ගන්නට බව නිලංකා නිකමට සිතුවාය. අසංක හැරුනේ තවත් වරක් පහළ මාලය දෙස බලාය.නිලංකා තමාට පිටුපා යන අසංකා දෙස බලාඋන්නේ හැඟීම්බරවය. චායාගේ සුන්දරත්වය මේ ඇස් දෙක නොවින්දෙත් ඒක මහා පුදුමයකැයි නිලංකා සිතුවාය.

අසංක ඔහුගේ අසුනට නොගොස් විශාල කාර්යාල කාමරය පුරා නොසන්සුන්ව ඇවිද්දේය. ඒ අතරතුර ඔහු කිහිප වාරයක්ම චායාගේ අසුන දෙසද බැලුවේය. වෙනදට මේ මේසය ළඟ පාන්දරම පිපෙන මල අද නොපිපෙන්නේ ඇයිදැයි ඔහු සිතුවේ දුකෙනි. වේදනාවෙනි. ඒ මුහුණ බලාගන්නම කියා හිතාගෙන පාන්දරම ආ ගමන බලාපොරොත්තු කඩවීමකින් කෙළවරවීම ගැන අසංකට මහා දුකක් දැනුණි. ඊටත් වඩා චායාගේ පමාවීම ඔහුගේ සිත නොසන්සුන් කළේය.

වෙනදට අසංක කාර්යාලයට පැමිණ මොහොතකින් උදේ

WWW.EXPRESSLANKA.TK 125

ආහාරය ගැනීම සඳහා ශාන්ති විහාරයට යනබව නිලංකාට සිහිවිය. අද නමය වනතුරුත් ඔහු ඒ සඳහා නොගියේය.

මුළු කාමරයම පාළුවට ගොස් යැයි අසංකට සිතුණි. ඡායා නොපැමිණෙන්නේ නම් මෙහි රැඳීම පවා ඔහුට වදයක් විය. ඔහුගේ දෙනෙත් මාරුවෙන් මාරුවට ඔරලෝසුව දෙසටත් කාර්යාලයේ දොර දෙසටත් යොමුවිය. කිසිදු වැඩක් කරන්නට ඔහුගේ සිතට නිස්කලංකයක් නොවීය.

නිලංකා කාර්යාල කාමරයට ඇතුල් වෙද්දී ඔහු උන්නේ නළලට අතක් තබාගෙන හිස බිමට නැඹුරු කරගෙනය. ඒ දර්ශනය නිලංකාගේ සිත වඩාත් පුදුමයට පත් කළේය. ඇගේ සේවා කාලය තුල අසංකා කොදිනකවත් එසේ සිටිනු ඇය දැක නැත.

සර්..

නිලංකා බියමුසුව අසංක වෙත වීත් කතාකළාය. නිලංකා දැක අසංක සිනාසුනේ කිසිවක් නොවූ ගාණටය. එහෙත් ඔහුගේ මුහුණ පුරා රැඳුන නොසන්සුන් දුක්බර බව නිලංකා අපූරුවට දැන ගත්තාය.

'රත්තරු ගාමන්ට් එකෙන් ඇවිත්.. බඩු වගයක් දන්න.. එන්න කියන්නද..'

'එපා.. හෙට එන්න කියන්න.. මට දැන් වැඩ වගයක් තියෙනවා.. දැන් ආවම පැයකට යන්නෑ.'

'ඇයි සර් සර්ට සනීප නැද්ද.'

නිලංකා ගෞරව පූර්වකව ඇසුවාය.

'නෑ.. එහෙම දෙයක් නෑ නිලංකා. මම මේ එකවුන්ට් වගයක හිරවෙලා. අරුන්ට යන්න කියන්න. මල කරදරේ.. උදෙන්ම එනවා මූසල කමට.'

කාර්යාලයෙන් පිටවෙද්දී නිලංකාට සැහෙන දේවල් සිතුණි. මේ සියල්ල මෙහෙමම වන බව ඇයට මුලදීත් යංතමට සිතුණි. එහෙත් තත්වය මේතරම්ම බරපතල යැයි නිලංකා නොසිතුවාය. ඡායා ඉක්මනට ආවානම් සියල්ල විසඳෙනු ඇත. ඡායාගෙන් ඇමතුමක් ආවේ නිලංකා පුටුවෙන් වාඩිවෙද්දීම වාගේය.

WWW.EXPRESSLANKA.TK 126

'මොකෝ කෙල්ලේ.. ඔයා නැතුව මේ පැත්තම කළුවෙලා.. වහින්න වගේ.. ඇයි පරක්කු.'

නිලංකා ඇසුවාය. වායා කතාකළේද අමාරුවෙනි.

'මට චුට්ටක් අමාරුයි නිලංකා.. කෝල් එක ගන්න ආවෙත් අම්මව එවන්න අමාරු නිසා.'

'ඇයි ඒ..'

'කලන්තේ වගේ.. උදේ වමනෙත් ගියා.'

'ඒ මොකෝ.. උණද..'

'එහෙමත් නෑ.'

'එහෙනම්..'

'මේ අසනීප දවස්..'

වායා යාංතමට සිනාසී කීවාය.

'ඒක චූට්ටකින් ඇරිලායයි කෙල්ලේ.. මෙහේ කට්ටිය හරි දුකින් ඔයා නැතුව..'

නිලංකා සිනාසී කියද්දී වායාට පුදුම සිතුණි.

'කට්ටිය කිව්වේ..'

'කට්ටිය කිව්වේ ගොඩාක් අය නැතේ.. අද මැඩමුත් නෑ.. සර් විතරයි.'

මැඩමුත් නැතිනම් කට්ටිය දුකෙන්යැයි කීවේ ඇයිදැයි වායා සිතුවාය. නිලංකා කටට ආ ඒවා කියන නිසා වායා ඒ ඔස්සේ වැඩිදුර නොසිතුවාය.

'හරි වැඩේ මැඩමුත් නැත්නම්.. මම චුට්ටක් ඉඳලා දවල් වෙලා එන්න බැලුවේ.. අමාරුයි නිලංකා..'

'අනේ වායෝ.. එන්නැතුව නම් ඉන්නෙපා.'

'ඇයි ඒ..'

'මම පස්සෙ කියන්නම්කෝ.. පෙනඩෝල් දෙකක් කෝපි එකක් එක්ක බීලා ඇඳගෙන එන්න. ඔය දවස්වලට සාරි පටලවගෙන

WWW.EXPRESSLANKA.TK 127

එන්නෙපා.'

'චූට්ටක් පරක්කු වෙයි.. ඇත්තටම අමාරුයිනේ..'

'මම දන්නෑ.. මම සර්ට දනවා.. ඕන එකක්.. බලමුකෝ ඔයා එයිද නැද්ද කියලා.'

'සර්ට කොහොම කියන්නද..'

චායා අසරණව ඇසුවාය.

'අරවා මේවා හැදිලා කියලා සර්ට කියන්නෙපා.. අසනීපයි කියන්න..ඒත් රජෝ එන්නම වෙයි.'

'දන්න එහෙනම් සර්ට.. නිවාඩු ඉල්ලන්නේ කොහොමද..'

'ඉල්ලුවත් දෙන එකක් නම් නෑ.. ඕන්න මං දනවා.'

නිලංකා රිසීවරය මේසය මත තබා කාර්යාලයේ දෙර ඇරියාය. අසංක උන්නේ ඔහේ බිත්තිය දෙස බලාගෙනය. නිලංකා තත්පරයක් ඒ දෙස නැරඹුවාය.

'සර්.. චායාගෙන් කෝල් එකක්.'

නිලංකා සිනාසී කීවාය. අසංක නිලංකාගේ දෙනෙත් දූක දූකම මඟ ඇරියාය. නිලංකා දෙරවසා තම අසුන වෙත ආවේ දහසක්දේ සිතමිනි.

'ස..ර්.. මං චායා.'

චායා කතාකළේ අවංක අමාරුවකිනි. අසංකගේ හදවත මඳකට ඇකිලී ගියේ ඒ අසරණ බවටය.

'ඇයි චායා.. අද ඔෆිස් එන්නැද්ද..'

ඔහු මොලොක් හඬින් ඇසුවේය. වචන විග්‍රහ කරන්න දන්නා නම් ඔහුගේ වචනයක් වචනයක් පාසා දූක වැඩිවෙන අයුරු අපුරුවට පෙනෙනු ඇත.

'මට අද ටිකක් අසනීපයි සර්..'

චායාගේ වදන් අසංකගේ සිත කඩා ඉහිරවන්නට සමත්විය. ඇය අද නොපැමිණෙනැයි ඔහු ඇත්තටම බියවිය.

WWW.EXPRESSLANKA.TK 128

'ඇයි ඒ.. මොකක්ද අසනීපේ..'

'කලන්තේ වගේ.. උණ ගන්න වෙන්නැති.'

අසංකට මහා හිස් බවක් දැනුණි. මේ දවස් ටිකම ගත කරන්නට වෙන්නේ මේ පාළුවෙන්ද.. මේ හිස් බවින්ද..

'මං සර් ටිකක් දවල් වෙලා එන්නද...'

'කීයට විතරද..'

'එකට විතර.. ඇවිල්ලා රෑ වෙනකල් ඉන්නම්..'

ඔහු ෆෝන් කරකවා වටපිට බැලුවේය. පැත්තම පාළුය.. මේ පාළුව ඉවසන්නට බැරිය.

'වායා බෙහෙත් ගත්තද.'

'නෑ සර්..'

මේවලට බෙහෙත් නෑ කියන්නට හිතුනද වායා එතමණක් කියා බලාඋන්නාය.

'එන්නම අමාරුද..'

අසංකගේ වචන දුරකථන රැහැන දිගේ වායා වෙත ආවේ අවශ්‍ය ප්‍රමාණයටත් වඩා මොලොක්විය. වායාගේ සිත ඒ වචන හමුවේ අසරණ විය.

'වුවිටක් මං ලේට් වෙන්නද සර්..'

'මොනව හරි පැරසිටමෝල් දෙකක් බීලා ත්‍රී වීලර් එකක හරි එන්න.. අමාරු උනොත් නිලංකා එක්ක ගිහිල්ලා බෙහෙත් ටිකක් ගන්න.'

අසංකගේ වචන වායාට පුදුමය. ඇය දුරකථනය කනේ තබාගෙන අසරණව බලා උන්නාය.

'වායා එනව නේද..'

වායාට දියයුතු පිළිතුරු කුමක්දැයි සිතාගන්නට අසීරු විය. ඇය තන්පර කිහිපයක් බලා උන්නාය.

'එන්නම් ස..ර්..'

අසංකට දැනුනේ කිව නොහැකි තරම් සතුටකි. ඔහු අත තිබූ රතුප[illegible] Good Girl [illegible]යි ලීවේය.

WWW.EXPRESSLANKA.TK 129

පසුව ඒ මතම ඇන්දේය.

'මං තියන්නම් සර්.'

'ත්‍රී විලර් එකක එන්න. දැන් නමයයි හතළිස් පහයි. දහයයි හතළිස් පහට ඔයා මෙතන හරිද..'

'හරි සර්...'

වායා දුරකථනය තබා දුරකථන කුටියෙන් මෑත්වූයේ ඇඟිලි තුඩු වලින් නළලත පිරිකාය. ඇගේ සිතට කෙදිනකවත් නොදැනුන තරම් අමුත්තක් දැනෙන්නට විය. ඇය ගෙදර ආවේ ඉක්මන් ගමනිනි. ඇමතුම ගන්නට යද්දී තිබූ අමාරුව දැන් නැත්තේ ඇයිදැයි වායා සිතුවේ පුදුමයෙනි.

'ඇයි පුතේ.. හවස් වෙලා එන්නම් කියලා කිව්වද..'

පද්මා දෙරකඩදීම වායාගෙන් ඇසුවාය. වායා අම්මා දෙස බැලුවේ නොසන්සුන්වය.

'ඔව් අම්මේ.. ඒත් වැඩ ඇති. මට දැන් අමාරුවකුත් නෑ.. මං යන්න හිතුවේ.'

'මාත් කිව්වේ ඒකනේ.. ඕක ඇරිලා යනවා.. තව කෝපි එකක් බීලම යන්න.'

'හා..'

වායා කාමරයට ගොස් වේලාසන මැද තිබූ සැහැල්ලු ගවුමක් අතට ගත්තාය. මෙතුවක් දවසක් සාරිම ඇඳගෙන ගොස් අද ගවුමක් ඇඳගෙන යන්නට ඇයට මොකක්ද වාගේය.

'අපරාදේ මං කෑම හැදුවෙත් නෑ..'

වායා එන්නට යද්දී පද්මා කීවාය.

'කන්න කොහොමත් පිරියක් නෑ අම්මේ.. මම මොනාහරි ගෙන්න ගෙන කන්නම්.. අම්මා උයලා කන්න.'

'අරවා දෙක තුනකුත් ගත්තද.'

අම්මා අසන්නේ සනීපාරක්ෂක තුවා ගැන බව වායා දන්නීය.

'ගත්තා.'

WWW.EXPRESSLANKA.TK 130

චායා අත් බෑගයට අත තබා සිනාසී කීවාය. ඇය පය ඉක්මන් කර ගොඩගම හන්දියට පැමිණ අත් ඔරලෝසුව දෙස බැලුවාය. හරියටම උදෑසන දහය එහි සටහන්ව තිබුණි. අසංකා කීවේ හරියටම දහයයි හතලිස් පහට කාර්යාලයේ ඉන්නා ලෙසය. සමහර විට විශේෂ වැඩක් අද යෙදී තිබෙන්නට බැරිනැත. මේ අලුත් අවුරුදු සමයයි. බසයෙන් ගියහොත් අඩුම වශයෙන් පැයක් වත් යනු ඇත. ඇය අකමැත්තෙන්ම නවතා තිබූ ත්‍රී විලරයකට ළංවූවාය. එහි උන්නේ චායා තරමක් දන්නා හඳුනන ගෙවල් ළඟ කෙනෙකි.

'තුම්මුල්ලට යන්න කීයක් ගන්නවද.'

'රුපියල් තුන්සීයක්වත් ගන්න වෙනවා. නංගිට එහෙම කියලා බෑනේ.. රුපියල් දෙසීයක් දෙන්න.'

'කමක් නෑ යන්.'

චායා ත්‍රී විලරයට ගොඩවී එහි අසුනට හේත්තු වූයේ බරවූ හදවතිනි. ඇයට අසංකාගේ වචන තවමත් ඇසෙන්නාක් බඳුය. මෙච්චර වැඩ තියෙද්දීත් මං නිවාඩු ඉල්ලපු එක හරි නෑ.. ඇය සිතුවේ කණගාටුවෙනි.

සාප්පුවේ සේවක සේවිකාවන්ට උදෑසන තේ හදද්දී නිලංකා කාර්යාල කාමරයේ දොර බාගෙට ඇර අසංකා දෙස බැලුවාය. දත් නම් ටිකක් මූණ පාට වැටිලා.. කෙල්ලට මොනවා කිව්වද දන්නෑ.. නිලංකා සිතුවාය.

'සර් තේකක් එවන්නද..'

නිලංකා ඇසුවේ සාමාන්‍යයෙන් ඔහු උදෑසන තේක නොගන්නා නිසාය. කඩවල් වලින් කන්නට පුරුදු වීම ගැන අනන්ත වතාවක් අසංකාට රණතුංග මහත්මිය දෙස් තහනු නිලංකා අසා ඇත.

'එපා මං පස්සෙ හදගන්නම්..'

ඔහු කීවේය. කාට කියලද.. කියා අසන්නට නිලංකාට සිතුණි. ඇය සිනාසී දොර වසා තම අසුන වෙත ආවාය. චායා තරමක් අමාරුවෙන් පඩිපෙළ නැඟ ඉහළ මාලයට ආවේ ඒත් සමඟමය. චායාව දුටුවනම නිලංකා අමුතුම ලතාවකට සිනාසුනාය. චායා ඒ හිනාව හඳුනාගත නොහැකිව නිලංකා දෙස බලා උන්නාය.

WWW.EXPRESSLANKA.TK 131

'ඇයි නිලංකා හිනාවුනේ..'

වායා අසරණව ඇසුවාය.

'න්.. නෑ.. දැන් එන්නෑ කිව්ව නේද.. ඔය ආවේ යස අගේට.. කෝ අසනීප..'

ඇය ඇසූවේ වඩාත් ලෙන්ගතු මෘදු හඬිනී වායා පිළිගැනීමේ කවුන්ටරයට බරවූවාය.

'උදේ ඇත්තටම අමාරු උනා නිලංකා.. මං හිතුවේ නෑ එන්න පුළුවන් වෙයි කියලා. කෝපි දෙකකුයි පැනඩෝල් හතරකුයි බීලා මේ එන්නේ.'

'ඉතින් ඔය ආවේ.. කතා කරලා පැය එකහමාරක් ගෙවුනේ නෑ.. මෙච්චර ඉක්මණට ආවේ කොහොමද..'

'ත්‍රී විලර් එකක.'

වායා කීවේ අවංක හඬිනි.

'එච්චර ඉක්මණට මොකෝ..'

'සර් ඉක්මනට එන්න කිව්වා. දහයයි හතළිස්පහට කළින්..'

'හරියටම තව විනාඩියක් තියෙනවා.. දැන් පායයි ඉතින් මේ පැත්තටම..'

නිලංකා වෙනස්ම ලෙස සිනාසී කීවාය. වායාට ඒ හිනාව රිස්සුවේ නැත.

'ඇයි පායන්නේ...'

'පායන්නේ කළු කරලා තිබ්බ නිසා.'

'කොහෙද.'

'පස්සෙ කතා කරමු.. දැන් ඇතුලට පලයන්..'

වායා තව මොහොතක් එතන රැඳී සිට නිලංකා සිනාසෙමින් බලා ඉඳිද්දීම කාර්යාලයේ දෙරට අත තැබුවාය.

වායා ඇතුල් වන්නට පෙර සිටම අසංකගේ දෙනෙත් දෙර වෙත රැඳී තිබුණි. වායා ඇතුල් වෙද්දීම ඇයට හසුවූයේ ඔහුගේ දෙනෙත්ය. දෙදෙනාගේම දෙනෙත් එකවර හමුවිය. වායා බිම බලාගත්තේ

WWW.EXPRESSLANKA.TK 132

සිනාසීගෙනමය. අසංකට පපුව ඇතුළාන්තයෙන් ඇල්පෙනිති තුඩක් දුවන්නාක් මෙන් දැනුණි. ඔහු බිත්ති ඔරලෝසුව දෙස බැලුවේ චායා ඔහුගේ මේසය වෙත එද්දීම වාගේය. චායාටත් ඉබේටම ඒ දෙස බැලුනි. හරියටම දහයයි හතලිස්පහ ලෙස එහි සටහන්ව තිබුනි. අසංක චායා දෙස බැලුවේත් ඇය සිනාසී බිම බලාගත්තේත් එකම විටය. වෙනද දකිනවාට වඩා අපූර්වත්වයක් විශේෂත්වයක් චායා වෙත අද ඇතැයි අසංකට සිතුණි. ඒ ඇය සාරියක් නොඇඳ ගවුමක් ඇඳගෙන ආ නිසාම නොවේයැයි පසුව ඔහු සිතුවේය.

'සොරි සර්.. මං නිවාඩු ඉල්ලුවට.. මං ටිකක් අමාරුවෙන් උන්නේ.. සමාවෙන්න සර්..'

චායා අවංකව කීවාය.

'මොකක්ද අසනීපේ..'

'ටිකක් උණ වගේ ආවා සර්..'

'දැන් උණ නැද්ද..'

අසංක අහද්දී චායා බිම බලාගෙන සිනාසුනාය. හැමවිටම හිනාවෙවී බිම බලන්නේ බිම පෙරහැරක් යනවාද කියා අසන්නට ඔහුට සිතුණි.

චායා තමා කියූ වෙලාවටම පැමිණීම ගැන ඔහු අවංකව ආඩම්බරයකින් පසුවිය. එහෙත් ඇය ආ අයුරු ඔහුට ප්‍රශ්නයකි.

'මෙච්චර ඉක්මණට කොහොමද ආවේ.'

'ත්‍රී විලර් එකක සර්.. ඉස්කෝලෙ නිවාඩු නිසා පාරේ ට්‍රැෆික් නෑ.. ත්‍රී වීල් එක හයියෙන් ආවා.. අද මැඩම් නැද්ද සර්..'

'මැඩම්ටත් සනීප නෑ..'

'ඇයි ඒ..'

චායා බියපත්ව ඇසුවාය.

'නෑ එහෙම ලොකු අසනීපයක් නෙවේ.. අද ඇඟට තෙහෙට්ටුයි කියලා නතර උනා.. හවස ඒවි.'

'හදිසි වැඩක් තියෙනවද සර්..'

ඇය ඇසුවේ හදිස්සියේම එන්නට කියූ නිසාය. අමාරුවක්

WWW.EXPRESSLANKA.TK 133

නොබලා උදේම ඒ වැඩේ ඉවර කළයුතු යැයි චායා එද්දීම සිතාගත්තාය.

'ම්.. නෑ.. රත්තරු ගාමන්ට් එකෙන් ආවා බඩු දන්න.. මං හරවලා යැව්වා.'

'ඇයි සර්.. එයාලගේ බඩු ඉවරනේ...'

'මට කම්මැලි හිතුනා චායා..'

ඔහු සිනාසී කීවේය. කිසිවක් කරන්නට තරම් හිතක් උදේ නොතිබූ බව චායාට කියන්නට තරම් අසංක විවෘත නොවීය.

'චායා මට තේකක් හදලා දෙනවද..'

අසංක කීවේ චායා එන්නට හැරෙද්දීය.

'ඇයි සර් අද විහාරයට ගියේ නැද්ද..'

ඇය සිනාසී ඇසුවාය.

'නෑ..'

එය කියද්දී අසංකගේ මුහුණේ ඇතිවන හැඟීම් බලන්නට චායා රැඳුනේ නැත. ඇය කුඩා කබඩ් එක උඩ තබා තිබූ අසංකගේ තේ කෝප්පයත් රැගෙන එළියට ආවාය. තිලංකා බලාඋන්නේ චායාගේ මුහුණ දෙසමය.

'මොකෝ වෙලා තියෙන්නේ.. ආව වෙලාවේ ඉඳලා මගේ මූණ දිහා බල බල හිනාවෙනවා.. ඇයි අද පවුඩර් වැඩිද..'

චායා තිලංකාට සමීපව ඇසුවාය.

'අනේ නෑ.. පවුඩර් ගාණට තියෙනවා.. මට බය ඔහොම යනකොට පවුඩරුත් වැඩිවෙයිද කියලා.'

තිලංකාගේ කතාව චායාට තේරුම් ගත නොහැක.

'උදේ හොල්මනක් දැකලද කොහෙද.. පිස්සු කියවනවා..'

චායා පිරිසි කෝප්පයේ දරය ඇඟිලි තුඩින් පිරිමැද කීවාය.

'මොනවද කරන්න යන්නේ.'

'සර්ට තේකක් හදන්න.. පුදුමයි උදේට තේ බොනවා.'

චායා දෙනෙත් ලොකු කර කීවාය.

'ඒකනේ.. උදේ කන්න ගියෙත් නෑ.. ඔයා එන්න විනාඩියකට

WWW.EXPRESSLANKA.TK 134

කළින් ස්ටාෆ් එකට සමරසිංහ තේ හදද්දි මම ඇහුවා තේකක් එවන්නද කියලා. එපා කිව්වේ.. ඔයා ආපු ගමන් තේ ඕන උනා.'

නිලංකාගේ කතාවට චායා ඇයදෙස බලාඋන්නා පමණි.

'සර්රුත් ඔයාගෙන්ම තේකක් බොන්න බලං ඉන්න ඇති.. පලයන්.. ඉක්මනට හදලා දීපන්.. බඩගින්නෙන්නේ ඉන්නේ..'

නිලංකා කම්බුලට අතක් තබා හිස ඇලකර මිමිණුවාය.

'ඔන්න කිව්වා කතාවක්.'

චායා කීවේ ඇගේ උරහිස සොනිත්තමිනි. ඇය කුඩා කාමරයේ මේසය මත තිබූ කෝප්පයට වතුර දමා හීටරයද ගසා බිත්තියට බරවූවාය. උදේ අමුත්තක් දැනුනේ ගතට පමණි. දැන් හිතටද අමුත්තක් දැනෙනැයි චායාට සිතුණි.

නිලංකා දුරකථනය ළඟින් මඳක් මෑත්වී තේ හදනා කාමරය දෙරකඩ වෙත පැමිණ පැද්දෙන වීදුරු දොරට බරවූවාය.

'දැන් අමාරු නැද්ද..'

නිලංකා ඇසුවේ කරුණාබරවය. යුවතියක් ඒ දිනවලදී විඳින වේදනාව අපහසුතාවය දන්නේ තවත් එවැනිම යුවතියක් පමණි.

'අද වෙනදටත් වඩා අමාරු උනා.. ඇයි දන්නෑ.. උදේ කලන්තේ වගේ.'

'ඕවා බැන්දට පස්සෙ හරියනවා.'

චායා නිලංකාගේ කතාව අසා උන්නේ පුදුමයෙනි.

'ඒ කොහොමද..'

'මාත් දන්නෑ.. දවසක් මාත් අමාරුවෙලා ඉන්නකොට ලොකු අක්කා කිව්වේ..'

'එහෙනම් ඉක්මණට බඳින්න ඕන. ඒතරම් අමාරුවක් තිබ්බුනේ..'

චායා කීවේ සිනාසීය. නිලංකා හිස වැනුවාය. ඒද තොල් පට තදකරගෙනය.

'අම්මට කියන්න කේන්දරේ චුට්ටක් බලවන්න කියලා.'

'ඒ මොකටද..'

WWW.EXPRESSLANKA.TK 135

චායා තෙත් ලොකු කර ඇසුවාය.

'නෑ. කවුද දන්නේ සිකුරා කියන්නෙම නැතුව ඇවිත් කැරකෙනවද කියලා.'

'එයාට දන්නමම මං ළඟට එන්න ටිකට් නෑ..'

චායා උණුවූ වතුර තේ කොළ දැමූ කෝප්පයට වත්කර කීවාය.

'සිකුරා එන්නේ අපි කියන වෙලාවට නෙවේ.. එයාට ඕන වෙලාවට.. එයාට ටිකට් ඕන නෑ.. ඕන වෙලාවක ඕන තැනක. මෙතනදි මේ වෙලාවට හරි එන්න මැන්ට පාය් තියෙනවා.'

නිලංකාගේ කතාව ගණනකට නොගෙන මෙන් චායා තේ හැදුවාය. චායාව මාතෘකාවකට ඇදගෙන ඒම පහසු නැතැයි නිලංකාට සිතුනි.

'ඔයාටත් තේකක් හදලා දෙන්නද.'

'හදලා දුන්නොත් බොනවා. හරි ආයාවෙන් හදපු නිසා රහත් ඇතිනේ..'

'මොකද අමුතු ආසාවක්..'

'ටුට්ටක් දෙන්න.. තේ බිව්වේ දැන්..'

'එහෙනම් ඕන නැහැ.'

'අනේ දෙන්න.. ඒක නෙවේ උදේ රත්තරු ගාමන්ට් එකෙන් ආවා බඩු දන්න. සර් හරවලා ඇරියා..'

'මට සර් කිව්වා. සර්ට කම්මැලි හිතුනලු..'

නිලංකා අඩි තුන හතරක් පියමැන මේසය මතට ඇගේ කෝප්පය තැබුවාය.

'අපේ සර්ට කම්මැලි හිතුනේ පස්සේ.. මුලින්ම පාළු හිතුනේ..'

'ඇයි ඒ.. මැඩමුත් නැතේ නේද..'

'මැඩම් නැති උනාට පාළු නෑ.. සර්ට ආසයි..'

'එහෙනම් පාළුයි කිව්වේ..'

'පාළුයි කිව්වේ පාළුව තනිකම සාංකාව මුණෙන් පෙනුන

WWW.EXPRESSLANKA.TK 136

තියා.'

චායා කිසිවක් නොපවසාම එක තේකක් තිලංකාටදී අසංකගේ තේ කෝප්පයද ගෙන එළියට ආවාය. අසංක චායාදෙස බැලුවේ ඇයට අපහසුතාවයක් නොදැනෙන ලෙස හොරැහිනි. ඒත් ඔහුගේ බැල්ම කැරකෙන ඇගේ දෙනෙත් වලට නිතර හසුවෙයි. චායාගේ දෙනෙත් ඒ මොහොතට බිමට බරවෙන්නේ මෘදු සිනාවක්ද සමගිනි.

උදේ චායා නොමැති පැය කිහිපයේ සිතට දැනුන හිස් බවත් දැන් දැනෙන පිරුන බවත් අතර ඇත්තේ මොනතරම් වෙනසක්දැයි අසංක සිතුවේය. අවශ්‍ය තාවයත් කිහිපයකටම එළියට යන්නට ඔහුට තිබුනද කාමරයෙන් මොහොතකට හෝ එළියට යන්නට අසංකට සිතක් තිබුනේ නැත. ඔහුගේ දෙනෙත් විනාඩියකට තුන් හතර වතාවක් චායාවෙත යොමුවිය. ඇතැම් විටක චායා වැඩ කරන්නේ මේසයට හිස ඔබාගෙනමය. ඒ මොහොතට ඇගේ කෙටි කොණ්ඩයෙන් මුහුණම වැසීයයි. අසංකට දුක හිතෙන්නේ ඒ වෙලාවටය. අසුනෙන් නැගිට ගොස් ඒ කොණ්ඩ ගස් ටික පසුපසට දමන්නට ඔහුට සිත්වෙයි. නොවේනම් තමාගේ මේසය මත ඇති රබර් පටියක් ඇයට දී කොණ්ඩය බැඳ ගන්න යැයි කියන්නට අසංකට සිතෙයි.

චායා සමඟ තව මොනවා මොනවා හෝ කතා කළයුතු යැයි සිත කීවද ඒ කුමක්දැයි කියන්නට තරම් හදවත කාරුණිකවූයේ නැත. ඒනිසා අසංකගේ සිත තිබූනේ දිගින් දිගටම බරකිනි. ඔහු විවිධ හේතු බලෙන්ම මවාගෙන චායාව දෙතුන් වරක්ම ඔහුගේ මේසය වෙත කැඳවා ගත්තාය. ඒ හැමවාරයකම ඔහුගේ සිත ගුරුතුමියක් ළඟට එනකුඩා දරුවෙකුගේ සිතක් තරමට බාලවිය.

'චායා ආයිත් නිවාඩු ගන්න ඉන්නේ කවදද..'

ගෙනා ඇඳුම් සාම්පලයක් පැයක් පමණ පරීක්ෂා කර අමාරුවෙන් වරදක් සොයා එය චායාට පෙන්වා ඔහු ඇසුවේය.

'අනේ නෑ සර්.. නිවාඩු ගන්නේ නෑ..'

චායා අසංක දුන් ඇඳුම් පාර්සලය අතට ගනිමින් කීවාය.

'අද වගේ අසනීප උනොත්..'

'ඒත් එනවා සර්..'

WWW.EXPRESSLANKA.TK 137

"එහෙම එපා.. අසනීප උනොත් එන්නෙපා. සනීපවෙලා එන්න."

අසංකගේ හඬ තුළ වූයේ කුළුණුබර බවකි. ඒ හඬ ඇත්තටම චායාගේ පපුව අළුතින් තෙත් කරන්නට සමත් විය.

"උදේ මං එද්දි ඔෆිස් එකම පාළුයි.."

ඔහු දිග කතාවක් කියන්නට මෙන් පටන් ගත්තේය. චායාට නිලංකා කිවුදේ සිහිවිය. තවත් කුමක්දේ කියන්නට යද්දී දුරකථනය නාදවිය.

"සර් හර්ෂණී මිස්ගෙන් කෝල් එකක්."

නිලංකා කියද්දී අසංකගේ පපුව කඩා වැටුණි. අමාරුවෙන් හදගත් යොදුරු නිමේෂය බොඳවීම පිළිබඳව ඔහු ඇත්තටම දුක්විය.

"අසංකයියා.. හැන්දෑව ෆ්‍රී තියාගන්න හොඳේ..."

හර්ෂණීගෙ හඬ අසංක තුළ ඇතිකළේ නොසතුටකි. චායා කාමරයෙන් ඉවත්වෙද්දී ඒ හැඟීම දෙගුණ තෙගුණ විය.

"මං ඊවිනින්ග් වැඩක් බබා."

"කැන්සල් කරන්න වැඩක් නම්.. අපේ ගෙදර අද ඔයත් එන්න ඕනා.."

අසංකගේ සිතට දැනුන බර වැඩිවිය. ඔහු සිතාගෙන උන්නේ තාලකක් ඇදගෙන හැන්දෑවේ නිස්කලංක තැනකට ගොස් බියර් එකක් බොන්නටය. හිතේ ඇති රසබර බවට ගැළපෙනම මිතුරා ඔහුය.

"ඇයි විශේෂයක්ද.."

"අපේ ගෙදර එන්න විශේෂයක් වෙන්න ඕනද.. මගේ යාළුවෝ කට්ටියක් එනවා.."

"අනේ බබා.. එහෙනම් බෑ.. මං වෙන දවසක එන්නම්.."

"බෑ.. බෑ..බෑ.. මට ඔයාව එයාලට මීට් කරවන්න ඕනා."

"ඕක ලෙඩක්.. මං එන්න ඕනම නෑනේ."

"මොකද ඔයාට වෙලා තියෙන්නේ.. තාත්තිත් බලං ඉන්නේ ඔයා එනකල්.. බෑනව දැක්කෙ නැහැයි කිය කිය උන්නේ ගොඩක් දවසකින්.."

"මං වේලාසන ඇවිත් යන්නම්."

"එන්නකෝ. මං නේ ඔයාව තියාගත්තේ.. ලස්සනට ඇඳලා එන්න හොඳේ.. මොඩ් පාටට..."

අසංකගේ සිතට ආවේ නොරිස්සුමකි.

"ඇයි මං වෙනදට අඳින්නේ කැතටද.."

"හරි.. හරි.. ඔයා දිනුම්.. එනව නේද.."

"පොඩ්ඩ වෙලාවකට ඇවිත් යන්නම්. ඉන්න බෑ."

"හරි යන්න තමයි.. කෝ ඇන්ටි.."

"අද ගෙදර.. අම්මට ටිකක් සනීප නෑ."

අසංක එසේ කියූ පසු හර්ෂණී මද වේලාවක් නිහඬ වූවාය.

"මං තියනවා බායි.."

අසංක දුරකථනය තැබුවේ බරවූ හදවතිනි. තමාගේ ජීවිතය මෙසේ පෙර සැකසුම් දෛවයකට හසුව තිබීම ගැන ඔහු ප්‍රථම වරට දුක්වූවේය.

"සර් ඕ.ටී ෆෝම් ටික මැඩම් කොහේ හරි තියලා ඇති.. මං ගෙදරට කතා කරලා මැඩම්ගෙන් අහන්නද.."

චායා අසංක හිස බර කරගෙන සිටිද්දී පැමිණ ඇසුවාය.

"අහන්න."

ඇය නිලංකා වෙත ගියේ ආශාවෙනි. ඒ ඒත් සමගම රණතුංග මහත්මියගේ අසනීප තත්වය අසන්නටද ලැබීම නිසාය.

මැඩම්ට ගෙදරට කෝල් එකක් අරන් දෙන්න නිලංකා..

චායා කීවේ දුරකථනය ළඟවූ පුටුවට මහන්සියෙන් බරවෙනා ගමන්ය.

"ඉතින් ඔයා ගන්නකෝ.. මම වැඩක්.."

"මං නම්බර් එක දන්නෑ.."

"එයිට් ෆයිව් සික්ස් ත්‍රී සෙවන් ඕක ලියලා ළඟ තියාගන්න. ඔයාට අනාගතේ ඕක ඕනවෙයි."

නිලංකා නැවත කීවේ පුරුදු මනමාල සිනාවද සමගිනි. චායා

WWW.EXPRESSLANKA.TK 139

එය ගණනකට නොගෙන අංකය එබූවාය.

'මැඩම්. මං වායා..'

'ඇයි රත්තරන්.. මට ගෙදරට වෙලා සැනසිල්ලේ ඉන්න දෙන්නැද්ද..'

ඇය කීවේ විහිළුවට මෙන් කරුණාවෙනි.

'මැඩම්ට දැන් සනීපද මැඩම්..'

'අසනීපයක් තිබුන්නෑ වායා.. මේ ළඟකදී ඉඳලා උදේට ඇඟපත රිදෙනවා.. පස්සෙ හිතුනා නවතිනවා කියලා. දස මහා යෝධයා වගේ පුතෙක් හදලා මං මොකටද එක අතකට මහන්සි වෙන්නේ. එයත් ඕවා පුරුදු වෙන්න ඕනා.'

'මැඩම් නැතුව ඔෆිස් එකම පාළුයි..'

වායා අවංක හඬකින් කීවාය.

'එහෙම බෑ.. මම හෙට අනිද්දම මේවලින් අයින් වෙනවා. සර් එක්ක මේ වැඩ කරන්න වෙනවා.'

'ඔය කිව්වට මැඩම් එනවා.'

'ඒක ඇත්ත.. එක දවසක් ගෙදර ඉඳලා මට පිස්සු වගේ..'

'මැඩම් ඕ.ටී. ෆෝම් ටික කොහෙද කියලා අහන්නත් එක්ක කතාකළේ..'

'මං හිතුවා මට ආදරේට දුක සැප බලන්න කතාකළා කියලා.'

ඇය කීවේ මහ හඬින් සිනාසීය.

'මැඩම් එහෙම හිතන්නෙපා.. මං උදේ ඉඳලා සර්ගෙන් අහන්න උන්නේ මැඩම්ට කතාකරන්න.'

'මං විහිළුවට වායා කිව්වේ.. මෙටල් කබඩ් එකේ උඩම තට්ටුවේ ඇති.'.

'මං එහෙනම් තියන්නම් මැඩම්.. බුදුසරණයි..'

වායාගේ වචන මොහොතකට රණතුංග මහත්මියගේ පපුව උණුකරවීය.

'අනේ.. ඔයාටත් බුදු සරණයි..'

WWW.EXPRESSLANKA.TK 140

වායා දුරකතනය තබා තිලංකා දෙස බැලුවාය.

'දවල්ට කන්නැ..'

'හානේ.. මං කෑම ගෙනාවෙත් නෑ.. දනුයි මතක් උනේ.'

'සර් උදේට කෑවෙත් නෑ කිව්ව නේද..'

වායා අසද්දී තිලංකා ඒ දෙනෙත් දෙස මෘදු බැල්මක් හෙළුවාය.

'අද බඩගිනි නැතුව ඇති.. නැත්නම් මෙලහකට ගිහිල්ලා..'

'මම මතක් කරන්නම්..'

වායා ගියේ හිස ඇලකර තිලංකා හා සිනාසෙමිනි. මොනවා මොනවා හෝ සිදු නොවුනහොත් ඒක ලොකුම පුදුමයක් යැයි තිලංකාට වායාදෙස බලා ඉදිද්දී සිතුණි.

# 16

අසංක රාත්‍රියේ හර්ෂණීගේ නිවසට යාමට සැරසුනේ කැමැත්තකින් නොවේ. ඔහුට ඕනා වූයේ ඊට වඩා හැඟීම්බර සැන්දෑවක් ගත කරන්නටය. බියර් බෝතල් තුන හතරක් වාහනයේ දමාගෙන නාලකවත් ඇදගෙන පාර්ලිමේන්තු උද්‍යානයේ නිස්කලංක තැනකට වී මේ හැන්දෑව ගතකරන්නට ඇත්නම් යැයි ඔහු සිතුවේය. හදවත තුල බුබුළු ලන ආගන්තුක හැඟීම් ආශාවෙන් විදීම තරම් සොඳුරු වැඩක් තවත් නැත.

එහෙත් හර්ෂණීගේ ආරාධනාවට පිටුපාන්නට තරම් ශක්තියක් අසංකට නොවීය. ඔහු ඇඟ සෝදගෙන කාමරයට පැමිණත් සෑහෙන වෙලාවක් එහි කල් ඇරියේය. අල්මාරිය අරිද්දීලස්සනට මොඩ් එකට ඇඳගෙන එන්න යැයි හර්ෂණී කියූ කතාව අසංකට ගිහිවිය. ඔහු හිතා මතාම ලේ පැහැගත් බතික් සරමත් සරල සුදු කමිසයකුත් ඇඳ

WWW.EXPRESSLANKA.TK 141

ගත්තේය. ඒ ඇඳුමට තමා ලස්සන යැයි අසංකට සිතුනේ එය ඇන්දපසුය. තමාව දුටුවනම හර්ෂණී මූණ අඳුරු කර ගන්නා බව දැන දැනම අසංක එය ඇඳගත්තේය.

විලවුන් බිඳක් ගෙලේ තවරා අත් ඔරලෝසුව පමණක් වමතට දමාගෙන අසංක යතුර අතට ගත්තේය.

'ඇයි පුතා දැන් මාමලගේ ගෙදර ඩිනර් එකට යනවා කිව්වා නේද..'

අසංක සරමකින් සහ සාමාන්‍ය කමිසයකින් සැරසී පහළට එද්දී රණතුංග මහත්මිය ඇසුවාය.

'මේ එහේ තමයි අම්මේ යන්නේ.'

ඔහු සිනාසී කීවේය.

'ඔහොම..'

'ඔව් ඇයි.. ලස්සන නැද්ද.'

'අපෝ නෑ. හරි ලස්සනයි. මං ආසම නෑ ඔයා ඔය ඩෙනිම් කලිසම් කෑලි ඇඳන් ඉන්නවට. ඒත් මට පුදුමයි ඔයා ගැන..'

රණතුංග මහත්මිය අමුතුම ලෙස සිනාසී පුතුදෙස බැලුවාය. උය මහත්වූ පසු පිරිමි දරුවන්ගේ හැඟීම් පුදුමාකාර ලෙස වෙනස් වේ.

'ඇයි..'

'මංද.. අර කෙල්ල දැන් ඔයාට බනී.. ඒකි කැමති නෑ ගොඩයන්ට..'

'සරම ඇන්දහම ගොඩයා වෙනවද.. ජේ.ආර් ජයවර්ධන ගොඩයෙක්ද.. විජය කුමාරතුංග ගොඩයෙක්ද.. අර්ජුන රණතුංග ගොඩයෙක්ද.. එයාලා ඔක්කොම වැදගත් තැන්වලට ඇන්දේ සරම.'

'ඒකත් ඇත්ත. අත වන වනා යන්නැතුව මොනාහරි අරගෙන යන්න.'

අසංක ගීතයක පද මුමුණමින් යද්දී රණතුංග මහත්මිය ඔහුදෙසම බලාඋන්නාය. ඔහු වෙත වෙනද නැති මොකක්දෝ එළියක් අද ඇතිබව ඇයට සිතුණි.

WWW.EXPRESSLANKA.TK 142

කිරුළපන උද්‍යාන මාවතට වාහනය හරවද්දී අසංක සිතුවේ හර්ෂණී ගැනය. සෑහෙන වේලාවක් සිතුවද ඔහුගේ සිතට හැඟීමක් දැනුනේ නැත. ඇය තම අනාගතයේ නියතයක් පමණක් යැයි ඔහු පසුව සිතුවේය. ඔහු නිවස ඉදිරිපිට වාහනය නවත්වද්දී තවත් වාහන දෙකක් පමණ පැමිණ තිබුනි. වෙනද නැති අපහසුතාවයකින් ඔහු වාහනයෙන් බැස්සේය.

ගෙට ඇතුළු වන්නටත් පෙර හර්ෂණී දොරකඩට ආවාය. කොටි සායක් හා අලුත්ම විලාසිතා රැල්ලේ ඇඟටම හිරවූ කුඩා ටී ෂර්ට් එකක් ඇඳගෙන උන් හර්ෂණී දෙස අසංක බැලුවේ ඇස් පුංචි කරගෙනය. අසංකව දුටුවනම හර්ෂණීගේ මුහුණ වෙනස්විය. ඇය මොනවද කියන්නට කට හැදුවද ඒ වනවිට ඔහු ළඟටම පැමිණියේය.

'ඔන්න මං ආවා..'

ඔහු සිනාසී කීවේය.

'ඔහොම ආවට වඩා හොඳයි නැවිත්ම හිටියනම්.. යන්..'

අසංක ඒ වචන බලාපොරොත්තු වූ නිසාදෝ ඔහුගේ සිතට බරක් නොදැනුණි. විශාල සාලයේ කොනක වූ සැටිය වෙත අසංක හර්ෂණී පිටුපස ඇවිදගෙන ගයේය. අසංක ඇවිදිද්දී ඔහුගේ සිල්ක් සරම දෙපාවල දැවටීම නිසා නැගෙන සිලිස් සිලිස් හඬ හර්ෂණීගේ සිතේ ඇතිකළේ අමනාපයකි. ඇය තම මිතුරියන් තිදෙනා දෙස බැලුවේ තරමක වකිතයකිනි.

'පරක්කු නිසා ගෙදර උන්න හැටියෙන්ම ඇවිත්..'

හර්ෂණී මිතුරියන්ට එසේ කියද්දී ඔහු යටි සිතින් සිනාසුනේය. තමා සරමක් ඇඳගෙන ආ එක ඇයට ලැජ්ජය. අරම කීවේ මිතුරියන්ගෙන් එය වසාගන්නටය. යමක් වැසීම එය මතු කිරීමකැයි ඇය දන්නේ නැත.

'මේ අංජලි.. මේ නිශාදි.. මෙයා රසිකා.. රසිකාව නම් ඔයාට හම්බවෙලා තියෙනවනේ නේද.. මේ අසංක. කලම්බු ෆැෂන් කම්ප්ලෙක්ස් එකේ එම්.ඩී..'

එය කියද්දී හර්ෂණීගේ මූහුණේ මතුවෙන හැඟීම් අසංක බලාඋන්නේය. අසංක ඒ හැඟීම් මැඩගෙන යුවතියන් හා සිනාසුනේය.

WWW.EXPRESSLANKA.TK 143

ඔවුන් අසංක දෙස බැලුවේ අමුතුම ආකාරයකටය. ඔවුන් බලාපොරොත්තු වූ අසංක නොපැමිණීම ගැන ඔවුන්යමක් හිතනවා විය යුතුයැයි අසංක සිතුවේය.

'මං කලම්බු ෆැෂන් එක ඔයාලගේ කිව්වාම තිශාදි පොඩි චෝදනාවක් කළා අසංකයියා.. මටත් හිතුනා ඒක හරි කියලා.'

අසංක සමීපයෙන්ම හර්ෂණී ඉඳගෙන කීවාය.

'ඒ මොකක්ද.'

අසංක ඉදිරියේ යුවතියන් කතා කිරීමට මැලිවිය.

'මොකක්ද තිශාදි... ඔයා කියන්න.'

'නෑ.. ඔයාලගේ ෂෝ රූම් එකට අපි තුන් හතර වතාවක් ගිහිල්ලා තියෙනවා. ඒකෙ මේ.. ෆැෂන්ස් ගොඩාක් ඒවා හරි චීප්.. රිචි මදි.. කොල්ලුපිටිවල අනික් ෂෝ රූම්ස් වල ඊට වඩා අලුත් පැටර්න්ස් තියෙනවා.'

අසංක යටිතොල සපාගෙන මොහොතක් ඇය දෙස බලාඋන්නේය. ඔහු ඔහුගේ ව්‍යාපාරයට ඇත්තටම ආදරය කළේය. එයට ගරහනවාට ඔහු කැමති වූයේ නැත. විලාසිතා තෝරන්නේ අත්දැකීම් අනුවය. මෙතෙක් එය වැරදී නැත.

'මම හරි නේද..'

අසංක කල්පනා කරද්දී ඇය ඇසුවාය.

'ඔයා කිව්ව එක ගැන නම් හරි සතුටුයි. අපි නිතරම කන්සියුමර්ස්ලගේ යෝජනා චෝදනා පිළිගන්නවා. හැබැයි එකක්. අපි සාප්පුවට ෆැෂන් දන්නේ ඇඳුම් අතගාලා ප්‍රිටෝන් කරලා.. මිරිකලා එකක් වත් නොගෙන දලා යන කොළඹ පිස්සු කෙල්ලන්ට නම් නෙමේ.. හොඳට ඇඳුම් ගන්න අයට.. එයාලා ඉල්ලන ෆැෂන්ස් තමයි දන්නේ.'

අසංක කෝන්ති නොගෙන බොහෝසේ පරිස්සමෙන් කීවේය. එයට යටිතොල හපාගත්තේ හර්ෂණීය. ඇය පුටුව ඇන්ද මත ඇති අතින් තම මිතුරියන්ට නොපෙනෙන්නට අසංකගේ පිට කෙනිත්තුවාය.

'අපි ගිය සතියේ එහේ ගියා. අලුත් පැටර්න් මොනවත් තිබුණේ නෑ..'

ඇය පරාජය පිළිගන්නට කැමති නැතැයි අසංකට සිතුනි.

'මොනවද අලුත් පැටර්න්..'

'මාකට් එකට ඇවිල්ලා තියෙනවා අර සිල්වර් ස්ප්‍රේ රෙද්දෙන් මහපු පාටි ඩ්‍රෙස් එක.. ඔයාලගේ එහේ නෑ..'

අසංකා අත වූ යතුර කරකවා ඇයදෙස බැලුවේය. ඔහු සිනාසුනේ වඩාත් සුහද හා කපටි ලෙසය.

'ඔයා දන්නවද ඒ පාටි ඩ්‍රෙස් එකක් කීයද කියලා.'

'මහ්.. දන්නෑ..'

ඇය දෙළුර සොලවා කීවාය.

'අඩුම ගානේ තුන්දස් හත්සිය පනහයි. එතන ඉඳලා හත්දස් හයසීය වෙනකල් තියෙනවා.'

'වෙන්න ඇති.'

ඇය කීවේ ගණනකට නොගෙනය.

'ඒ ගාන ගෙවලා ඒ පාටි ඩ්‍රෙස් එක ගන්න පුළුවන් මොන කෙල්ලටද.. අද කාලේ කෙල්ලෙක්ගේ පඩියම හාරපන්දහයි.. එහෙම වෙද්දි තුන් හාර දහක් දීලා ගවුමක් ගත්තාම ඒ කෙල්ල ඒ මාසේ ජීවත්වෙන්නේ කොහොමද.. ඒ ප්‍රශ්නෙ එක පැත්තක් විතරයි. ඒ වගේ ගවුමක් ඇඳලා ඒ කෙල්ල කොහේ යන්නද.. බෝයි ෆ්‍රෙන්ඩ් එක්ක ෆිල්ම් එකක් බලන්න යන්නද.. එතනයි ප්‍රශ්නේ..'

අසංකගේ තර්කයෙන් ප්‍රවනියත් පසුබැවාය.

'ඒ වුනාට අසංකයියා ඒ ගාණගෙවලා පාටිඩ්‍රෙස් එකක් ගන්න පුළුවන් ගර්ල්ස්ලත් ඉන්නවා. එයාලට ඒවා ඇඳගෙන යන්න තැනුත් තියෙනවා.. නේද..'

හර්ෂණී කීවේ මිතුරියන් බේරා ගනිමිනි. අසංක සිනාසුනේ සන්සුන්ව තරහක් නොගෙනය.

WWW.EXPRESSLANKA.TK 145

"පුළුවන්.. එහෙම අයත් ඉන්නවා තමයි. ඔයාට පුළුවන්.. මාමා හොඳට හම්බ කරලනේ තියෙන්නේ.. ඔය තුන් දෙනාටත් පුළුවන් ඇති. ඒත් ඔයාලා හතර දෙනාට නෙමෙයිනේ අපි බිස්නස් කරන්නේ.. ඒ වගේ ගවුමක් එක්ක සාමාන්‍ය ගවුමක් දැම්මාම අපි ළඟට එන ගෑණු ළමයි ඒ ගවුම අතගාලා ගාන බලලා හූල්ලලා ඒවා ගන්න බෑ කියලා ලාබ එකක් අරගෙන යනවා. ළමයාගේ හිතට හරි අප්සෙට්.. ඇයි එතන තිබ්බ හොඳම එක එයාට ගන්න බැරිඋනානේ.. එයා කම්ප්ලීට්ලි සැටිස්ෆයි කස්ටමර් කෙනෙක් විදිහට නෙමෙයි සාප්පුවෙන් එළියට යන්නේ. එයාට හරි දුකයි. හොඳ එක අතගාලා බාල එකක් අරන් යනවා කියලා ඒ ළමයා හිතන්නේ. එහෙම උනොත් යනකෙනා ආයි අපි ළඟට එන්නෑ. අපි එයාට පෙන්නන්න ඕනා මෙතන තියෙන හොඳම ලස්සනම අලුත්ම ඇඳුමත් ඔයාට ගන්න පුළුවන්.. ඒක ලාබයි.. අරගෙන යන්න කියලා. එයා ඒක ගන්නවා. අරගෙන යන්නේ හරි හිතේ සතුටෙන්. ඊළඟ පඩිදටත් එයා එන්නෙ අපි ළඟට.. මොකද අර සතුට එයාගෙ පපුවෙ වැඩ කරනවා. බිස්නස් කරද්දි බූරියානි පෙන්නලා පාන් වාට් කපලා කස්ටමර්ස්ලට කෝච්චොක් දන්න බෑ නංගි.. එයා තමයි අපේ දෙවියා. එයාව සතුටු කළොත් විතරයි අපි රැකෙන්නේ. තේරුණාද. ඒකයි අර අලුත්ම පැටර්න් එකේ පාටි ඩ්‍රෙස් අපි දම්මේ නැත්තේ. ඔයාලට ඕනනම් කියන්න මං චීස්කවුන්ට් පිට අරගෙන දෙන්නම්. ඒවා බැංකොක් වලින් ගෙන්නන්නේ මගේ යාළුවෙක්. කොස්ට් එකට මං අරගෙන දෙන්නම්."

අසංක කියාගෙන කියාගෙන ගොස් දිග සුසුමක් ඉහළට ගත්තේය. යුවතියන් හතර දෙනා මුහුණට මුහුණ බලාගත්තෝය. තමා වැරදි මිනිහට කට්ටුව දික්කළ බව ඔවුන්ගේ මුහුණිංත්ම පෙනුනි.

"අහගත්තද.. පුතා උත්තර නොදැන්නා නම් මං දෙන්නෙත් ඔය

WWW.EXPRESSLANKA.TK 146

උන්නරේමයි.. ඔයාලා දන්න බිස්නස්..'

පතිරගොඩ මහතා ඔවුන් අතරට එමින් කීවේ සිනාසෙමිනි. අසංක තම මාමණ්ඩිය දෙස බලා වඩාත් පුළුල්ලෙස සිනාසුනේය. අසංක ඔහුට ඇත්තටම ප්‍රිය කළේය. කුඩාම කාලයේදී තමාව පාසැලෙන් එක්කරගෙන යන්නට පවා ආවේද ඔහුය. ඔහු ඒ දිනවල අසංකව පාසැලේ ගේට්ටුව ළඟදී ආදරයෙන් හිස අතගා වාහනයට නංවාගෙන ආ සැටි ඔහුට මතකය.

'මෙහෙම කොල්ලෙක් මගේ බෑනා වෙන්න යන එක ගැන මට හරි සතුටුයි. පුළුවන් නම් ඔය ළමයිත් මේ වගේ කෙනෙක් හොයාගන්න.'

ඔහු කීවේ හර්ෂණීගේ මිතුරියන් දෙස බලාය. හර්ෂණී හිස ඇල කර බලන්න හැටි.. වැනි බැල්මක් මිතුරියන් වෙත හෙළුවාය. ඇය උන්නේ පරාජයේ අඳුරු හෙවනැලි මුහුණ මත තබාගෙනය.

'පුතා අද විජය කුමාරතුංග වගේ. ෂහ්.. හරි ලස්සනයි. හැමදාම මේ කිට් එක අඳින්නකෝ..'

මාමා කියද්දී අසංක දෙකොල්පට තදකරගෙන හර්ෂණී දෙස බැලුවේය. ඇය ඉවත බලාගත්තාය.

'මාත් හිතුවේ එහෙම අඳින්න තමා මාමේ.. අම්මත් කිව්වා ලස්සනයි කියලා.'

අසංක හර්ෂණීගේ හිත සිනාමතා රිදවන්නට සිතා කීවේය.

'කෝ අම්මා.'

අසංක තවත් ටික වේලාවක් කතා කර කර ඉඳ හර්ෂණීගෙන් ඇසුවේය.

'අම්මා කුස්සියේ.. යන්.. අපි විනාඩියෙන් එන්නම්.. ඔයාලා නව ස්නැක් එකක් ගන්න.'

එයේ කියා හර්ෂණී අසංකත් සමඟ ආවාය. මඟදී ඇය ඔහුගේ අතක් අල්ලා ගත්තාය.

'මොනාද අසංකයියා අර කරපු වැඩේ.. එයාලත් මොනවා

WWW.EXPRESSLANKA.TK 147

හිතන්න ඇත්ද.'

ඇය කීවේ නොරිස්සුමෙනි.

'ඔයා කියන්නේ ඔයාලගේ යාළුවෝ තුන්දෙනාට අපේ බිස්නස් එක බාල්දු කරල දන්න කියලාද. මං කිව්වේ ඇත්ත. ඒ පාටි ඩ්‍රෙස් එකක් ගන්න මෙයාලටවත් වත්කමක් නැතුව ඇති.'

'ඔයා හිතුවද මේ හිගන කෙල්ලෝ කියලා. හොඳට සල්ලි තියෙනවා.'

'සල්ලි තියෙනවා නම් මෙහේ ෂොප්ස් වල රස්තියාදු ගහන්නෑ. ගියා සිංගප්පූරු. ගත්තා ඇඳුම්.'

'හරි.. හරි.. ඔයා හරි..'

'හරි තමා.. මං හරි කියලා මම විතරක් නෙමේ කියන්නෙ ඔයාගේ තාත්තත් කියනවා.'

'ඒකනේ තාත්තා ඔයාටම මාව බන්දලා දෙන්නේ. මරු මාමයි බැනායි.. ගිහිල්ලා නැන්දවත් අල්ලගන්න.'

හර්ෂණී අසංකගේ අත අතහැර අඩවන් වූ බැල්මක් ඔහුවෙත හෙළුවාය.

'අම්මේ.. මෙන්න මම අමාරුවෙන් ගෙන්න ගත්තා. මෙයාට එන්න දූන් පාරත් අමතක වෙලා.. හොයාගෙන ඇවිත් තියෙන්නේ.'

කුස්සියට ආපසු හර්ෂණී අසංක දෙස බලා කට ඇද කර කීවාය. හර්ෂණීගේ මව අසංක දෙස බැලුවේ කරුණාබර දෙනෙතිනි.

'වැඩ නැත්දේ..'

'මං ගිය සතියේ ආවා එතකොට දූතා ගෙදර උන්නෑ.'

අසංක ඔළුව කසා බිම බලාගත්තේය.

'අද ලස්සන කිට් එකක් ඇඳලා තියෙන්නේ.'

ඇය කියද්දී හර්ෂණී සිනාසුනාය.

'මේක ඇඳගෙන මට ගෙට ගොඩවෙන්නත් එපා කිව්වා. මෙහෙම ආවම මෙයාගෙ යාළුවන්ට මාව අඳුන්නලා දෙන්න ලැජ්ජ

WWW.EXPRESSLANKA.TK 

ඇති..'

'මේ මෝඩීගේ කතා දූතා ගණන් ගන්නෙපා.'

'ඔයා එහෙනම් අම්ම එක්ක කතා කර කර ඉන්න. මං සාලෙට යනවා.'

'ලොකු දෙයක්.'

අසංක හර්ෂණීට නොඇසෙන ලෙස කීවේය. එහෙත් එය ඇයට ඇසුණි. තරමක් දුර ගොස් හර්ෂණී රවා බැලුවාය.

'මම කට්ලට් එකක් කන්නද නැත්දේ.'

උණු උණුවෙන් බැද තිබූ කට්ලට් පිඟාන දැක අසංකට එකක් දෙකක් කන්නට ආශාවක් ඇතිවිය.

'ගන්න පුතේ.. එකට දහයක් ගන්න. ලීලා මහත්තයට අර ප්ලේට් එකකට සෝස් ටිකක් දලා ගේන්න.'

අසංක කට්ලට් එකක් අතින්ගෙන අසල වූ කුඩා කෑම මේසයේ පුටුවකට බරවිය. පතිරගොඩ මහත්මිය තම අනාගත බෑනා දෙය බලා උන්නේ ආශාවෙනි.

'අම්මා දූතා එක්ක මුකුත් ළඟදී කතාකළේ නැද්ද..'

ඇය අසද්දී අසංකගේ සිත නොසන්සුන් විය. ඔහු ඒ ප්‍රශ්නයේදී වෙනදටත් වඩා හිරවිය.

'මේ දවස්වල අම්මටත් හරියට වැඩ නැත්දේ.. සීසන් කිට්ටුනේ..'

'එහෙම කියලා මේ වැඩ ප්‍රමාද කරන්න බෑනේ දූතා.. දැන් ඉතින් පිළිවෙලක් වෙන්න ඕනා.'

කට්ලට් දෙක තුනක් කන්නට ඔහුට තිබූ ආශාව තුරන් වී ගියේ ඉබේටමය. අසංක අත පිසදගෙන කල්පනාවට වැටුනේය. ජීවිතය ගැන නොතේරෙන යුගයකදී මේ තීරණ ගන්නට උදව් වන ලෙස තමා හැසිරුනේ අපරාදේ යැයි ඔහුගේ සිත ඔහුට කීවේය. දැන්හැරෙන්නට කාලයක් අවස්ථාවක් නැත.

'අවුරුද්දෙන් පස්සේ තැකත් බලමු කියලයි අම්මයි මායි කතා උනේ.. මොනවද ඉතින් බැන්ඳ ආවා.. අපේ අලුතින් මොනවා හිතන්නද..

ඔයාලා දෙන්නට මොනවද අඩු.. විනෝදෙන් ඉන්න තියෙන්නේ.. අම්මත් ජීවිත කාලෙම හම්බ කළා. මෙහේ මාමත් ලොරි එක්ක හැප්පි හැප්පි හම්බකළා.. ඒවා ඔක්කොම ඔයාගෙනෙ.'

අසංක කරබාගෙන අසා උන්නේය. ඉක්මණට ගෙදර යන්නට ඇත්නම් යැයි ඔහුට සිතුණි.

'ප්‍රාණ භුක්තිය අරකක් මේකත් තියාගන්නෑ. මාමා අවුරුද්දෙන් පස්සේ ඔක්කොම හර්ෂණීට ලියන්න ඉන්නේ. මාමත් කියන්නේ දූත් හම්බ කළා ඇති කියලා.'

'බිස්නස් නවත්තන්නද මාමා යන්නේ.'

'නෑ.. ඒත් නැහීගෙන කරන්නැලු.. මාමටත් දූත් ලෙඩ පුතා.. කියන්නෑ.'

අසංකට සියළු දේ මොහොතකට අමතක වී මාමා ගැන දුකක් උපන්නේය. ඔහු නොවන්නට අද අම්මාත් තමාත් සෑහෙන පමණකට අසරණවීය.

රෑ කෑමෙන් පසු හර්ෂණීගේ මිතුරියන් ගියහ. ඒ යද්දී දහයත් පසුවී තිබුණි. අසංක ගේට්ටුව ළඟදී ඔරලෝසුව බැලුවේය.

'මේ රෑ මෙහෙම කොල්ලෝ යන්න හොඳද..'

ඔහු අහද්දී හර්ෂණීත් අසංකගේ කැබ් රථයට බරවී ඔහුදෙස බලා සිනාසුනේය.

'දූත් එහෙම තමා..'

'ඔයත්. එහෙමනේ ඉන්දෙ..'

'ඔන්න මා එක්ක ගෝරි පටන් ගන්නා..'

පටු මාවත පාළුය.. ගේට්ටුව ළඟ තිබූ ලා අඳුරේ අසංකත් හර්ෂණීත් තනිවී උන්නාහ.

'අපි කවදද මැරි කරන්නේ..'

හර්ෂණී ඇසුවේ වාහනේ බඳට බරවී අසංකගේ දෙඅතින්ම අල්ලාගෙනය.

'මං නෙමේනේ තීරණය කරන්නේ.'

WWW.EXPRESSLANKA.TK 150

'ඔයා ආස කවදද..'

'එහෙම විශේෂයක් නෑ.'

'මට නම් හෙට උනත් ආසයි..'

අසංක කතාකළේ නැත. ඔහුට සිතන්නට ඕනෑවිය. එහෙත් සිතීම පලක් නැත. මේ ඉන්නේ නම අනාගත බිරිඳ නම් ඇය සෑහෙන්න වෙනස් විය යුතුය. ඇය බිරිඳ ලෙසට තමා පිළිගන්නවා නම් ඇයව වෙනස් කරගත යුතුය. එහෙත් ඒ උදෙසා විශාල කැපකිරීමක් කරන්නට අසංකට පණක් නොතිබිණි.

'මොනවද අනේ කල්පනා කරන්නේ.'

හර්ෂණී මූව තද කරගෙන සිනාසී ඇසුවාය.

'මට ගහන්නද හදන්නේ තනි කරගෙන..'

'අනේ නෑ.. අපිනේ පල්වුනේ..'

'මං යන්නද රෑ වෙනවා.'

අසංක යතුර අතට ගෙන කීවේය. හර්ෂණී ඔහු දෙස බැලුවේ වෙනස්ම බැල්මකිනි.

'මට කිස් එකක්වත් නොදීද යන්න හදන්නේ.'

අසංක වාහනයට පයක් තබා හර්ෂණීගේ කම්මුලක් සිපගත්තේය. හර්ෂණී ඔහුගේ උරහිසක් අල්ලා වඩාත් තදින් ඔහුගේ කම්මුලක් සිපගත්තේය.

'මෙහෙම දීලා මදි..'

ඇය මූණ ඇඹුල් කර කීවාය.

'ඉතුරු ටික දුන්නා කියලා හිතාගන්න.. මං යනවා ගුඩ් නයිට්..'

'ගුඩ් නයිට්..'

අසංක රිය පණ ගන්වා යළිත් වතාවක් හර්ෂණී දෙස බැලුවේය. හිතන්නට යමක් තිබුනද ඔහුගේ හදවත බරය. වාහනය හයිලෙවල් පාරට දමා ඔහු පැදවූයේ ඉතා සෙමෙනි. ඒ තරමටම හිත නොසන්සුන්ව තිබුණි.

හේතුවක් නැතුවම අසංකගේ සිතට වායා ඇතුල් විය. ඔහුගේ

මුහුණ පුරා තුනී හයරැල්ලක් ඇදී ගියේ ඉබේටමය.

'ඔබ රුව වායා.. සැහවේ පායා..'

ඒ ගී පදය ඔහුගේ මුවහට ආවේ ඉබේටමය.

# 17

ගෙදර එද්දී වායාගේ හිත ඕනාවටත් වඩා කලබලව තිබුණි. සිත මේ තරම්ම චංචලව තිබෙනු දකින්නට වායා කොහෙත්ම කැමති නැත. අමාරුවෙන් හදගන්නට තරම් බිඳුණු සිතක් තමාට නැතත් ජීවිතයට ඇති එකම වස්තුව මේ සිත පමණක් බව වායා ඉවෙන් මෙන් තේරුම් ගෙන උන්නාය. ඒ හිතත් අවුල් කරගත් විට කිසිවක් නැත.

උදේ සිදුවූ සිදුවීම් පෙළේ සිතන්නට මහා දෙයක් නොවුනද ඇගේ හිතට මහා අමුත්තක් දැනෙමින් තිබුණි. නිලංකාගේ වුව හැසිරීම් අමුතුය. ඒ හිනාවේ පෙන්වන දෙයට වඩා සඟවනා දේ වැඩිය. එසේ සඟවන්නේ මොනවාද.. උදේ තමා උන්නේ නැඟිටින්නවත් බැරිතරම් වූ අමාරුවකින් බව වායාට හොඳට මතකය. ඇය හිතුවේම අකමැත්තෙන් හෝ නිවාඩුවක් ගන්නටය. එහෙත් නිවාඩුවක් ගන්නට ඇමතුමක්දී සිදුවූයේ නොසිතූ දෙයකි. උදේ කතාකරගන්නවත් බැරි අමාරුවෙන් පෙළී පෙළී කතාකළපසු අසංක හදිස්සියේම එන්නට කීවේ වැඩ අධිකව තිබූ නිසාමද.. ඔහු අහිංසක සේවිකාවකට දවසක නිවාඩුවක් නොදෙතැයි සිතන්නට වායාට ලෝබය. ඔහු ඒතරම් නපුරු පාලකයෙකු නොවේ. 'මෙච්චර වෙලා කළුවෙලා තිබුනේ.. දන්නම් පායයි..' කියා නිලංකා කියූ කතාවේ තේරුම කුමක්දැයි වායා ඊළඟට සිතුවාය. සමහරවිට අසංක අවශ්‍ය වැඩක්කරගත නොහැකිව උදේ

WWW.EXPRESSLANKA.TK 152

තරහින් සිටින්නට ඇත. වෙනද ඔහුගේ හැම වැඩකටම සහාය වන්නේ තමාය. කොතරම් දඟලුවද ලෙහාගන්නට පොටක් පාදගත නොහැකිව වායා ඒ ගැන සිතීම අතහැර දැමුවාය. එසේ සිතනා වාරයක් වාරයක් පාසා අසංකගේ බැල්ම ඇගේ හදවතේ තුනී පටයක් පුරා ඇල්පෙනිති තුඩක් මෙන්දිවයයි.ඒඇයි.. වායා ඇත්තටම නොදත්තාය. පිරිමියෙකුගේ බැල්මක් විග්‍රහ කොට උත්තරයක් ලබාගන්නට තරම් මේරූ ගැහැණු සිතක් වායා තුළ නොවීය.

ලා යඳ රැස් වැටුන කෝපි මල් අහුරක් කඩාගෙන වායා එය මුහුණට ළංකරගත්තාය. අලුත් කෝපිමල් සුවඳ ගොස් නැවතුනේ ඇගේ පපුවේය. ඇඟ සෝදගෙන සැහෙන වෙලාවක් ගත වුවද වායාට ගෙට යන්නට තරම් ආශාවක් තිබුනේ නැත. ඇය කෝපිමල් සුවඳ විහිදුන ලාසඳ රැස් වැටුන ගේ පිටුපස ඔහේ ඇවිදිමින් කල්පනා කරමින් උන්නාය. අමුතුවෙන් සිතන්නට යමක් නැතත් සිත තිබුනේ මහා බරකිනි. ඒ බරෙන් සැහැල්ලු වෙනවාට වඩා ඒ බර විඳින්නට වායා ආශා කළාය. ඒත් ඒ බර කුමක්ද...

එකවරම රෑ සුළඟ ගෙන ආ අලුත් සුවඳකින් වායාගේ සිත ගැස්සින. ඇත්තටම ඇය වටපිට බැලුවේ පුදුමයෙනි. එහෙත් කිසිවෙකු නොවීය. ඒ සුවඳ නිතරම ආවේ අසංකගේ කාමරයෙනි. අසංකගේ කාමරයට ගොස් නැවත එන වාරයක් වාරයක් පාසා වායා ආවේ ඒ සුවඳත් රැගෙනමය. මේ පාළු රැයේ එකවරම වායාට දැනෙන්නේත් ඒ සුවඳය. ඒ විලවුන් සුවඳ පරිසරයෙන් හමා නොආ බව වායාට විශ්වාසය. නොවේනම් එය හමා එන්නට ඇත්තේ තමාගේ සිතෙනි.

වායා කෝපිමල් අහුර නැවතත් සිපගත්තාය.

පුතේ...

ඇය කෝපිමල් අහුර මුහුණෙන් මුදගත්තේ අම්මාගේ හඬිනි. පද්මා අද දවස පුරාම වායාව නිරීක්ෂණය කළාය. උදේ ඇය උන්නේ අසනීපයෙනි. ඇය දුරකථන ඇමතුම දුන්පසු කාර්යාලයට දිව්වේ අසනීප මැද්දේය. කාර්යාලයේ සිට ආ පසුත් වායා උන්නේ කල්පනාබරවය. ඒ කල්පනාව වෙනද පද්මා වායාගෙන් දකින කල්පනා බර බව නොවේ.

'ඇයි මෙතනට වෙලා.. මං බතුත් බෙදන් උන්නා කන්න එනකල්..'

වායා අම්මා දෙස බලා සිනාසුනේ දෙනෙත් හංගාගෙනය. අම්මාගෙන් සඟවා ගතයුතු යමක් දෙනෙත් මත ඇඳිවාක් මෙන් වායා දිගටම ඒ දෙනෙත් බිමට බර කරගෙන උන්නාය.

'ඔහිය් එයෝ මොකක් හරි ප්‍රශ්නයක්ද පූතේ..'

පද්මා ඇහුවේ නිකමටය. යුවතියක් රෑ සඳ එළියේ කෝපිමල් සිප ගනිමින් තනිවී කල්පනා කරන්නේ ඒතරම් රළු මාතෘකාවක් ගැන නොවන බව පද්මා දන උන්නාය. මේ රෑ සඳ එළියේදී පවා ඒ මූහුණේ ගලන මිහිරි බව පද්මා රස වින්දය.

'අනේ නෑ අම්මේ.. ඇයි එහෙම ඇහුවේ.'

'නෑ නිකම් පුතා කල්පනා කරන නිසා ඇහුවේ...'

පද්මා සීරුවෙන් ඒ දෙනෙත් තම දෙනෙතින් අල්ලා ගත්තාය.

'එහෙම කියලා කල්පනා කරන්න දෙයක් නෑ අම්මේ.. මං නිකම් කළුවරට වෙලා උන්නේ.. මුළු පැත්තම කෝපි මල් සුවඳයි.'

වායා සිනාසී කීවාය.

'හැමදම පිළිකන්න පැත්තට කෝපි මල් සුවඳයි පුතේ.. අද විතරක් නෙමේ..'

පද්මා හැඟීම්බර හඬින් කීවාය.

'අද මට වැඩිපුර දැනුනා. මේ ඉවසගන්න බැරුව කඩාගෙනත් ඉම්බා.'

වායා එනෙක් වෙලා දකුණතේ හිර කරගෙන උන් කෝපි මල් අතුර පද්මාට පෙන්වා කීවාය. පද්මා ඒ ... දියණිය දෙසත් බැලුවේ මාරුවෙන් මාරුවටය.

'පුතා මට මොකක් හරි හංගනවද...'

පද්මා යංතමින් සිනාසී ඇසුවාය.

'ම..ම.. අම්මට.. ඇයි අම්මා එහෙම හිතන්නේ. කවදද මොනවද මම අම්මට හංගලා තියෙන්නේ...'

වායාගේ වචන තුල අවංක දුකක්විය. පද්මාගේ ළය උණුවිය.

'අනේ නෑ පැටියෝ.. මම නිකම් කිව්වේ.. මං හිතුවා ඔයා මොනවා හරි හිත හිත මට කියාගන්න බැරුව ඇති කියලා..'

'කියන්න බැරි මුකුත් තවම වෙලා නෑ..'

වායාට ඉබේට ඒ වචන පිටවිය.

'කො..හෙ..ද..'

පද්මා සීරුවට බලාඇසුවාය.

'කොහෙවත් නෑ.. උනානම් ඉස්සෙල්ලම දැනගන්නේ අම්මනේ..'

ඉන්පසු සෑහෙන වේලාවක් යනතෙක් පද්මාත් වායාත් නිහඬව උන්නෝය. දෙදෙනාගේම හදවත් වෙන්වෙන්ව ගැහෙන්නට විය.

'ඔයා ගැන හිතන්න ඕන දේවල් මම හිතන්නෑ කියලද පූතා හිතන්නේ...'

පද්මා වේදනාවෙන් ඇසුවාය. යංතමට බොඳවූ කඳුළක් ඇගේ දෙනෙත් වල කැවුනි.

'අම්මා මොනවද මේ කියන්නේ..'

'වෙලාවකට මට හරි බයයි පූතේ. ඔයාගේ ජීවිතේ පිළිවෙලක් කරන්න කලින් මම..'

පද්මා කියන්නට ගියදේ ගිලගත්තේ වායාගේ බැල්ම එතරම්ම දැඩිවූ නිසාය.

'ඒ පාර ඔයත් මාව දාලා යන්නද හදන්නෙ.. යන්න යන්න... තාත්තත් අම්මා එනකල් බලාගෙන ඇති.. මං තට්ට තනියම මේ ගෙදර ඉන්නම්..'

වායා හඬමින් කීවාය. අනාගතය ගැන කරන කතාවක් ඒතරම් දුක්බර වේයැයි පද්මා සිතුවේ නැත. ඇය පැවසුවේ ඇගේ හිතට දැනුන හැඟීමය. ගැහැණු දරුවෙකු සමඟ තනිවෙන අම්මා කෙනෙකුගේ බිය සාධාරණය. ඊටත් වඩා නෑදෑයෙක් දේපොළක් නොමැතිව තනිවෙද්දී ඒ බිය දෙගුණ තෙගුණ වේ. අද තමා මේ අහිංසක කෙල්ලත් සමඟ මුහුණ දී ඇත්තේ දෛවයේ ඒ අවාසනාවන්ත තත්වයට බව පද්මා සිතුවාය.

"කවුරුහරි යෝජනාවක් එහෙම කළොත් මෝඩිවගේ ගත් කටටම බෑ නොකියා ටිකක් හිතලා බලලා තීරණයක් ගන්න.."

වායාට එකවරම සිනාගියේය. ඇයට හවස අසංක කියූදේ සිහිවිය.

"මොකද එකපාර හිනාඋනේ."

පද්මා සිනාසෙමින් ඇසුවාය.

"නෑ අපේ සර් දවල් කිව්ව කතාවක් මතක් වුනා අම්මේ.."

"මොකක්ද."

ඇය උනන්දුවෙන් ඇසුවාය.

"සීසන් දවස්වලට ටිකක් රෑ වෙනකල් වැඩනේ.."

"ඉතින්.."

"මටත් ගෙදර යනකොට රෑ වෙයි කිව්වා.. මං කිව්වා පාරට අම්මට ඇවිත් ඉන්න කියනවා කියලා.."

"හ්ම්.."

"සර් කියනවා හැමදම අම්මට කරදර නොකර ඒ ටිකත් යන්න කෙනෙක්ව හොයාගන්නලු..."

"ඉතින් ඇත්තනේ සර් කියන්නේ. කොල්ලෝ එහෙම හොයාගන්නවා තමයි.. ඔයා ඔහොම උන්නට.. මටත් ඒකෙන් කරදරේ... ඉතින් ඔයා මොනවද කිව්වේ."

"මං කිව්වා එහෙම කෙනෙක් හොයාගන්න බෑ.. ලැබෙන්න ඕනා කියලා.."

"ඔහොම යනකොට ඔයාටත් හොඳ ළමයෙක් ලැබෙයි."

පද්මා වායාගේ හිස අතගා කීවාය.

"අම්මත් ආස ඇති බෑනා පොඩ්ඩක්ව ඉක්මණට එක්කගෙන එනවා නම්.."

වායා කීවේ අම්මාදෙස බලා මෘදුව සිනාසීය.

"එහෙම දවසක් ඇත්තටම සතුටු වෙන්න ඕනා දවසක් තමා

වූනේ. මට දුක ඒ දවස මෙච්චර පරක්කු වෙන එකට..'

අම්මාගේ හැඟීම් වලට සිතාසෙන්නට තරම් සිතක් වායාට තිබුනේ නැත. අම්මා සිතන්නේ දුවෙක් ඉන්නා හැම අම්මා කෙනෙක්ම සිතනා ආකාරයටය. එහෙත් දෛවය තමාගේ ජීවිතය ඉදිරිපස ඒදේ මවන්නේ කවරාකාරයටද කියා තවමත් වායාට තේරුමක් නැත.

'අනාගතේ ගැන ඔයතරම් හිතන්න එපා අම්මේ.. වෙන දෙයක්වෙයි. කවුරුහරි කෙනෙක්ව මටත් දෙයියෝ මවලා ඇතිනේ.. එයාව හම්බවෙනකල් මම මගේ පාඩුවේ ඉන්නවා. අම්මා උනාත් මං ගැන ඔච්චර හිතන්න එපා.'

පද්මා වායාගේ කතාවට කිසිවක් නොකීවාය. ඇගේ ඉරණම් කරුවා හැකි ඉක්මනින් ඇගේ ජීවිතයට දෙවියන් මුණ ගස්වනවා නම් හොඳ බව පමණක් පද්මා සිතුවාය.

'යන්.. කෑම ටික තියෙනවා.'

වායා අම්මාත් සමගම ගෙතුළට ගියේ අතේ ගුලි කරගෙන උන් කෝපිමල් අහුර තවත් වරක් සිපගනිමිනි. අම්මා කියන්නේ ඇත්තය. මේ කෝපි මල් තමා දන්නා කාලයේ පටන් මේ ලෙසම පොකුරට ළිඳ අවට පිපී තිබුණි. එහෙත් මේතරම් සුවඳක් මීට පෙර ඉන් ඇය විඳ නැත. වෙනස්වී ඇත්තේ කෝපිමල්ද.. නැතහොත් එහි සුවඳ ඉවකළ හදවතද... ඇය නොදනී.

'හවස අලුත් වැලි හාල්මැස්සෝ අරගෙන මාළු කාරයෙක් ගියා. අරගෙන වේලෙන්න මිරිසට හැදුවා.. වායා නංගී මතක්වෙලා ගෙනාවේ..'

වායාත් අම්මාත් කන්නට ඉඳගනිද්දීම ලතා පැමිණ හාල්මැස්සන් දීසිය මේසය මත තබා කීවාය. වායා වැලි හාල්මැස්සන් දීසියෙන් ටිකක් පිඟානට දමා ගත්තේ ආශාවෙනි.

'හොඳට මිරිස් ගම්මිරිස් අඹරලා හැදුවේ රසද..'

ලතා අක්කාගේ මුහුණ දෙස බලද්දී වායාට දුක සිතුණි.

'හරි රහයි ලතා අක්කේ.. අම්මේ ලතා අක්කටත් බත්

WWW.EXPRESSLANKA.TK 157

බෙදන්නකෝ..'

'මොනවද නැන්ද උයලා තියෙන්නේ..'

ලතා ආශාවෙන් මේසයේ පුටුවක් ඇද වාඩිවී ඇසුවාය.

'අනේ රත්තරන් අද දෙකයි හැදුවේ.. කරවල තෙල්දලා මුංඇට හැදුවා.'

'ෂා.. මරුනේ.. එහෙනම් චූට්ටක් බෙදන්න.. මං උන්නේ හාල්මැස්සෝ එක්ක පාන් කන්න.'

'ඒකත් නියම කෑම..'

වායා අම්මා බෙදුබත් පිඟාන ලතා වෙතට පාමින් කීවාය.

'ජොබ් එකට ගිය මාසෙට දෙකට වායා නංගි තවත් ලස්සන වෙලා නේද නැන්දේ...'

ලතා බත්කටක් අතා මුවට තබා ගනිමින් කීවාය. වායා සිනාබරව නෙත් බිමට බර කරගත්තාය. කොල්ලෙකුගේ හදවත මොහොතකට නවත්වන්නට සමත් සිනාවක් ඇයට ඇතැයි ඒ දෙස බලා උන් ලතාට සිතුණි.

'අපි ලස්සනයි කිව්වට එයාට අගයක් නෑ.'

පද්මා වායා දෙස බලා කීවාය.

'ඒක ඉතින් හැම කෙල්ලෙක්ගේම හැටිනේ නැන්දේ.. කවදාහරි ඉතින් කොල්ලම කියන්න ඕනේ.. වායා බබා ඔයා හරි ලස්සනයි.. හිනාවෙනකොට මධූරි වගේ.. තව පාරක් හිනාවෙන්න.. අන්න එතකොට පිළිගනී...'

'ලතා අක්කා ඔන්න ගුටි කනවා.. මට ඕනනැති කොල්ලෙක් නෑ. ලතා අක්කා තමයි දවල්ට නිකම් ඉන්න බැරුවට අම්මට කොල්ලෝ ගැන කිය කියා අම්මවත් වයින් කරන්නේ.'

වායා දෙතොල විකාගෙන කීවාය. ලතා පද්මා දෙස බැලුවේ දෙනෙත් වලින් සිනාසෙමිනි.

'ඇත්තටම නංගී අපි ඊයෙත් කතාඋනා. ඕකට ඔච්චර පරක්කු

වෙන්නේ කවුරුහරි හිතාගන්න බැරි ඉරණම් කාරයෙක් ඇති එන්න. නැද්ද ඔෆිස් එකේ ලස්සන කොල්ලෙක්...'

ලතා අහද්දී චායා බත්පිඟාන දෙස බලා සිනාසුනාය. 'එක්කෙනෙක් ඉන්නවා..' යැයි කියන්නට ඇයට සිතුණි. ඒත් සමඟම 'එයාටත් එක්කෙනෙක් ඉන්නවා..' යැයි ඊට එකතු කරන්නට ඇයට සිතුණි. අසංකගේ රුව විදුලියක් මෙන් චායාගේ හදවතේ ඒ කොනේ සිට මේ කොනට ඇදී ගියේය.

'බොරු නෙවෙයි නංගි.. කෙල්ලෙක් කසාද බඳින්න ඕනා හොඳම වයසේ ඔයා ඉන්නේ. මේ කාලේ බ්‍රයිඩ් කෙනෙක් උනාම එයාගේ මූණේ මොකක්ද ෆ්‍රෙෂ් ගතියක් තියෙනවා.'

ලතා හැඟීම්බරව කීවාය.

'ආ.. ඇත්තද.. ඔය ලතා අක්ක හදන්නේ බැණුනුත් අහගෙන හාල්මැස්සෝ ටිකත් අරගෙන යන්න. මං බඳිනකොට තව පරක්කු වෙයි. ලතා අක්කා බැන්දේ කීයෙන්ද...'

චායාගේ කතාවට ලතා දෙවුර හකුළුවා සිනාසුනාය.

'විසි එකෙන්.. මෙලෝ හසරක් දන්නෑ.. තාමත් ඉගෙන ගන්නවා.'

'මං ඔය තරම්වත් දන්නෑ..'

'මොන කෙල්ලද දැනගෙන බඳින්නෙ.. බැන්දට පස්සේ වෙන්නේ කවදාවත් ඉගෙන ගත්තේ නැති දේවල්.. ඒවට කෙල්ලෝ ඉබේම පුරුදු වෙනවා.. ඔයත් පුරුදු වෙයි. ආදරේට කරන්න බැරි මොනවද..'

චායා කල්පනාබරව පිඟානේ බත්ඇට එකතුකළාය. ආදරය.. වඩාත් වැදගත් විය යුත්තේ විවාහයටත් වඩා ආදරය නොවේද..

'ඉස්සෙල්ලා ලව් කරන්න කෙනෙක් හොයාගන්න. ඊට පස්සේ පැලෙන්න ආදරේ කරන්න. පස්සේ බඳින්න.. බැන්දට පස්සේ මොන මොනාහරි වෙයි.. දුකක් උනාම මොකෝ.. සතුටක් උනාම මොකෝ.. ආදරේටනේ.. නේද නැන්දේ..'

පද්මා සිනාසුනා පමණි. චායාද අම්මා දෙස බැලූවාය. ඒ දෑස්වල දල්වෙන බලාපොරොත්තුවේ පහන් වැටි හරියට දල්වෙන්නේ

WWW.EXPRESSLANKA.TK 159

කවදාදැයි චායාට තේරුමක් තිබුනේ නැත.

# 18

සඳුදා උදයේ චායා විලාසිතාගාරයට හැරෙද්දීම අසංකගේ වාහනය ඉන් එළියට ආවේය. අසංකට ඉබේම තිරිංග තදවිය. ඔහු වාහනයේ වීදුරුව අතරින් පෙනුන චායාගේ මුහුණ දෙස සමීපව බැලුවේය. ඇතුළු හදවතේ දක්ෂ සිත්තරෙකු සිටින්නාක් මෙන් ඒ රුව මොහොතකින් ඔහුගේ ළය මත ඇඳුණි.

"ගුඩ් මෝනින් සර්.."

චායා පිරුන හැඟීමෙන් වාහනයේ පැති වීදුරුව වෙත පාත්වී කීවාය. අසංකට ඊට ප්‍රති උත්තරයක් දෙන්නට තත්පර කිහිපයක් ගතවිය.

"මෝනින් චායා.."

දෙදෙනාගේම දෙනෙත් මොහොතකට එකම බැල්මක නතරවිය. චායා මෘදුව බිම බලාගත්තාය. ඒ දෙබැම ඒ දෙනෙත ඒ හසරැල්ල තුනී වීදුරු කැබැල්ලකින් පසුව හාරන්නාක් මෙන්යැයි අසංකට සිතුණි.

"මං උඩට යන්නම් සර්.."

චායා බිම බලාගත්වනම කීවාය. අසංක හිස වැනුවා පමණි. වාහනය අසළින් චායා ගියපසුත් අසංක පැති කන්නාඩියෙන් තමාට පිටුපාා යන ඒ රුවදෙස මොහොතක් බලාඋන්නේය. ඔහු මොහොතකට පසු වාහනය පාරට ගත්තේ හදවතේ ඇඳුන චායාගේ රුව යළි යළිත් සිහි කරමිනි. ගැහැණු රුවක් මේතරම් සංවේදීව රස විඳිය හැකියැයි ඔහු මීට පෙර දැන උන්නේ නැත.

අසංක වාහනය මාර්ග තදබදයට හසුවූ පසු කැසට් රේකෝඩරය ක්‍රියාත්මක කළේ හිතට කාලාන්තරයකට පසුව දැනෙන රසබර අදහස් විඳගන්නට මෙනි.

WWW.EXPRESSLANKA.TK 160

කැසට් යන්ත්‍රයෙන් වාදනය වූනේ රණතුංග මහත්මිය නිතර ඇසූ සංගම් චිත්‍රපටයේ ජනප්‍රිය ගීතයකි. ඒ මිහිරි හින්දි පදමාලා අතරින් අයංකට චායාගේ රුව දස දහස් වාරයකට ඡේදනය වෙමින් දර්ශනය විය. අම්මා සමග යද්දී කොතෙකුත් මේ ගීතය ඔහු අසා ඇත. එහෙත් ඒ කිසිදිනයක මේ තරම් රූපමය දර්ශන සහිතව ඒ ගීතය ඔහු රසවිඳ නැත. එය හරියටම රස වින්දේ අදයැයි ඔහුට සිතුණි.

"ගුඩ් මෝනින් මැඩම්.. අද චුට්ටක් පරක්කු උනා."

චායා රණතුංග මහත්මියගේ මේසය වෙතට ගියේ සමාව ඉල්ලාගෙනමය.

"මෝනින් චායා.. පාරේ ට්‍රැෆික් නේද."

"ඒකමත් නෙවේ මැඩම්.. අද තාත්තාගේ උපන්දිනේ.. ඉතින් අම්මා උදෙන්ම හීල් දනේ පන්සලට දුන්නා.. මාත් ටිකක් උදව් වෙලාආවේ.. ඒකයි."

"අනේ.. අම්මයි දුවයි තාත්තගේ උපන් දිනේටත් පින්කම් කරනවද."

රණතුංග මහත්මිය කරමින් උන් වැඩය නවතා චායා දෙස බලා ඇසුවාය.

"අපිට උන්නේ එච්චරනේ මැඩම්..."

චායාගේ දෙනෙත් මොහොතකට තෙත්විය.

"හොඳ මිනිස්සුන්ට මේ ලෝකේ ඉන්න තියෙන්නේ ටික කාලයයි චායා. ඉක්මණට දෙවියෝ එයාලා ළඟට ගෙන්න ගන්නවා. අපි අසරණ වෙනවා."

චායා නිහඬවම රණතුංග මහත්මියගේ මේසයේ අපිළිවෙලට දමාතිබූ ෆයිල් කවර කිහිපය එකතු කොට පසෙක තැබුවාය. රණතුංග මහත්මිය බලා උන්නේ චායාගේ මුහුණ දෙසය. "කවදහරි හොඳ කොල්ලෙක්ව ලැබුනොත් හොඳයි.. නැත්නම් පව්.." ඇය අනුකම්පාවෙන් සිතුවාය.

"බලන්න චායා මේ ළමයා කරන වැඩ. බැංකුවට යන්න කිව්වම යතුර ගන්නා ඔහේ ගියා.. මේ චෙක් ටිකත් දලා ගිහිල්ලනේ.. උදෙන්ම

WWW.EXPRESSLANKA.TK 161

'දන්නම ඕන චෙක් වගයක්.'

රණතුංග මහත්මිය බණින්නේ අසංකට බව චායා දන්නීය. ඇය බැන්නද ඒ බැනුමේ පවා මහා සෙනෙහසක් තැවරී තිබුනි.

'දැන් මොකද කරන්නේ.. මං කියන්නද චායා මේ චෙක් ටිකත් අරගෙන ත්‍රී විලර් එකකින් බැංකුවට ගිහිල්ලා සර්ට දෙන්න.. දැන්මම දුන්න කියන්න.. බැංකුව චායා දන්නවා නේද..'

'දන්නවා මැඩම්.. මෙතන බම්බලපිටියේ සම්පත් එකනේ..'

'ඔව්.. පයින් යන්නෙපා ත්‍රී විලර් එකකින් යන්න.. එතනට ටිකක් දුරයි.'

චායා හෑන්ඩ් බෑගයද කරේ දමාගෙන රණතුංග මහත්මිය අතින් චෙක්පත් කිහිපය අතට ගත්තාය.

'සර් බැංකුවෙන් ගිහිල්ලා නම් ඔයාම එකවුන්ට් එකට දලා එන්න. පිස්සු ළමයෙක්.. කවදා හැදෙන්න ඉන්නවද දන්නෑ.. පොඩි එකා වගේ වැඩ..'

චායා කාමරයෙන් පිටවූයේ ඇය තවත් මොන මොනවදෝ කියා අයංකට බණිද්දීය. ඔක්කොටම වඩා භූරතලේ.. යැයි චායා සිතුවාය.

'කොහෙද යන්නේ..'

නිලංකා චායා එද්දී ඇහුවාය.

'මේ.. සර් චෙක් ටික දලා බැංකුවට ගිහිල්ලා තියෙන්නේ.. මැඩම් දගෙන බනිනවා.. මට ගිහිල්ලා දෙන්න කිව්වා.'

චායා සිනාසීගෙනම කීවාය. නිලංකා චායාගේ දෙනෙත් අල්ලාගත්තේ මනමාල බැල්මෙනි.

'උදෙන්ම මූණ බලාගන්න බැරිඋනාම කොල්ලගේ හිත අප්සෙට් යනවා නමයි. ඒක අනිත් අය දනගන්න ඕනා..'

නිලංකා අතේ තිබූ පෑන කටේ ගහගෙන කීවාය. චායා සිනාසුනේ අසරණවය.

'පිස්සු කියනවද මන්ද..'

WWW.EXPRESSLANKA.TK 162

චායා බිම බලාගෙන කීවාය.

"මං දැක්කනේ මෙතනින් ගිය මූණ.. හරියට රිටන්වෙච්ච චෙක් එකක් වගේ.. හරි හරි පලයන් පලයන් දූන් ඉතින්. පුළුවන්නම් පරිස්සමින් උඹම එකවුන්ට් එකට දපන්.. මූණ දැක්කහම වෙන කාගේහරි එකවුන්ට් එකකට චෙක්එක දයි."

නිලංකාගේ වචන චායාගේ පපුවට ගෙන ආවේ මහා බරකි. ඇය වචනයක්වත් කතානොකරම පාරට පැමිණ ත්‍රී විලරයකට ගොඩ වූවාය.

"මෙතන සම්පත් බැංකුවට යන්..."

හිත ලිහා දැමූ මුතු පටක මුතු මෙන් විසිර යනවා චායාට දැනෙයි. ඇය අසීරුවෙන් ඒ මේ අත විසිරියන මුතුපටවල් එක්කාසු කළාය. එකක් එකතු කරද්දී තව දහයක් ඇහිලිකරු අතරින් පැන විසිර යයි. දෙයියනේ මේ මොනවද වෙන්න යන්නේ. චායා සිතුවේ අචංක බියකිනි. නිලංකා කියනා වචන හරිහැටි තේරුම් බේරුම් කරගන්න වත් චායා නොගියාය. එහෙමම ඒ වචන අමතක කරන්නට ඇය උත්සාහ කළාය. "බැංකුවට යද්දී ගිහිල්ලා හිටියොත් හොඳයි.." චායා සිතුවේ අචංකවමය.

එහෙත් බැංකුව ඉදිරිපිට අසංකගේ වාහනය නතර කර තිබුණි. චායා ත්‍රී විලරයෙන් බැස බැංකුව වෙත පිය තැගුවේ ඇත්තටම බරවූ හදවතිනි. බැංකුවේ කවුන්ටර් වල සිට දිගට ඇදුන පෝලිම් අතර ඇගේ දෙනෙත් අසරණව දුවගියාය. අසංක පෙනෙන්නට නොවීය. හිතට දැනෙන්නේ සැනසිල්ලක්ද දුකක්ද පාළුවක්ද කියා චායාට තේරුමක් නැත.

අසංක බැංකුවේ කළමණාකරුගේ කාමරයේ වීදුරු අතරින් සැහෙන වෙලාවක සිට චායාදෙස බලාඋන්නාය. ඉඳහිට මුහුණකට ඒ මුහුණ වැසෙද්දී ඔහු ඇත්තටම කම්පාවිය. ඔහු කළමණාකරු ඉදිරියේවූ අසුනෙන් නැගිට්ටේ හිතට දැනුන ලෝබ සිතුවිලි නිසාමය. මේ තරම් සමීපව ඒ මුහුණ බලාගන්නට හිතට ඇති ඕනෑකම කුමක්දැයි ඔහු සිතින් ප්‍රශ්නකළාය.

"චායා.."

WWW.EXPRESSLANKA.TK 

අසංක වායා ළඟටම පැමිණ කතා කරද්දී ඇය ගැස්සී හිස එසෙව්වාය. ඔවුන් දෙදෙනාගේ මුහුණු අතර වූයේ අඟල් තුනහතරක පරතරයක් පමණි. මේ තරම් සමීපව මේ මුහුණ මේ උදුසන බලාගන්නට ඔහු හීනෙකින්වත් සිතුවේ නැත.

'සර්.. සර් චෙක් ටික දලා ඇවිත්...'

වායා ඒ බැල්මෙන් දෙනෙත් අමාරුවෙන් මුදගෙන කීවාය.

'ඒකනේ වේලාසන එන්න කියන්නේ.. හැම දෙයක්ම මට අමතකවෙනවා.'

අසංක කියද්දී වායා ගේ පපුව හිරිහැටී ගියේ ඉබේටමය. ඇයට නිලංකා එද්දී කියූ වදන් සිහිවිය. වායාට චෙක්පත් අල්ලාගෙන උන් ධූරත ගැහෙන්නාක් මෙන් දැනුණි.

'සර් යන්න සර්.. මං චෙක් ටික දලා එන්නම්.'

වායා බිමට නෙත් බරකර කීවාය. අතින් ඒ තිකට ඔසවා ඒ දෙනෙත් වලට එබී ඒ කළුබෝල අතර තමා ඉන්නවාදැයි නිසැකවම බලාගන්නට අසංකට සිතුණි. ඔහු ඒ හැඟීම් මැඩ ගත්තේ අසීරුවෙනි.

'එපා.. අපි දලා එකටම යන්. කෝ දෙන්න මං ඇතුලට ගිහිල්ලා දලා එන්නම්. ඔයා මේක තියාගෙන අතනට වෙලා ඉඳගෙන ඉන්න.'

අසංක ඔහු අත තිබූ ෆයිල් කවරය වායා අත තබා ඇගේ ධූරතින් චෙක්පත් ටිකගත්තේය. වායා බැංකුවේ කොනක තිබූ කුෂන් පුටුවට බරවූයේ හිතට මහා අමුත්තක් නුහුරු බවක් දැනෙද්දීය. 'මගේ මූණේ පෙරහැරක් යනවා වගේ බලා ඉන්නේ.. වෙලාවකට හරි අමුතුයි.. බිම බලාගන්නත් දුකයි..' ඇය අසරණව සිතුවාය. වායා අසංක අත තබා ගිය ඔහුගේ ෆයිල් කවරය දෙස බැලුවේ ඒ හැඟීමෙන් ඇගේ සිත මෘදුව දැවී යද්දීය. ඒ දැවීම ගින්දරක් වී ඇගේ හිත දවා දැම්මේ අසංක ඔහුගේ අත් අකුරින් ෆයිල් කවරය මත ලියා තැබූවක් දුටුවිටය. වායා ඒ පැතලි සිංහල වචන දෙක දෙස බලා උන්නේ පුදුමයෙනි.. වායා කල්පනී.. වායා අසංක ෆයිල් කවරය මත ලියූ ඇගේ නම කියවූයේ ගැහෙමිනි. ඒ වචන ඒ අත් අකුරින්ම ඇගේ පපුවේ ලියවෙන්නට වැඩි වේලාවක් ගතවූනේ නැත. 'අනේ ඇයි මෙහෙම කරන්නේ.. මොනවද මේ වෙන්නේ..' වායා

WWW.EXPRESSLANKA.TK 164

පපුවේ ඇඳුන ඒ අත් අකුරු මකාදමන්නට ඇයට නොහැකිවිය.

'අපි යන්ද...'

අසංක ළඟටම පැමිණ ඈසද්දී චායා ගැස්සීන. ඈය ප්‍රථම වරට දැස් පුළුල් කොට ඒ මුහුණ දෙස බැලුවාය. අසංක සිනාසුනේ දෙනෙත් වලිනි.

'සර් වාහනේ යන්න.. මං මේ ටික පයින් එන්නම්..'

චායා අසංකගේ දෙනෙත් මගහැර කීවාය. ඔහු ඈගේ දෙනෙත් දෙස බැලුවේ තරමක් එය අඩවන්කරය.

'ඇයි දරුවෝ පයින් යන්නේ.'

'එහෙම හොඳයි සර්.. සර් යන්න.'

බැංකුව දොරකඩදී අසංක වෙනස්ම ලෙස චායාදෙස බැලුවාය.

'යන්.. එන්න.. නගින්න.'

අසංක වාහනයේ රියදුරු අසුනට එහා අසුන සමීපයේ වූ දොර විවර කර කීවාය.

අසංක වාහනයට නැග්ගේ චායා එයට ගොඩවූ පසුය. අතින් පයින් දොර ඇර අසංක වාහනයට ගොඩ වෙද්දීම ඔහුගේ පපුව තතර වූවාක් බඳුවිය. ඔහු තමාට සමාන්තරව ඉන්නා චායාදෙස තත්පර දෙක තුනක්බලාඋන්නේය. ඊටත් පසු උකුල මත එකට බැඳුන ඈගේ දෑත් දෙසද බලා උන්නේය. ඒ දෑතම එක විනාඩියකට අල්ලාගෙන ඉන්නට පමණක් අවසර දෙන්න යැයි කියන්නට අසංකට සිතුණි. ඔහු වාහනය පණ ගැන්වූයේ වාහනය පුරා විසිරී ගිය ඈගේ සුවඳ මුළු ආත්මයෙන්ම ඉවකරමිනි. චායා නැවත වතාවක් අසංකට නොපෙනෙන්නට ඔහු දුන් ෆයිල් කවරය දෙසබැලුවාය. නිසැක වශයෙන්ම එහි තිබුනේ ඔහුගේ අත් අකුරුමය. මේ ලියවී ඇත්තේ තමාගේ නමමය. ඒත් ඒ ඇයි.

ගාලු පාරේ වාහන තදබදය උග්‍රවෙද්දී අසංකට සතුටක් දැනුණි. තව පැය බාගයකටවත් මේ මාර්ග තදබදය පහ නොවේවායි ඔහු පැතුවේය.

'අපරාදේ සර් අපිට බැංකුව ළඟින් අතික් පාරට දලා යන්න

WWW.EXPRESSLANKA.TK 165

තිබුනා.'

චායා අසංක වෙතහැරී කීවාය. අසංකට ඔහුගේ පපුව දැන් දැන් පිපිරෙතැයි සිතුණි.

'එහෙනම් මාවත් දලා ඔයා මෙතනින් බැහැලා යන්න..'

අසංකගේ ඒ කතාවට චායාගේ පපුවේ එක් කොනක් ඉරී ගියාක් බඳුවිය. ඇය ඔහුදෙස බැලුවේ සමාව ඉල්ලන බැල්මෙනි.

'යනවද..'

ඔහු යළිත් ඇසුවේය. චායා 'නැතැයි' කියන්නට මෙන් හිස වැනුවාය. වාහන තදබදය තව තවත් උග්‍ර වනවා නම් හොඳයැයි අසංකට සිතුණි. එහෙත් චායා උන්නේ වාහනයෙන් බැසගන්නට බැරුවය. වාහනය ඇතුළත පපුවට උහුලාගත නොහැකි යමක් පිරී ඇතැයි ඇයට දිගටම සිතුණි.

'චායා.. ඇයි කතා කරන්නැත්තේ.'

අසංක හෙමිහිට ඇසුවේය. ඔහුගේ දෙනුවන් නිවි නිවී දල්වෙන වෙසක් පහනක් මෙන් ඇය වෙතටම දල්වී තිබුණි. චායා උන්නේ දෙනෙත් ඔසවාගත නොහැකිවය.

'නෑ සර් මුකුත් නෑ.'

'කොහෙන්ද ඔය සල්වාර් එක ගත්තේ.'

එවර නම් චායා සිනාසුනාය. කෙල්ලෙක් සිනාගන්වන්නට ඇය ආශා කරන යමක් ගැන කතාකළ යුතුම යැයි ජීවිතයේ ප්‍රථම වරට අසංක සිතාගත්තේය.

'ඇයි සර්.. කැතයි නේද..'

අසංක සිනාසුනේ වඩාත් මෘදුවය.

'ලස්සනයි ළමයෝ..හරි ලස්සන පාට..ඔයාට හොඳට ගැළපෙනවා. කොහෙන්ද ගත්තේ කියලා මම කියන්නද.'

චායාගේ හිත ගැස්සින. මේ ඇඳුම ගත්තේ පඩිගත් ද හවස අම්මත් සමඟ ගොස් මහරගම සසංකා ඩ්‍රෙස් පොයින්ට් වෙතිනි.

'හා සර් කියන්න..'

WWW.EXPRESSLANKA.TK 166

'මහරගම සසංකා ඩ්‍රෙස් පොයින්ට් එකෙන්.. හරිද..'

චායා ළයට අතක් තබාගෙන පුදුමයෙන් අසංක දෙස බැලුවාය. ඒ ඇස් කවරදාටත් වඩා විශාලවී ඇතැයි අසංකට සිතුණි. ඔහු සිනාව සඟවාගත් පෙම්බර මුහුණින් චායාදෙස බලාඋන්නාය.

'ස.. සර් දන්නේ කොහොමද..'

ඇය ගොත ගසමින් ඇසුවාය. ඔහු හෙමින් හෙමින් වාහනය පැදවූයේ පෙරමඟ බලා සිනාසෙමිනි. චායාගේ හිත කුතුහලයෙන් පිරීගියාය. ඔහු කතානොකළේ ඇයට තව ටිකක් අසරණ කර ඒ මුහුණ රස විඳින්නට තිබූ ආශාව නිසාය.

'සර් කොහොමද දන්නේ...'

චායා දෙවනවර වඩාත් මොලොක් ලෙස ඇසුවාය. ඒ ගැහැණු බවට පිටුපාන්නට තරම් දැඩි පිරිමි ළයක් අසංක තුළ නොවීය. ඔහු චායාගේ තැඹිලි පැහැගත් සල්වාර් කමිසය දෙස මෘදුව බැලුවේය.

'මම නිකන් හිතලා කිව්වේ චායා.'

'සර් ඔය බොරු කියන්නේ.'

චායා නොදෙල් හඬින් කීවාය. මෙතෙක් වෙලා තමා දුටු නැන්පත් සේවිකාව යට කරගෙන චායා නම්වූ දඟකාර යුවතිය එවේලේ මතුවූවා යැයි ඔහුට සිතුණි. අසංකගේ හදවත වඩාත් කැළඹුයේ ඒ නව යෞවනත්වය ඔහුට දරාගන්නට බැරි තරම්වූ නිසාය. යුවතියකගේ මුව මත රැඳෙන පිවිතුරු අරුමැසි බව සත්සුන්ව විඳගන්නට ඇත්නම් යැයි ඔහුට සිතුණි. ප්‍රථම වරට චායා කෙරේ ශාන්තවූ අනුරාගයකින් ඔහුගේ පිරිමි ළය උණුවිය.

'මං ඇත්තම කියන්නද..'

අසංක වාහනය මාවත කොනක හෙමිහිට නවත්වා කීවේය. ඇයි වාහනය නැවැත්තුවේ යැයි කියා අසන්නටවත් චායාට ඉවසුමක් තිබුනේ නැත.

'චායා එද හැන්දෑවේ අම්මත් එක්ක ඕක අරගෙන එද්දී මාත් උන්නේ මහරගම... ඔයා ළඟම...'

චායා අසංක දෙස බැලුවේ අදහාගත නොහැකි බැල්මෙනි.

අසංක තිහඬව නිස්කලංකෝ ඒ මුහුණ රස වින්දේය.

'හානේ.. සර් ඇයි දැකලත් කතා නොකළේ.. අපරාදේ අම්මටත් සර්ව පෙන්නන්න තිබුනා.'

ඒ වචනයක් වචනයක් පාසා අහිංසක බොළඳකමක් ගලනු ඔහුට දැනෙයි. ඔහු ඇත්තටම ඒ ළඳ බොළඳ බවට ආශා කළේය. ඒ වචන.. ඒ බැල්ම ජීවිතයේ කිසිවෙකු විසින්වත් නොපිබිදවූ හැඟුමත් පොකුරු පිටින් පුබුදුවනැයි අසංකට සිතුණි.

'එක අතකට සර් කතා නොකළ එක හොඳයි. මං පුංචි ක්ලාක් කෙනෙක්නේ නේද..'

වායා අභිතක් නොමැතිව ඊළඟ වර කීවාය. අසංකගේ මුහුණ අඳුරු විය.

'වායා හිතන්නේ අසංක සර් ඒවගේ මිනිහෙක් කියලද..'

දියයුතු පිළිතුර නම් 'නැහැ' යන්නය.

'මං එහෙම හිතන්නෑ සර්..'

'එහෙනම් කිව්වේ.'

'සර් කතා නොකර ගියාම මට දුක හිතුනා.'

වායාගේ හඬේ තිබුනේ අහිංසක අවංක බවක තෙතමනයකි.

'ආයි කවදාවත් කතා නොකර ඉන්නෑ.. දුවගෙන ඇවිල්ලා කතා කරනවා.. හරිද...'

ඔහු ස්ථිරසාර ලෙසට කීවේය. වායා හිය ඔසවා සිනාවුනේ 'අනේ එහෙම කරන්න එපා..' කියන්නාක් බඳුවය.

'ඔයයි අම්මයි ඝාප්පුවෙන් එළියට ඇවිල්ලා එහාට මෙහාට වෙද්දී අතුරුදහන් උනා. මං ගොඩාක් වෙලා බලාඋන්නා වායා..'

ඒ වචන වායාගේ පපුව අලුතින් දවාලන්නට තරම් විය. ඇයි එහෙම බලාඋන්නේ.. කියා අසන්නට ඇයට සිත්විය.

'එද නම් අදට වඩා ලස්සනයි. ෂෝට් ස්කට් එකක් එහෙම ඇඳලා.. අඳුනගන්නවත් බැරිඋනා.'

අසංක කියද්දී වායා දූත් එවැන්නක් ඇඳගෙන ඉන්නාක්මෙන්

WWW.EXPRESSLANKA.TK 168

දෙදණ දතින්ම වසාගත්තාය. ඒතරම් නොවැදගත් දෙයක් පවා ඔහු මතක තබාගත්තේ ඇයි.. වායා එද මහරගමට ඇඳගෙන ගිය ඇඳුම සිහි කළාය. නැත. එය හිතනා තරම්ම කොට නැත. ඇයට සැනසිල්ලක් දැනුණි.

'සර් කොහෙද මහරගම ආවේ.'

වායා ඇසුවාය. වාහනය මාවත කොනක නවතා ඇති බවක් තවමත් ඇයට දැනුනේ නැත.

'මගේ යාළුවෙක්ගේ වන් මෑන් ෂෝ එකක් තිබුනා යූත් සෙන්ටර් එකේ.. ඒක බලන්න ආවා.'

සර් සිංදුත් අහනවාදැයි අසන්නට වායාට සිතුණි. එහෙත් ඒ වදන් ගිලගෙන වායා ඔහුදෙස බලා විවෘත දෙනෙතින් සිනාසුනාය.

'ඇයි හිනාවෙන්නේ.'

'නෑ නිකම් සර්..'

'නිකම් වෙන්න බෑනේ.'

'සර් සිංදු අහනවා කිව්වම හරි පුදුමයි.'

අසංකට ඒ උකුල මත ඇති සුදු සුරත ගෙන අතගා බලන්නට සිතුනි. ඒ තරමටම ඒ දැඟිලි සුන්දරය. ඔහු සෑහෙන වෙලාවක සිට ඒ දෙස බලා උන්නේය.

'වායා හිතාගෙන ඉන්නේ මං මෝඩ බිස්නස් කාරයෙක් කියලද.'

'අනේ නෑ සර්. කවුද එහෙම හිතුවේ.'

'එහෙනම් සිංදු අහන්න බැරි ඇයි..'

'ඒකහරි නිස්කලංකේ කරන්න ඕන අහිංසක දෙයක්.'

වායා හැඟීම්බරව කීවාය.

'මං අහිංසක නැද්ද වායා.'

වායා ඒහඬින් ගැස්සුනාය. ඇයට ඒ හඬ ඇසුනේ ඒතරමටම දෝංකාරවීය.

'එද හර්ෂණී මිසුත් උන්නද සර්... අපරාදේ මං දක්කේ නැනේ..'

වායා පසුතැවිල්ලෙන් මෙන් කීවාය.

WWW.EXPRESSLANKA.TK 169

'කපටි කෙල්ල මගේ ප්‍රශ්නේ මග ඇරියා නේද.. හරි හරි.. අපි අහිංසක නෑනේ.'

චායා උකුල මත ඇති තම දෑගිලි දෙස බලා සිනාසුනාය. ඔහුට ඕනානම් ලස්සනයි කිවහැක. අහිංසකයි කිව හැක. ඊටත් වඩාදෙයක් ඕනානම් එයද කිව හැක. එහෙත් තමාත් අසංකත් අතර පරතරයක් ඇත. ඒ පරතරය විසින් හදවතේ එකී කොන් වසා දමා ඇත. එය විවර කළ නොහැක.

'අපි යන් සර්..'

අසංක වාහනය ඉදිරියට ගනිද්දී චායාට බැලුනේ උකුල මත තිබූ ඔහුගේ ෆයිල් කවරයදෙසයි. ඒමත තමාගේ නම ඔහු ලීවේ ඇයි.. එය වැඩක් නැති දෙයකැයි හිත දෙතුන් වරක්ම අමතක කරවන්නට හැදුවද චායාට එයම මතක් විය. අසංක වාහනය සෙමෙන් මාර්ගයට දමනා අතරතුර කැසට් යන්ත්‍රය ක්‍රියාත්මක කළේය.

'මං සිංදුත් අහනවද කියලා අහනවා නේද.. ඔන්න අහගන්න.'

අසංක එය දමද්දී ඉන් වාදනය වූයේ ඔහු බැංකුවට යද්දී ඇසූ 'යේ මේරා ප්‍රේම මූපත්‍ර පර්තර්' යන ගීතයමය. චායාගේ දෙනෙත් සැන්ද අහසක්මෙන් බිමට බරව තිබුණි. ඔහු බැංකුවට ගියේ මේ ගීතයට පසුබිම්ව චායාගේ මුහුණ සිහිකරමිනි. දැන් ඒ රූප රාමු සජීවීව දැකගන්නට ලැබීම කොතරම් අපූරුදැයි ඔහු ආශාවෙන් සිතුවේය.

'හරි ලස්සන සිංදුව නේද සර්.. මාත් හරි ආසයි.'

චායා ඔහුදෙස අඩවන්ව බලා කීවාය.

'දැන්වත් පිළිගන්නවද මං අහිංසකයි කියලා.'

ඔහු ඇසුවේ වාහනය විලාසිතාගාරයේ වාහන නැවතුමේ නවතනා ගමන්මය. චායා එක වරක් පමණක් ඔහුදෙස බලා තුනී තොල්පට විහිදු සිනාසුනාය.

'සිංදු ඇහුවත් නැතත් සර් අහිංසකයි.. මං යන්නම් සර්..'

චායා සුවඳ පමණක් ඉතිරිකර වාහනයේ දෙර වසා කඩිමුඩියේම උඩට දිවගියාය. ඇගේ සල්වාර් ඇඳුමෙන් ගැලවුන සුදු මුතු බෝලයක් ඇය ඉඳගෙන උන් ආසනයේ වැටී තිබෙනු දැක අසංක එය අහුලාගත්තේය. ඔහු [illegible] ඇගේ

WWW.EXPRESSLANKA.TK 170

සුවඳ එතරමටම වාහනය ඇතුලත විහිදී තිබූ නිසාය. දවසක ඈත දුරක් මේ සුවඳත් තුරුල්කරගෙන ඇයත් සමඟ යන්නට ඇත්නම් යැයි අසංකට සිතුණි.

ඔහු කල්පනාබරව ඉහළ මාලයට නැග්ගේ වායාගේ ඇඳුමින් ගැලවුන මුතු පබළුව කමිස සාක්කුවේ දමාගෙනමය.

# 19

මෝසම් කාලයක වැහිබර අහසක් මෙන් වායාගේ සිත බරව තිබුණි. අසංකගේ දෙනුවන් දකින හැම වාරයකදීම ඒ බර ගතිය වැඩිවෙයි. ඒ දෙනෙත් මඟහැර යන්නට සිතුනද එවැන්නක් කරන්නට වායාට ලෝබය. එහෙත් මේ කලබලය දරාගන්නට තරම් ඇගේ හිතටත් ශක්තියක් නොවීය. පායන්නට පායන්නට වැහි වළාකුළු වලින් පිරීයන අහසක් මෙන් වායාගේ සිතද සිතුවිලි වලින් බරවිය. ඒ වෙනස වඩාත්ම හොඳින් දුක්කේ නිලංකාය.

දවල් කෑම කද්දී බත් කටක් දෙකක් පමණක් කා බත්පත අතගාන වායා දෙස නිලංකා සෑහෙන වේලාවක සිට බලාඋන්නාය. මේ දුප්පත් කෙල්ලව මේ තරම්ම අසරණ කරන්නට අසංක සර් හිතුවේ ඇයිදැයි ඇයට තේරුමක් නැත.

"වායා.."

නිලංකා කල්පනාබරව බිමට වැටුන වායාගේ දෙනෙත් දෙස බලා කතාකළාය.

"මොනවද කෙල්ලේ හිතේ හිර කරගෙන දුක්විදින්නේ.. බත් ටිකවත් හරියට කෑවේ නෑ.."

වායා හිස ඔසවා ආයාසයෙන් සිනාසුනාය. ඒ සිනහව වෙනදටත්

වඩා දුක්බර යැයි තිලංකාට සිතුණි.

'කන්න බඩගින්නක් නෑ තිලංකා.'

කුඩා මේසය මත තිබූ චායාගේ අතමත තිලංකා මෘදුව ඇගේ අත තැබුවාය.

'මොකක් හරි ප්‍රශ්නයක් නේද.. මට කියන්න තරම් මම හොඳ යාළුවෙක් නෙමේද..'

තිලංකා චායාගේ ඇහිලි මිරිකා ඇසුවාය.

'හිතට හරි අමුතුයි තිලංකා. වෙලාවකට හරි බයක් දැනෙනවා. මං මේ රස්සාවට හරි ආදරෙයි තිලංකා.. මට බයයි.'

චායාට ඇඬුණි. ඇගේ දෙනෙත් වලින් කඳුළු කැට දෙකක් පැන්නේ තිලංකා බලාගෙන ඉඳිද්දීමය.

'සර් මොනවද චායා කිව්වේ.'

තිලංකා ඉවසිල්ලෙන් ඇසුවාය.

'නැහැ මුකුත් නැහැ..'

'එහෙනම් අඬන්නේ.'

'නිකං තිලංකා..'

චායා කන්නට ගත් බත් මුල එහෙමම නවාගත්තාය. තිලංකා නැගිටින්නට ගිය චායාව අත තදකර නැවැත්වූවාය.

'සර් නරක කොල්ලෙක් නෙවේ චායා..'

තිලංකා චායාගේ දෙනෙත් දෙසම බලා කීවාය. චායා දෙනෙත් ලොකු කරගත්තාය.

'මං දන්නවා තිලංකා.. ඒත් සිද්ධ වෙන්නේ මොනවද කියලා මට තේරෙන්නෑ තිලංකා.. අපි දුප්පත් කෙල්ලෝ.. මට ඉන්නේ මගේ අසරණ අම්මා විතරයි...'

'උඹ අඬන්නෙපා.. අපි පස්සෙ වෙලාවක තිස්කලංකේ කතාකරමු.. ඒත් එකක්..'

තිලංකා ඉඳුල් තැවරුන දඹරැගිල්ල දිගුකළාය.

'මොකක්ද'.

'ඉස්සර වගේ හිනාවෙලා හිටපන්. බලන්න බොරුද කියලා.. මැඩමුත් ඔයාගෙන් ළඟදීම අහයි. ඇයි වායා කියලා.. ප්‍රශ්න එන්න කලින් ප්‍රශ්න ඔළුවට පටව ගන්න එපා කෙල්ලේ.. තේරුණාද.'

වායා යළිත් කාර්යාලය තුළට ගියේ මුහුණ සෝදගෙන අලුත් පුයර බිඳක් මුහුණේ තවරාගෙනමය. වායා ඇතුල් වෙද්දී රණතුංග මහත්මිය උන්නේ දහවල් ආහාරය ගනිමිනි. වායා හිස්ව තිබූ වතුර වීදුරුවට ඩිකැන්ටරයෙන් වතුර පිරෙව්වාය. ඇයට අසංකගේ කාමරය දෙස බැලුනේ ඉබේටමය.

'සර් කෑම කන්නැද්ද මැඩම්..'

වායාට ඇසිණි. ඒ හඬ අසංකට පවා ඇසෙන්නේ නැත. ඔහු උන්නේ වායාට පිටුපා හිස බිමට බර කරගෙනය. 'අද හරි අමුතුයි..'..

'ඊයේ රෑ ඉඳලා බඩ දැවිල්ල.. රෑට කෑවෙත් නෑ. උදේට කෑවෙත් නෑ.. එයා නොකා මටත් කෑමක් නෑ වායා. මම මේ බෙහෙත් ටික බොන්න ඕන නිසා බත් කටක් කෑවේ..'

වායාගේ පපුව පිච්චීගෙන ගියේ ඉබේටමය. දවල්ට බත් කටක්වත් කෑවේ අපරාදේ කියා ඇයට සිතුණි.

'මං අහලා තේකක් හදලා දෙන්නද මැඩම්..'

වායා වේදනාබරව ඇසූවාය. මේ තරම්ම පපුව ඇවිලෙමින් යන්නේ ඇයිදැයි ඇයට තේරුමක් නැත.

'එහෙනම් කිරි එකක්වත් අහලා හදලා දෙන්න වායා.. එක්කෝ නොකා ඉඳලා ගෑස් ඇවිත් නැත්නම් කා එක්ක හරි පාර්ලිමන්ට් ග්‍රවුන්ඩ් ගිහින් ඩ්‍රින්ක්ස් අරගෙන..'

වායා අසංකගේ කාමරය වෙත ගියේ තුනී තෙතමනයකින් දෙනෙත් කැවෙද්දීය. එසේ වන්නේ ඇයිදැයි කියා ඇයට තේරුමක් නැත.

'ස..ර්..'

වායා කතාකළේ බිඳුණු හඬිණි. අසංක මුහුණ හරවද්දී ඇයට හීල්ලිනා. වෙනද හිනා පොකුරු පිටින් පිපී ඇති ඒ මුහුණ අද පරව ගොස්ය.

WWW.EXPRESSLANKA.TK 173

"ගොඩාක් අමාරුද සර්.."

අසංක ආයාසයෙන් සිනාසෙන්නට වෙර දැරුවේය. ඒ හිනාව වෙනදා හිනාව නොවේ. චායාට ඇත්තටම මහා දුකක් දැනුණි. මේ කවර ආත්මයක ඇතිවූ බැඳීමක්ද..

"බඩ හරි දැවිල්ලයි චායා.. කන්න බෑ.. හරි අප්පිරියයි.. ඊයේ රෑ බිස්කට් එකක් කන්න ගත්තා.. වමනෙ ගියා.."

ඔහු කියවාගෙන ගියේ පොඩි දරුවෙකු මෙන්ය. චායාට මහා ලෝබකමක් දැනුණි. ඒ කුමක්ගැනදැයි ඇය දන්නේ නැත.

"හරි බඩගිනියි.. ඒත් කන්න බෑ."

පපුව හෝස් ගා අවුළුවන්නට තරම් ඒවචන වල ඇති ගින්දර කුමක්දැයි චායා සිතුවාය.

"අපි බත් ටිකක් කමු සර්.. බලන්න මැඩමුත් කාලා නෑ."

"චායා කෑවද.."

ඒ ප්‍රශ්නයට චායාගේ හිත වේදනාවෙන් බරවිය. ඇය ටික වේලාවක් ඔහුදෙස බලාඋන්නාය.

"දන්නව නම් මං කන්නේ නෑ සර්."

"ඔය ඇත්තමද."

"ඔව්."

වේල් ගණනක් බඩගින්නේ උන් කුස ඒ එක වචනයකට පිරී ගියාක්වැනියැයි ඔහුට සිතුණි. මේ කෙල්ල මට ලැබෙනව නම් යැයි ඔහු ආශාවෙන් සිතුවේය.

"බත් කන්න බෑ චායා.."

"ශාන්ති විහාර් එකෙන් තෝසේ ගෙනත් දෙන්නද.."

චායාට එසේ ඇසුනේ ඔහුගේ ප්‍රියතම අවන්හල එය නිසාය. අසංක සිනාසී බිමබලාගත්තේ ලැජ්ජාවෙනි.

"බෑ චායා.. ඒකට බඩේ අමාරු වැඩිවෙනවා.. උන් තලතෙල් බැරල් එකක් දනවා."

"එහෙනම් කිරි එක්ක...බිස්කට් මොනාහරි ගෙනල්ලා ඒකත්

WWW.EXPRESSLANKA.TK 174

එක්කම බොන්න..'

අයංකා කිසිවක් කීවේ නැත. ඔහුගේ ඇතුළු හද ගැබේ කොත් තුන හතරක් ඇකිලීයමින් තිබුණි. ජීවිතයේ ප්‍රථම වරට ගැහැණු ආත්මයක සුවඳකින් ඔහුගේ ආත්මය තෙමෙමින් තෙතබරියම් වෙමින් තිබුණි.

තේ හදන්නට හීටරය ගසා චායා පුටුවට බරවූවාය. නිලංකා කාමරයට එබුනේ ඒත් සමඟමය.

'කාටද තේ..'

'සර්ට..'

චායා බිඳුනු හඬින් කීවාය.

'ඇයි.. දුකෙන් වගේ. අනික මේ බත් කන වෙලාවනේ..'

'සර්ට සනීප නැහැ නිලංකා.'

ළපටි කම්බුල් වලට හදවතේ හැඟීම් හැංගිය නොහැකි යැයි නිලංකාට නිකමට සිතුණි. ඒ මුහුණේ බේරෙමින් පවතින්නේ දුකද.. ආදරයද.. ළෙන්ගතුකමද කියා ඇයට තේරුමක් නැත.

'සර්ට ගොඩාක් අමාරුද චායා.'

'ඊයේ රෑටත් කාලානෑ.. උදේටත් කාලා නෑ.. දුන්නුත් බඩගින්නේ ඉන්නේ..'

'ඉතින් ඇයි උඹේ ඇස්වල මේ කඳුළු..'

නිලංකා කියද්දී චායා වැර යොදා සිනාසෙන්නට උත්සාහ ගත්තාය.

'මට දුක හිතුනා නිලංකා.. පව් සර් බඩගින්නේ ඉඳිද්දී අපි කෑවේ.'

මේ ආදරය නොවේනම් කුමක්දැයි නිලංකා සිතුවාය. ඇය සිනාසුනේ නැත. සමච්චලයට බැලුවේද නැත.

'ඕකට තව මොනාහරි චුට්ටකුත් එකතු කරලම දෙන්න.'

නිලංකා හැඟීම්බරව බිම බලාගෙන තේක හැදීගාන චායා දෙස බලා කීවාය.

'මොනවද නිලංකා'

WWW.EXPRESSLANKA.TK 175

"ආ..ද..රේ..."

තිලංකා කීවේ වායාගේ දෙඋරහිසට පිටුපසින් අත්දෙකම තබා ඒ මූහුණට බරවය.

"ඒක එකතු කරන්න කෙනෙක් ඉන්නවා තිලංකා.. මට පුළුවන් ගෞරවය.. භක්තිය.. ම්. වැඩිම උනොත් පුංචි හිතවත්කමක් එකතු කරන්න."

වායා දෙතොල්පට තද කර කීවාය.

"ඔය ඔක්කොම වචන බොරු බබා.."

"සර්ගේ ජීවිතේට එච්චර දෙයක් එකතුකරන්න මේ දුප්පත් වායාට බෑ තිලංකා... උඹ මම පුංචි පූසි පැටව්. තේරුණාද.."

ඇය එසේ කියාගෙන ගියාය. වායාගේ කතාව හරියට හරියැයි තිලංකාට සිතුණි. පඳුවට දනෙන හැඟීම් මොනතරම් වුවද ලෝකය මැවූ දෛවයක් ඇත. ඒ දෛවය මැද හැමදමත් හැබෑ ආදරවන්තයෝ අසරණ විය.

"කිරි එක බීලා ඉන්න සර්.."

අසංක මේසයට හිස ගසාගෙන ඉඳිද්දී වායා මේසය අද්දරටම පැමිණ කීවාය. ඔහු හිස එසවූයේ නැත.

"නිදිද වායා.."

රණතුංග මහත්මියද කාමරය එමින් සිට ඇසුවාය.

"පුතා.. ඇයි රත්තරන් මේ.."

රණතුංග මහත්මිය අසංකගේ මුහුණ දුතින්ම ඔසවා ඇසුවාය.

"මට අමාරුයි අම්මේ.. බඩ පිච්චෙනවා වගේ.."

රණතුංග මහත්මියගේ දෑස්වල කඳුළු බොඳව ගියේත් වායාගේ දෙනෙත් වල කඳුළු පිරුණේත් එකමවිටය.

"වායා.. මං ඩොක්ටර්ට කෝල් කරන්නම්.. ඔයා ඔය කිරි ටික පොවන්න සර්ට.."

ඇය අසරණ හඬින් කීවාය. වායා පීරිසියට කිරි ටිකක් දමා මුවින් පිඹ නිවා අසංකගේ මුවට ළං කළාය.

WWW.EXPRESSLANKA.TK 176

'බොන්න සර්.. කිරි බිව්වාම බඩ දැවිල්ල අඩුවෙනවා.'

ඇය කාරුණිකව කීවාය. අසංකගේ මුහුණ ඇයට බලාඉන්නට බැරිතරම්ය. අමාරුවෙන් කිරි පීරිසිය බොද්දී අසංක චායාගේ දෙනෙත්වල බොඳව යන තෙතමනය හොඳින් දුටුවේය.

'තව ටිකක් බොන්න සර්..'

දරුපැටියෙකු සේ කිරි පීරිසිය බොන අසංකගේ හිස අතගාන්නට තරම් ආදරයක් චායාගේ පපුවට දැනුණි. ඇය ඒ හැඟීම් මැඩගත්තේ අසීරුවෙනි.

'දැන් අඩුද පුතා..'

රණතුංග මහත්මිය අසංකගේ හිස පිරිමැද ඇසුවාය.

'කිරි එක බිව්වට පස්සේ අඩුයි අම්මා.'

අසංක කීවේ චායා දෙස කෘතඥතා පූර්වකව බලාය.

'සර්ට හැදිලා තියෙන්නේ ගැස්ට්‍රයිටීස් වෙන්න ඇති මැඩම්. වෙලාවට කන්නැතේ. ඉතින් බඩයි පපුවයි දැවිල්ල ගන්නවා.'

'ඩොක්ටරුත් නෑ ගෙදර. අපි බෙහෙත් ටිකක් ගන්න යන්ද පුතා.'

'එපා අම්මා.. හවස බලලා ගමු.. දැන් ටිකක් හොඳයි.'

රණතුංග මහත්මිය අසංකගේ හිසඅතගෑවේ උතුරා ගිය සෙනෙහසිනි.

'සර්ව බලාගන්න මට දැන් බෑ චායා.. සර් දැන් ලොකු වැඩියි. ඉන්නකෝ ඔයාලටත් ඉක්මණට කේක් කෑල්ලක් කන්න දෙන්න.'

ඇය කියද්දී අසංක බැලුවේ චායා දෙසය. තුනී පතුරක් පපුවෙන් ගැලවී ගියාක්මෙන් චායාගේ පපුව මොහොතකට වේදනාවෙන් බරවිය. චායා තවත් වරක් අසංක දෙස බලා හිස් කිරි කෝප්පයත් රැගෙන රණතුංග මහත්මියත් සමඟම කාමරයෙන් පිටවන්නට හැදුවාය.

'චායා..'

ඇය නැවතුනේ අසංකගේ හඬිනි. දැන් ඒ මුහුණේ අමාරු පාටක් නැත.

'ඇයි මූණ කළුවෙලා.'

WWW.EXPRESSLANKA.TK 177

ඔහුගේ කතාවට චායාට උත්තරයක් නැතිවිය. ඇය බිම බලාගත්තාය.

'මට ඔය වගේ තව කිරි කෝපි එකක් හදලා ගෙනත් දෙනවද.'

'අනේ ඉක්මණට අරගෙන එන්නම් සර්..'

චායා යළිත් යන්නට සැරසුනාය. ඔහු අතින් ඇයව නැවැත්විය.

'මොනවද ඕකට දැම්මේ.'

'කිරියි කෝපියි සීනියි සර්.. ඇයි.'

ඇය පුදුමයෙන් ඇසුවාය.

'වෙන මොනවත්ම දැම්මේ නැත්ද.'

චායාට නිලංකා තේක හදද්දී කියූ වදන් සිහිවිය.

'මොනාහරි දැම්මා නම් ඒවා දලම තව එකක් හදලා ගේන්න හොඳේ..'

ඔහු ලෙඩ ඇස්දෙක ලොකු කර කීවේය. චායා කාමරයෙන් පිටවූයේ මෘදුව මුවගට ආ සිනාව දෙතොල්පට තද කර දරාගෙනමය.

# 20

අසංක බැල්කනියට ආවේ උඩුමහලේ එතෙක් දල්වෙමින් තිබූ විදුලි පහනද නිවාගෙනමය. බියර් කෑන් එකක්ද අතැතිව බැල්කනියට ගොඩවූ අසංක ජීවිතයේ ප්‍රථම වරට මෘදු සඳ එළිය විහිදෙන රෑ අහසක චමත්කාරය හදවතින් රස වින්දේය. මේ රෑ අහස පමණක් නොව ජීවිතයේ බොහෝද්‍ද තමා රස විඳ නොමැතිබව ඔහුට අවබෝධවන්නේ දැන්ය. ගෙවාදැමූ යොවුන් ජීවිතයේ වසර දහයක් ආපස්සට ගොස් එසේ රස විඳින්නට අමතක වූ බොහෝදේ විඳගෙන විඳගෙන එන්නට ඇත්නම් යැයි ඔහුට සිතුණි. හදවතේ එතෙක් වසාතිබූ

මේ ආදරබර දෙරගුළු විවර කළේ කවිරුන් විසින්දැයි ඔහු හුදෙකලාවේම සිතුවේය. තම හදවතේ තමාවත් පය නොතැබූ ඒ ආදරණීය ඉසව්වේ නොකියාම ඇවිදින මෘදු දෙපායුවළ කාගේදැයි ඔහු සිතුවේය.

එතෙක් වේලා උඩුකය වැසුන කමිසය ගලවා අසංක බැල්කනියේ තබා තිබූ වේවැල් පුටුවට බරවූයේ රාත්‍රී මනමාල සුළඟේ සිසිලස නිරුවත් පපුවෙන්ම විඳගන්නට සිතාගෙන මෙනි. ඔහු මෙසේ බැල්කනියට ආවේ පැයක් පමණ වේලා නානකාමරයට වැදී නෑමෙන් අනතුරුවය. නෑමෙන් පසුව හිතටත් ගතටත් දනෙන රසබර නැවුම් බව මේ තරම් සුන්දරයැයි ඔහු මීට පෙර අත්දැක නැත.

සීතල බියර් ටින් එක විවරකර ඔහු ඉන් උගුරක් මුවට හලාගත්තේ ආශාවෙනි. සීතල බියර් පොද පහළට ගියේ මුවත් උගුරත් අමුතුම සුන්දරත්වයකින් සීතලකරගෙනය. වේලාව මධ්‍යම රාත්‍රියට ආසන්න වුවද අසංකට නින්දස් අහලකවත් තිබුනේ නැත. මෙසේ නිදි නොලබා රැයක් ඇහැරී යමක් කල්පනාකළ දිනයක් තමාගේ ජීවිතයේ කෙදිනකවත් නොතිබූ බව අසංක සිහිකළේ පුදුමයෙනි.

මේ රැය පුරාම ඇහැරී සිතන්නට යමක් ඇතැයි ඔහුගේ සිත ඔහුට කීවේය. එහෙත් ඒ කුමක්දැයි සිත කීවේ නැත. එහෙත් සිත තිබුනේ මහා ගලක් ඔසවාගෙන ඉන්නාක් බඳුව බරකිනි. හවස සිදුවූ සිදුවීම් සියල්ලම එක පෙළට තබා සිතන්නට අසංක වෙර ගත්තේය. අද සවස ඔහු දුක්කේ ඔහුගේ යොවුන් ජීවිතය නම්වූ සිනමා පටයේ හමුවුන ආදරණීයම රූප රාමු පෙළකි. ඒ සියල්ල අසංක සිහිකළේ දුප්පත් අහිංසක රසිකයෙකු මෙන් ආශාවෙනි. පරිස්සමිනි. සැබැවින්ම ඔහුට මේ සියල්ල එකම රැයකින් සිනා අහවර කර දමන්නට ලෝබ සිතුණි.

දහවලේ අසනීප වූ මොහොතේදී චායාගේ දෙනෙත්වල තැවරී තිබූ නෙනමනය අසංකට හොඳින් මතකය. ඔහුට බැරිවූයේ ඒ නෙනමනය රැඳුන දෙනෙත් අතගා බලන්නට පමණි. පීරිසියෙන් කිරි පොවද්දී අසංක චායාගේ මුහුණ අන් කවරදාටත් වඩා සමීපව දැකගත්තේය. පිරිමි ඇස් දෙකක් ගැහැණු මුහුණකින් සොයන සියල්ල ඒමුහුණේ තිබුනායැයි ඔහු සිතුවේය. තම හදවත ආයෝජනය කරන්නේ ආදරය නම්වූ ව්‍යාපාරයේ නම් ඒ ආයෝජනය වෙනුවෙන් ලැබිය හැකි ඉහළම

WWW.EXPRESSLANKA.TK 179

ලාභය එවන් මුහුණකි.

එහෙත් දෛවය අසංකගේ ජීවිතයේ ලාභ අලාභ ගිණුම් සියල්ලම කළින්ම හද තිබුණි. තම හදවත ඒ ව්‍යාපාරයට ආයෝජනය කළද නොකළද ලැබෙන ලාභය ඔහු කළින්ම දැනගෙන උන්නේය. ජීවිතයේ තීරණ වේලාසනින්ම ගන්නට අම්මාට වුව ඉඩ දුන්නේ අපරාදේ යැයි ඔහු සිතුවේය. අතීත් අතට ඡායා හමුවනතුරු ඒ මුහුණ මේ තරම් ප්‍රබල ලෙස තමාව වශී කරන්නට ප්‍රථම තමාත් ඒ තීරණය ගෙන තිබූ බව ඔහුට සිහිවිය.

ඡායාත් හර්ෂණීත් හදවතේ දෙපැත්තට දමා ආදරයේ බර මිණුම් වලට අනුකූලව කිරා බලන්නට තරම් අසංක හදිසි නොවීය. මේ හදවත පිබිදවූයේ ඡායාය. ඒ නිසා හදවත ඇගේ කොටස ආශාවෙන් වැළඳ ගන්නාබව ඔහුට හොඳටම විශ්වාසය. හිතට මේ දැනෙන නොසන්සුන් හැඟීම් ආදරය බව අසංකට වැටහුනේ ඇත්තටම අද නොවේ. ඡායා ඇතුළු හදගැබේ එහාට මෙහාට යන්නට පටන්ගත් මුල්දිනවලමය. ආදරයෙන් පිස්සු වැටුන අසංක නම්වූ ආදරවන්තයාගේ අසරණ මුහුණ ඔහු දකගත්තේ ඡායාගේ හීන් දෙනෙත් වලිනි. ඒ ඇස්වල ඉන්නේ තමාම බව සහතික කරගන්නට ඔහුට අවශ්‍ය නොවීය.

හර්ෂණී තම අනාගත සහකාරිය ලෙය තෝරා දුන් තම දෛවය මොනතරම් අසාධාරණදැයි අසංකට වැටහෙන්නේ දැන්ය. මුලින්ම බාල සහෝදරියක් ලෙයද පසුව සමවයසේ මිතුරියක් ලෙසද ඊටත් පසුව අනාගතය කෙරේදැඩිව බලපාන යුවතියක් ලෙසද හඳුනාගත් හර්ෂණී ගැන විශේෂයෙන් යමක් සිතා ගොනු කරන්නට තවමත් අසංකට නොහැක. හර්ෂණී තම ජීවිතයේ ප්‍රශ්නයත් පිළිතුරත් එකට දුන් වැඩක් නැති ප්‍රශ්න පත්‍රයක් වැනියැයි අසංකට දැන් හිතෙයි. දෛවයේ තීරණාත්මකම විභාගයේදී ඔහුට කළයුතු කිසිවක් ඒ ප්‍රශ්න පත්‍රයේ නොවීය. අඩුම තරමේ ඒ විභාගයේදී උත්තර කුනක්වත් දුන්නාතම් ඉන් එකක්වත් තෝරාගන්නට තිබුණි. එවැන්නක්ද නැත. ලකුණු මොනතරම් ලැබෙනමුත් එවන් විභාගයක ප්‍රතිඵල දකිද්දී සතුටක් නැත.

තම අනාගත ජීවිතය හමුවේ ඇත්තේ එසේ සංස්කරණය කළ නොහැකි සැනසිය නොහැකි දෛවයක් බව ඔහු සිතුවේ ශෝකයෙනි.

WWW.EXPRESSLANKA.TK 180

ඔහු ඊට වඩා හැඟීම්බර පෙම්වතෙකු තමා තුලින් දුටුවේය. චායාව දකින දකින වාරයක් වාරයක් පාසා පපුව පුච්චාගන්නා ඒ ලාබාල ආදරවන්තයාට ඔහු අසීමිතව ආදරය කළේය. එහෙත් ඒ ආදරවන්තයාට සදකාලිකව තම ජීවිතයේ ලැගුම් ගත හැකිද....

තමාගේත් හර්ෂණීගේත් විවාහය තමා හිතනවාටත් වඩා ඉක්මනින් සිදුවෙන බව දුන් අසංකට විශ්වාසය. ඒ විවාහය තම ජීවිතයේ සිදුවිය යුතුම විවාහයක්දැයි ඔහු සිතුවේය. අනාගතය සම්බන්ධ සියළු තීරණ ගත් පසු චායා වැන්නියක්ව තමා ඉදිරිපිටට ගෙනආවේ ඇයිදැයි ඔහු තම දෛවයෙන් ප්‍රශ්න් කළේය. තමා සේම තම හදවත සේම තම දෛවයද මේ ප්‍රශ්නයේදී හිරවීම පුදුමාකාරය.

ඕනෑ නම් හර්ෂණීට පිටුපෑ හැක. එහෙත් අසංකට හර්ෂණී පිටුපස ඇති බැදීම් වලට ගැරහිය නොහැක. ඒ තරම් ගුණමකුවෙකු වන්නට ඔහුගේ හදවත ඔහුට ඉඩ නොදෙයි. අම්මා චායාට ආදරය කරද්දී ඇයට විශේෂත්වයෙන් සිතා සළකද්දී අසංකට මහා ලෝබකමක් දැනෙයි. එහෙත් අම්මා චායා දකින්නේ ඇයට ජීවිතයේ හමුවූ හොදම සේවිකාව ලෙයින් විනා තම අනාගත ලේලිය ලෙසින් නොවේ. චායා මොනතරම් හොද වුවද අම්මා ඊට වඩා බිදක්වත් හර්ෂණීට ආදරේ බව ඔහු දනී. ජීවිත මංතලාවේ තට්ට තනියම අසරණ අම්මා කෙනෙකු සමඟ ජීවත්වන චායා ගැන ඒතරම් සමීපව සිතන්නට අම්මාට බල කරන්නට අසංකට සිතෙයි.

සමහර විට එවැන්නකින් සිදුවන්නේ අම්මාගේ හිත රිදීම පමණි. ජීවිත මංතලාවේ මේතරම් දුරක් පැමිණ එසේ කිරීම අසාධාරණ බව ඔහු දනී. ආත්මයේ ගැඹුරුම පතුලක සිදුවෙමින් පවතින මේ සියල්ල කෙදිනක හෝ තම සිතට මහා බරක් වන බවද ඔහු දනී.

අසංක බියර් ටින් එකේවූ අවසාන බියර් උගුරද බී ටින් එක සුරතින් තදකළේය. බියර් ටින් එකේ තුනී තහඩු ඔහුගේ ඇගිලි තුඩු වලට පොඩිපට්ටම් වී ගියේ ඉබේටමය.

අනාගතයක් ගැන නොහිතා බැදීම් ඇතිකර ගත හැකිද. අනාගතයක් නැති බැදීමක ඇති පින්බර බව කුමක්ද. බැදීමක් නැති එක්වීමක ඇති අනාගතය කුමක්ද.. මේ සියළු ප්‍රශ්න වලට පිළිතුරු අසංක හොඳින් දැනගත්තේය. එහෙත් ඒ පිළිතුර හදවතින් ගන්නට

WWW.EXPRESSLANKA.TK 181

දෛවයේ මේ කටුක යථාර්ථය පිළිගන්නට ඔහු මැලිවිය.

චායා මේ රෑ මොනවා කරනවා ඇත්දැයි අසංක අඳුරේම සිනාසී සිතුවේය. ඇය මේ කිසිවක් නොදන්නේ යැයි ඔහු සිතුවේ වේදනාවෙනි. එහෙත් කිසිවක් නොදන්නේ නම් දවල් තමා අසනීප වූ විට ඒ ඇස්වල කඳුළු පිරුනේ ඇයිදැයි ඔහු සිතුවේය.

රණතුංග මහත්මිය අසංකව සොයා උඩුමහලේ කාමරයට ආවේ ඔහුගේ අසනීපය විමසනු පිණිසය. අසංක කාමරයේ නොවූ තැන ඇය පුදුම වූවාය; "මේ ළමයා මේ රෑ ඇහැරගෙන මොනවද කරන්නේ.." යැයි සිතමින් ඇය බැල්කනියට ගොඩවූවාය. අසංක කට්ට කළුවරේ තනිවී රෑ අහස දෙස බලාගෙන කල්පනා කරනු ඇය බැල්කනියේ දොර ළඟදීම දුටුවාය. දශක තුනකටත් වැඩි කාලයක් ඔහුත් සමඟම ජීවත්වූ ඇයට මේ දර්ශනය ඇත්තටම අමුතුය. මෙවැනි රෑක ඇහැරී කල්පනා කරන්නට යමක් ඔහුගේ ජීවිතයේ ඇතැයි ඇය කෙදිනකවත් සිතුවේ නැත. ඔහුට නිස්කලංකයේ ඉන්නට දී යන්නටත් සිතා නැවතත් ඇය අසංක වෙත පියනැගුවාය. අසංක අම්මා ළඟටම එනතුරු ඇයව දුටුවේ නැත.

"පුතා.. මොකද දරුවෝ මේ රෑ ඇහැරගෙන කරන්නේ."

ඇය ඇසුවේ අසංකගේ හිස මෘදුව අතගාමිනි.

"මේ රෑ පුතා නැවද.."

අසංකගේ කොණ්ඩයේ වූ තෙත ගතිය දැනී ඇය ඇසුවාය.

"ඇඟ හෝදද්දී ඔළුවටත් ගියා අම්මේ.. හිතලා නැවේ නෑ."

ඔහු අම්මා වෙතට නොහැරීම කීවේ හුරතල් ස්වරයෙනි.

"ඇයි පුතා මොකක් හරි ප්‍රශ්නයක්ද ඔයාට.."

රණතුංග මහත්මිය රෑ මඳ එළියෙන් පුතුගේ මුහුණ දෙස සීරුවෙන් බලා ඇසුවාය. අම්මාගේ ඉව ගැන ඇත්තටම අසංක පුදුම විය.

"එහෙම මුකුත් නෑ අම්මා.. නින්ද යන්නැති නිසා බැල්කනියට ආවේ.."

"ඒක තමා මාත් ඇහුවේ ඇයි නින්ද යන්නැත්තේ."

"ළඟකදී ඉඳලා රෑට නින්දයනවා හොරයි අම්මේ."

අසංක කීවේ ඇත්තය. නින්ද නොයනවාද නැත්නම් නින්ද යන්නට තිබූ කියන හිත ඇහැරුනාද කියා ඔහුවත් දන්නේනැත.

'පුතා මට මොනාහරි භංගනවා..'

ඇය සැකයෙන් අසංක වෙත හැරී කීවාය. ඇය අවශ්‍ය ප්‍රමාණයටත් වඩා අසංකව තේරුම් ගෙන උන්නාය.

'ම..ම.. මම අම්මට මොනා භංගන්නද.'

අසංකගේ වචන රණතුංග මහත්මිය විශ්වාස නොකළද ඇය කිසිවක් කීවේ නැත. තරුණ හිතකට කල්පනා කරන්නට දෙයක් නැතිවීමත් කල්පනා කරන්නට මාතෘකාවක් බව ඇය දනගෙන උන්නාය. තරුණ හිතක් දීර්ඝ කාලයක් හිස්ව තැබීම භයානක බව ඇය තේරුම් ගෙන උන්නාය. 'පුළුවන් ඉක්මණට අර කෙල්ලව මේ ගෙදරට ගේන්න ඕනා..' යැයි ඇය සිතුවේ එබැවිනි. විවාහයකින් පසුවත් තරුණ හිතක් හිස්වන්නේ කලාතුරකිනි.

'කල්පනා කරන දෙයක් දන්මම කල්පනා කරලා ඉවර කරලා දන එක හොඳයි.'

'කල්පනා කරන්න දෙයක්නෑ අම්මා.. අම්මා ඇවිත් ඔළුවත් අවුල්කරනවානේ.'

අසංක නාහෙන් අඬන්නාක් මෙන් කීවේය. රණතුංග මහත්මිය සිනාසුනේ කරුණාබරවය.

'හිතේ මුකුත් නැත්නම් අලුතෙන් අවුල් වෙන්න දෙයක් නෑ පුතා. හිතේ එක එක දේවල් පුරව ගත්තහම තමයි ඔළුව හැම වෙලාවෙම අවුල් වෙන්නේ.. තේරුණාද.'

අම්මා කියන්නේ ඇත්ත යැයි අසංකට සිතුණි. හිතේ මොන මොනවද පිරී ඇත. සමහරවිට ඕනාවටත් වඩා පිරී ඇත. බලං ඉඳිද්දී හිත හැඩි වන්නේ ඒ නියායය.

'පුතා වෙඩින් එකට. ලෑස්ති වෙලා නේද ඉන්නේ..'

අම්මා නොහිතූ මොහොතක අසද්දී ඔහුට පුදුම සිතුණි. මේ මහ රෑ පැමිණ විවාහයක් ගැන කියවන්නේ අම්මාට මොනවා හෝ දනීවත්ද කියා ඔහු සිතුවේ බියෙනි.

WWW.EXPRESSLANKA.TK 183

'ලැස්තියි අම්මා.. ලැස්තියි.'

ඔහු කීවේ පුංචි කාලයේ දෙස්තර මහතා ළඟට යන්නට සූදානම් වී කියන්නාක් බඳු කරදර කාරී ස්වරයෙනි.

'කසාදෙකට ලැස්තිවෙන්න ඕනා හිතින් පුතා. හරියටම කිව්වොත් මුළු හිතින්ම.. එතකොට තමයි ඒ ජීවිතේ සාර්ථකවෙන්නේ.'

තමාගේ සිත එවැන්නකට සූදානම් නැතැයි කියන්නට ඔහුට සිතුණි. එහෙත් ඔහු කරබා ගත්තේය.

'මං ලැස්තියි අම්මා.. ඒත්.'

අසංක යමක් කියන්නට ගොස් ගිලගත්තේය.

'ඇයි පුතා ඒත් කිව්වේ.'

'මම.. හර්ෂණීවමද බඳින්න ඕනේ.'

ඔහුගේ කතාව රණතුංග මහත්මියව අවුල් කළාය. ඇය අසංකගේ නිරුවත් උරහිසට වියපත් දෑරත තබා ඔහු වෙතට එබුනේ ශෝකයෙනි.

'ඇයි පුතා එහෙම අහන්නේ..'

'අපි අතරත් නොගැළපීම් තියෙනවා අම්මේ.'

රණතුංග මහත්මිය අසංක වෙතින් මිදී බැල්කනිය වටා ඉදිකළ කෙටි තාප්පයට බරවූවාය.

'ජීවිතේ ගැන ඕනවට වඩා සීරියස්ව හිතන්න එපා පුතා. නොහිතා ඉන්නත් එපා. නොගැළපෙන දේවල් වැඩිනම් එතනත් ප්‍රශ්නයක් තමා. ඒත් හර්ෂණී මෝඩ කෙල්ල උනාට ඔයා බුද්ධිමත්. කෙල්ලෙක්ව හදලා ගන්නබැරි කොල්ලෙක් නෙවී ඔයා..'

අසංක නිහඬවිය. අම්මා සමග මේවා කතාකරන්නට යාම මෝඩකමකි.

'පුතා මොකක් හරි හංගගෙන ඔයකතා කරන්නේ. මට හොඳට තේරෙනවා.'

අම්මාගේ කතාවෙන් අසංක ගැස්සිණ. හදවතේ නොඇරුන ඒ පැත්ත අම්මා ඉදිරියේ වත් විවර නොකරන්නට ඔහු සිතාගත්තේය.

'[illegible] අම්මා.'

WWW.EXPRESSLANKA.TK 184

`මෝඩ කොල්ලා.. දුන් හිත හිත ඉන්න පුළුවන් කාලයක්ද. දුන් ආදරේ කරන්න ඕන කාලේ. පිස්සු මනස්ගාත එහෙම මේ වෙලාවේ ඔළුවට දගන්නෑ තේරුණාද. මට බෑ ගුණමකු ගෑණියෙක් වෙන්න. මං ඔයාට එහෙම වෙන්න ඉඩ තියන්නෙත් නෑ. හැමදේම පිළිවෙලට හදලා ඉවර වුනාට පස්සේ අවුල් කරන්නෙපා.`

අසංක සුසුමක් පිට කොට කරබා ගත්තාය. තමාගේ ජීවිතයේ ප්‍රබලම තීරණය තමාට ගන්නටඉඩ දෙන්න යැයි කියන්නට ඔහුට සිතුනි. එහෙත් එසේ කිවනොහැක. මේ තීරණ ගත්තේ තමාත් පසුදැරිවය.

`යන්න ගිහිල්ලා නිදගන්න. දූන් රෑ දොළහත් පහුවෙලා. නින්ද යන්නැත්නම් කිරි එකක් හදලා ගේන්නද.`

ඇය දයාවෙන් ඇසුවාය. අසංකට අම්මා ගැන දුකක් දැනුණි.

`එපා අම්මේ,, අම්මා යන්න ගිහිල්ලා නිදගන්න. මං ටිකක් ඉඳලා එන්නම්. මෙතන සනීපයි...`

රණතුංග මහත්මිය ගියපසුව අසංක දෙනෙත් පියාගෙනම වේවැල් පුටුවට තවත් බරවිය.

# 21

සිංහල අලුත් අවුරුදු උත්සව සමය ඇරඹුනේ මේ සමයේමය. චායා ඒ දින කිහිපයේ ඇහැරුනේ පාන්දර හතරටය. ඇය පාන්දර සීතලද නොතකා නෑවාය. පුංචි ළිඳේ දවස වෙනුවෙන් තැනූ අලුත්ම වතුර පොද ඇගේ යොවුන් වත වෙනස්ම සීතලකින් තෙමා නිර්මල සුවඳකින් පුරවාලීය. මේ දිනවල චායා ඇත්දේ සැහැල්ලු ඇඳුම්ය. දවස තුල උඩටත් පහළටත් සිය ගමනකට වඩා ඉහළ පහළ යන්නට

WWW.EXPRESSLANKA.TK 185

ඇයට සිදුවිය. වේගයෙන් අලෙවි වන ඇඳුම් බලා ඒවා නැවත විලාසිතාගාරයට යැවූනේ ඇගේ අතිනි.

සිංහල අවුරුදු සමයට විලාසිතාගාරය අලුත් අවුරුදු සිරිය මතුවන ලෙස සැරසීම රණතුංග මහත්මියන් අසංකත් පුරුද්දක් කරගෙන උන්නෝය. වෙන වසරවලදී ඔවුන් මේ සඳහා එවැනි සැරසිලි කරන ඩෙකරේෂන් ශිල්පියෙකුගේ සහය ඒ සඳහා ලබාගත්තෝය.

"කීයක් විතර යනවද සර් ඩෙකරේෂන් වලට.."

චායා සිංහල අවුරුදු සේල් සමයට පිවිසෙද්දීම ඇසුවාය. අසංක සිනාසී තළල රැළි කරගත්තේය.

"ලොකු ගාණක් යනවා චායා. ගිය අවුරුද්දේ ගියා හැත්තෑ පන්දහක් විතර."

චායා දෙනෙත් ලොකු කර අසංක දෙස බැලුවාය.

"එච්චර ගාණක්.. මොනවද සර් කරපු ඩෙකරේෂන්.."

"මට නම් ඇල්ලුවෙත් නෑ චායා. රෙජිෆෝම් තැලි බිත්ති වලට අලවලා ඒවට රත්තරන් පාට ගාලා ඕගන්සා මල් එක්ක ෂොප්එක වටේට එල්ලුවා.. එච්චරයි."

"ඒකටද හැත්තෑපන් දහක් ගියේ."

"ම්.. මොනා කරන්නද."

චායා උන්නේ අසංකගේ මේසය ඉදිරිපිටවූ පුටුවේ ඉඳගෙන ඒ මේසයේම ඇණවුමක් සකස් කරමිනි. ඔහුද බලාඋන්නේ එවැනි මොහොතක් එනතුරුය.

"අපිට බැරිද සර් මොනවා හරි කරන්න. අපරාදේ ඔය යන සල්ලි."

අසංක කරුණාබරව ඇයදෙස බලා සිනාසුනි.

"ඉස්කෝලෙ අත්වැඩ කරනවා වගේ නෙවේ ළමයෝ ෂොප් එකක් ඩෙකරේට් කරන එක අමාරුයි."

චායා [illegible] දෙතොලතර රඳවාගෙන මොහොතක් අසංක

WWW.EXPRESSLANKA.TK 186

දෙස බලා උන්නාය.

'මං දන්නවා සර් ඒක.. ඒත් මේ තරම් සල්ලි ගොඩක්..'

'ගාණනම් වැඩි තමයි. ඒත් අපි හොයනවනේ වායා.'

වායා මේසය මත තිබූ සුදු හිස් කොළයක් රැගෙන එහි හරහට පහළට යමක් ඇන්දය.

'සර් දැකලා තියෙනවද චූටිම චූටි මේත් මෙච්චර විතර බල්බ් සෙට් එකක් ඇවිල්ලා තියෙනවා.'

වායා එය චූටිම චූටි බව පෙන්වූ ආකාරයට අසංකට නිකම්ම සිනා ආවේය.

'ඔව් මං දැකලා තියෙනවා ජුවලරි ෂොප් වල දාලා තියෙනවා.'

'ආන්න හරි..'

'ඒ බල්බ් සෙට් සීයක් විතරයි සුදු හරි පින්ක් හරි ප්ලේන් සාරි ටිකකුයි තියෙනවා නම් ලස්සන වැඩක් කළැකි.'

අසංක එවැන්නක් මවාගන්නට වෙර ගත්තේය. ඔහුට එවැනි සෞන්දර්යාත්මක ඇහැක් නැත.

'මට මවාගන්න බෑ වායා.. මැඩම්ට කියලා බලන්න.'

'මම සර්ට විස්තර කරන්නම්.. සර් මවාගන්න.'

වායා මෝස්තරය විස්තර කළේය. අසංක කිසිවක් ඇසුවේ නැත. ඔහු වායාගේ මුහුණ විවිධාකාරයට සජීවීව මවාගන්නා පමණි.

'දැන් සර්ට මවාගන්න පුළුවන්ද.. ලයිට් දැම්මාම හරි ලස්සන වෙයි සර්..'

වායා හිස ඔසවා කීවාය.

'දැන් සර්ට මවාගන්න පුළුවන් නේද..'

'ම්.. මෙතනට ලස්සනට රත්තරන් පාට මොට්ටුවකුත් තිබ්බාම ගොඩාක් ලස්සනයි.'

අසංක නළල මැදට ඇඟිලි තුඩ තබා කියද්දී වායා පුදුමයෙන් ඔහුදෙස බැලුවාය.

'කොහිද සර් ... ගන්නේ..'

WWW.EXPRESSLANKA.TK 187

'මචාගත්තේ මොනවද කියලා ඇත්තම කියන්නද..'

'හා..'

චායා අසරණව කීවාය.

'ඊයේ රෑ අම්මා හින්දි පිල්ම් එකක් බල බල උන්නා. මධුරි ඩික්සිත් උන්නේ. මං ඒ මූණට ඔයාගේ මූණ දලා මචාගත්තා. එතකොට අඩු උනේ මොට්ටුව විතරයි. අනිත් ඔක්කොම මේ මූණේ තියෙනවා.'

පැන අල්ලාගෙන උන් පුරන ගැහෙන්නාක් වැනි යැයි චායාට සිතුණි. ඇය හිනාව තදකරගෙන නැගිට්ටාය.

'මොකක්ද සර් පිල්ම් එක..'

චායා කාමරයෙන් යන්නට හැරී ඇසුවාය.

'මම නම දන්නෑ චායා. අම්මා හින්දි පිස්සි. ගිහිල්ලා මැඩම්ගෙන් අහගන්න. හැබැයි ඔයාට ගැලවීමක් නැතිවෙයි. නර්ගීස්ගෙන් පටන් ගත්තාම වෛජයන්ති මාලායි, හේමා මාලනීයි, නූටානුයි, රේඛයි, ශ්‍රී දේවියි.. මධුරියි ඔක්කොම ගැන ඔයාට කියයි. හින්දි කෝච්චියක්.'

චායා තොල් පට තදකරගත්තාය.

'සර් ආස කාටද..'

ඇය අසද්දී අසංක දෙනෙත් වඩාත් මෘදු ලෙස පාකර ඒ මූහුණට ගෙන ආවේය. චායා බිම බලාගත්තාය..

'මධුරිට..'

අසංක රහසින් මෙන් කීවේය. 'ඔයත් ඒ වගේමයි' කියන්නට අසංකට හිතුනද එය අසන්නට ඇය ළඟපාතක නොඋන්නාය. චායා රණතුංග මහත්මිය වෙත ගොස් ඇගේ සැරසිල්ල ඇයටත් මචා පෙන්වන්නට උත්සාහ දැරුවාය.

'මේකි මේ කියන අටමගලේ පුතාට තේරෙනවද පුතා.'

රණතුංග මහත්මිය පුටුවේ ඉඳගෙනම අහද්දී අසංකත් චායාත් එකවිටම වාගේ සිනාසුනෝය.

'මටත් තේරෙන්නෑ අම්මා. ලස්සන ඇති. චායා කියන විදිහට නම් රූපියල් විසිපන්දහකින් විතර කරන්න පුළුවන්.'

WWW.EXPRESSLANKA.TK 188

'ලස්සන වෙයිද කෙල්ලේ.'

'සිංහල අවුරුද්දට කරන ඩෙකරේෂන් එකයි ක්‍රිස්මස් ඩෙකරේෂන් එකක් වගේ වෙන්න නරකයි මැඩම්. ටිකක් පින් පාටට සිංහල පාටට තියෙන්න ඕන.'

'මං කියන්නද සර්ගෙන් සල්ලි ඉල්ලගෙන මේ කාමරේ සාම්පල් එකක් කරලා බලමු.. නරක නෑනේ..'

'ඒක හොඳයි මැඩම්..'

'මං දැන්මම නිලංකාවත් එක්කගෙන ගිහිල්ලා බඩු ගන්නද මැඩම්.'

'හරි.. හරි.. යන්න. මට සැටඩේ වෙනකොට ෂෝ රූම් එක ඕනේ. සිකුරාද පෝය දවසේ අපි නිවාඩුනේ.. එදට හදලා ඉවර කරන්නත් ඕනේ.'

චායා අතවූ ෆයිල් කවර මිටිය තුරුල් කරගෙනම රණතුංග මහත්මිය දෙස බලා උන්නාය. ඇය උන්නේ දිගු වැඩකය.

'මොකෝ තව.'

ඇය ඕනාවට එපාවට මෙන් හිස ඔසවා ඇසුවාය.

'ඊයේ රෑ හින්දි ෆිල්ම් එකක් ගියාද මැඩම්..'

රණතුංග මහත්මියගේ මුහුණ මලක් මෙන් පිපී ආවේය. ඇය අතවූ පෑන මේසයට අතහැර පුටුවේ ඇන්දට බරවූවාය.

'චායාත් හින්දි ෆිල්ම්ස් බලනවද..'

'මාත් ආසයි මැඩම්..'

'ඊයේ ගියේ හම් ආප්කේ හේ කෝන්.. හරි ලස්සනයි. මධුරිගේ උන්නේ.. මට චායාවත් මතක් උනා.'

ඇය කටපුරා එසේ කීවාය. චායා බිම බලාගත්තාය.

'ඒකේ එක සිංදුවකට මධුරි නටනවා කෙල්ලේ.. ෂාහ් කියලා වැඩක් නෑ.. මම නර්ගීස්ගේ ඉඳලා ෆිල්ම් බලලා තියෙනවා. ඒත් මධුරි වගේ නටන නිළියෙක් නම් දැකලා නෑ.. විදුලියක් වගේ.'

WWW.EXPRESSLANKA.TK 189

වායා සිනාසුනාය. අසංක කීවා හරිය. මැඩම් හොඳ හින්දි චිත්‍රපට රසිකාවියකි.

'වායා බලලා තියෙනවද සංගම්.'

'ඔව් මැඩම්..'

'එතකොට ආවාරා.. බර්සාත්.. ශ්‍රී ෆෝ ටුවෙන්ටි.. මදර් ඉන්ඩියා..'

'පරණ ඒවා දැකලා නෑ මැඩම්.'

'ඒවනේ දරුවෝ බලන්න ඕනා. ඒ කාලේ නර්ගීස් තරම් ලස්සන නිළියක් තවත් නැහැ. හිනාවෙනකොට පුදුම තරම් ලස්සනයි. වායා දන්නවද නර්ගීස් කවුද කියලා.'

'නැහැ මැඩම්..'

'ඔයා සංජේ දත්ව දන්නවද..'

වායා ඔහුටද ආශා කළාය. ඒ ආශාව උපන්නේ සාජන් චිත්‍රපටය බැලූ පසුය.

'ඔව් මැඩම්.. මාත් ආසයි.'

'නර්ගීස් කියන්නේ සංජේ දත්ගේ අම්මා. ඉස්සර නර්ගීස් යාළුවෙලා උන්නේ රාජ් කපූර් එක්ක. දවසක් මදර් ඉන්ඩියා කියන ෆිල්ම් එක ෂූටින් කරද්දී ලොකු ගින්නක් ආවා.'

'ඉතින්..'

'ඒ ගින්නට නර්ගීස්ව අහුවුනා. ඒ ගින්නෙන් නර්ගීස්ව බේරගත්තේ සුනිල් දත්. සංජේ දත්ගේ තාත්තා. ඉන්පස්සේ නර්ගීස් සුනිල් දත් එක්ක යාළුඋනා. පස්සේ බැන්ද. මේකෙන් පස්සේ රාජ් කපූර් පිස්සු හැදුනා. ඒ නිසා හරියට නර්ගීස් ගැන හිතලා දුක්උනා. ඊට පස්සේ රාජ් කපූර් හදපු ෆිල්ම්ස් අර තරම් ලස්සන නෑ.'

'පව්..'

වායාට කියවිනි. දුක හිතුනේ කා ගැනද කියා වායාට තේරුමක් නැත. වායාට රණතුංග මහත්මියගෙන් ගැලවෙන්නට ලැබුනේ හින්දි සිනමාව ගැන තව බොහෝදේ අසා උන්නාට පසුය. එහෙත් ඇය

ඒවා අසා උන්නේ ආශාවෙනි. අනතුරුව ඇය අසංක වෙත ගියාය.

'අහුවුනා නේද කෝච්චියට මං කිව්වේ.'

අසංක චායා දෙස හැරී සිනාසී කීවේ අම්මාට නොඇසෙන හඬිනි.

'ඒ වුනාට සර් මැඩම් කියන ඒවා අහගෙන ඉන්න හරි ආසයි.'

'ආසයි ආසයි. තව කතාකළා නම් ඔයාට කියයි රේඛගෙයි අමිතාබ්ගෙයි ලව් එක ගැන. තව ශ්‍රී දේවි මිදුන්ට බූට් එක තියපු හැටි.. ධර්මේන්ද්‍රයි හේමාමාලනියි ලව් කරපු හැටි.'

'ඉතින් ෂෝක්නේ.'

කතා කරනා අතරතුර චායා අසංක වෙත පූරන දිගු කළාය. ඔහු ඒ අත්ල දෙය බැලුවාය. රෝස පාට අත.. ඔහු ආශාවෙන් සිතුවාය.

'සර් සල්ලි..'

ඇය කීවාය. අසංක සිනාව සඟවාගත්තේය.

'දැන් වැඩේ කරන්නද සූදනම..'

'ඔව් සර්..'

'ඔයාට මහන්සියි නේද..'

ඔහු කුළුණුබර හඬින් ඇසුවේය. ඒ ඇස්දෙක විටෙක පියෙකුගේ වැනියැයි චායාට සිතුණි.

'මං ආසයි සර්..'

අසංක මුදල් නොගෙන ඔහුගේ පසුම්බියෙන් බැංකු කාඩ්පත එළියට ගත්තේය.

'උදේ සල්ලි බැන්ක් කළා චායා.. මේකෙන් ඕන ගාන ගන්න. මෙන්න නම්බර් එක..'

ඔහු චායාගේ දිගැටි අත්ලදෙස තවත් වරක් බලා බැංකු කාඩ් පත ඒ මත තැබුවේය.

'ගන්නකොට මටත් රුපියල් දෙදහක් වැඩිපුර ගන්න. අතේ සතේ නෑ.'

WWW.EXPRESSLANKA.TK 191

අසංක කියද්දී වායා සිනාසෙමින්ම කාමරයෙන් පිටවූවාය.

"උඹ මේ වැඩේදී නම් එරෙනවා කෙල්ලේ.. වැඩේ ලේසි නෑ."

විලාසිතාගාරය සරසන්නට බඩු ගනිද්දී තිලංකා වායා පිටුපසට වී කීවාය.

"පුංචි ට්‍රයි එකක් දීලා බලනවා."

"බැරි උනොත් පල්එක."

"පල්වුනත් සර්ටයි මැඩම්ටයිනේ.."

"ඒකත් ඇත්ත."

වායා ඊළඟ දවසේ සැරසිල්ල ගෙදරදීම නිම කරගෙන පැමිණ කාර්යාල බිත්තියේ එය සකස් කළාය.

පහල සේවිකාවන් දෙදෙනෙකුද හවුල් කරගෙන රණතුංග මහත්මියත් අසංකත් පැමිණීමට පෙර එය නිමා කිරීමට ඇයට හැකිවිය. සැරසිල්ල කර අවසානයේ ඇය කුඩා බල්බ් වැල දල්වූයේ ආශාවෙනි. බිත්තිය පිත්පාට අහසක් මෙන් සුන්දරව දිලුනි. සේවිකාවෝත් තිලංකාත් වායාත් සැරසිල්ල දෙස බලාඋන්නේ ඇත්තටම ආශාවෙනි.

"හරි ලස්සනයි වායක්සෝ.. ගිය පාර ඩෙකරේෂන් එක අහලකින්වත් තියන්න බැහැ.. මැඩමුයි සර්රුයි පුදුම වෙයි."

සේවිකාවක් කියද්දී තිලංකා එය අනුමත කළාය.

"මං නම් හිතුවෙම උඹ පල්වෙයි කියලා. උඹ ලකුණු රැස් කරනවා වේගේ වැඩියි.."

තිලංකා උරහිසින් වායාට ගසා කීවාය. වායා සිනාසුනා පමණි.

"මැඩමුයි සර්රුයි එනවා.. මං යනවා."

තිලංකා ගියපසු වායා සැරසිල්ලේ සියළු බල්බ් දල්වා ඇගේ පුටුවට වී උන්නාය. අසංකත් රණතුංග මහත්මියත් කාර්යාලයට ඇතුළු වෙද්දීම සැරසිල්ල දුටුවෝය. ඔවුන් දෙදෙනාම ඒ දෙස බලාඋන්නේ ඇත්තටම ආශාවෙනි. අසංක බැලුවේ අහිංසකව බලාඉන්නා වායාගේ මුහුණ දෙසය. බල්බ් වැල හයි කරන්න තිබුනේ මූණ වටේ.. මහු ආදරයෙන් සිතුවේය.

WWW.EXPRESSLANKA.TK 192

'හරි ලස්සනයි නේද පුතා.. අපරාදේ ගියපාර වියදම් කරපු සල්ලි. මං චායාට ඩබල් බෝනස් දෙනවා.'

අසංක ඔහුගේ කොළරය චායාට පෙනෙන්නට එසවූවේය.

'මං ඒකනේ කියන්නේ මේ කෙල්ල මට හම්බවෙන්න තිබුනේ මීට කලින් කියලා.'

රණතුංග මහත්මිය ළඟ සිටි චායාගේ හිස අතගා කීවාය. ඇගේ ඇස්වල ඉබේටම කඳුළු පිරුණි.

මටත් එහෙම හිතෙනවා අම්මේ. අසංක එසේ සිතුවා පමණි. ඔහු ඒ වචන පිටකළේ නැත.

'දවසකින් මේ ඩෙකරේෂන් වැඩ මුළු ෂොප් එකටම කරලා ඉවර කරන්න පුළුවන් වෙයිද චායා.'

එවරනම් චායා අසරණව අසංක දෙස බැලුවාය.

'කව්රුහරි තවත් උදව්වට ඕන වෙයි මැඩම්.. දන්න කෙනෙක්.'

අසංක සැරසිල්ල දෙස බලාගෙන කල්පනා කළේය. ඔහුට සිහිවූයේ නාලකවය. මෙවැනි කලාත්මක වැඩවලට ඔහු චායා මෙන්ම දක්ෂය.

'අම්මා නාලකයව උදව්වට ගෙනත් දෙන්නම්. ඌ චායාට උදව්කරයි.'

'ඒක ඇත්ත. පිරිත් මණ්ඩපේ හැදුවෙත් ඒ කොල්ලනේ.'

'ඌත් ඔයා වගේම කලාබර තමා.'

ඔහු ගියේ එසේ චායාට කියාගෙනමය. අසංක ඔහුගේ පුටුවට ගොස් සුදු විදුලි බුබුළු අතරින් පෙනෙන චායාගේ මුහුණ දෙස බලා උන්නේය. 'ඔය වගේ මගේ ජීවිතයත් සරසලා දෙන්න බැරිද..' ඔහු සිතින් ඒ ප්‍රශ්නය චායාගෙන් ඇසුවේය.

# 22

විලාසිතාගාරය සැරසීමට යොදාගත් පෝද්ද වායා පාන්දරම ඇහැරී ඇඳගත්තාය. ලා නිල් පැහැගත් ජීන්ස් කලිසමකුත් කහ පැහැගත් ටී ෂර්ට් එකකුත් ඇඳගත් පසු ඇය වෙතට ආවේ වෙනදට වඩා කෙළිලොල් යොවුන් පැහැයකි. මෙතෙක් කලක් මේ කෙළිලොල් යුවතිය උන්නේ කොහිදැයි හිතන්නට මෙන් වායා තම රූ සපුව දෙස කැඩපතින් බලාගත්වනම බලා උන්නාය.

'ඉඳහිට මෙහෙමත් ඇන්දම ලස්සනයි..'

පද්මා කාමරයට පැමිණ කීවාය. වායා කෙටි කොණ්ඩය දෙඋර මත සකසමින් අම්මා දෙස බැලුවාය. මේ දූත් පිපීගෙන එන්නේ ඔහේ පරව යන්නට ගිය මලක් නොවේදැයි පද්මා ආශාවෙන් සිතුවාය.

'භාරගත්තට වැඩේ ඉවර කරන්න වෙයිද දන්නෑ අම්මා.'

වායා පැවසුවේ ඇත්තටම බියෙනි. භාරගත් වැඩක් නිමා කරන්නට නොලැබීම ඇත්තටම දුකකි. ඊටත් වඩා හෙට සිට අලුත් අවුරුදු සේල් ඇරඹෙයි.

'ටිකක් රෑ වුනත් කමක්නෑ.. ඉවර කරලම එන්න. මම මහට ඇවිත් ඉන්නද.'

'අම්මා පාරේ බලං ඉන්න එපා. මම ෂොප් එකේ වොචර් අන්කල් එක්ක හරි එන්නම්. ඒ මනුස්සයා මට හරි ආදරෙයි.. දවසකුත් රෑ වෙලා මාව බස් එකටම ඇරලුවා. එයත් එක්ක ත්‍රී වීලර් එකක එන්න පුලුවන්.'

'ඔයා එපා කිව්ව නිසා කෑම හැදුවෙත් නෑ. දූත් බඩගින්නෙද වැඩ කරන්නේ.'

[illegible] මේ වැඩේ

WWW.EXPRESSLANKA.TK 194

ඉවර කරනකල් මට ඉවසුමක් නෑ.'

වායා නිවසින් පිටවූයේ යංතම් ඉර එළිය පාන්දර අහසේ මතුවෙද්දීය.

අසංක පෙරදා රැයේම නාලකව මහරගම බෝඩිමට ගොස් රැගෙන විත් ගෙදර නවත්වා ගත්තේය. මිතුරන් දෙදෙනා රෑ ගෙදර රහසේම බියර් බෝතල් තුන හතරක් හිස් කළෝය.

'උඹ ඉස්සරට වඩා හරි හැඟීම්බරයි. උඹවගේ කොල්ලෙක්ව සෙන්ටිමෙන්ටල් කරන්න එසේ මෙසේ කෙල්ලෙක්ට බෑ.. කොටින්ම හර්ෂණීටත් බෑ.. මට තේරුණා උඹ හැරෙනකොට.'

නාලක රෑ කාමරයේ බිම ඉඳගෙන කීවේ අසංක වායා පිළිබඳව කියූපසුය. ඇය පිළිබඳව නාලකට පැවසූ පසු ඔහුට විශාල සැනසිල්ලක් දැනුණි. එහෙත් හදවත තිබුණේ ආදරයෙන් බරවය.

'ඒකි මගේ මුළු ජීවිතේම වෙනස් කළා නාලක.. වෙලාවකට මේ ඔක්කොම දමලා ගහලා ඒකිව බඳින්න හිතෙනවා.'

අසංක ඔහුගේ ආත්මයම නාලක අභියස වැමෑරුවේය.

'ඔය උඹ නේද කතාකරන්නේ. බියර් නෙවේ නේද.'

නාලක ඇහුවේය.

'නෑ මචං.. මං ඇත්ත කියන්නේ.. මට හරි ලෝබකමක් දැනෙනවා. ඒ වගේ කෙල්ලෙක් කොල්ලෙකුට අහුවෙන්නේ එක පාරයි.'

'තාම කාටත් අහුවෙලා නැද්ද..'

'ඒකනේ පුදුමේ.. තාම පැකින් පිට.. අපරාදේ.'

නාලක බිත්තියට බරව අසංක දෙස බලාගෙන කල්පනා කළේය. අසංක ධනවත් පවුලක ඉපදුනද පාදඩ ගතිගුණ ඇති කොල්ලෙකු නොවන බව ඔහු දනී. එහෙත් ඔහු මේ තරම්ම හැඟීම්බරව කතාකරනවා නාලක කෙදිනකවත් දැක නැත.

'ඒත් මචං හර්ෂණී.'

'එයා සිංදුවකට බලෙන් දාපු මෙලඩි එකක් වගේ මචං..'

'උඹ සීරියස්ද ඔය කතාකරන්නේ.'

WWW.EXPRESSLANKA.TK 195

'ඔව් නාලක.. මං ජීවිතේ පළවෙනි වතාවට සීරියස් පිට කතා කරන්නේ. ඒත් වැඩක් නෑ.'

අයංක හීල්ලුවේය.

'දුප්පත් අහිංසක කෙල්ලෙක් බං.. වායාට ඒකිගේ පාඩුවේ ඉන්න දීපන්.. පොඩ්ඩක් හරි ඒ ජීවිතයත් අවුල් කළොත් උඹටයි පුතේ දුක.. පව්..'

'ඒ හින්දු තමා නාලක මේ තරම් ඉවසන්නේ. ඒත් මං ආදරේ කරන්න හරි ආසයි මචං..'

'උඹ ලෙඩේ හදාගෙන ඉවරවෙලා බෙහෙත් හොයන්නේ..'

'ලෙඩ හැදෙන්නේ කියලා නෙවේ මචං.. දැන් මේක ලෙඩක් නෙමේ වසංගතයක් වෙලා. උඹ දන්නෑ මේ කාමරේට වෙලා මං විදින දුක..'

අසංක කාමරයේ රෝස පැහැගත් බිත්ති දෙස බලා කීවේය.

'මට තේරෙනවා අසංක.. ඒත් එතනත් ජීවිතයක්නේ බං.. ආදරේ කියන්නෙ උඹට මට පොඩි දෙයක් උනාට කෙල්ලෙක්ට ජීවිතයක්. විශේෂයෙන් වායා වගේ දුප්පත් අසරණ කෙල්ලෙකුට.. ඒකිගේ තාත්තත් නැලු නේද..'

'අම්මා විතරයි ඉන්නේ.'

'ඉතින් බලපන්.. උඹ ඒකිව කරකවලා අත අරින්නද යන්නේ.'

'මංද නාලක.. ආදරේ කියන්නේ මෙච්චර බරපතල වරදක්ද.'

'ම්.. සුන්දර වරදක්. ඒත් දඬුවම හරි දුකයි පුතෝ..'

'සමහරවිට ඒ වරද මගේ අතින් වෙයි. මං ඒකට දඬුවම් විදිනවා නාලක..'

'ඒත් අර කෙල්ල..'

'මං දන්නෑ මචං...'

අසංක කුඩා දරුවෙකු මෙන් ඇඳ මත පෙරලී කොට්ටයක්

WWW.EXPRESSLANKA.TK 196

ආදරයෙන් තුරුල් කරගත්තේය.

'පුතා උදෙන්ම නාලකවත් එක්කගෙන යන්න. අර කෙල්ලට ඒක තනියම කරන්න බෑ.'

පාන්දරම රණතුංග මහත්මිය අසංකව කුද්ද කීවාය. ඔහු ඇඳේ එහා කොනේ නිදා උන් නාලකගේ පස්සට පයින් පහරක් ගැසුවේය.

'පව් පුතා..'

'නැත්නම් මූ නැගිට්ටන්නෑ අම්මේ. සංගීතයෙන් හීන දකින්නේ.. ඒයි නැගිටපන්..'

'දැන් සිංදු කියන්න බෑ බං.. නිදගනිං..'

නාලක තිත්දෙන් කියවද්දී අසංක සිනාසී අම්මාදෙස බැලුවේය. ඇය කාමරයෙන් පිටවූයේ සිනාව තද කරගෙනමය.

ඇතදීම වායාව දකිද්දී අසංකට ඉහිලුම් නොදුණි. ඇය අද වෙනදටත් වඩා සුන්දරය.

'ෂාහ්.. හින්දි මෙලඩි එකක් වගේ.. උඹ හරි...'

නාලක වාහනයේ වීදුරුව අතරින් වඩාත් ළං ළංව වායාගේ රුවදෙස බලා කීවේය.

'මචං.. මේ වායා..'

අසංක පපුව පුරවාගෙන වායාව නාලකට හඳුන්වා දුන්නේය. ඇය නාලක දෙස බැලුවේ තුනී හිනාවක් දෙතොලතර තබාගෙනය.

'වායා මේ මගේ හොඳම යාළුවා. නාලක පුංචි බණ්ඩාර. ඔයා අහලත් ඇති. නව පරපුරේ ගායකයෙක්. කවදහරි කපුගේ ගේ තැන ගන්නේ මූ තමයි.'

'කපුගේ අයියාට යන්න බැරිවෙන ෂෝ මට තමයි දෙන්නේ.'

නාලක කියද්දී වායා දෙතොල්පට තදකර අසංක දෙස බලා සිනාසුනාය. 'ඔච්චර හිනාවෙන්නෙපා පපුව පිච්චෙනවා..' යැයි කියන්නට ඔහුට සිතුණි.

'මොකද අද කලිසමට බැහැලා..'

නාලක [illegible] අසංක වායා වෙත

WWW.EXPRESSLANKA.TK 197

ළංව ඇදුණේය.

'ගවුම් ඇඳගෙන උඩ නගින්න බෑ සර්..'

ඇය ලැජ්ජාවෙන් කීවාය.

'අපි පල්ලෙහා ඉඳලා බලා ඉඳී කියලද..'

චායා හිනාවෙන ඇස් බිමට බරකරගෙන අසංකත් සමගම සාප්පුව තුළට ගියාය.

'හරිම චාම් පින්පාට ඩිසයින් එකක්. උඹලගේ ෂොප් එකේ ගියපාර තිබ්බ ඉයර් ඩෙකරේෂන් නම් වැඩක්ම නෑ අසංක.. ඒක හොඳයි වැලන්ටයින් එකට.'

නාලක කියද්දී චායාගේ හිත පිරී ගියේ ඉබේටමය. අසංක ඇය දෙස බලා ඇසක් ගැසුවාය.

'එතකොට ඉතින් එක්කෙනෙක් ඇවිත් නෑනේ.'

'මෙයාලට කලාව මවලා දෙන්න අපිම ඉන්න ඕන නේද චායා නංගි..'

'නාලක කොනක ගොඩගසා තිබූ සුදු සාරිගොඩ අතගා කීවේය.'

අසංක තවත් කම්කරුවන් හතර දෙනෙකුන් චායාගේ සහයට සොයා දුන්නේය. වරින්වර ඔහු පිටතට ගොස් තේ බීම රැගෙන ආවේය.

'කම්පැනියේ අයිතිකාරයා අද ටී බෝයි වෙලා.. පව්..'

නාලක අසංකට විහිළු කළේය. අසංක හැකි හැමවිටකම චායා ළඟට වී උන්නේය. ඒ ඇස් හතර විලාසිතාගාරයේ ඒ කොන මේ කොනහතර අත දස දහස් වාරයක් එකට හමුවිය. ඒ හැම විටකම චායාගේ දෙනෙත් මෘදු හිනාවක් සමඟ බිමට බරවෙයි. යළිත් ඇය දෙස බලන්නේ නැතැයි සිතාගත්තද අසංකට විනාඩි දෙකකින් නැවතත් චායාදෙස බැලෙයි. චායා පින්පාට සුදු සාරි අඹරා එල්ලමින් ඒමත මල්අමුණමින් හැඩ කරන්නේ සාප්පුව නොව තමාගේ හදවත යැයි මොහොතකට අසංකට සිතුනි.

'නාලක අයියා මෙන්න මෙතනට සෙන්ටර් කරලා මේ මල් ටික ගැළපුවා නම් හරි..'

WWW.EXPRESSLANKA.TK 198

වායා නාලකට එසේ අමතද්දී ඔහුගේ ළය දැවෙයි. තමාටත් සර් නොකියා එසේ අමතනවානම් කැමතියැයි කියන්නට ඔහුට සිතෙයි. ප්‍රධාන පොකුරු සැරසිලි දෙක කර අවසානයේ වායා බැලුවේ අසංක දෙසය.

'හොඳද සර්..'

අසංක පොකුරු සැරසිල්ලට වඩා බැලුවේ වායාදෙසය. 'මගේ මූණ නෙවේ ඩෙකරේට් කළේ..' යැයි ඔහුට විහිළුවට කියන්නට වායාට සිතුණි. එහෙත් ඒ හැඟීම ඇය හදවතේ රඳවා ගත්තාය.

'මේ රවුම ගත්තේ කොහොමද වායා.'

නිල්පැහැගත් අහසක් මෙන් අඹරා ගැසූ සාරි මැද තිබූ සුදු පැහැගත් රවුම දෙස බලා අසංක ඇසුවේය.

'මේ පත් වට්ටියක් සර්. පත්සල ළඟින් ගත්තේ. ඒක අරගෙන පින්ස් ගහලා සුදු සාරිය ඒකේ ඔතලා තීන්නේ.'

අසංකට ඇත්තටම පුදුමය. මේ හදවත මේ තරම් සුන්දරද. ඔහු ලෝබකමින් හිතුවේය. වායා කුඩා උසකට නැඟ ඉහළ රෙද්දේ මලක් අමුණන්නට ගොය් වැටෙන්නට ගියාය. ඇය නොවැටී බේරුනේ නාලකගේ උරහිසකට අතක් තබාය. වායා ඔහුගේ ගතින් සුරතගනිද්දී අසංක බිම බලාගනු ඇය දුටුවාය.

'බොට ඊරිසියයි නේද..'

නාලක රහසින් අසංකට පවසනු වායාටද ඇසුණි. පපුවේ තුනී බිත්ති දූත් දූත් ගැහී පිපිරෙතැයි ඇයට සිතුණි. 'මොනවා වෙන්න යනවද මන්ද..' ඇය අසරණව සිතුවාය.

'අ..නේ..'

වායා නොහිතූ මොහොතක කෑගැහුවේ අසංක දහවල් ආහාරයට අසල අවන්හලකින් කෑම පැකට් රැගෙන එද්දීය. ඔහු විලාසිතාගාරයට දුවගෙන ආවේ වායාගේ හඬටය. එද්දී ඇය ලේ පිරුන දකුණත අල්ලාගෙන කඳුළු පුරවාගෙන උන්නාය.

'මොකක්ද කරගත්තේ ළමයෝ..'

අසංක ඔවුන් වෙතට එමින් ඇසුවේය.

WWW.EXPRESSLANKA.TK 

'කටර් එකට කැපුනා සර්..'

ඔහු සාක්කුවේ තිබූ ලේන්සුව ගෙන වායාගේ කැපුන ඇඟිල්ල වසා ඒ සුරත වඩාත් සුරක්ෂිත ලෙස අල්ලා ගත්තේය. මිතුරාගේ දෑස්වල රැඳි ආදරය නාලක පසෙක හිඳ අපූරුවට බලාඋන්නේය.

'යන්.. එන්න උඩට බෙහෙත් ටිකක් දන්න.'

අසංක වායාගේ දකුණත ලේන්සුවෙන් තදකරගෙනම ඇයව උඩු මහලට රැගෙන ගියේය. 'මූ ෂූවර් එකටම ජයමංගල ගාථා වරද්දගන්නවා.' නාලක වායා නැවැත්වූ වැඩය කරන්නට සාරිය අතට ගෙන සිතුවේය.

'එපා සර්.. දැන් ලේ යන්නෑ.'

වායා අසරණව ඔහුවෙතින් සුරත මුදා ගන්නට සිතාකීවාය. මේ තරම් තමාට ළංවන්නට එපායැයි ඔහුට වැඳ වැටී කියන්නට වායාට සිතුණි.

'ඔහොම ටිකක් ලේන්සුව තදකරලා අල්ලගන්න. පණ්ඩිතයා නොවී. ගොඩාක් කැපිලා.'

වායාට බැලුනේ තමාගේ ලේ තැවරුන අසංකගේ ලා නිල් පැහැගත් ලේන්සුව දෙසය. අසංක සාක්කුවේ වූ යතුර ගෙන කාර්යාලයේ දොර ඇරියේය.

'එන්න.'

ඇය කාර්යාලයට ඇතුල්වූයේ ඇදුම්කන ඇඟිල්ල ඔහුගේ ලේන්සුවෙන් තදින් මිරිකාගෙනය. අසංක කාර්යාල බිත්තියේ කොනක ගසා තිබූ ප්‍රථමාධාර පෙට්ටියෙන් සැව්ලෝන් බෝතලයත් තවත් බෙහෙත් කුප්පියකුත් පුළුන් කැබැල්ලකුත් අතට ගෙන වායාදෙස බැලුවේය.

'මෙහෙම ඉඳගන්න වායා.'

වායා අසරණව ඉඳගත්තාය. ඔහු කිසිදු කතාවක් නැතුව පුටුවක් ඇය ළඟටම ඇද වාඩිවී ඇගේ සුරත ගෙන ඔහුගේ කකුල මත තබාගත්තේය. වායාගේ ඇස්වල කඳුළු පිරුනේ බලාඉඳිද්දීමය.

'සර් පව් වැඩක් කරන්නේ. මට පුළුවන් බෙහෙත් ටික දගන්න. සර් යන්න.'

WWW.EXPRESSLANKA.TK 200

වායා ඇඹුම්බරව කීවාය.

"කුවාලෙකට බෙහෙත් දන එක පව් වැඩක් කියලා මොන දහම් පාසැල් පොතේද වායා තියෙන්නේ."

ඔහුගේ ඩෙනිම් කලිසමේ ලේ තැවරෙතැයි බියෙන් වායා අත ඒ කකුලෙන් ඔසවා ගත්තාය. ඔහු "හප්" කියා අත නැවතත් කකුලට තදකළේය. වායාට ඇඹුම් අතරින් සිනා ආවේය. "හප් කිව්වේ මම පොඩි ළමයෙක් කියලා හිතලා වෙන්න ඇති."..

අසංක මෘදුව අත අල්ලා වායාගේ දකුණතේ වූ ලේ ඉවත්කර බෙහෙත් දමද්දී ඇගේ ඒ දකුණතම හිරි වැටුණි. ඔහුගේහිස තිබුනේඇගේ ළැමට මඳක් ළංවය. දැන් දැන් ඒ හිසත් කුඩු පට්ටම් වන්නට පසුව පිපිරෙතැයි ඇයට සිතුණි.

ඔහු ඒ කුඩා ඇඟිල්ලට බෙහෙත් දැම්මේ වඩාත් මොලොක් ලෙස ඒ සුරත අල්ලාගෙනය. බෙහෙත් දමනා අතරවාරයේ කිහිප වාරයක්ම අසංක හිස ඔසවා නෙත්වූ වායාගේ දෙනෙත් දෙස බැලුවේය. "ඇයි අඬන්නේ.." කියා ඔහු ඇසුවේ නැත.

"සර්.."

වායාට තිකම්ම කියැවිණ. අසංක ප්ලාස්ටරය ඒ ඇඟිල්ල වටා කරකවමින් හිස එසෙව්වේය.

"ඇයි.."

"ඇයි.. මෙහෙම දේවල් කරන්නේ.."යැයි වායාට අසන්නට ඕනැවිය. එහෙත් ඇය තොල්පිට පෙරලා නිහඬ වූවාය. ප්ලාස්ටරය දමා අහවර වූ පසුවත් අසංක ඒ සුරත අල්ලාගෙන උන්නේය. වායාට අතමුදගන්නට මහා ලෝබකමක් දැනුණි. පාත්වී ඒ සුරත සිපගන්නට ඇතිවූ ආශාව ඔහු මැඩ ගත්තේ අසීරුවෙනි. මොහොතකට පසුව දෙදෙනාම එකම විටක හිස එසෙව්වෝය. ඒ ඇස් හතර ළං ළංව හමුවූයේද එකම විටය.

"තාම රිදෙනවද.."

ඔහු පහත් හඬින් ඇසුවේය. "දැන් රිදෙන්නේ අත නෙමේ පසුව.." යැයි කියන්නට සිතුනද වායා අසරණව "නැතැයි" කියා හිස වැනුවාය. ඔහු ඇගේ සුරත දෙස තවත් වරක් බලා ඉතා සීරුවෙන් ඇගේ පාදයක්

WWW.EXPRESSLANKA.TK 201

වායා ඇඹුම්බරව කීවාය.

"තුවාලෙකට බෙහෙත් දන එක පව් වැඩක් කියලා මොන දහම් පාසැල් පොතේද වායා තියෙන්නේ."

ඔහුගේ ඩෙනිම් කලිසමේ ලේ තැවරේතැයි බියෙන් වායා අත ඒ කකුලෙන් ඔසවා ගත්තාය. ඔහු "හප්" කියා අත නැවතත් කකුලට තදකළේය. වායාට ඇඹුම් අතරින් සිනා ආවේය. "හප් කිව්වේ මම පොඩි ළමයෙක් කියලා හිතලා වෙන්න ඇති."..

අසංක මෘදුව අත අල්ලා වායාගේ දකුණතේ වූ ලේ ඉවත්කර බෙහෙත් දමද්දී ඇගේ ඒ දකුණතම හිරි වැටුණි. ඔහුගේහිස තිබුනේඇගේ ළැමට මදක් ළංවය. දන් දන් ඒ හිසත් කුඩු පට්ටම් වන්නට පසුව පිපිරේතැයි ඇයට සිතුණි.

ඔහු ඒ කුඩා ඇඟිල්ලට බෙහෙත් දැම්මේ වඩාත් මොලොක් ලෙස ඒ සුරත අල්ලාගෙනය. බෙහෙත් දමනා අතරවාරයේ කිහිප වාරයක්ම අසංක හිස ඔසවා නෙත්වූ වායාගේ දෙනෙත් දෙස බැලුවේය. "ඇයි අඬන්නේ.." කියා ඔහු ඇසුවේ නැත.

"සර්.."

වායාට නිකම්ම කියැවිණ. අසංක ප්ලාස්ටරය ඒ ඇඟිල්ල වටා කරකවමින් හිස එසෙව්වේය.

"ඇයි.."

"ඇයි.. මෙහෙම දේවල් කරන්නේ.."යැයි වායාට අසන්නට ඕනැවිය. එහෙත් ඇය තොල්පිට පෙරලා නිහඬ වූවාය. ප්ලාස්ටරය දමා අහවර වූ පසුවත් අසංක ඒ සුරත අල්ලාගෙන උන්නේය. වායාට අතමුදගන්නට මහා ලෝබකමක් දැනුණි. පාත්වී ඒ සුරත සිපගන්නට ඇතිවූ ආශාව ඔහු මැඩ ගත්තේ අසීරුවෙනි. මොහොතකට පසුව දෙදෙනාම එකම විටක හිස එසෙව්වෝය. ඒ ඇස් හතර ළං ළංව හමුවූයේද එකම විටය.

"තාම රිදෙනවද.."

ඔහු පහත් හඬින් ඇසුවේය. "දන් රිදෙන්නේ අත නෙමේ පසුව.." යැයි කියන්නට සිතුනද වායා අසරණව "නැතැයි" කියා හිස වැනුවාය. ඔහු ඇගේ සුරත දෙස තවත් වරක් බලා [illegible] සීරුවෙන් ඇගේ පාදයක්

WWW.EXPRESSLANKA.TK 202

මත තැබුවේය.

'මං කට්ටියට කෑම පැකට් ටික දීලා අපේ කෑමත් අරගෙන එන්නම්..'

වායා හිස වැනුවා පමණි. අසංක ගියපසු ඇය තෝන්තුවෙන් මෙන් මේසයට හිස ගසාගත්තාය. 'දෙයියනේ මොනවද මේ වෙන්නේ..' වායා බියමුසුව සිතුවාය.

අසංක ගිය ඉක්මනින් නැවත ඉහළ මාලයට ආවේය. වායා මේසයට හිස ගසාගෙන ඉන්නවා දකිද්දී ඔහුගේ හිත ආදරයෙන් බරවිය. ඔහු වායා ළඟටම ගොස් ඒ හිසට අතක් තබන්නට සිතා නැවතත් අත ඇද ගත්තේය.

'වා..යා..'

අසංකගේ හඬ ඇහෙද්දී වායා එකවරම හිස එසෙව්වාය. ඔහොම බලන්නට එපායැයි කියන්නට ඇයට සිත්විය.

'කෑම කාලා ඉන්න..'

පුටුවෙන් නැගිටගත් ඇය කාර්යාලයේ කොනක කැබිනෙට්ටුවේ දමාතිබූ අසංකගේ වීදුරුවට වතුර එකක් දමාගෙන විත් ඔහු අසළ තැබුවාය.

'මම නිලංකාගේ ටේබල් එකට ගිහිල්ලා කන්නම් සර්..'

ඇය කීවේ ඔහුත් සමඟ එක මේසයටවී කන්නට සිතට ශක්තියක් නොවූ නිසාය.

'මට තනියම කන්න බෑ වායා.'

ඒ වචන ඇයව නැවතත් ඉන්දවිය. වායා බත් පැකට් එක විවර කරගත්තාය. දකුණතින් කන්නටඅසීරු බව ඇයට වැටහුනේ ඇඟිලි දෙකකට දමූ බැන්ඩේජ් එක දකිද්දීය. වායා වමතින් කන්නට පටන් ගත්තාය. ඒ අතින් කන්නට හුරු නැත. අසංක මේ සියල්ල බලාගෙනය.

'මං පස්සේ කන්නම් සර්.. සර් කන්න.. මට බඩගින්නක් නෑ.'

බඩගින්නක් නම් ඔහුටද තිබුනේ නැත. හිත ඒතරමටම මොනව[illegible] තිබුණි.

WWW.EXPRESSLANKA.TK 203

"කෝ ඔය බත් පැකට් එකත් මට දෙන්න."

අසංක මේසයේ එක් කොනකට පුටුවක් ඇද ඉඳගත්තේ වායාගේ බත් පැකට්ටුවද තමාවෙත ඇදගනිමිනි. ඇයට කියිවක් සිතාගන්නට අසීරු විය. ඔහු කුඩා බත් කටක් අනා ඒ සුරත ඇගේ මුව වෙත දිගු කළේය. වායා ගැස්සී පුදුමයෙන් ඔහුදෙස බැලූවාය. ඇගේ දෙනෙත් වලින් කඳුළු පැන්නේ ඔහු බලා ඉඳිද්දීමය.

"අ..නේ.. සර්.. ඒකනම් කරන්න එපා. මොනවද මේ පව් වැඩ. මං බලං ඉන්නම්.. සර් කන්න."

වායා අසීරුවෙන් වචන සොයාගෙන කීවාය. අසංක ඇය වෙනුවෙන් ඇනූ කටද බත් පැකට්ටුවට දමා එය පසෙකට කළේය.

"වායා කන්නැත්නම් මාත් කන්නෑ.. අපි යන්."

ඔහු රළු ලෙස කීවේය. දත් දත් කෑ ගසා ඇඩෙනැයි වායාට සිතුණි.

"ස..ර්... සර්.. මං.. සර්..ස්ර්."

වායා අසීරුවෙන් කීවාය. ඔහු මොහොතක් වායා දෙස බලාගත්වනම බලා උන්නේය. මේසය මත තිබූ ඇගේ වමත ඔහුගේ වමත මත වැටුනේ ඔහුවත් නොහිතූ ලෙසය. වායා බිම බලාගෙන ඉකිබින්දය.

"ඔයාගේ ජීවිතේ මට සර් කෙනෙක්ට වඩා කෙනෙක් වෙන්න බැරිද වායා.."

ඔහු හිගන්නෙකුයේ බැගෑපත්ව ඇසුවේය. වායාට ඇඩුනේ පපුව කඩා ඉහිරවමිනි.

කුමකින් කුමක් වන්නට යනවාදැයි වායාට සිතාගන්නට බැරිවිය. මේතරම් දරුණු ලෙස තම පපුව තුවාල කරගන්නට නම් කැපුන ඇඟිල්ලට බෙහෙත් කරන්නට තමාව උඩට ගෙන ආවේ ඇයිදැයි ඇය සිතුවාය. පපුවට සම්බන්ධ සියළුම තුනී නහරවැල් එකට ඇලී දැවී යන සෙයක් වායාට දැනුණි.

වායාගේ වමත මත වැටී තිබූ අසංකගේ දකුරත තවමත් එහෙමමය. ඒ සුරත තවමත් තම අත මත තබාගෙන ඔහු ඉන්නේ යමක් ලැබෙනතුරු [illegible] කළ බව

WWW.EXPRESSLANKA.TK 204

වායා දැන උන්නාය. එහෙත් මේතරම් දෛවෝපගත ලෙස තමාව අසරණ කරන්නට දෛවයට සිතුනේ ඇයි..

හිස මේසයට ඔබාගෙන සිහින් හඬින් ඉකිබිඳින වායා දෙස අසංක බලා උන්නේ වායාටත් වඩා අසරණවය. ඔහුගේ දෙනෙත් වල කුළුඳුලේ ජීවිතය පතන නව යෞවනයෙකුගේ දෙනෙත් මත රැඳෙන නොඉඳුල් අරුමැයි බව රැඳී තිබුණි.

"වා..යා.."

ඒ හඬ බරය.. පිදුරුතලාගල කන්දටත් වඩා බරය. වායාට ඔහුගේ මුහුණවත් නොබලා පහළට දුවගෙන දුවගෙන යන්නට සිතුණි. එහෙත් ජීවිතයේ ප්‍රථම වරට තම හදවතට පිටතින් දමාගන්නට බැරි යමක් කොහේදෝ ඇතැයි වායාට සිතුණි. ඒත් ඒ මොනවාද.. ඒ ඇත්තේ කා ළඟද..

"වායා.. එක පාරක් ඔළුව උස්සලා මං දිහා බලන්න."

අසංක වඩාත් කුළුණුබර ලෙස කීවේය. වායා හිස එසවූයේ කඳුළින් පිරීගිය දෙනුවන් වසාගෙනමය. දෛවය තම ජීවිතයේ ආදරය පිළිබඳ පළමු සමනල පින්සල් පහර ගෑවේ වැරදි ඩ්‍රොයිත් කොළයක බව වායා දැන උන්නාය.

"ඇයි අරින්නේ නැත්තේ මං බලන්න බැරි තරම් කැතද.."

ඔහු අසරණව ඇසුවේය. වායාගේ හැඬුම් වේගවත් විය. සමනලයෙකුගේ දැස් ඉදිරිපිට පිපෙන්නට අකමැති මල කුමක්ද.. පසොළොස්වක සඳ පායා ඇති අහසක නොපිපෙන තාරකා ලොව ඇත්තේ කොහේද..

"වායා.."

"ස.. සර්.. සර්.. මේ මොනවද.."

වායාට වචන ගලපාගත නොහැකි විය. එක්කෝ හදවත පුපුරා යායුතුය. නැතහොත් සැනසිය යුතුය.

අසංක වඩාත් ශක්තිමත් හා සෞම්‍ය ලෙස වායාගේ තෙත දෙකම්මුල් වැසෙන්නට දෑතම තැබුවේය. වායාගේ දෙතොල් දෙනෙත් වේගයෙන් ගැසෙන්නට විය. නොඉඳුල් යුවතියකගේ දෙතොල මත කුළුඳුලේ පොපියන මෘදු අනුරා පැහැය ඉදිරියේ සන්සුන් කරගන්නට

WWW.EXPRESSLANKA.TK 205

තරම් ශක්තිමත් පිරිමි ළයක් ඔහු තුළ නොවීය. අසංක වඩාත් ආදරණීය ලෙස චායාව නැගිට්ටුවා තම වතට බර කරගත්තේය. චායා උන්නේ ගැහෙමිනි. දූන් දූන් තමාව සිහිසුන්ව ඇද වැටේතැයි ඇයට සිතුණි.

"සර්.."

චායා උගුරෙන් කතාකළාය. එහෙත් ඊට වඩා එක වදනක් හෝ ඇයට කතාකරගන්නට ඉඩක් නොවිණි. යෞවනයේ රෝස පෙති දෙපෙති ආදර සමතල දෙතොලකින් ප්‍රථම වරට වැසී ගියේය.

අසංකගේ ධුරත ඇගේ බඳවටා එතුනේත් ඇගේ මෘදු පපුව ඔහුගේ පළල් පපුවට තදවූයේත් එකටය. කර කියාගත හැකි දෙයක් නොමැතිව චායා අසීරුවෙන් දෙනෙත් පියාගත්තාය. එහෙත් මොහොතකින් ඇය දෙනෙත් යංතමින් විවර කොට තම මුහුණට බරවූ ඔහුදෙස බැලුවේ ජීවිතය පුරා රැකගත් සඳවතට එබී ප්‍රථම මුහුණ හඳුනාගන්නට මෙනි.

අසංක මොහොතකට පසු චායාගේ මුහුණින් මුහුණ ගත්තේ දරාගත නොහැකි ලෝබකමකිනි. යෞවනය මේතරම්ම පියකරු බවක් මෘදු බවක් ඔහු දූන උන්නේ නැත. වසන්ත කාලයේ පායන ධුන්දරම සඳවත ඔහුගේ හදවත නම්වූ කඳු සිරස මත පායා උන්නාය. තම ළය දූන් දූන් පැලී යතැයි අසංකට සිතුණි.

"චායා.. මා එක්ක තරහද.."

ඔහු ඇඩුම්බරව ඇසුවේය. තමා මේතරම්ම ආදරණීය පිරිමියෙකු බව ඔහුවත් දූනගෙන නොඋන්නේය. ජීවිතයේ මන්දස්වර හදවතේ කොනක සිරව තිබුනිද.. චායාට ඔහුගේ පපුවෙන් හිස ඔසවන්නට ලෝබ සිතුණි. සිතුනද ඔහු වඩාත් තදින් ඇගේ බඳ සිරකොට අල්ලා ගෙන උන්නේය.

"මොනව හරි කියන්න බබා.. තරහනම් බනින්න.."

"මං.. මං.. තරහ නෑ.. සර්.. ඒත් ඒත්.. ඇයි මෙහෙම කළේ.."

ඒ හඬ තුළ යුවතියකගේ අසරණ බව මෙන්ම කුළුඳුලේ පෙම්වතියකවූ යුවතියකගේ චමත්කාරයත් විය. ඔහු උන්නේ ඒ නිර්මල බව රස විඳිමිනි. ඇගේ ලවනත මොහොතක් පිප ජීවිතයේ වසර සිය ගණනකට අත් නොවිඳි ධුන්දරත්වයක් තමා වින්දායැයි අසංකට සිතුනි.

WWW.EXPRESSLANKA.TK 206

‘අද නෙවේ චායා.. ගොඩාක් දවසක ඉඳලා පිච්චිච්ච පපුවක් එක.. අදයි නිවුනේ.. ආයි ගිනි තියන්න එපා බබා..’

චායාට කිසිවක් අදහාගත නොහැක.. ඇය ඔහුගේ පපුවෙන් ඉදමට හිස එසෙව්වාය.

‘බැහැ.. එච්චර ඉක්මනට ඔයාට මගෙන් ඈත්වෙන්න බැහැ..’

ඇය අසරණව දෙනෙත් පියාගත්තාය. ආදරයේ රත් දියවර තම දුප්පත් නිම්නයම දෙවාගෙන ගලන්නේ ඇයිදැයි ඇය සිතුවාය. ඔහුගේ වචන තුනී ඇල්පෙනිති තුඩක් මෙන් ඇගේ මෘදු ළය බිඳගෙන පපුවේ ගැඹුරටම කිඳා බැස්සේය. ඒ තුඩ එළියට ඇද දමන්නයැයි ඔහුට කියන්නට ඇයට සිතුණි.

‘ස...ර්..’

කියාගත හැකි යමක් සිනට නොආවද ඇය හඩ බින්දය. ඔහු බඳ වටා එතුන අත තවත් දැඩි කළේය. ඒ මෘදු පපුව දැන් තම හදවතටම බද්ධ වී අවසානයැයි ඔහුට සිතුණි. එය උගුල්ලා ඉවත දැමිය හැකිද..

‘මුකුත් කියන්න එපා චායා.. අපි මෙහෙමම ඉමු..’

‘ඉන්න පුළුවන්නම්..’

ඇය කියන්නට කටට ආ වචන ගිලගත්තාය. තමා ඉදිරිපිට ඉන්නා දෙවයේ අපූරු පුද්ගලයා ඇයට කවමත් වටහාගත නොහැක. ඇය දන්නේ ඒ හදවත තම ජීවිතයේ හමුවූ ආදරණීයම හදවත බව පමණි.

‘කියන්න චායා...’

‘ඉන්න පුළුවන්නම්.. හැමදාම ඉන්නවා සර්.. මෙහෙම නෙමේ.. සර්ගේ පය පාමුළ වැටිලා හරි.. ඒත්.. සර්..’

ඇයට හැඬුණි. තමා මලක් කළ ආදරණීයම මිනිසාගෙන් ජීවිතය ඉල්ලාගත නොහැකි බව අසරණිය දැන උන්නාය.

‘අපි මෙහෙම ඉමු චායා..’

‘මේ හිතන කෙල්ලව.. පපුවට තියාගෙන ලබන සතුට මොකක්ද සර්...’

WWW.EXPRESSLANKA.TK 207

ඇගේ කඳුළින් ඔහුගේ කමිසය තෙත්ව ගොස් තිබුණි. අනන්ත ආදරයකදී දැස් මේතරමටම තෙත්ව යන බවක් චායා දැන නොඋන්නාය. ජීවිත උයනේ දහසක් මල්පෙති දෙපෙති විද හැර බලාඋන්නේ මේ මුහුණ පිළිගන්නද.. එය සදකාලික දුකක් බව හදවත නොදනීද..

"අර පල්ලෙහා ඉන්න තාලකයා වගේ මම ලස්සන වචන දන්නෑ චායා.. ඒත් පපුවේ මොනවද දිලිසෙනවා.. ඔයා අද සාප්පුව ඩෙකරේට් කළා.. ඒත් බබා ඔයා මගේ පපුව සැරසුවේ ඔයා ඉන්ටර්විව් ආපු දවසෙම.. දන්නවද..."

ඔහුගේ හඬ අවංකය.. හිමිවනවා නම් හිමිවිය යුත්තේ මෙවන් සඳකි.. ඔහු කලා පිරුන වෙසක් සඳකි.

"දන්නව සර්.. හැම දෙයක්ම දන්නවා.. ඒත්.. මං දුප්පත් කෙල්ලෙක් සර්.. සමහරවිට මේ ෂොප් එකේ වැඩ කරන දුප්පත්ම කෙල්ල මම වෙන්න ඇති.."

චායා ඇඩුම්බරව කීවාය. රැයේ දුටු රසබර සිහින රැයේදීම අමතක වෙනවානම් හොඳය. නැතිනම් එවැනි සිහින වල මතක දයාබර රාත්‍රියට තවත් දුකකි.

"ඉස් ඉස්සෙල්ලම ජීවිතේ ආදරේ කරපු දවයේ මාව අඩවන්න එපා චායා.. මට අනුකම්පා කරන්න."

ඔහුගේ හඬ.. ඒ වචන ඇගේ සිත උගුල්ලා දැමීය. ඒ වචන චායාගේ ළපටි ගැහැණු ළය වඩාත් සුරක්ෂිත ලෙස ලියාගත්තේය.

"මට බෑ සර් සර්ට අනුකම්පා කරන්න.."

"එහෙනම් මොනවද චායාට කරන්න පුළුවන්.."

ආදරේ කරන්න.. එසේ කියන්නට චායාට සිතුනි.. එහෙත් ඇය දෙනෙත් පියාගෙනම නිහඬව උන්නාය.

"කියන්න චායා.."

"මට බැහැ සර්.. අපි යමු..."

ඔහු ඔහුගේ වෙව්ලන දේකින් ගැහෙන ඒ වතමල ගත්තේය. අසංකගේ දිගු ඇඟිලි දහය මැද ඒ මුහුණ කලාවැවෙන් මේ දැන්

WWW.EXPRESSLANKA.TK 208

නෙලාගත් නෙළුමක් මෙන් පිපී තිබුණි. ඒ කඳුළු පැන් ඉස්සාක්මෙනි.

'කියන්න.. ම.. මට. ආදරේද...'

චායා දෙකොල්පට තදකරගෙන දිග සුසුමක් ඉහළට ගත්තාය. ජීවන ගංගාධාරයේ හමුවූ ප්‍රථම ඉරණම්කරුවා ආදර භාවනාවට කමටහන් ඉල්ලයි.

'ම..ට.. ආදරේද බබා..'

'ඔ..ව්..'

චායාගේ දෙකොල් ගැහෙයි.. පසුව ඊටත් වඩා වේගයෙන් ගැහෙයි. දෙවියනි මේ පිටවන වචන මොනවද..

'ගොඩාක්..'

'හ්ම්.. ගොඩාක්..'

ඒ ඇස් අසීමාන්තිකව ආදරය බලාපොරොත්තු වෙතැයි චායාට සිතුණි.

'එකක් කියන්නද'

ඔහු මෘදුව සිනාසී ඇසුවේය. තවමත් ඒ මුහුණ ඒ දේහ මැදය. චායා තිහඬව උන්නාය.

'ඔයාට බෑ මට තරම් ආදරේ කරන්න.'

චායා දෙනෙත් පියාගත්තාය. සැබෑය.. ඒතරමට ආදරය කරන්නට ඇය නොදනී. ඔහු චායා දෙස බලාගත්වනම බලාඋන්නේය. ඒ දෑස් තෘප්තිමත්ය. වසන්තයේ සුන්දරම රෝසමල නෙලාගත් මොහොතේ යෞවනයේ මල් කරුවාගේ දෙනෙත් තෘප්තිමත් නොවේද. මේ දෑස.. මේ දෙකොල.. මේ හදවත ඒ සියල්ල දැන් තමා සන්තකය යන උහුලාගත නොහැකි හැඟීම විසින් ඔහුව ගොළු කර තිබුණි.

'සර්..'

ඇය මොහොතකට පසු වේදනාවෙන් කටහඬ බින්දය. ජීවිතේ දුටු චමත්කාරජනකම සිහිනයෙන් කිසිවෙකු තමාව පුබුදුවන්නට පෙර තමා පිබිදිය යුතු යැයි ඇයට සිතුණි.

'මේ පාරේ දුක වැඩියි සර්..'

යෞවනයේ පින්බරම මොහොතේ මූසල කතාවකින් ඒ සියල්ල බො[illegible]. දැන් මේ

WWW.EXPRESSLANKA.TK 209

මොහොත හිමි ඔහුට පමණක් නොවේ.

'මට ආදරේ කරන්න දෙන්න චායා..'

ඔහු හැඟීම්බර ලෙස කීවේය. ඒ දැන දැන් නතරව ඇත්තේ චායාගේ ගෙල දෙපසය. ඔහු ඇගේ කර සැරසූ හීන් රන් චේන්පට ඇඟිලි තුඩු වලින් අල්ලා පිරිමැද්දේය.

'අපි පහළට යන් සර්.. නාලක අයියා බලං ඇති..'

ඇයට ඕනෑවූයේ නතිවන්නටය. රසබර සියල්ල හුදෙකලාවේ විඳගන්නට ඇය ආශා කළාය.

'තව මොනාහරි කියන්න චායා.'

'කි..ය..න්..න.. මං.. මං මොනවත් දන්නෑ සර්..'

'මෙතනට මොනවත්ම දැනෙන් නැද්ද.'

ඔහු ඇඟිලි තුඩු මෘදුලෙස ඇගේ ළය මැදට තබා කීවේය. ඒ සුරත අල්ලාගෙන සිපගෙන සිපගෙන යන්නට ඇයට සිතුනි. තමාට හිමි නොවන බව දැන දැනත් ඒ සුරතට මේ තරම්ම හිත ලෝබවන්නේ ඇයි..

'දැනෙනවා..'

ඇය මිමිණුවාය.

'මොනවද...'

ඔහුගේ දෑස් බලාපොරොත්තු සහගතව ඇය වෙතට යොමුවිය.

'කවුද ඇවිදිනවා ඇවිදිනවා වගේ.'

චායා මෘදුව සිනාසී බිම බලාගත්තාය. මේ සියල්ල සිහිනයක් නම් ඒ සිහිනයේ තව ටික වෙලාවක් රැඳෙන්නට ඇය ආශා කළාය.

'කවුද.. කොයි වගේ කෙනෙක්ද..'

'උස.. සුදු.. ලස්සන මහත්තයෙක්..'

චායා මඳකටවත් හිස නොඔසවා බිම බලාගෙනම කීවාය. අසංකගේ පපුව පැලෙන්නට ඔන්න මෙන්නය.

'නම මොකක්ද..'

ඔහු මෘදුව ඒ මුහුණට බරව ඇසුවේය. චායා දෙතොල් පට තද කරගෙන හිස ... ...

WWW.EXPRESSLANKA.TK 210

'කියන්න බැහැ..'

'බැ..හැ..'

'ම්.. මුල් අකුර කියන්න.'

'ඉස් ඉස්සෙල්ලම මේ අතින් ලිව්වේ ඒ අකුර... හෝඩි පොතේ ලියාගත්තෙත් ඒ අකුර.. දැන්..'

වායා නෙත් එසෙව්වාය..

'දැන්.. ඔව් කියන්න බබා..'

'මට නොලැබෙන බව දැන දැනත් ඉයි ඉස්සෙල්ලා පපුව උඩ ලියාගත්තෙත් ඒ අකුර..'

අසංක මොලොක් ලෙස ඒ ගෙල පෙදෙසින් අල්ලා ඒ මුහුණෙට බරවිය. එවර වායාගේ දෑත් ඔහුගේ බඳ වෙත ගියේ ඇයටත් නොදැනීමය. ජීවිත කුසුමේ රොන්සුණු ඇතිතරම් ඔහුට උරාගන්නට දී වායා දෙනෙත් පියාගත්තාය. දෙතොල පමණක් නොව මුළු හිතම හිරිවැටී ගොය්ය. තව ආත්ම ගණනකට ඒ හිරි වැටීම නොයනු ඇත.

'අපි යන් සර්..'

ඇය ඔහුගේ දෙතොලින් දෙතොල මුදවාගෙන මිමිණුවාය.

'ගෙදර ගිහිල්ලා රෑ ඇහැරගෙන මතක් කරන්න තව මොනවාහරි කියන්න වායා..'

ළාමක ඒ හඩ ආවේ ඒ මුහුණින්මද කියා බලාගන්නට මෙන් වායා දෙනෙත් එසෙව්වාය.

'අද රෑ විතරක් නෙවේ සර්.. මුළු ජීවිත කාලෙම මතක් කර කර සතුටුවෙන්න.. දුක් වෙන්න.. පපුව පලාගන්න.. පුච්චගන්න.. මට මේ ඇති සර්..'

වායා දෑතින්ම මුහුණ වසාගෙන කීවාය. මුළු හද ගැබම එකළු කළ සඳවත රාහු අසුරිඳු ගිල ගනීයැයි බියෙන් මෙන් අසංක ඒ දෑතම අල්ලා තම දේතට තද කරගත්තේය.

'මේ සතුටු කඳුළුද.. දුක් කඳුළුද වායා..'

ඔහු මහපටැඟිල්ලෙන් ඇගේ කඳුළු නෙතමනාය පිස ඇසුවේය. වායා [illegible]

WWW.EXPRESSLANKA.TK 211

'අද වගේ ලස්සන දවසක මොන කෙල්ලගේ ඇස් වලද සර් දුක් කඳුළු එන්නේ. මේ සතුටු කඳුළු.. ඒත් අදින් පස්සේ මේ කඳුළු ගොඩාක් දුකට වැටෙයි.. මං ඒක දරාගත්තම් සර්.. මට පුළුවන්..'

'මං ඔයාට අඩන්න දෙන්නෑ කෙල්ලේ..'

ඔහු ඒ හිස හෙමිහිට සිපගත්තේය. චායා උදසන නාද්දී ගැල්වූ ෂැම්පූ වර්ගයේ මෘදු සුවඳ ඔහුගේ හදවත පසාරු කරගෙන ගියේය. කොහන ඉම්බත් සුවඳයි.. ඔහු ඇතුළු හදවතින් සිතුවේය.

'සර් යන්න.. මං එන්නම්.. මට නාලක අයියා දිහා බලන්න ලැජ්ජයි..'

'නාලක හැම දෙයක්ම දන්නවා චායා.'.

චායා අසංක දෙස බැලුවේ පුදුමයෙනි. දෙවියනි මේ කියන්නේ මොනවාද.. මේ සියල්ල කළින් සැළසුම් කළ දේවල්ද..

'අද මේ ටික මම පපුවේ තියාගෙන ගියානම් මට හෙට උණ ගන්නවා චායා..'

ඔහු කීවේ කුඩා දරුවෙකු මෙනි. හදවත කුළුඳුලේ ගොස් පැටලුනේ මෙවන් සමනල පපුවකද...

'ඉක්මනට එන්න.. මට පාළුයි..'

ඔහු පහළට ගියේ එසේ කියාගෙනය. ඔහුගේ රුව ඒ සුවඳ පහළට ගියපසු පාළු දැනුනේ ඇයටය. මොහොතකට කළින් තමා දුටුවේ සිහිනයක්දැයි චායාට සිතාගන්නට බැරිවිය. ඇය තම දකුණත වමතින් කොනිත්තා ගත්තේ එය සිහිනයක් නම් දැන්වත් තමාව ඇහැරවාලන්නයැයි කියන්නට මෙනි. නැත.. මෙය සිහිනයක් නොවේ. හදවතට මහා බරක් එක්කළ බව සැබෑවකි. ජීවිතයේ එළඹි සුන්දරම මොහොතේ ලොව තිබුනේ කෙසේදැයි දැනගන්නට මෙන් චායා වට පිට බැලුවාය. තම දෛවයේ බොහෝ තීරණ ප්‍රකාශවූයේ මේ සුදු බිත්ති අතරය. සුදු සිවිලිම යටය. එද මෙන්ම අදත් මේ බිත්ති තමා දෙස ආදරයෙන් කරුණාවෙන් බලා සිටිනවා ඇය දුටුවාය.

චායා අසංකගේ මේසය ඉදිරිපිටවූ පුටුවට බරවූයේ අසරණවය. ඇය ඒ මේසයට බරව සැහෙන වෙලාවක් උන්නාය.

WWW.EXPRESSLANKA.TK 212

අසංක පහළට ගොස් නාලකට නොපෙනෙන්නට වීදුරු දෙරෙන් සාප්පුවේ පිටත කොරිඩෝවට බැස්සේය. වතුර බැරල් එකක් බොන්නට අවශ්‍ය වන තරමටම ඔහු පිපාසයෙන් උන්නේය. ජීවිතයේ අත්දුටු ආත්මගතම පිපාසය සංසිඳුන පසුවත් වතුර තිබහ ඒම පුදුමයකැයි ඔහුට සිතුණි.

'අසංක..'

නාලක පිටුපසින් විත් දයාබර ලෙස අසංකගේ පිටට අතක් යැවීය. ඔහු මිත්‍රත්වයේ පළිහුවෙන් වඩාත් පැහැදිලිව ඒ හැඟීම් දකගත්තේය. ඊයේ රෑ මේ මුහුණ තිබුනේ ලියා පද ගලපා ප්‍රස්තාර ලියා අහවර කළ ගීතයක් මෙනි. තිබුනේ එය ගයන්නට පමණි. මොහොතකට පෙර ඒ ගීතය ගයා අවසන් කර ඇති බව ඔහු ඉවෙන් මෙන් දැනගත්තේය. වායා වන් සුන්දර යුවතියකගේ මල්බර ආත්මය පාමුළ ඒ ගීතය නොගැයේ නම් එවැනි ගීතයක් පලක්නැත.

'නාලක..'

අසංකගේ හඬ මෘදුය. ඒ තමා මෙතෙක් දුටු මිතුරාගේ හඬ නොවන බව නාලක දනී. මේ ආදරයේ පෙරහන් කඩින් පෙරී එන පිරිසිදු වචනය.

'මංගල සූත්‍රය කියලා ඉවරද.'

නාලක සැහැල්ලු ලෙස අසංකගේ පිට හරහා සුරත යවා ඇසුවේය.

'කියන්න පටන් ගත්තා.'

අසංක දෙනෙත් අඩවන් කර කීවේය.

'ජේතවා ඒක.. පිරිත් පැන් උඹේ මූණේම නැවිලා.. ජීවිතේ පළවෙනි වතාවට ලස්සන ආදරවන්තයෙකුගේ පාට උඹේ මූණට ඇවිල්ලා.'

'ආදරේ මොන පාටද නාලක..'

'අතන කන්නාඩිය ළඟට ගිහිල්ලා මූණ බලපන්.. උඹේ මූණේ ඒ පාට තියෙනවා.. ඒ පාටට වචනයක් නෑ.'

නාලක දෙතුන් වරක් දයාබරව අසංකගේ පිටට තට්ටු කර

කීවේය.

"මට ලස්සන සිංදුවක් හදලා දීපන් නාලක.."

අයංකා නාලක වෙත හැරී මෘදුව සිනාසී කීවේය. නාලක ඔහු අත තිබූ දුම්වැටිය දල්වා ගත්තේ දඟකාර ලෙසිනි.

"ලස්සන සිංදුවක් තියෙනවා සේකර මහත්තයා ලියපු.. අහගනින්.."

චායා පහළට ආවේ ඒත් සමඟමය. ඇය ආ බවක් මිතුරන් දුටුවේ නැත. චායා ඔහුගේ මුහුණ දෙස අඩි දහයක් පහළවක් මෑතසිට බලාඋන්නාය. වීදුරු දොර ළඟ සිට ඇය ඔහුට කන්දුන්නාය.

තිම් වළල්ලෙන් එපිට සඳ රැස්..

ගලන නිල් මිටියාවතේ..

නිහඬතාවය තුළින් මතුවී.

ඔබේ පා මුදු හඬ ඇසේ..

චායා දෑත් බැඳගෙන නාලකගේ හඬ අනුව වෙනස්වන අයංකාගේ මුහුණ දෙස බලා උන්නාය. ඇයට පෙනෙන්නේ ඒ මුහුණේ හරි අඩකි. ඒ අඩ වුව සුන්දරය. උහුලාගන්නට බැරිතරම්ය.

අහස ගඟ බඩ හිමව් කුළු මත..

ඔබේ රන් මිණි විමානේ..

පහන් දල්වා තබනු මැන මා

නිදන කුටියට පෙනෙන සේ..

නාලකගේ හඬට චායාගේ පපුව පිරියයි. ජීවිතයේ පහන සදකාලයට ඔහුගේ කුටියට පෙනෙන සේ දල්වා තබන්නට ඇය සූදානම්ය.

සහස් මුවෙකින් නැගෙන ඔල්වර

සිනා හඬ දසතින් ඇසේ..

දහස් ගණනක් සෙනඟ අතරේ..

මහා තනියක් මට දැනෙයි..

ඒ තනිකම ජීවිතය පුරාම තමාට දැනෙන බව පමණක් චායාට විශ්වාසය. අදින් පසුව කාගේ හඬ ඇහුනද මට ඔබේ හඬ නැසෙන නැත ජීවිතය පාළුය.. හිස්ය.. දෙදෙනාගේම හදවතට ආවේ ඒ හැඟීමය.

එකවරම සද්ම් හඬක් ඇසී නාලකත් අයංකාත් දෙදෙනාම එකවර

WWW.EXPRESSLANKA.TK 214

හැරී බැලුවෝය. වායාට ඔහුගේ දෙනෙතින් නෙත් ඉවතට ගන්නට බැරිවූයේ ඒ දෙනෙත් ඒ මුහුණේ ඇලී තිබූ නිසාය. තනුවක් අහිමි පදමාලාවක් විය. පද මාලාවක් අහිමි තනුවක් විය. දෛවය ඒ දෙක එකතු කළේය. ආදරයේ ගීතය බිහිවූයේ එලෙසිනි. වායා මොහොතකින් නෙත් බිමට බර කරගෙන විලායිතාගාරය ඇතුළට ගියාය.

"මේක හදක්.. පුළුවන්නම් උඹේ අහසෙම තියාගනින්.. ජීවිතේම පසොළොස්වක තමයි.."

නාලක හැඟීම්බරව කීවේය.

"බැරිඋනොත්.. අමාවකද ජීවිතේම..

අසංක විවෘත දෑසින් ඇසුවේ දයාබරවය.

"මට උඹ ගැන හරි දුකයි අසංක..බැරිඋනොත් වොට් පන්සීයේ විතර ලයිට් එකක් දගනින්.. වෙන කරන්න දෙයක් නෑ.. ඒත් හඳ එළියේ තියෙන අහිංසක බලාපොරොත්තුව ලයිට් එළියේ නෑ."

නාලක අසංකගේ පිටට තට්ටු කර විලායිතාගාරය තුළට පිවිසුනේ වායා දෙස බලාගෙනමය. ඇය හැඟීම්බර සිත්තරෙකුගේ කලාත්මක පින්සල් පහරක් මෙනි. ඔහුට බියක් දැනුනේ ඒ පින්සල් පහර දෛවයේ කඳුළින් බොඳව යන නිසාද...

# 23

සැරසිලි සියල්ල නිමාවූ පසු වායාට බැලුනේ අසංක දෙසය. "ලස්සනද.." ඇය දෙනෙතින් ඇසුවාය. ඔහු ලස්සන බැලුවේ ඒ දෙනෙත් වලය.

"වායා නංගි අපි ලයිට් ටික දලා බලමුද.."

[illegible] කුඩා විදුලි [illegible] පොකුරු

WWW.EXPRESSLANKA.TK 215

දැල්වූ පසුය. චායා නිහඬව අසංක දෙස බැලුවාය.

'සර් ලයිට් දනවද..'

චායා සිනාසී කීවාය. ජීවිතයේ පහන එකවර දැල්වූ ඔහු හැර ඊට සුදුසු වෙන කෙනෙක් නැත. හදවතේ පරිපථ සියල්ල සම්බන්ධ කර ඇත්තේ ඔහුගේ පපුවේ ආදර ස්විචයටය. දල්වනවාද සදහටම අඳුරේ තබනවාද කියා තීරණය කළ යුත්තේ ඔහුය.

'චායා ස්විච් එක දන්න.'

අසංක කුළුණකට බරවී කීවේය.

'බෑ.. සර් දන්න.'

නාලක දෙදෙනා දෙසම බලා සිනාසී දෙතොල් තද කරගත්තේය. අසංක කුඩා පොකුරු බල්බ් වැල් එකට සම්බන්ධ කළ ස්විචය වෙත ගොස් එය දැමුවේය. අපමණ සුන්දරත්වයකින් හා පිත්බර බවකින් මුළු විලාසිතාගාරයම එකළුවිය. චායාගේ ඇස්වල කඳුළු පිරුණේ බලා ඉඳිද්දීමය. ඇය අසංක වෙත හැරුණේ ඒ කඳුළු සමඟය. ඔහු පවා ආශාවෙන් අවට බලා උන්නේය.

'ලස්සනද ස..ර්..'

චායා ඔහු සමීපයට ගොස් ඇසුවාය.

'හරි ලස්සනයි චායා.. අම්මා පුදුමවෙයි.. දෙයක් අහන්නද..'

ඔහු පහත් හඬින් ඇසුවේය.

'හා..'

'මගේ ජීවිතෙත් මේවගේ සරසලා දෙන්න බැරිද..'

ඇය බිම බලාගත්තාය. 'දෛවය එච්චර දෙයක් මට දෙන්නෑ.. ඒත් දුන්නොත් මේවගේ දහ ගුණයක් ලස්සනට සරසන්නම්.. මේ අත් දෙකින්..' ඇය සිහින් කීවාය.

'ආ චායා..'

'මේ දුප්පත් අත් දෙකට එච්චර වාසනාවක් නෑ සර්.. ඒක වෙන කෙනෙක් බාරගෙන නේද..'

මුලින්ම චායාගෙත් පසුව අසංකගෙත් දෙනෙත් බිමට බරවිය.

'මට ඔය අත්දෙක දුප්පත් නෑ චායා.. ඔයාට තරම් ලස්සනට

WWW.EXPRESSLANKA.TK 216

කාටවත් මගේ ජීවිතේ සරසන්න බෑ.'

වායා කතා නොකළාය.

'ලස්සනද නාලක අයියේ.'

වායා නාලක වෙත හැරී ඇසුවේ හිතේ මහා බරක් සඟවාගෙනය.

'වැඩක් නෑ නංගි කියලා.. මං ඔයා උනානම් කියලා මට හිතෙනවා. ලස්සන කියන්නේ ඇස් දෙකට පේන දෙයක් නෙවේ.. පපුවට දැනෙන දෙයක්.. ඔයා ඒක කළා.'

නාලකගේ කතාව කොතරම් සත්‍යදැයි අසංකට සිතුණි. තමාට පිහිටන්නට තිබුනේ ඔහුගේ කවි සිතය. එසේනම් හදවතේ ඇති සියළු හැඟීම් ලස්සනට ඇයට කියන්නට තිබුණි.

'මම උඩ වහලා එන්නම්..'

අසංක උඩුමහල වෙත ගියේ වායාවත් නාලකවත් පහළ තබාය. අසංක ගියපසු නාලක වායා වෙත හැරුනේ සුන්දර සිනාවක්ද සමගිනි. ප්‍රේමයේ මධුර ආනන්දය උතුරා ගලායන මොහොතක මුනිවත රකින්නට ඔහුගේ හිත ඔහුට ඉඩ නොදෙයි.

'වායා නංගි.. අදයි අපි අඳුන ගත්තේ. ඒත් කාලයක් ඉඳලා ඔයාව දන්නවා වගේ මට දැනුනේ. සිද්ධ උනේ මොනවද කියලා මං දන්නෑ.. ඒත් මොනා හරි දෙයක් උනා කියලා මේ මෝඩයගේ කලා හිතට දැනෙනවා.. ඒක ඔය ලස්සන මූණෙන් පේනවා.. මගේ සුබපැතුම් පිළිගන්නවද..'

නාලක මෘදු ලෙස කීවේය. වායා දෙනෙත් බිමට බර කළේ පින්බරවය. ඒ සිනහව දුක්බරයැයි ඔහුට සිතුණි. සුබ පතන්නේ කුමකටදැයි වායා ඇසුවේ නැත.

'මේක ලොකු දුකකින් කෙළවර වෙන ගමනක් නාලකයියේ.. ඒ නිසා අයියගේ සුබපැතුම මම අදට විතරක් බාර ගන්නම්..'

වායාගේ ඇස්වල කඳුළු පිරුණි.

'ලස්සන කතාව ටික දුරක් හරි දුකක් නැතුව අරගෙන යන්න නංගි.'

නාලක වායාත් සමඟම ඉදිරිපස බැල්කනියට එමින් කීවේය.

WWW.EXPRESSLANKA.TK 217

ඒත් සමඟම වාගේ රතු පැහැගත් කාර් රියක් සාප්පුව දෙසට හැරවිණ. එය පදවාගෙන ආවේ හර්ෂණී බව චායා අදූරේම හඳුනාගත්තාය. ඇගේ සිතට ගලා ආවේ රුදුරු බියකි.

'සමහර කතා එහෙමයි නාලකයියේ.. පටන් ගන්නකොටම දුකයි.'

චායා ඒ කතාව කීවේ හර්ෂණීව දක බව නාලක හොඳින්ම තේරුම් ගත්තේය. ඔහු කරකියාගත හැකිදෙයක් නොමැතිව චායාත් සමඟම හර්ෂණී වාහනයෙන් බැස එන අයුරු බලා උන්නේය. චායාට වැඩිවෙලාවක් බලා ඉන්නට ඉඩක් නොලැබිණි. ඇගේ දෙනෙත් බිමට බරවිය. ඒත් හර්ෂණීගේ දෙනෙත් තිබුනේ චායා වෙතය. වෙනදට වාම්ව උන්න චායාගේ අද ස්වරූපය ඇයව තැති ගැන්වුවේය.

'හර්ෂණීව දක්ක කල්..'

නාලක අපහසුතාවයෙන් මෙන් කීවේය. ඔහු ඉන්නේ බියපත්ව බව චායා හොඳින්ම තේරුම් ගත්තාය. අසංක පහළට නොඑනවා නම් යැයි ඇය සිතුවාය.

'ආ.. මොකෝ මෙහේ.. සංගීතයක්වත් දන්නද.. ඔයා මොකද අද හොලිඩේ දවසෙත්...'

හර්ෂණී අහද්දී චායාට බැලුනේ නාලක දෙසය.

'අද ෂොප් එක ඩෙකරේට් කළා මිස්,. ටිකක් රෑවුනා.'

චායා අමාරුවෙන් වචන එකතු කර කීවාය. ලස්සන දවසක් මූසල කමින් කෙළවර වූවායැයි ඇයට හීල්ලිනි. නාලකටත් ඇතිවූයේ එවැනිම හැඟීමකි.

'ආ.. මේකද මහ ලොකු සැරසිල්ල... මේක හොඳයි පන්සලකට.. කාගෙද අයිඩියා එක නාලකගෙද..'

හර්ෂණී අතවූ යතුර කරකවමින් ඇසුවාය. ඇයත් සමඟ ආ තවත් යුවතියක් වාහනයට බරවී චායා දෙසම බලාගත්වනම බලාඋන්නාය.

'අපි කතාවෙලා කළේ..'

නාලක කීවේ චායාව බේරගනු පිණිසය. එය චායාද තේරුම්

WWW.EXPRESSLANKA.TK 218

ගත්තාය.

'වැඩේ ඉවරනම් ගියානම් හරිනේ..'

හර්ෂණී කියද්දී චායා අසරණව ඇතුලේ තිබූ ඇගේ හෑන්ඩ් බෑගය අතට ගත්තාය.

'කෝ නාලක අයංක.'

'උඩ..'

නාලක කීවේ එපමණකි. හර්ෂණී තවත් වරක් චායාදෙස බලා ඉහළමාලය වෙත ගියාය. චායා නෙත් කොනකින් ඒ දෙස බලා උන්නේ පපුව ඉරී යද්දීය. ඇගේ දෙනෙත් තෙත්ව යනු නාලක බලාඋන්නේ සංවේගයෙනි. ආදරය මොන පැත්තකින් ගත්තද දුකකි.

'මං යනවා නාලකයියේ.. සර්ට කියන්න.. අයියා මතක් කරලා ලයිට් ඕෆ් කරන්න.. සර්ට අමතක වෙයි.'

චායාගේ නෙත් අගකින් කඳුළක් පැන්නේ නාලක බලා ඉඳිද්දීමය.

'පියසුද.. ඩූටිටක් ඉන්න.. අරූ මාව කයි.. මේ රෑ ඔයාව තනියම යවලා..'

නාලක හර්ෂණී සමඟ ආ යුවතියට නෑසෙන්නට රහසින් මෙන් කීවේය. චායා දිගටම නෙත් බිමට ඔබාගෙන උන්නාය.

'මට බස් එකේ යන්න පුළුවන් නාලකයියේ.. මං යන්නම්.. අම්මත් බලං ඇති.'

නාලකට ඇයව අතින් අල්ලා නතර කරන්නට සිතුනි.

'චායා.. එපා..'

ඔහු වඩාත් තදින් රහසින් කීවේය.

'මං යනවා.. ගුඩ් නයිට් අයියේ..'

චායා විලාසිතාගාරයේ ගේට්ටුවෙන් පිටවෙනවා නාලක බලා උන්නේ ඇවිලිගිය හදිනි. ඔහු අත රැඳි ඔරලෝසුවෙන් වේලාව බැලුවේය. එහි නමයයි දහය ලෙස සටහන්ව තිබුණි. ඔහු ඉහළ මාලය දෙස බලා අමාරුවෙන් අසංක එනතුරු බලා උන්නේය.

පොද නිසා පාරවල් පාළුවට ගොස් තිබුනි. චායා බස් නැවතුම දක්වා ආවේ බියවත් වවා දකෙනි. ඇයට දුක සිතුණේ ඔහුට යන්නම්

කියාවත් කියාගන්නට නොලැබුන නිසාය. පාළු මාවතේ නැත් දෙක තුනක ඇගේ කඳුළු වැටුණි. ඒවා බලන්නට කෙනෙක් නැත. ඒ නිසා ඔහේ ගලා ගියාදෙන් කියා වායා ඇවිදගෙන ආවාය.

වායා බස් නැවතුමට එද්දී එහි කිසිවෙකු උන්නේ නැත. ඇගේ පපුවට මහා බියක් දැනුණි. ඉදහිට යන වාහනයක් විනා බස්රියක් ආවේම නැත. මාවතේ වේගයෙන් ඇදී ආ ත්‍රී විලර් දෙක තුනකම වේගය වායා අසලදී බාලවිය. ඇගේ දෙපා ගැහෙන්නට විය.

ආදරයේ තරම.. සඳළු තලාවක පිපුනද ජීවිතය ඇත්තේ මේ හුදෙකලා කාණු පල්ලේ නොවේදැයි වායාට සිතුණි. පැය බාගයක් පමණ ගතවීත් බස්රියක් නොපැමිණෙද්දී වායාගේ දෙනෙත් වලින් කඳුළු පේළි තුන හතරක් ගලා ගියේය. ඇය තොල් පට තද කරගෙන ඇඩූම්බරව බලාඋන්නාය.

හර්ෂණීව පිටකර අසංක වාහනය එළියට ගත්තේ කෝන්තියෙති. ඔහු රකුසෙකු මෙන් වාහනය නැවතුම කරා පැදවූවේය. වායා බස්රියක ගොස් නම් මේ රෑ ගෙදරට හෝ යනවායැයි ඔහු සිතා ගත්තේය.

කුන්මුල්ලේ සළුසල ඉදිරිපිට නැවතුමේ හුදෙකලාවේම ඉන්නා වායා දුටු අසංකගේ පපුව පත්තුවිය. ඔහුට බැලුනේ නාලකා දෙසය.

'කෙල්ල ඉන්නවා මචං...'

අසංක පොඩි දරුවෙකු මෙන් කීවේය. වායා හුදෙකලාවේම නැවතුමේ ඉඳිනු දකිද්දී නාලකටද දුක සිතුණි.

'පව්.. දුප්පත් කෙල්ල.'

ඔහුට කියැවිණි. අසංක වාහනය වට රවුමෙන් ගෙන ගොස් සෙමෙන් සෙමෙන් එය වායා අසල නැවැත්විය. අසංකගේ වාහනය දකින්ම වායාට සැනසිල්ලක් දැනුණි. ඇය කඳුළු පිටි අත්ලෙන් පිසදගන්නට නැත් කළාය. ඒත් රීට කළින් අසංක වාහනයෙන් බැස්සේය.

'ඈ..යි.. ආවේ..'

ඔහු ඇසුවේ ඒ නෙත මුහුණ දෙසම බලාය.

'වැඩ ඉවරනේ සර්.. අම්මත් බලං ඉන්නවා.'

අසංක ඒ මුහුණ දෙස බලාගත්වනම බලා උන්නේය. මාවතේ

WWW.EXPRESSLANKA.TK 220

දැල්වූ අමුතුම කහ පැහැයක් ගත් වීදි පහන් එළියට ඒ මුහුණ පෙනුනේ වඩාත් සුන්දරවය.

'ඇයි බබා අඬන්නේ...'

'බලං උන්නා උන්නා බස් නෑ සර්.. මට බය හිතුනා.'

අසංකට කෝන්තියක් උපන්නේ හර්ෂණී ගැනය. මේ සියල්ල කළේ ඇයයයි ඔහුට සිතුණි.

'නගින්න..'

නාලක එතෙක්වෙලා ඉඳගෙන උන් ඉදිරිපස අසුනෙන් බැස වායාට දොර ඇර දුන්නේය.

'නෑ සර්.. දැන් බස් එයි.. පුළුවන් නම් සර් බස් එකක් එනකල් මෙතන ඉන්න.. බීපු ත්‍රී වීලර්කාරයෝ ළඟින් යනවා.'

වායාට දෙවන වතාවටත් ඇඬුණි. හිත මේතරම්ම කඩා ඉහිරෙන්නේ ඇයි.

'ගුටි කන්නැතුව
නගින්න.'

'මං බස් එකේ යන්නම් සර්..'

අසංක නාලක බලා ඉඳිද්දීම වායාගේ පුරන දෑඩිව අල්ලාගත්තේය.

'නගින්න..'

ඔහු කීවේ එපමණකි. ඇය අවනත වූවාය. ඒ දැස් වලට පිටුපෑ නොහැක.

'මං පස්සෙන් නගින්නම්.. නාලක අයියා ඉඳගන්න.'

නාලක ඉදිරිපස අසුන ඇයට පිළිගන්වද්දී වායා පසුපසට වී කීවාය.

'මූට පිටිපස්සට ඇස් නෑ. වායා නංගි නගින්න ඉස්සරහට..'

නාලක වායාගේ පිටට අත තබා සැබෑ ලෙසම ඇයව ඉදිරිපස අසුනට එබුවාය. අසංක වාහනයට නැග්ගේ සැනසීමෙනි. වායාගේ සිත වඩාත් බරව තිබුණි. පාළු හයිලෙවල් පාර දිගේ වාහනය මඳ වේගයෙන් ධාවනය වෙමින් තිබුණි. අසංක හිතාමතා මඳ වේගයෙන් යත [illegible]

WWW.EXPRESSLANKA.TK 221

'තාලක සිංදුවක් කියපන්..'

අසංක පිටුපසට හැරී කීවේ සිත ඒ තරමටම හැඟීම්බරව තිබූ නියාය. චායා වාහනය තුළ වූ අඳුර මැදින් ඔහු දෙස බලා උන්නාය. තමාට පෙනි පෙනී මේ සම්පත අහිමි වන බව ඇය දැන උන්නාය. ඒ ගැන දුකක් ඇයට නැත. ඔහු දුන් ආදරය ජීවිතයට ඇතිය. ඒ මතකය වුව අගේයැයි චායා සිතාගත්තාය. නොවේනම් එසේ සිතා හිත හදාගත්තාය.

මිත්දද හීසර
වැදී සැලෙන හද..
නංවන දුක් ගී ඔබට ඇසෙනවද..
චන්දන මල් අතුරා ඇති යහනට..
කන්ද කපා පායන් රන් පුරහද..

ආදර වැස්සේ තෙමී.. මිත්දද හීසර වැදී ඒ කුළුඳුල් තුවාල සහිත හදවත් දෙකක් ඉදිරිපස තබාගෙන කිව හැකි ඊට වඩා සුන්දර ගීතයක් තාලකට සොයාගත නොහැකි විය. අසංක චායා දෙස බැලුවේ හැඟීම්බරවය. 'ඔහොම බලන්නට එපායැයි..' කෑගසා කියන්නට ඇයට සිත්විය.

තුරඟෙකු පිට නැඟි
මේඝ වලාකුළු..
ගුවන් ගැබින් පිට ඇදෙන වෙලේ..
නෙත් මිණි පහනින්
පහන් කරනු මැන
සුසුම් සිනා කැන්
හද මත අතුරා..

ආදරයේ පරම නිර්මල හෘදයාංගම සිනහව ඒ ඇස්වල ඇත්දැයි සොයාගන්නට මෙන් අසංක වාහනය පදවනා අතරතුර චායා දෙස බැලුවේය. ජීවිතයේ අනන්ත පරතැස නිවනා සංසාරගත මදහස ඒ තුනී තොල්පට මත යංතමට පිපී තිබුණි. ඒ සිනහව රැඳෙන ඇදෙන නැවරෙන දුරක ජීවිතය සදාකාලයටම සතපවා ගන්නට පිනක්ඇත්නම්.. [illegible] අසංක සිතුවේය.

WWW.EXPRESSLANKA.TK 222

# 24

'අසංක මම නුගේගොඩින් බහිනවා..'

ඇත්තටම ඔහු බැසිය යුත්තේ නුගේගොඩින් නොවේ. එහෙත් ආදරයේ එළඹෙන ප්‍රථම රාත්‍රියේ තනිවන හදවත් දෙකකට ගලන්නට නිදහස දියයුතුය. පිපෙන්නට ඉඩ දිය යුතුය. නොවේනම් එය පාපයකි.

'හිටපන්.. මම බෝඩිමටම දන්නම් නාලක..'

'බැ මචං.. මට පරක්කු වෙනවා. උඹ චායාව බස්සපන් ඉක්මනට.. මේ කෙල්ලගේ අම්මා බයවෙලා බලං ඇති.'

අසංක වාහනය නුගේගොඩ හන්දියේ කොනක නැවැත්වූවේය. නාලක බැස යළිත් අසංකගේ පැත්තෙන් මතුවිය. අසංක පැති වීදුරුව පහත් කළේය.

'උඹලා දෙන්නට මොනවා කියන්නද කියලා මං දන්නෑ.. මං යන්නම් අසංක.. යන්නම් නංගි..'

චායාත් අසංකත් හෘදයාංගමව හිස වැනුවෝය. නාලක හයිලෙවල් පාරේ ඇදීයන අසංකගේ වාහනය දෙස බලා උන්නේ සුසුමක්ද හෙලමිනි. මේ යන ගමනේ කෙළවර කොතැනද...

'දැන් ඉතින් පයින්ම බෝඩිමට යමන් නාලක.. මොනා කරන්නද කලාකාරයෝ උනාම ඔහොම තමයි..'

නාලක තමාටම මුමුණමින් පාළු මාවතේ ඇවිදගෙන ගියේය.

මහරගමට එනතෙක්ම අසංකත් චායාත් කතාකළේ නැත. එහෙත් දෙදෙනාගේම හදවත් වාහනයේ ඇතුළු බඳ පුපුරා යන තරමටම දෙඩම[illegible] මත තිබු

WWW.EXPRESSLANKA.TK 223

වමත වඩාත් මෘදුලෙස වායාගේ උකුල මත තිබූ සුරත මත තැබුවේය. වායාගේ ඒ පැත්තම හිරි වැටිණි.

'කතා නොකර ඉන්නේ මා එක්ක තරහ වෙලාද..'

ඔහු අසරණව ඇසීය. ඒ හඬ ඇගේ දෑස් තෙත් කරවන්නට සමත් විය. -

'සර් එක්ක තරහ වෙන්න මං දන්නෑ සර්..'

'ඇයි මාව දාලා ආවේ.'

ඔහු ඇසුවේ ඇයව අඬවන්නට සිතා නොවේ.

'ආ වායා.. ඇයි මාව දාලා ආවේ..'

'සර් මාව දාලා යනවා බලං ඉන්න බැරිනිසා..'

වායාගේ වචන අයංක බලාපොරොත්තු වූවක් නොවේ. ආදරයේ මුව දොර අභියසදී කෙල්ලෙකුගේ වචන මේ තරම් හැඟීම්බර යැයි ඔහු දැනගෙන උන්නේ නැත.

'ඒකද ඒ දුක මට දුන්නේ.'

'අපි දෙන්නගෙන් කවුරුහරි ඒ දුක විඳින්න ඕනේ සර්..'

'මං නිසාවත් බැරිද දුක් විඳින්න..'

ඔහු තීරණාත්මක ලෙස ඇසුවේය.

'සර් කියනවා නම් මං ඇති තරම් දුක් විඳින්නම්.. කොහොමටත් මට කවදාහරි දුක තමයි.. ඒක ගාණක් නෑ සර්.. ඒත් සර් දුක් විඳින්න එපා.. හර්ෂණී මිස්ව දැක්කහම මට බය හිතුනා. පපුව ගැහෙන්න ගත්තා. මං එයාට වරදක් කළා නේද කියලා මට හිතුනා. මාව මේ තරම්ම අසරණ කරන්න එපා සර්.. මං පව් කරන්න බයයි.'

වායා හඬමින්ම කීවාය. ජීවිතේ ලස්සනම දවසක වැඩිපුරම කළේ ඇඬූ එකය..

'ආදරේ කියන්නෙ පවක්ද වායා..'

'සර් වෙනුවෙන් ඒ පවත් මම විඳින්නම්.. අද සිද්ධ වෙච්ච හැම දෙයක්ම හීනයක් කියලා මං හිතන්නම්...'

WWW.EXPRESSLANKA.TK 224

'අපි ඒ හීනෙම ජීවත්වෙමු චායා..'

ඔහු මෘදුලෙස ඇගේ ඇඟිලිකරු අතර ඇඟිලි හිරකර කීවාය. ඒ අත්ල පුංචිය. ඕනානම් එක අතකට අත්දෙකම ගත හැක.

'කවිරුහරි ඇහැරවයි සර්.. ඇහැරුනාම මේ දුප්පත් කෙල්ල තනියම නේද..'

චායාගේ ප්‍රශ්නයට පිළිතුරක් ඔහු අත නැත. යළි පිපෙන්නට ප්‍රථම ජීවිත අහසේ තරු තැබුවේ කවුද..

'හීනයක් උනත් මේ තරම් ලස්සන හීනයක් ආයේ කවදාවත් දකින්න බෑ චායා..'

'ඇත්ත සර්.. මං වගේ දුප්පත් කෙල්ලෙකුට සර් සමනල කන්ද වගේ.. ඒත් මං කොහොමද සර් හෙට මැඩම්ගේ මූණ බලන්නේ. මම ලොකු වරදක් කළා කියලා මට හිතෙනවා.'

'හැම දෙයක්ම මං නිසා නේද..'

ඔහු දුක්බරව ඇසුවේය.

'නෑ සර්.. මං පහන තියලා තෙලුත් දලා පහන් තිරෙන් දන් උන්නා.. ආසාවට.. සර් ඇවිත් අද ඒක නොහිතපු විදිහට පත්තු කළා.. අපි හම්බවෙන්න ඉන්නත් ඇති.. ඒකනේ මැඩම් ඉන්ටර්විව් ආපු මේ දුප්පත් කෙල්ලවම ගත්තේ.. ඒත් සර්...'

චායා අද කවරදාටත් වඩා දෙඩමළුය.

'ඇයි චායා..'

'මේ හීනේ මට දීලා සර් යන්න සර්.. මට ජීවිත කාලෙට මේ ටික ඇති. හොඳටම ඇති.'

චායා පහත්වී තම අතමත පැටලී තිබූ ඔහුගේ පිටි අත්ල සිපගත්තාය. ඒ ස්පර්ශයෙන් ඔහු පිබිදුනේ මලක් මෙනි.

'මට මේ ඇති සර්.. සිද්ධ වෙච්ච හැම දෙයක්ම මට දීලා සර් හිත නිස්කලංක කරගෙන යන්න.'

ඇය වඩාත් කරුණාබරව කීවාය. ඒ දෙනෙත් වලින් ගැලූ කඳුළු [illegible] කොට්ටාව

WWW.EXPRESSLANKA.TK 225

පසුව හමුවන විශාල වෙල්යාය අද්දර අඳුරේ වාහනය නතර කළේය.

'ඇයි වායා ගැහෙන්නේ..'

ඇගේ අත්ල ඇකිලී තිබෙනු දැක ඔහු ඇසුවේය.

'සර් ඒයි පුල් දාලා සීතලයි..'

වායා කීවේ බොරුවකි. පහන් දෙකක් දැල්වෙන ආදරයක් හදවතේ තිබෙද්දී කවර සීතලක්ද.. අසංක වායුසමීකරණය අඩුකොට ඇය වෙතට බරවිය.

'ස..ර්..'

ඔහු ඉහිලුම් නොදෙන ආදරයකින් ඇගේ උරහිසක් සිප ඒ උරහිසට බරවිය.

'මම මෙහෙම මැරෙන්න ආසයි වායා..'

ඔහුගේ කතාවට ඇගේ ළය සීතල විය.

'අද මාව ගෙදර දන්නේ මාව තවත් අඩවලද සර්..'

'මට එක පාරක් අසංක කියලා කතාකරන්න..'

'මට ඒක හිතින් විතරක් කියන්න දෙන්න සර්..'

'එකපාරක් විතරක් කියලා මට පෙන්නන්න.. ගෙදර ගිහිල්ලා මතක් කරන්න.'

වායා ඒ ගතින් හිස නැඹුවාය. ඔහු ඇගේ ළය හරහා සුරත දමා 'ඇයව වාහනයේ මැදට ඇද ගත්තාය.

'කියන්න..'

ඔහුගේ මුව තිබුනේ පොඩිවී ගිය ඇගේ මුහුණ අද්දරය.

'අ..ස..ං..ක.. ගොඩක් දුරගියාම හැරෙන්න අමාරුයි..'

'ඉතින්.. අපි දිගටම යන්.. ඇයි හැරෙන්නේ..'

'එහෙම වෙනවා සර්.. මං දන්නවා.. මං වගේ දුප්පත් අම්මා කෙනෙක්ගේ දුවෙක් එක්ක ලොකු දුරක් යන්න බෑ.. හැරෙන්නම වෙනවා.. අපි දන්මම හැරෙමු සර්..'

'ඔයාට පුළුවන්ද වායා..'

ඔහු හුල්ලා ඇසුවේය. මෙතුවක් දවසක් ඇය දුටු ගාම්භීර

WWW.EXPRESSLANKA.TK 226

තරුණයා යටකරගෙන ළාමක ළද බොළඳ තරුණයෙකු තමාගේ දකුණු පසින් සිට තමාගෙන් ජීවිතය පතන යෙයක් ඇයට දැනුණි. ඒ වචන වල රැඳි පූජනීය බව ප්‍රතික්ෂේප කළනොහැකි ලෙස ඇයව හිරිවැට්ටුවේය. ඔහු වැන්නෙකු තමාගේ ආදරය.. ජීවිතය නොව සුළු උපකාරයක් පැතීම පවා සමාජයට විහිළුවකි.

'පුළුවන්ද චායා..'

'ඕන්.. සර්..'

'මං අහන්නේ පුළුවන්ද ඔයාට..'

'බැරි උනත් සර්..'

'මෙච්චර ඉක්මනට මාව හිතෙන් ඈහැරවනවද... පව්නැද්ද.'

'මං කිව්වනේ පව් මං ගෙවන්නම් කියලා.'

චායාට ඔහුගේ වතින් එන පිරිමි විලවුන් සුවඳ ළං ළංව දැනෙයි. ඒ සුවඳ පරයා ඔහුගේ හදවත ඇතුලාන්තයෙන් එන සුවඳක් ඇයට දැනෙයි. ආදරයේ ප්‍රථම ආදර සුවඳ සිහිනෙන් විඳි සුවඳක් වුයේ ඇයි.

'මට පොරොන්දු වෙන්න..'

ඔහු දිග අත ඇය වෙත පෑවේය. ඇය අසරණව ඔහුදෙස බැලුවාය.

'මො..ක...ක්..ද..'

'ඔයාට හිතෙනවද චායා මම ඔයාගෙන් ආදරේ ඇරෙන්න වෙන දෙයක් බලාපොරොත්තු වෙනවා කියලා..'

ඇගේ පපුව හිරි වැටීගෙන ගියේය. සතර මහා දෙවිවරුන් දිවුරා කිව හැක. ඔහු ගැන ඇගේ සිත තුළ ඇත්තේ අතිශය පූජනීය දෙවිරුවක් හා සමාන හැඟීමකි.

'අනේ සර්.. කවදාවත් මම එහෙම හිතන්නෑ.. කව..දා..වත්.. නෑ.. මේ අත මට හරි සුවදායි.. මේ බලන්න මං ඉඹිනවා.'

ඇය ඇත්තටම ඒ සුරත ගෙන දෙතුන් වරක් සිපගත්තාය. නැත... ආදරයේ නිර්මල පුදුම ඇරෙන්නට අන් සුවඳක් ඒ අත්වල නැත.

WWW.EXPRESSLANKA.TK 227

'ඒත් සර්..'

ඇය අඳුරේම හීල්ලුවාය. ඔහු ඇගේ උරහිස මත හිස තබාගෙන ඇයට ඇහුම්කන් දුන්නේය.

'ඉස් ඉස්සෙල්ලම මේ මූණ ඉම්බේ සර්.. මගේ ජීවිතේ ඕන දෙයක් සර්ට ඕන වෙලාවක ගන්න. මට ඒවා දෙන්න කව්රුවත් නෑ.. කවදාවත් මම හොයාගන්නෙත් නෑ.'

වායාගේ වචන ඔහුව අවුළුවා දැමුවාක් මෙනි. ජීවිතය හා ආදරය සමඟ බැඳුණු ගැහැණු ආකල්ප පූදමාකාරයැයි ඔහු සිතුවේය. ජීවිතය පූදදී ආදරය ජීවත් කරවන පෙම්වතියකගේ උගුලාගත නොහැකි පරිත්‍යාගය ඉදිරියේ පිරිමියෙකුගේ ආදරය විහිළුවකි.

'මුකුත් එපා කෙල්ලේ.. මට වැටිලා ඉන්න හිතේ කොනක් දෙන්න.'

ඔහු ඇගේ ගෙළ පිරිමැද කීවේය.

'සර්.. සර් වගේ කොල්ලෙක් කාගෙවත් හිතක කොන්වල අඟුවල වැටිලා ඉන්න ඕනනෑ සර්.. ඇරලා තියෙන හැම දෙරකින්ම හිතට ඇවිත් ඉන්න. හිතුන වෙලාවක යන්න. සුවඳ විතරක් තියලා.. මේ හිඟන්තිට ඒ ඇති.'

'මගේ ජීවිතේ ගැන ඔයා දන්නවා වායා.'

'මං හොඳට දන්නවා සර්.. අපි අද රෑ විතරක් ඒවා කතා නොකර ඉමු..'

ඇය ප්‍රථම වරට ඔහු දෙසට මෘදුව හැරී සිනාසී කීවාය. ඔහුගේ නෙත් ලෝබකමින් පිරුනි.

'ඇයි අද රෑ විතරක්..'

'දුප්පත් කෙල්ලෙක්ගේ ජීවිතේ එකපාරක් විතරක් උදාවෙන ලස්සනම රෑ.. ආයේ කවදාවත් මේ වගේ දවසක් උදාවෙන්නෑ.. මට ඒ දවස දෙන්න සර්.'

'මේ රෑ මට මොනවාද දෙන්නේ.'

WWW.EXPRESSLANKA.TK 228

'ඒත් සර්..'

ඇය අඬුරේම හීල්ලුවාය. ඔහු ඇගේ උරහිස මත හිස තබාගෙන ඇයට ඇහුම්කන් දුන්නේය.

'ඉස් ඉස්සෙල්ලම මේ මූණ ඉම්බේ සර්.. මගේ ජීවිතේ ඕන දෙයක් සර්ට ඕන වෙලාවක ගන්න. මට ඒවා දෙන්න කව්රුවත් නෑ.. කවදාවත් මම හොයාගත්තෙත් නෑ.'

වායාගේ වචන ඔහුව අවුළුවා දැමුවාක් මෙනි. ජීවිතය හා ආදරය සමඟ බැඳුණු ගැහැණු ආකල්ප අද්භූමාකාරයැයි ඔහු සිතුවේය. ජීවිතය පුදදී ආදරය ජීවත් කරවන පෙම්වතියකගේ උගුලාගත නොහැකි පරිත්‍යාගය ඉදිරියේ පිරිමියෙකුගේ ආදරය විහිළුවකි.

'මූකුත් එපා කෙල්ලේ.. මට වැටිලා ඉන්න හිතේ කොනක් දෙන්න.'

ඔහු ඇගේ ගෙළ පිරිමැද කීවේය.

'සර්.. සර් වගේ කොල්ලෙක් කාගෙවත් හිතක කොන්වල අහුවල වැටිලා ඉන්න ඕනනෑ සර්.. ඇරලා තියෙන හැම දෙරකින්ම හිතට ඇවිත් ඉන්න. හිතුන වෙලාවක යන්න. සුවඳ විතරක් තියලා.. මේ හිඟන්නිට ඒ ඇති.'

'මගේ ජීවිතේ ගැන ඔයා දන්නවා වායා.'

'මං හොඳට දන්නවා සර්.. අපි අද රෑ විතරක් ඒවා කතා නොකර ඉමු..'

ඇය ප්‍රථම වරට ඔහු දෙසට මෘදුව හැරී සිනාසී කීවාය. ඔහුගේ නෙත් ලෝබකමින් පිරුනි.

'ඇයි අද රෑ විතරක්..'

'දුප්පත් කෙල්ලෙක්ගේ ජීවිතේ එකපාරක් විතරක් උදාවෙන ලස්සනම රෑ.. ආයේ කවදාවත් මේ වගේ දවසක් උදාවෙන්නෑ.. මට ඒ දවස දෙන්න සර්.'

'මේ රෑ මට මොනවද දෙන්නේ.'

WWW.EXPRESSLANKA.TK 229

'සර් ඉල්ලන දෙයක්..'

ඇය විවෘත දෑස් දල්වාකීවාය.

'ගෙදරට තව දුරද.'

'නෑ දැන් ළඟයි..'

'දෙන්න හිතෙන දෙයක් දෙන්න.'

ඔහු ඇගේ උරහිසට බරවී දෑස් පියාගෙන උන්නේය.

චායා ඔහුව දකුණතෙන් දරාගෙන ඒ මුහුණ දෙස අතිශය පවිත්‍ර දෙනෙතින් බලා උන්නාය. ඊටත් පසු ඇය දෙනෙත් පියාගෙන ඒ නළලට දෙතොල තැබුවාය. එහෙමම උන්නාය. දැවෙන්නේ නළලද දෙතොලද කියා ඇය නොදනී.. කුමක් හෝ දැවෙයි.

'මෙතනට..'

අසංක දඟකාර ලෙස සිනාසී දඹරැඟිල්ල දෙතොලට තැබුවේය.

'මං ඒවා දන්නෑ.'

ඇය අහිංසකව කීවාය. අසංක වඩාත් පිරුණු අනුරාගයකින් ඒ දෙතොල් තදින් සිපගත්තේය. යංතමට උණුසුම් වූ ඇගේ පපුවෙන් එන රස්නය ඔහුගේ දෑතට තදින් දැනුණි.

'සර්..'

'ඇයි චායා..'

'මට තව එක දෙයක් කරන්න ඉඩදෙන්න.

'මොකක්ද..'

අසංක පුදුමයෙන් ඇසුවේය. චායා ඇගේ පැත්තේ වූ දොර ඇරගෙන ඔහුගේ පැත්තට ආවාය.

'චුට්ටක් බහින්න සර්..'

අසංක පුදුමයෙන් චායාදෙස බලාබැස්සේය. ඇය මොහොතක් ඔහුදෙස බලා හිඳ මහපාරේ දූවිලි අතර දණ ඔබා ඔහුට වැන්දය.

'මේ මොනවද මේ කාළේ..'

ඔහු මහ පාරේදීම ඇයව තුරුල් කරගත්තාය.

'මං වගේ දුප්පත් අහිංසක කෙල්ලෙක්ට චුට්ටං ආදරයක් හරි

WWW.EXPRESSLANKA.TK 230

දූන්නට.. මට මීට වඩා දෙයක් කරන්න දන්නෑ සර්..'

වායාගේ ඇස්වල කඳුළු එය.

'මගේ ආදරේ චූටිටංද මැණික.'

'මට දූන් ඒ ආදරේ හැමදම ගේ ළඟට පේන සමනල කන්ද වගේ සර්..'

'ඇයි පිදුරු තලාගල වගේ කියන්නැත්තේ.. ඒක සමනල කන්දට වඩා ලොකුනේ.'

'ඒත් සර්.. සමනල කන්ද තරම් පින්පාට නෑ. පහුවට දූනෙත් නෑ ඒක දැක්කම. සමනල කන්ද දැක්කත් අත් දෙක එකතු වෙනවා.'

'ආයේ මට වඳින්න එපා.'

ඔහු දුක්බරව ඇගේ හිස අතගාකීවේය.

'අපි යන් සර්.. රෑ වෙනවා.'

'නිදිමතද බබාට..'

'නෑ.. අද නින්ද යන්නෑ සර්..'

වායා ඔහුගේ සුරතින් ගිලිහුන හිස් පුරන වමතින් පිරිමැද කීවාය.

# 25

'හැමදම මම එන්න කලින් ඇවිත් ඉන්න..'

ගොඩගම හන්දියෙන් බහින්නට ඔන්න මෙන්න කියා තිබියදී අසංක ඒ සුරත මත වමත තබා කීවේය. වායාට බැලුනේ ඔහුගේ වමතේ මුදුහිල්ලේ දිලිසෙන සුදු ගලක් ඇල්වූ රත් මුදුව දෙසය. මේ මුදුව වමත් මුදුහිල්ලෙන් දකුණතේ මුදුහිල්ලට මාරුවනද.. වායාගේ [illegible]

WWW.EXPRESSLANKA.TK 231

අම්මා ලතා අක්කාත් සමඟ පාරට පැමිණ සිටිනු චායා ඈතදීම දුටුවාය. ඇගේ සිතට මහා ලෝබකමක් දැනුණි. ගේ පිහිටන්නට තිබුනේ තව ඈතිනි.

"ස..ර්.."

ඒ හඬ ඕනාවටත් වඩා දුක්බරය.

"අපි මේ හරියේ නවත්තමු සර්.. අම්මා පාරට ඇවිත්.."

ඔහු වාහනයේ වේගය බාලකර ඇය දෙස බලාගත්වනම බලා උන්නේය. සියල්ල දරාගත හැක. ඒ බැල්ම නම් දරාගත නොහැක. උණුවතුර දේනක් පපුවට අත හරිනවා ඊට වඩා හොඳය.

"මං බහින්නම් සර්.."

"ඉන්න මං ගෙවල් ගාවටම දන්නම්.."

"ගේ ළඟට වාහනයක් ගන්න අමාරුයි සර්.."

"මාව දලා යන්න දුක නැද්ද චායා.."

චායා මෘදුව ඔහුදෙස බලා සිනාසුනාය. රාත්‍රිය ගෙවාදමන්නට ඒ හිනාව හොඳටම ඇතිය.

"මං සර්ව දලා යන්නෑ.. සර්රුයි මාව දලා යන්නේ.."

ඔහුට සිනාසිය නොහැක.

"මං බහින්නම් සර්.. බුදු සරණයි.. පරිස්සමින් යන්න."

චායාගේ අත නොදැනීම ඔහුගේ වමත මත තිබුණි. ජීවිතය දමා යා නොහැක. රැගෙන යන්නටද නොහැක.

"යන්න.. මං බලං ඉන්නම්.."

"බෑ.. සර් යන්න.. මං අම්මා එක්ක බලං ඉන්නම්..."

අසංක චායා පාර පැන මඟ අඳුරේ ගුරු පාර අද්දරට යනු වාහනය හරවද්දී යංතමට බලා උන්නේය. එකවර ඔවුන් ළඟ වාහනයේ වේගය බාල කර ඒ මූහුණ බලා ගන්නට ඔහුට සිත්විය. එහෙත් ඔහු ඒ හැඟීම අමාරුවෙන් යටපත් කරගත්තේය.

දියණිය ආවේ තරුණයෙකු සමඟ බව පද්මා හොඳකාරවම දුටුවාය. චායාගේ බිමට බරවූ දෙනුවන් මුවේ රැඳුන තුනී මදහස පද්මාගේ හිතේ ඇතිකළේ නුහුරු හැඟීමකි.

WWW.EXPRESSLANKA.TK 232

'ටිකක් පරක්කු උනා අම්මේ.. ඇයි ලතා අක්කට කරදර කළේ.. මං එනවනේ කොහොම හරි..'

චායා අම්මාගේ දෙනෙත් මග හැර ලතා දෙස බලාකීවාය. ඇය් ඔයතරම් බර මොකෝ යැයි අසන්නට පද්මාට සිතුනි.

'ඒකත් ඇත්ත නැන්දේ.. ගෙනල්ලා බස්සන්නත් කෙනෙක් ඉන්නකොට නැන්ද මොකටද පාරවල් මුර කරන්නේ.'

ලතා ඇඟට පතට නොදැනී කුළුපගව එසේ කියද්දී චායාගේ හිත තිගැස්සිණ.

'ඕං කිව්වා.. සර් මාව විතරක් නෙවේ ගොඩාක් අයව බස්සගෙන ආවේ..' මං ඉතුරු වුනා.'

කිසිවෙකු නිදහසට කරුණු ඇසුවේ නැත.

'අපි ඇහුවයැ නේද නැන්දේ.. කියන්න ඕනෙම කියලා හිතෙනවා නම් කිව්වත් ඉතින් අහගෙන ඉන්නවා..'

'ලතා අක්ක මගෙන් බැණුම් අහන්න යන්නේ..'

චායා ඇඹුම්බරව කීවාය. සියල්ල දන්නවාක් මෙන් ලතා කතා කරද්දී චායාට පුදුම සිතුණි. 'මූකුත් නෙමේ මේකිගේ ඉව..' ඇය එසේ සිතුවාය.

'අපි හිතුවේ නෑ කාර් එකේ එන්නේ චායා නංගි කියලා. මං ඒත් නැන්දටත් කිව්වා ලස්සන කොල්ලෙකුයි කෙල්ලෙකුයි කියලා.'

'කවුද පූතේ ඒ. පුතාලගේ සර්ද.'

එතෙක් වෙලා නිහඬව උන් පද්මා ඇසුවාය.

'ඔව් අම්මේ..'

තව යමක් කිව යුතුය. ඔහු ගැන ඒතරම් කෙටිවදනක් කීම හරි මදිය. එහෙත් සියල්ල ලොවට කියන්නට පෙර තනිවී කල්පනා කළයුතුය. ප්‍රේමයේ දිව්‍යමය රාත්‍රිය රසබරව විඳගත යුතුය.

'කවුරු උනත් නංගි හරි ලස්සන කොල්ලෙක්.. දකලා තියෙන කවුද වගේ.. ම්..'

ලතා යමක් මතක් කරන්නට උත්සාහ ගත්තාය. චායා ඒ

මුහුණ දෙස ආශාවෙන් බලා උන්නාය. "ඉස්සර සනත් ගුණතිලක වගේ.. දෙවෙනි ගමන පිල්ම් එක කාලේ.." එසේ කියන්නට ඇයට සිතුණි.

"හ්ම්.. මතක් වෙන්නෑ. හරියට හුරුපුරුදු මූණක්.."

ඡායා බිම බලාගෙන සිනාසෙන්නේ ඇයිදැයි පද්මා නිහඬව සිතුවාය. ඒ ඇස්වල මල් පෙරහැරක් යන්නාක් මෙනි. ඒ මුහුණේ ඇත්තේ සතුටද පෙම්වත් බවද කියා පද්මා දැන උන්නේ නැත. එහෙත් දූව කවරදාටත් වඩා අද වෙනස් බව පමණක් ඇයට සිතුණි.

අතීත් අතට අද වැනි පාළු දවසක රාත්‍රියේ වාහනයක ඉදිරිපස අසුනේ එන නව යොවුන් තරුණයෙකු හා ලස්සන තරුණියක අතර රසබර යමක් සිදු නොවී තිබුනහොත් ඔවුන් දෙදෙනා යෞවනයත් නොවේයැයි පද්මා සිතුවාය.

ඡායා මෙන්ම පද්මාද ගෙට ඇතුළු වූයේ හිතේ බරිනි. මෙතුවක් දවසක් ජීවිතයේ දුක සැප එකට විඳගත් දියණිය තමාට කිසිවක් සඟවනැයි සිතන්නට පද්මාට ලෝබය. අනෙක් අතට තමා හිතනවා බරවැඩියැයි ඇයට සිතුණි. ඡායා කාමරයට ගියේ මව දෙසවත් නොබලාමය. කාමරයට ගිය හැටියේම ඇය විදුලි පහන දල්වා කැඩපත ඉදිරියේ හිටගත්තාය. මුළු මුහුණම එයට එබුවාය. යුවතියකගේ හැඟීම් හොඳින් දන්නා කෙනෙකු ඇය ඉදිරිපිට උන්නා නම් කුළුඳුලේ පෙම්වතියක වූ යුවතියකගේ මුහුණේ මතුවන හැඟීම් සියල්ල මේ මුහුණේ ඕනාවටත් වඩා පිපී ඇතැයි කියනු ඇත. ඡායා කැඩපතේ ඇඳෙන තම මුහුණ දෙස බලාගත්වනම බලාඋන්නාය. මොහොතකට කළින් ඔහු සිපගත්තේ මේ මුහුණම බව සිහිවී ඇගේ ළය හිරිවැටී ගෙන ගියේය. පිරිමි ළමයෙකුගේ සුසුම් පොදක්වත් නොවැටුන මේ මුහුණ ඒතරම් සැහැල්ලු ලෙස ඔහුට පෑවේ කෙසේදැයි.. ඇයිදැයි ඡායා සිතුවාය. ඔහු මුහුණට එබෙද්දී මේ මුහුණ තිබෙන්නට ඇත්තේ කෙසේදැයි ඇය සිතුවාය.

පද්මා දෙර රෙද්ද මෑත් කර සි[illegible]ල බලාඋන්නාය. දියණියගේ හැසිරීම් ඇගේ සිත අවුළුවාලීය. කැඩපතට එබී එබී යුවතියකට ඔයතරම් කල්පනා කරන්නට ඇත්තේ මොනවාදැයි ඇය සිතුවාය.

WWW.EXPRESSLANKA.TK 234

දියණියගේ මුහුණේ මෙතුවක් තිබූ ළඳ බොළඳ පැහැය නැතිවී ඒ වෙනුවට මතුව එන පිරිපුන් ගැහැණු පැහැය දෙස පද්මා බලා උන්නේ දෙගිඩියාවෙනි.

'පුතේ..'

පද්මා හෙමිහිට කාමරයට ගොඩවූවාය. චායා කැඩපතින් දෙනෙත් මුදවාගෙන අම්මාදෙස බැලුවාය. යමක් දැන් දැන් කියවෙතැයි චායා බියවූවාය. යමක් දැන් දැන් ඇගේ මුවින් කියවෙතැයි පද්මාද බලා උන්නාය.

'වැඩේ ඉවර කළාද පුතේ.'

'ඔව් අම්මේ.. හිතුවටත් වඩා ලස්සනට ඉවර කළා.. දැන් බලන්න ලස්සනයි...'

සාප්පුවටත් වඩා අද හිත ලස්සන යැයි අම්මාට කියන්නට ඇයට සිතුණි. චායා කරබාගෙන තුවාය අතට ගත්තාය.

'මෙච්චර රෑ වුනේ පුතේ.. මං බයේ උන්නේ..'

'ටිකක් පරක්කු උනා අම්මේ.. පෝය නිසා බස් අඩුයි.. සර්ම ගෙනත් බැස්සුවේ ඒකයි..'

චායා නෙත් බිමට ඔබාගෙන කීවාය. පද්මා තව යමක් දියණිය කියතැයි සිතා ඇඳමත ඉඳගත්තාය.

'හරි මහන්සියි අම්මේ.. මං ඇඟ හෝදගන්න යනවා.'

චායා අම්මාව මඟහැර නාන කාමරයට ගියාය. සිතද ගතද සුවෙන් සනීපයෙන් හුදෙකලා වන්නට ආශාවෙන් උන්නාය. ඇය ඇඳුම් උනා වතුර මල යට සිටගත්තේ මුළු පපුවම දෑතින් වසාගෙනය. නාන කාමරයේ කුඩා බිත්ති අතර විසිර ගිය දියබුබුළු අතරින් ඇයට අසංකගේ මුහුණ සිහිවිය.

ඒ මුහුණ ඒතරම් ළහට මේ තරම් ලස්සන යැයි චායා තෙරුම් ගත්තේ අදය. ඒ මුහුණ තමාගේ මුහුණට එබෙද්දී තිබුනේ කෙලෙසකදැයි චායා අමාරුවෙන් සිතුවාය. ගතම ගැස්සී ගියේ වතුර මලින් විසිදුන සීතලටද නැතහොත් ඒ සිදුවීම සිහිවීද කියා ඇයට තේරුමක් නැත.

'බත් බෙදන්නම් පුතේ..'

WWW.EXPRESSLANKA.TK 235

පද්මා කාමරයට එබී ඇසුවේ චායා ඊ ඇඳුම ඇඟට දාගනිද්දීය. ඇයට ඕනාවුයේ ඉක්මනින් ඇඳට වැටෙන්නටය. අද නින්ද නොඑන බව ඇයට හොඳින් විශ්වාසය. ජීවිතයේ ප්‍රථම වරට ඇඳමතට වී පෙරළි පෙරළි විඳින්නට යමක් තමා සතුව අද ඇතැයි චායා සිතුවාය.

'මට වුට්ටක් බෙදන්න අම්මේ.. බඩගින්නක් නෑ.'

දහවල් ඔහුගේ අතින් කෑවේ බත් කටවල් හත අටකි. ඒ බත් කටවල් හත අටට කඳුළු කොපමණ එකතු වූනාද කියා දන්නේ ඇයත් අසංකත් පමණි. ඔහු බත් කටක් කවන කවන වාරයක් පාසා පසුව ඉරිතැලී දැවී ගිය බව පමණක් ඇයට මතකය. තව වේල් හය හතකට දැන් බඩගින්නක් නොඑනු ඇත.

දියණිය ඉන්නේ කම්පනයකින් යැයි පද්මා කුස්සියට යන අතරතුර සිතුවාය. වෙනද නම් කන්නට කතාකරද්දී ඇය දහසක් ප්‍රශ්න අසයි. මුලින්ම ඇයට උයා තිබෙන සියල්ල කිවයුතුය. අද ඒ කිසිවක් නැත. අද කෑම එක රැගෙන ගියේද නැත. රෑට කන්නට බඩගින්නක්ද නැත. පද්මාට ඇත්තටම පුදුමය. ඊට වඩා හිත කලබලය.

චායාට අම්මා ගැන දුක හිතුනේ බත් පිගාන අතට ගනිද්දීය. කුඩා ඉස්සන් කළුවට හද පරිප්පු තෙම්පරාදුකොට කතුරුමුරුංගා මළවා තිබුණි. සියල්ලටම වඩා චායා ඉස්සන් මාළුවට කැමතිය. හවස ආ කත් කාරයාගෙන් පද්මා කුඩා කිරි ඉස්සන් කුන්සිය ගත්තේ චායාව මතක්වීය.

අම්මා හැමදම කළේ ජීවිතයේ දුකවැඩි කොටස ඇයවිඳ දුක අඩු කොටස තමාට දීම බව චායා සිහි කළාය. අද සිදුවූ සියල්ල අම්මාට නිස්කලංකේ අදම කිවහැකිනම් යැයි චායාට සිතුණි. එහෙත් සිතට ලෝබය. කුඩා දැරියක් විනෝද ගමනකදී එකතු කරගත් සිප්පි කටු ගොඩක් මෙන් චායා සියල්ල පපුවේ තුරුල් කරගෙන උන්නාය. කුඩා දැරියට මෙන් ඇයටද ඕනෑ වූයේ නිස්කලංක මුල්ලකට ගොස් සිප්පි කටු උඩ දුවමින් හුදෙකලාවේ සතුටු වන්නටය.

පද්මා චායාගේ මුහුණ දෙස බලා උන්නේ සීරුවෙනි. ගහක මල් පිපෙන්නට කාලයක් ගනී. සමහරවිට මල් වාර තුනහතරක් පායා එන්නටද බැරිනැත. එහෙත් ප්‍රථම පොහොට්ටුව පිපුන පසු ගස මලින් [illegible] තොයයි.

WWW.EXPRESSLANKA.TK 236

කල්ගතවී මල් පුබුදන ගසක් අනෙක් ගස්වලට වඩා ආඩම්බරයෙන් මල් දරාගෙන සිටී. එවන් මල් ගසක් දුටු හැටියේම හඳුනාගත හැක. අද දියණියගේ මුහුණද එසේ කාලයකට පසු මල්වර වූ මල් ගසක් මෙනි. චායාගේ අතේ ඇඟිලි දෙකකටම ප්ලාස්ටර් දමා ඇතිබව පද්මා දුටුවේ ඒ මොහොතේය.

'දෙයියනේ අතට මොකද උනේ..'

චායාටද තුවාලය මතක් වූයේ එවිටය. අද හදවත යුවකල නොහැකි ලෙස තුවාල වූයේ මේ තුවාලය නිසාය. එය දෛවය විසින් ඇති කළ තුවාලයකි.

'දවල් කැපුනා කටර් එකට..'

චායා නෙත් ඔසවා කීවාය. ඒ ඉක්මනින් දෙනෙත් බිමට පහත්වෙන්නේ ඇස් පිහාටු වල ගල් එල්ලුවාක් මෙනි.

'ගොඩාක් කැපිලද..'

'නෑ.. ටිකක්..'

තුවාලය නිසා ඇතිවූ කැපුම් තුවාල අම්මා දැනීනම් යැයි චායාට සිතුණි.

'කවුද බෙහෙත් දැම්මේ..'

අම්මා ප්‍රශ්න අසන්නේ ඒ ඔස්සේ තවත් යමක් එළිකරගන්න දැයි චායා බියවූවාය. හිත ඇත්තටම හොරය.

'ඔෆිස් එකේ ළමයෙක්...'

'ඉතින් දරුවෝ දවල්ට කෑවේ කොහොමද..'

පපුවේ පතුරක් ගැලවී ගියාක්මෙන් ඇයට අසංකව සිහිවිය. අද අම්මාට බොරු කියනවා වැඩිය.

'එයාම කැව්වා..'

චායා සෑහෙන වෙලාවකට දෙනෙත් නොඑසවූයේ දෙනෙත් වලින් ලොකු රහසක් අම්මා දකීයැයි බියෙනි.

'කෝ දෙන්න මං බත් එක කවන්න.'

'නෑ අම්මේ.. මට පුළුවන්..'

ඇය ප්ලාස්ටර් නොදැමූ ඇඟිලි තුනෙන් බත්ඇට එකතු කළාය.

WWW.EXPRESSLANKA.TK 237

'ඇයි පුතේ..'

පද්මා චායා බත් පිඟාන අතපත ගානු දැක ඇසුවාය. වෙනදා නම් මෙලහකට බත් පිඟානෙන් බාගයක්ම ඉවරකොට ඇත. දෙතුන් වරකටම පිඟාන දික්කර ඉස්සත් හැඳි දෙක තුනක් ඉල්ලා සිටිනු ඇත. එහෙත් අද ප්‍රථම වරට බෙදූ ඉස්සත් හැන්දද එහෙමමය. පද්මා වේදනාවෙන් ඇගේ ඇඟිලි වලට දැමූ ප්ලාස්ටර් දෙස බලාඋන්නාය.

'නෑ.. මූ..කුත් නෑ අම්මේ..'

චායා මවාගත් සිනහවක් පා කීවාය. දියණියගේ සිනහව ඒ තරම් ව්‍යාජ නොවන බව පද්මා දනී. ඇගේ නියම සිනහව අව්‍යාජය. නිර්මලය.

'අද බඩගිනි නැද්ද.. අපරාදෙ ඉස්සෝ හැදුවේ..'

'මහන්සියට කන්න බෑ අම්මේ.. අරව මේවා කාලම බඩ පිරිලා..'

චායා පිඟානේ තිබූ බත් නොකා කුඩා ඉස්සෙකු පමණක් ඇඟිලි තුඩින්ගෙන දිවහට තබාගෙන කීවාය. බඩගින්නක් නැත්තේ අරවා මේවා කාලද නැත්නම් හිතට අරවා මේවා වැටිලාද කියා අසන්නට පද්මාට සිතුණි. පද්මා ඉන්පසු කිසිවක් ඇසුවේ නැත. පොහොට්ටු සඟවා ගත්තාට මල් සඟවා ගතනොහැක. මල් සඟවා ගත්තද සුවඳ සැඟවිය නොහැක.

'බත් කන්නැත්නම් තේකක් හදලා දෙන්නද..'

පද්මා චායා ඔහේ ඇනූ බත් පිඟාන අතටගෙන ඇසුවාය. අම්මා ඉදිරිපිට අද තරම් අධීරුවෙන් ගත කළ රැයක් චායාට සිහි කරන්නට පවා නොහැක.

'එපා අම්මේ.. මං නිදාගන්නවා.. හරි මහන්සියි.'

චායා අත සෝදාගෙන පැමිණ පද්මාට පහත්වී වැන්දාය. ඇය නැගිටිද්දී පද්මා චායාගේ උරහිස මත සුරත තැබුවාය.

'පුතා මට මොනාහරි හංගනවද මැණික..'

ඇය ඇසුවේ දරාගන්නට බැරිම තැනය. චායාගේ දෙනෙත් වෙත කඳුළු පිරුනේ අම්මා බලා ඉඳිද්දීමය.

'අම්මට එහෙම හිතෙන්නේ ඇයි..'

WWW.EXPRESSLANKA.TK 238

'මගේ තාත්තා.. ඔයාගේ සීයා ඉස්සර අවිස්සාවේල්ලේ හොඳ ගොවියක්.. ඉස්සර සීයා උදේට එළියට බැහැලා අහස දිහා බලලා කියනවා හරියටම තව සතියකින් වහිනවා කියලා.. අපිට හරි පුදුමයි. අපි බලා ඉන්නවා.. හරියට සතියකින් වැස්ස පටන් ගන්නවා... තේරුණාද..'

හිටි හැටියේම වැස්ස ගැනත් සීයා ගැනත් අම්මා කියුවේ ඇයිද්දයි වායා පුදුමයෙන් සිතුවාය.

'ඔය මූණ මං හොඳට අඳුනනවා දුවේ.. හොඳට අඳුනනවා..'

අම්මාගේ කතාවට වායාගේ සිතුවිලි දුවී ගියේය. තමාගේ මුහුණේ අද සිදුවූ සියල්ල පෙනෙනවාද..

'මට අද නිදාගන්න දෙන්නැද්ද අම්මා..'

වායා ඇඬුම්බරව ඇසුවාය. පද්මා දියණියගේ හිස පිරිමැද්දය. දෙදෙනාගේම දෙනුවන් කඳුළින් පිරී තිබුනි. එහෙත් ඒ ඇයිද්දයි දෙදෙනාම දැන උන්නේ නැත.

'යන්න.. ගිහිල්ලා නිදාගන්න. ඒත් ඔයා අද නිදාගන්නෑ කියලා මං දන්නවා.. අද නෙමේ කවදාහරි ඔයා මට කියන්න...'

මොනවද කියා වායා ඇසුවේ නැත. ඇය තවත් වරක් අම්මා දෙස බලා කාමරයට දුවගෙන මෙන් ආවාය. කාමරයට පැමිණ පොරවන රෙද්ද ගෙන එය ගත පුරාම පොරවාගෙන ඇඳට ගුලි වූවාය. අම්මා කියූදේ ඇගේ සිතේ පොල් කොටන මෙන් පාවෙමින් තිබුණි. ඇඳෙන් නැගිට ගොස් අම්මාගේ උකුලට වී සියල්ල මුල සිට කියන්නට ඇයට සිතුණි. කොහෙන් පටන් ගන්නද.. සිදුවූ සියල්ල වචන වලට පෙරළිය හැකිද.

වායා වැළඳගෙන උන් කොට්ටය සිප ගත්තාය. ඉන් ආවේ ඔහුගේ පපුවෙන් ආ සුවඳය. ඇය කළුවරට දෙනෙත් යවද්දී මැවුනේ ඒ රුවය. පරිසරයට කන් යොමද්දී ඇසුනේ ඒ හඬය. මෙතුවක් හදවත තිබුනේ හිස්වද්දයි ඇය තම හදවතින්ම ඇසුවාය. ඒ තරමටම හිත ඒ සුවඳින්.. බැල්මෙන්.. ආදරයෙන් පිරී තිබුණි.

අසංක තම හදවතට ආවේ එහි ඇර තිබූ කවර දොරටුවෙන්දැයි

WWW.EXPRESSLANKA.TK 239

චායා සිතුවාය. ඔහු යිතට වඩින තුරු හදවතක් ඇති බවවත් චායා දැන නොදැන්නාය. ජීවිතයේ කිසි දිනයක දැනුවත් නොවූ හදවතේ වෙනමම බිම් කඩක් ඔහු සොයාගත්තේ කෙළෙසදැයි චායා නොදනී. හදවතේ තුනී නහරවැල් මත දුවෙන දුවිල්ල ආදරය නම් තමා ආදරවන්තියක් නොවේදැයි චායා ආශාවෙන් සිතුවාය.

එහෙත් අත පොවන්නටත් බැරි ජීවිත ක්ෂිතිජන්තක ප්‍රථම ආදර මල පිපුනේ ඇයිදැයි ඇය වේදනාවෙන් කල්පනා කළාය. හදවත බලා ඉඳ ඉඳ අත්සතු අන්තක පිපුන මලක් ගෙන ජීවිත කිතිජ්න මත ගසා ගත්තා නොවේදැයි ඇය සිතුවාය. සමනල කන්ද තරම් පින්බර ආදරයකදී පිදුරුතලා ගල තරම් දුකක් හදවතට දෙන්නට තම දෛවය සිතුවේ ඇයි කියා ඇය සිතුවාය. ආදරය සදකාලයටම අහසේ දිලෙන පහන් තාරුකාවක් නොමවී ඇදී පෙනී මැකී ගිය දේවතා එළියක් වූවා නොවේදැයි ඇය සිතුවාය. තමා වැනි දුප්පත් හිතකට ආදරයේ මහානුභාවසම්පන්න හැඟීම් පෙන්වා බියජනක වියෝගයක දුක් සංකා ඉතිරි කළේ ඇයිදැයි ඇය ඇසුවාය.

සියල්ල සිදුවී හමාරය. සිදුවූ කිසිවක් ඒවා සිදුවිය යුතු හොඳම විදිහට සිදුවූවා යැයි සිතන්නට ඇයට නොහැක. ආදරයේ උණුසුම් හැඟීම් ගිනි ගොඩක් වී කෙදිනක හෝ මෙලවෙන බව ඇය හොඳකාරවම දන්නීය. ප්‍රේමයෙන් මුසපත්වූ නිල් ඉඳුවර දෙනෙත් පැලී කඳුළු ගංගාව ඇරඹෙන බවද ඇය දන්නීය. සියල්ල සිහිනයකැයි සිතා හිත හදගත යුතුවන්නේ ඒතිසාය. සියල්ල අතරමැදත් සිත මහා ලෝබකමකින් පිරෙයි. ඔහු පිදූවේ එසේ ලේසියෙන් හදවතින් ගලවා විසි කළහැකි ආදරයක් නොවේ. සංසාරය පුරාම ඒ දෙනෙත් තම දෙනෙත් මත කැවුන බව ඇයට සිහිවෙයි. සියල්ල එසේවූවද ආත්ම ගණනක දුක් සමහරවිට මේ ආත්මයේ විදින්නට සිදුවෙනු ඇත.

සියල්ල කළේ ඔහුයැයි සිතන්නට ඇගේ සිත ඇයට ඉඩ නොදෙයි. ඔහු හදවතට එද්දී හදවතේ දෙරගුළු ඉබේම විවර විය. ඔහු කළේ ඇර තිබූ දෙරින් ආදරණීය හිතුවක්කාරයෙකු සේ ඇතුළු වීම පමණි. යළිත් ඔහුට යානොහැකි ලෙස මේ දෙර පියන්පත් වසාගන්නවාද නැතහොත් ඔහුට හැකි තරම් හද ගැබේ ඉන්නට දී යන්නට ඕන වූ මොහොතක යන්නට දෙනවාද කියා ඇය සිතුවාය.

WWW.EXPRESSLANKA.TK 240

චායාට රණතුංග මහත්මියව සිහිවී දෙපාම පණ නැතිවිය. ජීවිතයට තමාව ඇරලූයේ ඇයයි. උතුරා යන ඒ මිතියක්කමටත් තමා ද්‍රෝහි වූවාදැයි ඇය බියෙන් සිතුවාය. ඇගේ එකම සම්පත අසංකාය. ඒ සම්පත තමා වැනි දුප්පත් කෙල්ලෙකු කොල්ල කෑවා යැයි ඇය දිනෙක කියනු ඇත. ඒ දිනය සිහිවී චායගේ පපුව හිරිවැටිණ. ඒ සියල්ල සිහිවන්නේ දන්ය. ආදරයේ උල් පිහි තුඩින් පපුව හාරාගත් පසුය. සියල්ල සිතන්නට තිබුනේ සියල්ලට කලින්.

හැන්දෑවේ දුටු හර්ෂණීගේ දෙනුවන් චායාට යළිත් සිහිවිය. ඔහුගේ දෛවය ලියා ඇත්තේ ඇයවම විය යුතුය.

# චායා 1 නිමාව

# මායා -2

WWW.EXPRESSLANKA.TK 242

# 26

ආදරයක් නම් දෙදෙනකු දෙතැනක ඈහැරවා තැබියයුතුය. හදවත් දෙකකින් එකම සිතුවිලි සිහිත ගලා ආ යුතුය.

'දෙයියනේ මං මොනවද ඒ දූප්පත් කෙල්ලට කළේ..' අසංක බැල්කනියට වී සිතුවේය. අලුත් මෝසම් සුළඟ ඔහුගේ පපුවට වින් වැදුනේ 'සීතලද' කියා අසන්නාක් මෙනි. චායා දහවලේ හිස තබාගෙන ඉකිබින්දේ ඈගේ කවර තැනකටදැයි සොයන්නට මෙන් අසංක පපුව පිරිමැද්දේය. පපුවේ විසිරී ගිය මෘදු රෝමයන් අතර ඔහු සුරත ගෙන ගියේ ආශාවෙනි.

චායා ඉහළ අත්තක පිපිය යුතු නමුදු දෛවය පහළ අත්තක පිබිදවූ කුසුමක් බව අසංක දැන උන්නේය. ඒ මල නෙලා ගැනීම මේ තරම් පහසුයැයි ඔහු සිතුවේ නැත. වඩා ලස්සන කන්ද පහළ සිට ඇය දෙස බලා උන් දවසද නැතහොත් කන්ද තරණයකොට ඇයව සිපගත් මොහොතද කියා ඔහු නොදනී.

ආදරය යනු බැඳීමක් පමණකැයි ඔහු චායා හමුවන තුරුම සිතා උන්නේය. එය ජීවිතයට බලෙන් එල්ලා ගන්නා දෙයක් විනා පපුවෙන් උපදින හැඟීමක් නොවන බව ඔහු තදින්ම විශ්වාස කළේය. හර්ෂණී ඔහුගේ සිත තුල ආදරය පිළිබඳව ඇතිකළේ එවැනි ආගන්තුක හැඟීමකි. චායා ඒ සියල්ල වෙනස් කළාය. පිරිමියෙකුගේ ආත්මය සසල කළ හැකි එකමදේ ගැහැණියකගේ හැඟීම් යැයි දැන් ඔහු දනී. ගැහැණියකගේ වඩාත්ම සුන්දර දේ ඇගේ සුවඳයැයිද ඔහු දනී.

ඕනම පිරිමියෙකු තුල සෞන්දර්යයක් ඇත. කලාවක් ලතාවක් ඇත. ඒ සියල්ල ප්‍රකාශවන්නේ ඔහුගේ ආදරය හරහාය. තමාගේ හදවත තුළ එවැනි කවි හිතක් ලැගුම් ගෙන ඇතිබව අසංක වටහා ගත්තේ චායා නිසාය.

දෛවය චායා හමුවන්නට පෙර තමාගේ ජීවිතයේ ඇඳි තීරණ මොනතරම් හිස්දැයි අසංක සිතුවේය. ඒ සියල්ල සංස්කරණය කළයුතු

WWW.EXPRESSLANKA.TK 243

බව හිතෙන්නේ දැන්ය. එහෙත් එයට තමා පමාවූවා වැඩියැයි ඔහු සිතුවේ පසුව හිරිවැටී යද්දීය. ජීවිතයේ කිසිවක් වෙනස් කරගන්නට බැරිබව දැන දැනත් අසරණ කෙල්ලෙක්ගේ පසුවට දුන් ගින්දර සාධාරණ නැත.

අද පහන් වැටියක් සේ හදවත මත්තේ දල්වෙන පහන හෙට ගිනි ගොඩක් වන බව අසංකට ඉඳුරාම විශ්වාසය. ඒ ගින්දරෙන් තමාව පිච්චී අළුව ගියද එය කමක් නැතැයි ඔහුට සිතුණි. එහෙත් ජීවිත අරණේ හව්හරණක් නැති චායා ඒ ගින්දරෙන් දැවීයාම ඔහුට දුකකි. හදවතේ පතුල අතපත ගාමින් ආදරය කරනා මොහොතක මහන්තත්වයට වත් ඉවසගන්නට තිබුනායැයි ඔහුට දැන් සිතෙයි.

ආදරය ගැන පරීක්ෂණයක් කරන්නට ඔහු ආශාවෙන් උන්නේය. එහෙත් ඒ පරීක්ෂණයට චායාවන් යුවතියකගේ ජීවිතය ගෙන අත්හදබැලීම නොකළයුතුව තිබුණි. මේ පාපය ගෙවා දැමිය නොහැක. ආදරය සඳෙන් දෙවා කිරෙන් නැහැවූ කලෙක මෙන් පාරිශුද්ධය. අද තමා වින්දේ ඒ අතිශය පවිත්‍ර වූ සෙනෙහස බව අසංකට ඉඳුරා විශ්වාසය. ඇතුළු නහරවැල් අග උණුවී වැගිරෙන ප්‍රේමයේ ප්‍රථම ලේ පොද කෙදිනක හෝ සෙලවී වැගිරෙන්නට පුළුවන. එය වන බවද ඔහුට විශ්වාසය. එදාට චායාට අත්වන ඉරණම....

ආදරය පසුවේ හිර කරගෙන විඳිය හැකි ජීවිත රසාස්වාදයක් අසංක වෙත නොතිබුණි. ඔහුට ඇත්තටම තිබුනේ උතුරා පිටාර ගලා යන පිරිමි ළයකි. ආදරය වත් දියවරයක් ඒ ළය තුළ නොරඳ පිටතට ගැලීම ස්වභාවිකය. අද සොරොව් වැව් තාවුළු වැකඳු පුපුරාගෙන ගැලුවේ ඒ දියවරයයි. ඒ දියවරයෙන් ජීවිත ලියැද්දක් අස්වද්දනවාට වඩා අහිංසක ගෙවිලියකගේ දුප්පත් කෙතක් යටවී යන බව පමණක් ඔහු දැන උන්නේය.

අසංකට ඇත්තටම හඩන්නට සිතුණි. ඒ ප්‍රථමව චායා ගැනත් ඊළඟ වර තමා ගැනත් දුක සිතීය.

නාලකව ගෙදර ගෙන්වාගන්නට තිබුනායැයි අසංකට සිතුනේ හිත මේ තරම් නොසන්සුන් වූ පසුවය. කලාව දුකද ලතාවකට පුබුදුවන බව දැන් අසංක හොඳින් දනී. තමාගේ හදවතේ දුක වඩාත්ම මෘදුව පුබුදුවන්නට ඔහුට හැකිබව ඔහු දැන උන්නේය. සියල්ලටම

WWW.EXPRESSLANKA.TK 244

වඩා ඔහුට වායා ගැන කතා කරන්නට අවශ්‍ය විය. කිසිවෙකු හා කතා කළ නොහැකි තම දුක්බර දෛවය ගැන ඔහු හා කතා කළහැක.

කවරෙකු හා කවරක් කතා කළද තමාගේ හෘදය සාක්ෂියෙන් තමාට ගැළවිය නොහැකි බව ඔහු දැනගෙන උන්නේය. වායා කෙදිනක හෝ තමාට සමාවදෙන තරමට තමාට ආදරය බවත් ඔහු දැන උන්නේය. සමාව නොලැබෙන්නේ තම හදවතිනි.

අදින් පසු ජීවිතයට කවර සැපක් ලැබුනද පලක් නැත. ඇය අහිමි වන ලොව පාළුය. අඳුරුය. හදවතේ කැමරාවේ ආදරය නමින්වූ සේයාපටලය ගලවා විසි කර දැමිය හැකිද.. එසේ කළහැකි වුවද එසේ කරන්නට ශක්තියක් නැත.

ජීවිත වෘක්ෂයේ පිපුණු මල් මංජරියකින් වෘක්ෂයට පිවිසිය හැකිබව ඔහු දැන උන්නේය. එහෙත් ඒ කුසුම් මංජරිය තරහා ගසේ මුදුන් මුල දක්වා පැමිණිය හැකියැයි ඔහු දැන නොඋන්නේය. වායා පැමිණියේ එලෙසිනි. අද ඇය මලේ සිට මුල දක්වාම ඉඳී. හෙට මලක් පිපේද ඒ පිපෙන්නේ ඇගේ ආදරයේ මූල් වලින් උරා ගත් සාරය නිසාය.

හර්ෂණීව අමතක කළහැක. එහෙත් අතහැර දමා යා නොහැක.

අද ජීවිතය සතු සියල්ලම කැපකර ඒ සියල්ලම දී වායා පමණක් ගතහැකිනම් යැයි ඔහු සිතුවේය. දෛවය එවැනි ගනුදෙනුවකට පවා සූදානම් නැත. දෛවය කියන්නේ වායා දී.. තම කුළුඳුල් ආදරය පුදදී සියල්ලම ගන්නා ලෙසය.

තීරණ ගැන දැන්මම සිතිය යුතු නැත. ඕනෑනම් පැලෙන්නට ආදරය කළ හැක. දැනටමත් පැලී ගොසිනි. හදවතේ දෙතුන් තැන පැලුම්ය. කැපුම්ය. ඒවා සුවකළ නොහැකි ආදරයේ ආත්මීය ඉරිතැලීම්ය. වායා තම ජීවිතයේ තනුවද.. පදමාලාවද.. ගායන වෘත්දයද කියා අසංක සිතුවේය. පැයක් පමණ කල්පනා කොට ඇය ඒ තුනම යැයි ඔහු හදවතට කියාගත්තේය. හර්ෂණී තම හදවතට ගෙන එන්නේ ආදරයේ පරම නිර්මල ගීතය නොවේ. සමහර විට එය බාල කපිකබල් බයිලාවක්ද විය හැක. වායාගේ ආදරය වැනි ගීතයක් රස නොවින්ද නම් සමහරවිට ඒ බයිලාවත් ගීතයක් ලෙස පිළිගෙන තමා රසවිඳිනු

WWW.EXPRESSLANKA.TK 245

ඇත.

ආදරයේ අත්වැල් කෙඳිනක හෝ ගිලිහෙන බව දැන දැනත් ඇහිලිකරු පටලවාගත්තේ අසරණ කෙල්ලෙකුගේ ආත්මය සමඟ සෙල්ලම් කරන්නටද.. එවැනි හදවත් පහරන්නෙකු වන්නට තමාට ඇති අයිතිය කුමක්දැයි ඔහු නොදනී. ඔහුට සිතුනේම වායා මවා ඇත්තේ ඔහුටම කියාය. දෛවය ඊට කලින් හර්ෂණීව තම ආත්මයේ මැවූවේ ඇයි.. දුක් දෙන්නද..

ආදරයේ දුක දුකක් නොවන බව ඔහු අසා තිබුනේය. ඒ කොහේ කොතනින්දැයි ඔහු නොදනී. අසංක වඩාත් විවෘත දෑසින් අහස දෙස බැලුවේය. "මේක හඳක්.. පුළුවන් නම් උඹේ අහසෙම තියාගනින්.. ජීවිතේම පයොළොඒවක තමයි.." නාලකගේ වදන් අසංකගේ ළය තුළ අපමණව නැවුනේය. රැයේදී සඳක් ඉඳුල් කර උදැසනේදී හිරු බඳගත හැකිද.. එසේ කළද සඳේ සිහිලැල් නොඉඳුල් මුදු බව අමතක කළහැකිද..

අසංක තෝත්තුවාවෙන් තළලත මිරිකා ගත්තේය. ඔහු ඇඳට වැටුනේ පැනඩෝල් පෙති හතරක් එකවිට මුවට හලාගෙන වතුර වීදුරුවක් බිවූ පසුය.

☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆

පුළුන් කොට්ටයෙන්.. පොරවනයෙන් පවා අලුත් සුවඳක් එතැයි වායාට සිතුණි. ඒ සුවඳ එන්නේ කොට්ටයෙන්ද.. පොරවනයෙන්ද.. නැත්නම් තම ඇතුළු හදවතින්ද කියා ඇය සිතුවේ නැත. මොහොතකට පෙර ආයාසයෙන් පියාගත් දෙනෙත් කළුවරේම ඇය විවර කළාය.

නින්ද අහලකවත් නැත.

මේ තමා කුළුඳුලේ ආදරවන්තියක් කළ රාත්‍රියයි. මධු සඳක් පායා ඇත්දැයි ඇය නොදනී. තාරකා දස දහසක් පිපී ඒ සඳට පරිවාර වුනිදැයි ඇය නොදනී. ප්‍රේමය සමරන්නට තිල් වළා කැටිති රැස්තියාදුවේ යන්දැයි ඇය නොදනී.

රාත්‍රිය තමාව ඇහැරවා හිතට වද දෙන බව පමණක් ඇය දනී.

සිත සිත සිතා තනිවෙමින්.. තනිවී සිතමින් නොනිදා පහන්

කරයි. යංතමට ඇස් පියවෙද්දී ඔහුගේ ළයෙන් ආ සුවඳ ඇයව ගස්සවා ඇහැරවයි. හෝරා දෙක තුනකට කළින් ඉඳුල්වූ ලවනත චායා කෙළ බිඳකින් තෙමා ගත්තාය. ඒ මිහිරි සිපගැනීමත් සමඟ විඳි ආදරයේ තෙතමනය ඇයට සිහිවිය.

බියෙන් ඇවිලී ගිය චායා තොල්පට මුව තුළට දමා තදකර ගත්තාය. විනය පිටකයේ ගැඹුරුම විනය බැන්දුමක් කඩකළ තරුණියක සේ ඇය කම්පා වූවාය.

ප්‍රේමය මීදුමක් සේ හුදෙකලා කඳු අතර එතුනේ දරාගත නොහැකි ලෙයිනි. අවසානයේ කඳුහිස කඳු පාමුළ නොපෙනෙනා තරමට එය මීදුමෙන් වැසුණි. තමා කළේ නොසෙල්වී මීදුමට තම ආත්මය වටා පැටලෙන්නට දවටෙන්නට දීම නොවේද..

ආදරය මීදුමක් සේ තැවරී තද අව් රශ්මියේදී මීදුමක් මෙන්ම පහුවේ සිටිනවා නොවේද.. කුළුඳුල් ආදරයේ ඉරණම ගැන චායා හිතන්නටත් බිය වූවාය. ආදරය අකාලයේ පිපි අකල් මරණයකට ගොදුරු වන අවාරයේ මලක්ද..

චායා අසංක ගැන සිතුවේ පුපුරා යන ලෝබකමිනි. ඔහු වැන්නෙකු තමාට ආදරය කරන්නට සිතීම පවා අදහාගත නොහැක. ඔහු පැමිණියේ ආදරයේ නාමයෙන් ජීවිතයේ රසබර යමක් කඩා වඩාගෙන යන්නට නොවන බව ඇය දැන උන්නාය. කඩා වඩාගන්නට ප්‍රථමව සිතා පුදලන්නට තරම් අද ආදරය පරිත්‍යාගශීලීය.

තමාගේ ඇබිත්තං ජීවිතයට මේ සිදුවූනේ කුමක්ද යන්න පවා චායා දැන නොඋන්නාය. දුප්පත් අම්මාත් සමඟ මෙතුවකට ජීවිතය බෙදහද ගත්තේ නිවී සැනසිල්ලේය. අද ඒ සැනසීම නැත. සිහිනයක පාට රැගෙන සැබෑ ජීවිතය නම්වූ චිත්‍රය පැහැ ගැන්විය නොහැකි බව චායා දැන උන්නාය. එසේම මේ හිඟන ජීවිතයේ ලද පාටවල් ටික ගෙන ආදරයේ හීනය පැහැගැන්විය නොහැකි බවද ඇය දැන උන්නාය.

සියල්ල දැනගෙන ආදරයට පපුව විවර කළේ ඇයි.. අනුන්ගේ වත්තක මල් ගසක පිපි මලක් ගෙන බුදුන් වැන්දද පිනක් නැතැයි චායා සිතුවාය.

රෑ එකට දෙකට මහ හඩින් ගොරවමින් වැහි ඇදවැටුනේය. මෝසම් වැසි වේලාසනම ඇවිත් තිබුණි. කවරදාටත් වඩා විදුලි අකුණු

WWW.EXPRESSLANKA.TK 247

පුපුරණ හඬ ඇසෙද්දී චායා ඇත්තටම බිය වූවාය. මේ වැසි වැටෙන්නේ අකුණු පුපුරන්නේ අහසේ නොව තම හදවත මතයැයි චායාට සිතුණි. චායාට අයංකගේ පුළුල් උරතලයෙන් දැණුනු උණුසුම සිහිවිය. ආදරය කල්යල් බලා පසුවට ආවේ නොසිතූ පරිද්දෙනි.

එකවරම මහ හඬින් අකුණක් පුපුරා ගියේය. අකුණ පුපුරා ගියේ ළඟ ළඟම බව චායාට දැනුණි. ඇගේ තුන් හිතම බියෙන් වෙව්ලා ගියේය. චායා පොරවනයත් කොට්ටයත් ගෙන අම්මාගේ ඇඳට ඇදුනාය. පද්මා උන්නේද නිදි වර්ජිතවය.

'පු...තේ..'

පද්මා ආදරයෙන් ඇයට ඇමතුවාය.

'මට බයයි අම්මේ...'

චායා පූස් පැටවියක මෙන් අම්මාගේ උණුසුම අතර හිරවූවාය. දියණිය කෙරේ උපන් අලුත් සෙනෙහසකින් පද්මාගේ ළය උණුවිය. අද හිතනවාටත් වඩා යමක් සිදුව ඇතැයි පද්මා තේරුම් ගත්තාය.

'ඇයි මැණික බය..'

'දන්නෑ අම්මේ.. හයියෙන් ගොරවනවා.. අකුණුත් පිපිරුවා.'

'ඉස්සරත් වැස්සා පුතේ.. ඔයා බයවුනේ නෑනේ.'

'දන්නෑ අම්මේ.. අද මට හරි බයයි.'

'තනියෙන් ජීවිතේට මුහුණ දෙන්න ඕන පුතේ.. අම්මා හැමදම නෑ.'

'ඇත්තටම මම තනිවෙයිද අම්මේ..'

චායා නොසිතා ඇසූ ඒ ප්‍රශ්නයෙන් පද්මාගේ සිත ඇවිළිණි. වනේ වන හතුරෙකුට එවැන්නක් වුවද තම දියණියට එසේ නොවේවා යැයි ඇය පැතුවාය..

'ඒකනේ මැණික මම කියන්නේ.. තනි නොවෙන්න කෙනෙක් හොයාගන්න කියලා.'

'හොයාගත්තම තනිකම නැතිවෙනවද අම්මේ.'

'ගොඩාක් ආදරේ කරන කෙනෙක් කවදවත් දලායන්නේ නෑ

WWW.EXPRESSLANKA.TK 248

පුතේ.. ඔයා වගේ කෙල්ලෙක්ව කොහොමටත් දලා යන්නේ නෑ.'

'මට ආදරේ වුණත් එයාට දලා යන්න උනොත් මාව...'

වායා තෝන්තුවාවෙන් මෙන් ඇසුවාය. පද්මාගේ ළය සීතලවීගෙන ගියේය.

'පූනා කා ගැනද කතා කරන්නේ.'

වායා නිහඬ විය. පද්මාගේ ඇඟිලි තුඩු දියණියගේ මෘදු හිසකෙස් අගට දයාබරව යමින් තිබුනි.

'මට අම්මට කියන්න දිග කතාවක් තියෙනවා අම්මේ.'

'කතාව මොකක්ද කියලා මං දන්නෑ පුතේ. ඒත් එහෙම එකක් තියෙනවා කියලා මං දන්නවා.'

'අම්මා මා එක්ක තරහද..'

'ඔයත් එක්ක තරහ වුණොත් මං කා එක්ක ජීවත් වෙන්නද පුතේ..'

'හීනයක් වගේ දෙයක් අම්මේ.. මට කියන්නත් ලෝබයි..'

'අපි පුතේ දැන් නිදගමු.. උදේට මට කියන්න.'

'මටත් හරි නිදිමතයි අම්මේ.. ඔළුව අතගාන්න..'

පද්මාගේ දෑස් තෙමී ගියේය. ඒ කඳුළු නොසිතූ ඉක්මණට කොට්ටය සිපගත්තේය. පද්මා බොහෝ රෑ බෝ වනතුරු දියණියගේ හිස අතගෑවාය.

'ඉන්න තැනක ඉඳලා දූව දිහාත් වුට්ටක් බලන්න. මේ අසරණ කෙල්ලට මොනවා වෙන්න යනවද කියලා මට තේරුමක් නෑ. පව්..'

පද්මා සිය සැමියාට සිහිනයෙන් මෙන් කීවාය.

WWW.EXPRESSLANKA.TK 249

# 27

චායා සඳුද කාර්යාලයට යන්නට ඇඳ ගත්තේ වෙනදටත් වඩා වේලාසනිනි. තෑමෙත් සීතලවූ ගත කුමක්දෝ රසබර හැඟීම් පොදකින් උණුසුම් කරන්නාක් මෙන් චායාට දැනුණි. හදවත සන්තක සියල්ලම එකම රුවක්.. එකම බැල්මක් පතන්නාක් වැනි විය. ඇය ලා කොළ පැහැයට හුරු සල්වාර් කමිසය ඇඳගත්තේ ඔහු ගැනම සිතමිනි. කැඩපතින් ඇය දුටුවේ මෙතෙක් කලක් උන් චායා නොවේ. ආදරයේ ප්‍රථම හීසර පහර වැදුන යුවතියක් ලෙසිනි.

ඊයේ රාත්‍රියේ අම්මා සමඟ කියවුනේ මොනවාදැයි සිහිවෙද්දී චායගේ පපුව හිරි වැටිණ. එක අතකට එසේ ඉඟියක් හෝ දී තිබීම හොඳය.

ආදරය මේ තරම්ම ප්‍රබල ලෙස ඇතුළු හදවතේ පටක පුබුදුවතැයි චායා නොසිතුවාය. ජීවිතයේ ප්‍රථම වරට චායා තවත් දෙනෙතක් ගැන සිතමින් කැඩපතේ ඇඳෙන තම රුව රස වින්දය. ඕනාවටත් වඩා විලවුන් තවරාගත් බව චායාට සිතුනේ විලවුන් සුවඳින් මුළු කාමරයම පිරී ඉතිරී යද්දීය. ඒ සුවඳ වඩාත් ප්‍රබලව දැනුනේ ඇයට නොවේ. කාමරයට එබුන පද්මාටය. ඇය මොහොතක් ඇය දෙස බලාගත්වනම බලාඋන්නාය.

'ඕනවට වඩා හැඩ වෙන්න ගියාම තිබ්බ ලස්සන නැතිවෙනවා පුතේ.. කව්රුහරි දැකලා ඇත්තේ ඊයේ තිබ්බ ලස්සන.. අද තියෙන ලස්සන නෙමේ...'

පද්මා මෘදුව සිනාසී කීවාය. චායාට අම්මා දෙස බලන්නට ලැජ්ජා සිතුණි.

'මල් පෙරහැර යද්දි මෙච්චර ලස්සන නම් රන්දෝලි පෙරහැර යද්දි ඔයා කොච්චර ලස්සනට ඉඳිද.. ඒත් ජීවිතේ ගැන හරි පරිස්සමින් පුතේ..'

WWW.EXPRESSLANKA.TK 250

පද්මා හූල්ලා මෙන් කීවාය. චායා එතෙක් බිමට බරකර උන් දෙනෙත් අම්මා දෙසට හැරවූවාය. ගැල්වූ රෝස පුයර කපාගෙන කඳුළක් රූරා වැටුණි. මේ තරම් ඉක්මණට මේ ඇස්වලට කඳුළු ආවේ කෙලෙසින්ද.

'සමහරවිට මල් පෙරහැරින්ම පෙරහැර ඉවර වෙයි අම්මේ.. දේව දූතයා නැතුව රන්දේලි පෙරහැර යන්න බැනේ නේද..'

චායාට හැඬුණි. පද්මාගේ යටිපතුලේ සිට සීතල වීගෙන ගියේය. ඇය නැගිට දියණියව පපුවට තුරුළු කර ගත්තාය.

'මොනාහරි කරගෙන අඩාගෙන ගෙදර ආවොත් මේ හිගන්නිට සමාව දෙනවා නේද අම්මා.'

චායා හඬමින්ම ඇසුවාය. ඇට මිදුළු පවා රත්වන සෙයක් පද්මාට දැනුණි.

'ඔයා කොහොම ආවත් මට හිගන්තියෙක් නෙවේ පුතේ.'

'දිගටම අඩන්න වෙන නිසා මම මේ දවස් ටිකේ විතරක් හිනාවෙනවා අම්මේ.. මට සමාවෙන්න.'

චායා කියන්නට යන්නේ මොනවාදැයි පද්මා පුදුමයෙන් සිතුවාය. ඇය මෝඩ හිස් කෙල්ලෙකු නොවන බව ඇය අත්දැකීමෙන් දැන උන්නාය. සමවයසේ අන් බොහෝ යුවතියකට වඩා ඇය බිඳක් හෝ ජීවිතය දන්නීය. එහෙත් ජීවිතය දන්නා කී දෙනෙකුට ජීවිතය නපුරු ලෙස සැළකුවාද..

'පරිස්සමින් මැණිකා..'

'මං යනවා අම්මේ.. එද්දි රෑ වෙනවා. අම්මා පාරේ බලං ඉන්න එපා.'

'එක්ක යන්න කෙනෙක් හොයාගත්තට පස්සේ මං බලා ඉන්නෑ පුතේ.'

'අද නැතුවට අම්මට වෙන දවසක මං එනකල් බලා ඉන්න

WWW.EXPRESSLANKA.TK 251

වෙයි. මං යනවා.'

'බුදු සරණයි පුතේ.'

වායා පාරට බැස්සේ කුඩා උණු බත් මුල අත්බැගයට දමාගෙනමය. එහි රස්නය සිතිඳු බඳ බිඳගෙන ළය දක්වා පැතිරගියේය. මඟදී වායාට ලතා මුණ ගැසුණි. ඇය පරිස්සමින් වායාගේ මුහුණ පරීක්ෂා කළාය.

'ඇඹුවද.. හිනාවුනාද..'

ලතා හැඟීම්බරව ඇසුවාය.

'අඩන්න බලාගෙන හිනාවෙනවා ලතා අක්කේ..'

ලතා පුදුමයෙන් වායාදෙස බලාඋන්නාය. ඇය මොහොතක් ලතා ළඟ නැවතී පසුව අසරණව සිනාසී එතනින් ඉවතට ගියාය. ලතා වායා යනදෙස බලා උන්නේ පද්මාත් සමගය. වායා නොපෙනීම ගියපසු පද්මාට හීල්ලින.

'මොනවද නැන්දේ මේ කෙල්ල මේ කියවලා ගියේ... අඩනවලු... හිනාවෙනවලු.. මට නම් තේරෙන්නේ නෑ.'

'මටත් තේරෙන්නේ නෑ ලතෝ..'

'නැන්දට මොනා හරි කිව්වද..'

'නොකියා කිව්වා..'

'කෙල්ලව මීට වඩා පරිස්සම් කරන්න වෙයි වගේ.'

'ඔතනදී කෙල්ලෙක්ව පරිස්සම් කරන්න බෑ ලතා.. එයාගේ දෛවය.'

'අනේ මන්ද.. අසරණ කෙල්ල.. පව්.'

පද්මා දෑස්වල නැගුණ කඳුළට එසේම ගලා යන්නට දී ගෙට හැරුනාය.

හිත රසබරව දුක් වෙනවාද.. දුකසේ රසවත් වෙනවාද කියා වායාට තේරුමක් නොවීය. කොහොමටත් හිත ඇත්තේ රසවත් බරකිනි. ඇය විලාසිතාගාරයට පියමැන්නේද ඒ රසවත් බරිනි. නිලංකා දුටුවනම වායාගේ දෙතොළට සුන්දර සිනාවක් නැගුණි.

WWW.EXPRESSLANKA.TK 252

ගුඩ් මෝනින් කෙල්ලේ..

ගුඩ් මෝනින් තිලංකා..

චායා ඇතුළු කාමරයට නොගොස් තිලංකා ළඟ නතර වූවාය. උදෑසන මල් බඳුනට දැමූ අලුත් කානේෂන් මලක් චායා ඇඟිලි තුඩුවලින් පිරිමැද්දය.

'උදේ ෂෝරූම් එක දකිද්දි මට අදහාගන්න බැරිඋනා. ඔච්චර ඉක්මණට ලකුණු එකතු කරන්න එපා.'

තිලංකා පසුව පුරවාගත් හැඟීමෙන් කීවාය.

'ඇයි සනත් අයියා වගේ මාවත් අවුට් වෙයිද..'

'ක්‍රිකට් ගැන මං දන්නෑ පැටියෝ.. ඒත් මට පුදුම හිතුනා. ෂෝරූම් එක එච්චරටම ලස්සනයි. එදා සර්ත් ආවද..'

'ම්...'

'ගොඩාක් රෑ වෙන්න ඇති. වොචර් අන්කල් කිව්වා රෑ නවයත් පහුඋනා කියලා.'

'එහෙනම් ඔයා ඔක්කොම අහගෙන..'

'මොකද.. ෂෝ රූම් එක ඩෙකරේට් කරන ගමන් තවත් කාගේහරි හිතකුත් ඩෙකරේට් කළාද...'

චායාගේ හිත ගැස්සිණ. කෙල්ලෙකුට ඉව ඇත. චායාට මේ උඩු මහලේ සිදුවූ සියල්ල සුන්දර සිනමා පටයක් මෙන් සිහිවිය. ජීවිතයේ රසබරම දවස.. හැමදාමත් ඒ දවස උදාවේනම්..

'මූණ නිකන් සීරියල් බල්බ් වැලක් වගේ.. අපිට කියන්න හොඳ මදිද..'

'මොනා කියන්නද..'

චායා දෙනෙත් සඟවාගෙන ඇසුවාය.

'අනේ කෙල්ලේ.. කම්න් කැලි බලලම එපාවෙලා. මං හිතුවා ෂෝ එක පටන් අරගෙන ඇති කියලා.'

පිළිගැනීමේ මේසය මත තිබූ චායාගේ සුදු සුරත මත තිලංකා සිය අත තබා කීවාය. චායා ටයිල් ඇල්Lූ මහපොළවට සිනාසුනාය.

WWW.EXPRESSLANKA.TK 253

බොහෝ වේලාවකට පසු චායා කානේෂන් මල් බඳුන දෙස බලා පසුව තිලංකා දෙස බැලුවාය.

'මාත් නොහිතපු වේලාවක ෂෝ එක පටන් ගත්තා කෙල්ලේ...'

චායා කියද්දී තිලංකාගේ පවා පසුව වෙව්ලා ගියේය. ඇය චායාගේ අත මත තිබූ දූරත තවත් තද කළාය.

'උඹ මට විහිළු කරනවා නෙවී නේද.'

'ජීවිතේ එක්ක මං විහිළු කරනවා තිලංකා දැකලා තියෙනවද...'

'කරන්න පුළුවන් උනත් උඹට මට එහෙම බෑ..'

'ඇත්ත අපි හරි අසරණ කෙල්ලො.. මට හරි බයයි තිලංකා.. උදේ ආවෙත් ගැහි ගැහි..'

'කොච්චර දුක උනත් සතුට හංගන්න බෑ උඹේ මූණෙන්.. කම්බුල් ළපටි වැඩියි.'

'ගොඩාක් හිනාවෙන්න බයයි තිලංකා.. මම දන්නවා මට අඩන්න වෙනවා කියලා.'

'අඩන එක පස්සට තියලා දැන් හිනාවෙයන්.. හැම ෂෝ එකක්ම දුකෙන් ඉවර වෙන්නේ නෑ.'

'ඇත්ත.. ඒත් කෙල්ලේ හැම ෂෝ එකක්ම සතුටෙන් නිමාවෙන්නෙත් නෑනේ.. නේද.'

'උඹ දැන්මම අඩනවනේ රත්තරං..'

දෙනෙත් දැලින් ගලාගිය කඳුළු දෙස බලා තිලංකා ඇවිලී ගිය හඬින් කීවාය. ඇය මේසයේ කවාකාර දරයෙන් මෙහා පැත්තට පැමිණ චායාගේ හිස අතගෑවාය.

'මට කරන්න පුළුවන් හැමදෙයක්ම මං කරන්නම්. උඹේ මෝඩ යාළුවට දැන්ම සුබ පතන්න පුළුවන්ද..'

චායා හිස ඔසවා දයාබර ලෙස හිනැහුනාය.

'අද එපා.. එහෙම දවසක් ආවොත් ඉස්සෙල්ලාම ඇවිත් උඹ මට සුබ පතපං..'

WWW.EXPRESSLANKA.TK 254

"දැන් ඔය කඳුළු පිහදගනිං.. මැඩමුයි සර්රුයිත් එනවා ඇති."

"මට අද ඉන්නත් බයයි.. මාව ගැහෙනවා කෙල්ලේ."

"ඔළුව අවුල් කරගන්න එපා චායා.. වෙන දෙයක් වෙයි. මාත් ඉන්නවනේ කෙල්ලේ.. මට වෙච්ච දේවල් ඔක්කොම කියනවද.. අහන්නත් ආසයි."

"කියන්නත් ආසයි නිලංකා.. අද නෙවේ.. දවසක වෙන කොහේ හරි.."

"ඊයෙටත් වඩා අද පරිස්සමින්.. තේරුනාද.., මෙතන මොනා සිද්ධ උනත් හිත තද කරගෙන ඉඳපන්.."

"ඒකම තමා අමාරු වැඩේත්.."

"මෝඩියෙක් වෙන්න එපා.. අසංකට ආදරේ කරපන්.. ඒත් සර්ට එහෙම බෑ."

"මට මොනා උනත් කමක් නෑ නිලංකා.. මං සර්ට ගොඩාක් ආදරෙයි.. මගේ ප..ණ..ටත් වඩා.."

චායා දෑස්වල උතුරන කඳුළු අතරින් කීවාය. කෙල්ලෙක් ආදරය කරද්දී මොන තරම් අහිංසකද.. කෙදිනකවත් පිරිමියෙකුට ඒ තරම් පවිත්‍රව ආදරය කරන්නට නොහැකි යැයි නිලංකා සිතුවාය. ඇය අත තිබූ ටිෂූ කඩදසි කඩින් චායාගේ දෙනෙත් තෙත මාත්තු කළාය.

"යන්න.. ගිහිල්ලා මූණ හෝදලා ආයිත් චූටි මේක් අප් එකක් දගන්න. කොල්ලා ආස ඇතිනේ උදේම රෝස මල පිපිලා තියෙනව බලන්න."

නිලංකා චායාගේ වම් අතේ පහල කොටස තරමක් තදින් කොනිත්තා කීවාය.

"ඔන්න පර්ස්ට් නිව්පින්ච් එක මගෙන්.. අමතක කරන්න එපා."

"වෙන කව්රුවත් මට නෑ කෙල්ලේ නිව් පින්ච් දෙන්න.. උඹම මියක්."

නිලංකා චායා ඇතුළු කාමරයට යන අයුරු ආශාවෙනුත්

WWW.EXPRESSLANKA.TK 255

දූකෙනුත් බලා උන්නාය. මේ ආදරය ජීවිත කාලයේ තමා දකින සුන්දරම පවිත්‍රම සෙනෙහස බව ඇයට ඉදුරා විශ්වාසය. චායා ප්‍රථම වරට කාර්යාලයට ආ දිනය තිලංකා මෙනෙහි කළාය. 'කොල්ලා ආදරේ කරන්න පටන් ගන්න ඇත්තේ එද ඉඳලා..' ඇය සිතුවාය. පිරිමියෙකුට ආදරය යනු ජීවිතයෙන් කොටසකි. එහෙත් යුවතියකට එය තම ජීවිතයමය. ආදරය නමින් ලොව ඉන්නා සැම දෙනෙක්ම මේ පෙම් යුවළට රැකගනිත්වායැයි තිලංකා පවිත්‍රව පැතුවාය.

'තිලංකා දැක්කද අපේ කෙල්ලගේ වැඩ..'

රණතුංග මහත්මිය ඉහළ මාලයට ආවේ හද පුවරාගත් හැඟීමෙන් එසේ කියාගෙනය. තිලංකා යටි සිතින් සතුටු වූවාය.

'ඒකනේ මැඩම්.. අද උදේ ෂෝ රූම් එක දැක්කහම මට පුදුම හිතුනා. ගිය පාර විකාරයක්නේ මැඩම්..'

'ඒකනේ.. මටම ලැබුනේ මේ කෙල්ලව.. කෝ ආවද..'

'ආවා.. ආවා.'

'දවසක ගෙදර ගෙතිහිල්ලා මුළු ගේම ආයෙත් මේ කෙල්ලට දීලා ලස්සන කරගන්න ඕනේ.'

රණතුංග මහත්මිය නැවත කීවාය. 'ගේ දෙන්න කලින් අසංක පුතා මුළු ජීවිතේම කෙල්ලට දීලා ලස්සන කරලා දෙන්න කියලා..' එසේ කියන්නට තිලංකාට සිතුණි.

'සර් පහළ තාමත් හැඩ බලනවද මැඩම්..'

රණතුංග මහත්මියත් සමඟම අසංක නාව කල තිලංකා ඇසුවාය.

'නෑ තිලංකා සර් ආවේ නෑ.. උදෙන්ම අර කෙල්ල ඇවිත් සර්ව එක්කගෙන ගියා. මට කේන්තියි එක්ක. මේ සීසන් දවස්නේ.. ඒත් මොනා කරන්නද බඳින්න ඉන්න කපල් එකනේ.. එයාලටත් ජීවිතයක් තියෙන්න ඕනනේ..'

තිලංකාගේ ළය දැවී ගියේය. මෙය අසන්නට චායා මෙතන නොඋන්න එකම හොඳයැයි ඇය සිතුවාය. එහෙත් අද කවර හෝ මොහොතක ඇය මෙය මැඩම්ගේ මුවින්ම අසාගනු ඇත. ඒ මොහොතට

වායාගේ දෙනෙතට කඳුළු පිරෙනා බව ඇය හොඳකාරවම දැන උන්නාය. පව්.. අහිංසක කෙල්ල.. උදෙන්ම මූණ බලාගන්න ආසාවෙන් ඉන්න ඇති. දැන් පැලෙයි.

රණතුංග මහත්මිය පමණක් කාර්යාලය තුලට ඇතුළු වෙද්දී වායාට පුදුම සිතුණි. ඊටත් වඩා ඇය දෙස එක එල්ලේ බලන්නට බැරි ගතියක් ඇයට දැනුණි. 'රත්තරං මැඩම් මට සමාවෙන්න' යැයි කියා ඇගේ දෙපා පාමුළ වැඳ වැටෙන්නට ඇයට සිත්විය.

'ගුඩ් මෝනින් මැඩම්..'

වායා ගැහෙන දෙතොලින් ඒ වචන මුදහැරියේ බියෙනි. රණතුංග මහත්මිය ෆයිල් කවර කිහිපයත් බ්‍රීෆ් කේසයත් මේසය මත තබා වායා අද්දරටම ආවාය. වායාට බිම බැලූනි.

'ඔයා වගේම තමයි පැටියෝ ඔයාගේ වැඩත් හරි ලස්සනයි.. මට හරිම පුදුම හිතුනා වායා. මට හරි බයයි දැන්..'

රණතුංග මහත්මිය වායාගේ උරහිසට අතක් තබා කීවාය. වායා දෙනෙත් ඔසවා බැලුවේ පුදුමයෙනි.

'ඇ.. ඇයි මැඩම්...'

'එක්කෝ ඔයා මාව දලා වෙන රස්සාවකට යයි.. නැත්නම් වෙන කවුරුහරි ඔයාව ඩැහැ ගනී.'

වායාගේ දෙනෙතට කඳුළු නැඟ ආවේ නිරායාසයෙනි. කවුරු ඩැහැ ගන්නද.. ඔයාගේ පුතාම මාව ඩැහැගත්ත කොට.. ඇය සිතුවාය.

'මං මැඩම්ව දලා යන්නේ නෑ මැඩම්.. මැඩම් මාව එලෙව්වොත් මිසක්..'

වායා කඳුළු අතරින් කීවාය. 'සමහර විට ළඟදීම මාව එළවගනී..' ඇගේ යටි සිත වේදනාවෙන් පිරුණි. ඒ අසංක වෙනුවෙන් නොවේ. රණතුංග මහත්මිය වෙනුවෙනි.

'මම මැරෙනතුරා ඔයා මං ගාව ඉන්න ඕන. මං නැති උන කාලෙක සර් මේ බිස්නස් එක කරද්දිත් එයා ළඟත් ඔයා ඉන්න ඕන.'

වායාගේ ඇස්වල මැවුන කඳුළු සටස් ගා බිමට වැටුණි.

'ඉන්න දෙනවනම් මං හරි ආසාවෙන් ඉන්නවා මැඩම්.. අනේ

WWW.EXPRESSLANKA.TK 257

මැරෙන කතා කියන්නෙපා මැඩම්.. අපේ ආයුෂත් අරගෙන මැඩම් ඉන්න ඕනා.'

'අ..නේ..'

රණතුංග මහත්මිය ආදරයෙන් චායාගේ හිස අතගා එතැනින් ගියාය. මහා පව්කාරකමක් කළේ මේ රත්තරං පපුවට නොවේදැයි චායාට සිතුණි. චායාගේ හිත නොසන්සුන් වූයේ අයංකා පෙනෙන්නට නොඋන් නිසාය. අගේ කරන්න පල්ලෙහාට වෙලා ඇති.. ඇය දඟකාර ලෙස සිතුවාය. මටත් තිබුනේ පරක්කු වෙලා එන්න. හිත මොහොතකට බොළඳවිනැයි ඇයට සිතුණි.

'චායා. බැංකුවට යන්න ඕන දරුවෝ.. උදෙන්ම අද සරුත් නෑ.'

චායාගේ තුන්හිතම භූමිකම්පාවක්වූ කලෙක මෙන් දෙදරිණ. හිතට මේ මහා දූකක් දී ඔහු කොහේ ගියාද.

'අ..ඇයි.. මැඩම් සර්ට සනීප නැද්ද.'

'නෑ චායා.. උදෙන්ම අයියා ඇවිත් හර්ෂණී මිස්ව ගෙදර බස්සලා ගියා. කෙල්ල ඉන්දියාවේ යන්න. සර්ට කිව්වා ගිහිල්ලා වීසා අරගෙන දෙන්න කියලා. කොච්චර වැඩ තිබුණත් එයාලගේ ජීවිතේනේ.. මං යන්න කිව්වා. යවලත් බෑ.. නොයවලත් බෑ.'

මුවහත් බ්ලේඩ් තලයකින් කැපුම් පාරවල් දහ පහළවක් ඇතිවූ කලෙක මෙන් චායාගේ සිත උණුවිය. ඒ මූහුණ මේ දෑසෙන් බලන්නට උන්නේ මොනතරම් ආශාවෙන් දැයි චායා සිතුවාය. සිහිනයක ජීවත්වීම වුව මොනතරම් දූෂ්කරද.. දූකද.. මේ සිහිනයෙන් මෙසේ කී වාරයක් පිබිදෙන්නද.. නිස්කලංක හිතට ගිනි පෙළෙලි දමාගෙන මේ විඳින දූක මොනතරම් කටුකද..

ලෝකයම හිස්යැයි අඳුරු යැයි චායාට සිතුණි. චායා පුටුවට බරවූයේ හොන්ඩර පනහක් පමණ බර හිස මතට පැටවූ කලෙක මෙන් පීඩිතවය. කිසිඳූ වැඩක් පලක් කරන්නට පවා හිතට ශක්තියක් නැත. 'එක පාරක් ඔෆිස් එකට ඇවිල්ලා මූණ පෙන්නලා යන්න තිබුනා..'

WWW.EXPRESSLANKA.TK 258

දෙතුන් විටක්ම දෙනෙත් බොඳවෙන්නට ගියේය. ඒ හැම විටකම චායා කැල්කියුලේටරය අසීමාන්තිකව ඔබමින් හැඟීම් මැඩ ගත්තාය. දුවගෙන කොහේ හෝ ගොස් ඇතිවන තුරු හඬා එන්නට ඇයට සිතුණි.

ආදරය කළේ මේ දුක විඳින්නට වනබව දැනගෙන නොවේද.. ඔහුට හැකි තරම් පපුවේ ඉරි ගයන්නට දුන්නේ ඒ සෙනෙහසේ තිත්ත කඳුළින් බොඳවෙන බව දැනගෙන නොවේද..

"ආ ළමයෝ මේක ගන්න.. මේ චෙක් ටික දලා කෑෂ් විසි හතර දහසුත් අරගෙනම එන්න.. අද ලයිට් බිල් ගෙවන්නත් ඕනේ.. මේ බිල් වැඩිවෙන හැටියට බිස්නස් කරගෙන යන්න වෙන්නෑ.. මතක ඇතුව චායා පහළ කිත්සිරිට කියාගෙන යන්න සෙනග නැති වෙලාවට ඒසී ඕෆ් කරන්න කියලා."

"හා මැඩම්.."

චායාට රණතුංග මහත්මිය කියූ කිසිවක් ගැන සිතන්නට හිතක් තිබුනේ නැත. ඇය මැඩම් අත තිබූ චෙක්පත් අතට ගෙන අත් බෑගයද ගෙන බරවූ හදවතින් පිටතට ආවාය.

තිලංකා චායා දෙස බැලුවේත්.. චායා තිලංකා දෙස බැලුවේත් එකම විටකය. චායා ඇතුල් කාමරයේදී සියල්ල දැනගන්නට ඇතැයි තිලංකා ඒ මුහුණ දුටුවනම සිතාගත්තාය.

ආදරය මොන පැත්තෙන් ගත්තද දුකකි.. වේදනාවකි.

චායා තිලංකාව පසුකර යන්නට හැදුවද ඇයටත් නොදැනී ඇගේ දෙපා නැවතිණි.

"ආදරේ කරන පපුවෙත්ම ඔය දුකත් විඳින්න පුරුදු වෙන්න චායා.. මොන රස කෑම කෑවත් වුව්වටත් දැවිල්ලක් එනවනේ.. නේද."

"මං දන්නවා තිලංකා.. මං යනවා."

"පොඩ්ඩක් හිටපන්.. ඔළුව තෝන්තු කරගන්නැතුව පරිස්සමින් පලයන්.. ඔය චෙක්ස් පරිස්සමින්... සමහරවිට දවල් වෙනකොට එයි."

"නේනව නම් හොඳයි."

චායා [illegible] ගෙන [illegible]ය.

WWW.EXPRESSLANKA.TK 259

'ඇයි සරුංගලෙත් අරගෙනම එයි කියලා බයද... උඹ ඕවා හිතන්න එපා වායා...'

'මංද,, මං යනවා කෙල්ලේ.'

'එනකොට මිල්ක්බෝඩ් එකෙන් උම්බලකඩ බනිස් දෙකකුයි කිරි පැකට් දෙකකුයි අරගෙන එන්න.. හරි බඩගිනියි.'

'මට එපා.. මං උඹට ගෙනල්ලා දෙන්නම්..'

'ඔන්න පළවෙනි රෝග ලක්ෂණේ.. නොකා ඉන්න පටන්ගත්තා. මට විතරක් අරං ආවොත් මම කන්නෙත් නෑ..'

වායා අසරණව සිනාසී පහළට බැස්සාය. පහළදී ඇය පෙරදා අහවර කළ විලාසිතාගාරයේ මල්කම් දෙස මොහොතක් බලා උන්නාය. ඒ මල්කම් අතර සිදුවූ සියල්ල සිතුවම් පටක් මෙන් ඇයට සිහිවිය. 'ඉස්සෙල්ලම දවසෙත් මාව ඇඬෙව්වා.. අදත් ඇඬෙව්වා..' ඇගේ බොළඳ සිත වේදනාවෙන් පුපුරු ගසන්නට විය.

වායා බැංකුව වෙත ගියේ පයින්මය. ගාලුපාරේ වාහන තදබදයට හසුවූ වාහන පෙළ දෙස බලමින් ඇය ගියේ හිස්වූ හදවතිනි. එකවරම පුරුදු වාහනයක දුටුන ඇගේ නෙතද සිතද කලබලයට පත්කළේය. ඒ අසංකගේ කැබ් රථයයි. වායාට ඉන් දෙනෙත මුදවාගන්නට බැරි තරමට ඇගේ සිත අසරණ විය. මුලින්ම අසංක දෙසත් පසුව ඊට එහා අසුනේ උන් හර්ෂණී දෙසත් වායාට බැලුනි. ඇය උන්නේ සෙලියුලර් දුරකථනය කනේ ගසාගෙන ඇගේම ලොවකය.

වාහන තදබදය අතරමැද වටපිට බලද්දී අසංක වායාව දුටුවාය. නෙත් සතර එකට හමුවෙද්දී වායාගේ යටි පතුලේ සිට සීතලවිය. අඩිය ඉක්මන් කර යන්නට සිතුනද සාමාන්‍ය ගමන පවා අඩාලවිය. ඇය තවත් වරක් හිස ඔසවා බැලුවාය. අසංක තවමත් බලාගත් පරිදිමය. අසරණකමට.. බයාදුකමට හුරු ආදරයක් ඒ දෙනෙත් වල විය. උදේ සිට හිත පෙලා දැමූ සිතුවිලි දෙගුණ තෙගුණ වී දැනෙන්නට විය. ඒ ඇස් මට සමාවෙන්න වැනි වදනක් ලියාගෙන ඉන්නාක් බඳුයැයි ඇයට සිතුණි.

වාහන තදබදය අවසන්වීත් ටික වෙලාවක් යනතුරු අසංක

WWW.EXPRESSLANKA.TK 260

වාහනය නවතාගෙන උන්නේය. ඔහු පියවි සිහිය ලද්දේ පිටුපසින් ඉන්නා වාහන රියදුරන් එකදිගට නලා හඬවද්දීය.

'මොනාද කරන්නේ.. යන්..'

හර්ෂණී අසංකගේ වමතට ඇණ කීවාය. චායාගේ මුවහට සිනාවක් පහලවුනේ නිතැතිනි. ඇය ගාලුපාරේ පදික වේදිකාවේ ඇවිදිමින් උන් සෙනඟ අතරේ සැඟව ගියාය. ඔහු ඉන්නේ වේදනාවෙන් අපහසුතාවයෙන් අසරණකමින් බව දැනී චායා සතුටුවූවාය. එසේ සිතා හිත හදගත්තද මොහොතකින් සිත කඩා වැටුණි. කී කාලයකට මෙසේ හිත රවටා ගන්නද..

සියල්ල අමතක කර හිත හදගන්නානම් හොඳයැයි ඇයට සිතුණි. ඒත් සමගම වාහනයේ වීදුරුව අතරින් පෙනුන ඒ රුව ඇයට සිහිවිය. අප්‍රමාණ ලෝබකමකින් ඇගේ සිතැතුරා ගියේය. කොටු කමිසයට ඔහු වෙනදටත් වඩා අද ලස්සනට පෙනුනියැයි ඇය සිතුවාය.

ආදරයේ අහිමත් විඳිය හැක්කේ ආදර නිමිත්ත සන්තක කරගත් පමණින්මද.. හිමිකර නොගෙන දුරින් හිඳ ආදරය කර ඒ පරමානන්දනීය සතුට විඳිය නොහැකිද.. අනෙක් අතට ඒ තරම් ලොවිතුරු ලෙස ආදරය කළ පසුත් අහිමිවීම උරුම නම් ඒ කවර පාපයක්ද..

චායා බැංකුවේ සිට නැවත ආවේ ගියාටත් වඩා හිත අවුල් කරගෙනය. කාර්යාලයට ආපසු ඇය හිත තද කරගෙන පැය තුන හතරක් එක දිගට හිස ඔබාගෙනම වැඩ කළාය. එහෙත් හැම විනාඩි තුනකටම එක වරක් ඇයට අසංකගේ කාමරය දෙස බැලුනි. එය හිස්ය.. වෙනදා ඒ වීදුරු අතර පායන සඳ අද නැත. ඇයට හීල්ලිනි.

චායාට දුක සිතුනේ මේ දුක අඳම දැනුන එකය.

ඔහුගේ කාමරයට ගොස් ඒ මේසය.. ඒ පතපොත අතපත ගාන්නට ඇයට සිතුණි. දෙතුන් වරක්ම ඒ හැඟීම ආයාසයෙන් නවතාගත් ඇය අන්තිම වර ඒ කාමරයට ගොස් ඔහුගේ පහස නිතර විඳි පැනක් රැගෙන විත් එයින් ලියන්නට ගත්තාය. එය දෙතොල්පට අතර රඳවාගත්තාය. ඒ සුවඳට.. ඒ ස්පර්ශයට.. හිත මේ තරම් ලෝබ වන්නේ ඇයි.. එය අහිමි වන්නට තිබේන නිසාද..

'කෑම කාලා ඉන්න ළමයෝ.. දැන් දෙකත් පහුවෙලා.'

WWW.EXPRESSLANKA.TK 261 වරක්ම කන්නට

කියූ පසුය. ඇය බත් එකත් රැගෙන එළියට ගියේ සැනසිල්ලක් නැති හිතම අමාරුවෙන් හදාගෙනය.

'මං හිතුවා අද කන්න එන එකක්වත් නෑ කියලා. පුළුවන්නම් කොළේ ඉරාගනින් පුතෝ.. මැඩම් දවස් දෙක තුනෙන් අල්ල ගනී ඔක්කොම.. මෝඩියෙක් වෙන්න එපා.'

නිලංකා ආදරයෙන් නමුදු බැරෑරුම් ලෙස කීවාය. බත් මුල ලෙහාගත්තද කන්නට පිරියක් තිබුණේ නැත.

'මම කරගත්තේ ලොකු මෝඩකමක් කියලා මට හිතෙනවා නිලංකා. ඒත් ඒක සිද්ධ උන දෙයක් මිසක් මං හිතලා කරගත්ත දෙයක් නෙමේ.'

වායා බත්මුල අත ගගා කීවාය. පෙඟී ගිය දූස් ඉඳුල් නොතැවරුන අතින් වායා පොඩිකර ගත්තාය.

'පෙරහැර ගියාටත් පස්සේ අලිබෙටි වේලුනාටත් පස්සේ ඕවා ගැන කතා කරලා වැඩක් නෑ වායා. බලාපොරොත්තු තියාගන්න කියන්නද එපා කියන්නද කියලා මං දන්නෑ. ඒත් සර් ගැන මම හොඳට දන්නවා. එයා අසරණ උනොත් මිසක්කා කවදාවත් උඹට අසාධාරණයක් කරන්නෑ.'

'ආදරේ කරලා සාධාරණයක් ඕන නෑ නිලංකා.. මට ආදරේ තිබුනාම ඇති. මට හරි පුදුමයි මං ගැනම.. මං කොල්ලෙක් දිහා කවදාවත් මෙහෙම බලලා නෑ. ආදරේ ගැන හිතලවත් නෑ.'

'ඒක උඹේ මූණෙන්ම පේනවා. උඹ කපටි නැහැ.'

'දුක් විඳවිඳ හරි කමක් නෑ.. මට මෙහෙම වැටිලා එයා දිහා බල බල ඉන්න හරි තිබුණොත්..'

'උඹ කන්නැතේ කෙල්ලේ.. කටක්කාපන්..'

'කන්න බැහැ නිලංකා.. මං පස්සේ තේකක් බොන්නම්.. මේ කරෝල බැදුමයි අඹ මාලුවයි ඔයාට දෙන්නද...'

නිලංකා අහිංසකාව සිනාසුනාය. දෛවය මේ පසුවට ගින්දර

WWW.EXPRESSLANKA.TK 

දෙන්නට සිතනවා නම් එය නුහුලනා අපරාධයකි.

'මේ කෙල්ලේ.. මෙහෙම දෙයක් කරමුද.. සෙල් නම්බර් එක තියෙනවා. මං කෝල් එකක් අරගෙන උඹට දෙන්නද.. කටහඬවත් අහන්න බැරියැ.'

'එපා නිලංකා.. කවුරු ළඟ ඉන්නවද දන්නැ.. අනික කතාකරලා මං මොනා කියන්නද..'

'උඹලා මොනා කතා කරනවද කියලා මංදන්නේ කොහොමද.. ඔන්න මගේ යුතුකම මං කිව්වා.'

'මං රැට කන්නම්...'

චායා බත්මුලම එකට ගුලිකර කුණු රඳවනයට දැමුවාය. ඇය අත සෝදගෙන පැමිණ වාඩිවූයේ ඇල්වතුර වීදුරුවකින් පමණක් කුස පුරවාගෙනය.

අසංක කාර්යාලයට ඇමතුමක් ගත්තේ හර්ෂණීගෙන් නිදහස් වූ මොහොතකය. ඔහු උන්නේ දැඩි වේදනාවෙනි. එහෙත් කළයුතු දෙයක් නැත. ගාලු මුවදෙර පිටියට ආසන්නයේ වාහනය නවතා අසංක ඇමතුම ගත්තේ මුලින්ම නිලංකාටය.

'නිලංකා මම..'

'ස..ර්..'

'ඉස්සෙල්ලා අම්මට යන ලයින් එක ඕෆ් කරන්න.. මෝඩි වගේ බෙරිහන් නොදී..'

ඔහු අණක් සේ කීවේය. වසර ගණනාවක් සේවය කිරීම නිසාදෝ දැඩි විශ්වාසයත් සමඟ බැඳුන හිතවත්කමක් ඔවුන් අතර විය.

'හරි සර්..'

'නිලංකාට චායා මොනාහරි කිව්වද..'

අසංක වඩාත් විවෘතව ඇසුවේය. සිදුවූ බොහෝ දේවල් ඇය දන්නා බව ඔහු දැන උන්නේය.

'මට චායා කියන්න ඕන නෑ සර්.. මං දන්නවා.. චායාත් කිව්වා.'

WWW.EXPRESSLANKA.TK 

'මම නිලංකව විශ්වාස කරනවා.'

'ජීවිතේ පළවෙනි වතාවට මැඩම්ට බොරුවක් කරලා මං ඒ විශ්වාසේ රකිනවා සර්..'

'තැන්කියු.. සෝ දූන්..'

'පව් සර්.. කෙල්ල කැවෙත් නෑ.. තුන් පාරක් ඇඩුවා.'

අසංකගේ හදවත ඇවිලීගෙන ගියේය. ආදරයේ ප්‍රථම දිනයේදීම ඇයව රිදවන්නට ඔහුට සිදුවිය.

'මං හිතලා කරනවා නෙවෙයි නිලංකා..'

'දන්නව සර්.. අනේ මන්ද..'

'ඔනනට කතා කරනවද.'

'මැඩම් මොනාහරි හිතයිද..'

'අම්මා කතා කරනවා කියන්න..'

'හරි.. හරි.. සර් ලයින් එකේ ඉන්න.. මේ කරන්නේ පව්ද පින්ද දන්නෑ.'

'පින්.. පින්.. ලොට් ඔෆ් පින්..'

නිලංකා සිනාසී රිසීවරය මේසය මත තබා ගැහෙන හදින් කාර්යාලයට එබුනාය.

'වායා.. අම්මගෙන් කෝල් එකක්.'

නිලංකා වචන අමාරුවෙන් අමුනා කීවාය. වායා හිස එසවූයේ පුදුමයෙනි.

'ඇයි නිලංකා හදිස්සියක්ද..'

රණතුංග මහත්මිය හිස ඔසවා ඇසුවාය.

'නෑ මැඩම්. මේ.. මේ. ඊ වෙනවද කියලා අහන්නලු.'

'නිලංකට කියන්න තිබුනේ අපි කෙල්ලව පරිස්සම් කරලා එවනවා කියලා. පව් දෙයියනේ.. එයත් අම්මා කෙනෙක්නේ..'

රණතුංග මහත්මිය කරුණාබරව කියා යළිත් වැඩෙහි යෙදුනාය. නිලංකාගෙන් වායාගෙන් පසුව උණුවී ගියේ එකම විටය.

වායා එළියට [illegible] ඇය [illegible] ලා [illegible] ම [illegible] රයට

WWW.EXPRESSLANKA.TK 264

සිනාසුනාය.

'ගතින්.. හදවතින් ඇමතුමක්.'

වායා දුරකථනය ගන්නා තුරුම ඇය අසංක කතා කරනා බව ඇයට නොකීවාය.

'අම්මේ...'

වායා ඇමතුවාය.. අසංකගේ හදවත කොඅත් තුන හතරකින් ඇකිළී ගියේය.

'බබා ම..ම..'

දුරකථන රැහැන දිගේ ආ ගින්දරපුංජයක් ඉන් පිටවී දෙසවන් හරහා පපුවට බහිනා සෙයක් ඇයට දැනුනි. වායා මොහොතක් කතා කරගත නොහැකිව තිලංකා දෙස බලා උන්නාය.

'බබා.. කතා කරන්නැත්තේ මා එක්ක තරහ වෙලාද.. කියන්න චූටි පුතාට සමාවදෙනව නේද..'

ඔහුගේ හඬේ වූ ආදරණීය බවට වායාගේ දෙනෙත් උණුවී තෙත්විය.

'දෙ..න..වා..'

ඇයට කියැවිණ. ඔහුට මහා සහනයක් දැනුනි.

'ඇයි කෑම කෑවේ නැත්තේ.. බඩගින්නේ නේද..'

'දැන් බඩගිනි නෑ..'

'මාත් කෑවේ නෑ..'

'බොරු කියන්නේ.'

'බඩ කපලා පෙන්නන්නද ඇවිත්.. උදේ ඉඳලා කොකා කෝලා එකක් විතරයි බිව්වේ...'

'දැන් කන්න.'

'දැන් කන්න ඕන නෑ.'

'ඇයි...'

'බඩපිරිලා..'

'මොනවයින්ද.'

'[illegible] ඕනෙද..'

WWW.EXPRESSLANKA.TK 265

'ම්..'

'ආදරෙන්..'

වායා පපුවට අතක් තබාගත්තාය. දැන් දැන් පපුව පැලෙතැයි ඇයට සිතුණි. මේ කටහඬට පවා ජීවිතය පිරවිය හැකිදැයි ඇය ඇගෙන්ම ප්‍රශ්න කළාය.

'අද හරි ලස්සනායි...'

ඔහු කීවේය. ඇගේ මුවමත තුනී හසරැල්ලක් ඇඳුනි. ඒ අද දවසට ඇඳුන ප්‍රථම හසරැල්ලය.

'මං තෙමේ...'

'එහෙනම්..'

'ස..ර්..'

'මං ප්‍රශ්නයක් අහන්නද..'

'හා..'

එහෙත් එකවරම දුරකථන රැහැන විසන්ධිවිය. වායාට හීල්ලින.

'කට්වුනා නේද..'

'ම්..'

'මං ආපහු අරගෙන දෙන්නද..'

'එ..පා..'

නැවත ඇමතුම එතැයි වායා බලාඋන්නාය.

'සෙල්ෆෝන් එකේ බැට්රි බැහැලා ඇති.. දැන් හරිනේ.'

වායා යළිත් කානේෂන් මල් පොකුර දෙස බැලුවාය. එය උදේට වඩා දැන් සුන්දරය. වායා එදෙස බලා සුන්දරව සිනාසුනාය.

'අප්පේ ඇති යන්තම්.. මං හිතුවා හිනා ෆැක්ටරිය අද දවසෙම වහලා තියෙයි කියලා. දැන් ගිහිල්ලා වැඩ කරපන්. බලපන් කඩාගෙන දැන් එයි.'

වායා යළිත් කාර්යාලයට ගොස් ඉඳගත්තේ අහිංසක ආශ්වාදයකින් පපුව පිරී යද්දීය. ආදරය මහා පුදුමාකාර දෙයකි. එය ප්‍රාතිහාර්යයක්ද.. විශ්ව කර්මයක්ද.. දේවකර්මයක්ද.. ඇය නොදනී.

WWW.EXPRESSLANKA.TK 266

# 28

උදේ තමාත් හර්ෂණීත් එකට වාහනේ යනු දුටුවිට වායා
මොනවා සිතෙන්නට ඇත්දැයි අසංක සිතුවේ ගින්දරෙනි. මොනතර
අසරණ කෙල්ලක වුවද ඇය තමාට ආදරය කළ යුවතියය. ඇ
ආදරය හර්ෂණීගේ ආදරය තරම් ආත්මාර්ථකාමී ව්‍යාජ ආදරය
නොවේයැයි ඔහුට සිතුණි. ජීවිතයේ සියළු සත්තකය තමාට පුදදී ඇ
බලාපොරොත්තු වූයේ මොනවාදැයි තවමත් ඔහුට සිතාගැනීමට නොහැ
උදේ හර්ෂණී පැමිණියේ අසංක වායා පිළිබඳ රසබර සිතුවි
වලින් හද පුරවාගෙන තැවුම් හැඟුමින් ඒ මුහුණ දැකගැනීමේ ආශාවෙ
උන් මොහොතේය. සමහරවිට ජීවිතයේ උදවන සුන්දරම උදෑසන අ
වන්නට පුළුවනැයි ඔහුට සිතුණි. ඔහු ක්‍රීම් පැහැගත් පසුබිමට ඒ ස
දකින්නට අපමණ ආශාවෙන් උන්නේය. අද දකින්නේ ඊයේ දුටු වාය
නොවේ. පෙරද රාත්‍රියේ ඇයව පපුවේ හොවාගෙන උන් අයුරු අසංක
සිහිවිය. මොහොතකින් මුළු පපුවම හීටරයක් ගැසූ කලෙක මෙ
උණුසුම්විය.

අසංක උදේ හර්ෂණී එද්දී උන්නේ මේසය මත තිබූ ගුව
විදුලියෙන් වාදනය වෙමින් තිබූ ගීතයකට දැහැන්ගතවීය.

අසූරු යැතිත් එක මොහොතකදී
කාලය නැවතී යළි ඇරඹී..
විශ්වය අලුතින් බිහිවේවා
ඔබේම වී මා..
මගේම වී ඔබ..
අපේම වී අප ඉපදේවා..

WWW.EXPRESSLANKA.TK 267

ඒ ගීතයේ පද අසංකගේ ඇතුළු හදවත හිරිවැට්ටවීය. ආදරය වෙනුවෙන් තම සිතේද ඇත්තේ මෙවන් ගැඹුරු අහිංසක ප්‍රාර්ථනාවක් යැයි අසංකට සිතුණි. එහෙත් ලෝකය වෙනස් නොවන බවත් විශ්වය අලුතින් බිහි නොවන බවත් ඔහු වේදනාවෙන් සිතුවේ හර්ෂණීගේ කටහඬ පහළ මාලයෙන් ඇසෙන්නට වූ නිසාය.

'අසංකයියා කවද ඉඳලද ලව් සෝන්ග්ස් අහන්න පටන්ගත්තේ. ඊටත් මේ ලව් හිහන සිංහල සිංදු..'

හර්ෂණී උළුවස්සට බරවී සිනාබරව ඇසුවාය. අසංකගේ මූවට ගලා ආවේ හොඳ කුණුහරුප දෙකකි. එහෙත් ඔහු අමාරුවෙන් එය ගිලගත්තේය.

'ඇයි මේවා ඇහුවහම ලව් කරන්න බැරිද..'

ඔහු ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියා විරහිත කර ඇසුවේය.

'අසංකයියා දැන් හරි වෙනස්.. ඉස්සර හිටපු කෙනා නෙවෙයි.'

මිනිස්සු වෙනස් වෙනවා තමයි හමී.. පුංචි කාලේ මම ඔයාට රටකජු වල පොතු ගලවලා කැව්වා. ඔයාලගේ අම්මා අපිට කස ඇට දලා පැමත් හදලා දුන්නාම අපි එකම පුටුවේ දෙපැත්තට වෙලා බිව්වා. ඒ කාලේ ඔයා ජීවිතේ හරි අහිංසකව දැක්කා. පුළුවන් නම් අතීතෙට ගිහිල්ලා පරණ හමී බබාව අරගෙන එන්න.. මං එයාට ගොඩාක් ආදරෙයි..

'අද ඉන්න මටත් වඩා..'

හර්ෂණී ඇස් ලොකු කර ඇසුවාය.

'ඔව්.. තරහ වෙන්න එපා බබා කිව්වට.. ඔයා ඉස්සර චූටි කාලේ හරි අහිංසකයි.. ලොකු ළමයෙක් වෙන්න කළින් මං ඉස්සරහ ජංගිය ගලවලා වූ කළා... ඒ දවස්වල ඔයා හිනාවුනේ හරි අහිංසක විදිහට.. එයා කෝ.'

'මට තේරෙන්නෑ ඔය කියන බූත.. පිස්සු ඩබල් වෙනවනේ ඔයා කියන ඒවට.. මට පොඩි එකෙක් වෙන්නද කියන්නේ.. ඇයි අද මගේ තියෙන වැරැද්ද මොකක්ද..'

අසංකට සිතුණේය. ඇය අමුතු කතාකර තේරුමක්

WWW.EXPRESSLANKA.TK 268

නැත.

"ඔයා කතා කරන විදිහට මටනම් මැරි කරන්නත් බයයි.. ඔන්න දැන්මම කිව්වා මං හිරවෙලා ජීවත්වෙන්න නම් ආස නැහැ."

"ඒ මම හිර කර ගත්තොත්නේ."

"මං ආවේ කථික තරඟයකට නෙවේ අසංකයියේ."

"මටත් අද වාද කරන්න කම්මැලියි.. වෙන දවසක ඒක කරමු."

හර්ෂණී පැමිණ අසංක ඉදගෙන උන් ඇඳමත ඉඳගත්තේ ඉන් පසුවය.

"තරංගි ඇන්ටි ඉන්දියාවේ යනවා. මටත් කතාකළා. වෙඩින් එකට ඕන කරන දේවලුත් එහෙන් ගන්න පුළුවන්.. මම යනවා."

ඇත්තටම ඇය තමා සමඟ විවාහ වී ලස්සන ජීවිතයක් ගතකරන්නට සිතාගෙන ඉන්නවා නම් ඇය ඇසිය යුත්තේ මං යන්නද කියාය. දැන් ඇය එය තීරණය කර හමාරය.

"දැන් ඉන්දියාවේ බඩු මෙහේ ෂොප්වලින් ගන්න පුළුවන්නේ."

"ඒත් මං යන්නත් ආසයි."

"ගෑණු දෙන්නෙක් තනියම.. වෙන්නායි හිතන තරම් හොඳ ටවුන් එකක් නෙමේ හණී.."

"අසුබවාදියා.. තරංගි ඇන්ටි හොඳට දන්නවා."

"හරි මොකක්ද කියන්නේ එයාර් පෝට් එකට ගිහිල්ලා බස්සන්න කියලද.."

"ඒකට ගෙදර වාහන ඕන තරම් තියෙනවා. වීසා ගන්න ඕන අද යන්.."

"අද.. දැන් කොහොමටත් බෑ.. වැඩ පිරිලා හණී."

"ඔයා අද නොගියා කියලා ෂොප් එක වහන්න වෙන්නෑ. ම දන්නෑ. අන්න තාත්ත පහළ.. ඔයා නැතුව මට යන්න එපා කිව්වා ඒකයි ආවේ."

ඔෆිස් යන ගමන නවත්වන්නට සිදුවීම ගැන අසංකට මහ දුකක් ... හදගත්තේය. ජීවිතයේ

WWW.EXPRESSLANKA.TK 269

පතනා සියල්ල පතනා ලෙසම සිදුනොවේ. එසේ වීනම් ජීවිතය මේ තරම් දුකක් නැත.

යන මඟ පූරාවටම හර්ෂණී කළේ අසංකගේ සෙලියුලර් දුරකථනයෙන් ඇමතුම් ගැනීමය. එක අතකින් අසංකට එය මහ අස්වැසිල්ලක් විය. ඔහු දිගටම කල්පනා ලෝකයේ සැරි සැරුවේය.

"ඕනතරම් කෝල්ස් ගන්න. අන්තිමට මට එක කෝල් එකක් ගන්න බැට්රිය ඉතුරු කරන්න හොඳේ..."

අසංක එද්දී කීවේය.

"කාටද.."

හර්ෂණී නොපිස්සුමෙන් ඇසුවාය.

"කෙල්ලෙක්ට.."

අසංක කටට ආවාට එසේ කීවේය.

"විශ්වාස කරන්න අමාරුයි.. ඔයා ලව් කරන්න දන්නෙ නෑ.."

හර්ෂණීගේ ඒ වචන ගල් ඉන්නක් පපුවට බැස්සුවාක් මෙන් අසංකගේ පපුව පලාගෙන විදගෙන ගියේය. ඔහුට වායා සිහිවිය. මට ආදරය කළනොහැකි දැයි ඇගෙන් ඇසිය යුතුයැයි ඔහු සිතාගත්තේය.

"ඇයි කතා නැත්තේ."

හර්ෂණී පුදුමයෙන් ඇසුවාය.

"නෑ.. ආදරේ ගැන කතාකරන්න අව්ව සැර වැඩියි."

ඔහු හැඟිම්බර ලෙය කීවේය. හර්ෂණී ඔහුදෙය අන්දමන්දව බලා පුදුමක් හෙළුවාය.

"කවදද ඉන්දියා යන්නේ."

"අනිද්දට.. මං යන්න කළින් එන්නම්."

"සමහර විට මම නැතිවෙයි. නුවර යන්න හිතන් ඉන්නවා අනිද්දට.."

"ඒ මොකටද.."

"නාලකව ෂෝ එකකට එක්කං යන්න තියෙනවා."

"ඔයාගේ ඔළුවට ඔය විකාර අදහස් ආවේ නාලක නිසා තමා."

WWW.EXPRESSLANKA.TK 270

'මොනවද විකාර අදහස්.'

'ඔළුවේ මොනාද තියෙන්නේ කියලා ඔයාම දන්නවා ඇතිනේ.'

'අපි ඕවා ගැනකතා නොකර ඉමුද..'

හර්ෂණීව අසංකට පීඩාවක් විය. වරින් වර පපුව කොනිත්තා වදදෙනවාට ඔහු කැමති නොවීය.

'මාව එම් සී එක ළඟින් දන්න. මට නව බඩු වගයකුත් ගන්න ඕන.'

බහින්නට ළංවී හර්ෂණී අසංකගේ වමත මත සුරත තබා කීවාය.

'මොනවද ඉන්දියාවෙන් ගෙනල්ලා ඕනේ.'

සැබෑවටම හර්ෂණීට ආදරය කරනවා නම් තමා ඇයට මේ ගමන යන්නට ඉඩ නොදෙන බව ඔහුට විශ්වාසය. අයාලේ ගිය ගැහැණු හදකට ආදරය කරන්නට පිරිමියෙකුට හිත හදගැනීම අතිශයින් දුෂ්කරය. මොනවත් අවශ්‍ය නැතැයි කියන්නට ඔහුට සිතුණි. එහෙත් ඒ තරම් අමානුෂික වන්නට ඔහු ඉගෙන ගෙන නැත.

'චෙන්නායි වල තියෙනවා හොඳ බුලත් විට.. ඒවායිත් පහක් විතර අරන් එනවද...'

ඔහු සිනාසී කීවේය. හර්ෂණී ඔහුදෙස බැලුවේ කෝන්තියෙනි.

'මං යනවා.. ආවේ අපරාදේ ඔයා එක්ක මේ ගමන..'

අසංක කිසිවක් කීවේ නැත. මෙවන් ලුහුඬු ගමනක් තමා සමඟ ගොස් අපරාදේ යැයි කියනා ගැහැණිය විවාහය වැනි දීර්ඝ ගමනක් තමා සමඟ යන්නට හිත හදගත්තේ කෙසේදැයි ඔහුට සිතාගත නොහැක.

☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆

අසංක කාර්යාලයට ඇතුළු වෙද්දීම වායාගේ මුහුණ අවපසේ සිට පූරපසට එන්නාක් මෙන් එකළුවිය. ඒ ඇස් හතර හමුවුනේ තත්පර කිහිපයකට පමණි. 'හරි මහන්සියි පාටයි.' වායා වේදනාවෙන් සිතුවාය.

'කෙල්ලව ගෙදරටම බැස්සුවද පුතා.'

WWW.EXPRESSLANKA.TK 

රණතුංග මහත්මිය ඇසුවාය. චායා නෙත් අකීරුවෙන් බිමට බර කරගත්තාය. මේ අහසේ කිසි දිනයක තමාට සඳක් විය නොහැක. අඩුම තරමේ කසිකබල් තරුවක්වත් විය නොහැක...

"එම් සී එක ළඟින් බැස්සා අම්මේ.."

"ඒ ළමයගෙත් රස්තියාදුව.."

රණතුංග මහත්මිය එසේ කියන්නේ ඒ රස්තියාදුව බරපතල ලෙස බාරගෙන නොවන බව චායාට විශ්වාසය. චායා දිගටම නෙත් ෆයිල් කවරයටම ඔබාගෙන උන්නාය. අසංක ළඟින් එද්දී ඒ සුවඳින් චායා මුළු පපුවම පුරවාගත්තාය. පෙරදා රැයේ ආත්මයෙන්ම විඳගත්තේ මේ සුවඳය.

ඒ මුහුණ ළං ළංව බලාගැනීමේ තදබල ආශාවකින් ඔහුගේ හිත ඇවිලී ගියේය. වෙනදානම් කොළයක් බිමට වැටුනද ඇයට කතාකරන්නට තරම් සැහැල්ලු බවක් ඔහු තුළ විය. එහෙත් අද එසේ නොවේ.

"අම්මා තේ බිව්වද අම්මේ."

ඔහු එසේ ඇසුවේ හිතාමතාය. චායාගේ මූවගට සිනාවක් නැඟුණි. හරි කපටි කොල්ලෙක්.

"තේ බීලා කොච්චර වෙලාද.. ඔයා බොන්න."

චායා නැගිට්ටේ සිනාබර වන තොල්පට තදකරගෙනය.

"සර් නිකම් තේ එකක් හදන්නද කිරි තේ එකක් හදන්නද.."

අසංකගේ කාමරයට එබී චායා ඇසුවාය. ඔහු එයට පිළිතුරක් නොදී තත්පර දෙක තුනක් එහෙමම ඒවන දෙස බලාඋන්නේය. චායා තුනී ලෙස සිනාසුනාය.

"නිකම් තේ එකක්.."

ඔහු ඕනාවටත් වඩා මෘදුව කීවේය.

"කාටද තේ.."

හීටරය ගහද්දී නිලංකා ඇසුවාය.

"සර්ට.."

චායා මදහස අලුත් කර කීවාය.

'බලපන් කොච්චර ආදරේද කියලා. ආව ගමන් කෙල්ලගෙන් තේ එකක් බොන්න ආස හිතිලා. බැන්ද කාලෙක තේ එකට කලින් තවත් මොනාහරි ඉල්ලයි.'

'මොනවද..'

'බෙල්ල බදාගෙන කිස් එකක්.. මෙතනට..'

තිලංකා මනමාල සිනහවක් පා වායාගේ දෙකොලට ඇඟිල්ලක් තබා කීවාය. උණුවෙන උණුවතුර කෝප්පය පපුවට හලාගත්තාක් වැනිව උණුවී වැගිරෙන්නට විය.

'ඒක මට දෙන්න ලැබෙන්නෑ තිලංකා..'

තිලංකා කිසිවක් කීවේ නැත. එය එසේ නොවේයැයි කියන්නට තිලංකාට බියක් දැනුණි. අසරණ කෙල්ලෙකුගේ හිත හීන වලින්ම පුරවා තැබීම පාපයකි. ඒවා සැබෑම වන සිහින නම් ප්‍රශ්නයක් නැත.

වායා තේ කෝප්පයත් රැගෙන අසංකගේ කාමරයට ඇතුළුවූයේ නෙත් බිමට බර කරගෙනය. ඒ පිළිවෙත රැකීම අසීරුය. ඔහු ළං වෙද්දී ඇස් ඉහළට එසවින. ඔහුගේ මේසය ඉදිරිපිට පුටුවට වී පැය දෙක තුනක් ඔහේ ඒ මූහුණ බලා ඉන්නට ඇත්නම් යැයි වායාට සිතුණි. ඒ තරම්ම ලෝබකමක් ඇයට දැනුණි.

සියල්ල අමතක කර වායා තේ කෝප්පය ඔහුගේ මේසයේ වම් කෙළවර තබා හැරුනාය.

'පුතා.. ඕඩර් ෂීට් එක වායා ලියලා තියෙන්නේ. අරගෙන බලලා ඒක වෙරිෆයි කරන්න. උදේන්ම ඒ මිතිස්සුන්ට දෙන්න ඕන.. වායා ඍර් එක්ක එකතුවෙලා ඒක හදන්න.'

රණතුංග මහත්මිය කැගසා කීවාය. වායාටත් අසංකටත් දැනුනේ එකම සතුටකි. ආදරය මොන පැත්තෙන් ගත්තද සුන්දරය. එය දුකේදීත් සැපේදීත් සුන්දරය.

'වායා ගේන්න..'

අසංක කියන්නටත් පෙර වායා ෆයිල් කවරයත් රැගෙන නැගිට්ටාය. ඇය පැමිණ මේසය ඉදිරිපිට පුටුවට බරවූයේ ඕනාවටත් වඩා රාජකාරී මුහුණක් මවාගෙනය. අසංකට ඒ මූහුණ එසේ දකින්නට

ආශාවක් නොවීය. ඔහුට දකින්නට ඕනා වූයේ එද රැයේ තිබූ ආදරය උතුරා ගලායන මුහුණය. එහෙත් මේ ඒ රාත්‍රිය නොවේ.

"මේ තියෙන්නේ සර් ලේඩීස් අයිටම්ස් වල ලිස්ට් එක."

වායා කොළයක් රැගෙන එහි පෙළට තිබූ ඇණවුම් තීරය දිගේ ඇඟිලි තුඩ ගෙන ගියාය. ඔහු බලා උන්නේ ඇණවුම් තීරය දෙස නොවේ. මෙරුන් පැහැයට හුරු පැහැයකින් හැඩ ගැන්වී තිබූ ඇගේ සුන්දර ඇඟිල්ල දෙසය. අසංක වායා බලාපොරොත්තු නොවූ මොහොතක ඒ ඇඟිල්ලට පෑන් තුඩින් ඇන්නේය. ඇය තොල්පට තදකරගෙන සිනාව සඟවා ගත්තාය.

ඔහු ඇණවුම් පත පරීක්ෂා කළේ ඕනාවටත් වඩා සෙමෙනි. ඇණවුම් පතේවූ කිසිවක් කෙරෙහි ඔහුගේ සිත ගියේ නැත. මේ සුවඳ ජීවිතයට ගලන මානයකදී හිත සන්සුන් කරගැනීම බෙහෙවින් දුෂ්කර යැයි ඔහු සිතුවේය.

ඔහු මේසය මතවූ සුදු හාප්ෂීට් එකක් රැගෙන ඇය දෙස මොහොතක් බලා උන්නේය. වායා ගැස්සී බිම බලාගත්තාය.

"ෆයිල් එක යටින් අත චූට්ටකට එවනවද.."

අසංක ඔහුගේ කැත සිංහල අකුරු වලින් එසේ ලියා ඇය වෙත පෑවාය. ඒ දුක වායාගේ හිත මහා අහිංසක ආදරණීය බවකින් පිරී ගියේය. ඇය පෑන රැගෙන ලියනදේ වමතින් වසාගත්තාය.

"මේ හිඟන කෙල්ලගේ අතට එච්චර ආසද.."

වායා කොළය ඔහුවෙත පාකර ෆයිල් කවරයට නෙත් යොමාගත්තාය.

"ආසාවට නෙවේ.. ආදරේට..."

ඔහු යළිත් එසේ ලියා ඇයට දුන්නේය.

"කවදහරි අත් අරින්න වෙන අතක් ආදරෙන් අල්ලගෙන වැඩක් නෑ සර්."

ඒ වටකුරු සිංහල අකුරු වල රැඳි දුක වේදනාව අසංක බාරගත්තේ ඊටත් වඩා වේදනාවෙනි.

"අල්ලගෙන ඉන්න පුළුවන්නම් ඔය අත ජීවිතේ පුරාම මං අල්ලගෙන ඉන්නවා කියලා බබාට හිතෙන්නැද්ද.."

WWW.EXPRESSLANKA.TK 274

කොළයේ එක පැත්තක් නිමාවිය. චායා එය අනිත් පැත්තට පෙරළුවාය.

"අත ඇරියත් කමක් නෑ සර්.. අත ඇරපු දවසේ ඉඳලා මං අතවත් නොහෝද ඉන්නම්.. ඔය අතේ සුවඳ තියාගෙන."

"ඔච්චර මට ආදරේ කරන්න එපා. මාව හොල්මන් වෙලා ඉන්නේ. උදේ රැවුල කපන්න ගිහිල්ලා ෂේවින් ක්‍රීම් කියලා සිග්නල් එක මූණේ ගාගත්තා. මට පිස්සු හැදිලා බබා."

"මං එච්චර ආදරේ කරන්න දන්නෑ.. හෝඩි පංතියට ගියේ පෙරේද.. මේ කාමරේදී.."

"ඒ වුනාට දන් ආදරේ කරන්නේ උපාධියක් ගත්ත ගාණට.."

"මෙහෙම ආදරේ කරලා වෙන්වෙන්න උනොත් හරි දුකයි සර්.."

"අනාගතය ගැන නොහිතා අපි ආදරේ කරමු."

"කැමැත්තක් සර්.."

"දන්වත් අතදනවද.."

චායා අමාරුවෙන් සිනාව නවතාගෙන ෆයිල් කවරය යටින් අත දමුවාය. ඇගේ දකුණත මතට වැටුනේ ඔහුගේ වමතය.

ඔහු මෘදු ලෙස ඔහුගේ අත්ලෙන් ඇගේ පිටි අත්ල පිරිමැද්දේය. දකුණතේ නහර දිගේ ගලා ආ මොකක්දෝ ගින්දරක් මුළු ගත පුරාම දිවගියේ මොහොතකිනි.

"හතට සළුසල ළඟ ඉන්න.. මං ගෙදරට බස්සන්නම්.."

ඔහු යළිත් කොළයක් ගෙන ලීවේය.

"එපා සර්.. මං බස් එකේ පුරුදු විදිහට යන්නම්... මං නිසා ප්‍රශ්න වල පැටලෙන්න එපා.. දුක් විඳින කොටස මට දීලා සර් යන්න."

ඇගේ දෙනෙත් අගක කඳුළක් මතුවිය. චායා එය අමාරුවෙන් දරාගත්තාය.

"පිස්සි.. මගේ අත රිදෙනවා.. මම ගෙදර ගිහිල්ලා හතට එන්නම්.."

චායා නිහඬ වූවාය. ඒ හිත රිදවන්නට තරම් ශක්තිමත් හිතක්

WWW.EXPRESSLANKA.TK 275

ඇය වෙත නොවීය.

"මට ජෙන්ට්ස් ඇයිටම්ස් ෂීට් එක දෙන්න වායා."

ඔහු නින්දකින් පිබිදුනාක් බඳුව කීවේය. වායා ඇය අත තිබූ ෆයිල් කවරය ඔහුට දී එතෙක් වේලා කුරුටු ගෑ සුදු කොළ කිහිපය දෙකට නවා සූරතේ තදකර ගත්තාය.

"හරි.. අරගෙන යන්න.."

ඔහු ළඟින් නැගිටිද්දී වායාට මහා ලෝබකමක් දැනුණි. ජීවිතය පුරාම ඔහු ළඟ ඉන්නට ඇත්නම්...

වායා අසංකගේ වාහනයට නැග්ගේ ගැහෙමිනි. වාහනයට ගොඩවී විනාඩි පහළොවක් පමණ වනතුරුත් ඇය වචනයක් හෝ කතා නොකළාය. රාත්‍රී අන්ධකාරය හයිලෙවල් පාරට නොදැනුනේ මහ දෙපස වූ කඩ සාප්පු වෙතින් ගලා ආ තියොන් විදුලි ධාරාවන් නිසාය. ඒ නිල් පැහැගත් විදුලි එළි වායාගේ මූහුණට වැටී වරින් වර වෙනස්ම චමත්කාරයක් ඇතිකළේය. ඔහු උත්තේ ඒවා රස විඳිමිනි.

අසංක වාහනය පැදවූයේ සෙමෙනි.

"ඇයි කතා කරන්නැත්තේ."

ඔහු කිරුළපන පසුවෙද්දී ඇසූවේය. වායා පැහැබර දෙනෙතින් ඔහුදෙස බැලුවාය.

"සර් මොනාහරි කියන්න.. මං අහගෙන ඉන්නම්.."

"ඇයි උදේ මාව දැකලා නැවතුනේ."

"දන්නැ.. නිකම්ම නැවතුනා."

වායා අවංක හඬකින් කීවාය.

"දු..ක..ද.."

WWW.EXPRESSLANKA.TK 276

ඔහු එසේ අසන්නට සිතා උන්නා නොවේ. ඉබේටම එසේ ඇසුණි.

'ම්.. හරි දුකයි.. ඒත්..'

'ඇයි..'

'මට ඒ දුකත් සැපක් සර්..'

'ඒකද දවල්ට කෑවෙවත් නැත්තේ.'

'මට චුට්ට චුට්ට දුක් විඳලා මේ දුක හුරු කරගන්න ඕන සර්.. නැත්නම් කවද හරි මාව පැලෙයි.'

ඔහුගේ ඇතුළු පටක උණුවී ගියාක් බඳුවිය.

'එච්චරම දුකනම් මම ඈත් වෙන්නම්.'

වායා කතා නොකළාය. ඔහු වමකින් ඒ ඇඟිලි තුඩු තම උකුලට ගත්තේය.

'වායා.. කියන්න බබා.. මම එහෙම කරන්නද.'

'දෙක වසරේ ළමයෙක්ට ඒ ලෙවල් ගාණක් දීලා උත්තර බලාපොරොත්තු වෙන්න එපා සර්...'

'කවුද දෙක වසරේ ළමයා.. ඔයාද.'

'ම්..'

'මගේ ආදරේ එච්චර අමාරු ප්‍රශ්නයක්ද..'

'තාමත් මට හිතාගන්න බෑ.. හිතටත් මොකක්ද වෙලාවගේ.'

'මටත් එහෙමයි..'

'මොනා වගේද සර්..'

'පාවෙනවා වගේ.'

වායා දෙතොල්පට තදකර සිනාසුනාය. තමාටත් දැනෙන්නේ එයම නොවේද.. ආදරය මන්මත් සිහිනයකි. ඒ සිහිනය සදාකාලික වීනම්..

'මට හීනයක් වගේ.. ඉක්මනට ඇහැරෙන්නත් ලෝබයි. දිගටම නිදගන්නත් දුකයි.. ඇහැරෙනවා කියල දන්නවනේ.. කවදහරි දවසක

WWW.EXPRESSLANKA.TK 

මං හීතෙන් ඩොක්ගාලා වැටෙනවා. මට හරි බයයි සර්.. එදට මගේ කැලි ටික තමයි මගේ දුප්පත් අම්මට එකතු කරන්න වෙන්නේ.'

'මං දුප්පත් කොල්ලෙක් උනානම් කියලා මට දැන් හිතෙනවා.'

'අපේ ජීවිත වල තියෙන්නෙ නොලැබීම් ටිකක් විතරයි සර්.. හැමදම උනේ ඒ නොලැබීම් ගොඩට අලුතෙන් එකක් එකතු වෙන එක විතරයි.'

ඔහු හයිලෙවල් පාර ආසන්නයේ තිබූ කුඩා කඩයක් ළඟ වාහනය නැවැත්වීය.

'මට බඩගිනියි.. මොනාහරි කීලායත්.. මොනාද බොන්නේ.'

'සර් බොන දෙයක්.'

'බියර් එකක්.'

ඔහු සිනාසී ඇසුවේය. වායා බිම බලා සිනාසුනාය. ඔහු වාහනයේ නලාව හඬවා සේවකයෙකු කැඳවා සිසිල් බීම දෙකක් ඇණවුම් කළේය.

'එකක් ඇති සර්.. මට චුට්ටක් දෙන්න.'

'එහෙනම් අලියා ක්‍රීම් සෝඩා එකක්.'

'සර් ආස ක්‍රීම් සෝඩා වලටද.'

'ඔව්. ඇයි බබා ආස නැද්ද..'

'මාත් ආස ඒකට..'

'මං ආස මේකට..'

ඔහු ඇගේ දෙතොල් වලට අත තබා කීවේය. වායා නෙත් පියාගත්තාය.

'දැන් ඒවල හැම වෙලාවෙම කඳුළු.. ඒත් මං අඬන්න ආසයි.'

'මං නිසා අඬන්න එපා.'

වායා ඇඟිලිකරු පටලවා ඔහු වෙත හැරුනාය.

'උදෙන්ම කපල් එක දැක්කා හරි ලස්සනයි.. මේ වහන්තරාව ගලවලා දන්න සර්..'

වායාට ඇඬෙන්නට ආවේය. ඇය ඇඳුම් වාවාගත්තාය. අසංක

ක්‍රීම් සෝඩා බෝතලය අත තබාගෙන ඒ කඳුළු වෙතට නෙත් ඔබා උන්නේය.

'මගේ ජීවිතේ රිටන් වෙච්ච චෙක් එකක් වගේ චායා. ලොකු ගාණක් දලා තියෙනවා. ඒත් රිටන්නේ.. වටිනාකමක් නෑ.'

'තව පාරක් එකවුන්ට් එකට දලා බලන්න සර්.. එක පාරක් රිටන් වෙන චෙක් දෙවෙනි පාර පාස් වෙනවා.'

'චායා එහෙම හිතනවද..'

'ම්..'

'ඒ එකවුන්ට් එක ක්ලෝස් බබා.. දලා වැඩක් නෑ.'

'මගේ තාත්තා උන්නානම් අපිටත් සල්ලි තිබුනානම් මාත් මිය් වගේ තමා.. අපි මේක නතර කරමු සර්.. මේක පවක්.. ලොකු පවක්.. මට උදේ මැඩම්ගේ මූණ බලන්න බෑ.. මට ඇඩුනා.'

අසංක කිසිවක් නොකියා බීම බටය ඇගේ මුවට ළං කළේය.

'සර් බීලා දෙන්න.'

'බොන්න..'

ඔහු ඇය කියූදේ ගණනකට නොගෙන කීවේය. සීතල ක්‍රීම් සෝඩා උගුර උගුරින් පහළට යද්දී උණුවිය. පපුවේ ඒ තරමට ගින්දරය.

'අනිද්ද මම නුවර යනවා.'

'අ..නේ..'

ඇයට ඉබේම කියැවිණ. අසංක ආගාවෙන් ඇය දෙස බලා උන්නේය.

'නොගිහින් බෑ බබා.. නාලකගේ ෂෝ එකක්. මං ඌට පොරොන්දු වෙලා තිබුනේ ඌ එක්ක යන්න එනවා කියලා. මට පොරොන්දු කඩ කරන්න අමාරුයි.'

ඔහු හැඟීම්බරව කීවේය. අසංක බලා උන්නේය. ඒ වචන ඇයටත් කළින් ඇගේ පපුව ලියාගත්තේය.

'ඒත් සර්.. ජීවිතේ එක පොරොන්දුවක් සර්ට ඉටු කරන්න බෑ

නේද.'

'එක පොරොන්දුවක් ඉටු කරන්න එක ආත්මයක් විතරක් නෙවී බබා තියෙන්නේ.'

'මං ආත්ම කීයක් බලා ඉන්න ඕනද..'

ඒ වචන ජීවිතය ඉදිරියේ අසරණවූ යුවතියකගේය. ආදරය ඉදිරිපස වඩාත් අසරණවූ පෙම්වතියකගේය.

'මං නුවර යන්නේ ජීවිතේ ගැන තීරණයක් ගන්න වායා.. මට හිතන්න ඕන. හිත නිදහස් නෑ.'

'මංද හිත අවුල් කළේ...'

'නෑ. ඔයා මට හිතන්න බලකළා. මට මේ අත්දෙක ඕන බබා. ඇත්තටම ඕන.. ඔයා නොහිතන ජීවිතයක් මං මේ අත්දෙකෙන් පතනවා රත්තරන්.. ඔයා දන්නෑ.. එක තත්පරයක් ගෙවෙන්නෑ ඔයා ගැන නොහිතා. ඇයි මගේ ආදරේ විශ්වාස නැත්තේ..'

අසංක වායාගේ දේනම රැගෙන කීවේය. ඒ දේනේ මුහුණ හොවාගෙන අඬන්නට ඔහුට සිත්විය.

'විශ්වාසයි සර්.. ඕනාවටත් වඩා විශ්වාසයි. මේ කෙල්ල එළදෙන වගේ මේ එන්නේ ඒකනේ.. ඒත් සර් මාව එච්චර වටින්නෑ..'

'වටිනවා මැණික.. ගොඩාක් වටිනවා.'

ඔහු කෑ ගැසුවේය. වායා පුදුමවී බලා උන්නාය.

'අද දවල් මට ඇවිල්ලා ඔයාව බදගෙන ඉඹින්න හිතුනා. හරි අමාරුවෙන් හිත පාලනය කරගත්තේ.'

'අනේ.. ඇයි ඇස් රතුවෙලා.'

වායාට ඇඬුනි. ඔහු මෙපමණටම ආදරය කරනවා නම්.. දුක්විඳින්නට හෝ මේ ගමන යායුතු නොවේද.. ආදරයේ බිම්පලස ඔහු වෙනුවෙන් සදහටම එලාතැබිය යුතු නොවේද...

'මගෙන් එච්චර දිග අනාගතයක් පතනවද...'

ඇය වෙව්ලා ගිය හඬින් ඇසුවාය.

WWW.EXPRESSLANKA.TK 280

'ඒ අනාගතයට කෙළවරක් නෑ වායා..'

'මං.. මම මොනවද කරන්න ඕන.'

වායා ඇසුවේ අසරණවය.

'දැනට මට ඉන්න ඔය පපුවේ පොඩි ඉඩක් දෙන්න.'

'සර් කිව්වත් නැතත් මං මගේ මුළු පපුවම සර්ට දීලා ඉවරයි.. කැමති කාලයක් ඉඳලා යන්න. මේ දුප්පත් කෙල්ලට කරන්න පුළුවන් එච්චරයි.'

'හැමදම මං ඉන්නද..'

'මං පව් කරන්න බයයි සර්.. සර්රුයි මිසුයි හෙට අනින්දම බඳිනවා. මං හොඳටම ඒක දන්නවා. සර්ට බෑ මාව බඳින්න. ඒත් කවදහරි මම ඒ දුක විඳවගන්නම්.'

'මගේ දෛවය මා එක්ක සෙල්ලම් කරනවා වායා.'

'මේ පපුවට ගත්තේ ගින්දර කියලා මාත් දන්නවා සර්...'

අසංක වායාගේ හිස තම වම් උරහිසට වාරු කරගත්තේය. ඇගේ කඳුළින් ඔහුගේ කමිසය තෙත්විය.

'වෙලාවකට හිතෙනවා මෙහෙමම පණ යනවනම් කියලා.'

'හැමදමත් අඩ අඩ වෙන්වෙන්නද අපිට වෙන්නේ වායා.'

'කියනව නම් හිනාවෙලා ඉන්නම්.'

'බොරුවට..'

'නෑ ඇත්තටම.. හිනාවෙන්න බැරුව නෙමේ.. අඩන්න වෙන නිසා හිනාවෙන්න බයයි සර්..'

අසංක සෙමෙන් සෙමෙන් වාහනය හයිලෙවල් පාරදිගේ ධාවනය කළේය. ඔහුගේ වමත තිබුනේ ඇගේ උකුල මතය.

'උදේ ඇඳන් ගිය කොට්ටු ෂර්ට් එකහරි ලස්සනයි.'

වායා මිමිණුවාය. සියල්ල අමතක වී මොහොතකට ඇගේ සිත බොළඳ විය.

'හැමදේකම ලස්සන මට පේන්නේ දැන් වායා.'

WWW.EXPRESSLANKA.TK 281

"දැන් ගිහිල්ලා කල්පනා කර කර ඉන්නෙපා. දවසෙම බඩගින්නේ නේද.. කාලා නිදාගන්න."

"මෙහෙම ඉඳලා ගියාම ඔයාට නින්ද යනවද බබා.."

"නෑ සර්.. නිදාගන්න ලෝබයි..."

"මාව මෙතනින් බස්සන්න."

වායා කීවාය. ඔහු වාහනය නතර කර ඒ මුහුණ දෙස බලාගත්වනම බලා උන්නේය. දෙදෙනාගේ අත් එකට තදවූයේ නොදැනීමය.

"අඬ අඬා ගියා කියන්නෙපා ඔන්න.. මේන් හිනාවුනා. ඇතිද.."

"මදි.."

ඔහු සිනාසී කීවේය.

"අදට ඇති.. මං බහිනවා.."

එසේ කීවද ඇය බැස්සේ නැත. දෙපා පණ නැතිවී හිරිවැටී ඇති සෙයකි.

"ය..න්..න..ං.. සා..දු.."

ඇය වාහනයේ අසුන මත ඉඳගෙනම ඔහුගේ දෙපා අල්ලා වැඳ බැස්සාය. ප්‍රේමයට නිම්හිම් නොවේයැයි කව්දේ කියා ඇත්තේය. එය සැබෑය. අසංක වාහනය හරවා ගත්තේ වායා අතුරු පාරට හැරුනායින් පසුය.

වායා වාහනයේ ඉතිරි කර ගිය සුවඳ වඩාත් මෘදුව විඳවාගන්නට මෙන් අසංක වායුසමීකරණයේ අගය වැඩි කළේය. විලවුන් සුවඳ අධික සීතලේදී ආරක්ෂාවෙයි.

☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆

"උඹලව පොපියුලර් කරන්න අපිට විඳින්න වෙලා තියෙන දුකක්. අම්මට වැඳලා නිවාඩුවක් ඉල්ලගත්තේ."

අසංක පාන්දර පහට පමණ නාලකව නුගේගොඩින් වාහනයට නංවා ගනිද්දී කීවේය. නාලක සිනාසුනේ අහිංසක ලෙසිනි.

WWW.EXPRESSLANKA.TK 282

'උඹට වදයක් නම් මචං මාව පිටකොටුවෙන් දපන්.. මම ඉන්ටර් සිටි එකක නුවර යන්නම්.'

'හරකා.. විහිළුවට බං කිව්වේ. මටත් මළුව ටිකක් නිදහස් කරගන්න ඕන.'

'ඒකට ඉතින් නුවර ගිහිල්ලා හරියන්නෑනේ.. ගොඩගම පැත්තට පලයන්.'

අසංක සිනාසුනේ මේ පාන්දර වායාව සිහිවී හදවතට නැඟෙන පැහැබර සිතුවිලි නිසාය.

'උඹ හරි ලස්සන වෙලා අසංක..'

නාලක කියුවේ සැබෑවකි. අසංකගේ මුහුණ මේ දින දෙක තුනට සුන්දරවී තිබුණි. ප්‍රේමයේ සුහුඹුල් පැළ තවාන් කළ මුහුණක් සුන්දර නොවන්නේ නම් එය පුදුමයකි.

'උඹ ලව් කරනවා බලන්නත් ආසයි.'

'ඇයි මට ලව් කරන්න බැරිද.'

ඔහු ඇසුවේ එද හර්ෂණී කියුදේ සිහිවූ නිසාය.

'ආදරේ මවලා තියෙන්නේ උඹ වගේ කොල්ලෙක්ට වායා වගේ කෙල්ලෙක්ට.. අපිව මවලා තියෙන්නේ හැමදම ලව් එකට ඩෝල්කි ගහන්න.'

නාලක මහ හඬින් සිනාසී කීවේය. ඉන්පසු බොහෝ වේලාවක් යනතුරු අසංක කතාකළේ නැත. ඔහුට කල්පනා කරන්නට ඉඩදී නාලක ඔහු අතවූ සංගීත ප්‍රස්තාර පාන්දර අරුණැල්ලෙන් පරීක්‍ෂා කළේය.

'උඹ සිංදුව ලියලා තනුව දනවද.. නැත්නම් තනුව දලා ඒකට සිංදුව ලියනවද..'

අසංක හිටිවනම ඇසුවේය. නාලකව ඇසුරු කළ පසු ඔහුත් සංගීතය ගැන යම් යම් දේ දැන උගත්තේය.

'ට්‍යූන් එකට පද ලියන එක කෑතිමයි මචං., එතකොට සිංදුව ලස්සන නැහැ. මං ඉස්සෙල්ලා සිංදුව ලියනවා. පස්සෙ ඒකට තනුව

WWW.EXPRESSLANKA.TK 283

දනවා.. ඇයි උඹ එහෙම ඇහුවේ'

'නෑ මචං.. ජීවිතෙත් වෙන්න ඕන එහෙම. ඒත් මගේ ජීවිතේ වේලාසනම තනුව දලා.. දැන් තනුවට පද ගලපන්න බැරුව මම තටමනවා. වේලාසන මට සිංදුව ලියාගන්න තිබුනා.'

තම ආදරණීය මිතුරා ආදරයත් සමගම ජීවිතයෙන් පරිණතව ඇතැයි නාලකට සිතුණි. චායා හමුවන්නට ප්‍රථම ඔහුට මේ පැහැබර ජීවිත දර්ශනය තිබුනේ නැත.

'කවුරුහරි දාපු ට්‍යූන් එකට වචන දාන එකහරි අමාරුයි තමයි අසංක.. එහෙම සිංදුවක් ලස්සන නෑ.. කෘතිමයි.'

'එහෙම වුනාම මොනවද නාලක උඹ නම් කරන්නේ.'

අසංක අසරණව ඇසුවේය.

'එක්කෝ මචං ඔය තනුව අයින් කරලා අලුත්ම රචනාවක් ලියාගෙන ඒකට තනුවක් හදගන්න ඕනේ.. නැත්නම්...'

නාලක කියන්නට ගියදේ ගිලගෙන අසංක දෙස බැලුවේය.

'නැත්නම්.. ඉතින් කියපන්..'

'නැත්නම් ඉතින් ඔය තනුවට ඔය මොනාහරි වචන ටිකක් දලා ජීවිතේ පුරාම කිය කියා ඉන්න ඕන..'

'උඹනම් මොනවද කරන්නේ.'

'මට මචං තනුවකුත් නෑ.. පද රචනාවකුත් නෑ.. කවදහරි ඉතින් ඔය දුප්පත් රචනාවක් හොයාගෙන නිස්කලංකේ එකම තනුවක් දගන්නවා. මට ඒ ඇති. උඹට එහෙම නෙවේනේ මචං.. උඹට එක පැත්තක තනුවක් තියෙනවා. නවත් පැත්තක රචනාවක් තියෙනවා.'

'කවදාවත් තනුවට මේ රචනාව ගැළපෙන්නෑ. නේද.. මම මොනාවද බං කරන්න ඕනේ.'

'මට උඹේ ජීවිතේ මියුසික් ඩිරෙක්ටර් වෙන්න බැහැ මචං.. ඒක උඹම [illegible] එකක්..'

WWW.EXPRESSLANKA.TK 284

අසංක වඩාත් විවෘත ලෙස නාලක දෙස බැලුවේය.

'කියපන්..'

'උඹට වඩා මම සංගීතයත් දන්නවා. ජීවිතයත් දන්නවා. ඒක නිසයි මං කියන්නේ.. වායා නියම පද රචනාවක්.. සමහර සිංදු තියෙනවා මෙලඩියක් අමුතුවෙන් ඕන නෑ. ඒක ඇතුලෙම මෙලඩි එක තියෙනවා. වායා ඒ වගේ. කියද්දි නිකම්ම මෙලඩි එක පපුවට එනවා. හරියට සේකරගේ කවියක් වගේ.'

අසංකගේ පපුව මොහොතකට ආඩම්බරයෙන් පිරුණි.

'උඹ කියන්නේ මම හොඳ මියුසික් ඩිරෙක්ටර් කෙනෙක් කියලද.. හොදම රචනාවක් තෝරා ගත්ත..'

නාලක සිනාසුනේය. ඒ ඔහුට නොවේ. ඔහුගේ දෛවයටය.

'ඒ ගැන කතා දෙකක් නෑ.. ඒත් මචං.. උඹ රචනාවක් හොයාගන්න ඕන උඹේ ටියුන් එකට නේද..'

අසංක නැතිගත් විලාසයෙන් නුවර පාර අද්දර වූ ආප්ප කඩයක් සමීපයේ වාහනය නතර කළේය.

'මට ජීවිතේ ගැන තීරණයක් ගන්න ඕන නාලක.. මං උඹ එක්ක නුවර ආවේ ඒකට.. මට හිතන්න ඕන.'

අසංකට දියයුතු පිළිතුර කුමක්දැයි නාලකට සිතාගත නොහැක. ඔහු බලාඋන්නේ අසරණවය.

'ජීවිතේම අවුල් කරගෙන තීරණගන්න බෑ පුතේ..'

'මට වායා නැතුව ජීවත් වෙන්න බෑ නාලක.'

'අපි අද රෑට කතා කරමු.. ආප්පයක් කාලා ප්ලේන්ටියක් ගහලා යමුද..'

'ගහමු..'

අසංක සුක්කානමට අතින් ගසා වාහනය ක්‍රියා විරහිත කොට ඉන් බැස්සේය.

WWW.EXPRESSLANKA.TK 285

# 29

පහළ ප්‍රදර්ශනාගාරයේ ඇවිදිමින් ඇඳුම් පරීක්ෂා කරද්දී රණතුංග මහත්මියට දෙපා පණ නැතිවී මුළු ඇඟම කඩා වැටෙන්නාක්මෙන් දැනුණි. ඇය සේවිකාවන්ට කිසිවක් නොපෙන්වා අමාරුව තද කරගෙන පියගැට පෙළ අමාරුවෙන් නැග එන්නට උත්සාහ ගත්තාය. අඩි දහයක් දොළහක් නැග එද්දී ඇගේ පපුව හිරවී ගතම හිරිවැටී යන්නට විය. රණතුංග මහත්මිය පියගැට පෙළේ යකඩ බඳ අල්ලාගත්තේ අමාරුවෙනි.

'චා..යා..'

රණතුංග මහත්මිය පියගැට පෙළ මැද ඇද වැටුනේ චායා බලා ඉදිද්දීමය. චායාත් තිලංකාත් දුවවිත් ඇයව අල්ලා ගත්තේ කෑගසමිනි.

'අ..නේ.. මැඩම්..'

යුවතියන් දෙදෙනාගේම දෙනෙත් වලින් කඳුළු පැන්නේ එකවිටමය. ඔවුන්ගේ කෑ ගැසීමට මුළු සේවක මණ්ඩලයම එතනට දුවගෙන ආවෝය.

'මැ..ඩ..ම්.. කතා කරන්න රත්තරං මැඩම්..'

චායා කෑගැසුවාය. රණතුංග මහත්මිය උන්නේ පියැගට පෙළේ ඉඳගෙන උන් චායාගේ උකුලේය.

'අනේ තිලංකා.. මැඩම් කතා කරන්නෑ. මැඩම්..'

චායා ඇගේ දෙකම්මුල් වලට මෘදුව ගසා කතා කළාය.

'ඉක්මණට වෑන් එක ගන්න.. මැඩම්ට අමාරුයි. ඉක්මන් කරන්න කිත්සිරි..'

රණතුංග මහත්මියව දෙපයින් වාරු කරගත්තේ චායාත් තිලංකාත්ය.

'අනුෂා ෂොප් එක වහන්න. කවුරු හරි සර්ගේ සෙල් එකට

WWW.EXPRESSLANKA.TK 286

කෝල් කරන්න.'

වායා කඳුළු පිරි නෙතින් කීවාය. වාහනය වේගයෙන් නවලෝක රෝහල කරා යද්දී වායාත් නිලංකාත් කඳුළු පොකුරු ඇස්මත තබාගෙන රණතුංග මහත්මියගේ හිස අතගෑවෝය. යුවතියන් දෙදෙනාම උන්නේ අතිශයින් බියට පත්වය.

'අනේ නිලංකා.. මැඩම්ට ඇයි මෙහෙම උනේ.. උදේ හොඳට උන්නනේ.. බලන්න.'

'කිත්සිරි ඉක්මන් කරන්න.'

නිලංකා කෑගැසුවාය.

'සරුත් නෑ වෙලාවට.. අපි මොකද දන් කරන්නේ.'

'ඉස්සෙල්ලා මැඩම්ව හොස්පිට්ල් එකට අරගෙන යන්කෝ..'

වාහනය ගංගාරාම පන්සල අසලින් දමද්දී වායා දෑතම එක්කොට වැන්දය. මගේ ජීවිතේ හරි අරගෙන මැඩම්ව බේරලා දෙන්න. ඇගේ පපුවේ වූයේ එවන් පැතුමකි.

වාහනය නවලෝක රෝහලේ දෙරකඩට ගැනුණි. රෝහල් හදිසි කාර්යමණ්ඩලයේ හෙදියක පැමිණ ඇයව හදිසි සත්කාර ඒකකයට ගත්තේය. නිලංකාත් වායාත් කිත්සිරිත් රෝහල් කොරිඩෝවේ තනිවිය.

'වායා.. අනේ කෙල්ලේ සර්ට කතාකරන්න.'

මේ පුවත ඔහුට කියන්නේ කෙලෙසදැයි වායා සිතුවාය.

'හදිස්සියේ කොළඹ එන්න ගිහිල්ලා අනතුරක් වෙයිද..'

'එහෙම නෑ.. ඔයා කියන්න පරිස්සමින් එන්න කියලා. අතන බොක්ස් එකක් තියෙනවා. ආ.. රුපියල් දෙකේ කාසි තුනක්.'

වායා ගැහෙමින් කාසි තුන දමා අයංකගේ සෙලියුලර් දුරකථන අංකය ගත්තාය. තුන් වතාවක්ම දුරකථන මාර්ග අවහිරතා නිසා ඇමතුම සම්බන්ධ නොවිණි. ඇගේ පපුව කඩා ඉහිරුණි. ඉඳලා ඉඳලා අදම නුවර ගියානේ.. ඇය වේදනාවෙන් සිතුවාය.

අවසන් වතාවෙදි දුරකථනය නාදවිය. වායාගේ පපුව ගැහෙන්නට විය.

'ස..ර්.. මම..'

වායා 'හඬමින්ම කතා කළාය.

"ඇයි මැණිකෙ.. ඇයි."

ඔහුගේ වචන හදවතේ තුනීම පටක පවා හඬවන්නට විය.

"කලබල වෙන්නෙපා රත්තරං.. මැඩම්ට අසනීප වුනා ෂොප් එකේදි.. දැන් නවලෝකෙ ඉඳලා මේ කතාකරන්නේ."

"අම්මට මොකද බබා උනේ."

"දන්නෑ දෙයියනේ.. එක පාර පහළ ඉඳලා උඩට එද්දි පපුව අල්ලගෙන කලන්තේ දලා වැටුනා. මායි තිලංකයි වෑන් එකේ නවලෝකෙට අරගෙන ආවා."

"හරි.. ඔයා හොස්පිට්ල් එකේම ඉන්න.. මං එනවා."

"අනේ පරිස්සමින් රත්තරං.. කලබල වෙලා අනතුරක් වෙයි."

"හරි මැණිකෙ. මං එනවා."

අසංක වාහනය එහෙමම නතර කළේය. ඔහු උන්නේ කඩුගන්නාව කන්ද නගිමිනි.

"මචං.. අම්මට සනීප නැතිවෙලා නවලෝකෙට ගෙනිහිල්ලා. උඹ මෙතන ඉඳලා බස් එකේ පලයන්.. මං කොළඹ යනවා."

නාලක අසංකගේ උරහිසට අතක් තැබුවේය.

"උඹව තනියම යවන්න බෑ.. මාත් එනවා."

"එතකොට ෂෝ එක."

"කෝල් එකක්දීලා මං කැන්සල්කරන්නම්.. ඒකෙ අවුලක් නෑ. ෂෝ එකට වඩා මට උඹවයි අම්මවයි වටිනවා.. හරවපන්.."

අසංක කඩුගන්නාව වංගුව ළඟදීම වාහනය යූ හැරවුමක් දමා හරවා ගත්තේය. ඔහු වාහනයේ වේගය වැඩි කළේ බලා ඉඳිද්දීමය.

"පරිස්සමින් අසංක.."

"අම්මට අමාරුද දන්නෑ මචං.."

අසංකගේ දෙනෙත් අග බොඳවී ගියේ බලා ඉඳිද්දීමය.

අසංකත් නාලකත් රැගත් වාහනය කඩුගන්නාව පහළ වංගු දිගේ පහළට ඇදුණේ වේගයෙනි. ඒ එන අතරතුර ඔහුට බොහෝ දේ

WWW.EXPRESSLANKA.TK 288

සිහිවිය. හිටි හැටියේම අම්මා අසනීප වූයේ ඇයි.. ඔහු දෙස අනේ සිතුවේය. අම්මා හිතනවාටත් වඩා වේගයෙන් වියපත්ව ඇතැයි අසංක හිතුවේ වේදනාවෙනි.

'අම්මා මෙච්චර අසනීප වෙන්න තරම් ලෙඩක් තිබුනේ නැනේ අසංක..'

නාලක පුදුමයෙන් ඇසුවේය.

'ලෙඩ තිබුනට කියන්නෑ නාලක.. මහ පුදුම ගෑණියෙක්.. කොච්චර කිව්වත් වැඩමයි.. හාට් ඉෆෙක්ට් එකක් වූට්ට වූට්ට තිබ්බා. ඒක වැඩිවෙන්න ඇති. ඇයි වැඩමනේ..'

'අම්මා බලන් ඉන්නෙ ඒ වැඩවලින් නිදහස් වෙන්න.'

නාලක කීවේ කල්පනාබරවය.

'කොහොමද..'

'උඹව හර්ෂණීට බන්දලා දීලා.. බිස්නස් ඔක්කොමත් උඹට දීලා නිදහසේ ඉන්න.'

'උඹ හිතනවද මායි හර්ෂණීයි මැරි කළාට පස්සේ අම්මට නිදහසේ ඉන්න ලැබෙයි කියලා.'

'දෛවය ගැන මට වේලාසන කියන්න අමාරුයි අසංක..'

'උඹ කියන්නේ මේ හැමදෙයක්ම දෛවයට බාරදීලා මට නිකම් ඉන්න කියලද..'

'නෑ.. මට හිතෙනවා හෙට අනිද්දම උඹට ලොකු තීරණයක් ගන්න වෙනවා.'

'ඇ..යි.. ඒ..'

අසංක උගුරෙන් මෙන් ඇසුවේය.

'ජීවිතේ එහෙම තමයි අසංක..'

'එක අතකට මට ගන්න තීරණයක් නෑ නාලක.. හිතින් ගන්න තියෙන තීරණේ මම අරගෙන ඉවරයි. දෛවයට මට දෙන්න පුළුවන් තීරණේ දීලා ඉවරයි..'

WWW.EXPRESSLANKA.TK 289

'ඒ දෙකින් එක තීරණයක් උඹට ගන්න වෙනවා.'

'ඒවා හිතද්දී වාහනේ පල්ලමකට අල්ලන්න හිතෙනවා නාලක..'

'පිස්සෙක් නොවී කෙළින් බලාගෙන වාහනේ ඩ්‍රයිව් කරපන්..

ඔක්කොටම කළින් ගිහිල්ලා ඇන්ට්ට කොහොමද බලමු..'

නුවර යන්නට පිටත්වූයේ නිස්කලංකයේ ජීවිතය ගැන සිතා තීරණයක් ගනු පිණිසය. හදවත කවද තීරණයක් ගන්නට බලාඋන්නාද කියා ඔහු සිතුවේය. දෛවය නුවර නගර සීමාවටවත් තමාට එන්නට නුදුන්නේ ඒ ගන්නට ගිය තීරණය වළක්වාලන්නටද..

අසංකට මොහොතකට කළින් ජංගම දුරකථනයෙන් ඇසුණු වායාගේ හඬ සිහිවිය. ඒ ඇමතුම ආවේ තමාගේම හදවතින් යැයි සිතෙනා තරමට ඒ හඬ ඔහුව නිවා සනසාලීය. ආදරය යනු රුකබලා ගැනීම නම් ඒ වචන වල ඒ හැඟීම පොකුරු පිටින් තිබුණි. ජීවිතය ගඟක් නම් ගැලිය යුත්තේ එවන් නිම්නයක් හරහාය. එහෙත් දෛවය තම ජීවිත නදිය ඒ සඳහරින නිම්නයෙන් ඈතට ගෙන යන සෙයක් ඔහුට දැනෙයි. ඒ හැඟීමෙන් අසංක දැවීගියේය.

ළඟකදී සිට සිතුවිල්ලක් උපදින නූපදින හැමවිටකම හදවත දැවීගෙන යන්නේ ඇයිදැයි අසංකට තේරුමක් නැත. සමහරවිට හදවතේ වැල් නිසිලෙස වැඩ කරන්නට ගත්තේ වායා හමුවූ පසුව වන්නට ඇත. මෙතුවක් කලක් හදවත තිබෙන්නට ඇත්තේ ක්‍රියා විරහිතව පැත්තකට දමාය.

නාලක කියූසේම ජීවිතය ගැන ඉක්මන් තීරණයක් ගන්නට දෛවය ඔහුට බල කරන සෙයක් අසංකට දැනුණි. එතැනට යන්නට ඔහු තුළවූයේ බලවත් නොකැමැත්තකි.

'සමහරවිට උඹට උඹ නොහිතන ඉක්මනට හර්ෂණීව බඳින්න වෙයි.'

නාලක තිට්ටඹුව පසුවෙද්දී කීවේය.

'මටත් එහෙම හිතෙනවා නාලක.. මොනා කරන්නද කියලා මටම තේරුමක් නෑ.'

'උඹේ අනාගතේ ගැන ගන්න තීරණේදී ගොඩාක් වෙලාවට

උඹට ඡන්දයක් නැතිවෙයි.'

නාලකගේ වචන තුනී ඇල්පෙනිති තුඩවල් මෙන් ඔහුට වැද දුන්නේය.

'මට මං ගැන දුක නෑ නාලක. මට දුක අර කෙල්ල ගැන.'

'ඔව්.. ඒ කෙල්ලට හැමදාම දුකයි.. සමහරවිට උඹට දුක් විඳින්න වෙන්නේ ටික කාලයක් ගිහිල්ලා.'

'උඹ මාව බය කරනවද මචං..'

අසංක අසරණව සිනාසී ඇසුවේය.

'නෑ.. උඹව දුකට ප්‍රැක්ටිස් කරනවා. දුක උනත් ටිකක් විඳින්න පුරුදු වෙලා විඳපන්..'

'අම්මව අසනීප වුන වෙලාවේ උඹට මේ ඔක්කොම හිතෙන්නේ ඇයි...'

'ඇන්ටි හොඳ සනීපයකින් ඉන්නවා නම් දැනටමත් ඒ තීරණේ අරගෙන ඇති. හිත හරිගස්සගෙන පලයන්.'

'එක්කෙනෙක් හිත හරිගස්සන කොට අනිත් කෙනා ඇවිත් අවුල් කරනවා නාලක.'

'ජීවිතේ එහෙම තමයි මස්සිනා.'

අසංක බැලුම්මහරින් වාහනය හරවනා තුරාම වචනයක් වත් කතා නොකළේය. ජීවිතයේ අඳුරු පැය කිහිපයක තනිවූ තම මිතුරාගේ මානසික කැළඹීම නාලක අපූරුවට තේරුම් ගත්තේය.

☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆☆

වායාත් නිලංකාත් නවලෝක රෝහලේ බාහිර රෝගීන්ට වාඩිවීම සඳහා දමා තිබූ අසුන් දෙකකට බරවී ඔහේ බලා උන්නෝය. විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඊ.සී.ජී අංශයට ගත් රණතුංග මහත්මියව පසුව විශේෂ ප්‍රතිකාර කිහිපයක් සඳහා හෘද රෝග ඒකකයට මාරු කර යවනු ලැබීය.

වායා වරින් වර නැගිට නවලෝක රෝහලේ ඉදිරිපස වාහන

WWW.EXPRESSLANKA.TK 291

අංගනය දෙස බලා උන්නාය. ඇගේ දෙනෙත් සෙව්වේ ඒ රුවය.. 'දූන් පිජ්සා වගේ කඩාගෙන එනවා ඇති. අපරාදේ කිව්වේ..' චායා වේදනාබරව සිතුවාය.

'ඉක්මනට එන්න ගිහිල්ලා කරදරයක් කරගත්තද දන්නෙත් නෑ.'

චායා දෙරකඩ දෙස විනාඩි දහයක් පමණ බලා සිට නැවතත් අසූන වෙතට විත් කීවාය. නිලංකා ඇගේ අතින් අල්ලා ඇයව ඉන්දවීය.

'සර් ඩූටි බබෙක් නෙවීනේ චායා.. ඉක්මනට එයි.. බයවෙන්න එපා.'

චායාට හීල්ලින. එක අතකට මේ සියළු ලෝබකම් කෙදිනක හෝ අහිමිවී යන මුහුණක් වෙනුවෙන් නොවේද..

'නිලංකා..'

'ඇයි කෙල්ලේ..'

'මට තව රුපියලේ කාසි දෙකක් දෙනවද..'

'උඹට බයද..'

'අනේ දෙන්න..'

නිලංකා ඇගේ ගමන් මල්ලේ තිබූ මාරු කාසි වලින් රුපියලේ කාසි දෙකක් පමණක් ගෙන ඇය අත තැබුවාය. චායා රෝහලේ පිළිගැනීමේ කවුන්ටරය අසළට වන්නට තිබූ දුරකථන පෙට්ටියට කාසි දෙකම දැමුවාය.

දුරකථනය වඩාත් පැහැදිලිව නාදවෙනු ඇසී ඇගේ ළයට සැහැල්ලුවක් දැනුණි.

'කොහෙද ඉන්නේ.'

ඇය ඇඩුම්බරව ඇසුවාය.

'මම මේ ළඟ මැණිකා.. තව විනාඩි තිහෙන් ඔතන.. අම්මට කොහොමද..'

'ඇතුළට ගත්තා. ස්පෙෂල් ට්‍රීට්මන්ට් එකකට කියලා උඩට ගෙනිච්චා.'

'හරි.. බබා ඉන්න.. මං එනවා.'

WWW.EXPRESSLANKA.TK 292

වායා දුරකථනය තබා හුල්ලමින් පැමිණ අසුන් ගත්තාය. රෝහල් කොරිඩෝව දිගේ එන රුව දැක ඇගේ තුන් හිතම කඩාවැටුණි. වායා නිලංකාගේ අත මත සුරත තැබුවාය.

හර්ෂණී ඇගේ පියාත් සමගම පැමිණ වායාත් නිලංකාත් උන් තැන නැවතුනෝය. වායා හර්ෂණී දෙස වරක් බලා බිම බලාගත්තාය. ඇගේ සිතට දැනුනේ වරදකාරී කරදරකාරී හැඟීමකි.

'අක්කට කොහොමද ළමයිනේ.'

හර්ෂණීගේ පියා ශෝකයෙන් ඇසුවේය. ඔහු පමණටත් වඩා කාරුණික යැයි වායාට සිතුණි.

'ඕ.පී.ඩී එකේ චෙක් කරලා ඇතුළට ගත්තා. තවම වෝඩ් එකට දීලා නෑ. ලොකු සර් දැනගත්තේ කොහොමද..'

නිලංකා ඇසුවාය. වායා ඔහුදෙසම බලා හිඳ නොහිතූ මොහොතක හර්ෂණී දෙස බැලුවාය. ඇගේ නෙත් යොමුව තිබුනේ වායා වෙතමය. ඒ බැල්මේ අසාමාන්‍ය බවට ඇගේ ළය පත්තුවීගෙන ගියේය.

'ඔයාලා දැන් ගෙවල් වලට යන්න. මායි තාත්තයි ඉන්නවනේ.. මං අසංකයියටත් කතා කළා.. එයත් දැන් එනවා.'

වායාගේ පපුව හිරවීගෙන ගියේය. තව විනාඩි දහයකින් පහළවකින් ඔහු මෙතනට එනබව ඇයට ඉඳුරාම විශ්වාසය. ඔහුගේ ජීවිතයේ සෝබර මොහොතක ඔහු හා ඉන්නට ඇය ආශා කළාය.

නිලංකාත් වායාත් මූහුණට මුහුණ බලාගත්හ. වායාගේ මූහුණේ වූ අසරණ පෙනුම නිලංකා වහා හඳුනාගත්තාය. 'කෙල්ලගේ ජීවිතේ කොයි පැත්තෙන් ගත්තත් දුකයි..' නිලංකා වේදනාවෙන් සිතුවාය.

'අනේ මිස් මැඩම්ගේ මූණ බලලම අපි යන්නම්.'

නිලංකා අවංක වේදනාවකින් කීවාය. ඇය කියූයේ තමාගේ හදවතේ වූ දේ බව වායා දැන උන්නාය.

'ඔයාලා මෙතන හිටියා කියලා වැඩක් නැනේ.. යන්න.'

හර්ෂණී කීවේ අකාරුණික හඬකිනි. වායාට ඇඬෙන්නට තරම්විය.

WWW.EXPRESSLANKA.TK 293

'යතුරු ටික මං ගාව.. සර් ආවම දීලම යන්නම් මිස්..'

වායා ඔහුගේ මුහුණ නොදක යන්නට බැරිම වූ නිසා කීවාය. හර්ෂණී එකෙනෙහිම අත පෑවාය.

'කෝ.. මට දීලා ඔයාලා යන්න..'

රැඳෙන්නට තරම් තවත් අවසරයක් ඇගේ හඬ තුළ නොවීය. වායා එතෙක් වෙලා අතේ තබාගෙන උන් යතුරු කිහිපය හර්ෂණී අත තැබුවාය.

'මිස් අපි හවසට ඇවිත් බලන්නද මැඩම්ව..'

'ඕන් නෑ උදේට කෙළින්ම ඔෆිස් එන්න.'

නිලංකා අසරණව වායාදෙස බැලුවාය.

'අපි එහෙනම් යන් වායා.. යන්නම් මිස්..'

වායා හර්ෂණී දෙස බලා ඉක්මනින් දෙනෙත් සඟවා ගත්තාය. දුන් දුන් ඇඩෙතැයි ඇයට සිතුණි. ඔහුව නුවර සිට ගෙන්වා ගත්තේ තමාය. ළඟටම ආපසූන් ඒ මුහුණ දැකගන්නට පිනක් තමාට නොතිබිණ. වාවාගත නොහැකි ආත්මානුකම්පාවකින් වායාගේ ළය උණුවිය.

'උඹ දුක්වෙන්න එපා කෙල්ලේ.'

රෝහලින් පිටවෙද්දී නිලංකා වායාගේ අත අල්ලා කීවාය. වායා පිටි අත්ලෙන් දෑසට නැඟුණ කඳුළු දෙපේළිය අවට පිරිසගෙන් වසන් කරගත්තාය.

'මැඩම්ව හොස්පිට්ල් එකට ගෙනාවෙත් අපි.. සර්ට කෝල් දීලා ගෙන්න ගත්තෙත් අපි. අන්තිමට අපිව එළවනවා. හරි අසාධාරණ පසුවක් එයාට තියෙන්නේ.. එයාට වඩා චූට්ටක් හරි අපි මැඩම්ට ආදරෙයි..'

නිලංකා කෝන්තියෙන් කීවාය. වායා කතා කළේම නැත. ඇය රෝහල හතරවටින් එහාට මෙහාට වන වාහන අතර ඔහුගේ වාහනය වේදැයි බැලුවාය.

'අපි යන් කෙල්ලේ.. මෙතන හිටියොත් අපි ගැන සැක හිතනවා. ගිහිල්ලා පස්සේ සර්ට කෝල් කරමු..'

'ඔක්කොටම වඩා මැඩම්ට අසනීපවුනු වෙලාවේ මැඩම් ළඟට වෙලා ඉන්න බැරි වෙච්ච එක ගැන දුකයි නිලංකා..'

'මටත් දුක ඒකයි චායා.. කමක් නෑ අපි අපේ යුතුකම ඉටු කළානේ.. දැන් යමු..'

'චුට්ටක් හෝල්ට් එකට වෙලා බලං ඉඳලා යන්..'

'මූණ නොදැක ගෙදර යන්නම අමාරුද..'

'යන්න පුළුවන් නිලංකා.. ගෙදර ගිහිල්ලා ඉන්න අමාරුයි.. මැඩම්ට අමාරුද දන්නෑ.'

'ටිකක් බලං ඉඳලා අපි යන්..'

නිලංකාත් චායාත් නවලෝක රෝහලට ආසන්නයේ වූ බස් නැවතුම අසළට වී බලා උන්නෝය. යුවතියන් දෙදෙනාගේම මුහුණුවල තිබුනේ අසරණ අනාථ බවකි. හර්ෂණී තමන් දෙදෙනාව සිතාමතාම කොන් කළ බව දෙදෙනාටම වැටහී තිබුණි. සියල්ලටම වඩා චායාට දුක සිතුනේ රණතුංග මහත්මිය ගැනය. ඇය බලා උන්නේ අද දවසම හෝ ඇය ළඟට වී ඉන්නටය. රෝහලේ නවත්වා ගතහොත් ගෙදරට පණිවිඩයක් යවා මුළු රෑම හෝ ඇය ළඟට වී ඉන්නට ඇය ආශා කළාය.

එහෙත් ඒ කිසිවක් නොවීය.

'චා..යා.. සර්..'

කොළඹ නගර ශාලාව දෙසින් ආ අසංකගේ වාහනය වේගයෙන් රෝහලේ රථ අංගනයට හරවද්දී නිලංකා චායාගේ අත දැඩිව අල්ලාගෙන කීවාය. චායාගේ ඇස්වල කඳුළු පිරුනේ නොදැනීමය.

'අ..නේ..'

ඇයට ඉබේම කියැවිණ. ජීවිතය තමාට පෙනි පෙනී අහිමිවී යන සෙයක් ඇයට දැනුණි. එය මොහොතකට පෙර තිබුනේ තමන්ගේ උකුලේය. එහෙත් දැන් සියල්ල හිස්ය.

'දුවලා ගිහිල්ලා කතාකරමු චායා..'

WWW.EXPRESSLANKA.TK 

'ඕන් නෑ තිලංකා.. අපි ගෙදර යන්.. මේ අපේ නොලැබීම කියලා හිතලා හිතහදාගමු.. මට මැඩම් ගැන දුකයි..'

එසේ කීවද වායාට බස් නැවතුමෙන් හෙලවෙන්නවත් නොසිතිණ. හදවතේ ඇතුළ පතුරු ගැලවී ගැලවී වැටෙන්නාක් මෙනි. ආදරය ගින්දරකි. තමා මේ දැවෙන්නේ ඒ ගින්දරෙන් බව වායා හොඳකාරවම දනී.

'වායා.. උඹ අඬනවද..'

'නෑ තිලංකා.. අඬනවා නම් අඬන්න ඕන තරම් පුළුවන්..'

'අපි වගේ කෙල්ලන්ට මීට වඩා ලස්සනට ආදරේ ලැබෙන්නේ නෑ කෙල්ලේ.. ටිකක් හිත තද කරගෙන ඉඳපන්..'

'හිටපු නිස්කලංකේ කොච්චර හොඳද කියලා හිතෙනවා තිලංකා..'

'එක වැස්සකින්ම ගංගාවල් උතුරන්නේ නෑනේ වායා. අපි ගෙදර ගිහිල්ලා ටිකක් ඉමු.. රෑට සර්ට කතාකරලා බලමු මැඩම්ට කොහොමද කියලා.'

'සනීප උනොත් මැඩම්ව ගෙදර එක්කගෙන යයිද..'

'ඔ..ව්..'

'එහෙම උනොත් අපිට හවසට මැඩම්ව බලන්න ගෙදරට එන්න බැරිද..'

'සමහරවිට පුළුවන් වෙයි. මේ බස් එකේ සෙනඟ අඩුයි යන්..'

වායා බස්රියට නැඟ තිලංකා ළඟම ඉඳගත්තාය. මොහොතකට ඇගේ නළල් තලයම රිදෙන්නට ගත්තේය. වේදනාව දරාගන්නට බැරිම තැන වායා තිලංකාගේ උරහිසට හිස බරකළාය.

ජීවිතය නිස්කලංක නිහඬ ඉවුරක සිට දුක් ඉවුරකට පාව යන බව වායා දැන උන්නාය. ගංදිය මත පාවෙන වියළි මල් පරඬලාවක් සේ ජීවිතයට එසේ හිතුමතේ පාව යන්නට ඉඩ දිය යුතුද.. ජීවිතය පරඬලාවක් වුවද මේ ආදරණීය ප්‍රථම ගං දියෙන් ඈත්වන්නට හිතට ලෝබය. ඒ ජීවිතයට ගලා ආ ප්‍රථම සෙනෙහසේ දියවරයයි.

ඔහුගේ [illegible] ඉන්නට

WWW.EXPRESSLANKA.TK 296

නොලැබෙනා බව චායා දන උන්නාය. ඒ තරම් පිනක් තමා සතුව ඇතැයි ඇයට සිතාගැනීමට නොහැක. අඩුම තරමේ මේ ජීවිත කාලය පුරා ඔහුට පෙනෙන ඔහුට ඇසෙන ඔහුගේ සුවඳ දැනෙන දුරක ඉන්නටවත් ලැබේනම්..

එහෙත් සන්තකයම හිමි නොවන ආදරයක් දෙස තරුවක් දෙස මෙසේ බලා සිටිය හැකිද.. පපුවට ළං කරගත නොහැකි ආදරයක් දෙස දුරින් සිට බලා ඉඳ ආදරය කිරීම ගින්දරක් නොවේද..

හදවත ඒ ගින්දරෙන් හෝ දැවී යාමට සූදනම් යැයි චායාට සිතුණි.

'හවස මං සර්ට කෝල් කරන්නද උඹ කතා කරනවද..'

බහින්නට සූදනම්වී නිලංකා චායාගේ උකුල මත අත තබා ඇසුවාය.

'මං කතා කරලා උඹට කතා කරන්නම්..'

'මේ වෙලාවේ සර්ගෙත් ඔළුව අවුල් වෙලා ඇති. පිස්සිවගේ අඬන්න එපා ෆෝන් එකට..'

'අඬන්නැතුව ඉන්න පුළුවන් නම් හරි ආසයි නිලංකා..'

නිලංකා ඇගේ අත අල්ලා ආදරයෙන් තම සුන්දර අහිංසක මිතුරිය දෙස බලා උන්නාය.

'හිතන්න එපා.. අපි බලමු.. අඬලා මය මූණ කැත කරගන්න එපා. කොල්ලට දුක හිතෙයි.'

චායා ගෙදර ආවේ අමාරුවෙන් හිත හදගෙනය. එක අතකට මේ දුක අමුතුවෙන් අද ආ දුකක් නොවේ. මේ හොඳට හුරු පුරුදු වීද හුරු දුකකි. ආදරය වැඩි වෙද්දී හිතට දැනෙන ලෝබකම දැඩිය. අද ඔහුගේ දක්ම පවා අහිමිවී දුක් විඳින තමාට අනාගතයේ ඔහුව සදහටම අහිමිවී යද්දී ඇතිවන දුක තේරුම් ගන්නටවත් බැරි යැයි චායාට සිතුණි.

'ඇ...යි පුතේ..'

පද්මා ගෙට ගොඩවෙද්දීම දියණියගේ මුහුණේ වූ අසරණ දුක්බර බව දැක ඇසුවාය. උදේ හවා මල් පිපීම තිබෙනු දැක හුරු

WWW.EXPRESSLANKA.TK 297

දෙනෙතකට ඒ මලේ පෙත්තක් අවපැහැ වුවද හොඳින් තේරේ..

'මැඩම්ට අසනීප වෙලා හොස්පිට්ල් ගෙනිච්චා අම්මේ.'

එය කියද්දී චායාගේ ඇස්වල කඳුළු පිරුණි.

'අනේ.. ඇයි මැඩම්ට මොකද.'

'හදිස්සියේම දවල් ෂොප් එකේ පපුව අල්ලගෙන වැටුනා.. මායි තිලංකයි නවලෝකෙට අරගෙන ගියා.'

'ඇයි ඔයාලගේ සර්..'

'සර්ත් වෙලාවටම නුවර ගිහිල්ලා.'

'ඉතින් දැන් මොකද මැඩම්ට..'

චායාට හීල්ලිත.

'අපිට මැඩම් ළඟ ඉන්න වුනේ නෑ අම්මේ.'

දියණියගේ දෙනෙත් වල තිබූ කඩා ඉහිරුණු බව පද්මා හොඳකාරවම දුටුවාය.

'ඇයි ඒ..'

'අපේ සර්ගේ නෑනා ඇවිත් අපිට යන්න කිව්වා. හරි දුකෙන් අම්මේ දලා ආවේ.'

පද්මා දියණියගේ මුහුණ දෙසම බලා උන්නාය. ඒ ඇස්වල එක රහසක් නොව රහස් රැසක්ම සැඟව ඇති බව ඇය දැන උන්නාය.

'ගොඩාක් දේවල් හිතේ තියන් ඉන්නකොට හිත බරයි පුතේ...'

පද්මා ඉවසිල්ලෙන් කීවාය. චායා කුස්සියේ තබා තිබූ ගුරුලේත්තුවෙන් වතුර වීදුරුවක් ගෙන එය එක හුස්මට බීගෙන බීගෙන ගියාය.

'හිත බරනම් තමා අම්මේ.'

චායා මිමිණුවාය. හිතේ බර ඇගේ වචන වලද බැල්මේද ඇස්වලද තිබුණි.

'ඔයා දුක් විඳින්නද පුතේ ඔය ලැස්ති වෙන්නේ..'

'මංද අම්මේ.. මට සමාවෙන්න.. මං අම්මට හංගනවා නෙවේ..'

'ඔයා මට කියන්න ඕනේ නෑ පුතේ.. ඔයාගේ මූණේ ලොකු

දෙයක් පේනවා.'

ඒ මොනවගේ දෙයක්දැයි වායා ඇසුවේ නැත. අසත්තට ඇයට බියය.

'දවාලට කාලා නෙවේ නේද ඉන්නේ.'

'නෑ අම්මේ.. බත් එකත් ඔෆිස් එකේ..'

'මම කත්තුන් තෙල්දලා තලපත් ටිකක් කිරට හැදුවා. බත් ටිකක් පුතේ උණුවෙන් දාගෙන එන්නද..'

'මං චුට්ටක් ඇලවෙලා ඉඳලා කන්නම් අම්මේ.'

වායා ඇහිලි තුඩින් නළලත මිරිකා කීවාය. තරුණ ගැහැණු දරුවන්ගේ හිසේ ඇම්ම යනු හදවතේ ඇම්මය. වෙනකක් නොවේ.

'යන්න.. ගිහිල්ලා ඇලවෙන්න.. මම තේ ටිකක් හදගෙන එන්නම්.'

වායා ඇඳගෙන ආ ඇඳුම් පිටින්ම ඇඳට වැටුනාය. එතෙක් වෙලා හිතටද නෙතටද බරවූ කඳුළක් හීන් සීරුවේම ගලාගොස් කොට්ටයට වැටුණි.

# 30

වායා කුස්සියේ සිටම අම්මා බෙදූ බත් ටික කෑවාය. අම්මා තලපත් කිරට උයා කත්තුන් තෙල්දමන්නේ ඒ දූප්පත් කෑම වට්ටෝරුවට තමා ආශා නිසා බව වායා දන්නීය. වෙන වෙලාවක නම් බත් හැඳි තුන හතරක් දමාගෙන ඇය කන්නීය. එහෙත් අද අනාගත් එකම බත් කටවල් තුන හතර පවා උගුරෙන් පහළට ගියේ වැර වැයමෙනි.

'නව මාළු කෑල්ලක් ගන්න පුතේ.'

පද්මා පොල්කටු හැන්ද අත තබාගෙන කීවාය. උයපු මාළු

හොද්දෙන් මාළු කෑලි දෙක තුනක්වත් ඇයට කවා නොගතහොත් පද්මාගේ හිතට ලෝබය.

'මං රෑ වෙලා කන්නම් අම්මේ.'

චායා අත සෝදගෙන පැමිණ කාමරයේ තිබූ කුඩා පර්ස් එක අතට ගත්තාය.

'අම්මේ.. මං හන්දියට ගිහිල්ලා කෝල් එකක් අරගෙන එන්නම්..'

ඇය එසේ කියා අම්මාගේ පිළිතුරක්වත් බලාපොරොත්තු නොවීම පාරට බැස්සාය. හිත හිතනවාටත් වඩා අවුල්ව නැවුල්ව ගොසිති.

චායා දුරකථන ක්‍රියාකරවන්නියට අසංකගේ අංකය දුන්නාය. ඔහුගේ හඬ අසන්නට පවා ඇගේ තුන් හිතම සැදී පැහැදී උන්නේය.

'හෙලෝ..'

ඒ හඬ අසද්දී චායාට කතා කරගන්නට පවා බැරිවිය. ඇයට හීල්ලින.

'ස..ර්.. මම..'

'කොහෙද බබා ඉන්නේ.. ඇයි අම්මව දාලා ගියේ. මං එනකල් උන්නැත්තේ ඇයි..'

ඔහුගෙන් ප්‍රශ්න වැලකි.. චායාට හැඬුම් ආවේය.

'ඉතින් අඬනවා.. ඇයි බබා මේ.'

'ළඟ කවුරුහරි ඉන්නවද කියලා කියන්න.'

'ඉන්නවා..'

චායාගේ ඇතුළු ළය සීතල විය.

'ක..වු..ද..'

'මගේ පණ.. ළඟ නෑ හිතේ ඉන්නේ.'

'විහිළු කරන්න එපා සර්..'

චායාට ඇඬුනේ ඒ වදන් මැදය.

'මැඩම්ට කොහොමද සර්..'

'අම්මට හාට් ඇටෑක් චායා.. අද හොස්පිට්ල් එකේ ඉන්න වෙනවා.'

WWW.EXPRESSLANKA.TK 300

'අ..නේ.. දැන් අමාරුද..'

'දැන් අඩුයි.. තව චෙක්අප් වගයකට නවත්ත ගත්තේ. වැඩ ඔක්කොම අඩු කරන්න කිව්වා.'

'මං පහනට බාරෙකුත් ගැට ගැහුවා.'

වායා එසේ කියා නිහඬ වූවාය. දහවල් වූ සිදුවීම් කියනවාද.. ඇය සිතුවේ දෙගිඩියාවෙනි.

'ඇයි දවල් ඉන්නැතුව ගියේ..'

'නෑ සර්.. හර්ෂණී මිස් ආවනේ.. වැඩක් නැති නිසා මායි නිලංකයි ආවා.'

ඇය බිඳුණු හඬින් කීවාය. එහෙත් ඒ වචන යට රැඳි අතිශය වේදනාබර අසරණකම අසංක හොඳ හැටි හඳුනාගත්තේය.

'අම්මා නැගිට්ට හැටියේ ඔයාව හොයලා තියෙන්නේ..'

'අ..නේ.. මම ළඟ ඉන්න හිතත් උන්නේ.. මං ගැන මොනා හිතුවද දන්නෑ.'

'බබා ගෙදරද ඉන්නේ..'

'ඔ..ව්.. මං මැඩම්ව බලන්න එන්නද..'

'අම්මව බලන්න අමාරුයි බබා.. රෑට ටෙස්ට් වගයක් යනවනේ.. ඒවා ඉවර වෙද්දි රෑ දහයවත් වෙයි..'

කතාව අවසාන වුවද වායා රිසීවරය ඔහේ අල්ලාගෙන උන්නාය. දවුණු කතරට වැහි පොදක් ඉල්ලා මෙන් ඒ හදවත හඬා වැටෙන්නට විය.

'අම්මව විතරද බලන්න ඕනේ.'

ඔහු තරමක සැහැල්ලුවෙන් ඇසුවේය.

'වෙන අයට ලෙඩ නෑනේ.'

'මං අසාධ්‍ය රෝගියෙක් බබා..'

'ඔයා හවසට ඇඩ්මිට් වෙන්න සර්.. බලාගන්න නැතත් ඉන්නවනේ..'

'පිස්සු කියවන්නැතුව ඉන්න.'

WWW.EXPRESSLANKA.TK 301

ඔහු තරමක් සැරෙන් කීවේය.

'මං කියන්නෙ ඇත්ත ස..ර්..'

සඟවා ගත් ඉකිබිඳුම අලුත් විය.

'සොරි.. හවස චූට්ටක් හම්බවෙමු.'

'කඩාගෙන යනවා කියලා දැනගෙනම සරුංගලේට බුරුල දෙන්න එපා සර්.. මාව හොයාගන්නවත් බැරිවෙයි.'

'මං හෝමාගමට එන්නද..'

ඔහු ඇය කියූ දේ ගණනකට නොගෙන ඇසුවේය. ඒ හිතුවක්කාර හඬට පවා ඇය උකුරා යන ලෙස ආදරය කළේය.

'තව පැය බාගයකින්.. හෝමාගම ස්ටෑන්ඩ් එක ළඟට බබා එන්න.. මං එන්නම්.'

ඒ ඉල්ලීමට පිටුපාන්නට තරම් හැඟීම් විරහිත බවක් ඇය තුළ තිබුණේ නැත.

'ස..ර්..'

'ඇ..යි..'

'මැඩම් ළඟ කවුද ඉන්නේ.'

'අම්මා ළඟ කාටවත් ඉන්න බෑ දරුවෝ..'

චායා රිසිවරය තබා ගෙදරට ආවේ ගියාට වඩා හිතේ නිස්කලංකයෙනි. කොතරම් හිත දෙදරා ගියද ඒ මුහුණ තව එකවරක් හෝ බලා නිදාගන්නට ලැබීම ගැන ඇය දෙවියන්ට ස්තූති වූවාය. දෛවය තමාට දුකසේ සැප දෙනවා යැයි ඇයට සිතුණි.

ඇය ගෙදර පැමිණ සියළු තොරතුරු අම්මා සමඟ කීවාය. එහෙත් මේ ඇඳගන්නට යන්නේ ඔහු හමුවන්නට බව කීමට ඇගේ තරුණ සිත මැළිවිය.

'රස්සාව නිසයි ඒ රත්තරං මිනිස්සු නිසයි මිසක් ඔයාව මෙහෙම රෑ පාතේ යවන්න මට ලෝබයි පුතේ.'

'මේ හිහන්නිට කවුරුත් කරදර කරන්නෑ අම්මේ.'

චායා සිනාසී කීවාය. ඒ සිනහවේ 'දනට එක්කෙනක් කරදර

WWW.EXPRESSLANKA.TK 302

කරනවා..' වැනි කතාවක් විය.

ජීවිතය කොහේ සිට කොහාට යනවාදැයි නොදන්නා මේ යන ගමනේ තේරුමක් නැත. කෙදිනක හෝ අභිමිවීම් වල බර ගල් කණු බැඳගෙන තමාට හුදෙකලාවේ හඬන්නට සිදුවෙනු ඇත. මේ හෙමින් හෙමින් පය තබා යන්නේ ඒ දිනයට නොවේද..

සියල්ල අමතක කර දමා ආපසු හැරිය හැකිදැයි ඇය සිතුවාය. සියල්ලම අමතක කළහැකිය. එහෙත් ප්‍රථම දිනයේ ඒ රාත්‍රියේ ඒ ඇස්වල තිබූ ආදරයේ තිම්හිම් නැති ආදරණීයත්වය අමතක කළ නොහැක. ඒ ජීවිතය කුළුඳුලේ ආදරයක් අත්විඳි නිර්මලම මොහොතය.

හෝමාගමින් බසින්දී අඳුර වැටී තිබුණි. වායා බස් රියෙන් බැස අවට බැලුවාය. ඔහු බස්නැවතුමට එහා මාවත කොනක වාහනය නවතාගෙන ඔහේ පාර දෙස බලාගෙන උන්නේය. පෙහෙවත් සමාදන් වූ තෙරණියක් සුදු බුදුරදුන් හැබැහින් දක්නාක් බඳු පිරුණු හැඟීමකින් ඇගේ ළය පිරුණි.

දෛවය ටික කලකට තුලියට දුන් ආදරය මේ තරම් අරුමැයි නම් එය සිත්තක්කරයට ලියාදුන් පසු කොතරම් චමත්කාරජනක විය හැකිද..

වායා හිස බිමට බර කරගෙන වාහනය දෙසට ඇවිදගෙන ගියාය. ඔහු ඇය එනවා දුටුවේ නැත. වායා වාහනය ළඟටම පැමිණ එහා ආසනයේ වීදුරුවෙන් ඔහු දෙස බලාගත්වනම බලා උන්නාය. ඒ දෙනෙත් අපමණ දුකෙන් මාවත දෙසට යොමුව තිබුණි. වායාගේ පපුව හෝස් ගා ඇවිලිණ.

මේ මුහුණ මේ තරම් ඉක්මනට පරවූයේ කෙසේද.. වායා ඇඟිලි තුඩින් වීදුරුවට තට්ටු කළාය. එතුවක් වෙලා පරව තිබූ මලකට පැන් ඉස්සාක් මෙන් ඒ වත කමළ පිපී ආවේය. වායා පැහැබරව සිනාසුනාය. ඔහු වාහනයේ දෙර විවර නොකර වීදුරුවෙන් ඒ මුහුණ දෙස තත්පර දෙක තුනක් බලා උන්නේය. 'මේක හඳක්.. පුළුවන්නම් උඹේ අහසේම තියාගනින්..' නාලක කියූ එවදන් ඔහුට යළිත් සිහිවිය. අසංක විවර කළ දෙරින් ඇතුළුවී ඇය ඉඳගත්තාය. කළු සායත් කහ පැහැගත් කමිසයත් ඇගේ වතට ගෙන ආවේ ලාබාල පෙනුමකි. උඩු ඇඳුමේ සහපැහැය ඒ මුහුණට පරාවර්තනය වී තිබුනි. අසංක ඇය දෙස බලා

WWW.EXPRESSLANKA.TK 303

උන්නේ අවතැන්ව ගිය හිත එක්තැන් කර ගනු පිණිසය.

"අපි මෙතනද ඉන්නේ සර්.."

ඔහුගේ බැල්ම දරාගත නොහැකිව චායා ඇසුවාය.

"මට ඔයා එක්ක කොහන උන්නත් එකයි බබා.."

ඔහු වාහනය කොළඹ දෙසට හරවා නොගෙන හයිලෙවල් පාර දිගේ අවිස්සාවේල්ල දෙසට වාහනය පැදවීය.

"ඇයි මේ පැත්තට.."

"කොහේ හරි නිස්කලංක තැනක් හොයාගෙන යන් වායා."

ඒ හඬ වෙනදට වඩා අමුතුය. වචන පවා එන්නේ බිඳී බිඳීය.

"ඔය දූක මූණ පෙන්නන්නද මට එන්න කිව්වේ.. ඇයි සර් මේ.."

අසංක කතා කළේ නැත. ජීවිතයේ ප්‍රශ්න පත්තරයට අද හැන්දෑවේම පිළිතුරු ලිවිය යුතුද.. එය හෙට හෝ අනිද්දට කල්දැමිය නොහැකිද..

"ම..ට.. කියන්න.. ඇයි කතා කරන්නැත්තේ."

චායා යළිත් ඇසුවාය. අසංක ගියරය මත තිබූ වමත ඇගේ උකුළට වැටෙන්නට දැමුවේය. උකුල මත තිබූ ඇගේ දිගු ඇඟිලි අතර ඒ වමත සිරවිය. ඒ වමතේ තිබුනේ අයාමානා රස්නයකි.

"උණද දෙයියනේ.."

චායා ඉඳගෙන උන් ආසනයෙන් ඉස්සී ඔහුගේ ගෙළටත් නළලටත් අත තබා ඇසුවාය.

"උණ තමයි.."

"ටිකක් තිබුනා බබා.."

"ටිකක් නෙවේ ගොඩක් තියෙනවා. නවත්තලා පෙනඩෝල් දෙකක් වත් බොමු.."

අසංක වාහනය මාවත අයිනේ වූ කඩයක් අසළ නැවැත්තුවේය.

"මං දුවලා ගේන්නම්."

ඔහු බලා සිටිද්දීම ඇය දුවගොස් පෙනඩෝල් පෙති දෙකකුත් වතුර වීදුරුවකුත් ගෙන ආවාය. ඇය කඩා දුන් පෙති දෙක ඔහු බීවේ

කුඩා [illegible] ආශාවෙන් ඔහු දෙස බලා උන්නාය.

WWW.EXPRESSLANKA.TK 304

'මටම ලැබෙනවා නම්' ඇය සිතන්නට ඇත්තේ එවැන්නකි.

'බෙහෙත් ටිකකුත් අරගෙන යන් සර්..'

ඔහු වේදනාබරව ඇයදෙස බැලුවාය.

'මට මෙතනට වෙලා චුට්ටක් නිදගන්න දෙන්න.. එතකොට සනීප වෙයි.'

අසංක කීවේ චායාගේ උකුලට වමත තබාය. එක අතක් මත ඒ අත තබා චායා අනිත් අතින් අත පිරිමැද්දය.

'නුවර කොයි හරියෙදිද හැරුනේ.'

'කඩුගන්නාව ළඟදි..'

'ලස්සනද..'

'ම්.. දවසක යන්..'

'නු.. වර..'

'ඔ.. ව්.'

'ඔච්චර දුර යන්න මං හීන දකින්නෑ සර්..'

'කොච්චර දුර යන්නද ඕනේ.'

'යන්න ලැබෙනවා නම් ආත්ම ගාණක් දුර යන්න මේ දුප්පත් කෙල්ල එන්නම් සර්.. ඒත් මට බෑ.. මට මේ ආත්මෙවත් සර් ළඟ ඉන්න බෑ..'

ඔහුගේ දකුණත හැඩකළ රන් පැහැගත් ඔරලෝසුව ඇය ගලවමින් නැවත සවිකරමින් කතා කළාය. හිටිහැටියේම දෙනෙත් වලට බරවූ කඳුළක් ඔහුගේ වමතේ පිටි අත්ලට වැටුණි.

'තව කොච්චර දවසක් මම මෙහෙම අල්ලගෙන ඉන්නද..'

ඇය ඔහුගේ වමත බදාගෙන කියද්දී අසංකා ඒ අත මුදාගෙන ඇගේ හිස අතගෑවාය.

මේ ලෙස කප්පරක් සෙනෙහස පසුවට ගෙන අනාගතයේදී මුළු හදවතම නෙතබරියම් වනාතුරු අඩන්නට සිදුවනවා නොවේදැයි ඇයට සිතුණි.

'දත් හරවගෙන යන් සර්..'

WWW.EXPRESSLANKA.TK 305

'මට ඔයා එක්ක අද රෑ ඉන්න ඕන වායා.. පුළුවන්නම් එළිවෙනතුරු..'

එක රැයක් එළිවෙනතුරු නොව රාත්‍රී දස දහස් ගණනක් වුව එළිවෙනතුරු ඔහු පහසේ ගැලී සිටින්නට ඇය ආශා කළාය. ජීවිතය ඒ තරම්ම කාරුණික නැත. අසංක හංවැල්ලට ආසන්නයේ වූ නිස්කලංක අවන්හලකට වාහනය දැමුවේය. කැළණි ගං මිටියාවතේ පිහිටා තිබූ ඒ අවන්හල ලා කහපැහැයෙන් අහිංසකව දිලෙමින් තිබුණි. අසංක වාහනය අංගනයේ නවතා වායා දෙස බැලුවේය.

'වායාට බයද මම එක්ක මෙහෙම එන්න..'

ඔහු අවංක හඬකින් ඇසුවේය. වායා බිම බලාගෙන හීල්ලුවාය.

'සර් මට දෙවියෙක් වගේ. මං අදහනවා මේ අත්දෙක මේ අත්වලින් මට වරදක් වෙන්නෑ කියලා මං දන්නවා ස ර්.. කවදාහරි දෙන්න ඕනනම් මගේ පණ උනත් මං සර්ට හරි ආසාවෙන් දෙනවා සර්..'

'අපි යන්..'

ඔවුන් පියනැගුවේ අවන්හලේ පහළ තීරුවටය. තරමක් පාළු තුරු වදුළු යට අඩවන් කළ විදුලි පහන් එළිමැද තනා තිබූ කුඩා ගස් සෙවණ මුහුණලා තිබුනේ නිසංසලේ ගලායන කැළණි ගංගාවටය. ගඟ දිය දෙසින් හමා එන තුහී මෘදු රෑ සුළඟේ තිබුනේ මොලොක් සීතලකි. යන අතරවාරයේ අසංක වායාගේ වමතින් අල්ලා ගත්තේය. ඇය අපමණ ආශාවෙන් ඒ සුරත මැද ඇඟිලි තුඩු සිරකරගත්තාය.

අවන්හලේ කහ පැහැගත් ඡායාව පහළ ගඟදිය මත අපූරුවට වැටී තිබුණි. වායා ඇගේ වම් කොපුළ ඔහුගේ බාහුවේ තබා තදකරගත්තාය. මොහොතකට හෝ මේ සියල්ල තමා සන්තකවීම ඇයට දරාගත නොහැක.

'මොනවද බබා බොන්නේ..'

'සර් ආස දෙයක්.'

'මං බියර් එකක් බොනවා..'

'මො[illegible] ඕවා [illegible] ඔයා බීලා වැඩිවෙයිනේ..'

WWW.EXPRESSLANKA.TK 306

'දැන් හිසරදේ නෑ.'

'තාම තියාගත්තේ නැතේ..'

'මොකක්ද..'

'ඔළුව.. මෙතනට..'

ඔහු අපමණ ආශාවකින් ඇගේ බඳ වටා සුරත යවා තම වතට ළංකරගත්තේය. ඔහුගේ ශක්තිමත් සුරත සිහිඳු බඳවටා එතෙද්දී ඇගේ ඒ පැත්තම හිරිවැටී ගියාක් බඳුවිය.

'ඔයාටත් බියර් වුට්ටක් පොවන්නම්.'

'අ..නේ.. මට මුකුත් එපා.'

චායා අඳුරු සෙවනයට තබාලූ වේවැල් පුටුවමත ඉඳගත්තාය. ඔහු සේවකයාට ඇණවුම දී පැමිණ චායා අසළ වූ අනෙක් පුටුවේ ඉඳගන්නට ගොස් නැවත ඇය අභිමුවට ආවේය. ඊටත් පසු ඇය ඉඳගෙන උන් පුටුව පාමුළ දණ ඔබා ඉඳගෙන ඇගේ උකුලට හිස තබාගත්තේය. චායාගේ ළය ඇතුළු බිත්ති දෙදරමින් ආදරයෙන් පිරී ගියේය. ජීවිතයේ ප්‍රථම ස්වයංවර රාත්‍රියේ තනිවූ යුවතියකගේ මෙන් ඇගේ හිතද දහසක් මල් වරුසා වලින් තෙමී යමින් තිබුණි.

ඔහුගේ මුහුණට ඒ දෙපාවල උණුසුම තදින්ම දැනුණි. අසංක වඩාත් මෘදුලෙය ඇගේ දෙපා යුවළ මත දෙතොල් තබා දැස් පියාගත්තේය. චායාගේ ගැහෙන අතැඟිලි ආදර රිද්මයකින් ඔහුගේ හිසකේ අතර හුදෙකලාවිය.

'මට හැමදාම මෙහෙම ඉන්න දෙන්න කෙල්ලේ.'

ඔහුගේ හඬ කුමර හදවතක ප්‍රථම අනුරාග අනුරාවයක් මෙන් නැඩුම්ය. ඒ තරමටම නැඩුම් වූ ඇගේ හදවතට ඒ හඬ දරාගන්නට බැරිතරම්ය. ඇය පහත්වී අපමණ සෙනෙහසකින් ඒ හිස සිපගත්තාය.

'මං එපා කිව්වෙ නැතේ ර..ත්..ත..රන්..'

ඇගේ වචන යුවතියකගේ හද සන්තානයේ නිම්නාද වන ප්‍රථම අනුරාග කෙඳිරිල්ලක් සේ අවංකය. නිර්මලය. ඒ වචන ඔහුගේ පිරිමි ළයේ පැත්තක් කඩා ඉහිරවන්නට තරම් විය.

'මම මගේ ජීවිතේ මැද්දෙම අසරණ වෙලා බබා..'

'මං දන්නවා සර්.. අපිට හැමදාම මෙහෙම ඉන්න බෑ.. මට ජීවිත කාලෙටම මේ දවස් ටික ඇති සර්..'

'මං ජීවිතේ හැම දෙයක්ම දාලා මේ පුංචි උකුලට එන්නද චායා..'

'සර් ආවත් නැතත් මේ උකුලේ කවදාවත් වෙන කෙනෙක් මෙහෙම මම තියාගන්නෑ සර්.. මට බෑ එහෙම කරන්න. ඒත් සර්ට දාලා එන්න බැරි ගොඩාක් දේවල් තියෙනවා. මං නරහ නෑ සර්.. සර් නැති කාලෙක මං කොට්ටයක් හරි උකුලේ තියාගෙන අතගගා ඉන්නම්..'

'ඔයා නැති ජීවිතයක් මට හිතාගන්න බෑ චායා..'

'හිතන්න වෙනවා සර්.. හිතන්නම වෙනවා.. ජීවිතේ ප්‍රශ්න මැද්දෙ මං නිසා හිරවෙන්න එපා රත්තරන් සර්.. අපි මේ දවස් ටික මෙහෙමම ඉමු..'

ඔහුගේ දිග සුසුමක් ඇගේ දෙපාවල වැදී ගත උණුසුම් කරන්නට විය. ජීවිතයේ දහසක් ප්‍රශ්න අමතක කර දමන්නට මෙන් ඔවුන් දෙදෙනා ඔවුන්ගේ මුහුණු වලින් ආදරය සෙව්වෝය. ඔහුගේ අතැඟිලි ඇගේ ගෙළ දිගේ විත් දෙකොපුල් දෑලට විත් නතර විය. ලා අඳුරේද ඔහු ඒදෙනෙත් ළං ළංව දැකගත්තේය. අපමණ ආදරයකුත් ඒ ආදරය විසින් ඇතිකළ සුන්දර අනුරාගයකුත් එක්ව ඒ දැස් තෙමා දමන්නට විය.

'අනේ මට මූණ පේන්නැනේ. එන්න මෙතනට..'

ඔහු ඇගේ උකුලින් මිදී ඇය අසළම වූ පුටුවට බරවූවේය. හිතට මහා පාළුවක් දැනෙතත් ඇය ඒ සුරත ගෙන තදින් අල්ලා ගත්තාය.

'මං අම්මට චායා ගැන කියන්නද..'

ඔහු සේවකයා ගෙනා සීතල බියර් වීදුරුව සුරතට ගෙන ඇදුනුවේය.

'එහෙම කරන්න හිතන්නවත් එපා සර්.. මං ජීවිතේ තුනකට හරි ආදරෙයි.. ඒ සර්ටයි මගේ අම්මටයි මගේ රස්සාවටයි. ඔය දෙක

WWW.EXPRESSLANKA.TK 308

තුනම මට එකපාර නැති උනොත් මට ජීවත්වෙන්න බෑ සර්..'

'වැඩියෙන්ම ආදරේ කාටද..'

ඔහු බියර් වීදුරුවේ සුදු පෙන බුබුළු දෙස බලාගෙන ඇසුවේය.

'මම මගේ අම්මටත් වඩා සර්ට ආදරෙයි.. එහෙම කළා කියලා මගේ අම්මා මා එක්ක තරහ වෙන්නෑ.'

ඔහු ඒ බැව් දන උන්නේය. ඔහුට අවශ්‍ය වී තිබුනේ එය නිතර නිතර අසන්නටය. ආදරය ප්‍රත්‍යක්ෂ කර සතුටක් විඳින ළාමක ආදරවන්තයෙකුගේ හදවත මෙන් ඔහුගේ හදවතද බොළඳව ළාමකව තිබුණි. ඒ ළඳ බොළඳ බවට ඔහු ආශා කළේය.

'සනීප වෙලා ගෙදර ආවාම මං අම්මා එක්ක කතා කරන්නම් බබා..'

'එපා දෙයියනේ.. මේ කකුල් දෙක ඉඹලා වැඳලා කියන්නම්... එපා.. මට ඔය කාමරේට වෙලා ඉන්න ඕන නෑ. පහළ සේල්ස් ගර්ල් කෙනෙක් වෙලාහරි මේ මූණ දිහාම ජීවිතය පුරා බලා ඉන්න ඕන..'

'ඒ ඇතිද මැණිකා..'

'ලැබෙන දෙයින් සෑනසෙන්න දුප්පත්කම මට උගන්නලා තියෙනවා සර්.. මට තියෙන එකම බලාපොරොත්තුව ඒක.. ඒකත් නැතිඋනොත්.. මට ජීවත්වෙන්නවත් හිත හදාගන්න බැරිවෙයි සර්..'

ඔහු බියර් වීදුරුව පසෙක තබා දතින්ම මුහුණ වසාගෙන හිල්ලුවේය. අසංක තමා නිසා දුක්විඳිනැයි චායා හිතුවේ වේදනාවෙනි.

'මං නිසා ඔහොම දුක් විඳින්න එපා සර්.. මං බලං ඉන්නේ කොහොමද.. ජීවිතේ සර් ගන්න හිටපු තීරණ වෙනස්කරන්න එපා සර්.. ඒවා වෙනස් කරන්න ගිහිල්ලා සර්ට ගොඩක් දේවල් නැතිවෙනවා. සර් කැමති උනත් මට බෑ සර්ව ඒ තත්වෙට පත්කරන්න.'

දෛවයේ දරුණුම කෙනෙහිලිකමක් ඉදිරියේ යුවතියකට මේ තරම් තැන්පත් විය හැකිදැයි ඔහු පුදුමයෙන් සිතුවේය.

'හර්ෂණී මිස්ට සර්ගේ ජීවිතේ තියෙන තැන මේ චායාට ගන්න බෑ සර්.. එයා ගොඩාක් පින්කරලා ඇති.. ඒ වලින් අරික්කාලක් වත්

මම කරලා නැතුව ඇති..'

'මාව කසාද බඳින එක හර්ෂණී පිනක් කියලා හිතන්නෑ වායා..'

'පින්කාරයෝ පින් තියේය කියලා දන්නෑ සර්.. හර්ෂණී මිස් කොච්චර වාසනාවන්තද කියලා දන්නේ මේ පව්කාර මම..'

'වෙන්වීමක් ගැන මට හිතාගන්න බෑ බබා..'

'මම මේ ආත්මේ මෙහෙම තනියම ඉන්නම්..'

'එක්කෙනෙක් එක්ක එක ආත්මයක් උන්නොත් එයා එක්ක ආත්ම හතක්ම එකට ඉන්න වෙනවා වායා..'

'කවුද සර්ට කිව්වේ.'

වායා දුක්බරව ඇසුවාය. මේ ආදරය ලබාගන්නට ආත්ම හතක් බලා සිටිය යුතුද..

'නාලක.. මොකක්ද පිල්ම් එකක තිබුනලු.'

'ආත්ම හතක් නම් මට මේ දුක උහුලගන්න බෑ සර්..'

'ආත්ම හතක් නෙවේ වායා.. මට ඔයාව එක පැයක්වත් නොදක ඉන්න බෑ.'

'මටත් බෑ දෙ ..යි..ය..නේ.. ඒත් මොනා කරන්නද..'

ඇය ඔහුගේ උරහිසට බරවී ඒ පැත්තේ බාහුව තදින් අල්ලා ගත්තාය. ඔහුගේ වතින් හමා එන සීතල කඳුකර සුවඳක් රැගත් මෘදු විලවුන් සුවඳ ඇගේ යොවුන් හිත මොහොතකට නතර කරන්නට සමත්විය.

'මට මේ ගාන සෙන්ට් බෝතලේ ගෙනත් දෙන්න.. ඒකෙ සුවඳවත් මාරු කරන්න එපා. මොකක්ද ඒකේ නම..'

වායා බොළඳ හඬකින් ඇසුවාය.

'කූල් වෝටර්.. ඇයි මොකටද.. මං වෙන සුවඳ ලේඩිස් පර්ෆියුම් ටිකක් ගෙනත් දෙන්නම්.'

'නෑ මට මේකමයි ඕනේ.. හැමදාම රැට කොට්ටෙට වුට්ටක්

ඉහගන්න..'

'කොච්චර කාලෙකටද.'

අසංකගේ සුරත ඇගේ ගෙළේ පහළ නිම්නයේ සිට කෙස් රොදවල් අතරින් හිස් මුදුන දක්වා ආවේය. ඇය පහත්වී ඒ උණුසුම දරාගත්තාය.

'ජීවිත කාලෙටම..'

'සුවඳ චිතරක් ඇතිද..'

'මේ කෙල්ලට එච්චරයි ලැබෙන්නේ සර්.. මට ඒ ඇති. හොඳටෝම ඇති. අනේ ගෙනත් දෙනවා නේද..'

'මට මොනවද තියෙන්නේ..'

'අලුත් ජීවිතයක් පටන්ගත්තාම සර්ට මේ කඩමාළු අමතක වෙයි සර්..'

ඔහුගේ දෑස් කඳුළින් තෙමීයනු ඇය බලා උන්නේ පුදුමයෙනි. තමා කියූ වචන ඔහුගේ දෑස් තෙමාදමන්නට තරම් ප්‍රබලවීද. ඇගේ තුන් හිතම ගල් ඉන්නකින් ඇන්නාක් මෙන් රිදුම් දෙන්නට විය.

'අනේ.. මට සමාවෙන්න.. ඇයි මේ..'

'මං ගැන එහෙම හිතන්න එපා බබා..'

ඇය උන් අසුනෙන් නැගිට ඔහු පාමුළ අඩවන්ව ඉඳ ඒ දෙපාවලට දූතම තැබුවාය.

'අසංක..'

ඒ ඇය ඔහුගේ නම කියා ඇමතූ ප්‍රථම වතාවය. ඒ මුවගට මොහොතකට හිනාවක් නැගුණි.

'ඔහොම හිනාවෙනකොට කොච්චර ලස්සනද ඔයා.. ජීවිතේ හැමදාම හිනාවෙලා ඉන්න. අඬන එක මට දෙන්න කිව්වේ තරහට නෙවේ දෙයියනේ.. මට අඬලා පුරුදු නිසා.. ඔයා අඬන්න එපා.. අඬනකොට කැතයි.. හිනාවෙලා ඉඳිද්දී මොන පැත්තෙන් බැලුවත් ඔයා ලස්සනයි..'

'මට කියන්නේ ඔයා අඬනවා බලා ඉන්න කියලද...'

WWW.EXPRESSLANKA.TK 311

'කියනව නම් හිනාවෙලා ඉන්නම්.. ඒකත් මට හොඳට පුළුවන්. දවසකුත් මං කිව්වේ..'

ඇය මොහොතකට ඔහුගේ දෙපාමත මුහුණ තැබුවාය. ආදරය කෙල්ලෙකුගේ ආත්මය සංස්කරණය කරන්නේ මොනතරම් සුන්දර ලෙසද.. එය බලා ඉන්නට ආසා හිතෙන තරම්ය. ඒ සංස්කරණ පිටපත ඔහු කුළුඳුලේම දුටුවේ චායාගේ මුහුණින්. හර්ෂණී අදක්ෂ කතුවරයෙකුගේ අවුල් වූ පිටපතක් බඳුය. එහි රසවිඳින්නට යමක් නැත. අලුතෙන් හදවතට ගතයුතු සුවඳක් නැත.

'අසංක.. අපි තව චුට්ට දවසක් මෙහෙම ආදරේ කරමු.. මේ වගේ ළංවෙලා.. මාව අමතක කරන පොරොන්දුව පිට..'

ඔහු ඉඳගෙන ඉඳිද්දීම ඇයව නැගිට්ටවා ඒ කුසමත මූළු මුහුණම තබාගත්තේය.

'මේ හැම දෙයක්ම මං දලා යන්නේ කොහොමද..'

'ජීවිතේ අපි පතන දේවල්ම වෙන්නෑ සර්..'

අසංක ඇයට පහරක් ගැසුවේ රිදෙන්නටය.

'ලස්සනට අසංක කිය කියා ඉඳලා මොකද එකපාර සර්ට මාරුඋනේ.'

'ඒක අමතක වෙයි කියලා බයට.. මං හැමදම කියන්න ඕන එහෙමනේ.. නේද සර්.. මාව ෂොප් එකෙන් කවුරු එලවයිද දන්නෑ.. සමහරවිට මැඩම් හෙට අනිද්දම මාව එලවයි.. එහෙම වෙනවානම් දුකක් නෑ.. කකුල් දෙක අල්ලලා වැඳලා යනවා.. ඒත්..'

උගුර හිරවී ගියෙන් ඇය නිහඬ වූවාය.

'ඇයි ඒත් කිව්වේ.'

'මැඩම් නැතත් කවදහරි හර්ෂණී මිස් මාව එළවයි. එදට මහත්තයෝ හිතෙන්වත් මගේ පැත්ත ගන්නෙපා හොඳේ.. මේ පිස්සු කෙල්ලට ආපු විදිහටම සළුසළ ළඟින් එකයිය තියා අවෙ නැගලා ගෙදර යන්න පුලුවන්..'

'ජීවිත කාලෙම මං ළඟ ඉන්න බැරිද චායා..'

'වෙලාවකට එහෙමත් හිතෙනවා. අර සිංදුවක තියෙනවා වගේ.. මගේ මුළු ලෝකෙම වෙනස් උනොත්.. මං දුවගෙන එනවා ඔයා ළඟට.. ඒත් ලෝකේ වෙනස් වෙන්නෑ සර්..'

'අපි වෙනස් වෙන්නෙත් නෑ වායා..'

'වෙනස් වෙන්න වෙනවා සර්.. මේ කොණ්ඩේ ඉටි වගේ.'

ඇය හිස අතගා කීවාය. සියළු දේ ගැනහිතෙන්නේ මගේය කියනා හැඟීමෙනි. එහෙත් එය මායාවකි.

'උදේ ජෙල් ගෑවා.'

එසේ කියමින් ඔහු වීදුරුවේ ඉතිරිව් තිබූ අවසන් බියර් උගුරද බිව්වේය. වායා යටි තොල හපමින් ඔහුදෙස බලා සිනාසුනාය. සරල පිරිමියෙකු ගේ ආත්මය රස විඳින්නට මොනතරම් අපූරු දේවල් ඇත්ද.. ඇය සිතුවේ ලෝබකමිනි.

'බියර් බෝතල් දෙකම බිව්වා. දැන් ඇති.. අපි යන්..'

'අද මම ගෙදර තනියම..'

'අරයා ඇවිත් බලාගෙන ඇති..'

'මොකෙක්වත් මට ඕන්නෑ.. නාළකට කිව්වා ගෙදර එන්න කියලා.'

'රෑට කෑම කාලා නේද හිදගන්නේ.'

'බබා කෑවද...'

ඔහු අහද්දී ඇය බිම බලාගෙන සිනාසුනාය. ඒ සිනහවෙන් ඇබිත්තක් ගෙදර ගෙනයා හැකිනම්.. රෑයටම පාළුවක් නැත.

'මම වේලාසනම චුට්ටක් කෑවා.. අම්මා පෙරෑත්ත කළා.'

'මොනවද උයලා තිබ්බේ..'

'කියන්නද..'

'හා..'

'කිරි මාළු හදලා.. කන්කුන් තෙල්දලා.'

ඔහුගේ මුවට කෙළ ඉනුවේ ඉබේටමය..

WWW.EXPRESSLANKA.TK 313

"බත් කටක් කාලා යන්න මං එන්නද.."

"අ..නේ..."

ජීවිතය ඒතරම් සරල වීනම් මේ හැබෑම වසන්තයකි. එහෙත් ගිම්හානයක් දෙරකඩ තබාගෙන වසන්තයක් හදවතින් විඳිය හැකිදැයි වායා නොදනී.

"එන්නද බබා..."

"වෙන දවසක එන්න.. අම්මට කියලා මං රසට උයලා තියන්නම්.."

"වෙන මුකුත් එපා.. මට ඕන කිරි මාළුයි කන්කුන් තෙල් දලයි.."

"ඔයා මාව අඬවනවා."

ඇය ඇස් පොඩි කළේ ඇඹුම්බරවය. ඒ වචන වල අඬන්නට දෙයක් තිබුණිද..

"මං පාන්දරම මැඩම්ව බලන්න එන්නද."

"හා.. පාන්දරම එන්න."

"දවල් වෙද්දි ආවොත් මාව එලවගනී. එතකොට මට දුකයි.."

ඔහු කතාකළේ නැත. නැගිටින්නට ප්‍රථම ඇය පහත්වී ඔහුගේ දෙපා සිප ගත්තාය. පාදන්තයේ සිට නහරවලට එක්වූ යමක් පසුව දක්වා වේගයෙන් ගලාඑනු ඔහුට දැනුණි. ඒ කුමක්ද..

"අද රෑත් සිංදු කිය කිය ඉන්නවද..."

"කොහොමටත් මෙහෙම ඉඳලා ගියාම නින්ද යන්නෑ වායා."

"මම නම් නිදාගන්න ආසයි.. හීනෙන් ගොඩාක් ලස්සන ඒවා පේනවා.. ඇහැරුනාම දුකයි.."

වෙන්ව යන්නට ප්‍රථම ඔහු වඩාත් ආදරණීය ලෙස ඇගේ නළලත සිපගත්තේය.

"ඇ..යි.."

ඇය හුල්ලද්දී ඔහු ඇසුවේය.

"මාත් එතනට එකක් දෙන්නද.."

වායා හිනාබරව ඇසුවාය. ඔහු නළලත වෙනුවට දෙතොල පෑවේය.

"මිහ්.. මෙතනට.. ඕවා මං දන්නෑ."

ඇය ඉහිලුම් නොදෙන ආදරයකින් ඔහුගේ නළලත් කොපුළත් ගෙලත් සිපගත්තාය.

# 31

නිලංකාත් ඡායාත් නවලෝක රෝහලේ පියගැට පෙළ නැග ආවේ දුවගෙන මෙනි. ස්වාමිදුවක මෙන් නොව අම්මා කෙනෙකු මෙන් හෘදයාංගමවූ ඇය මෙසේ රෝගීවීම යුවතියන් දෙදෙනා තුළම මහා දුකක් ඇතිකරවීය.

සුදු කොට්ටය මත මලානිකව වැටී තිබූ ඒ වියපත් කරුණාබර මුහුණ දකිද්දී දෙදෙනාටම ඇඬෙන්නට තරම්විය. සේවකයන්ට අසනීපයක් වුවද ළඟට වීත් බෙහෙත් ටික බිව්වද දරුවෝ කියා අසනා ඇයට මෙවන් දුකක් වුයේ කෙසේදැයි ඔවුන් දෙදෙනාටම සිතාගත නොහැක. දෙවියන් පවා වැඩිපුර රිදවන්නේ තමාට තරගයක් විය හැකියැයි සිතන මිනිස්සුන්ටමය.

"අනේ මගේ නෙල්ලො දෙන්නා.. ඊයේ මාව දලා කොහෙද ගියේ."

යුවතියන් දෙදෙනා දුටුවනම රණතුංග මහත්මිය ඇසුවාය.

"මැඩම්ට දැන් කොහොමද මැඩම්.. අපි ඊයේ හරියට බයවුනා. ඡායානම් ඇඬුවත් එක්ක.."

නිලංකා අවංක හඩින් කීවාය. රණතුංග මහත්මිය ඇගේ අතකින් අල්ලාගත්තාය.

"ඇයි දරුවෝ ඇඬුවේ.."

"දන්නෑ මැඩම්.. දැන් අමාරුවක් නැද්ද මැඩම්.."

WWW.EXPRESSLANKA.TK 

'නවම ටික ටික තියෙනවා කෙල්ලනේ.. කොහොමටත් මම.'

රණතුංග මහත්මිය කියන්නට ගියදේ ගිලගෙන දෑස්වල නැගුණ කඳුළු පිටි අත්ලෙන් පිසදගත්තාය.

'දැන් මට ගෙදරට වෙලා පිනක් දහමක් කරගෙන ඉන්න කාලේ ඇවිල්ලා චායා..'

'අනේ.. එහෙම වෙන්නෑ.. ටික දවසකින් ඇරිලා යයි මැඩම්..'

'හාට් කේස් එහෙම යට යන්නෑ මෝඩ දරුවෝ.. අවුරුදු විස්සක් එක දිගට වැඩ කළා. පැය හයයි නිදගත්තේ. ශරීර සනීපයක් ගැන හිතුවේ නෑ. දැන් මට එක්තැන් වෙන්න කාලේ ඇවිත්.. යන තැනකට තමයි දැන්.. ඔයාලගේ මැඩම් වැඩ කරන්නේ.'

චායාගේ ළය කීරි ගැසීගෙන යන්නට විය. මේ ආදරබර ගැහැණිය එතරම් ඉක්මණින් ජීවිතයෙන් සමුගත යුතු නැත.

'ඔහොම කතා කියන්න එපා මැඩම්..'

'ජීවිතේ ඇත්ත මේක චායා.. ඒකට පිටුපාන්න බෑ කෙල්ලේ..'

'බලන්න නිලංකා.. මැඩම්ට හිතෙන දේවල්.. මැඩම් තව කොච්චර කාලයක් අපි එක්ක ඉන්නවද..'

චායා දෑස්වල කඳුළු පුරවාගෙන නිලංකා වෙතට හැරී කීවාය.

'හැම දෙයක්ම දැන් සර් තනියම කරන්න ඕන. ඔහොම හිටියට තාම පොඩි ළමයෙක් වගේ. වගකීමක් දරන්න කැමති නෑ.'

අසංක ගැන කියද්දී චායා බිම බලාගෙන තොල්පට පෙරලා ගත්තාය. පොඩි ළමයෙක් වගේ නම් තමා.. ඇය සිතුවාය.

'සමහරවිට බැන්දම ඒ ගතිය ඇරිලා යයි. ගෙයක් දොරක් අනාගතයක් තියෙනවා කියලා කොල්ලෙක්ට හිතෙන්නේ කසාද බැන්දට පස්සේ.. එහෙම කාලෙක ඔයාලා මට වගේම ආදරෙන් ඒ දෙන්නටත් ඉන්න.. ඔයාලගේ වයසමනේ.. යාළුවෝ වගේ වැඩ කරන්න.'

චායාට ඇඬුම් ආවේ නොහිතූ 'ලෙසය. ඇය ඉකිබිඳුම් වාවාගන්නට හැකි සෑම වෙරක්ම ගත්තාය. අවසානයේ ඇය ගිලන් සයනයේ [illegible] තාය.

WWW.EXPRESSLANKA.TK 316

'ඇයි දරුවෝ මේ අඬන්නේ.. මේ කෙල්ලට මොකද වුණේ නිලංකා..'

රණතුංග මහත්මිය අසද්දී නිලංකා බියමුසුව චායා දෙස බැලුවාය. ඒ හිත ඇවිලෙන තරම් ඇය දනී. හැම වචනයක්ම ඒ පපුවට කුළුගෙඩි පහරවල් තරම් බවද ඇය දනී.

'මැඩම් ෂොප් එකේ නැතිඋනාම වැඩියෙන්ම පාළු චායාටනේ.. ඒකයි මැඩම්...'

නිලංකා ඇයව බේරාගනු පිණිස කීවාය.

'මං එන්නම් ඔයාලා බලලා යන්න.. මාවත් බලන්න එනවනේ සතියකට වතාවක් හරි..'

තම සිහින මාළිගාව මේ තරම් ඉක්මනට බිඳී වැටෙතැයි චායා සිතුවේ නැත. ඇය බලාඋන්නේ ඒ මාළිගය ටිකෙන් ටික ගරා වැටෙන තුරුය.

'ඔයාලගේ සර්ගේ පැටියෙක්ව හවසට උකුලේ තියාගෙන කුටු කව කව ඉන්න මාත් ආසයි කෙල්ලනේ. බිස්නස් නිසා මට ජීවිතේම අමතක වෙලා තිබුනේ. මට මේවා කරන්න ඔයාලා උදව් කරන්න ඕනේ.. තනියම මට බෑ.'

පාන්දරම හිත මේ තරම් අවුල්ව යතැයි චායා සිතුවේ නැත. දවස පටන් ගත්තේ හොන්ඩර ගණනක් බර ගල් ගෙඩි දෙක තුනක් පපුවට දමාගෙනය.

'සර් විතරක් නෙවේ ඔයාලත් බඳින්න ඕනේ.. මං හරි ආසයි මං ජීවත්වෙන කාලෙම ඔයාලා මනමාලියෝ වෙනවට..'

එය කෙදිනකවත් ඉටු නොවෙතැයි කියන්නට චායාට සිතුණි.

'නිලංකා දූත්ම බඳින්නේ නැත්ද නිලංකා.'

'ගෙදරින් කෙනෙක් හොයනවා මැඩම්..'

'ගෙදරින් මොකට හොයනවද.. ඔච්චරටම ඔයාට කොල්ලෙක් හොයාගන්න බැරිද..'

රණතුංග මහත්මිය චායා දෙසද බලා කීවාය.

WWW.EXPRESSLANKA.TK 317

"මං කොල්ලෝ තෝරන්න දන්නෑ.. මං තේරුවොත් පිස්සෙක් තමයි.."

වායා තිලංකාගේ කතාවට දුක්බරව සිනාසුනාය.

"වායෝ.. ඔයා.. මේකිට නම් ලස්සන කොල්ලෙක් ඇති නොකිව්වට.."

ඇගේ කතාවට වායාට යළිත් ඇඬෙන්නට මෙන් විය. "ඉන්නවා ලස්සනම ලස්සන කොල්ලෙක් ඉන්නවා.." ඇගේ දිවග තිබුනේද එවදන්ය.

"මං අම්මත් එක්කම තනියමම ඉන්නවා මැඩම්.."

වායා දෙඩන්නේ ආත්මානුකම්පාවෙන් බව තිලංකා දනී.

"ඔන්න කිව්වා කතාවක්.. අම්මලා හැමදම ඉන්නවයැ ළමයො.."

"වායා කවදාවත් බඳින්නෑලු මැඩම්.."

"ඇයි අර.. සසර කළකිරිලද.. මේවගේ රෝස මලක් කවුද වාස් එකට දානොගන්නේ.. මේකිගේ බොරු.."

රණතුංග මහත්මියගේ නිරීක්ෂණය හරිය. ඒ රෝස මල වැටී තිබුනේ කුමාරයෙකුගේ මල් බඳුනටය. ඒ බඳුනේ සදකාලිකව රැඳෙන්නට තරම් පිනක් ඒ මලට නැත.

"අර රන්තරු ගාමන්ට් එකේ පර්චසින් මැනේජර් මං බලාගෙන වායා දිහාම බලං ඉන්නවා. මිනිහා හොඳ කොල්ලා.. මං කතා කරන්නද.."

වායාගෙ පපුව සීතල විය. පර්චසින් මැනේජර් තමා දෙස බලා ඉන්නවා දුටු ඇය එකම කාමරයේ ඉන්නා අසංක තමා දෙස බලා සිටිනු නොදක්කා පුදුමය.

"මේ ජීවිතේ හොඳයි මැඩම්.. නිස්කලංකයි."

"ඔහොම හිතන්න එපා දරුවෝ.. ගෑණු ළමයෙකුට ඔයා හිතන විදිහට නොබැඳ ඉන්න බැහැ."

"මැඩම් උදේට කෑවද මැඩම්.."

ඇය කතාව වෙනතකට හරවනු පිණිස කීවාය.

"මම ඔයාලා එක්කම කන්නම්.."

WWW.EXPRESSLANKA.TK 318

වායා හැකි පමණින් රෝහල් කාමරය අස්පස් කළාය. සියල්ලටම වඩා හිත අද හැඩිවී ඇතැයි ඇයට සිතුණි.

නොසිතූ මොහොතක රෝහල් කාමරයේ දොර ඇරුණි. ඉන් ඇතුළු වූ මුහුණු දෙක දැක වායාගේ නෙත් ඉබේටම පහළට බරවිය. මුළු ගතම නටන උණුවතුර බේසමකින් නෑව්වාක් බඳුව දැවෙන්නට විය.

මුලින්ම හර්ෂණීත් පසුව අසංකත් ඇඳ අද්දරට ආවෝය. වායා තිලංකාත් සමග පසුපසට වූවාය. දූත් දූත් තමන්ව එළවාවි යැයි ඇයට සිතුණි.

'මගේ ලේලි පොඩ්ඩ එහෙනම් මට ආදරෙයි.. අනේ උදෙන්ම මාව බලන්න ඇවිත්..'

රණතුංග මහත්මිය හර්ෂණීගේ අත අල්ලාගෙන කීවාය. කාමරය තුළ හුස්ම ගන්නටවත් බැරි සෙයක් ඇයට දැනුණි. වායා අසරණව තිලංකා දෙස බැලුවාය. ඇය උන්නේද වායා මෙන්ම අසරණවය.

'අම්මා අද ෂොප් එක අරින්නද..'

අසංක පහත් හඬින් ඇසුවේය. ඒ කටහඬ අසරණයැයි වායාට සිතුණි. ඇයට පෙරදින රාත්‍රිය සිහිවිය. ඒ රැයත් මේ උදෑසනත් අතර ඇත්තේ මොනතරම් පරතරයක්ද..

'මේ සීසන් දවස් වල වහලා දාන්න ඔයාට පිස්සුද පුතා. යන්න උදෙන්ම ගිහිල්ලා අරින්න.. අද මේ කෙල්ලවත් දවසම ෂොප් එකේ තියාගන්න.. ඔයත් මැණික මේවා බලා කියාගන්න ඕන දූත්.. අසංකයියාව විතරක් බලාගෙන මදි.'

රණතුංග මහත්මිය කීවේ කරුණාබර හඬිනි. ඉක්මනටම මෙතනින් ගියහොත් මැනවැයි වායාට සිතුණි. රැඳෙන්න රැඳෙන්න වේදනාව වැඩිය.

'මං චුට්ට වෙලාවක් ඉන්නම්.. දවල් මට වැඩක් තියෙනවා ඇන්ටි..'

අසංක හොරැහින් වායා දෙස බැලුවේය. වායා සිනාසුණේ අඩන්නට බැරිකමට බව අසංක දැන උන්නේය.

WWW.EXPRESSLANKA.TK 319

'එහෙනම් යතුරු ආ.. චායායි නිලංකයි ගිහිල්ලා ෂොප් එක අරින්න..'

අසංක අත රැඳි යතුරු කැරැල්ල ඇය වෙත පා කීවේය. එහෙත් ඒ යතුරු කැරැල්ල ගත්තේ හර්ෂණීය. චායා ඉහළට ගත් අත පහතට හෙලා ගත්තාය.

'නෑ එපා.. දැන් අපිත් යනවනේ..'

'මං හිතුවේ අද ෂොප් එක වහලා දන්න..'

අසංක අම්මා දෙස බලා කීවේය.

'එපා පුතා.. එන කස්ටමස්ලා හැරිලා යයි.. ඒක හොඳ නෑ.'

සාප්පුව එක දවසකට හෝ වසා තබනවාට චායාද අකමැති වූවාය. ජීවිතයට සැනසීමක් දෙන එකම තැන ඒ පියසය. මේ සිදුවෙමින් යන්නේ එයද අපායක් වීමය.

'අපි මොනාද කරන්නේ සර්..'

නිලංකා ඉන්නට බැරිම තැන ඇසුවාය.

'අසංකයියා මෙයාලව යවල ඉන්න.'

හර්ෂණී එසේ කියමින් සිය ජංගම දුරකථනය අතට ගෙන එබුවාය. චායා.. අසංකගේ දෙනෙතට දෙනෙත මුණ ගැසෙතැයි බියෙන් දෙනෙත් බිමට බර කරගෙන රණතුංග මහත්මියගේ හිස අද්දරට ආවාය.

'මැඩම් ආස දෙයක් තියේනම් කියන්න.. මං හදගෙන එන්නම්..'

'අනේ පැටියෝ.. මං ගෙදර ආවම අම්මට කියලා කොහෙල් කොළයක හොඳ ගමේ බත් එකක් හදලා ගෙනත් දෙන්න.'

රණතුංග මහත්මිය උණුවී ගිය හඩින් කීවාය.

'හැමදම ගේන්නම් මැඩම්..'

'පැයෙන් පැයට කැෂියර් වෙක් කරන්න චායා.. සර්ට කොච්චර කිව්වත් මතක නෑ. පනස්දහ පැනපු ගමන් බැංකුවට යවන්න.'

'මං කරන්නම් මැඩම්.. මැඩම් රෙස්ට් කරන්න.. අසනීප වෙලත් ඒවම හිතනවා.'

WWW.EXPRESSLANKA.TK 320

'තොහිතා කොහොමද රත්තරනේ..'

හර්ෂණී එහා කෙළවරින් ඇඳ සමීපයට ආවාය.

'කෑෂ් හැඩ්ල් කරන්න කෙනෙක් ගන්නනම් හරිනේ ඇන්ටි.. එකවුන්ටන් කෙනෙක් හොඳ සුදුසුකම් තියෙන.. මෙයාලා මොනවා දන්නවද..'

හර්ෂණී කීවේ සෙලියුලර් දුරකථනය රැඳි සුරත වායා දෙසට දික්කරය.

'වායා මෙහාට එන්න.'

අසංක උස් හඬින් කතා කළේ හර්ෂණී කියූදේ ඇසීය. ඔහුගේ හඬ තුළ කෝන්තියක් විනැයි වායාට සිතුණි.

'මේ චෙක් දෙක බැංකුවට දන්න. මෙන්න මගේ සෙට් කාඩ් එක. ඒකෙන් රුපියල් විසිදහකුත් අරගෙන ඔෆිස් එකට යන්න.. මං එන්නම්.'

වායා අසංක අතවූ චෙක්පත් දෙකත් ඔහුගේ බැංකු කාඩ් එකත් සුරතට ගත්තාය.

'සර් සීක්‍රට් නම්බර් එක.'

වායා පහත් හඬින් ඇසුවාය. අසංක නිහඬව පර්ස් එක ඇර එහි තිබූ කොළ කැබැල්ලක අංකය ලියා දුන්නේය.

'අපි යන්නම් මැඩම්..'

'හවසට බස්වල රස්තියාදු වෙලා මාව බලන්න එන්න එපා කෙල්ලනේ.. රෑ නොවී ගෙදර යන්න.'

ඇගේ කාරුණිකත්වයට සියල්ල අමතක වෙයි. නෑකම් අවශ්‍ය නැත. ජීවිතය පුරා මෙහෙකාරියක සේ ඇය ළඟටවී උන්නද සිතට සහනයකි.

'යන්නම් මිස්..'

වායා හර්ෂණී දෙස බලා කීවාය. ඇය යන්නම් හිස දෙපසට වැනුවා පමණි. වායාත් තිලංකාත් ගිය පසු හර්ෂණී අසංක දෙස බැලුවේ කෝපයෙනි.

'[illegible] නිකම් කෙල්ලන්ටත්

WWW.EXPRESSLANKA.TK 321

සෙට් කාඩ් එක දෙනවා. සීක්‍රට් නම්බර් එකත් ලියලා දෙන්න... උන් මොක්කුද.. සල්ලි ඉල්ලුවා නම් මම දෙනවා.'

අසංක අම්මා දෙසද බලා සුසුමක් හෙළුවේය. වායා සමඟ කවර ආකාරයක සම්බන්ධයක් තිබුණද ඔවුන් ව්‍යාපාරයේ අවංකම සේවකයින්ය. එසේ සිතන්නට ඔහුට හුරුකළේ අම්මාමය.

'ඒ කෙල්ලෝ එහෙම කරන්නෑ හර්ෂණී.. අද වෙනතුරු සත පහක වංචාවක් ඔය ෂොප් එකේ වෙලා නෑ..'

රණතුංග මහත්මිය තිවී ගිය හඬින් කීවාය. හර්ෂණී තොල්පිට පෙරළා අසංක දෙස බැලුවාය.

'මංද.. මට පරක්කු වෙනවා.. මං යනවා. මෙන්න ඔෆිස් එකේ යතුර..'

'ඇයි දූන් දූවත් ෂොප් එකට යනවා කිව්වනේ.'

'මං නැතුවට ඔය ඉන්නෙ විශ්වාසවන්ත අය ඕනතරම්.. මට ජූඩිගේ සැලොන් එකට යන්න ඕන. මාව ඩ්‍රොප් කරගෙන යනවද..'

අසංක අම්මා දෙස බැලුවේය. හදවතට අමුණන්නට යන්නේ මේ ජීවිතය නොවේදැයි ඔහු මවගෙන් ප්‍රශ්නකළේය.

'සැලෝන් එකට මොකද හර්ෂණී හදිස්සියේ..'

'මේ කොණ්ඩේ මට කැතයි ඇන්ටි.. හිතුවේ ස්පයිඩ පර්ම් කරගන්න. හාෆ් ටින්ට් එකකුත් කරලා.'

අසංක අම්මගෙන් නෙත් වසන් කරගෙන බිත්තියට සිනාසුනේය. ස්..පා..යි..ඩ.. ප..ර්..ම්. ඔහු හිතින් මිමිණුවේය.

'අනේ දරුවෝ ඔය කොණ්ඩේ ලස්සනයිනෙ. මං දැක්කා කරිෂ්මාගේ ෆිල්ම් එකකත් එයා ඔය වගේ ලස්සනට දාගෙන ඉන්නවා. අනික කොණ්ඩෙට ඔය අනං මනං කළාම වෙඩින් දවසට අමාරුයිනේ..'

අසංක මේ කතාවට සම්මාදම් වූයේ නැත. ඔහුට වායාගේ කොණ්ඩය සිහිවිය. එය උරහිසින් මදක් පහළට වැටුන තට්ටු තට්ටු කොණ්ඩයකි. ඇය ඇවිදිද්දී.. සිනාසෙද්දී ඒ කොණ්ඩය ඇගේ මුහුණ අනුව ඒ පැත්තට මේ පැත්තට වැටෙයි. ඒ ලාලිත්‍යයට ඔහු අපමණව

WWW.EXPRESSLANKA.TK 322

ආශා කළේය.

'මම වෙඩින් එකට අඳින්නේ වෙස්ටන් ඩ්‍රෙස් එකක් නිසා ඒක හොඳයි ඇන්ටි..'

රණතුංග මහත්මිය සිනාසුණා පමණි.

'මං දන්නෑ ඔයාලා දෙන්නට ආස විදිහක්.. මොනවා කළත් ලස්සනට ඉන්න.'

'අම්මා මොනවද දවල්ට කන්නේ.. මම සූප් එකක් ගේන්නද..'

'එපා පුතා.. ඔයා ෂොප් එක බලාගෙන ඉන්න..'

හර්ෂණීත් අසංකත් නවලෝක රෝහලේ පියගැටපෙළ බැසගෙන ආවේ නිහඬවමය.

'කොහනින්ද ඔයාව දන්න ඕන හෂී..'

'සැලෝන් එක ගාවින්.'

අසංක හර්ෂණීගේ දනට ඇති කොණ්ඩය හිතින් වෙනස් කර බලන්නට උත්සාහ ගත්තේය. දන් ඇති කොණ්ඩයට ඇය සුන්දරය. කෙළිලොල් දඟකාර බවක් ඒ තුළින් මතුවේ.

'හවසට මට ඇන්ටිව බලන්න එන්න වෙන්නෑ අසංකයියා..'

'ඇයි..'

එය දනගන්නට තිබූ ආසාව නිසා නොව කටට ආ නිසා අසංක ඇසුවේය.

'මට බර්ත් ඩේ පාටියක් තියෙනවා.. එනවද..'

'ඔයා යන්න.. මගේ ඔළුවේ කරදර..'

'මාස හයක් දෙන්නම්.. ඔය කරදර පැත්තක තියලා ටිකක් වෙනස් වෙන්න.. නැත්නම් ලයිෆ් එකම බෝරින්...'

'කරදර තිබ්බයි නොතිබ්බයි කියලා නෑ.. කොහොමත් මේක තමයි මගේ ජීවිතේ හැටි හෂී.. ඒක වෙනස් වෙන්නෑ..'

'එහෙනම් මටත් වෙනස් වෙන්න ඕන නෑ.'

'මං කිව්වත් නැතත් ඔයා වෙනස් වෙනවනේ හෂී.. දන් ඔය ලස්සනට තියෙන [illegible] යන්නේ [illegible]

www.EXPRESSLANKA.TK 323

අහලද.. වෙනස් වෙන්න ඕන නිසානේ.. නෝ ප්‍රොබ්ලම්.. යූ කැන් චේන්ජ්.. ඉෆ් යූ කැන්.. අයි නෙවර් ඉන්වෝල් දට්.. ප්ලීස් ලීව් මී අලෝන්..'

ඔහු ඇතිවූ කෝන්තියට ඉංග්‍රීසියෙන්ම කියාගෙන ගියේය. ඇගේ ඔළුවට සමහර දේවල් වැදෙන්නේ එසේ කියූවිටය.

'සොරි.. ඒත් මම ආස දේවල් මං කරන්න ආසයි.'

'රයිට් කරන්න.. ඔන්න ඔයාගේ සැලෝන් එකට ආවා..'

'බායි.. මං රෑට ෆෝන් කරන්නම්.'

හර්ෂණී අසංකගේ උරහිසට සුරත තබා කියා බැස ගියාය. ඔහු මද වේලාවක් ඇය යන අයුරු බලා උන්නේය. අසංක වාහනය ඉදිරියට ගත්තේ ඇය රූපලාවන්‍යාගාරයේ කළු වීදුරුව අතරින් නොපෙනී ගියාටත් පසුය.

# 32

ඒ සතියේම වායාත් අසංකත් කාර්යාල කාමරයේ තනිවිය. දෙදෙනාටම කිසිඳු වැඩක් කරගන්නට නොහැකිවිය. එහෙත් හැම විටකම වායා ගනුදෙනු වලදී පරිස්සම් වූවාය.

'බබා මෙහේ එන්න..'

ඔහු ඇතැම් විටක මහ හයියෙන් කෑගසයි. වායා නැගිටින්නේ මේසයෙන් වටපිට බලා සිනහව සඟවාගෙනය.

'මෙහේ බබාලා නෑ සර්.. කෑගහන්න එපා.'

'මෙතනට එන්න.'

ඔහු ඔහුගේ ආසනයේ වම් පැත්ත දෙස බලා කියයි. වායා සිනාබරව හිස දෙපසට හැරවූවාය.

'බෑ..හෑ..'

'කිව්වාම එනවා.'

WWW.EXPRESSLANKA.TK 324

ආශා කළේය.

'මම වෙඩින් එකට අඳින්නේ වෙස්ටන් ඩ්‍රෙස් එකක් නිසා ඒක හොඳයි ඇන්ටි..'

රණතුංග මහත්මිය සිනාසුණා පමණි.

'මං දන්නෑ ඔයාලා දෙන්නට ආස විදිහක්.. මොනවා කළත් ලස්සනට ඉන්න.'

'අම්මා මොනවද දවල්ට කන්නේ.. මම සූප් එකක් ගේන්නද..'

'එපා පුතා.. ඔයා ෂොප් එක බලාගෙන ඉන්න..'

හර්ෂණීත් අසංකත් නවලෝක රෝහලේ පියගැටපෙළ බැසගෙන ආවේ නිහඬවමය.

'කොහතින්ද ඔයාව දන්න ඕන හෂී..'

'සැලෝන් එක ගාවින්.'

අසංක හර්ෂණීගේ දනට ඇති කොණ්ඩය හිතින් වෙනස් කර බලන්නට උත්සාහ ගත්තේය. දන් ඇති කොණ්ඩයට ඇය සුන්දරය. කෙළිලොල් දඟකාර බවක් ඒ තුළින් මතුවේ.

'හවසට මට ඇන්ටිව බලන්න එන්න වෙන්නෑ අසංකයියා..'

'ඇයි..'

එය දනගන්නට තිබූ ආසාව නිසා නොව කටට ආ නිසා අසංක ඇසුවේය.

'මට බර්ත් ඩේ පාටියක් තියෙනවා.. එනවද..'

'ඔයා යන්න.. මගේ ඔළුවේ කරදර..'

'මාස හයක් දෙන්නම්.. ඔය කරදර පැත්තක තියලා ටිකක් වෙනස් වෙන්න.. නැත්නම් ලයිෆ් එකම බෝරින්...'

'කරදර තිබ්බයි නොතිබ්බයි කියලා නෑ.. කොහොමත් මේක තමයි මගේ ජීවිතේ හැටි හෂී.. ඒක වෙනස් වෙන්නෑ..'

'එහෙනම් මටත් වෙනස් වෙන්න ඕන නෑ.'

'මං කිව්වත් නැතත් ඔයා වෙනස් වෙනවනේ හෂී.. දන් ඔය ලස්සනට තියෙන කොණ්ඩේ මතුළු දාල් කරගන්න යන්නේ මගෙන්

WWW.EXPRESSLANKA.TK 325

අහලද.. වෙනස් වෙන්න ඕන නිසානේ.. නෝ ප්‍රොබ්ලම්.. යූ කැන් චේන්ජ්.. ඉෆ් යූ කැන්.. අයි නෙවර් ඉන්වෝල් දැට්.. ප්ලීස් ලීව් මී අලෝන්..'

ඔහු ඇතිවූ කෝන්තියට ඉංග්‍රීසියෙන්ම කියාගෙන ගියේය. ඇගේ ඔළුවට සමහර දේවල් වැදෙන්නේ එසේ කියූවිටය.

'සොරි.. ඒත් මම ආය දේවල් මං කරන්න ආසයි.'

'රායිට් කරන්න.. ඔන්න ඔයාගේ සැලෝන් එකට ආවා..'

'බායි.. මං රෑට ෆෝන් කරන්නම්.'

හර්ෂණී අසංකගේ උරහිසට සුරත තබා කියා බැස ගියාය. ඔහු මද වේලාවක් ඇය යන අයුරු බලා උන්නේය. අසංක වාහනය ඉදිරියට ගත්තේ ඇය රූපලාවන්‍යාගාරයේ කළු වීදුරුව අතරින් නොපෙනී ගියාටත් පසුය.

# 32

ඒ සතියේම වායාත් අසංකත් කාර්යාල කාමරයේ තනිවිය. දෙදෙනාටම කිසිඳු වැඩක් කරගන්නට නොහැකිවිය. එහෙත් හැම විටකම වායා ගනුදෙනු වලදී පරිස්සම් වූවාය.

'බබා මෙහේ එන්න..'

ඔහු ඇතැම් විටක මහ හයියෙන් කෑගසයි. වායා නැගිට්ටින්නේ මේසයෙන් වටපිට බලා සිනහව සඟවාගෙනය.

'මෙහේ බබාලා නෑ සර්.. කෑගහන්න එපා.'

'මෙතනට එන්න.'

ඔහු ඔහුගේ ආසනයේ වම් පැත්ත දෙස බලා කියයි. වායා සිනාබරව හිස දෙපසට හැරවූවාය.

'බෑ..හෑ..'

'කිව්වාම එනවා.'

අසංකාට කේන්තිය පිටකළ නොහැක. එවිට ඔහුගේ මුහුණ විකාරයකි. ඒ විප්ලුළු බව බලන්නට චායා ආශා කළාය.

'ඇයි..'

ඇය මේසයේ වම් දරය අසළට විත් අසාන්තිය. ඔහු ඇගේ අත රැගෙන සිපගත්තාය. තිය ආලේපනයක් නැතුව වුවද ඒ දෑත සුන්දරය.

'කෝ කියුවෙක්ස්..'

'මම ඔක්කොම ඇරියා..'

'ඇයි..'

'හැමදම ගාන්න මං ආස නැහැ..'

'අද මොන සබන්ද ගෑවේ.'

ඔහු ඇගේ පිටි අත්ල සිප ඇගෙන් ඇසුවේය. ඒ හැම චාරයකම ඇගේ පසුව හිරිවැටී ගියේය.

'කොහොඹ..'

'ඔළුවට.. ෂැම්පූ දැම්මද.'

'දැ..ම්..මා..'

ඇය කියන්නේ සිනහව තද කරගෙනය. ඔහුට ඕනා දෙයකුත් නැත. එපා දෙයකුත් නැත.

'චුට්ටක් පාත් කරන්න.'

චායා ඔහුගේ මේසය පැත්තට හිස නැඹුරු කළාය. ඔහු ඒ තවමත් තෙත්ව තිබූ කොණ්ඩය සිපගත්තේය.

'මේ මොනාද ෂැම්පු එකක්ද..'

'වතිකා කියලා ආයුර්වේද එකක්..'

ඔහු එය කියූ පසුත් බලා උන්නේය.

'තව මොනවද සර්ට දැනගන්න ඕනේ.'

'දැනගන්න ඕන එක කිව්වොත් ඔයා මට බණීං..'

'එහෙනම් අහන්න එපා..'

තවත් දවසක චායා හිස් ෆයිල් කවරයට නැඹුරු කරගෙන

ලැයිස්තුවක් හදමින් උන්නේය. ඒ වෙද්දී අසංක පහළ ප්‍රදර්ශනාගාරයට ගොස් උන්නේය. කිසිවෙකු පිටුපසින් පැමිණ අත් යටින් අත දමා තමාව වැළඳ ගනිද්දී ඒ ඔහු බව ඇය තේරුම් ගත්තාය.

"ඇ...යි... මේ.."

වායා පහත් හඬින් ඇසුවාය.

"ගොඩාක් වෙලා බලන් හිටියා.. අල්ලල මිරිකන්න තරම් ආදරයක් ආවා.."

"මිරිකලා මිරිකලා මාව මරලා දාන්න බැරිද.."

ඔහු තවමත් ඉන්නේ පිටුපසින් ආ අයුරින්ම ඇගේ උරහිසත් ගෙළත් අතර මුහුණ තබාගෙනය.

"අනේ ඇයි අද රැවුල කැපුවෙ නැත්තේ.."

"වවන්න කියලා ඉන්නේ.."

"දි..ග..ට.."

"ම්.."

"අනේ එපා.."

වායා අතවූ පෑනෙන් හිස් කොළය මත ඉරි අඳිමින් කීවාය. ඔහු මෘදුලෙස දෙතොල් ඇගේ කුඩා කන්පෙති අතර තැබුවේය. ඒ පැත්තම කිතිකැවී ගියෙන් ඇය ඇඹරුනාය.

"එකක් අහන්නද..."

ඔහු ඔහුගේ රැවුල් කොට ඇගේ ගෙළ අතර තවරා ඇසුවේය.

"දෙක තුනක් අහන්න.. මේ මූණ වුට්ටක් අරගෙන.. මට කිති.."

"මෙච්චර ලස්සන උනේ කොහොමද.."

"මම ලස්සනයැ.."

"ඔන්න පිස්සු කියවනවා.. බලාගෙනම ඉන්න හිතෙනවා වෙලාවකට.. රඟපාන්න ආස නැත්ද.."

"කියන එක්කෙනාට නම් පුළුවන් උදව් කරන්න."

වායා එසේ සිතුවේ ගණනකට නොගෙනය. ඔහුගේ මුවින් සුසුමක් පිටවූයේ ඇයි..

"ඔබට හිතෙන්නේ මං රඟපානවා කියලද.."

WWW.EXPRESSLANKA.TK 328

"අ..නේ.. මං එහෙම හිතලා කිව්වෙ නෑ.. මොනවද මේ කියන්නේ, සනත් ගුණතිලක වගේ නිසා කිව්වේ.. ඇයි මං ගැන එහෙම හිතන්නේ."

"මං ජීවිතේ රඟපාන්න ආය නැහැ බබා.. මට එපාවෙලා තියෙන්නෙ මේ ජීවිතේ.."

ඔහු මේ තරම් කලකිරීමෙන් කතා කරන්නේ ඇයි.. ජීවිතය කොහොමටත් දුකක් බව සැබෑය.

"මං හිතුවා සතුටින් ඇති කියලා.. මූණ හරි පින්පාටයි මේ දවස්වල.. වෙලාවකට.."

ඇය කියන්නට ගියදේ ගිලගත්තාය.

"මොනවද.. වෙලාවකට.."

"නෑ මුකුත් නෑ.."

"කියපන් කෙල්ල.. වෙලාවකට මොනවද හිතෙන්නේ.."

ඔහු වඩාත් ළංව ඇසුවේය. ඔහුගේ දෑස් ඇත්තේ ඇගේ මුව අද්දරය. මේ දෙතොලතර වදින්නේ ඒ ඇස් පිහාටුය.

"කියන්න මැණික.."

"ඉඹගෙන ඉඹගෙන යන්න හිතෙනවා."

"ඉකිත් ඇයි ඉඹින්නැත්තේ.."

"ජීවිතේ බර මට ටික ටික දැනෙනවා සර්.. වෙලාවකට උහුල ගන්න බැරි විදිහට ඒක දැනෙනවා."

"මටත් එහෙමයි බබා.."

"කවදද සර් අපි සැහැල්ලුවෙන් ඉන්නේ."

"දන්නෑ චායා.."

ඔහු ඇගේ උරහිස් සිපගත්තේ සුසුමක්ද සමඟය.

"මේ ඒක නෙවේ අලුතෙන් ගෙනාපු පැන්ටීස් හරියට යනවනේ.. දැන් ෆෝර්ටි ඩයත් විතර කරලා.. පුදුමයි.."

අසංක චායා දෙස බලා කීවේ දෙනෙත් ලොකු කරගෙනය. චායා වමතේ ඇඟිලි තුඩු වලින් සිනාබර මුව වසාගත්තාය.

"ඇයි [illegible]

WWW.EXPRESSLANKA.TK 329

ඔහු මේසයට පාත්වී ඇසුවේය.

'දනගන්නම ඕනද..'

ඇය දෙනෙත් ඔහුගේ මුහුණ මතට පා කළාය.

'ම්..'

'ඒක ඇන්දම.. ඇඟට.. හරි.. සනීපයි.. හරිද.. ඒ වගේ පැන්ටීස් අඳින්න ගර්ල්ස්ලා ආසයි..'

ඔහු බැරෑරුම් ලෙස හිස වැනුවේය. වායා පුදුම වී බලා උන්නාය. ඔහු කාමරයට නොගොස් පහළ ප්‍රදර්ශනාගාරයට යළිත් ගියේය. ගිය ඉක්මනින් ඔහු නැවත උඩට ආවේය.

'ආ..'

වෙනත් කාන්තා ඇඳුමක් යට සඟවාගෙන ලා රෝස පැහැගත් යට ඇඳුම් කිහිපයක් ඔහු ඇය වෙත පෑවේය. සිනාසෙන්නද හඬන්නද කියා ඇයට තේරුමක් නැත.

'මටද..'

'ඔව්.. ඇයි සනීපයි කිව්වේ.'

'මං ගන්න කියලා උන්නේ.'

'ඇයි ආස දෙයක් මගෙන් ඉල්ලන්නැත්තේ.. ඉල්ලන්න ඕනෙත් නෑ.. අරගෙන යන්න.'

'ආස දෙයක් එන්නේ ඉඳ හිටලා.. ඒ ආවම මං මැඩම්ට කියලා පඩියෙන් කැපෙන්න ගන්නවා.'

'හෙටම මේක ඇඳගෙන එනවද..'

'ම්..'

'සනීපෙට ඉඳී එහෙනම්..'

ඔහු ඇගේ නහය තරමක් වැරෙන් මිරිකා තම පුටුව වෙත ගියේය. වායා දැස්වල නැගුණු කඳුළු වලට ඔහේ ගලායන්නට දී ඔහු ගෙනා යට ඇඳුම් කිහිපය පිළිවෙලට නැව්වාය. ඊටත් පසු ඇය යට ඇඳුම් දෙකක් නිලංකාට දෙන්නට ගත්තාය.

'මාත් ගන්න හරි ආසාවෙන් උන්නේ.. ඒත් යට ඇඳුමකට

WWW.EXPRESSLANKA.TK 330

එච්චර වියදම් කරන්න බැරි නිසා උන්නේ.'

තිලංකා ඇය වෙත පෑ යට ඇඳුම් දෙක ආශාවෙන් බැගයේ දමාගත්තාය.

'මේ දවස් ටිකට උඹ ලස්සන වෙලා.. මේ කුරුලෑ දෙක තුනකුත් ඇවිත්..'

චායා නෙත් බිමට බරකරගත්තේ ලැජ්ජාවෙනි.

'ලස්සන දවස් කීයකටද කියලා හරි බයයි තිලංකා..'

'ඔයයි සර්රුයි ආදරේ කරන හැටි බලලා සතුටු වෙනවා ඇර මටත් ඉන් එහාට දෙයක් හිතන්න තේරෙන්නෙ නෑ චායා..'

'මේ දවස් ටිකේම හරියට හිතාවුනා. ළඟදීම අඬන්න වෙයි කියලා මට හිතෙනවා.'

'හිතාවෙද්දි හිතේ තිබ්බ ශක්තියම අඬද්දීත් තියාගනින්.. ඊයේ අම්මා එක්ක පන්සල් ගියාද..'

'ගියා.. ගියා.. හිතනම් පන්සලේ තිබ්බා වගේ සැහැල්ලුයි චායා වෙලාවකට.. වෙලාවකට උහුලගන්න බැරි තරම් බරයි.'

'හවසට මැඩම් බලන්න යන්..'

'යන්. මූණ දකින්නැතුව මටත් පාළුයි..'

චායා නැවත ආවේ අසංකට චොක්ලට් කිරි එකක්ද සාදගෙනමය. අසංකට චොක්ලට් කිරි බොන්නට පුරුදු කළේ චායාය. කිරි තේක හඳ එයට චොකලට් කුඩු ටිකක් කලවම් කරගත්විට එඩාක් රසය.

ඔහු උන්නේ මේසයේ බැරෑරුම් කල්පනාවකය. කැල්කියුලේටරයක් ඔබමින් අසංක කල්පනා කරන්නේ බැරෑරුම් දෙයක් වියයුතුයැයි චායාට සිතුණි. ඇය තේක රැගෙන ගොස් ඔහුගේ මේසයේ කොනක තබා ඒ මුහුණ දෙස බැලුවාය.

'ස..ර්..'

ඇය කල්පනාවෙන් ඔහුගේ මුහුණ පරීක්ෂා කළාය.

'මොකක්ද සර් ප්‍රශ්නේ.'

ඔහු දුක් විඳිනවා දකින්නට ඇය කැමති නැත. ඒ මූහුණ පිපී

WWW.EXPRESSLANKA.TK 331

ඇත්තේ සිනාවටමය.

'ප්‍රශ්නයක් නෙවේ චායා.. ගිය පාර රන්තරු ගාමන්ට් එකෙන් ගත්තේ අර සුදු ලේඩීස් කමිස තුන්සීයක්..'

'ඉතින්.. ඒක යන්නෑ නේද..'

'ඒකනේ.. මම මේ දැන් දිල්හාන්ට කතාකළා. එයා කියනවා ඒක මාරු කරන්නත් අමාරුලු.. රුපියල් හතළිස් දහක් විතර වතුරේ.. මං හිතුවා සීසන් එකට යයි කියලා.. ඒත් නෑ.. අම්මා දැනගත්තම මටත් බණී.. මම කියලා උං ඒක දලා ගියේ.'

ඇගේ හිත ඔහු කෙරේ උපන් අපරිමිත ප්‍රේමයෙන් වෙළී ගියේය. ඇය ඔහුගේ මේසයේ අද්දරට පැමිණ ඔහුට හදගෙන ආ කිරි එක දුන්නාය. ඊටත් පසු මේසයට බරවී මොහොතක් ඒ තළල ඇඟිලි තුඩුවලින් පිරිමැද්දය.

'ඕක තිවෙන්න කලින් බොන්න.. මම ගිහිල්ලා බලන්නම්.. චූටි ප්‍රශ්නයක්..'

ඇය කරුණාබරව කියා පහළට ගියාය. ඇය ගොස් නැවතුනේ පහළ කවුන්ටරයේ අනූෂා ළඟය.

'මොකද ළමයෝ අඩන්න වගේ.'

අනූෂා දුකෙන් සිටිනු දැක චායා ඇසුවාය.

'අද මෙන්සස් මිස්.. හරි අමාරුයි මෙතන හිටගෙනම ඉඳලා.. කලන්තෙත් වගේ.'

චායා අනුකම්පාවෙන් ඇයදෙස බැලුවාය. ඒ දින කිහිපයේ අමාරු වන දවස් අනන්තවත් ඇත. එක දිගට පැය දහයක් දොළහක් හිටගෙන සිටීම ඒ දිනවල පහසු නැත.

'යන්න උඩට ගිහිල්ලා නාලිකා ළඟට වෙලා ඉන්න.. මං කෝපි එකක් හදලා දෙන්නම්.'

'කමක් නැද්ද මිස්..'

'දුවන්න දුවන්න.. වේලාසන කියන්න එපායැ..'

'අනේ මිස්ට පින්.. මම හරි අමාරුවෙන් උන්නේ.'

WWW.EXPRESSLANKA.TK 332

අනුෂා ගියේ යටිබඩට අතක්ද තබාගෙනය. දුප්පත්කම නිසා නොවේනම් ඔවුන් මෙසේ දුක් නොවිඳිනු ඇත. චායා මෙන්ම අනුෂාද එකම දෛවයක් පතා ආ අය නොවේද..

චායා අනුෂාව යවා විලාසිතාගාරය පුරා ඇවිද්දය. තරමක සෙනඟක් එහි විය. උඩ ඉඳිද්දී පහත මාලය මේ තරම් කාලගෝට්ටියක් බව ඇයට අමතකව යයි. මිනිස්සු ඇඳුම් තෝරන අතරවාරයේ චායා ඇගේ බිත්ති සැරසිල්ල දෙසද ආශාවෙන් බලා උන්නාය. ඇය යටි සිතින් අපමණ සතුටක් වින්දය. ඒ තමාගේ නිර්මාණයක් යැයි එහෙම බලන කෙනෙකුට කියන්නට තරම් ආශාවක් ඇයට ඇතිවිය.

චායා අසංක දුටන්නේ නෑ යැයි කියූ සුදු කමිසය අතට ගත්තාය. හියැක ලෙසම ඔහු රන්තරු ගාමන්ට් එකට අභූවන්නට ඇත. ඔවුන් ආනයනය කළ වැඩකට නැති කමිස තොගයක් අසංකගේ පිට පටවරා ඇත.

චායා සුදු කමිසයක් අතට ගත්තාය. එහි කිසිදු ආකර්ශනයක් නැත. එය නොවිකිණෙන එක අහන්නටත් දෙයක් නොවේ. අද කාලයේ යුවතියක් මේ තරම් චාම් වීමට කැමති නැත. පුද්ගලිකව චායා ඒ සුදු කමිසයට ආශා කෙරුවාය. ලා නිල් පැහැගත් ඩෙනිම් ජීන්ස් කලිසමකට එය වඩාත් සුන්දරය...

විලාසිතාගාරය පුරාම ඇවිද ගොස් චායා සුදු කමිසය සමඟ ගැලපිය හැකි ඇඳුම් රොත්තක් සොයා ගත්තාය.

'අනේ කෙල්ලේ යන් මේ ටිකත් අරගෙන මා එක්ක උඩට..'

ප්‍රමුදි චායා බඳගෙන ආ ඇඳුම් පොකුර ඇයත් සමඟම බඳගත්තාය.

'ඒයි කෙල්ලේ.. මාව බඳගන්න එපා.'

චායා සිනාසී කීවාය.

'ඒකට කෙනෙක් ඇතිනේ මිස්ට..'

ප්‍රමුදිගේ කතාවට චායාගේ ගත සීතල වී ගෙන ගියේය. මේ තරම් පරිස්සම් වීත් මොවුන්ට එය ඉව වැටිලාවත්ද.

'කවුද..'

ඇගේ කටහඬේ අපමණ බියක් තිබුනි..

WWW.EXPRESSLANKA.TK 333

'මිස්ට නැත්නම් ඉතින් අපිටත් නැහැ.. බොරු.'

'අනේ මට නෑ ප්‍රමුදි..'

'ලව්කරන එක හරි වදයක් නේද මිස්..'

ප්‍රමුදි වායා සමඟ කතාවට ආවාය. වායා බිම බලාගත්තේ අසංකව සිහිවීය.

'ම්.. වද දෙනවා තමයි.'

කැෂියර් එක ළඟදී වායා එනෙක් වෙලා එකතුවූ මුදල් ගැන අතට ගත්තාය. හරිනම් මේවා බලා කළ යුත්තේ ඔහුය. අද ඒ සියල්ල ඔහුට අමතක වී ඇත. අහිංසක ඔහු ඒ සියල්ල අමතක කළේ වායා මතකයේ තබාගන්නද.

'මේ මොකද මේ ඇඳුම් රොත්තක් උඩට ගෙනාවේ.'

නිලංකා ඇසුවාය. වායා පුටුවකට බරවී හති ඇරියාය.

'පොඩි වැඩක් කරන්න.. ප්‍රමුදි අනේ කෙල්ලේ ක්ලිප් හැඟර් තුනකුයි කොකු තුනකුයිත් මට ගෙනත් දෙන්න.'

වායා සුදු කමිසය සමඟ ඇඳුම් ගැලපුවාය. සුදු කමිසයට රතු ෂෝට් ස්කර්ට් එකකුත් රතුත් සුදුත් ඉරිවැටුන ස්කිනි වර්ගයේ ටී ෂර්ට් එකකුත් ගැළපුවාය. ඇය බලාපොරොත්තු වූ පෙනුම ඇඳුමට ආවේය.

'අර කොල්ලා පිස්සු වැටෙන එක අහන්න දෙයක් නෙවේ.. මාර මැච්න්නේ..'

නිලංකා එය දෙස බලාකීවාය.

'දුන්නම මටත් එකක් ගන්න හිතෙනවා.'

යළිත් නිලංකා කීවාය. වායා ඇඳුම් ගොඩෙන් රතුත් සුදුත් මිශ්‍ර ඇඳුම හැඟර් එකක දමා එල්ලුවාය. ඉන්පසු නිල් ඩෙනිම් ජීන්ස් එකකුත් කමිසය උඩින් දමන්නට ඩෙනිම් වේස්ට් කෝට් එකකුත් කමිසයට ගැළපුවාය. මුල් එකට වඩා දෙවන එකට වායා ආශා කළාය. හැන්දෑවකට ඔහු සමඟ රවුමක් යන්නට එය කදිමය.

'කොහෙන්ද වායා ඕවා ඉගෙන ගත්තේ.'

නිලංකා ගේ කතාවට වායා ඇඳුම් දෙක දෙස බලා සිනාසුනාය. ජීවිතයේ කිසි දෙයක් ඇය විශේෂයෙන් ඉගෙන ගෙන නැතැයි ඇයට

WWW.EXPRESSLANKA.TK 334

සිතුණි.

'ඉගෙන ගන්න ඕනද නිලංකා ලස්සනට දෙයක් කරන්න.'

'ඒකත් ඇත්ත. ඔය කවදාවත් කොල්ලෙක් දිහා නොබලා ලස්සනට ලව්කරන්නේ.. හුරු වෙලායැ..'

වායා නිලංකාගේ මේසයට බරවී ඇගේ අතක් කෙණිත්තුවාය.

'ඒ සංසාර පුරුද්ද.'

'ඒ කියන්නෙ පතාගෙනම ඇවිත්..'

'ම්.. ඒකනේ මේ ඔනාගෙන ඉන්නේ.'

යුවතියන් දෙදෙනාම මහ හඬින් සිනාසුනෝය. දූනට ඇති හැටියකට සිනාසිය යුතුය. අඬන්නට ඇති දවස් ළඟය.. වායා හැඟර් කළ ඇඳුම් දෙකත් ඔසවාගෙන කාමරයට ගියාය. ඔහු ගණනක් සදමින් උන්නේය. ඇය මොහොතක් ඒ රුව දෙස බලා උන්නාය.

'සර්.. සුදු කමිසයෙන් වෙච්ච පාඩුවද ගණන් බලන්නේ.'

'ඔව් වායා.. රුපියල් හතළිස් හතර දහක්..'

'ඒක පාඩු වෙන්නෑ සර්..'

වායා එතෙක් වෙලා පිට මත දමාගෙන උන් ඇඳුම් ගැළඳුම් යුගල ඔහුගේ මේසයට වැටෙන්නට දැම්මාය. ඔහු දැස් විශාල කරගෙන බලා උන්නේය.

'දෙයියනේ ලස්සන.. සුදු කමිසෙද කියලා හොයන්න බෑ.. මාර පිනිෂ්. නීට් කිට් එක. රියල් එක්සෙකටිව් කිට් එකක්.'

ඔහුගේ වචන වලට ඇතුළු හදවතේ ආඩම්බර කමට මෙන් ගල් පෙරළෙයි. ජීවිතයේ ඔහුගේ මුවින් හැරෙන්නට අන් කිසිදු මුවකින් පැසසුම් අසා පලක් නැත.

'හරි ලස්සනයි බබා..'

ඔහු නැවත නැවතත් එය කියවූවේය.

'මේ සුදු කමිසේ ප්‍රයිස් කරලා තිබ්බේ රුපියල් දෙසීය හැත්තෑපහකට.. හරි.. ඉතින් ඕක හදන්න..'

වායා කැල්කියුලේටරය පෙන්වා කීවාය. අසංක කීකරුව ඒ

මුදල සැඳුවේය.

'හරි.. ස්කර්ට් එක දෙසීයයි.. ෂර්ට් එකට තුන්සීයයි. ඒකත් ගහන්න. මේ ස්කිනී එක සේල් දාපු එකක් රුපියල් සීයයි.. ඔක්කොම කීයද..'

'රුපියල් හයසීයයි.'

ඔහු කීවේය. වායා මඳ වේලාවක් කල්පනා කළේය. නැත.. ඒ ගණන වැඩි නැත.

'රුපියල් පනහක් අඩු කළොත් පාඩුද..'

'මොන පාඩුද බබා.. වෙන්න ගිය පාඩුව ඒ වගේද..'

'එහෙනම් පන්සිය පනහකට දෙමු.. බලන්න ජීසන් එක ඉවර වෙද්දි ෂර්ට් ටිකත් ඉවරයි. සාය වලුත් ඉවරයි.. ස්කිනිත් ඉවරයි..'

'එතකොට මේක..'

'මේක ඊට වඩා චූට්ටක් ගණනකට දෙතැකි. ජීන්ස් එක අටසීයයි. ෂර්ට් එකට එකසිය හැත්තෑපහයි.. මේ වේස්ට් කෝට් එකට එකසිය පනහයි..'

'ඔක්කොම එක්දස් එකසිය විසි පහයි...'

'හරි.. එක්දස් එකසීයට දෙමු..'

ඔහු නැඟිට්ටේ ඇය දතින්ම ඇඳුම් දෙක අල්ලාගෙන ඉඳිද්දීය.

'මගේ ජීවිතේ තියෙනවා නේද..'

ඔහු කතා කළේ කණ අද්දර සිටය.

'ම්..'

'ඒකත් හරියට ඔය පාඩුවට අහක දාන්න ගිය ෂර්ට් එක වගේ.'

'නෑ. සර්ට තියෙන්නේ ගොඩක් වටින ජීවිතයක්.'

'මං කියනදේ අහගන්නවා..'

'කියන්න..'

'ෂර්ට් එක ඒ විදිහටම තිබ්බාම පාඩුයි වගේ මගේ ජීවිතෙත්

WWW.EXPRESSLANKA.TK 336

මෙහෙමම තිබුනාම හරි පාඩුයි..'

'මොනවද කරලා ඕනේ.'

'ගළපලා දෙන්න.. ලස්සන ඇඳුමක් එක්ක ගැළපුවා වගේ.'

'ඒක කොහොමද කරන්නේ.'

ඔහු ඇයව ළඟටම ඇදගෙන කාමරය පසෙක එක බිත්තියක්ම වසාලූ කන්නාඩියෙන් එදෙස බැලුවේය. ඔවුන් දෙදෙනා ළං ළංව උන්නේ මංගල ඡායාරූපයක මෙනි.

'මෙන්න මේ වගේ..'

'මං බැහැයි කිව්වේ නැතේ සර්..'

ඔහුගේ මුහුණ වේදනාවෙන් බරවිය.

'අපි ඕවා ගැන නොහිතා ඉමු.. ලස්සන දවසක් මුසල කරගන්නේ මොකටද.. නේද සර්..'

'මේක ඩම් එකක දාන්නද සර්..'

අසංක ඇඳුම් දෙක අතට ගෙන ඉන් එකින් එක චායාගේ සුන්දර වතට තබා බැලුවේය. ඔහු ඇඳුම තබා බැලුවේ ඒ මුහුණ දෙසය.

'ඩමි ඕන නෑ.. මේක ඇඳලා පල්ලෙහා කැරකි කැරකී ඉන්න. ඇඳුම් ටික ඉවරවෙයි.'

තමා මෙපමණටම ලස්සනදැයි අසන්නට ඇයට සිතුණි.

'මෙයින් කිට් එකක් අරගෙන ගිහිල්ලා හෙට ඇඳගෙන එනවද..'

'පල්ලෙහා කැරකි කැරකි ඉන්නද..'

ඇය ඇසූවේ පුදුමයෙනි.

'නෑ.. මං වටේ කැරකි කැරකි ඉන්න.'

අසංක කීවේ ඇගේ කම්බුලකට අත්ලෙන් කුඩා පහරක් ගසාය.

දවස් ගෙවී ගියේ එසේ නිවී සැනසීමේය. චායා මුතු අහුරක් දේත තබාගෙන මෙන් පරිස්සමින් ජීවත්වූවාය. කොයි මොහොතක හෝ මුතු පොකුර වැටී සී සී කඩ යාද..

ඒ [illegible] එසේනම් ජීවිතයේ මහා

WWW.EXPRESSLANKA.TK 337

ප්‍රාතිහාර්යයක්ම වෙනු ඇත. පත්සල් ගොයි පැතුයේ එසේ වන්නට කියාය. එහෙත් පතනා සියල්ලම සිදු නොවේ..

# 33

ගෙදර එද්දී වායාට පාළුය. ඔහු සමඟ කොහේ ගොසින් ආවද ගෙදර ආ පසු දුකය. ආදරය කොහොමටත් දුකකි. පුංචි හීනයක කඩමාල්ලක් වත් හිතේ තබාගෙන ඉන්නට තිබුණා නම් ඒ හීනය තුරුළු කරගෙන දුක වාවාගන්නට තිබුණි. එහෙත් ආදරය හිතට ගලා ආවේම හීන දකින්නට නම් එපා කියාගෙනමය. කිසිවක් සිතානොබලා ඒ ආදරය බඳ වැළඳගත් එක මෝඩකමකැයි සිතන්නට තරම් වායාට කුරිරු විය නොහැක.

ලෝකයේ සුන්දර යැයි හැඟෙන යමක් දුටුවානම් ඒ ඔහු නිසාය. ආදරය කරන්නට ඉගැන්වූයේ ඔහුය. දූන හිත හදගන්නට ඉගෙන ගත යුත්තේ තමාය. ඒ තනිවමය. අත්වැල් පටලාගෙන ආ මඟ තනිව යාම දුෂ්කරය. ජීවිතය මොන පැත්තෙන් ගත්තද නපුරුය. ඒ නපුරු ලෝකය තුළ තමාගේ තනියට ඔහුට නතර වියනොහැක. ඔහුව නවත්වා ගන්නටද නොහැක.

ඒ සුවඳ හැම මොහොතකම එන්නාක් එන්නාක් මෙනි. නිත්දෙදි පවා හිටි හැටියේම ඔහුගේ සුවඳ දැනෙයි. වායා ඇහැරී අසරණව කොට්ටයෙන් ඒ සුවඳ සොයන්නීය. සුවඳ එන්නේ සිතේ පතුළින්ම බව ඇය දනී. දෙනෙත් තෙමී යන්නේ නොදැනීමය. මේ දුක කිසි දිනයක සංසිඳී යන දුකක් නොවේ. භවයෙන් භවය පුරා ම අහිංසක හිතටම විඳදෙන දුකකි. ආදරය තමාට ඉතිරි කරන්නේ ඒ දුක නම් ආදරයේ එකම සන්තකය එයනම් එය වුව රැකගන්නට ඇගේ හිත සූදානම්ය. ප්‍රශ්නය ජීවත්වීමය. විටෙක මැරෙන්නට තරම් දුකක් එයි.

WWW.EXPRESSLANKA.TK 338

ජීවිතයේ අහිමිවීයන දහසක් දේ වෙයි. සමහරඒවා අහිමිවෙද්දී සටන් කර ඒවා හිමි කරගත යුතුය. අහිමිබව දැන දැන කෑ ගසා බිම පෙරළී අඬන්නේ නොදරුවන්ය. ලොකු මහත්වූ පසුවත් අහිමි වෙන දේට එසේ බිම පෙරළී කෑගසා දවසක් තිස්සේ හඬන්නට හැකිනම් දුක තුනීවිය හැක. එහෙත් කොපමණ කාලයකට හඬන්නද. ඉක්මණින්ම ලෙස්සා ගොස් ලිහෙන බව දැනදැනත් ආදර ගැටයක් හදවතේ ගසා ගත්තේ මේ දුක විඳින්නටය.

සියල්ල ඉවසිය හැක. එහෙත් ඔහු යම් දිනකින් පසු ජීවිත අහසේ නොපායන බව දනෙද්දී.. සිහිවෙද්දී පැලීයන පපුව සනසා ගත නොහැක. ආදරයේ නිමැවුම් කරුවාට ආදරයේ දුක දරාගන්නා වෙනුවෙන් බෙහෙතක් හදන්නට අමතක වූයේ ඇයි... එසේ වූවානම් මේ ගැහෙන විරහ හිත නැත.

ඊ අහසේ එක තරුවකට දෙකකට වඩා නැත. සමහරවිට නොහිතන ඉක්මනින් වැහි ඇද වැටෙනු ඇත. පායන වැස්සක් නම් තුරල් කරන තුරු අගුවකට වී හෝ සිටිය හැක. දෛවය ජීවිතයට රැ ගෙන එන අනෝරාව නොපායන බව වායාට විශ්වාසය. වැස්සෙන් බේරෙන්නට සෙවණකට දුව යායුතුද.. නැතහොත් මේ වැස්සේම තෙමී තෙතබරියම්වී වැහි දියටම යේදී යනවාද.. ආදරය කරන්නාට මිසක තීරණ ගන්නට යුවතියන් නොදනිති. වායාද එසේමය. ජීවිතයට වසන්තය රැගෙන ආ පොද වැස්ස ඒ වසන්තය නිමා කරනා ධාරානිපාතයක් වන්නට වස්සාන ඉඟිබිඟි පල කරයි.

අසංක මේ රෑ මොනවා කරනවා ඇත්ද. වායා මිදුලේ සක්මන් කරමින් සිතුවාය. ඔහු හදවතට වැඩිද සිට ඔහු ගැන හැර අන් දෙයක් ගැන නොසිතූ බව ඇයට විශ්වාසය. එහෙම හිතන හිතකට කවද හෝ ඔහු ගැන හිතන්නටම එපායැයි කියා තරවටු කරන්නේ කෙලෙසකද.. එක්කෝ තමා කුරිරු විය යුතුය. නැත්නම් හිත කුරිරු විය යුතුය. ඒ දෙකම සිදුනොවේ. නොවේනම් ඔහු කුරිරු විය යුතුය. එහෙත් ජීවිතයේ දරුණුතම තීරණයක් ඔහුට ගන්නට සිදුවූනද එය තමාට කළ කුරිරු කමකැයි සිතන්නට වායා අකමැති වූවාය.

'නංගී..'

[illegible] පෙතියා ගස් මැත්

WWW.EXPRESSLANKA.TK 339

කර ඇය වෙත ආවේ හිමිහිටය. මහ රුක මල් ගස් අතර තනිවී අහස දෙස බලාගෙන කෙල්ලෙකුට කල්පනා කරන්නට ඇත්තේ එක් දෙයක් ගැන පමණි. යුවතියකගේ සිත හින්දෙන් ඈත් කර තබන්නට හැක්කේ ඒ දෙයට පමණි. ලතා එය හොඳින් දැන උන්නාය.

'ලතා අක්කේ.. නිදගත්තේ නැ.'

'මම නංගිගෙන් අහන්නෙත් ඒකම තමා.. නිදි ගන්න ගියාට නින්ද යන්නැ නේද..'

චායා බිම බලාගෙන සිනාසුනාය.

'නින්ද නම් යන්නැ තමයි ලතා අක්කේ.'

'හිතේ තියෙන ඒවා කිමින් කියාගන්න බැරි උනාම තමයි නින්ද යන්නැත්තේ.'

'කිමින් කියන්නත් බැරි දේවල් හිතේ තියෙනවා නම්..'

'එහෙම නම් ඒ සේරම තුරුල් කරගෙන හොඳට පොරවගෙන නිදගන්න. එතකොට නින්ද යනවා.'

'මෙච්චර දවසක් නිදගත්තේ එහෙම තමයි අක්කේ. ඒත් ඒකටත් දැන් හිත බයයි.'

මිදුලේ වූ මඳ අඳුරේ පවා ඇගේ දැස් දිලියෙනු ලතා බලා උන්නාය. ඇය චායාගේ උරහිසකට අතක් තැබුවේ කරුණාවෙනි. මේ අහිංසක කෙල්ල ජීවිතය ගලපා ගත්තේ මොනතරම් අධිරුවෙන්දැයි ලතා දනී.

'එන්න.. අපි ඉඳගෙන කතාකරමු.'

ඇය චායාගේ අතක් අල්ලාගෙනම පැමිණ ගෙයි දෙරකඩ සිමෙන්ති පඩිය මත වාඩිවූවාය.

'අම්මා නිදිද..'

'නිදි.. මොනවාද කියෝ කියෝ ඉඳලා නිදගත්තේ.'

'අම්මා මුකුත්ම දන්නැ කියලද නංගි හිතාගෙන ඉන්නේ.'

'කිව්වේ නැති උනාට අම්මා සේරම දන්නවා ඇති අක්කේ.. එයාට මගේ හිත හොඳට කියවන්න පුළුවන්.'

WWW.EXPRESSLANKA.TK 340

චායා දිග සුසුමක් පිට කළාය. දිනකට හෙළන එවැනි සුසුම් දස දහසක දියවී යන්නේ තමාගේ ආත්මය බව චායා දැන උන්නාය.

'නංගි මට වඩා ඉගෙන ගත්ත කෙල්ලෙක්. ඒත් මං ඔයාට වඩා ජීවත්වෙච්ච ගෑණියෙක්. ඒ ඔක්කොටම වඩා මම මගේ නංගි කෙනෙක්ට වගේ ඔයාට ආදරෙයි.. ඒකයි මම මෙහෙම කියන්නේ.'

ලතා කතා කළේ දුක සඟවාගෙන නිවී සැනසිල්ලේය.

'අක්කා කියන්න අක්කේ.. මං මුකුත් හිතන්නෑ..'

'තවත් දුර ගියාම කවද හරි තනියම පෝද හැරිලා එන්න ඕනේ.'

චායා යටි තොල හපාගත්තාය. ඉවසා දරාගත නොහැකි තැන ඇය දෑහිලි විකා ගත්තාය.

'මං දන්නවා අක්කේ. කවදහරි එයාට නවතින්න වෙනවා. ඒත්.'

'ඇයි දරුවෝ..'

'මට.. ස..ර්..ව.. අමතක කරන්න අමාරුයි. එයා අමතක කළොත් හිත හදගන්නවා. එයා නැවතුනොත් තනියම එනවා. මට.. එයාව දලා එන්න බෑ.'

ඇය ඉකිබින්දේ ලතාගේ දණමඩලේ හිස හොවාගෙනය. ලතා හැකිතරම් වේලාවක් ඇයට හඬන්නට දුන්නාය. අඩුම තරමේ ඇය අඬාවත් පුරුදුවිය යුතුය. දෛවයේ රුදුරු සරදමක් ඉදිරියේ මේ අහිංසක කෙල්ලගේ හදවත මත්තේ තැබිය හැකි විසඳුම කුමක්දැයි ජීවිතය ගැන මේ තරම් දැනගත් ලතාට පවා කීමට අසීරු විය.

'අඬලාවත් පුරුදු වෙයන් කෙල්ලේ.. වෙන මොනවා කරන්නද..'

ලතා හුල්ලමින් කීවාය.

'හැමෝම ජීවිතේ ඉඳලා යයි. ඔයාට ජීවිතේ පුරාම මෙහෙම අඬන්න වෙයි.'

අසංකට කුමක් හෝ කියද්දී ඇයට ඉහිලුම් නොදේ.. අනාගතයේ කුමක් සිදුවුවද ඔහු ඊට වගකිව යුතු නැතැයි දැඩිව ඇය ඇදහුවාය.

WWW.EXPRESSLANKA.TK 341

ඊට ඔබිනා එපා අසංකේ.

ලතා සිනාසුනේ වායාගේ හිස අතගාය.

'ඔයා ආදරේ කරනවා හොඳට.. මං නම් දැනගෙන හිටියා ඒක.. කවදහරි පැලෙන්න ලව් කරයි කියලා.'

'ඇයි.. ඒ..'

'ඉඳලා ඉඳලා ගහක පිපෙන පළවෙනි මල හරි ලස්සනයිලු.. උදේට උදේට මේ මූණ දකිද්දි මට හිතුනා.'

'ආදරේ මෙච්චර ලස්සනයි කියලා මං දැනං උන්නැ අක්කේ.'

'බය කරනවා නෙවේ රත්තරන්.. ආදරේ දුකත් ඒ වගේම කටුකයි.'

'දන්නවා අක්කේ.. හොඳට දන්නවා.. ඒක ළඟදීම විඳින්නත් වෙනවා කියලා දන්නවා.'

'අම්මා මොනවද කියන්නේ.'

'මුකුත් කියන්නැ.'

'අම්මත් අද ඔයා වගේම අසරණ වෙලා. කරන්න ඕන මොනවද කියලා එයාවත් දන්නැ.'

'අම්මා මොනවා කරන්නද.. කවදහරි හයියෙන් අඬනවා. එයා උකුලේ තියාගෙන සනසයි.'

'ඒක කරන්න කෙල්ලෝ හදන අම්මලා බලං ඉන්නේ.'

'හැම කෙල්ලෙක්ම මං වගේ අවාසනාවන්ත නැ අක්කේ.'

වායා රෑ ඇඳුමේ පහළ පටියෙන් කඳුළු පිසදාගෙන කීවාය. සිල්ක් රෑ ඇඳුමට කඳුළු උරා ගන්නේ අඩුවෙනි.

'කෙල්ලෙක්ගේ වාසනාව ගැන අනාවැකි කියන්න බැ නංගි..'

'සිද්ධ වෙන දෙයක් සිද්ධ වෙද්දෙන් කියලා මං ඔහේ ඉන්නවා ලතා අක්කේ. කොහොමටත් මං අඬන්න බලං ඉන්න කෙල්ලෙක්. චුට්ටක් හිනාවෙන්න ලැබුනොත් ඒක ලොකු දෙයක්..'

'ඔෆිස් එකේ අනිත් අය මේක දන්නවද නංගි.'

[illegible] කළෙද එය

WWW.EXPRESSLANKA.TK 342

කළේ පරෙස්සමිනි. ඔහුගේ නම් කිසිඳු පරිස්සමක් නැත.

'එදා මෙහේ ආවේ.. ඉරිදා කාලා ගියේ.. ඒ නිලංකා.. ඒකි අහිංසකයි.. එයා විතරයි හැම දෙයක්ම දන්නේ.'

'ආරංචි වෙන්න තියන්නත් එපා.. මිනිස්සු හරි කුහකයි නංගි.. වැරදි විදිහට ඕවා ප්‍රචාරය කරයි.'

'මං හරියට පරිස්සම් වෙනවා අක්කේ. ඒ මං ගැන හිතලා නෙවේ.. එයා ගැන හිතලා. මොනවා නැතත් මං වගේ දුප්පත් කෙල්ලෙකුට පැලෙන්න ආදරේ කරපු කෙනා.. මං මැරුණත් එයාට වචනයක් අහන්න තියන්නෑ.'

චායා කීවේ පපුව පුරවා ගිය භක්තිපූර්වක හැඟීමෙනි. ඔහු ගැන ඇත්තේ ලොවිතුරු සිතුවිලිය. ඒවාට ලාභ මිල ගණන් ඇතිවීමට ඇය ඉඩ නොදුන්නාය.

'ඔයත් පුදුම කෙල්ලෙක්. වෙන කෙල්ලෙක් නම් ඔක දැනටමත් වටේටම දනගන්න දීලා.. ඒකෙන් තව ප්‍රයෝජනත් අරගෙන.'

'එයා මට කවදාහරි නැතිවෙනවා. ඒක මං දන්නවා.. ඒත්.'

චායාට යළිත් ඉකිබිඳුනි. එවන් දෙයක් හීනෙකින්වත් නොවේවායි ඇගේ තුන් හිතම කෑගසා පතයි.

'එයා හරි අහිංසක කොල්ලෙක්.. මට නොලැබුනත් අක්කේ මේ ආදරේ කරපු දවස් මට ඇති... මුළු ජීවිතේටම ඇති.'

ඇය හඬමින්ම කීවාය.

'ඔයා කියලම සර් ගැන මගේ හිතේත් තියෙන්නේ ලොකු ගෞරවයක්.'

'ඊට වඩා කෝටියක ගෞරවයක් මගේ හිතේ තියෙනවා අක්කේ. ඒක කවදාවත් නැතිවෙන්නේ නෑ. ලෝකේ කිසිම පිරිමියෙකුට මට ඒ තරම් ගෞරව කරන්න බැරිවෙයි.. ආදරේ කරන්නත් බැරිවෙයි.'

අසීමිතව චාන්දමත ආදර දියවරයකදී යුවතියකගේ මුවින් පිටවෙන වචන ඕනවටත් වඩා අහිංසකය. නිර්මලය. ඒ සියල්ල මේ චායාගේ මුවින් පිටවෙන වචන වල ඇත. තමාට හිමි නොවනා

WWW.EXPRESSLANKA.TK 343

ජීවිතයක් වෙනුවෙන් පවා එසේ ශක්තිමත් වීමට ගැහැණියකට ඇති මිනිස්කම පුදුම සහගතය.

ලතා බොහෝ වේලාවක් වායාගේ හිස අතගෑවාය.

"දැන්නම් නිදි මතක් එනවා."

සනීපයට ලතාගේ දෙදණ මත හිස තබාගෙන උන් වායා සිනාසී කීවාය.

"යන්න ගිහිල්ලා නිදාගන්න.. හෙට ඔෆිස් යන්නත් ඕනනේ.. නැත්නම් කොල්ල හොයාගෙන ගෙදර එයි."

මොහොතකට සියළු දුක් සංකා අමතක විය. "ඇත්තටම හොයාගෙන එයි නමා.." වායාද සිතුවාය.

"ඉස්සරහ දොර වහන්නෙපා. මං කිරිතේ එකක් හදලා ගෙනත් දෙන්නම්.. යන්න."

"අක්කා හදන් එන්න.. මං මෙතනටම වෙලා ඉන්නම්.."

"කොල්ලෝ ඔහොම තමයි. නිදාගන්න යන අන්තිම පොඩ්ඩෙත් කොල්ලා ගැනම හිතන්න ඕනේ."

"අක්කත් එහෙම ඇති."

"හිතුවා හිතුවා. තාමත් හිතනවා.. ළඟ නැති වෙනකොට අන්තිම දවසේ ඇඳගෙන හිටපු සරම හෝදන්නේ නැතුව තියාගෙන පොරවගෙන නිදාගන්නවා."

ලතා අන්තිමට කියා ගිය කතාවට වායාගේ පපුව උණුවිය. හැම ගැහැණියක්ම ආදරයට පපුවේ වෙන්කර ඇති ඉඩ එක සමානද.. සමහරවිට ඔවුන් මුළු පපුවම ඊට වෙන්කර තබා ඇත. ආදරය අහිමි වෙද්දී පපුවේ කොටසක් පත්තු නොවී මුළු පපුවම ගිනි ගන්නේ ඒ නිසා විය යුතුය.

ගෙදර දුරකථනයක් තිබුණි නම් ඔහු හා මුළු රෑම කතා කර කර ඉන්නට තිබුණි. ඒ හඬ පවා අසන්නට හිතට ලෝබය.

"මම නෙස්ටමෝල්ට් එකක්ම හැදුවා. අා බීලා නිදාගන්න."

ලතා උණු උණුවේ දුම් දමන නෙස්ටමෝල්ට් කෝප්පය වායා අතට දී [illegible] ඒ සුවඳට ඇය ආශා කළාය.

WWW.EXPRESSLANKA.TK 344

චායා කලින් ගණන් හදගෙන උන්නාක්මෙන් කීවාය.

'හතරක් කාටද..'

'මට එකයි.. නිලංකාට එකයි.. මැඩම්ටත් ආසයිලු කෙහෙල් කොළයක දලා බත් කන්න.'

'ඉතින් තුනනේ.'

පද්මා දෙතොල් පට තද කරගෙන ලූණු තෙල් දමූමට දෙහි ඇඹුල් දමමින් කීවාය. චායා අම්මා දෙස බලා උන්නේ සහචාගත් මනමාල දෑසිනි.

'එහෙනම් තුනක් ඇති. මං මගේ බත් එක දෙන්නම්.'

ඇය මචාගත් දුකකින් පවසා දැත බැඳ උළුවස්සට බරවූවාය.

'අනේ මන්ද තාත්තවත් උන්නනම් මට එයා එක්ක හරි ඔයාගේ ඒවා ගැන කතාකරන්න තිබුනා. අද මටවත් තේරුම් ගන්න බෑ ඔයාට මොනවා කියන්නද.. මොනවා කරන්නද කියලා.'

පද්මා කීවේ හුල්ලමිනි. ඇය ගෑස් ලිපේ දැල්ල අඩුකර ගවුම් පටින් කඳුළු පිසද ගත්තේ මහා දුකකිනි.

'මටත් තේරෙන්නෑ අම්මේ.. මට මේ කීයටද අම්මේ ලබන්නේ..'

'විසිපහට..'

ජීවත්වීමට තව කොතෙක් කලක් ඇත්ද.. ඒ කාලයට ජීවත්විය යුත්තේ හිස් හදවතින්ද.. චායාගේ ළය හිරිවැටී ගියේ ඉබේටමය.

'අම්මේ' කහබත් එකටත් අල තෙල්දලා දෙන්න හොඳේ.'

'දෙනවා.. දෙනවා.. ඔයාට ඕනෙ නම් අලගෝතියක් හරි ගෙනත් තෙල්දලා දෙන්නම්.'

එච්චර කාලයක් අල තෙල් දමන්නට සිදුනොවේ. සමහරවිට ජීවිතයේ යළි කිසිම දිනයක අල බැදුමක් කන්නට තමාට නොහැකි වනු ඇත. ඔහු ආශා කළ සියල්ලක්ම ඔහු සමුගත් පසු දුකම ගෙනෙන බව ඇය දනී.

එක දිගට රෑ තුන හතරක් වැස්ස නිසාදෝ අලුත් කෝපි මල් අහුරු පිටින් පිපී තිබුණි. චායා කෝපිමල් ළඟ නැවතී ඒදෙස මොහොතක්

WWW.EXPRESSLANKA.TK 345

බලා ඉඳ බරවූ හදවතින්ම ළිඳ වෙත ගියාය. තවමත් හිරු එළිය හරි හැටි පතිත නොවූ ළිඳේ මතුපිට ඇඳෙන තමාගේම ඡායාව දෙස ඇය මොහොතක් බලා උන්නාය. ඊටත් පසු ඇය ළිඳට සිනාසුනාය.

★★★★★★★★★★★

අසංක වායාගේ උපත් දිනය සොයාගත්තේ ඇය කාර්යාලයට පැමිණෙද්දී බාරදුන් අයදුම්පතෙනි. එය අමුතුවෙන් ලියාගන්නට ඔහුට අවශ්‍ය නොවීය. ඔහු බලා උන්නේ වායාව පුදුම කරවීමටය.

උපත් දිනයට ඇයට තිළිණ කිරීමට යමක් ඔහු සතියක් පමණ තිස්සේ කල්පනාකළේය. මේ ඔහු තම ආත්මීය හැඟීම් සමඟ ගනුදෙනු කරනා කුළුඳුල් වතාවය. එතැනදී හැම තරුණයෙකුගේම ළයේ මතුවන ආධූනිකබව ඔහුටත් දැනුණි.

අසංක වායා කාර්යාලයට ආ මොහොතේ සිටම ඇය වෙතට නෙත් තබාගෙන උන්නාය. ඒ රුවත් තමාගේ උපත් දින තෑග්ගත් අතර ඔහු දේලනය වෙමින් උන්නේය.

අතිත් අතින් ඔහු කම්පාවූවේය. උපන්දිනයට නොව ඇගේ මුළු ජීවිතයටම තමාට දියහැකි ලොකුම තෑග්ග තමාට දෙන්නට දෛවය ඉඩ නොදෙන බව ඔහුදැන උන්නේය. ඒ වරම තමාට ලැබේනම් මුළු ජීවිතයම ඇයට තිළිණ කිරීමට ඔහු සූදානම්ය. එසේ වුවද ඉරණම ඒ තෑග්ග වේලාසනම අඳුරා තිබුනේ වෙනත් හදවතකට දෙන්නටය. මේ අහිංසක යුවතියව තවත් දුක් ගොඩක රැඳවීම පාපයක් යැයි ඔහු සිතුවේ දැඩි පසුතැවීමෙනි. තමා ඉන්නේ හැඟීම් වලට නිදැල්ලේ ගලා යන්නට ඉඩ හැරිය යුතු නිදහස් නිම්නයක නොවේ.

ජීවිත වන්දනාවට දන් මල් එකතු කර පලක් නැත. ඔහුට යන්නට වෙන්නේ මල් වට්ටි පිටින් ගෙන යායුතු භක්ති පූර්වක ගමනක් නොවේ. කෙදිනක හෝ විරහව හුදෙකලාවේම දරාගන්නට වෙන්නේ ඇයටය.

වායා පහළ කවුන්ටරයෙන් එකතු කරගත් මුදල්ද රැගෙන අසංක වෙත ආවේ එවන් සිතුවිලි වලින් ඔහු දැවෙමින් සිටිද්දීය. ඔහු ඇගේ නළල් තලයේ සිට බඳ දක්වාම දෙනෙත් රැගෙන ගියේය.

WWW.EXPRESSLANKA.TK 346

'ඇ...යි..'

අසංක ඇගේ ගෙල දෙස වඩාත් ඕනෑකමින් බලා සිටිද්දී ඇය තරමක බියෙන් ගෙල පිරිමැද ඇසුවාය. ඇගේ ගෙළ සැරසී ඇත්තේ හීන් චේන් පටකිනි. ඒ ගෙළට ලස්සන ඊට වඩා නවීන මෝස්තරයේ රන්දමකි.

'කවුද ඔය චේන් එක දුම්මේ.'

ඔහු සිනාසී ඇසුවේය. වායා සිනාසුනේ සැහැල්ලුවෙන් නොවේ. වඩාත් වේදනාබරවය.

'තාත්ත දුම්මේ.. මං ලොකු ළමයෙක් වෙලා ආපු වෙලාවේ.'

කඳුළු පටලයක් දෙනෙත් වසාගියේ තාත්තා සිහිවීම නිසාය. දෛවය අහිමි කළේ.. අහිමි කරන්නට යත්තේ එසේ මෙසේ දේවල් නොවේ. පපුවේ බැඳගත් දේවල්මය.

'ඇ..යි.. සර් ඇහුවේ..'

'නෑ බබා නිකං.. ඔය කඳුළු පිහදගන්න..'

හෙට තමාගේ උපන් දිනය යැයි කියන්නට ඇගේ කටට ආවේය. ඊට වඩා හෙටම කිරිබත් කෑල්ලක්දී ඔහුට එය කියන්නට ඇය ආශා කළාය.

'මොනවද කියන්න හදලා කිව්වේ නෑ.'

ඔහුගේ නිරීක්ෂණය පුදුම සහගතය. එක අතකට එහි පුදුමයක්ද නැත. ජීවිතයට වඩාත් ළංව එබුණු ඔහු හැර අන් කවරෙක් හිත කියවන්නද..

'ම්.. එකක් හිතුවා.. ඒත් අද කියන්න බෑ..'

'හිතුව දේ මොකක්ද කියලා මාත් හෙටම කියන්නම්..'

'අ..නේ.. දූන්මම කියන්නකෝ..'

හිත මොහොතකට බොළඳ විය. ඔහු සිනහබරව හිස වැනුවේය.

'කියන්නම බැරිද..'

'බෑ..'

ඔහුගේ හඩ හිතුවක්කාරය.

WWW.EXPRESSLANKA.TK 347

'චූට්ටක් කියන්න..'

'මෙතනට ආවොත් කියනවා.'

'එහෙනම් හෙටම කියන්න.. මං යනවා.'

ඇය මුදල් මිටියට රබර් පටියක් දමා මේසය කොනක තබා හැරෙන්නට ගියාය. එහෙත් යන්නට ප්‍රථම ඔහු පුටුවෙන් නැගිට ඇගේ පුරත තද කොට අල්ලා ගත්තේය. ඊටත් පසු ඇගේ බඳවටා දෙඅත් යවා ඇයව තම වතට ළං කරගත්තේය.

'දැන්වත් කියන්න..'

'දන් බෑ..'

'එහෙනම් මාව අතාරින්න.'

ඔහුවඩාත් පැහැදිලි ලෙසම ඇගේ බඳින් දෙඅත් ගෙන ඇයව අතහැරියේය. චායා දිගටම එලෙසම ඔහුගේ වතට බරව උන්නාය.

'කිච්චට මං හිතුවේ නෑ අත් අරියි කියලා.'

චායාගේ හඬ අසරණ බොළඳ අහිංසක ආදරවන්තියකගේ හඬය. අසංකගේ සිත මහා ලෝබකමකින් පිරුණි.

'බඩ්ඩක් ඉල්ලන්නද..'

'ඉල්ලන්න.'

ඔහු ආශාවෙන් කියුවේය. ඒ ඇය් යමක් ඉල්ලන ප්‍රථම වතාවය.

'දෙනවද කියන්න. දෙන්න බැරි දෙයක් මං ඉල්ලන්නෑ..'

'ඉල්ලපු දේ ඉල්ලන්න.'

'මට ලැජ්ජයි..'

චායා අතේවූ පෑනෙන් අතැගිලි වලට අනිමින් කියුවේය. ඔහු ඒ පෑන උදුරාගෙන මේසයට වීසි කළේය.

'දැන් කියන්න.'

'රෑට අඳිනවා නේද.'

'ඔව්.. ඒක් උදේට හෙළුවෙන්..'

'ඕ..යා.. මොකක්ද අඳින්නේ.'

'[illegible] තමා සොඩි මැන්ට සනීප..'

WWW.EXPRESSLANKA.TK 348

චායා හිනාව නවතාගත නොහැකිව ඔහුගේ බඩට වේගයෙන් පහරක් ගසා හැරුණාය. ඇගේ දෙනෙත් දෙකෙළවර කඳුළු බිඳු දෙකක් මතුවූයේ හිනාව වැඩිකමටය.

'හ..රි.. නරකයි.'

'ඒක නරක දෙයක්යැ.'

'හරි. හරි.. නරක නෑ.. හරි හොඳයි.. මං දන්නවනේ.'

'ඇත්තටම මං නරකද චායා.'

ඔහු ඇසුවේ හැඟීම්බරවය. චායාට දුක සිතුණි.

'මට සර් තරම් හොඳ කෙනෙක් ලෝකේ තවත් නෑ සර්..'

'මටත් නෑ චායා..'

දෙදෙනා අතර කෙටි නිහඬතාවයක් ලියලා වැඩුණි. හිතට බරක් එකතු වෙන්නේ මෙවැනි මොහොතකය.

'මොනවද ඉල්ලන්න ගියේ.'

'මට අරවයින් එකක් ගෙනත් දෙන්න.'

'මොනවයින් එකක්ද.'

'රෑට අඳින සරම් වලින් එකක්.'

ඔහු චායා දෙස බලාගත්වනම බලා උන්නේය. ජීවිතයට අභිමවී යන්නේ තමාගේ සුවඳට පවා ආදරය කරනා ගැහැණියකි. පිරිමියෙකුට එවැනි ගැහැණියක් ලැබෙන්නේ එකම වතාවක් පමණි.

'ඇයි බබා සරමක් ඕන.'

'ම..ට.. රෑට පාළුයි.. ඒක ළඟ තියං නිදාගන්න.'

අසංක පුපුරා ගිය ආදරයකින් චායාගේ හිස අතගෑවේය. පිරෙන කඳුළු ඔහේ ගලායන්නට ඇයද ඉඩ දුන්නාය. ජීවිතය පරවූවාට කම් නැත. ආදරය ජීවත් කළ යුතුව ඇත. ඒ කඳුළිත් දෙවා ගත් පැතින් සනහාය.

'පහළ සරම් තියෙනවා.. මං ඒකක් ගෙනත් දෙන්නද..'

'මට ඒවා නෙවේ මහත්තයෝ ඕන.. ගෙදර ඔයා අඳින සරමක්..'

'ඒවා ගඳයිනේ මැණික.'

'කමක් නෑ.. මට සුවඳයි..'

ඔහුට වචන හොයාගත නොහැකි විය. ඒ නිසාම වායාගේ අත රැගෙන අසංක දැඩිව අල්ලාගෙන උන්නේය.

'මට මෙච්චර ආදරේ කරන්න එපා වායා.'

'ඇයි ස..ර්.. කවදහරි සර්ව මට නැතිවෙන නිසාද.. කමක්නෑ.. මට චුට්ටක් ආදරේ කරන්න නෙවේනේ ඔයා කියලා දුන්නේ රත්තරන්..'

අසංක ඇගේ ගෙල පිරිමැද්දේ අසරණවය. පසුව ඔහු එහි සියුමැලි රේඛා දෙස බලා උන්නේය.

'සාස්තර කියන්න දන්නවද..'

'දන්නවා..'

'කියන්න බලන්න.'

ඔහුගේ දිවහ වියැලිණි. වායා කඳුළු පුරවාගෙන බලා උන්නාය.

'කමක් නෑ මහත්තයෝ.. මගේ අනාගතය මම දන්නවා. මම ඒක දැනගන්න ආස නැහැ.'

වායා ඔහුගේ දෝතින් සුරත මුදවාගෙන දෙකොල්පට තද කරගත්තාය.

'සර් කලෙක්ෂන් චුට්ට චුට්ට අඩුවෙනවා නේද.. බලන්න අද ඊයෙටත් වඩා අඩුවෙලා..'

ඇය කීවේ බැරෑරුම්වය.

'මටත් ඒක තේරුණා වායා.. ඇයි ඒ..'

'ප්‍රමෝෂන් මොනවා හරි කරන්න ඕන.. දිගටම මෙහෙම වෙන එක හොඳ නෑ.. දැන් මේ දිගටම අලුත් ෂොප්ස් ඇරලා.. සෙනග එහාටත් අදිනවා..'

'ඒක මාත් දැක්කා. අනික රටේ ආර්ථිකෙත් එච්චර හොඳ නෑ බබා.'

'එහෙම කියලා බෑනේ.. රටේ තත්වේ කවදත් මෙහෙම තමයි.'

'මොනවද කරන්නේ.'

WWW.EXPRESSLANKA.TK 350

"අපි අල්ලගෙන ඉන්න ගාමන්ට් එච්චර හොඳ ඩිසයින් දාන් කරන්නෑ. අර දවසක් සර්ගේ යාළුවෙක් ආවේ බැංකොක් ඉඳලා ඇඳුම් ගෙන්නන.. කවුද.."

"කමල් ද.."

"අන්න එයා.."

"ඉතින්.."

"එයාට කිව්වොත් අලුත් පැටර්න්ස් ටිකක් ගෙනෙයි. ටිකක් අඩු කොස්ට් එකේ ගාමන්ට් ටිකක්.."

"මං කතාකරන්නම්."

"පත්තර වල ඇඩ් ටිකකුත් දැම්මොත්. ඒවලට ගාන වැඩිද."

අසංක මොහොතක් කල්පනා කළේය. වායා කියන ලෙසම මේ තත්වයට ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගතයුතුය.

"දාමු. මං ඒජන්සියට කතාකරන්නම්.. මේ.."

අසංක එසේ කියා යළිත් ඇගේ උරහිසට අතක් තැබුවේය.

"ඇයි.."

"බබා ඇඩ් එකට ඉන්නවා නේද.."

"ම..ම.."

"ඔව්.."

"එපා.. ලස්සන මොඩ්ල් කෙනෙක්ව දලාකරමු.. සර්ට පිස්සු."

"මට ඇත්තටම පිස්සු."

"අනේ.. මං ආස නැහැ."

වායා සමාව ඉල්ලන බැල්මෙන් ඔහුගේ දෙනෙත් වෙත බැල්මක් හෙළුවාය. අසංකගේ යටි හිතේ මහඟු සතුටක්විය. මේ ලස්සන ලෝකය දකිනවාට ඔහු කැමති නැත.

"තරහද."

ඇය මෘදුව ඇසුවාය.

"තරහයි.."

WWW.EXPRESSLANKA.TK 351

"අනේ යාළු වෙමුකෝ.. මේ දවස් ටිකෙත් තරහ වෙන්නෙපා."

ඒ වචන බයාදුය. බැගෑපත්ය. අසංක වඩාත් ආදරණීය ලෙස ඇගේ ගෙළ පිරිමැද්දේය. උපන්දින තිළිණය ඔහුට සිහිවිය.

'බෙල්ලේ මොනාහරි තියෙනවද දන්නෑ.. අද බලන්නෙම බෙල්ල දිහා.'

වායා කීවේ සිනාසෙමිනි.

# 35

'අවුරුදු විසි පහක් ඔයාගේ උපන් දින විසි පහකට කිරිබතක් හැදුවා.. තව අවුරුදු කීයක් හදන්න වෙයිද දන්නෑ.. මොනා කළත් ඔයා ගැනත් චුට්ටක් හිතන්න පුතේ.'

පද්මා කිරිබත් කෑබලි කපමින් දියණිය දෙස බලා කීවාය. වායා ගේ දෑස් තෙමීගියේ නොදැනුවත්වමය. ඇගේ හදවත පෑරී ගියේ අම්මා කවදක හෝ තමාට අහිමිවී යනවා නොවේදැයි සිහිවී දැනුන බියත් පාළුවත් නිසාය. එදට ජීවිතය ළඟින් ඉන්නේ කවුද..

'උපන් දිනේ දවසෙම අම්මා මාව අඬවනවා.'

වායාට ඇගේ පපුවේ නැගෙන දුක් කඳු එලෙසින්ම අම්මාට දිය නොහැක. ඇයට ඇත්තේද දුප්පත් පපුවකි. ඒ පපුව ජීවිතය පුරාම සමනල කන්ද තරම් දුකක් උහුලාගෙන ඉඳිනු වායා දුටුවාය. අවුරුදු විසි පහක් පුරා මලක් මෙන් තමාව රැකගෙන ආ ඇය විඳින්නේ කිසිවෙකුට පැවසිය නොහැකි දුකකි.

'අඬනවා නෙවේ මැණික.. අපිට කියලා කවුද ඉන්නේ පුතේ..

WWW.EXPRESSLANKA.TK 352

ඔයා ජීවිතේ ලස්සන දේවල් ගොඩාක් දැක්කේ නෑ නමා.. ඒත් මට බයයි.'

'අම්මා හිතන්නේ මම තෘප්ති වෙනවා කියලද..'

චායා අම්මා අනා තිබූ ලුණු මිරිසට දෙහි බෑය මිරිකුවාය. ඇගේ දෙනෙත් වලින් කඳුළු ගලා යන්නේද දෙහි බෑය මිරිකනා ලෙසිනි.

'අපිට අඬන්න දේවල් ජීවිතේ නැතුවා නොමේනේ පුතේ.. අපි හිර කරගෙන උන්නට..'

ඇස් පිහාටු වල කඳුළු නැවරුණු කල දෙනෙත් ඇරීම පවා දුෂ්කරය. චායා එහෙමම දෙනෙත් පියාගත්වනම උන්නාය.

'සර් මාව රවට්ටනවා නෙවේ අම්මේ.'

මේ ඔහු ගැන සෘජුව කතාකරන ප්‍රථම වතාවය. පද්මාට දියණිය ගැනපුදුම නැත. මොලොක් හදවතක් ඇති දියණියක් සිටින හැම අම්මා කෙනෙක්ම දියණියකගේ මේ ආදරණීය උමතුව දරාගත යුතුය. එය අම්මා කෙනෙකුගේ උරුමයකි.

'ඔයාගේ ජීවිතේ ලස්සන දේවල් උදුරාගන්න හදනවා නෙවේ දරුවෝ.. මං කියන්නේ ටිකක් හිතන්න කියලා.'

'නොහිතනවත් නෙවේ අම්මේ..'

'හිතුවාම තවත් අතරමං වෙනවානේ..'

චායාට අම්මාගේ වචන පුදුමය. තමාගේ හිත ඒ තරම් පහසුවෙන් කියවිය හැකි පොතක්ද.. අනිත් අතට ඇයට හැර කාට මේ හිත කියවිය හැකිද..

චායා හුල්ලමින් රත්වූ තෙලට කට්ලට් තුන හතරක් දැමුවාය. ඒවා චිරිස් ගා වැටී බැදෙනු ඇය බලා උන්නේ ආශාවෙනි.

'කෝ.. අහකට යන්න.. අලුත් ඇඳුමට තෙල් වීසි වෙනවා.'

අම්මාගේ අතින් බත් පාර්සල් ටිකත් කිරිබත් පාර්සලයත් ගන්නට ප්‍රථම චායා ඇයට දණ ඔබා වැන්දය. නෙලූ පලා දිනෙක මහදමා අඩාගෙන ගෙදර ආ දිනයක හඬන්නට වෙන්නේ ඇගේ උකුලේය.

'[illegible] ගෙන බත් පාර්සලේ

WWW.EXPRESSLANKA.TK 353

මැඩම්ට.. ඒකට තෙල් දැම්මේ නෑ..'

ලතා දුවගෙන ආවේ වායා ගෙදරින් පිටවෙන්නට ඔන්න මෙන්න කියා තිබියදීය.

'බර්ත් ඩේ ගර්ල් හොර පාරින්ම පනින්න යන්නේ.'

ඇය සිනාසී කීවාය. ලතා ඇගේ දෙකම්මුල් සිපගත්තේ ආශාවෙනි. ඒවා මල්මෙනි. කොල්ලා හොඳට කිස් කරනවා ඇති.. ඇය මනමාල සිතින් සිතුවාය.

'ලතා අක්කගේ පංගුව අම්මා වෙන්කරලා තියෙන්නේ.'

'අපේ පංගුව නැතත් මොකෝ.. ඔය උස්සගෙන යන්නේ ගෙනියන්න ඕන අයගේ පංගුව.. නේද නැන්දේ..'

පද්මා සිනාසුනේ දුක්බරවය.

'මගෙන් චූටි තෑග්ගක්.'

ලතා එනෙක් වෙලා අතේ රඳවාගෙන උන් කුඩා බ්‍රවුන් පේපර් බෑගයක දමාලූ යමක් වායාට දුන්නාය.

'මොකක්ද අක්කේ.'

'අනේ පැටියෝ ලොකු දෙයක් ගන්න වෙලාවක් තිබුනේනෑ.. පොඩි තෑග්ගක්.'

'පොඩි උනත් ලොකු උනත් මට මේක හරි වටිනවා.. මං යනවා ලතා අක්කේ.'

වායා ඇයටද පාත්වී වැන්දය. ලතා ඇයට සමුදුන්නේ තවත් වරක් ඒ හිස සිපගත් පසුය.

'පුදුම දරුවෙක් ලතෝ.. මං බලං ඉන්නේ කවද අඬාගෙන එයිද කියලා. සතුසන්න.'

පද්මා කීවේ ඈත යන වායාදෙස බලාය.

'කෙල්ල පුදුම විදිහට සර්ට ආදරේ කරන්නේ. ඒකි දන්නවා කවදහරි ලොකු දුකක් විඳින්න වෙනවා කියලා. ඒත් ඒකවත් නොහිතා පිස්සි වගේ ඒකම හිතනවා.'

WWW.EXPRESSLANKA.TK 354

'මට නම් පුදුම බයක් හිතෙන්නේ..'

'නැන්දා බයවෙන්න එපා. එක දෙයක්.. ඒ කොල්ලා නරක කොල්ලෙක් නෙවේ.. ප්‍රශ්නවල අසරණවෙලා ඉන්නනියා මියක්කා නැත්නම් අපේ කෙල්ලගෙන් අයුතු ප්‍රයෝජන ගන්න අදහස් කරනවා නෙවේ. කෙල්ල නාස්ති වෙන්නෑ.'

'ඒක මාත් දන්නවා ළතා.. නැත්නම් ඒ කෙල්ල මෙච්චර නැහෙන්නේ නෑ.'

'අනේ මොනවා හරි වෙලා ඒක වෙනවානම්..'

පද්මා කිසිවක් කීවේ නැත. එසේ වන්නට නම් සිත්ඩරෙල්ලාට සුර මාතාවක් පිහිටට උන්නා සේ ඇයටද කිසිවෙකු පිහිට විය යුතුය.

'කිරිබත් ටිකක් දලා දෙන්නද... නැත්නම් දෙන්නත් එක්කම කමුද..'

'යන්.. මං නැන්දත් එක්කම කනවා.'

පද්මා ගෙට ගියේ දැල්වෙමින් තිබූ බුදු පහනේ දැල්ල තවත් දිගු කරය.

★★★★★★★★★★★★★★

රණතුංග මහත්මිය උන්නේ ගෙයි පහළ කොරිඩෝවේ හාන්සි පුටුවේ වාඩිවී පුවත්පතක් බලමිනි. ගේට්ටුවෙන් ඇතුල් වෙද්දීම වායාට බැලුනේ අසංකගේ කාමරය දෙසය. එහි කවුළුපත් විවර වී නොතිබුණි. වායාට මහා දුකක් දැනුණි.

'මැ..ඩ...ම්.. ගුඩ් මෝනින්..'

රණතුංග මහත්මිය පුවත්පත මෑත්කර බැලුවේ ඇසුණු කටහඩිනි. ඇගේ දෙනෙත් ලොකුවිය.

'දෙයියනේ වායෝ.. මම ඊයෙ රෑත් ඔයාව මතක් කළා.'

වායා රණතුංග මහත්මිය පසෙක හිටගෙන සිනාවුනේ පැහැබර ලෙසිනි.

'ලස්සන සල්වාර් එකක් ඇඳලා.. මහදි කොල්ලෙක් අල්ලගත්තේ

WWW.EXPRESSLANKA.TK 355

නැතුවා පුදුමයි.'

තමාව අල්ලාගත් එකම කොල්ලා ඉන්නේ උඩ තට්ටුවේය. තවමත් ඔහු ඇඳේ විය යුතුය.

'උදෙන්ම ආවේ.. මාව බලලා යන්නද..'

'ඔව් මැඩම්. මං බයෙනුත් ආවේ නිදි ඇති කියලා.'

'ඉස්සර පුරුද්දට මට පාන්දර පහ වෙද්දි ඇහැරෙනවා දරුවෝ.. ඒකට අපේ ගොයියා.. අර තාම නිදි.. අද වායා හරි ලස්සනයි.. ඉන්දියන් පොට්ටුවකුත් තියාගෙන.. නියම මධුරි..'

වායා බිම බලාගෙන සිනාසුනාය. ගෙනා බත් පාර්සල් තවමත් ඇගේ අතේය.

'මැඩම්.. අද මගේ උපන් දිනේ.'

ඇගේ අහිංසක හඬ රණතුංග මහත්මියගේ පපුව මොහොතකට දවාලීය.

'අනේ... මම දන්නෑ මැණිකෙ.. කෝ එන්න රත්තරනේ කිස් එකක් දෙන්න.'

වායා ඇගේ සුන්දර මුහුණ රණතුංග මහත්මියගේ සුදේසුදු වියපත් මුහුණ අද්දරට පහත්කළාය. ඇය වායාගේ මුහුණ දෙතුන් වරක්ම සිපගත්තේ සැබෑ සෙනෙහසකිනි. වායාගේ ඇස්වලට කඳුළු පිරුණි.

'මෙහි හැපි රිටන්ස් වායා.. කෙල්ල ගාව හරි සුවඳයි.'

'ඒ වුනාට මං ආය මැඩම් ළඟින් එන සුවඳට..'

වායා දෙනෙත් වල නැගී ආ කඳුළු දෙනෙත් මිරිකා නෙතමාත්තු කරකීවාය.

'මොනවද මං කෙල්ලට බර්ත් ඩේ එකට දෙන්නේ..'

රණතුංග මහත්මිය වායාගේ මුහුණ දෙස බලාගෙනම කල්පනා කළාය.

'මැඩම් මට අලුත් ජීවිතයක් දුන්නා.. ඒක ජීවිතේටම ඇති මැඩම්..'

WWW.EXPRESSLANKA.TK 356

"එහෙම කියන්න එපා දරුවෝ.. ඔයා කොච්චර දුක් විඳිනවද.. සර් උනත් ඇවිත් කියන්නේ චායා නැත්නම් දැන් බිස්නස් කරන එකත් එපා වෙනවලු.."

ඔහු ගැන උපන් අලුත් ආදරයකින් ඇගේ හදවත තෙත්විය.

"මං මැඩම්ට බත් එකක් ගෙනාවා.. මැඩම් ආසයිනේ කෙහෙල් කොළේ බෙදලා කන්න. අම්මා උදෙන්ම කහබත් හැදුවා."

චායා දෙනෙත් බිමට බරකර කීවාය. රණතුංග මහත්මිය ඇය වෙතට නෙත් දල්වා උන්නාය. ඒ වියපත් දෑස්වල උතුරන්නේ ළෙන්ගතුකමයි.

"ඔයා වගේ කෙනෙක් අපටම ලැබුනනේ.. අනේ පැටියෝ කවදාවත් අපිව දලා නම් යන්නෙපා.. බැන්ද කාලෙක මහත්තයා අප් කරගනීද දන්නෑ."

ඇතුළු ළය හිරි වැටිණ. කියන්නට නම් බොහෝ දේ හිතට එයි. එහෙත් දෛවය ඒ වදන් අහුරා ඇත.

"මම මැඩම්ලව දලායන්නෑ මැඩම්... එලෙව්වත් ඉන්නවා."

"එහෙම හිතන්නත් එපා චායා.. මට දීපු සහයෝගෙම සර්ටත් දෙන්න."

උඩුමහලෙන් ශබ්දයක් එද්දී චායා ගැස්සුනාය. සමහරවිට ඔහු ඇහැරී වන්නට ඇත.

"මං යන්නම් මැඩම්.."

"ඉන්න දරුවෝ.. තේ ටිකක් බීලා යන්න."

"මං වෙන වෙලාවක එන්නම් මැඩම්.. උදෙන්ම බැංකු යන්නත් ඕනේ.."

"ඉන්න මැණිකා ටිකක්."

රණතුංග මහත්මිය චායාව තනිකර ගෙතුළට ගියාය. ඇගේ දෙනෙත් කවාකාරව නිවස පුරා දිව ගියේය. ඔහු පෙනෙන්නට වත් නැත.

"ලලිතා.. චායාගේ [illegible] අරගෙන එන්න."

WWW.EXPRESSLANKA.TK 357

ඔහුගේ කටහඬ ඇසී චායා ගැස්සී උඩුමහල දෙස බැලුවාය. හඬ මිස ඒ රුව පෙනෙන්නට නැත. ලලිතා දුවගෙන ගොස් ඔහුගේ වාහනය ඇර එහි තිබූ ෆයිල් කවරයක් රැගෙන ගෙට දුව ආවේ චායා බලා ඉඳිද්දීමය.

'මිස් ඉඳගන්න.'

ලලිතා යද්දී කීවාය. චායා සිනාසුනා පමණි. උඩු මහළට නගින්නට ඇති පියගැට පෙළ පාමුළදී ලලිතා අත තිබූ ෆයිල් කවරයෙන් විසිතුරු කාඩ් පතක් බිමට වැටුණි. ලලිතා එය දුටුවේ චායා දුටු පසුය.

## Happy Birth Day For Very Special One....

ඉර බැස යන මොහොතක තුරුල් වූ පෙම් යුවළක් ඉන්නා ඒ සුබපැතුම් පතේ රන් පැහැයෙන් එය මුද්‍රණය කර තිබුණි. චායාට පුදුම සිතුණි. ඔහු තමාගේ උපන් දිනය නොදන්නා බව ඇයට විශ්වාසය. එය ඇය හිලංකාට පවා කීවේ නැත. සමහරවිට ඔහුගේ ජීවිතයේ තවත් විශේෂ කෙනෙකුගේ උපන් දිනයක් අදට යෙදී තිබෙන්නට පුළුවන. ඇගේ සිත මොහොතකට අවුල් විය. ලලිතා එය අහුලාගෙන රැගෙන ගියපසුත් ඇය උඩුමහල දෙස බලා උන්නාය. ඔහු ආවේ නැත.

'ඇහෙනවා නේද උදේට තියෙන ජරමරේ.. ඔක්කොම ළඟට ඕනේ.'

රණතුංග මහත්මිය සාලයට ආවේ එසේ කියාගෙනමය.

'මං තෑගි වලට සල්ලි දෙන කෙනෙක් නෙවේ කවදාවත්.. ඒත් චායා මට හෙල්ලෙන්නවත් බෑ අද.. මේක තියාගන්න.. ඔයා ආස දෙයක් අද හවසට ගන්න.'

ඇය අත තිබූ සුදු පැහැගත් කවරය චායා අත තැබුවාය.

'මට තෑගි ඕන්නෑ මැඩම්..'

'මම මගේ හිතේ නැති කෙනෙකුට තෑගි දෙන්නෑ දරුවෝ.. මං ඔයාට ආදරේ නිසා දෙන්නේ..'

WWW.EXPRESSLANKA.TK 

රණතුංග මහත්මිය බලෙන්ම මෙන් කවරය වායා අත තබා කම්බුලට සෙමෙන් ගැසුවාය. වායා එකතැදීම පාත්වී ඇයට වැන්දය. සියළු බැඳීම් පසෙක තැබුවද තමාට ජීවිතයක් දුන්නේ මේ අපූරු ගැහැණියයි. තමා ඇයට මිස ඇය තමාට වරදක් කර නැත. වායා අවසන් වතාවටත් ඉහළමාලය දෙස බැලුවාය. වතුර වැටෙන ශබ්දය එන්නේ ඔහු බාත්රූම් එකේ නිසා වියයුතුය.

'මැඩම්.. මං කියන්නමයි හිටියේ.. මේ දවස්වල බිස්නස් ටිකක් විතර අඩුයි.. මම සර්ටත් කිව්වා..රටේ තත්වෙත් නරකයි තමා.. ඒත් අපිත් මොනාහරි කරන්න ඕනනේද...'

රණතුංග මහත්මිය සමග දිග මිදුල හරහා එද්දී වායා කීවාය. ඔහුට මේවල ගාණක් නැත. අම්මා කිව්වොත් පිළිගනු ඇත. වායා කියන සියල්ල ඔහුට වෙලාවකට නෑයෙයි. ඒ මොහොතට ඔහු බලා ඉන්නේ ඇගේ සුන්දර වත මල දෙසයි.

'රැ මටත් ඇවිත් කිව්වා.. ටී.වී ඇඩ් එකක් කරන්න රැ කාටද කතාකළා.'

'ඒක හොඳයි..'

'අලුත් ඩිසයින් ගනිද්දී වායා ටිකක් බලන්න. සර් සමහර වෙලාවට අහුවෙනවා. අලුත් පැටිත් ගැන ඔයත් උනන්දු වෙන්න.'

මේ ළඟදිත් එහෙම අහුවුනායැයි කියන්නට ඇයට සිතුණි. ඔහු ගැන දුක සිතී ඇය එය සඟවා ගත්තාය. සියල්ල කරන්නේ ඔහුගේ හොඳටය.

'මැඩමුත් සර්ට ටිකක් කියන්න. අලුත් සප්ලයර්ස්ලා ඉන්නවා. ටිකක් හොයලා බැලුවොත් අල්ල ගන්න පුළුවන්.'

'අපි සර්ට වෙඩින් එක වෙනකල් ටිකක් ඉන්න දෙමු.. ඊට පස්සෙ මිනිහම වැඩට බහියි.. මාත් කියන්නම්.'

ඒ වචන ඇයගේ හිසට දරුණු පහරක් ගැසුවාක් මෙනි. වායා අපමණ වේදනාවකින් තොල්පට තදකරගත්තාය. සිහිනයට වැඩි දුර නැත. ළඟදීම ඉන් ඇහැරෙන්නට තමාට සිදුවෙනු ඇත.

වායාත් රණතුංග මහත්මියත් ගේට්ටුව අද්දරටම ආපසු නවීන

WWW.EXPRESSLANKA.TK 

පත්තයේ කාරයක් පැමිණ එය අසළම නතර විය. පිටුපස අසුනෙන් බැස ආවේ හර්ෂණීය.

හර්ෂණීගේ දෙනෙත් ඕනාවට එපාවට මෙන් වායා වෙත යොමුවිය. වායා සිනාසුනද ඒ ඇගේ තියම ඉන්ද්‍රියානු සංකලනයේ මදහස නොවේ.

'මෙයාලා ඔෆිස් එකේ ප්‍රශ්න පාන්දරම මෙහාට ගේනවද.. ඇන්ටිට රෙස්ට් කරන්න ඕන කියලා දන්නැද්ද..'

ඇගේ හඬ මේ පාන්දර සෞම්‍ය බවට කිසිසේත්ම නොගැළපෙතැයි වායාට සිතුණි.

'අනේ නෑ.. කෙල්ලගේ අද බර්ත් ඩේ එක.'

රණතුංග මහත්මිය ඇයව බේරා ගත්තාය.

'මං යන්නම් මැඩම්.. යන්නම් මිස්..'

'පරිස්සමින් දරුවෝ..'

එසේ කීවේ රණතුංග මහත්මියයි. වායා දෙනෙත් පියාගෙනමෙන් හැරුණාය.

'අසංකයියා නාම තිදිද ඇන්ටි..'

වායාට ඇසුනේ ඒවචන පමණි. ඇය පටුපාර දිගේ ආවේ නොන්තුවාවෙනි. ජීවිතයේ තව කොපමණ කලක් නම් මේ දුක විඳවන්නද.. වායාට මහා ආත්මානුකම්පාවක් දුකක් දැනුණි. අද මේ ගෙදරට ආවේ අපරාදේ යැයි ඇය ප්‍රථම වරට සිතුවාය.

අනාගතයක් නැති ආදරයක් පිටුපස වැටී තමා අත් විඳින්නේ කවර සතුටක්ද... වායා සිතුවිලි අතර අතරමං වූවාය. ඔවුන්ගේ ලෝකයේ තමා නොවැදගත් සේවිකාවකි. රණතුංග මහත්මිය ව්‍යාපාර වලින් ඈත් වන්නට තීරණය කළේ අපරාදේ යැයි වායාට සිතුණි.

කුණාටුවක් අත ළඟ ළඟම එන බව කියවෙන ලකුණු දසතින්ම නැගවිත් තිබුනි. දත් ඉන්පලා දුවන්නට පමාවූවා වැඩිය. ජීවිත උයන පුරා කුළුඳුලේ හමා ගිය ආදර පවන් පොද කුණාටුවක් කියා කෙසේ සිතන්නද..

වායාට බිම වැටුණුඅසංකගේ සුබපැතුම් පත සිහිවිය. ඔහු ඒ සුබ පැතුම් පත ගත්තේ කාගේ උපන් දිනයක් වෙනුවෙන්ද..

WWW.EXPRESSLANKA.TK 360

# 36

කෙහෙල්මල් උපන්දිනයක් ගැන නොකියා සාමාන්‍ය ලෙස ඉන්නට වායාට සිතුණි. මේ ජීවිතයට තවත් විශේෂ දේවල් අවශ්‍ය නැත. සියල්ලෙන්ම වෙන්නේ හිත රිදීම පමණි.

"අද නම් කොල්ලා පැලෙයි ලස්සන දැකලා. කොහෙන්ද වායා මේ සල්වාර් එක ගත්තේ."

වායා දුටුවනම නිලංකා ඇසුවාය. හිතේ මතුවන බර ටිකක් හෝ අඩු වන්නේ කාර්යාලයට ආ පසුය.

"නුගේගොඩින් ගත්තේ."

"අද නම් මොකක් හරි විශේෂයක් තියෙනවා., මේ මොනවද කෙල්ලේ.."

බතුත් කිරිබතුත් බහාලූ බෑගය අල්ලා නිලංකා ඇසුවාය. ඇයට බොරුවක් කරන්නට වායාගේ හිත ඉඩ නොදෙයි.

"හවස කොහේ හරි මල් ටූවර් එකක් යනවද.."

"අද මගේ බර්ත් ඩේ එක කෙල්ලේ."

"හානේ.. මට කිව්වෙත් නෑ."

"ඒකේ කියන්න තරම් දෙයක් නෑ නිලංකා.."

"මට නොකිව්වට සර්ට නම් කියලා ඇති.."

"අනේ නෑ.. සර් දන්නෙවත් නෑ.. උදේ මං මැඩම්වත් බලල ආවේ."

"කොල්ලා උන්නද.."

වායාට ඔහුව සිහිවී සිනානැගුණි. කොතරම් දුකක් හිතේ තිබුනද ඒ නම සිහිකරද්දී පවා හිත බොළඳ වන්නේ ඇයි

WWW.EXPRESSLANKA.TK 

'සද්දේ ඇහුනා. මං ආපු බව දන්නෑ.. ගියාට වඩා හොඳයි නොගිහින් උන්නනම්..'

'ඇ..යි..'

'හිත රිදෙන එක විතරයි නිලංකා..'

ඒ වන මොහොතකට අඳුරු විය. හිතේ තැවුලින් ඒ වතේ කෝමල රේඛා සැඟවිය නොහැක.

'හැපි බර්ත් ඩේ කෙල්ලේ.'

නිලංකා ඇගේ කොපුළ සිප කීවාය.

'තැන්කියූ නිලංකා.. මං උඹේ පංගුවත් ගෙනාවා.'

'මට සුවඳ ආවා.. ඒකනෙවේ.. කලින් කොල්ලට කියන්නනේ තිබ්බේ.'

'නොකියාම ඉන්නනේ හැදුවේ. ඒත් දූක හිතුනා.'

'එච්චර නපුරු වෙන්නෙපා.'

'මං නපුරු නෑ නිලංකා.. මගේ දෛවය තමා නපුරු..'

'අන්න කුමාරය ආවා.. පලයන් ඇතුළට..'

'ඇයි මෙතන ඉන්නවා.'

වායා පුදුමවී මෙන් කීවාය.

'ආව ගමන් දෙන එක මං දන්නවනේ.. මෙතන උන්නාම ඒකත් දීගන්න බැරිවෙනවා.'

'උඹට ගහනවා.'

ඇය නිලංකාගේ බාහුව කොනිත්තා කාර්යාලය ඇතුළට පියමැන්නාය. ඔහු ළඟ ළඟම එන බව දූන ඇය බුදු පහනේ පරමල් ඉවත්කළාය. වායා උන්නේ බුදු පහනට තෙල් දමමිනි. ඔහු ඇතුළු වූයේ ඇයට නෑසෙන හඬින් දොර ඇරගෙනය.

නොසිතූ මොහොතක අසංක වායාගේ පිටුපසින් පැමිණ ඇගේ බඳ වටා දෑත් යවා තරයේ ඇයව ළං කරගත්තේය. ඇගේ ඉන්ද්‍රියානු ඇඳුමේ සිල්ක් රෙද්දේ සනීපය ඔහුගේ අත් වලට ගෙන ආවේ අමුතුම සනීපයකි.

'හරි.. මට බුදුපහන පත්තු කරන්න ඕනේ.'

'හැපි බර්ත් ඩේ බබා.'

වායාට පුදුමය. ඔහු තමාගේ උපන් දිනය දන්නේ කෙසේද.. ඔහු වැළඳගෙන සිටිද්දීම වළල්ලක් මෙන් බඳවටා එතුන ඔහුගේ දෑත මැද දිම ඇයඹහු දෙසට හැරුණාය.

'ආ.. මගෙන් පුංචි තෑග්ගක්.'

ඔහුගේ සූරතේ වූ ක්‍රීම් පැහැගත් රන් ආභරණ අසුරණය දෙස ඇය බලා උන්නේ ඊටත් වඩා පුදුමයෙනි. මුලින් ඇය සිතුවේ උදේ රණතුංග මහත්මිය උපන් දිනයට ගෙදර ආ බව කියන්නට ඇති කියාය. එහෙත් මේ දන් තෑගි.. මේවා මේ පාන්දර ගත නොහැක.

'ගන්න මැණික..'

දවස තිස්සේම දෑස්වල කැටුන කඳුළු උදයන ගැල්වූ රෝස පුයර තට්ටුව කපාගෙන ගලාගියේ නොසිතූ ලෙසිනි.

'ඇයි දෙයියනේ මේ අඬන්නේ..'

ඔහු ඇගේ කෙටි කොණ්ඩය යටින් අත දමා ගෙළ පිරිමැද ඇසුවේය.

'කො..හො..ම..ද.. බර්ත් ඩේ එක කියලා දන්නේ.'

ඇය ඇඩුම්බරව ඇසුවාය. ඔහුගේ මුහුණේ ඇඳුනේ හිතුවක්කාර දහකාර සිනාවකි.

'මගේ කෙල්ලගේ උපන්දිනේ මං දන්නැත්නම් කවුද දන්නේ.'

අශංක හැඟීම්බරව කියුවේය. වායාගේ ළයේ පතුරු ගැලවී යන්නට විය.

'අ..නේ.. ම..ම..'

ඇයට කියාගන්නට ඉඩක් නැත. ඉකිබිඳුම් පෙරටු කරගෙන මහ හඬින් ඇඩුම් ආවේය.

'පාන්දර දූවගෙන ආවේ කඳුළු දකින්න නෙවේ රත්තරන්..'

WWW.EXPRESSLANKA.TK 363

අසංක ඇගේ දෙනෙත් වල නැගුණ කඳුළු ඔහුගේ අතින් පිසදැම්මේ ඒ වත සුමලට හානියක් නොවන ලෙස මෘදුවය.

'ම..ට.. මෙච්චර ආ..ද..රේ.ද..'

'කොච්චරද කියලා මමවත් දන්නෑ චායා.'

චායා ඔහුටත් නොසිතූ මොහොතක ඔහුගේ දෙකොපුළ තදින් සිපගත්තාය. හදට න ැගුණ හැඟීම් මැඩගන්නට අද ඇයට නොහැක. වෙන දෙයක් වෙච්චදෙන්.. මම ආදරේ කරනවා.. ඇගේ දෙනෙත් වල වූයේ එවැනි කතාවකි.

'මගේ නැග්ග බලන්නෑ.'

ඔහු අයරණව ඇසීය. චායා ඔහු අත තිබූ රන් පෙට්ටිය විවර කර බැලුවාය. එහි වූයේ පෙළින් පෙළට සුදු ගල් ඇල්ලූ තරමක් ඝනකම් රන් චේන් පටකි.

'ඇයි මට මෙච්චර දෙයක් ග .න්..නේ.'

'මට මේකත් මදි බබා.'

'මිනනැති වැඩ කරන්නේ.'

'මං දන්නද..'

'ම්..'

අසංක ඒ රන් චේන්පටගෙන ඇගේ ගෙළ යටින් දතම යවා එය බැන්දය. දෙවියට වැරදීවත් මේ චමත්කාරජනක මොහොත පෝරුමස්තකයක යළි උදාකර දෙනවා නම්.. චායා සිතුවේ දැඩි ලෝබකමිනි. ඔහු රන් චේන්පටගෙළ පළඳ එහිවූ සුදු ගලක් ඇල්ලූ පෙන්ඩනය ඇගේ ළැමට ඉහළින් සකස් කළේය. ඊටත් පසු ඒ පසුවත් ගෙළත් මුහුණත් දයාබරව සිපගත්තේය. ඇය පියාගත් දෙනෙත් විවර කළේ ඔහු ඇගේ දෙතොල් පටින් බොහෝ වේලාවකට පසු දෙතොල මුදගත්විටය.

'ඒක තමයි මං ආය නැග්ග..'

චායා මිමිණුවාය.

'මොකක්ද..'

WWW.EXPRESSLANKA.TK 

'කිස් එක..'

'එහෙනම් තව තෑග්ගක් දෙන්නද..'

'එපා එපා. මේ ඇති.'

තවමත් ඔහුගේ දෑත ඇගේ උරහිස මතය.

'උදේ මං ගෙදර ආවා..'

'ඇයි මට කතා කළේ නැත්තේ.'

'මට උඩට එන්න පුළුවනෑ.. බලං හිටියා.. ලලිතට කෑ ගහනවා නම් ඇහුනා.'

හර්ෂණීව සිහිවී චායාගේ ළය බරවිය. ඔහුගෙන් ඒ ගැන අසා පලක් නැත. ඒ තරම් අසංකව අසරණ කරන්නට ඇයට හිතක් නැත.

'අපි හවස කොහේ හරි යන්..'

'මං අම්මට කියලා ආවෙත් නෑ.'

'වෙලාසන ගිහිල්ලා කියලා එන්න.. අද විශේෂ දවසක්නේ.. ආයනෑ මගේ ළඟට වෙලා ඉන්න.'

චායා නෙත් ඉහළට ඔසවා ඔහුගේ දෙනෙත් සෘජුව අල්ලා ගත්තාය.

'මට.. සර් එක්ක ඉන්න හැම දවසක්ම විශේෂයි.. අද විතරක් නෙවේ.. එහෙම දවස් තියෙන්නේ ඒකයි.'

අසංක කතා කළේ නැත.

'මං කීයටද ගෙදර යන්නේ.'

'තුනට විතර ගිහිල්ලා එන්න.'

'හැමදාම මෙහෙම බෑ සර්.. හරි දුක හිතෙන එවා වෙනවා.'

'මට ලලිතා කිව්වා අද උදේ ඔයා ඉඳිද්දීම හර්ෂණී ආවා කියලා.'

'මට හිතෙනවා වැරැද්ද කළේ මම කියලා. මමම ඒක හදගන්නද..'

'මේ ලස්සන මූණ අද අඳුරු කරගෙන ඉන්නෙපා.. අපි හවස කතාකරමු.'

WWW.EXPRESSLANKA.TK 365

'කතා කරලා ඉවරයක් කරගමු..'

චායාගේ උරහිස මත තිබූ අසංකගේ දෑතම පහළට වැටුණි. ඔහු තම ආසනය වෙත ගියේ දැඩි වේදනාවෙනි.

කළය මුව පිටටම පුරවා ගත්කළ රැගෙන යාම අසීරුය. කොපමණ අසීරුවෙන් එය අරගෙන ගියද බිඳක් හෝ හැලෙන්නට බලයි. මේ හිතද රැගෙන යාම එතරම් අසීරුය. මේ හිත පුරවා ගත්තේ ආදරයේ නමින් ප්‍රථමව ඉනූ ආදර උල්පතෙනි. ඒ උල්පතින් යළිත් මේ දිය නොගැලෙන බව චායා දනී. එහෙත් කොයි මොහොතක හෝ කලය බිඳී යයි. එකතු කළ ආදර ජලයද විසිරී යයි. කළය.. බිමින් තබනවාටද හිත ඉඩ නොදෙයි.

තීරණගන්නට හිත ඉගෙන ගෙන නැත. උගන්වන්නටද නොහැක. කෙල්ලෙක් කැමති වන්නේ කවුරුන් හෝ කියනා තීරණ වල පිහිටා වැඩ කරන්නාටය.

'මට ගෙදරදීත් උඹයි සර්රුයි ගැන හරියට මතක් වෙනවා. ඉස්සර නම් මට පුදුම හිතුනා. ඒත් දැන් පුදුම හිතෙන්නේ නෑ.'

දහවල් කන්නට ඉඳගත් පසු තිලංකා කීවාය. බත් පත විවර කරද්දීම ආ කහබත් සුවඳින් මුළු කාමරයම පිරී යන්නට ගතවූයේ එක තත්පරයකි.

'වෙලාවකට මටත් මං ගැනම හරි පුදුමයි තිලංකා..'

චායා තිලංකාගේ බත් පතද විවර කර දුන්නාය. එහි ඇත්තේ රත් පාටකි..

'අම්මේ.. මෙහෙම බත් එකක් නම් කාලෙකින් දැකලත් නෑ. හරි රස ඇති චායා.. මැඩමුත් ආසාවෙන් කයි..'

'ඊයෙම මං අම්මාට කිව්වා බත් සර්ටත් ගෙනියන්න හදන්න කියලා.'

'ඒක තමයි මේ තරම් රසට හදන්න ඇත්තේ.'

'අම්මත් මගෙන් ගොඩක් ප්‍රශ්න වලට උත්තර බලාපොරොත්තු වෙනවා තිලංකා.. දෙන්න උත්තර මං ගාව නෑ.'

WWW.EXPRESSLANKA.TK 366 උත්තර

නෑ චායා.'

නිලංකා ආශාවෙන් ඇනූ බත් කට මුවට තබාගෙන කීවාය. කහබත් කහපාට වුවද මේ කහබතේ රස හැමෝටම ගත නොහැක.

'වෙලාවකට හිතෙනවා නිලංකා හැම දෙයක්ම දමලා ගහලා ගෙදරට වෙලා ඉස්සර වගේ ඉන්න. ඒත් බස් එක ටිකිට්ටක් ලේට් වෙනකොට හිතට අප්සෙට්.. එහෙම මම කොහොමද නොදක ඉන්නේ.'

'දෙන්නටම අමතක කරන්න බැරිනම් ඔන්න ඔහේ ලව්කරපන් කෙල්ලේ.. මොනවා හරි ලොකු දෙයක් වෙලාහරි හොඳ දෙයක් වෙයි.'

දෛවය ඉදිරියේ ඒ තරම් නිර්භීත සෙබලියක් වන්නට තමාට නොහැක.

'ඒක කරන්න බෑ නිලංකා.. මැඩම් සර්රුයි හර්ෂණී මිස් ගැනයි ලොකු බලාපොරොත්තුවකින් ඉන්නේ. අද උදෙත් දෙන්නගේ වෙඩින් එක ගැන කිව්වා.'

'දෙන්නෙක් දෙපැත්තේ දුක් විඳ විඳ කාගෙවත් තීරණ උඩ වැඩ කරලා වැඩක් තියෙනවද.'

එය එහෙමදැයි චායාද නොදනී. හෙට හෝ අනිද්ද ඔහු ජීවිතයේ නොඉන්නට පුළුවන. චායා දන්නේ අදඔහු තමාගේ ජීවිතයට නැතුව බැරිබව පමණි.

'මම මගේ අතීතය.. මගේ දුප්පත් කම අමතකකරලා ඉන්නවා නෙවී නිලංකා.. ඒවා හැම තිස්සෙම හිතේ හොල්මන් කරනවා. ඒත් එකපාරක් මූණ දක්කහම ඔක්කොම අමතක වෙලා ආදරේ කරන්නම හිතෙනවා.'

'ආදරේ එහෙම තමා චායා.. කරන්න කරන්න තවත් ලෝබකම වැඩිවෙනවා.'

'ඕනවට වඩා හිතේ පුරවගෙන එකපාර හිස් වුනොත් කියලා තමයි මට බය.'

'වෙන්න තියෙන දෙයක් වෙයි කියලා හිතලා අපි මෙහෙමම ඉමු චායා. සමහරවිට උඹ නොහිතන දෙයක් වෙයි.'

WWW.EXPRESSLANKA.TK 367

ඒ නොසිතන දෙය කුමක්දැයි වායා ඇසුවේ නැත. ජීවිතයක ප්‍රතිහාර්යයන් වෙනවා අඩුය. ඒ නිසා හිත ඉල්ලන පෙළහර පාත්තටද අවසර දිය නොහැක.

'බත් එක දීලා ආවා.. තනියම කනවද දන්නෑ.. මං බලලා එන්නම්.'

වායා බත් මුලෙන් අඩක් පමණක් කා නැගිට්ටාය.

'මට මෙතන තනියම කන්න පුළුවන්.. මේකත් අරගෙන ගිහිල්ලා කවපන්.'

ඇය එතන කමින් උන් බත් මුල අතට ගත්තේ සිනාසෙමිනි.

'ඔච්චර ලව් එකක් නවත්තන්න මං හිතන්නෑ බ්‍රේක් පලු තියෙයි කියලා.'

'කොහේ හරි කඩාගෙන කඩාගෙන ගිහිල්ලා හැප්පිලා කුඩු පට්ටම් වෙලා නතර වෙයි.. නේ..ද..'

වායා එසේ කියාගෙනම කාර්යාල කාමරයට ඇතුළු වූවාය. සිතුවා හරිය. ඔහු බත් මුල දිගහැරගෙන ඔහේ අත ගාමින් උන්නේය.

'අම්මගේ බත් එක රහයි.. ඒත් තනියම කන්න බෑ..'

වායා ඔහු අද්දර තිබූ අසුනට බරවූයේ තම බත්පත පසෙක තබා ඔහුගේ බත්පත ළඟට ගෙනය.

'බබෙක් හදාගත්ත නම් මීට වඩා හෙඳයි.'

ඇනූ බත් කටක් ඔහුගේ මුව වෙතට ළංකර වායා කීවාය. ඔහු ඇගේ මැණික් කටුව ළඟින් අල්ලා ගෙන බත් කට නොකා බලාඋන්නාය.

'ක..න්..න..'

ඇය ඔහුගේ නිකටට යටින් අත තබාගෙන කීවාය.

WWW.EXPRESSLANKA.TK 368

# 37

වායා කැඩපත අභියසට වී ගෙළත් ගෙළමත ඔහු පැළැන්දූ මාලයත් ඇඟිලි තුඩු වලින් පිරිමැද්දය. උදේ මේ මාලය ඔහු පැළැන්දූ හැටි සිහිවී වායාගේ ළය අලුතින් ඇවිලිණි. සංසාරයේ අපමණව ආදරය කරන්නට ඇත. සෙනෙහෙදම්ද පූරන්නට ඇත. එහෙත් ඔහුවත් පෙම්වතෙකු මුණ නොගැසෙන්නට ඇත. නැතහොත් සසර පුරාම හමුවන්නට ඇත්තේ ඔහුවය. එසේ හමුවූ ඔහු මේ සංසාරයේ හමුවී අභිමිවන්නේ ඇයි.. ආදරය කරන්නට මිසක හිමිකරගන්නට පින්නැති සංසාර බැඳීමක් ජීවිතයේ මැවූනේ ඇයි.. දුක්දී අනන්තයටම වදදී ඒ දුකත් සමඟ මැරී යන්නටද.. පැලීයන්නටද.

වේන්පවේ දිගටම අල්ලා තිබූ කුඩා සුදු ගල් වල කාන්තිය ගෙලට වැටී තිබේ. ජීවිතය පුරාම කර සැරසුවේ පවුමක වේන් පටකි. එහෙත් ඒ වේන්පටට වායා පණමෙන් ආදරය කළාය. අද එය ගලවා මේ වේන්පට ඔහු දැමුයේ ජීවිතයේ එක යුගයක් නිමාවූ බව දන්වන්නද. මාලය ඉතා වටිනා එකක් බව පැහැදිලිය. වායාට ලෝබසිතුණි. මේ තරම් වටිනා තෑග්ගක් ඔහු උපන් දිනයට ගෙනේවි යැයි ඇය නොසිතුවාය.

වායාට දුක තෑග්ග නොවේ. ඔහු තමාගේ උපන්දිනය මතක තබාගෙන තමා වෙනුවෙන්ම මෙය ගත් එකය. හවස හමුවූ පසු උපන් දිනය දනගත්තේ කෙසේදැයි ඇසිය යුතුය.

WWW.EXPRESSLANKA.TK 369

ආදරය දුඛාන්තයක් ගෙනෙන බැඳීමක් නොවිනි නම් අද කොතරම් සතුටු දවසක්ද.. ඒ ඇස්වල දවටි දවටී ඒ පපුවේ ඇලී ගැලී ජීවත්වන්නට හිත මොනතරම් ආශා කරනවාද..

පද්මා සෑහෙන වෙලාවක සිට දුව දෙස බලාඋන්නාය. එපා කියද්දීත් ඇය හවස නෑවාය. තවමත් ඇඳගෙන ඉන්නේ තැඹිලි පැහැගත් නුවායයි. ඒ නිසා පපුවෙන් ඉහළ එහෙම් පිටින්ම විවෘතය. දියණියගේ ගෙළේ වූ අලංකාර මාලය ඇය අපූරුවට දක ගත්තාය. කිසිවක් ගැන හිත වෙහෙසා සිතිය යුතු නැත. ඇයට සියල්ල අවබෝධ විය. පඩි නුනහතරක් එකතු කළද එවැන්නක් ඇයට මිලට ගත නොහැක. යට ඇඳුමක් ගත්කල ගෙදර විත් කියන දියණිය මේ තරම් වටිනා මාලයක් තමාට නොකියා නොගන්නා බව පද්මාදනී.

නොහිතූ මොහොතක චායා හැරී අම්මා දෙස බැලුවාය. මේ මාලය කව්රු හෝ පළඳන්නට ඇත්තේ සෑහෙන වේලාවක් තෝරා වියයුතුය. එය ඒතරම්ම ගෙළට ගැලපේ.

'මේ.'

චායා මාලයට දෙඅත් යවා අම්මාට එය පෙන්නුවාය. පුංචිම දවස්වලදී ඇය අලුත් පුකුරුත්තමක් ඇඳ පෙන්වන්නේද මෙලෙසය. ඒ බොළඳකම අදත් ඇගේහිතේ ඇති බව චායා දනී. වෙනසකට ඇත්තේ ඒ බොළඳකම් උපන් වස්තු වෙනස්වීමය. එක කාලයකින් පසු දූවරු අම්මලා දෙන දේවලට කැමති නැත. ඔවුන් ඔවුන්ට විශේෂ ඒවා තෝරා ගනිති. ඒවා නැතුව යද්දී කෑගසා හඬති.

'ලස්සනද අම්මේ.'

චායාට අවශ්‍ය අම්මාව පටලවාගන්නටය.

'දුපූ එක්කෙනා ලස්සනයි කියන්න ඇතිනේ.'

ඇය බිම බලාගත්තාය. දියණියගේ ඇස්වල ඇති කාන්තිය දෙස පද්මා බලාඋන්නේ අහිංසක ආශාවකිනි. මේ සතුට හැමදමත් තිබේනම්.. දුප්පත් කෙල්ලගේ පපුව පාමුළින් ආදරයක් කියා හීනයක් තැබුවේ ඇයිදැයි පද්මා තමාගෙන්ම ප්‍රශ්න කළාය.

'බර්න් ඩේ එක කොහොම දනගෙනද දන්නෑ.. මට හරි පුදුමයි..'

අම්මගෙන් පිළිතුරක් ලැබුනද නොලැබුනද චායා කියවයි. ප්‍රේමයේ අරුණෝදය වැටුන හැම යුවතියකම මෙතරම් හැඟීම්බර වන්නට ඇත.

WWW.EXPRESSLANKA.TK 370

පද්මා දියණියට සිනා නොවූනාය. ඇයට දුක කෙල්ලට ආදරය බරක් වීම පමණි.

"මොකක්ද අදින්න යන්නේ."

පද්මා ඇසුවාය. වායා අල්මාරිය ඇර එය දෙසම බලාඋන්නාය. ඔහු හමුවන්නට යන හැම දිනයකම ඇඳුමක් තෝරා ගැනීම පැයක් හමාරක් ගතවන ප්‍රශ්නයකි.

"ඉන්න.."

පද්මා ගොස් ඇය දවල් ගෙනවිත් තැබූ අලුත් සායත් රෝස පැහැගත් අලුත් කමිසයත් රැගෙන ආවාය. ඇය මේ ඇඳුම තෝරාගත්තේ මහරගම සාප්පු වල පැයක් පමණ රස්තියාදුවීය.

"ආ.. මේක අදින්න."

වායා අම්මා දුන් ඇඳුම අතට ගෙන බලා උන්නාය. දිලිසෙන රිදී පැහැයක් සහිත රෝස පැහැගත් කමිසය දුටුවනම ඇගේ හිත් ගත්තාය.

අම්මා ගියපසු වායා දිගටම හිතුවේ අම්මා ගැනය. ඇය බොහෝ දේවල් නොකියා නිහඬව දරා ඉන්නා බව වායා දනී. අම්මා මේ තරම් නිහඬ ගැහැණියක් නොවේ. විශේෂයෙන් ඇය තමාගේ කාරණාවලදී ඕනාවටත් වඩා දෙඩමළුය. ඇය කිසි දිනයක තමාගේ තීරණයකට විරුද්ධ නොවන බව වායා දැන උන්නාය. තමාගේ සතුට ඇත්තේ කොයි පැත්තේද ඇය උන්නේ ඒ පැත්තේය.

අද ඉන්නේ දුක පැත්තේද සතුටු පැත්තේද කියා වායාට තේරුමක් නැත.

ප්‍රේමයට ඉවුරක් නැතිබව මේ ළඳ බොළඳ යුවතිය දැනඋන්නේ නැත.

වායා ඇඳගෙන අම්මාව සොයාගෙන ගියාය. පද්මාට ඇය ඇඳගෙන ආපසු බැලුනේ රෝස පැහැගත් කමිසයේ උඩ බොත්තම ඇරී ඒ යටින් පෙනෙන රන්මාලය දෙසය. දියණිය ලස්සනය. කොහොමටත් ලස්සනය. අද වෙනස් ලස්සනක් ඇත. ඒ ලස්සන උපන්නේ තමා තෝරූ ඇඳුමින් නොවේ.

"අම්මේ.."

WWW.EXPRESSLANKA.TK 371

පද්මා දියණියගේ වැසී තිබූ කොළරය මදක් කර පෙනෙන ලෙස සකස්කළේ හැංගී තිබුණ මාලය පෙනෙන ලෙසය.

'මොකෝ..'

'හදිස්සියෙවත් රජ්සාවෙන් මං අස්වුනොත් අපිට පිරිමහ ගන්න පුළුවන් වෙයි නේද අම්මේ.'

චායාගේ කතාවට පද්මා ගැස්සී ගියාය. රජ්සාවට මේ ජීවිතයට දියණිය කොතරම් ආශාකරනවාද කියා පද්මා දනී. රැකියාවට ගියපසු ඇය රැකියාව ගැන හැර අන් දෙයක් ගැන කතාකරනු පද්මා නොදුටුවාය. නොඇසුවාය. රැකියාවෙන් පසු ජීවිතයට එළියක් වැටුණි. අද ඒ සියල්ලගෙන්ම ඇය ඈත්වන්නට හදන්නේ ඇයි..

'මොනවද පූතේ මේ කියන්නේ.'

'එහෙම හිතෙනවා අම්මේ.. මට බනින්න එපා.'

පද්මා චායාගේ හිස අතගෑවාය. දියණියගේ සම්බන්ධකම් ගැන ඇය සමඟ විවෘතව කතාබහ කරන්නට තිබුණි. ඇයකියා කා සමඟ දෙඩන්නද.. තමා නිහඬව සිටීමෙන් කළේ වරදකැයි පද්මාට සිතුණි. චායා සෘජුව ඒ ගැන නොකීවේ යුවතියකට.. දරුවෙකුට ස්වභාවයෙන්ම පිහිටන කෝලබව නිසාය. හාර අවුස්සන්නට තිබුනේ තමාටය.

'අපි රෑට කතා කරමු.. දැන් යන්න ගිය ගමන යන්න. ප්‍රශ්න හිතට කරදර කරද්දී තීරණ ගන්න යන්නඑපා.. ඒක එච්චර හොඳ දෙයක් නෙවේ.. ආ මේ පැණින් එකත් බීලම යන්න.'

චායා අම්මා හදතිබූ වැල් දෙඩම් වීදුරුව බීගෙන බීගෙන ගියේ සහරා කතරේ පිපාසයෙන් උන් කෙනෙකු මෙනි.

'අම්මේ.. චුට්ටක් රෑ වුනාට කමක් නැද්ද.'

චායා බැගෑපත්ව ඇසුවාය.

'ගොඩක් රෑ වෙන්නත් එපා.'

'චු..ට්..ට..ක්..'

'රෑට කාලද එන්න හදන්නේ.'

'මං අම්මටත් එක්ක මොනාහරි අරගෙන එන්නම්.'

'එපා.. මං හාල් හුණ්ඩුවක් තියාගන්නම්.'

'එහෙනම් මාත් නොකා එනවා.'

'යන්න.. දරුවො...'

චායා මහට බැස්සේ මැඩගත් සිනාවෙනි.

හිත නිස්කලංක නම් මේ සතුට කප්පරක් විඳිය හැක. දුක එසේ නැති එකය. සැනසිල්ලේ ආදරය විඳගන්නට තමාට පිනක් තිබුනේ නම්.. මේ හිත බලාපොරොත්තු වලින් පුරවා ගන්නට තිබුණි. හීන වලින් සරසා ගන්නට තිබුණි. අද ඒ දෙකම කරන්නට හිතට බයය.

**************

ඩෙනිම් නිල් කලිසමත් නිල් කොටු අත්කොට කමිසයත් ඔහුට ගෙනවිත් තිබුනේ ලාබාල පෙනුමකි. චායාත් අසංකත් රැගත් වාහනය ගාලු පාරදිගේ කළුතර දෙසට ඇදී යමින් තිබුනේ වේගයෙනි. හැන්දෑ අඳුර මුහුදුබඩ පොල් ගස්මනට පාත්වී තිබුනි. නව මොහොතකින් කළුවර වනු ඇත.

වායුසමීකරණයෙන් එන සීතල වැඩිය. චායාගේ දෙඅත්ලම සීතලෙන් හෙත්ව තිබුණි. ඇය ඒ දෑත් එකට තද කරගෙන ඔහු දෙස බැලුවාය. ඔහුට සීතල ගාණක් වත්නැත.

'අනේ මට සීතලයි.'

චායා ගැහෙමින් උරහිස් අකුළුවා කීවාය. ඔහු එක කෙලින්වූ කොරළවැල්ල මාර්ගයේ වේගයෙන් වාහනය පදවන අතරතුර ඇයවෙත හැරුනේ හිනැහීගෙනමය.

'සෝ් අත දෙන්න.'

ඇය අත ඔහුගේ වමත මැද තැබුවාය. හවස ගැල්වූ මේරුන් පැහැගත් තිය ආලේපනය තිසා දෑත් සුන්දර වී ඇත.

'මේ.. අත හරි උණුයි..'

ඇය ඔහුගේ [illegible] විඳ කීවාය.

WWW.EXPRESSLANKA.TK 373

චායා ඒ අත්ලේ නම සීතල කුඩා දෙතොල තබා පිරිමැද ගත්තේ කුඩා දැරිවියක මෙනි.

ජීවිතයට මේ අත්ල තරම්වත් උණුසුමක් ලැබෙනවා නම්.

'ස..ර්.. ඇයි මෙච්චර දුර..'

නළුතර චෛත්‍යයේ යෝධ පහළ බඳ පෙනෙද්දී චායා ඇහුවාය.

ඔහු දන්නේ හැම එකටම සිනාසෙන්නට පමණි. කොල්ලෙක් උපන් ගෙයි හිතුවක්කාරයෝය.

'මං පඬුරු දන්නද.'

'හා..'

චායා අත් බෑගයේ වූ මාරු කාසි අහුරක් ගෙන ඔහුගේ පුරතද ඊට ස්පර්ශකොට වාහනයෙන් පාවහන් ගලවා බැස්සාය. පඬුරු දමා නත්පරයක් දෙකක් ඇය වැඳගෙන උන්නාය.

'බෝධියට වෙන බාර ඉෂ්ඨ වෙනවලු.'

අසංක කීවේ වාහනය පන්සල ළඟින් ගනිමිනි.

'පඬුරු දානකොට පතන ඒවා වෙනවානම් මං හැමදම හවස ඉන්ටර් සිටි එකක ඇවිත් පතන්නම් ස..ර්..'

ඒවචන දුක්බරය. අද හැන්දෑවට කඳුළු ඕනාම නැත. චායා තොල් පට විකා සිනාසුනාය.

'මං හිතුවා ඇඬුවා කියලා.'

ඔහු හැඟිම්බරව කීවේය.

'අද රෑ විතරක්.. අඬන්නැතුව ඉන්න උත්සාහ ගන්නම්. අඩපු නැති දවසකුත් තියෙන්න ඕනනේ.'

ඔහු ළඟදී හංගාගත් කඳුළු වැටෙන්නේ ඔහුගෙන් සමුගත් පසුය.

ඔහු වාහනය හැරවූයේ විශාල පොල් රුප්පාවක් මැදින් වැටුන සොඳුරු සෙවනකටය. පොල් රුප්පාව මැදින් වැටුන මාවත නිමාවූයේ ළගන්නා සුළු අවන්හලකය. ඉන් ඔබ්බෙන් වූ මුහුදු තීරයද සුන්දරවිය. ජීවිතය ගැන ඔහු සමඟ නිස්කාලංකයේ කතාකරන්නට මෙතන හොඳය.

ඔවුන් ගියේ පොල් අතු හෙවිණි කළ ආරුක්කුව යටින් මුහුද අද්දරම [illegible] ගෙය චේතටය. තුනී එළියක් ගලා ආ

WWW.EXPRESSLANKA.TK 374

ළන්තෑරුමකට සමාන විදුලි බල්බයක් පමණක් එහි දල්වා ඇත.

අඩි හතරක් පමණ වත්තට උණ බට ගස් වහළට පොල් අතු දමා සකස් කර තිබූ ඒ කුඩා ගිම්හාන නිවස දකිද්දී වයාට සිනා නැගුණි.

'මොකෝ හිනාවෙන්නේ.'

ඔහු වඩාත් ශක්තිමත් ලෙස ඇගේ අතැඟිලි තුඩු අල්ලා ගත්තේය. ඒවා වාහනයෙන් බැස්ස මොහොතේ සිට උන්නේ ඔහුගේ පහස සොයමිනි.

'නෑ නිකං..'

'අනේ කියන්න.'

'සර්රුත් හොයාගන්නෙ පුදුම තැන්.'

'මට මෙතන කිව්වේ කවුද දන්නවද.'

'නෑ.'

'අපේ නාලකයා.'

'සර් එයාටත් කිව්වද.'

'ම්.. මං ඇහුවා ඔයත් එක්ක හවස බර්ත් ඩේ එක සෙලිබ්‍රේට් කරන්න යනවා කොහෙද හොඳ කියලා. නාලකයා මෙතන කිව්වා. ඌ ඉස්සර බෙල්වුඩ් එකේ කෙල්ලෙක්ට ලව් කළා. කෙල්ලගේ බර්ත් ඩේ එකට මෙතනට ඇවිත් කේකුත් කැපුවලු.'

'දන්නෝ.. ඒ ගර්ල්.'

'මූව අතෑරියා.'

වයාට දුක සිතුණි. ඒනැතත් නාලකගේ අසරණ මුහුණ මැවී පෙනුනි. ඔහුට කොහොමටත් ඇත්තේ ආදරයෙන් පරාජිත මුහුණක ලාංඡනයකි.

'මම නම් කේක් ගෙනාවේ නෑ.'

'මූත් හවසනේ කිව්වේ. මට වෙලා තිබුනේ නෑ. අපි මගේ උපන් දිනේට කේක් අරගෙන එමු.'

හිතේ විදුලියක් කෙටීය. මේ ආදරය ඒ තරම් අනාගතයට විහිදී

WWW.EXPRESSLANKA.TK 375

යනවාද.. සමහරවිට ඔහුගේ උපන් දිනයට තමා ඔහු ළඟ නැතිවන්නට පුළුවන.

චායා හිතුදේ කීවේ නැත. දුක බව දැනදැනත් ඒවාම මතක් කරන්නේ ඇයි.

පොල් අතු සෙවිලි කළද එය එළියේදී දුටුවාට වඩා ලස්සනය. අසංක ඒවනවිටත් බැසයමින් තිබූ ඉරමල දෙස බැලුවේ චායාගේ උරහිසටද අතක් තබාය. මෙසේ උදාවෙන රාත්‍රිය සදාකාලික වේනම් ජීවිතයේ කිසි දිනයක් එළි නොවෙනවා නම්..

උරහිස මත තිබූ ඔහුගේ අත මත චායා මුහුණ තබාගත්තාය. ඒ අත ඕනාවටත් වඩා උණුසුම්ය. අදවන් දවසක මේ දැනෙන උණුසුම අනාගත දවසකදී විඳගන්නට අරන් තබාගත හැකිනම්.. ඔහු ඇඟිලි තුඩින් ඇගේ දෙතොල් පට වල රේඛාවක් ඇන්දේය. චායාට කිති කැවිණි. ඇය ඒ ඇඟිල්ල සෙමෙන් විකාගන්නේ සිනාවද සඟවාගෙනය.

'කෝ මටත් කරන්න..'

අසංක ඇය වෙත මුව පෑවේය. චායා ඔහුගේ දෙපා වලට මූළු ගතේම බරදී දෙතොල් පට දිගේ සිහින් තිය තුඩ ගෙන ගියාය. මඳ වේලාවක් එසේකර ඔහුට කිති නොකැවෙන කල ඇය මූළු අත්ලෙන්ම ඒ මුහුණ අතගෑවාය. අසීමිත ලෝබකමකින් මූළු හාදවතම වෙව්ළුම් කෑවේය.

'මොනවද මැණික කල්පනා කරන්නේ.'

ඔහු මොලොක් හඬින් ඇසුවේය. චායා දෙනෙත් අඩවන් කර සිහින් සිනාවක් පෑවාය. හිතේ ගින්දර මේ සෞම්‍ය ප්‍රේම සැඳෑවට කොහෙත්ම නොගැළපේ.

'මගේ උපන්දිනේ දැනගත්තේ කොහොමද කියන්න.. මං ගෙදර ගිහිල්ලත් හිතුවා.'

අසංක ඇගේ අත ගෙන තම අත්ල මත තබාගත්තේය. ජීවිතයම ඒ සුරතේ ඇතැයි ඔහුට සිතුණි. අහිමිව යන්නේද එවිට මුළු ජීවිතයමය.

'කොහොම හරි මං හොයාගන්නනේ..'

'තව මොනවද එහෙම හොයාගෙන තියෙන්නේ.. මං ගැන..'

WWW.EXPRESSLANKA.TK 376

'[illegible] මොනවද

කියලා.'

ඒ දෑස්වල අවංකකම සාගරයක් තරමට තිබුණි. චායා අහිංසක ලෙස ඔහුගේ උරහිසට බරවූවාය. දෙඩන හැම වදනකම ඇත්තේ ආදරයයි. බලන හැම බැල්මකම ඇත්තේ ආදරයයි. ඒ සියල්ල එක්වී දිඅණක සඳන්නේ මහමෙර තරම්වූ දුකයි.. වේදනාවයි..

'මං අම්මට මුකුත් කියලා නෑ.. ඒත් අම්මා හැම දේ.. දන්නවා.. හරි පුදුමයි.'

'මේ ඇස් දෙකේ ආදරේ ගලනවා.. ඒක බලන ඕන කෙනෙකුට කියන්න පුළුවන්.'

'මොන පාටද.. කියන්න බලන්න.'

'එක පාටක් නෙවේ මැණික.. ආදරේ හැම පාටම තියෙනවා.'

'හ..රි.. දුක පාටකුත් ඇති නේද..'

'ඒ පාට මේ මගේ ඇස්වලත් තියෙනවා නේද..'

ඔහු ඇඟිලි තුඩු තම ඇස් සමීපයට ගෙන ගොස් කීවේය. ඇත්තටම ඒ ඇස් පසුව අවුළුවා ලන තරම් දුක්බරය. එහෙම දුක්ගන්න එපායැයි කියන්නට චායාට සිතුණි.

'ඒ පාට මගේ ඇස්වල වීතරක් තිබ්බාම ඇති සර්..'

අසංක ඉඳගෙන උන් ආසනයෙන් නැගිට ඇය අභියසටම පැමිණියේය. ඇයද ඒ අනුව නැගිට්ටාය. ඔහුගේ දෑත ඇගේ බඳ වටා ගියෙත් ඇගේ දෑත් ඔහුගේ පිට හරහා ගියෙත් එකවිටය. වැලත් ගසත් බඳගන්නට බලාගෙනම ඉසදෙයි. යුවතියන්ද එසේමය. තමා අභියස ඉන්නා අතිශය ආදරණීය ආත්මයක් ඉදිරියේ නිහතමානී නොවන්නේ එහෙමත් යුවතියක් පමණි. චායා ඒ තරම්ම දැඩි යුවතියක් නොවේ.

'අ..ස..ං..ක.. අඩන්න වගේ ඉන්නෙපා දෙයියනේ.. හිනාවෙලා ඉන්න.. මං කිව්වනේ මට පුළුවන් කියලා හැම දෙයක්ම විඳවගන්න.'

දුක ඇත්තටම දැඩිය.. ඇය ඔහුගේ කමිසයත් පසුවත් රහසින් මෙන් විසාගත්තේ ඒ නිසාය. මෙහෙමම මැරෙන්න සිතෙනා තරම්ය.

'ඔයා හිතන්නේ ජීවිතේ දුක ඔක්කොම ඔයාට දීලා මං යයි

WWW.EXPRESSLANKA.TK 377

කියලද..'

මුහුදේ රළ බිඳෙන ඝෝෂාව නිසා ඒ හඬ ඇහෙන්නේ අමුතුම ස්වරයකිනි.

'පුළුවන් සමක් තියේනම් මාවත් අරගෙන මේ ජීවිතේ යනවා කියලා මං දන්නවා.. හිතන්නෙපා මේ කෙල්ල ඔයාව තේරුම් අරගෙන නෑ කියලා. මං ආත්මාර්ථකාමී නෑ රත්තරං.. කොහොහරි.. කොහොම හරි.. ඔයා සතුටින් ඉන්න ඕන.'

'ඔයා දුක් විඳිද්දී..'

'දු..ක.. ඒක මම මගේ ජීවිතේ කියලා හිතන්නම් අසංක.. මට පුළුවන් එහෙම හිතන්න.'

'මම කොහොමත් මුළු ජීවිතයම හිතින් වඳ විඳින කොල්ලෙක් චායා..'

'එහෙම වෙන්නෙපා දෙයියනේ.. හිතනවද එහෙම ඉඳලා මාව සතුටින්න... බෑ.. කවදාවත් බෑ..'

'අද අඬන්නෑ කියලා ඇවිත් දැන් අඬනවා..'

චායා මවාගත් සිනහවකින් මුහුණ සරසා කඳුළු පිසදා ගත්තාය.

'සොරි.. මට අමතක උනා.. ආයේ අඬන්නෑ. බර්ත්ඩේ ගර්ල්නේ.. චුට්ටක් අඬන්නත් ඕනනේ ඉපදුන ගමන්..'

කුඩා පැළේ දැල්වූ ලා රතු විදුලි බුබුලේ ආලෝකය ඔවුන් දෙදෙනාගේ වතට වැටී තිබුනේ මෘදු ලෙසිනි.. ඒ එළිය කෙනෙක්ව හඳුනාගන්නට පමණක් ප්‍රමාණවත්ය.

'මොනවද ඕඩර් කරන්නේ.'

සේවකයා පැමිණිවිට අසංක ඇසුවේය. චායා සිනාසුනාය. ඒවා දන්නේ ඔහුය. දැන් තමාට තමා ආශා කරන්නේ මොනවාද කියාවත් මතක නැත.

'සර්.. මිස්ට සීසනල් ලේඩිස් වයින් එකක් තියෙනවා ගේන්නද..'

සේවකයා චායා දෙස බලා ඇසුවේය. අසංක ඇය දෙස බැලුවාය.

'අනේ.. මට එපා.. වෙන මොනවාහරි..'

WWW.EXPRESSLANKA.TK 378

'කමක් නෑ. ඒක ගේන්න..'

සේවකයා ගියපසු චායා අසංක වෙත නෙත් හෙළුවේ දෙතොල්පට තද කරගෙන සිනාව සඟවාගෙනය.

'ඇයි ඒක ගේන්න කිව්වේ..'

'වයින් හරි රහයි ළමයෝ.. බීලා බලන්නකෝ..'

'මං බීලා තියෙනවා.'

චායා කීවේ ඔහුගේ සුරත ගෙන එහි ඇඟිලිකරු අතර තම ඇඟිලි තුඩු පටලවාගෙනය.

'කොහෙන්ද..'

'දවසක් අම්මා එක්ක වෙඩින් එකකට ගියා.. එහෙදී වෙඩින් කේක් එක්ක වයින් දුන්නා.'

'ඉතින් රහයි නේද..'

චායා ඔහුගේ කන්පෙති අද්දරටම දෙතොල් ගෙන ආවාය.

'ර..හ..යි..'

'ඒකනේ මං කිව්වේ..'

'හැබැයි වුවටයි ඔන්න..'

කතා කරන්නට දහසක් දේ ඇත. ඉන් බොහෝමයක් ඒවා කතා කරන්නට දෙදෙනාටම බයය. අනාගතයක් අහිමි ආදරයකට වචන සොයාගැනීම දුෂ්කරය.

සේවකයා බියර් බෝතලයත් විශාල වීදුරුවත් හීන් දිගැටි වයින් වීදුරුවත් ගෙන ආවේය. ඒ වයින් වීදුරුවේ දරයට කුඩා ඕකිඩ් මලක් ගසා තිබුණි.

සේවකයා ගියපසු අසංක වයින් වීදුරුව ඇගේ මුවට ළං කළේය.

'චූටි උගුරයි..'

ජීවිතය ඇත්තටම සුන්දරය. නොවේනම් සැහැල්ලුය. ඒත් ඒ සියල්ල මේ සැඳෑවට පමණක් උරුම දෙයකි.

මුහුදු සුළං හමන වේගය දත් වැඩිය. ඒ සුළඟේ ගමන් තාලයට [illegible] ඇහෙන වෙලාවක

WWW.EXPRESSLANKA.TK 

පිට බලා උන්නේය.

තමා වඩාත් ප්‍රිය කරන්නේ ඇගේ කුමකටද කියා ඔහු සිතුවේය. ඒ සිනාව.. ඒ බැල්ම.. ඒ ගමන.. සියල්ලම නැවුම් චමත්කාරයක් ඔහු තුළ ඇති කරයි. වෙන් වෙන් වශයෙන් ගත්තද එක්කර ගත්තද හදවතේ අංක එකට තේරුවේ ඇයවය..

'කට හදනවා විතරයි.. මොනවත් කියන්නෑ.'

ඇය දිග සුසුමක් හෙළා කීවාය.

'ඔයත් එහෙමයි..'

'මං හැමදම ගිරව් වගේ කියවනවා.. කවදහරි මං නැති කාලෙක කණට හරි නිදහසක් තියෙයි.'

ඇගේ දනම උකුලත මත පැටලිණි. ඒවා කියද්දී එහෙමය. හිත එකලාසයක් කරගැනීම අසීරුය.

'මම ඉක්මණටම මැරෙයි වායා.'

ඔහු කීවේ කල් යල් ගෙන දැවීගිය හඬිණි. කන්දක් නායගියාක් මෙන් ඇගේ ළය කඩා පාත්විය.

'අත උස්සන්න එපා.. නැත්නම් ගහනවා කට තැලෙන්න.. මට නොලැබුනත් ඔයා කොච්චර වටිනවද..'

'කාටද..'

'කාටහරි.. මං දන්නෑ.'

හිතට මොහොතකට මහා ලෝබකමක් දැනුණි. ලොව වඩාත්ම ආශා කරනදේ අහිමිවී යාම දුකක් නොවේද..

'ඔයාට වටිනවා.. අම්මට වටිනවා.. වෙන කාටවත් මාව වටින්නෑ.'

'කවුද දන්නේ වටිනවද කියලා.'

අසංකට තම ජීවිතය ගැන මහා කලකිරීමක් දැනුණි. සතුට කොතරම් ඇතද.. ඒ තරමටම ජීවිතයද ඇතය. ඔහු දෙදණ මත දනම තබා දෙඅත්ලට මූහුණ බරකර ගත්තේය. එවැනි දර්ශනයක් බලා

WWW.EXPRESSLANKA.TK 380

ඉඳීම අසීරුය.

ඒ ඇස්දෙක.. ඒ මුහුණ මෙසේ පරවී තිබෙනු බලා සිටීම දුෂ්කරය. චායා තම අසුනෙන් නැගිට ගොස් ඔහු අභියස දණ ඔබා ඉඳගත්තාය. ඊටත් පසු ඉතා අමාරුවෙන් ඔහුගේ දෑත මුහුණින් ඉවත්කර ගත්තාය. හිතුවා හරිය.. ඔහුගේ දෙනෙත් වල කඳුළුය. ඇය වාවාගත නොහැකිව ඔහුව වැළඳ ගත්තාය.

"අනේ දෙයියනේ.. මං වරදක් කළාද.."

ඇයටද හැඬුණි. ඒ දෙනෙත්වල තෙතමනය සිහිඳු ඇඟිලි තුඩු වලට හොඳටම දැනුණි.

"මං කියනදේ අහන්න.. අපි අඬන්නෑ කියලා දෙයියනේ ආවේ.. මං බලං ඉන්නේ කොහොමද.. අනේ හිනාවෙලා ඉන්න."

ඇය ඔහුගේ මුළු මුහුණම අතගා කීවාය. සයුර මොහොතකට නිසලවී යළිත් රළ බිඳී ශබ්ද නගන්නට විය. අසංක චායාව නැගිට්ටවා තම වම් පාදය මත ඉන්දවා ගත්තේය. ඊටත් පසු ඒ මෘදු ළැමදේ ඔහු හිස හොවා ගත්තාය. ජීවිතයේ සන්තකයම මෙපමණයැයි සිතා මෙන් චායා උණුවී ගිය හැඟීමෙන් ඔහුව තව තවත් ළයට තෙරපා ගත්තාය.

"අසංක.."

ඔහු කතා කළේ නැත. ආදරය වචන වලින් පිට කරන්නට තරම් ඔහුට නිස්කලංකයක් නැත. ඇගේ පපුවෙන් එන්නේ විද හුරු විලවුන් සුවඳය. එය වඩාත් ගැඹුරින් විඳගන්නට අසංක වඩාත් තදින් ඒ පපුව සිපගත්තේය. ඔහු හිස එසවූයේ ඇගේ දෙතොල් සොයාය. ඇගේ මෘදු දෙතොල් ඒ පහය විඳගන්නට පතාගෙනම උන්නාක්මෙන් ඔහුගේ දෙතොල් හා ගැටිණ.

දෙදෙනාගේම දෑස් පියවිණි. ජීවිතයේ ශාන්තවූ රසයක් සොයාගන්නට මෙන් මේ ආදරවන්තයින්ගේ උණුසුම් හිතුවක්කාර ලවන් විනාඩි ගණනක් එකට මුසුව තිබුණි. ඇගේ දෙකම්මුල් වලින් එන තුනී රස්නය ඔහුගේ අතැඟිලි වලට වඩාත් සෞම්‍ය ලෙස දැනුණි.

චායා දෑස් පියාගත්වනම ජීවිතයේ විඳින නිර්මලම අනුරාගය

WWW.EXPRESSLANKA.TK 381

රිසියේ විඳගත්තාය. බොහෝ වේලාවකට පසු ඔහු තෙත්වූ දෙතොල් ඇගේ නිරාවරණය වූ ගෙළට තබාගෙන නිහඬව භාවනාවේ උන්නේය.

ශරීර වලින්.. ඊටත් වඩා හදවතින් ළංවූ ආදරවන්තයින් දෙදෙනෙකුට වචන ඒ තරම් වැදගත් නැත. වායා ඔහුගේ හිස කෙස් අතර ඇඟිලි තුඩු ගෙන ගියේ තිවී සැනසී ගිය ආදරණීය බවිනි.

'මහත්තයෝ.. අදත් නිදිද..'

පැය කාලක් පමණ ගතවූ පසු වායා ඇසුවාය. ඇත්තටම ඔහුගේ දෙනෙත් ආදරණීය නිද්‍රාවකට පත්ව තිබුණි. ඒ නිද්‍රාවේ ගැලී ජීවිතයේ ඉන්නට හැකිනම්..

'මම මෙහෙම ඉන්නම්..'

තියාගන්නට ලැබේනම් කල්පයක් වුව ඔහුව ළඟ තබාගන්නට ඇය සූදානම්ය.

'මම මේක ඇර ගන්නට කමක් නැද්ද.'

ඔහු ඇගේ කමිසය පෙන්වා ඇසුවේ අහිංසක ලෙසිනි. ඇය අනුවේදනීය හා ආදරණීය ලෙස සිනාසුනාය. ඊටත් පසු ළැමද වසාලූ කමිසයේ කුඩා බොත්තම් විවර කර ඔහුව එහි සනපවා ගත්තාය.

ඇයට ඔහුගේ මුහුණේ රස්නයත්.. ඔහුට ඇගේ ළැමදේ උණුසුමත් දැනුනේ එකම ලෙසය. ආදරයත් අනුරාගයත් වෙන් කරනා රේඛාව දැඩිව ආදරයකින් බැඳුණු ආදරවන්තයෝ නොදනිති. හදවතම පුදදුන් පසු.. ජීවිතයේ ප්‍රාණයම පුදදුන් පසු.. මේ ගතේ ඇති විශේෂත්වය කුමක්ද..

'චූටි මැණිකෙ.. තරහද මා එක්ක...'

ඔහුගේ හඬ තුන් හිතම රිදවන සුළුය. තමා කොතරම් අසංකට ආදරය කරනවාද කියා යමහරවිට ඔහුවත් නොදන්නවා ඇතැයි වායාට සිතුණි.

'මුළු ජීවිතේම මගෙන් ඉල්ලන්න.. මං මේත් කියලා දෙන්නම්.. ඔහොම කතා කරන්න එපා රත්තරං..'

ඇය කීවේ ඔහුගේ හිස මුදුන දෙස බලාය. වායාට අසංකගේ මුහුණ නොපෙනේ.. ඒ මුහුණ හදවතේ ගැඹුරුම තැන සිපගත් ගමන්ය. ඔහු දුත් දුත් ඒ දුහැණින් බිඳේයැයි ඇයට බියක් දැනුණි.

WWW.EXPRESSLANKA.TK 382

'මං අද ආවේ තීරණයක් අරගෙන මැණිකා..'

අසංක තොපළුවෙ ඇගේ ළැමැදට සිරවූ මූවින් අසීරුවෙනි.

'මො..කා..ක්..ද..'

වායාගේ හදවතට අලුත් ගින්දරක් දැනුණි. මේ ජිවිතයේදී මොන තීරණයක් ගන්නද මහා දුකක් බව ඇය දනගෙන උන්නාය.

'මං අද රෑ ගිහිල්ලා අම්මට හැම දෙයක්ම කියනවා.. තේරුම් ගන්නැත්නම් අඬලා කියනවා.. හර්ෂණී මට කවදාවත් ආදරේ කළේ නෑ. ආදරේ කරන්නෙත් නෑ. මමත් එයාට ආදරේ කළේ නෑ.. ආදරේ කරන්නෙත් නෑ.. මේ වගේ හැමදම දුක් විදින්නත් බෑ.. ඔයාට මේ තරම් වත් ගින්දරක් දෙන්න මං ආසත් නෑ.'

ඔහු තව තවත් ඇයව තුරුල් කරගෙන කීවේය. වායාගෙ ඇතුළු හදවත් මණ්ඩපයම ඉරිතලා ගියේය. ඔහු අඩුළුවන්නට යත්නේ පුදුමාකාර ගින්දර ගොඩකි.

'මොනවද මේ කියන්නේ.. පිස්සුද.. මේ ආත්මේ අපිට එකතු වෙන්න බැරිනම් මම තව ආත්ම ගාණක් බලං ඉන්නම්.. ඔයා ඔය වගේ පිස්සු තීරණ ගන්නෙපා. අන්තිමට මේ තියෙන සැනසිල්ලත් නැතිවෙලා ලොකු විනාශයක් වෙයි. අනේ වඳින්නම්.. එහෙම කරන්න එපා. මං දන්නවා.. මේ හිඟන කෙල්ලට ලොකු වාසනාවක් නෑ.'

'මං දුර්වල කොල්ලෙක් නෙවේ වායා.. මටත් තීරණ ගන්න පුලුවන්.'

'පුළුවන් රත්තරන් පුළුවන්.. ඒත් අසංකා..'

'ඇයි..'

ඇය ඉකිබිඳිමින් ඔහුගේ හිස අතගෑවාය.

'වේලායන හැමෝම එකතුවෙලා ගත්ත තීරණයක් වෙනස් කරන්න බෑ.. නේද.. අපි මේ ආත්මේ ඉවසමු..'

'මේ ආත්මේ නෙවේ බබා.. මට මේ දවස් ටිකවත් ඉවසන්න බෑ.. මං.. මං කොහොමද ජීවිතේ ඉස්සරහ ගැන දකින්නේ.'

'ඔයාට මං කොච්චර ආදරේද.. කවදහරි ඔයා නැති උනොත් මට මොනාවෙයිද දන්නෑ.. ඒත් මම ජීවත්වෙයි. වෙන දේකට නෙමේ.. ලබන ආත්මේ වත් ඔයාව ලබාගන්න පුළුවන් තරම් පින් කරන්න. වෙන දේකට නෙමේ..'

'මට බලාගෙන ඉන්න බෑ..'

'මම වෙන කා එක්ක හරි මෙහෙම ඉන්නවද බලන් ඉන්න බැරි.. ඔයා හිතනවද තවත් කොල්ලෙක්ට මම මෙහෙම පපුවට තියං ඉඳී කියලා.. හිතනවද අසංකා.. මේ වගේ රැක.. කියන්න රත්තරං.. ඔයා හිතනවද..'

අසංක කතා කළේ නැත.

'මං දන්නවා ඔයාට දුකයි.. ඔයාව මට නැතිවෙයි.. ඒත් මං මේ ආදරේ එහෙම කිළුටු කරන්නෑ අසංක.. මේ පපුව ඉස්සෙල්ලාම ඉඹ ගත්තෙත් ඔයා.. අන්තිමට ඉඹින්නෙත් ඔයා.. ආයේ කවදාවත් කා වෙනුවෙන්වත් මේ පපුව ඇරෙන්නෑ.. මං දිව්රලා කියන්නම්..'

ඔහු නෙත්වූ දෙනෙත් ඇගේ ළමැදෙන්ම පියාද ගත්තාය. දැන් ඒ කඳුළේ කැළැල් ඒ පපුව මතය. සීතල කඳුළේ අසිරිමත් කැළැල්..

අසංක හිස චායාගේ ළැමදෙන් මුදාගෙන ඇගේ ඇඬූ ඇඳුමේ කුඩා බොත්තම් එකින් එක පියවූවේය. ඊටත් පසු ඇගේ දෙනෙත් වෙතට නෙත් තබා ගත්තේය.

'අපි බඳිමු..'

චායා ගැස්සී ගියේ ඔහුගේ වචන වල තිබූ තදකමටය.

'මේ අහන්න.. දෙයියෙක් ඇවිල්ලා මට කියනවා මුළු ජීවිතේම නොකා නොබී ඉන්න. එතකොට ඔයාගේ අසංකව ඔයාට දෙන්නම් කියලා.. එහෙනම් මම එක වතුර පොදක් විතරක් බීලා ඔයාව ගන්නවා.. නැත්නම් කියනවා මගේ ඇස් අන්ධ කරන්න දෙනවා නම් ඔයාව දෙනවා කියලා.. එහෙනම් මම ඔයාව අරගෙන පොට්ටියෙක් වගේ ඔයාව හැමදම අල්ල අල්ල ඉන්නවා. ඒත් මේ වගේ පව් වැඩක්

WWW.EXPRESSLANKA.TK 384

මම කරන්නේ කොහොමද.. ඇත්ත.. එද මට අර ෂෝරූම් එක සරසන දවසේදී උඩ කාමරේදී මේ කිසි දේකට කැමති නොවී ඉන්න තිබුණා. ඒත් මමවත් අද වනතුරු දන්නෑ මට මොනවද උනේ කියලා. ඒක හීනයක් අසංක.. ලස්සන හීනයක්.. මං දන්නවා මේ ආත්මෙදි ඒ හීනේ හැබෑ වෙන්නෑ කියලා. මං හිත හදගන්නම් මහත්තයෝ.. ඇත්තටම හිත හදගන්නම්.. බඳින කතා කියන්නෙපා.. මේ වූට්ටං හීනේ ඇති.. ඒකට තව බර පටවන්න එපා. මං එච්චර දෙයක් හීනෙන්වත් හිතන්න ආස නැහැ. තේරුමක් නෑනේ.

ඇගේ කඳුළු වැටුනේ ඔහුගේ හිස මුදුනටය. අසංක උන්නේ වේදනාවෙන් වෙව්ලමිනි.

දෙයක් කරන්න පුළුවන්ද කියලාවත් බලන්න ඇයි මට ඉඩදෙන්නේ නැත්තේ.

එපා.. එපා.. මැඩම් ඇවිත් මට හොඳ කම්බුල් පාරක් දීලා බැහැපන් බැල්ලි පාරට කිව්වාම මම අර ඔක්කොම ස්ටාෆ් එක ඉස්සරහ අඬ අඬ ගෙදර යනවා බලන්න ඔයාට ඕනෙද.. ඊට පස්සේ දුප්පත් මගේ අම්මයි මායි ජීවිතේ පුරාම දුක් විඳිනවා බලන්න ඔයාට ඕනෙද.. ඔයාගේ අර රත්තරං මාමා ඔයාට පණ වගේ. ඒ වගේ රත්තරං මනුස්සයෙක් නැතිකරගන්න ඔයාට ඕනෙද.. අර පපුවේ නහර කුඩා වෙලා මරණය දිහා බලං ඉන්න ඔයාගේ අම්මා පපුව අල්ලගෙනම මැරෙනවා බලන්න ඔයාට ඕනෙද.. මෙච්චර කාලයක් ගොඩ නගාගත්ත බිස්නස් සේරම නැති නාස්ති වෙලා යනවා ඔයාට බලං ඉන්න ඕනෙද.. ඔයාගේ මුළු පවුලම විනාශ කළේ මේ හිගන කෙල්ල කියලා ඔයාගේ අම්මා කියනවා ඔයාට අහගෙන ඉන්න ඕනෙද.. මං බස් හෝල්ට් එකේ ඉඳිද්දී හරි වැඩ ඇරිලා එද්දි හරි කවුරුහරි ඇවිත් මරලා යනවා බලන්න ඔයාට ඕනෙද.. ඔයාට ඕනේ මේ හැම දෙයක්ම සිද්ධ වෙලා අන්තිමට මාත් නැතිවෙලා යනවා බලන්නද..

www.EXPRESSLANKA.TK 385

වායා හති ඇරියාය. ලස්සන සඳුදවක් බොඳව ගිය ඉක්මන යැයි ඇයට සිතුණි.

‘ඔය හැම දෙයක්ම මට බලං ඉන්න පුළුවන්.. ඒත්.’

‘මොනාද දෙයියනේ මේ කියන්නේ.. ඇයි තේරුම් ගන්නැත්තේ.’

‘ඇයි අපිට මෙහෙම වුනේ වායා.’

‘මේ ආත්මේ අපිට පුළුවන් ආදරේ කරන්න විතරයි.’

‘එතකොට..’

‘වෙන ආත්මෙක හම්බවෙමු.’

‘බැහැ.. මම මේ ආත්මේ සටන් කරනව වායා.. සටන් කරලා මැරෙනවා..’

වායා කතා නොකළාය. මේ තර්ක කිරීම කොහොමටත් දුකය. කෙළවරද දුකය.. කඳුළු ගෙදර ගෙනයන්නට ඇය කැමති නොවූවාය.

‘මේ අහන්න මහත්තයෝ.. අපි මේ දවස් ටික ගැනවත් හිතලා සතුටින් ඉමු. අන්තිම දවස් ටික..’

‘එහෙනම් සතුටින් ඉමූ.. ජීවත්වෙන අන්තිම දවස් ටිකනේ.’

‘ම..ම.. ග..හ..න..වා..’

වායාට හෝ ගා ඇඬුනි. අසංක ඇයව යළිත් තුරුළු කරගත්තේ පෙරටත් වඩා ආදරයෙනි.

‘පි..ස්..සු.. කියවන්නැතුව මෙතනට වෙලා උන්න විදිහටවත් ඉන්න.’

ඇය වේගයෙන් ඔහුගේ හිස පපුවට ළංකරගෙන කීවාය. එය පිපිරීයන්නට ආසන්නය. කඩා හැලෙන ඒ පපුව රැකගන්නට මෙන් අසංක වඩාත් අනුපමේය ලෙස තම දෙවුර මැද ඇයව හොවාගත්තේය.

# 38

WWW.EXPRESSLANKA.TK 386

අසංක නාලකව සොයාගෙන ගියේ අවුල්ව ගිය තෝන්තු හිතිනි. තීරණයක් ගන්නට කියා ඔහුගේ හිත ඔහුට බලකරයි. වායා කුමක් කීවද ඔහුට ඔහුගේ හෘද සාක්ෂියට පිටුපා යා නොහැක. ජීවිතය කියා යමක් මෙතුවක් නොදුටු බව ඇත්තය. දැන් ජීවිතය දැස් මායිමේ වැනෙනු ඔහුට පෙනෙයි. එය මගහැර යා නොහැක.

කලා සොලොසම පිරුණු සඳක් ජීවිතයට ඉහළින් පායා තිබියදීත් අඳුරට ගාල්වන්නේ මෝඩයින්ය. අසීමිතව ඒ සඳ දහර මැද තෙමෙන්නට ඔහුගේ හදවත ඔහුට බල කරයි. මේ දැස් අද දකින චමත්කාරය සිහිනයක් බව සිතාගන්නට අසංක කැමති නැත. සිහිනයක් නම් එය සැබෑවක් කරගත යුතුය. සිහිනයක් සිහිනයක් ලෙස රස විඳිය යුතු නිස්කලංක වයසක අසංක උන්නේ නැත.

නාලක උන්නේ සාමාන්‍ය මට්ටමේ ගෙයකට එපිටින්වූ කුඩා ඇනෙක්සියකය. එයට වූයේ කුඩා කාමර කෑල්ලකුත් ඊටත් වඩා කුඩා කුස්සි කෑල්ලකුත් පමණි. ඉරිද රෑයේ ඔහු ආවේ නාලක සොහේ හෝ ගොස් ඇත්දැයි සැකයෙනි.

අසංකගේ සෙලියුලර් දුරකථනය නාදවූයේ නාලකගේ ඇනෙක්සිය ඉදිරිපිට වාහනය නවත්වද්දීම වාගේය. අසංක එය අතට ගත්තේ වායා වියයුතු යැයි සිතාය. එහෙත් ගලා ආවේ හර්ෂණීගේ කටහඬය.

'හෙලෝ.. කොහෙද අසංකයියා ඔයා ඉන්නේ.. ගෙදරට ගියා ගෙදරත් නෑ. අපිට බෑ ඔයාගේ පස්සෙන් එන්න.. නිවාඩු දවසකවත් ගෙදර ඉන්නකෝ..'

අසංක මොහොතක් නිහඬව උන්නේය.

'මං මහපාරේ..'

ඔහු ගත්කටටම කීවේය. හර්ෂණී සිනාසුනාය.

'මොකෝ මහපාරේ.. හිඟාකනවද..නැත්නම් ජන්දෙට වැඩද..'

'ඔව් ජන්දෙට වැඩ.. මං මේ මනාප ඉල්ලගෙන යනවා.'

'යන්න යන්න.. ලැබෙයි මනාපේ.. මම නම් කොහෙත්ම මනාප නෑ ඔයාට..'

'මං දන්නවා ඒක..'

විහිළුවට නමුත් සත්‍යයත් එයම නොවේදැයි අසංකට සිතුණි.

'මනාපේ ගන්න ඕනනම් ඇවිල්ලා සාප්පුවෙන් කතාකරන්න. පොරොන්දු ටිකකුත් දෙන්න ඕන.'

'මං බොරු පොරොන්දු දීලා මනාප ගන්න බාල පොලිටීක්කෙක් නෙමේ.. ඉෂ්ඨ කරගන්න පුළුවන් පොරොන්දු විතරයි දෙන්නේ.'

'ඔයාට වඩා හොඳ ලස්සන පොරොන්දු දෙන අය අපේ මනාපේ ඉල්ලනවා.'

'ඉතින් දෙන්නකෝ බබා.. මං එපා කිව්වේ නෑනේ.. මටත් ඉන්නවා පොරොන්දු එකක්වත් නොදී මනාපේ දෙන කට්ටිය.'

'ආ.. ඇත්තද.. හරි හරි බලමු.. ඇත්ත කියන්න කොහෙද ඔයා ඉන්නේ.. මට මීට් වෙන්නම ඕනා.'

'හදිස්සියේ ඇයි.'

අසංක ඇසුවේ උගුරෙනි. ඒ තරමටම ඔහු ප්‍රශ්න වලට බියෙන් සිටියේය.

'වෙඩින් එකට ඔයා අඳින්නේ මොනවද... මං මගේ බ්‍රයිඩ්ල් එක ලෑස්ති කරගන්න ඕන.. හෙට උදේ කියන්න ඕන. ඩ්‍රෙස් කරන ආන්ටි හෙට සිංගප්පූර් යනවා.. එයාට කලර් එක කියන්න ඕන.'

සෙලියුලර් දූරකථනය වියිකර දමන්නට ඔහුට සිතුණි. ආවේ හිත නිස්කලංක කරගැනීමටය. දැන් එහිද තේරුමක් නැත. පෙරහැර දැන් බොහෝ දුර ගොස්ය.

'සුදු.. මං අඳින්නේ.'

'සුදු.. ඇයි වෙඩින් එක ෆියුනරල් එකක් කියලා හිතුවද..'

'ඔව්..' කියා කියන්නට ඔහුගේ කටට ආවේය. එහෙත් අසංක ඒ වදන් පිට කළේ නැත. සැබැවින්ම තමාගේ විවාහය යනු මුළු ජීවිතයේම මළ ගමයැයි ඔහුට සිතී බොහෝ කල්ය.

'ප්ලීස් අසංකයියා.. විහිළු එපා.. ඇත්තටම කියන්න.'

WWW.EXPRESSLANKA.TK 388

'වෙඩින් එකට අඳින පාට සිලෙක්ට් කරගත්තාම ඇතිද..'

'වෙන මොනවද.. තාත්තලා හොටෙල් එක බුක් කරයි. ඉන්වයිට් කරන අය එයි.. නැග්ගා පෝරුවට.. බැස්සා. එච්චරයි.. සිම්පල්නේ..'

'ඔයාට මැරේජ් එක එච්චර සිම්පල්ද.'

'සිම්පල් උනත් කැපිටල් උනත් අසංකයියා වෙන්නේ ඔච්චරනෙ.. ඕවා ගැන ඕනවට වඩා හිතන්න මං ආස නැහැ.. හිතුවත් නැතත් අපි දෙන්නා බඳිනවනේ.. නේද.'

අසංකට හර්ෂණීගේ මේ වදන් පුදුම නැත. වායා ගැන හිනද්දී හර්ෂණී තමාගේ ජීවිතය අල්ලාගෙන ඉන්නේ කොතරම් නොවැදගත් ලෙසදැයි අසංක දනී.

'මොකද කියන්නේ.. අද එනවද ගෙවල් පැත්තේ.'

'මං වැඩකට යන්නේ.. ඉවර වුනොත් එන්නම්.'

'මොකක්ද වැඩේ..'

'බිස්නස් වැඩක්..'

'බිස්නස් කිව්වම තමයි මතක් වුනේ.. ඇන්ටි ගිය වෙලාවේ කිව්වා බැන්දට පස්සේ ඔයත් එක්ක එකතුවෙලා බිස්නස් බලාගන්න කියලා. ඒක නම් රපෝ මගෙන් බලාපොරොත්තු වෙන්න එපා. මට බෑ ඕවා වල හිරවෙලා ඉන්න. තාත්තා මාව ලෙඩක් හැදිච්ච වෙලාවකවත් බැංකුවට යවන්නෑ.. අනේ මට ඒ විදිහට හිරවෙන්න නම් බෑ.'

අසංක කිසිවක් කීවේ නැත. විවාහයට පසු හර්ෂණී මොනවා කරන්නට ඉන්නවාද කියා ඔහුටවත් තේරුමක් නැත.

'තරහද..'

'අනේ නෑ.. මං කිව්වේ නෑනේ බිස්නස් වලට දනවා කියලා.'

'තැන්කියු.. සෝ මච්.. බැන්ද ගමන් වෙනස් වෙන්න බෑනේ නේද.. අපි හිමිහිට බලමු..'

හැම බිරිඳකටම සැමියෙකුගේ පාද පරිචාරිකාවක් විය නොහැක.

එහෙම බිරින්දන් ඇත්තේ ඉතාම අඩු ගණනකි.

'මොනවද හමී දූන් කරන්නේ.'

'මංද..'

'ඔව්..'

'මුකුත් නෑ.. ඔයා එන්නැත්නම් මං නිදගන්නවා.'

'තාම අටයිනේ..'

'ගාණක් නෑ.. එහෙනම් හෙට හම්බවෙමු.. මං ඔෆිස් එනට එන්නම්.'

අසංක කිසිවක් කීවේ නැත.

'ගුඩ් නයිට්..'

දුරකථනය ක්‍රියාවිරහිත කළ අසංක වාහනයෙන් බැස්සේ ආවටත් වඩා හිතේ බරකිනි. විසඳගත නොහැකි ප්‍රශ්න මාලාවක ඔහු පැටලී උන්නේය. බලන කිසි අනක සැනසෙන්නට විසඳුමක් නැත.

නාලකගේ කාමරයේ දොර අඩවල් කර තිබුණි. අසංකට සහනයක් දැනුණි. ඔහු රස්තියාදුවක ගොස් නැත. ඔහු එය ඇරගෙනම ඇතුළට ඇවේය. කාමරයේ නාලක පෙනෙන්නට නැත. කුඩා කුස්සියෙන් භාජන ගැටෙන ශබ්දයක් ඇසෙයි. අසංක එයට එබුනේ සීතාබරවය.

'අ..මි..මේ.. සපුමල් කුමාරයා රොබඩ්ඩගේ ගෙදරට ඇවිත්.. යහපතක්ම වේවා කුමරුනි..'

නාලක අසංක දුටුවනම කෑගැසුවේය.

'කිසිම යහපතක් නෑ.'

'උඹලට යහපතක් නැත්නම් අපිට මොන යහපතක්ද.. ඉතින්..'

නාලක කුඩා හොට් ප්ලේට් එක මත තබා තිබූ බත් සාස්පාන ඇර එහි ඇටයක් ගෙන එය ඉඳී ඇත්දැයි බැලුවේය. අසංකගේ පපුව හෝස් ගා ඇවිලිණි. මිතුරා ජීවත්වන්නේ කොතරම් අහිංසක ලෙසද..

'මොනවද බං හදන්නේ.'

'කඩ කෑම කාලා එපාවෙලා අසංක.. දැන් උයාගෙන කන්නේ.'

'මොනවද උඹ බත් කන්න ඔය හදන්නේ.'

WWW.EXPRESSLANKA.TK 390

"විශේෂයක් නෑ මචං.. බිත්තරයක් තම්බ ගන්නවා. අනේ පොල් සම්බෝලයක් හදනවා."

ඔහුගේ ඇතුළු ළය කම්පාවිය. අතිත් අතට අසංකට නාලකගේ ජීවිතය ගැන සතුටක් දැනුණි. මොන දුප්පත්කම තිබුනද ඔහු කොතරම් නිදහස් ලෙස ජීවත්වෙනවාද..

"මටත් බත් චුට්ටක් දීපන්.. උඹට ඇතිවෙයිද."

"අපෝ ඇති.. මං මේ උදේටත් එක්ක හදන්නේ."

"උඹ උදේටත් කන්නේ මේවද.."

"ඔව් මචං.. මේ බත් වළඳෙම උදේට වහලා තියෙනවා.. හීල් බත් පාර මරු.."

නාලක පිඟන් දෙකකට බත් බෙදූවේය. අසංක කුඩා කුස්සි කැල්ලේ උළුවස්සට බරවී ඒදෙස දුක්බරව බලාඋන්නේය. නාලක ඔහුට තම්බාගත් බිත්තරය මිතුරාගේ පිඟානට දමා ඔහුට පෑවේය.

"මට බිත්තර එපා මචං.."

අසංක දැඩි වේදනාවෙන් කීවේය.

"උඹ කාපං බං.. මට මේ ඇති."

"එහෙනම් බාගෙ බාගෙ කමු."

ඔහු මේසය මතවූ පිහිය ගෙන බිත්තරය දෙකට කපා නාලකගේ පිඟානටද බිත්තර පළුවක් දැම්මේය.

"යමන්.. ඇඳෙන් ඉඳගෙන කමු.."

පොල් සම්බෝලයට උණු සුදුහාලේ බත කලවම් වූ විට ඇත්තටම රසය. පොල්සම්බෝල මේ තරම් රස බවක් ඔහු මීට පෙර දැන නොතිබිණි.

"උඹේ මෙනු එක මාර රහයි නාලක.. ඇත්තමයි."

"ඩෙවල් චිකන් ෆ්‍රයිඩ් රයිස් වලට වඩා මේ දුප්පත් වේල රහයි තමා අසංක.. ඒකනේ හිල්ටන් එකෙත් පොල් සම්බෝල හදන්නේ."

"මට තව සම්බෝල ටිකක් දාපං මචං."

නාලක කුස්සියට දුවගොස් පොල්සම්බෝල දීසිය ගෙනවිත්

WWW.EXPRESSLANKA.TK 391

මිතුරාට බෙදුවේ ආශාවත් ගෞරවයත් ආදරයත් මුසුවූ හදවතිනි. නාලකගේ හදවතේ අසංක කෙරේ මිත්‍රත්වය ඉක්මවා ගිය සහෝදර ප්‍රේමයක් ඇත. ඒ බව අසංකද හොඳින් දැන උන්නේය. හදවත ගිනිගත් හැම විටකම අසංකා ඔහුව හොයාගෙන එන්නේ ඒ නිසාය.

'පස්සේ ප්ලේන්ටියකුත් ගහමු.. ඉතින්.'

නාලක අසද්දී අසංක කොට්ටයත් රැගෙන ඇඳේ කෙළවරටම ගොස් එහි වාඩිවිය. ඔහු ඇඳ කොනක තබා තිබූ ගිටාරය ගෙන පිළිවෙලට තත් පිරිමැද යළිත් එය ඇඳමතට දැමුවේය. මිතුරා පැමිණ ඇත්තේ හිත කලබල කරගෙන බව නාලක හොඳින්ම දුටුවේය.

'අසංකා..'

නාලක කතා කළේ නිවුන හඬිනි.

'පුළුවන් නම් වතුර බාල්දි දෙක තුනක් වත් ඇඟට දාපන් මචං.. මාව පිච්චෙනවා..'

'උඹේ මූණ බැලුවාම ඒක කියන්න පුළුවන්. හොඳට පිච්චෙනවා කියලා උඹව..'

'පිච්චිලා අළුවෙලා තියෙන්නේ නාලක..'

'මො..ක..ද..'

'මං අහලා තියෙනවා නාලක තීරණ ගනිද්දී හදවතින් ගන්න එපා බුද්ධියෙන් ගන්න කියලා.'

'ඔ..වි..'

'මගේ හදවතයි බුද්ධියයි දෙකම ගන්නේ එකම තීරණයක්. මොකද බං ඒකට කරන්නේ.'

නාලක නිහඬය. කිවයුතුදේ ඇත. නොකිවයුතු දේත් ඇත. ඇවිලෙන ගින්දරට පිදුරු දමා තම මිතුරා ඇවිලෙනු බලා සිටිය නොහැක. මොනම තත්වයක් යටතේවත් එය කළ නොහැක.

'මං දන්නවා.. උඹට තියෙන ප්‍රශ්නේ.. චායාව අතඇරලා උඹට හර්ෂණීව බඳින්න බෑ.'

'චායාව අත් අරිලා තියමු.. හර්ෂණීව බැන්ද තියමු.. ඒත් මගේ

WWW.EXPRESSLANKA.TK 

ජීවිතේ නාලක.. මම අර කෙල්ල නැතුවද ජීවත්වෙන්න ඕන.'

'ඔය වගේ ප්‍රශ්නයකට මුහුණ දුන්න පළවෙනි කෙනා උඹ නෙවේ මචං..'

'අනිත් උන් මොනවද නාලක කළේ.'

'අනුන්ගේ ජීවිත වල සමීකරණ තමන්ගේ ජීවිතයට දගන්න එපා අසංක. අපි උඹේ ප්‍රශ්නේ ගැන හිතමු.'

'හිතලා තේරුමක් නෑ නාලක. මට තීරණයකුයි ගන්න ඕනේ.. හිතලම දැන් මට එපාවෙලා. අප්පිරියයි.'

'ඇත්ත.. හරක්ට තණකොළ කන්න පුළුවන් ලණුව දිග තියෙන දුරට විතරයි.'

'උඹ කියන්නෙ මට හිතන්නවත් බෑ කියලද.. මං ආවේ අපරාදේ උඹවත් හම්බවෙන්න.. මං යනවා.'

අසංක කොට්ටය ඇඳට දමා කීවේය.

'ඔහොම හිටපන් පිස්සෝ.. තාමත් පොඩි එකා වගේ හැසිරෙන්නේ.. ලව් කළා වගේ නෙවේ ලව් වල ප්‍රශ්න විසඳනකොට.. ටිකක් හිටපන්.. උඹ හිතන්නේ මම උඹේ ප්‍රශ්නේ ගැන හිතුවේ නෑ කියලද..'

'මොනවද උඹ හිතුවේ.'

'හිතුවා විතරක් නෙවේ.. උඹ වෙනුවෙන් මං කතා කරන්නත් ගියා.. ඒත් වැඩක් නෑ.'

අසංක පුදුම වීමෙන් ඇඳ අද්දරටම ආවේය.

'මොනවද උඹ කළේ.. කා එක්කද කතාකළේ.'

'එද උඹ චායා එක්ක ඒකිගෙ බර්ත් ඩේ එකට කළුතර ගිය වෙලාවේ මං ගියා උඹලගේ ගෙදර.. අම්මා විතරයි ගෙදර හිටියේ..'

'ඉතින්..'

'මං හෙමිහිට ඇත්ටිච කතාවට අල්ලගත්තා. මට ඇත්තටම [illegible] ගැන [illegible] මොනවද කියල

WWW.EXPRESSLANKA.TK 393

දැනගන්න.'

නාලක මේසය මත වූ සිගරට් පැකට්ටුව ගෙන ඉන් දුම්වැටියක් දල්වා ගත්තේය.

'ඔය බම්බුව තියලා කියපන්කෝ වෙච්ච දේ..'

'හිටපන්.. මං අම්මගෙන් නිකමට ඇහුවාඇයි අසංකට එයාගේ විවාහේ ගැන තීරණයක් ගන්න දුන්නේ නැත්තේ කියලා.'

'එතකොට..'

'අම්මා කියනවා එකක් උඹට කොල්ලෙක් දිහා බලලා තෝරගන්න බැලු.. අනික දන්න අඳුනන පුංචි කාලේ ඉඳලා දැකපු කොල්ලෙක් ඉඳිද්දී නව කොල්ලෝ හොයන එකත් තේරුමක් නැලු.. ඔක්කොටම වඩා මේ ප්‍රශ්නෙදි උඹලගේ මාමා හරි ප්‍රබල චරිතයක්. අම්මා කියන විදිහට මාමා හිටියේ නැත්නම් උඹයි අම්මයි ඇත්තටම අනාථ වෙනවලු. එයාගේ මනුස්සකම නිසාලු මෙහෙම නැගිටලා ඉන්නේ.'

'ඒක ඇත්ත නාලක.. මේ ප්‍රශ්න මොනවා උනත් මගේ මාමා රත්තරන් මනුස්සයෙක්. මම මාමට මගේ තාත්තට වඩා ගරු කරනවා. පුංචි කාලේ ඔය හර්ෂණීට වඩා මාමා මට ආදරේ කළා. මාව ලොකු ඉස්කෝල වලට දලා උගන්නලා ක්‍රිකට් ප්‍රැක්ටිස් වලට අරගෙන ගිහිල්ලා.. පිස්සු හැදෙනවා ඒ මනුස්සයා කරපු දේවල්. පුංචි කාලේ මාව ඔඩොක්කුවේ තියාගෙන මට ඩ්‍රයිවින් ඉගැන්නුවේ.'

අසංකා කීවේ හැඟීම්බර ලෙසය. අසංක ප්‍රශ්න දෙය බලන මැදිහත් මිහිස්කම නාලක හදවතින්ම අගය කළේය.

'ඒකනේ අසංක.. උඹ ඔය කිව්ව එව්වට වඩා ගොඩාක් දේවල් අම්මා මට කිව්වා. තාත්තා නැතිවෙන කොට හැම තැනකටම ණයලු.. බැංකු ලෝන් එකකට ගේත් උකස් කරලලු තිබුණේ. ඒ වෙලාවේ මාමා හිටියේ නැත්නම් බැංකුව ගේත් වෙන්දේසි කරලා උඹලවත් පාරට දාලා අනාථ කරනවලු.. තාත්තගේ හත් දවසේ දානේ ඉවර වුනාට පස්සේ උඹලගේ අම්මා හැදුවේ උඹවත් අරගෙන උඹලගේ ආච්චිලගේ

WWW.EXPRESSLANKA.TK 394

ගෙදරට යන්නලු.. කොහෙද මේ..'

'කෑගල්ලේ..'

'අන්න හරි.. ඒ වෙද්දි බැංකුව රෙඩ් නෝටිස් එවලලු තිබුනේ.. මාමා ඒ කිසි දෙයක් කරන්න දීලාතෑ. සහෝදරය උනත් එහෙම උදව් කරන්නෑ අසංක..'

'මං දන්නවා නාලක.. පුංචි උනත් මං ඔය හැම දෙයක්ම දැක්කා.'

'උඹලගේ අම්මා කියන්නේ කවදාහරි එයාලා නැති කාලෙක එයාගේ පින්තූරේ නැතත් මාමගේ පින්තූරයක් ෂොප් එකේ ගහලා පහනක් පත්තු කරන්න කියලා. මාමගේ මනුස්සකමට අම්මගේ ජීවිතේ කවදාවත් වන්දි ගෙවලා ඉවර කරන්න බෑලු.. මාමට පිරිමි දරුවෙක් නෑ. එයාගෙත් බිස්නස් තියෙනවා. ඒ මනුස්සයත් කියනවා මේ ඔක්කොම දවසක අසංක පුතා දියුණු කරයි කියලා. අම්මා කියන්නේ වැටිච්ච කාලේ උන්න ඒ මනුස්සයට උඹ ජීවිතේම දුන්නත් මදි කියලා. ඒකට කළගුණ සළකන්න තියෙන එක පුංචි ක්‍රමයක් විතරයිලු හර්ෂණීව බඳින එක.'

අසංකට දිග සුසුමක් පිටවිය. ඔහුට අවසාන වරට දුටු චායාගේ මුහුණ සිහිවිය. ඇය කීවෙත් මෙයම නොවේද.. ලෝකයම කියන්නේ හදවත. සන්තක එකම ලේ නහරය කපා දමන ලෙසද.. එය කොතරම් කටුක සැත්කමක්ද..

'උඹ කිව්වේ නැද්ද හර්ෂණීව මට ගැළපෙන්නෑ කියලා.'

'මං එහෙමම කිව්වෙ නෑ. නමුත් මං තිකමට ඇහුවා හර්ෂණී අසංකව තේරුම් අරගෙන ජීවත්වෙයිද කියලා. අම්මා ඒකි ගැන හිතන්නෙ බෝනික්කියෙක් ගැන හිතන විදිහට. උඹට හැම දෙයක්ම තියෙනවලු.. ඉතින් ඔය ටිකක් උඩ පනින කෙල්ලෙක්ව හදගන්න බැරිද කියලා අම්මා අහනවා.'

ජීවිතය ඉතා දුෂ්කර තැනකට තමාව රැගෙන විත් බව දන් ඔහු දනී. [illegible] නැත්නම් මේ සියල්ලටම මුහුණ

WWW.EXPRESSLANKA.TK 395

දිය යුතුය.

"එක දෙයයි උඹට කියන්න තියෙන්නේ.. ඡායා වගේ කෙල්ලෙක්ව ලබන්න උඹට පින නෑ.. උඹව මේ ලෝකෙ වැඩියෙන්ම තේරුම් ගත්ත කෙල්ලට උඹේ ලෝකෙට එන්න මේ ආත්මේ පින් නෑ.. ලබන ආත්මේ වත් ට්‍රයි කරපන්.."

ඡායා කීවේද මේ ටිකමය. එහෙත් ඇය කීවේ ඔහුගේ පතිනිය වන්නට ඇය පින් නොකළ බවකි. දෙදෙනාම කරුමක්කාරයෑයි අසංකට සිතුණි. මේ ආදරය කෙළවර වන්නේ දෙපස ගිනිගොඩවල් දෙකක ගසාය. ඒ ගින්දරෙන් වඩාත් අසරණ ලෙස දැවී යන්නේ තමාටත් වඩා ඡායා බව අසංක දනී. ඔහුට ඇති දුකත් එයමය. ජීවිතයේ ප්‍රථම වරට ආදරයේදී පරාර්ථකාමී වන්නට ඔහු ඉගෙන ගත්තේ මේ ඊයේ පෙරේදාය.

"උඹ මට උදව්වක් කරපන්.."

අසංක අසරණ ලෙසින් කෙඳිරුවේය.

"බෙල්ල ගහලා ගියත් මම ඒක කරනවා අසංක.. මොකක්ද.."

"මං වෙනුවෙන් අම්මා එක්ක ඡායා ගැන කතා කරපන්.."

නාලක දැස් කුඩා කොට තම මිතුරා වෙතට දෙනෙත් තබාගෙන උන්නේය. මේ ජීවිත කාලයේ සමහර දේවල් වෙනස් කරගත හැක. එහෙත් තවත් බොහෝදේ සදාකාලයටම වෙනස් කරගත නොහැක.

"ඒකෙන් වැඩක් තියෙනවයි කියලා හිතනව නම් උඹ මට නැතිඋනත් උඹලගේ අම්මා මාව එළවගත්තත් මම කතා කරන්නම්. උඹ දන්නවනේ මට ඒක කරන්න බැරිකමක් නෑ.. ඒත් මස්සිනා උඹට කොළ අත බෙදලා තියෙන්නේ තුරුම්පු නැතුව.."

"මං දන්නෑ නාලක.. මේ කෙහෙල්මල් තුරුම්පු මට මොකටද නාලක.. ඡායා වගේ කෙල්ලෙක්ව මට ලැබෙනව නම්.."

"මරු.. ආසි හතර දෙනාම උඹට ලැබුණවගේ.. ඒත් එහෙම නෙමේනේ කොළ අත බෙදෙන්නේ."

"කතා කළොත් අම්මා මොන වගේ දෙයක් කියයිද.."

"ඉස්සෙල්ලම අර අහිංසක කෙල්ලව ගහලා අස්කරයි. උනුට

WWW.EXPRESSLANKA.TK 396

අම්මා වායාට හරි ආදරෙයි.. එද කතා කරද්දීත් කිව්වා ඒ කෙල්ල නැත්නම් එතනත් අවුල් ගොඩාක් කියලා. ඒ වෙලාවේ මම නිකමට ඇහුවා හර්ෂණී ඔය වගේ බිස්නස් වලට උදව් කරයිද කියලා. අම්මා ගත් කටටම කිව්වේ ඒකි දන්න කෙහෙල් මලක් නෑ කියලා. අම්මා ඒක බලාපොරොත්තු වෙන්නෙත් නෑ. අර කෙල්ල කොහොමටත් දුක් විඳිනවා. උඹ ඔය ප්‍රශ්නේ මතු කරලා ඒ කෙල්ලව රස්සාවෙන් අයින්කරලා අසරණ කරනවා.. එහෙම කරන්න එපා. එහෙම උනොත් උඹට හරියට පව්..'

'මට කරන්න වෙන්නේ කොච්චර පවක්ද නාලක..'

අසංකගේ මුහුණ වේදනාවෙන් මිරිකී තිබුනි. එය බලන්නට පවා දුකයැයි නාලකට සිතුණි. ඔහු පෙළෙන දුක නාලක හොඳින් දැන සිටියේය. ජීවිතයේ සමහර තැන්වලදී ඇවිලෙන ගින්දරට හදවතින්ම ආදරය කරන අයට පවා සම්මාදම් විය නොහැකි වන අවස්ථා ඇත.

'මං උඹට කියන්නෑ මේවා පටන්ගන්න කළින් උඹට හිතන්න තිබුණා කියලා. ආදරේ වගේ දේකදි එහෙම කරන්න අමාරුයි.. ඒත් අසංක දැන් හැරියත්.. මං මේ හරි ආදරෙන් කියන්නේ.. අර කෙල්ලටත් හිත හදගන්න කාලයක් ඕන. ඒකි කෙල්ලෙක්.. දුප්පත් අම්මා විතරයි ඉන්නේ. රස්සාව කරන්නත් ඕන. හරි දුෂ්කරයි.'

'එහෙම ගින්දරක් දෙන්න හිතෙන්නෑ නාලක.'

'මං හොඳට දන්නවා වායා උඹට සමාව දෙනවා. ඒකි කඩා වැඩා ගන්න කෙල්ලෙක් නෙමේ.. උඹව අසරණ කරන කෙල්ලෙකුත් නෙමේ.. උඹ ලස්සනට ඉන්නවා නම් කොහේ හරි අස්සකට වෙලා බලලා අඬ අඬ හරි හිනාවෙයි.'

'එයා මට කියනවා අසංක යන්න කියලා. මටයි ඒක කරන්න අමාරු.. මං හිතුවා මට මේවා විසඳගන්න පුළුවන් වෙයි කියලා.'

'ආදරේ කරද්දි අසංක අපිට ඕන විදිහට තර්ක හදගෙන අපි

WWW.EXPRESSLANKA.TK 397

ජීවත්වෙන්නේ.. ඒවා කොච්චර බොළඳ පුංචි තර්කද කියලා තේරෙන්නේ යථාර්ථය ඔළුව උඩට කඩාගෙන වැටුනාම.. මල් පාරෙන් හැරිලා වරෙන්.. මං උඹට හිත හදගන්න උදව් කරන්නම්.. පුළුවන් වෙලාවක මලක් පූජා කරලා අසරණ දරුවෙකුට බත් ටිකක් අරගෙන දීලා පිනක් කරපන්. උපදින ආත්මයකවත් මේ වගේ කටුක වෙන්වීමක් වෙන්න එපා කියලා. මාත් ආස නෑ උඹ ඔය වගේ දුක් විඳිනවට.. උඹේ විතරක් නෙවේ.. මට පුළුවන් නම් මම අර කෙල්ලගේ හිතත් හදන්නම්..

අසංක ඇඳ පත්ත මත හිස ගසාගත්තේය.

ම..ට.. අමාරුයි නාලක.. චායා නැතුව මට ජීවත් වෙන්න අමාරුයි.. මං අම්මට ගිහිල්ලා කෑ ගහලා කියන්නම් නාලක.. මට බෑ හර්ෂණීව බඳින්න.

නාලක ඔහුගේ හිස අතගෑවා පමණි. ආත්මයේ අසරණ නිමේෂයකදී තම මිතුරාව හුදෙකලා කරන්නට ඔහුට නොහැක.

කවුරු හරි මගේ ජීවිතේ අන්ධකාරයට ඇදගෙන යනවා වගේ මට දැනෙනවා නාලක.. තාමත් හඳ එළිය තියෙනවා තියෙනවා වගේ.. ඒත් වැඩි කල් මම ජීවත්වෙන එකක් නෑ කියලා මට හිතෙනවා. ඇත්තටම මට දැන් මැරෙන්න ආසයි.

පිස්සු.. මොනවද මේ කියවන්නේ.. කාට සැනසීමක් දෙන්නද උඹ මැරෙන්න යන්නේ. අම්මටද.. හර්ෂණීටද.. නැත්නම් චායාටද..

කාටවත් නෙවේ මාව සනසගන්න.

අසංක දුම්වැටියක් දල්වාගෙන ඇඳෙන් නැගිට්ටේය. ඔහුව තනිවම යවන්නට නාලකට බිය සිතුණි. ආදරයේදී ඇතිවන දරුණු වියෝ වේදනාව මිනිසුන්ව හිතනවාට වඩා තලාපෙළා දමයි. ඒ වේදනාව රුදුරුය. කර්කෂය.

හිටපන් මාත් එනවා.

අද රෑ එහෙම ඉමු..

බෑ කොල්ලෝ.. සිංදු දෙකක් තියෙනවා ටියුන් දන්න.. හෙට

WWW.EXPRESSLANKA.TK 398

රෙකෝඩ් කරන ඒවා. නොටේෂන් තොලිව්වොත් මං කොට උඩ.'

'ගිටාර් එකත් අරගෙනම යන් ගෙදර.'

'ආදරෙන් වියරු වැටිච්ච කොල්ලෙක් ඉන්න කාමරේක සිංදුවකට ටියුන් එකක් දන්න බෑ.'

'එහෙනම් මොනවද කරන්න පුලුවන්.'

බෝතලයක් තියාගෙන හොඳට බොන්න හිතෙන්නේ.'

'බෝතලයක් අරගෙනම යන් එහෙනම්.'

'උඹ නාස්ති වෙන්න එපා අසංක.. උඹට එහෙම කරන්නත් බෑ.'

නාලක ඇඳුමක් දගෙන කාමරයේ යතුරත් රැගෙනම පාරට බැස්සේය.

'වෙලාවකට මෙහෙම හයියෙන් එලවගෙන ගිහිල්ලා ඇස් වහගෙන ස්ටියරින් වීල් එක අත් අරින්න හිතෙනවා මක බෑවිලම යන්න.'

නාලක අසංකගේ වමත මත සුරත තැබුවේය.

'එපා අසංක.. ටිකක් ඉවසලා ජීවිතේ ඉඳපන්..'

'ඇයි..'

'නෑ.. මං කිව්වේ නිකං..'

'උඹ කියන්නෙ මොනාහරි වෙයි කියලද..'

'බලාපොරොත්තු තියාගන්න එපා අසංක.. තේරුමක් නෑ.'

වාහනය තුළ සීතල වැඩියැයි අසංකට සිතුණි.

# 39

'මොකද ඔයාගේ මූණත් එක්ක කළුවෙලා ගිහිල්ලා.. බලන්න ඇහෙත් හැටි.. හරියට කෝට්ටු වෙලා.'

රණතුංග මහත්මිය කීවේ අසංකගේ ඇඳමක වාඩිවී ඔහුගේ

WWW.EXPRESSLANKA.TK 

හිස මෑදුව පිරිමදිනා අතරවාරයේදීය. අසංගට අම්මාව බදගෙන සියල්ල කියන්නට සිත්විය. සිදුවන දෙයක් සිදුවී සියල්ල කෙළවර වනු ඇත.

'මේ දවස්වල මගේ හිතට හරි නෑ අම්මේ.'

ඔහු එය කියූ ආකාරයට රණතුංග මහත්මියගේ පපුව හෝස් ගා ඇවිලිනි. ලෝකයේ ඕනෑම කෙනෙකු දුක් විඳිනවා බලා සිටිය හැක. එහෙත් ඇයට තම පුතු දුක් විඳිනවා බලා සිටිය නොහැක.

'ඇයි පුතා.. ඔයාට සනීප නැද්ද.'

'මට මේ ඔක්කොම කරන්න බෑ අම්මේ..මට බර වැඩියි.'

ඇගේ ළය අනුකම්පාවෙන් බර විය.

'මැරි කළාට පස්සේ ඔය ප්‍රශ්න අඩුවෙයි.'

'අම්මා හිතනවද එහෙම.. කවුද මගේ බර අඩු කරන්න එන්නේ.'

'ජීවිතේ ඔයාට මොනවද පුතා කරන්න තියෙන්නේ.. අමාරුම හරිය මම කොහොම හරි කරලා දුන්නා නේද..'

'මට කවුරුහරි මේ වැඩ වලට උදව් කරන්න ඕන.. නැත්නම් මගේ ඔළුව අවුල් වෙනවා.'

'ස්ටාෆ් මදිනම් තව ගන්න.. වායා හොඳට වැඩ කරනවා නේද..'

අසංකගේ දෑස් දීප්තිමත් විය.

'වායා නැත්නම් මේ ටිකවත් කරන්න බෑ.. දැන් අම්මගේ වැඩත් කරන්නේ ඒ කෙල්ල.'

'ඕනවට වඩාත් බර දන්න එපා.. පොඩි කෙල්ලෝ නාම.. ලෝඩ් එක වැඩි උනාම ඒ කෙල්ලටත් අමාරුයි.'

තමාගේ ජීවිතයේ වම් පසින් ඇයට තබාගන්නට තිබෙනවා නම් මේ කිසිවක් නැත. සියල්ලම ඇය බලාගනු ඇත. තමාට ඉතිරිවන්නේ පැලෙන්නට ආදරය කිරීම පමණි.

'එහෙම නෑ අම්මේ.. වායා බලෙන්ම වැඩ අරගෙන කරන්නේ.

'අපි කෙල්ලගේ පඩි වැඩි කරමු.'

අසංක කිසිවක් කීවේ නැත. දෙනවා නම් ඇයට දියයුත්තේ

WWW.EXPRESSLANKA.TK 400

වැටුප් නොවේ. ඊට වඩා හෘදයාංගම දෙයකි. කිසිඳු ප්‍රශ්නයක් නැත්තම් අද රෑම ගොස් එය දෙන්නට ඔහුට හැක.

'හර්ෂණී වෙනස් වෙන්න කැමති කෙල්ලෙක් නෙවේ අම්මේ..'

'ආදරේ එක්ක අඩුපාඩුත් යන්න ඕන පුතා. සර්ව සම්පූර්ණ ගැණු ලෝකෙ නෑ. ඔයා කියලා සම්පූර්ණද.. කොච්චර අඩුපාඩුකම් ඔයාගේ තියෙනවද..'

අසංක නිහඬ විය. අම්මාට ප්‍රශ්න ඇද වෙහෙසට පත්කරන්නට ඔහුගේ කැමැත්තක් නැත.

'ඔයා හර්ෂණී එක්ක කතා කරන්න. කතා නොකර ප්‍රශ්න විසඳගන්න අමාරුයි පුතා.'

'අම්මා හොඳට හිතලද මාව හර්ෂණීට බන්දලා දෙන්නේ..'

ඇය තම පුතණුවන් දෙස බැලුවේ තියුණු දෙනෙතිනි.

'හිතුවත් නැතත් එතන තියෙනවා නොකර බැරි ප්‍රශ්නයක්. මට මාමව මග ඇරලා යන්න බෑ.. ඔයාටත් බෑ.. කරුණාකරලා පුතා ඔළුව විතරක් අවුල් කරලා දාන්න එපා.'

රණතුංග මහත්මියට බියක් දැනුණි. ඇය සිතා උන්නේ සියල්ල පිළිවෙලට නිමාකර සැනසිල්ලක් ගන්නටය. ජීවිතයේ අවසාන දවස්වලදී අනන්තයට සතුටුවන්නට ඇය ආශා කළාය. ඒ සතුටෙන් සියයට අනූවක්ම රැඳී තිබුනේ අසංකගේ ජීවිතයේ සතුට උඩය.

'මං කෙල්ලට එන්න කියලා කතාකරන්නම්.. මං කැමති නෑ පුතා බලපෑම් කරන්න.'

'එපා.. අම්මා මූකුත් කතා කරන්න එපා. ජීවිතේට මොනවා හරි වෙන්න තියෙනවා නම් වෙයිතේ.'

'මොනවද ඔයා මේ කියවන්නේ.. මං ලෙඩෙක් කියලා දන්නැද්ද..'

'සොරි අම්මේ.'

'ඔයා බයවෙලා වගේ කතා කරනකොට මටත් ඒක ලොකු ප්‍රශ්නයක්. අනික ඔය දෙන්නා බැන්ඳු කියලා මෙතන මූකුත් වෙනස් [illegible] ප්‍රශ්න [illegible] වෙන්නෑ.. මෙහෙ [illegible]න්නවා.. නැන්ද

WWW.EXPRESSLANKA.TK 401

ඉන්නවා.. ඔයාලව බන්දලා වෙන රටකට යවනවා නෙවේනේ.. නිකං පොඩි ළමයෙක් වගේ ප්‍රශ්න ඉස්සරහ පිස්සු නටන්න එපා. ඔච්චර ඔයාගේ හිත අවුල් වෙලා නම් දවස් දෙක තුනක් ෂොප් එක වහලා යන්න කොහේ හරි දුරකට.. ගිහිල්ලා හොඳට සතුටු වෙලා ඔය මනස්ගාත අයින් කරගෙන එන්න.. කසාදයක් කියන්නේ සෙල්ලමක් කියලා හිතුවද.. අනික එතැනත් එකම කෙල්ල.. මාමා පණ්ඩවගේ ඒ කෙල්ලව හැදුවේ. ඔයාට බාර දෙන්නේ ඒ කෙල්ලව විතරක් නෙවේ.. ගණන් බලන්නවත් බැරි තරම් වටින දේපල බිස්නස්.. ඔයා මෙතන පිස්සු කියවනවා.'

අම්මා සමඟ මේවා කතා කරන්නට ගියේ මොන මෝඩකමකටදැයි අසංක සිතුවේය. අම්මා සමඟ නොව කිසිවෙකු සමඟ තම අනාගතය ගැන දෙඩා පලක් නැත. අසා පලක් නැත. සියල්ල පැහැදිලිය.

★★★★★★★★★★★★★

චායා බැංකුවට ගොස් එද්දී තරමක් පමාවිය. මේ සියල්ල එක අත් දෙකකින් කිරීම අසීරුය. ඇය ඊයේ රාත්‍රී දෙක පමණ වනතුරු මේ මාසයට අදාලව තිබූ තොග ඇණවුම් පත් ලීවාය. මාසයකට වතාවක් එන ගණකාධිකාරීවරයාට ඒ සියල්ල අද හවස බාර දියයුතුය.

කීයට නිදගත්තද පාන්දර පහවෙද්දී චායා පිබිදෙයි. අසංක එන්නට ප්‍රථම කළහැකි සියල්ල ඇය කර තබයි. නැතිනම් නිස්කලංකයේ ඒ මුහුණ දෙසවත් බලාගන්නට ඇයට ඉඩක් නොලැබෙයි. වැඩ අධික වූ මොහොතක චායා තම අසුනේ සිට ඔහුදෙස බලා දුක්බරව සිනාසෙයි. අසංක ඇයට කතා කරන්නේ ඊටත් වඩා අසරණවය.

'මට වැඩ තියෙනවා දෙයියනේ.. බලන්නේ නැතුව චෙක් දීගෙන දීගෙන ගිහිල්ලා සල්ලි බැලන්ස් කරන්න ඕන මම දන්. චෙක් එකක් ලියනකොට මේ පුංචි ස්ලිප් එකේ ලියන්න දුන්නේ කාටද.. කීයද.. දැම්ම ඩේට් එක මොකක්ද කියලා.'

[illegible] සියල්ලම

WWW.EXPRESSLANKA.TK 402

අවුලෙන් අවුලට පත්වන දිනය වැඩි ඈතක නොවේ.

'මහන්සිද..'

ඔහු නැගිට පැමිණ ඇගේ දෙඋර මත දනම තබා ඇසුවේය.

'නෑ.. ඒත් මේවා ඉවර කරලා දාන්න ඕනනේ.. නේද.. මේවා මං නිසා නම් වෙන්නේ මං ආස නැහැ ඔයා මෙහෙම අවුල් වෙනවට..'

'නිරවුල් කරගන්න බැරි විදිහට මාව අවුල් වෙලා ඉවරයි.'

'ම...ම..ද.. ඒක ක..ළේ..'

'නෑ මැණික.. ඔයාට විතරයි මගේ ජීවිතේ අවුල් ලිහන්න පුළුවන්.'

'ජීවිතේ බෑ රත්තරන්.. මේ බිස්නස් වල අවුල් ටික ලිහලා දෙන්නම්.. ඒක මට පවරලා තියෙන රාජකාරිය.. අරක දේවකාරියක්. ඒකට මාව සුදුසු නැතුව ඇති.'

වායා අසංකගේ අතගෙන ඒ අත්ල මත පෑනෙන් යමක් ලිව්වාය. වටකුරු අත් අකුරින් එය ලියා වායා ඒ අත්ලට දෙතොලම තබා සිප ගත්තාය.

අසංක තම අත්ල දෙස බැලුවේ අසරණ දෙනෙතිනි.

I Love You (කියන්න බැරි තරම්)

එහි ලියවී තිබුනේ එවැන්නකි. අසංකට අත්ලට පිහියක් ගෙන ඇනගන්නට සිතුණි. අද නොකළත් කවද හෝ දවසක තමා එසේ කරගනී යැයි ඔහුට සිතුණි.

'මූණවල් දත් බලන්න බෑ. ඔච්චර දුක් වෙන්න එපා. බලන්න කළුවෙලා ගිහිල්ලා. තවත් දුක් වෙනවා නම් මං වැඩටවත් එන්නෑ. කව්රුවත් දන්නැනේ මං මේවා දැකලා කොච්චර දුක් විදිනවද කියලා.. මට මගේ හිත හදගන්න බෑ..'

වායා කීවේ බැගෑරුම්වය. ඔහු පොඩි දරුවෙකු මෙනි. සියල්ල සන්සුන් වනවා දකින්නට වායා කැමති වූවාය. දැවෙන ගින්දරකින් ඉක්මණින්ම දැවෙනවා නම් හොඳය.

'මම බෝධි පූජාවක්වත් අම්මා එක්ක ගිහිල්ලා තියන්නද..

WWW.EXPRESSLANKA.TK 403

ඔය ඔළුව නිස්කලංක කරලා දෙන්න කියලා.'

අසංකට කිසිවක විශ්වාසයක් නැත.

'මට ඔයාව ලැබෙනවා නම් මේ කිසි දෙයක් එපා.'

චායා වීදුරු දෙර අල්ලාගෙන තවත් මොහොතක් ඔහුගේ දෑස් දෙස බලා උන්නාය. දමායන්තට බැරි තරම් ඒ ඇස් වලට තමා ආදරේය..

එකවරම කාර්යාලයේ දෙර විවර විය. එබුනේ නිලංකාය. චායාත් අසංකත් එකට වෙළුන දෑත් මුදගත්තේ හෙමිහිටය.

'සර්.. හර්ෂණී මිස් එනවා.. කාර් එක දැන් ආවේ.'

නිලංකා බියපත් මුහුණින් කීවාය. කෙල්ල දුවගෙන එන්නට ඇත්තේ තමා ගැන සිතා බව චායා දනී.

'මං පහළට යනවා.'

චායා කීවාය.

'මොකට යනවද.. මෙන්න මෙතනට වෙලා ඉන්න.'

'මාව එළියට දනකොට දූකයි.. ඊට වඩාහොඳයි පහළට යන එක. රත්නප්‍රිය කතා කරයි. චෙක් එක ආයිත් දන්න කියන්න.'

චායාට කාර්යාල කාමරයෙන් පිටවන්නට ඉඩක් නොලැබිණි. හර්ෂණී ඊට කළින් එයට ඇතුල් වූවාය. මොනවා නැතත් ඇගේ මුහුණ ලස්සනයැයි චායාට සිතුණි. එය දැන් ඉස්සරටත් වඩා හැඩය. නිරූපිකාවන්ට ඇත්තේ ඇගේ වැනි මනාව සකස් කළ මුහුණකි.

'ගුඩ් මෝනින් මිස්...'

චායා හැකි තරම් භක්තිමත්ව කීවාය. හර්ෂණී ඇය අසලින් ගියේ නිකට පමණක් සොලවාය. ඒ සුවඳ ප්‍රදූමාකාරය. යුවතියකගේ පවා හදවත පැහැර ගන්නා සුළුය. ලංකාවේ විලවුන් වර්ගයකින් එතරම් සුවඳක් නොඑන බව චායා දන උන්නාය.

නිලංකා චායාව බලාපොරොත්තුවෙන් උන්නාය.

'ඕන්න කළු කරගත්තා.'

'කෝ නෑ.. මේ හිත දැන් ගලක්.. උරුමක්කාරි එයා.. මම කරුමක්කාරි.. පොඩි හීනයක් නිලංකා දැක්කේ.'

WWW.EXPRESSLANKA.TK 404

'දුවගෙන ඇවිත් කිව්වේ ඇතුලේ ළඟට වෙලා ඉන්නවා කියලා දන්න නිසා.'

'උඹ පැලීගෙන උදව් කළේ අකල් මරණයක් වගේ තියෙන ආදරේකට..'

'මං දන්නවා මං පව් වැඩක් කලේ නෑ කියලා.'

චායා පිළිගැනීමේ කවුන්ටරයේ තබා තිබූ ඕකිඩ් මල් කළඹ අතගෑවාය.

'හැමදාම ඕකිඩ්ම ගෙනල්ලා ලස්සන නෑ නේද.. දවසක කානේෂන් ගෙනත් තියමු.. සුදු කානේෂන්..'

'සුදු කානේෂන් ගේන්නේ දුක ප්‍රකාශ කරන්න චායා.'

'ඒක දැනගත්ත එක හොඳයි.'

'ඇයි ළඟදී මළ ගෙයක් තියෙනවද.'

'ඔව්.. ආදරේ මළගම.'

තිලංකාටද හීල්ලින. ලස්සනට ගලා ගිය චිත්‍රපටයක අවසානය දුකක් වනවා දකින්නට ආශා කරන්නේ කවුද.. අවසාන මොහොතේ හෝ සියල්ල විසඳී දෙදෙනා එක්විය යුතුය.

'අනේ මන්ද..'

එකවරම අභ්‍යන්තර දුරකථනය නාද විය. තිලංකා එය අතට ගත්තාය.

'චායාට කියන්න මට තේ ගේන්න කියලා.. තිබහයි.'

තිලංකා දුරකථනය තබා චායා වෙත හැරුනාය.

'සර්ට තේ ඕනලු.'

'එයාටත් පිස්සු.. මිස් අනූ වෙලාවෙම තේත් ඕනෙද..'

'තේ සර්ට විතරක් මගේ හිතේ.'

'එහෙම කරන්න බෑනේ.. අහන්න මිස්ට මොනවද ඕන කියලා.'

'උඹත් පුදුම කෙල්ලෙක්.'

තිලංකා නැවතත් දුරකථනය එබුවාය.

WWW.EXPRESSLANKA.TK 405

'සර්.. මිස්ට මොනවද ගේන්නේ.'

'මොනවද බොන්නෙ ඔයා..'

ඔහු ඇගෙන් අසන හඬ නිලංකාට ඇසුණි. ඒ හඬ වෙනද තරම් සුන්දර නැත.

'මොනාහරි.. තේ නැතුව.'

'නිලංකා මොනා හරි කූල් එකක් ගේන්න.. මට ඉඟුරු තේ එකක්.'

නිලංකා දුරකථනය තැබූයේ සිනාසීගෙනය.

'සර්ට ඉඟුරු තේ.. මිස්ට කොකා කෝලා.'

'මං හදලා දෙන්නම්.. නිලංකා ගිහිල්ලා දෙන්න.'

'අනේ කෙල්ලෙ..'

'මේ වගේ උදව්වක් නොකර ඉන්නෙපා.. මට හරි දුක හිතෙනවා.'

'හරි.. හරි.. මං ගෙනිහිල්ලා දෙන්නම්.'

චායා තේ හදන්නට ගියේ බරවූ හදවතිනි.

'මෙච්චර ඉක්මනට බඳින්න මාත් හිතං උන්නෑ.. ඒත් ප්‍රශ්නයක් නෑ. මොකද අසංකයියා හිතන්නේ.'

'සැප්තැම්බර් ළඟ වැඩි නැද්ද.'

'ළඟ නම් තමා.. ඒත් කවද බැන්දත් එකයිනේ.. ඔය කෙහෙල්මල් කරලා දම්මම ලේසියි. මටත් හරි හිසරදයක්.'

විවාහය යුවතියකට හිසරදයක් දැයි අසංක සිතුවේය.

'වෙඩින් එකේ වැඩ වලට මට තනියම යන්න බෑ.. තාත්තත් කියන්නේ ඔයා එක්කම යන්න කියලා.'

'මේ දවස්වල මං ටිකක් බිස්නස් වල හිරවෙලා හෂී.. ඇත්තටම කිව්වොත් බිස්නස් වැටිලා. අද රටේ තත්වේ අන්තිමයි.'

හර්ෂණී සමච්චලයකට මෙන් සිනාසුනාය.

'ඔක්කොටම කළිං හොඳ ස්ටාෆ් එකක් ගන්න. මේ අම්මන්ඩිලා එක්කද ඔයා සේල්ස් අල්ලන්න යන්නේ. මූන් මොනවා

WWW.EXPRESSLANKA.TK 

දන්නවද..'

අසංක මේසය මත තිබූ වීදුරු බෝලය අතැඟිලි වලට තද කර ගත්තේය. මේ ගරහන්නේ මේ තරම්වත් කර දෙන වායාටය. තිලංකාටය. මේ තරම් දුරක් මේ දුක විඳගෙන ආවේ ඔවුන් සමඟය.

'හරි.. මං බිස්නස් බලාගන්නම්.. දැන් මොනවද මං කරන්න ඕන.'

ඔහුට අවශ්‍ය වූයේ හර්ෂණීගෙන් ගැලවෙන්නටය.

'හොටෙල් බුක් කරන්න ඕන.. ෆොටෝ ග්‍රැෆර්ට කතා කරන්න ඕන. ඩ්‍රෙස් කරන කෙනාව හම්බ වෙන්න ඕන. කේක් හදන්න දෙන්න ඕන. මට විකාර වගේ.'

'හරි.. මම රෑට ගෙදරට එන්නම්..'

'ඔයාට රෑ වෙන්නේ රෑ දහයෙන් පස්සෙනේ නේද..'

'කීයට හරි මම පුළුවන් වෙලාවට එන්නම්.'

හර්ෂණී යටැසින් අසංක දෙස බලා උන්නාය.

'ඇයි..'

ඔහු ඇසුවේ ඒ බැල්ම තුළ යමක් විනැයි සිතාය.

'නෑ..'

'නැතිවෙන්න බැනේ..'

'නෑ.. මට නිකං හිතුනා අපි දෙන්නා බැඳලා කොහොම ජීවත් වෙයිද කියලා.'

'ඇයි ඔයා ඒ ගැන හිතුවෙ නැද්ද.'

'පොඩ්ඩක්වත් නෑ.'

'එතකොට හිතන්නෙවත් නැතුවද මාව බඳින්නේ.'

'මං මෙහෙම ඇහුවොත් ඔයා මං ගැන මොනවද හිතලා තියෙන්නේ.'

'මං ගැන මොනවත් හිතන්නැති කෙනෙක් ගැන මම මොනවද හිතන්නේ.'

WWW.EXPRESSLANKA.TK 407

අසංක වේදනාව මුසුවූ හැඟීමකින් කීවේය. මේ අඳුරු ආදර සිතුවම දෙස බලාගෙන ආදරය ගැන කළ හැකි භාවනාවක් නැත.

'මං හිතන්න ඕනද..'

'ආදරේ ගැන.. කසාදේ ගැන.. කසාද බඳින එකක් ගැන අමුතුවෙන් හිතන්න ඕන නෑ. ඒක ඉබේම හිතෙන්න ඕනා.. එහෙම හිතෙන කෙනෙක්ව තමා බඳින්නත් ඕනා. ඔය ඇඳුම් ටික ගලවලා දලා ඔයාව ඇඳකට පෙරළගෙන මට මොනා හරි කරන්න පුළුවන්. ඒත් ආදරේ කියන්නෙ ඒක නෙමේ.'

හර්ෂණී නිය ආලේපන ගැල්වූ නිය තුඩ මේසයේ වීදුරුව මත රිද්මයානුකූලව ගැසුවාය.

තේ රැගෙන නිලංකා ආවේ එවිටය. ඈය මුලින්ම කොකා කෝලා බෝතලය ඇල්ලුවේ හර්ෂණීටය. ඉක්බිතිව ඔහුට තේක දුන්නාය.

'අර ඇතුලේ ඉන්න කෙනාට ටිකක් එන්න කියන්න.'

හර්ෂණී එකවිටම වායාගේ කියද්දී නිලංකාගේ අත ගැහෙන්නට විය. අසංකද පුදුමයෙන් හර්ෂණී දෙස බැලුවාය.

'ඈ..යි.. එයාව මොකටද.'

ඔහු ගත් කටටම ඇසුවේය.

'පොඩි වැඩකට..'

කාර්යාලයෙන් පිටවෙද්දී නිලංකාගේ දෙපා ගැහෙන්නට විය. ඈය දුවගෙන මෙන් ගොස් වායාගේ අතකින් අල්ලා ගත්තාය. ඒ අතම සීතල වී ගොස්ය.

'ඇයි නිලංකා..'

ඈයට එය කියාගන්නට වත් බැරිවිය.

'මොනා කරන්නද කියලා මටම තේරෙන්නෑ..'

'මොනවද කියන්නේ.. ඇයි මේ ගැහෙන්නේ.'

'මිස් උඹට එන්න කිව්වා.'

වායාගේ සර්වාංගයම සීතල විය. ඇගේ සිහින් තොල්පට උඩින් දහදිය බිබිලි මතුවූයේ බලා ඉඳිද්දීමය.

'ඈ..යි.. දන් [illegible]

WWW.EXPRESSLANKA.TK 408

"දන්නෑ කෙල්ලෙ.."

"ක..ම..ක්.. නෑ.. මොනාහරි කිව්වොත් මං ගෙදර යනවා.. මං මේක බලාපොරොත්තුවෙන් උන්නා."

"ඉස්සෙල්ලා පලයන්. වෙන කේස් එකකටද කියලා කවුද දන්නේ."

ජීවිතය කොතරම් තමාව අසරණ කරදැයි වායා කල්පනා කළාය. ඇය කාර්යාල කාමරයට එබුනේ මුළු මුහුණම ලේන්සුවෙන් පිසදමාගෙනය. ඒ තරමටම දහදියය. සියල්ල ඉවසිය හැක. ඔහුට ප්‍රශ්නයක් වෙනු ඇයට බලා සිටිය නොහැක.

වායා දෙනෙත් එසවූයේ ඔහුගේ මේසය අද්දරටම ගොස්ය. හර්ෂණී ඇය උන් ඉරියව්වෙන්ම සිට දෙනෙත් එසෙව්වාය.

අසංක ජීවිතයට වඩාත්ම බලපෑම් කළ ගැහැණු දෙදෙනා අතර මේ සිදුවන්නේ කුමක්ද කියා තේරුම්ගත නොහැකිව බලා උන්නේය.

"මි..ස්.. එන්න කිව්වේ."

වායාගේ හඬ ඇසෙත්ම අසංකට දරුණු වේදනාවක් ඇතිවිය. මොනම තත්වයක් යටතේවත් වායාට බලපෑම් කරන්නට හර්ෂණීට අයිතියක් නැත. බැඳීම් ඉවත් කළද ඇය තම සේවිකාවකි.

"එන්න කිව්වේ දෙයක් අහන්න."

කියනා දෙයක් කියා තමාට බැණ වැදී හෝ ඉක්මණින් ගලවා හරිනවා නම් හොඳය.

"දැන් සතියකට විතර කලින් ෂෙරින් ශ්‍රීමාල් කියලා කෙනෙක් කතා කරාද.."

වායාට ඒ නම හොඳට හුරුය. ඇය අසංක දෙස බැලුවේ නෙත් කොනිනි.

"ඔව් මිස්.. යංතමට මතකයි."

"මොකටද එයා කතා කළේ."

"මේ මිස්.. හොංකොං ගවුම් වගයක් දන්න."

වායාට යළිත් ඔහු දෙස බැලුණි. එය අසංකට කියන්නට වායාට අමතක විය. අනෙක එහි වැදගත්කමක්ද නොවීය.

'මොනවද එයාට කිව්වේ.'

'සර් එයා ගෙනල්ලා තිබ්බේ හොංකොං ෆ්‍රොක්ස් වගයක්. එකක් ඒ වල ප්‍රයිසස් හරි වැඩියි. අතික සාම්පල් ටිකක් එවලා තිබ්බා.. ඒක ඇඳගෙන මේ රටේ නම් යන්න අමාරුයි.'

ඇය මේ සියල්ල පැහැදුවේ ඔහුටය.

'ඔයා පොඩ්ඩක් ඉන්න අසංක.. හරි ඔයාද දන් මෙතන ඩිසයින්ස් තෝරන්නෙ.. ඒ කෙනාට කතා කරන්න කිව්වේ මම. මම කිව්වේ ඔයාට කතා කරන්න කියලා නෙවේ.. අසංකට හරි පර්චයින් කරන මැනේජර්ට හරි කතා කරන්න කියලා.'

ඇයට යළිත් ඔහු දෙස බැලුණි.

'පෝස්ට් එක ලියලා දීලා නම් නෑ හමී.. ඒත් වායා තමයි පර්චයින් කරන්නේ.'

ඔහු කීවේ සාවධානවය. මේ ප්‍රශ්නය දුරදිග ගියහොත් ප්‍රශ්නය අර්බුදයක් වන බව ඔහුට වැටහිණි.

'සමාවෙන්න මිස්.. එකක් ඒ ලේඩි කිව්වෙ නෑ එයාව එව්වේ මිස් කියලා. අතික රුපියල් පනස් දහක් විතර යට කරලා ඒ වගේ බඩු ලෝඩ් එකක් අරගන්න අමාරුයි.. මට හිතුනෙ නෑ ඒක යයි කියලා. ඒකයි සර් රිටන් කළේ.. මට සමාවෙන්න.'

'ඔයා කවුද හලෝ ඩිසයින් තෝරන්න. මොනවද ඔයාලා දන්න ඩිසයින්ස්.. යනවකෝ එම් සී එකට ගිහිල්ලා බලනවා ඒවගේ ඇඳුම් මොනවද තියෙන්නේ කියලා.. අතික් දවසේ මගේ කවුරුහරි කතා කළොත් පණ්ඩිතකම් නැතුව සර්ට දෙනවා.. හරිද.'

වායාගේ දෙනෙත් පලාගෙන මෙන් කඳුළක් ගලාගෙන ගියේය. අසංකට දරාගත නොහැකි විය.

'සමාවෙන්න මිස්.'

ඇය කඳුළු උතුරන දෙනෙත් ඇයවෙත පා කීවාය.

'වායා කියන්නෙ ඇත්ත. මං උන්නත් මම කරන්නෙත් ඒ වගේ

WWW.EXPRESSLANKA.TK 410

ඇඳුම් රිටන් කරන එක. සල්ලි හිර කරලා ඇඳුම් අරගෙන එල්ලගෙන ඉන්න බෑ.'

ඔහු තරමක් තිවීගිය හඬින් කීවේය.

'බිස්නස් වැටිලා කිව්වා නේද.. මට හිතාගන්න පුළුවන් වැටුනේ ඇයි කියලා.. මහ ලොකු පර්චසින් මැනේජර්.. මෙයාලව හොඳයි වත්තියේ ෂොප් එකක පර්චසින් කරන්න දන්න.. ඇන්ටිට පිස්සු.'

අසංක ඉවසා සිටියේ අමාරුවෙනි. යමක් දික් ගැස්සුනොත් ප්‍රශ්න මොනතරම් බරපතල වනවාද කියා ඔහු දනී.

'වායා යන්න.'

යන්නට හැරෙන්නට ප්‍රථම වායා යළිත් වතාවක් ඇය දෙසට බැල්මක් හෙළුවාය.

'මං හිතලා වැරැද්දක් කළේ නෑ මිස්..'

'හරි.. හරි.. යනවා.'

වායා ගියේ දෙතොල් පට විකාගෙනය. ඈගේ දෙනෙත් වලින් කඳුළු උතුරමින් තිබුණි.

'මොකද උනේ.'

තිලංකා වායාගේ අතගෙන ඇසුවාය.

'දුප්පත්කමට රස්සාවලට ඇවිත් අපිත් කුණු බැණුම් අහනවා තිලංකා.. ෂිත්..'

වායා සියල්ල තිලංකාට කීවේ තේ හදනා කාමරයේ සිටය.

'උඹ කාමරේ ඇතුලේ ඉන්නවට එයා ඊරිසියයි. ඒකයි ඔය බැන්නේ.'

'ක..ම..ක්. නෑ.. මං සර් නිසා මේ ඔක්කොම ඉවසගෙන ඉන්නවා.'

'සර්ට කතා කරන්න තිබ්බනේ.'

'එයාට පුළුවන් ප්‍රමාණයක් තියෙනවා තිලංකා. ඇන්ත. මායි මේ ඔක්කොම වරද්දගත්තේ. දැන් මේක නිවැරදි කරගන්නේ කොහොමද කියලා මටම තේරෙන්නේ නෑ.'

වායා වතුර දේනක් ගෙන තෙත්වූ දෙනෙත් වලට ඉස ගත්තාය.

WWW.EXPRESSLANKA.TK 411

මෙය පටන් ගැනීම පමණි. දැන් අඩන්නට දෙනෙත් සූදානම් කරගත යුතුය.

"ඔයා හැසිරුනේ වැදගත් කෙල්ලෙක් හැසිරෙන විදිහට නෙමේ.. එයා කරන්නේ එයාගේ ජොබ් එක. ඒ විදිහට කරන්න කියලා අපි කියලා තියෙනවා. අනික එයා පර්චසින් කරනවා හොඳයි. ඉස්සර මාත් රැවටුනා බඩු වලට. දැන් එහෙම නෑ. මං ආය නෑ ඔයා ඔය වගේ හැසිරෙනවට.. දුප්පත්කමට රස්සාවල් වලට ආවට ඒ ළමයත් ඔයාගෙම වයසේ ඔයා වගේම ළමයෙක්. අනික මගේ සේවකයෙක් වැරැද්දක් කළා නම් ඔයාට තිබ්බා මට කියන්න. මිනිස්සු හිතන්නේ මං මොකෙක් කියලද එතකොට.."

"ඔයා කියලා ඉවරද.."

"මම කිව්වේ හරි වැරැද්ද.. මට මෙහෙම කියන්න අයිතියක් තියෙනවා."

"එතකොට මට මේවට අයිතියක් නැද්ද.. වැඩිම උනොත් තව මාස දෙකයි.. මං ඔයාගේ වයිෆ්.."

"ඒක නිසා තමයි වැරැද්දක් නොකරත් ඒකෙල්ල ඔයාගෙන් සමාව ඉල්ලුවේ.. ඇත්තටම වරදක් නෑ. ඔයා කියන්නෙ ගෑණියෙක් හොංකොං වලින් වල් ගවුම් ටිකක් ගෙනාවම මේ කෙල්ල මගේ එකවුන්ට් එකෙන් සල්ලි අරගෙන දීලා ඒවා ගන්න ඕනද.. ඔයාට පිස්සුද.."

"හිතාගන්න මං ඔයාගේ බිස්නස් වලට කතා කරපු අවසාන වතාව කියලා මේ. අද ඉඳලා අපි දෙන්නගේ ජීවිත ඇතුලේ බිස්නස් තහනම්.."

හර්ෂණී නැගිට්ටේ වේගයෙනි. සංයමයක් නැති ඇගේ හැසිරීම් පවුල් ජීවිතය වැනි නිස්කලංක ගමනකට සොහොන්ම නොගැලපේ.

"මං යනවා.. හවස එනවා නම් එන්න.. ඇන්ටි හැමදාම මට කියනවා ඔයාට උදව් කරන්නලු.. බිස්නස් වැඩ බලාගන්නලු.. අද මම

ඇන්ටිට කතා කරලා කියනවා මෙහෙ බිස්නස් බලාගන්න ඕන තරම් අය ඉන්නවා.. මට කරදර කරන්න එපා කියලා.'

'අම්මට ප්‍රශ්න දන්න එපා හෂී.. ඒ මනුස්සයා ලෙඩෙක්..'

ඇය කතා නොකරම කාර්යාලයෙන් පිටවූවාය. අසංක මේසයට හිස ගසා ගත්තේ හිසම බඳගෙනය.

වායා කාර්යාලයට ආවේ හර්ෂණී පිටත්වී ගොස් සෑහෙන වෙලාවකට පසුය. ඇයට අසංක ගැන අබමල් රේණුවක තරම්වත් තරහක් අහිතක් නැත. ඔහු තමා සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලදී අසරණ බව ඇය දනී. බේරාගත හැකි මට්ටමින් ඔහු තමාව බේරා ගත්තේය. ඒ ටිකත් ඔහු කතා නොකළා නම් හොඳයැයි වායාට සිතුණි.

වායා කාර්යාලය තුළට ගියේ පැයක් පමණ වෙලා පහළ ෂෝ රූම් එකේ සිටය. තමාගේ තේරීම් ඇත්තටම වැරදි ඒවාද කියා ඇය ඒ පැය තුළම වග විභාග කළාය. පර්වයින් කිරීම ලේසි නැත. පොඩ්ඩ වැරදුන කල මුදල්ද බඩුද අපතේ යයි. ඇඟලුම් ව්‍යාපාරයේ මාසයක් ඇඳුමක් පරණ වූ පසු කිසිම වටිනාකමක් නැත. මාසයක් තුළ අලෙවි වී හමාර වන ඇඳුම් තෝරා ගත යුත්තේ ඒ නිසාය. ව්‍යාපාරයට ලාබ ඇත්තේ එවිටය.

'පව් දන්වත් ඇතුළට පලයන්.. සර් වරදක් කළේ නැතේ.'

වායා උඩට එද්දී තිලංකා අනුකම්පාවෙන් මෙන් කීවාය. වායාගේ ළය උණුවිය.

'කළත් මං පිළිගන්නෑ තිලංකා.. මට අද හරි දුක හිතුනා. වෙන ප්‍රශ්නයකට නෙවේ.. මං හරි ආදරෙන් උනන්දුවෙන් කරන මගේ රස්සාවට ගැරහුවට.. මම මගේ ආදරේටයි රස්සාවටයි කවදවත් බොරු කළේ නෑ.'

'හරි කෙල්ලේ දැන් අඬන්න එපා.. යන්න.. හිත රිද්දගන්නත් එපා.. හැම පැත්තෙන්ම ප්‍රශ්නනේ.'

'ප්‍රශ්න තියෙනවා නම්.. දුක් තියෙනවා නම් මං ඒවා ගන්නවා.. එයාට නිස්කලංකේ ඉන්න දෙනවා.'

වායා දොර ඇරියේ එසේ කියාගෙනය. [illegible] ඇගේ තුන්

WWW.EXPRESSLANKA.TK 413

හිතම කඩා වැටුණි. ඔහු කාර්යාල මේසය මත මැරුණෙක් මෙන් හිස ගසාගෙන උන්නේය. වායාට ඉහිලුම් නැති විය. ඇය මේසය මතට දුවගෙන මෙන් ගියාය.

'අසංක..'

ගියවනම ඒ හිසට අත තබා වායා කතා කළාය. නැත.. කිසිම හැල හොල්මනක් නැත

'අනේ මහත්තයෝ නැගිටින්නකෝ..'

ඇය යළිත් වරක් කීවාය. එවරද ඔහු කතා කළේ නැත.

'මො..ක..ක්..ද. උ..නේ.. නැගිටින්නකෝ..'

වායා දැතම යවා ඔහුගේ මුහුණ මේසයෙන් මුදවාගෙන දේතට ගත්තාය. ඒ දෑසම කඳුළු වලින් වැසී තිබුණි. ඇය ගින්දරකින් මෙන් දැවී ගියාය.

'ඇ..යි.. මේ.. මොනවටද දෙයියනේ අඬන්නේ..'

ඉඳගෙන උන් ඔහුගේ හිස වායා තම බඳට තබාගෙන කීවාය. අසංක ඇගේ මුළු බඳම බදාගෙන ඉකිබින්දේය. මේ මේසේ ළඟ තබාගෙන අඬන්නටවත් ලැබෙන අවසන් දින කිහිපයයි.

'මාව මරලා දාන්න මැණික.. මට ගහන්න.. නැත්නම් බැනලා බැනලා මට මොනාහරි කරන්න. මට ආදරේ විතරක් කරන්න එපා මෙහෙම.. අනේ මම ඔයාට කොච්චර දුක් දෙනවද..'

ඔහු ඉකිබිඳ බිඳ කීවේය.

'මං ආදරේ කරනවා.. ගොඩාක් කරනවා.. ඔයාටවත්.. කාටවත් බෑ මගේ ඒ ආදරේ උදුරගන්න. මේ ආත්මෙ මං තනිවෙන්නම්.. කමක් නෑ.. ඒත් කවදහරි ඔයා මට.. ආදරේ කරන්න එපා කියන්නෙපා.. ඔයාට ම..ම.. ආදරේ නැත්නම් කවුද ආදරේ..'

වායා තොල්පට විකාගෙන ඒ හිස බදාගෙන කීවාය.

'මගේ මැණිකට දුක හිතුනද..'

ඔහු ඇගේ මුහුණ අතගා ඇසුවේය.

'නෑ අසංක.. පොඩ්ඩක්වත් නෑ.. මම ගොඩාක් දුප්පත් කෙල්ලෙක්..

හර්ෂණී මිස් දන සෙරප්පු දෙකක් වත් ගන්න මට සල්ලි නෑ. ඒත් සර්.. මම මගේ රස්සාව හරියට කළා. අපි දෙන්නා අතර සිද්ධ වෙච්ච දේවල් පොඩ්ඩක් තියන්න.. ඒත් මගේ රස්සාව ගැන එයා මොනවද දන්නේ.. අනේ මං කොච්චර අමාරුවෙන්ද මේවා කරන්නේ.'

'හර්ෂණී ඔයාට ඊර්ෂ්‍යයි.. ඔයා වගේ ලස්සන කෙල්ලෙක් මං ගාව ඉන්න එක එයාට දිරවන්නෙ නෑ.'

'ඔක්කොටම වඩා අපි අසරණ කෙල්ලෝ.. මට හරි දුක හිතුනා එහෙම කියද්දි.. මං කොච්චර ආදරේද මේ ඔෆිස් එකට.. මේ වැඩ වලට..'

අසංක වේදනාවෙන් ඇගේ බඳ මත හිස තබාගෙනම උන්නේය. එහිවූ සිහිඳු මෘදු මොලොක් බව ඔහුගේ මූහුණට වඩාත් තදින් දැනෙයි.

'මාව පර්චසින් වලින් අයින් කරන්න සර්.. මං හින්ද ප්‍රශ්න ඇතිවෙනවට මං ආස නැහැ.'

බොහෝ වෙලාවකට පසු චායා ඔහුගේ හිස උකුලින් මුදාගෙන මේසයේ කෙළවරට ගොස් කීවාය.

'ඔයාට පිස්සුද.. එයාගේ අම්මා ඇවිල්ලද මෙතන පර්චසින් කරන්නේ.. ඔයා කිව්වා හරි. අපි දෙන්නගේ ප්‍රශ්න එකක්.. ඒවා රස්සාවට අදල නැහැ. මෙතන මං ඉන්න කල් ඔයා තමයි පර්චසින් කරන්නේ.. ඔයා සිලෙක්ට් නොකර මං එක ජංගි කෑල්ලක් ගන්නෑ.. තේරුණාද..'

හිත ඇතුලාන්තයට අහිංසක ආඩම්බරයක් දැනෙයි. තමාට සතුටුවිය හැක්කේ මෙසේ කුඩා දෙයක් ලබාගෙන පමණය.

'මිස් කියන ගවුම ඇඳගෙන යන්න අමාරුයි.. පුළුවන් කමක් තිබුනා නම් මම ගන්නවා. මෙන්න මෙතනට පලලා.. යට කලිසමත් පේනවා.. පස්ස පැත්තෙනුත් පිට ළඟට එනකන් මෙහෙම රවුමක් කපලා. පිට එළියේ.. මට හිනාත් ගියා ඒක දැක්ක වෙලාවේ.'

WWW.EXPRESSLANKA.TK 415

'අපරාදේ ගන්න තිබ්බේ.. ඔයාට විතරක් එකක්.'

'මොකටද ඒක..'

ඇය තොදොල් වී ඇසුවාය. මොහොතකට ඒ හිනාව දකිද්දී සියල්ල අමතකව යයි. යළි දුවගොස් බදාගන්නට සිතෙන්නේ එවිටය.

'ඇයි එයා ඉක්සරහ ඇඩුවේ.. ඔයා වරදක් කරලා නැතේ.'

'මට මං ගැන පොඩ්ඩක්වත් දුක නෑ.. ඒත් ඔයා ගැන මට දුකයි. මේවා ඔයාට ප්‍රශ්න.. ඇයි ඔළුව ගහගෙන හිටියේ.'

'ඔළුව පුපුරන්න වගේ.'

'අනේ මං දන්නෑ.. මම පහළ ඔක්කොම ඩිසයින්ස් ආයෙත් චෙක් කළා..'

'ඒ මොකටද..'

'මිස් කිව්වනේ මාව ගැළපෙන්නේ වන්තියේ ෂොප් එකක පර්චසින් වලට කියලා. ඇත්තටම එහෙමනම් මං සර්ට කියලා අදම අස්වෙන්න උන්නේ.'

චායා අවංක බැරෑරුම් කමකින් කීවාය. තමාව අවශ්‍ය නැති තැනක සේවය කරන්නට ඇයට හිතක් නැත. අම්මාත් සමඟ ගෙදරට වී කැලි රෙදි මැසීම ඊට වඩා හොඳය.

'ඉතින් මොනවද හිතුනේ.. පර්චසින් කරලා ගත්ත බඩු හොඳ නැද්ද.'

'අපෝ නෑ.. මං පර්චසින් කරපු ඒවා හොඳට යනවා.'

චායා මුවමත හීන් මදහසක් තබාගෙන කීවාය.

'ගොඩක් ඔළුව රිදෙනවද..'

'ඔව්.. මේ පැත්තම හිරිවැටිලා වගේ.'

'එන්න.. මං ඔළුව මසාජ් කරන්නම්.'

ඇය විනාඩි කිහිපයක් ඒ හිස පිරිමැද්දය. බොහෝ වේලා මෙසේ සිටින්නට බයය. කිසිවෙකු නාවද හිතට වෙනස් බියක් දනෙයි. හර්ෂණී පැමිණි පසු ඒ බිය වඩාත් තදින් දනෙයි.

WWW.EXPRESSLANKA.TK 416

'තේකක් හදලා එව්වා රසද..'

'අර..'

තේක එහෙමමය. එය බොන්නට ඉඩක් නොලැබිණි. හර්ෂණීට ගෙනා කොකා කෝලා එකද එහෙමමය.

'අපරාදේ.. ඉන්න මං තේකක් හදගෙන එන්නම්..'

'ඊයේ රෑ බීව්වද..'

චායා ඇසුවේ ඔහුගේ වතට පහත්වීය.

'මං බොන්නේ සතුටට විතරයි.. දුකට බොන්න මට අමාරුයි..'

'මිනිස්සු ඒකේ අනික් පැත්ත..'

'ඒත් ළඟදීම මාව පිස්සෙක් වෙයි බබා.. අමුම අමු පිස්සෙක් වෙයි.. අනේ මට මොනවා උනත් මාව බලාගන්නවා නේද..'

චායා ඔහුගේ හිස බඳින් මෑත්කරගත්තේ ගිනි බෝලයක් උකුල මත තබාගෙන සිටියාක් මෙනි.

'ඔයාව බලාගන්න කෙනෙක් එනවනේ.. මං මේ බිස්නස් එක මට පුළුවන් හැටියට බලාගන්නම්.'

ඔහුගේ කෝප්පය අතට ගෙන චායා කීවේ බිඳුණු හඬිනි. මහමෙර තරම් බලාපොරොත්තු හිතින් දරාගන්නට ඇය දැන් සූදානම් නැත. ඇබිත්තං ප්‍රාර්ථනාවක් වත් ඉතිරි නොවන ලෙස කුණාටුව හමා එන්නට පටන්ගෙන ඇතිබව ඇයදනී. ඉන් බේරෙන්නට ඔහුගේ අත අල්ලාගෙන වැඩක් නැත. මේ කුණාටුවෙන් ප්‍රථම කොටම ගසාගෙන යන්නේ ඔහුවය. ඔහුගේ ආදරයය.

# 40

තමාගේ විවාහයට කටයුතු සැකසෙමින් පවතින බව අසංකට

WWW.EXPRESSLANKA.TK 417

රහසක් නොවේ. මේ සියල්ල හැරදා කොහේ හෝ ඈතකට දුවන්නට ඔහුට සිතෙයි. වාහනය අරගෙන පාරට බැස්ස විට එහෙමම ගාලුපාර කෙළවර වනතෙක් ධාවනය කරන්නට ඔහුට සිතෙයි. අම්මා ජීවත්ව නොඋන්නා නම් කියා ඇතැම් විට ඔහුට සිතෙයි. එවිටම වාගේ අසංකගේ තුන්හිතම හිරිවැටී ගෙන යයි. මේ තරම් කුරිරු ලෙස ජීවිතය ගැන සිතන්නට ඔහුට අමාරුය.

ජීවිතය යනු නිස්කලංකයේ සිතන්නට දුන් කාලය මදි බව ඔහුට වැටහේ.

හවස වායා ගෙදර යන්නට පවුඩර් දමාගෙන ආපසු අසංක වඩාත් බැරෑරුම් ලෙස වායාගේ මේසය අද්දරට ගියේය. ඔහුගේ බැල්ම වෙනදා මෙන් නොවන බව දුන වායාද අයාගත් දෙනෙතින් බලාඋන්නාය.

'වායා..'

'ස..ර්..'

'මට අම්මා එක්ක කතා කරන්න ඕන.'

වායා ගැස්සුනාය.

'ම..ගේ.. අම්මා එක්ක.'

'ඔ..ව්..'

'මො..න..ව..ද.. සර්..'

'මුකුත් විශේෂ දෙයක් නෙවේ.. නිකං..'

වායා තවමත් වතුර රැඳුන ඇඟිලි තුඩින්අසංකගේ බාහුව මත ඉරි ඇන්දය. ඔහුගේ අතෙත් තමාගේ ඇඟිල්ලෙත් ඇත්තේ එකම පැහැයකි.

'සර් එනවා නම් ඇස්වල කඳුළු පුරවගෙන අපේ අම්මා සළකයි. ඒත් රත්තරං.. අම්මට දුක හිතෙයි... එයා දන්නවා.. ඔයාට කවදාවත් එයාගේ බෑනා වෙන්න බෑ කියලා. අපි මේ උන්නා වගේ ඉමු මහත්තයෝ..'

වායා ඒ මුහුණ අහගා මෙත් කීවාය.

'කල්පනා කරන්න එපා [illegible].. හිත [illegible] අමාරු

WWW.EXPRESSLANKA.TK 418

නමයි.. ඒත් දෙයියෝ මේ අපේ ලැබීම.. මටත් මොනවා වෙයිද දන්නෑ.. ඒත් කමක් නෑ.. පුළුවන් විදිහකට වෙඩින් එකට ලෑස්ති වෙන්න.. මැඩම් පව්.. ලෙඩ වුනොත් ජීවිතෙත් ෂුවර් නෑ නේද.. හරි භයානක ලෙඩක් ඒක.. අන්තිම කාලේ ඔයාගේ පැටියෙක්ව උකුලේ තියං නලවන්න හිතාගෙන ඉන්නේ.. මට මැඩම් කිව්වා. ඒ බලාපොරොත්තු එහෙමම ඉෂ්ඨ කරන්න.. මට ආදරේ කරලා ජීවිතේ වැරදුනා කියලා හිතන්න එපා. මට එක දෙයයි රත්තරන් කරන්න පුලුවන්.. මේ ඔක්කොම මැරිගෙන කරගෙන මං මෙතන වැටිලා ඉන්නම්.. ඔයා මගේ සර්.. මට බනින්න.. අණකරන්න.. මං හරි ආසයි එහෙමවත් හිත හදගෙන ඉන්න. තේරුණාද.. හවස අරහෙ යන්න.'

අසංක බලාඋන්නේ සට සට ගා වැටෙන ඇගේ දෑස් වල කඳුළු දෙසය. ඒවා පැහැදිලි වැහි බිංදු මෙනි.

'අපේ ජීවිතේ මේ ලස්සන දවස් ආයෙ එන්නෑ අසංක.. ඒත් ඔයාගෙ ජීවිතේ ලස්සන මෙතනින් නතර කරගන්න එපා.. ජීවිතේ කියන්නෙ එක අතීතයකට නෙමේ..'

'බණ කියන්න එපා චායා.'

ඔහු සැරෙන් කීවේය.

'තරහ ගන්න එපා.. ජීවිත තුන හතරක් අවුල් වෙන එක දූප්පත් කෙල්ලෙක්ගෙ ඇස්වල කඳුළු වලට වඩා බරපතලයි. මට හිත හදගන්න පුළුවන්.. බැරි උනත් මං ඒක කරනවා. ඒ ඔයාගේ ආදරේ වෙනුවෙන්.. මට පරක්කු වෙනවා දෙයියෝ.. මං යන්නද...'

චායා අතවූ පෑන මේසය මත තබා ඔහු අභියස පහත්වූනාය. ඔහුට වැඳ ඇය මොහොතක් ඒ දෙපා බදගෙන ඇඩුවාය.

'නැගිටින්න මැණික..'

'අ..නේ.. මට ඔයා නැතිවෙනවනේ..'

ඒ ඉකිබිඳුම නවත්වා ගන්නට චායාට නොහැකි විය.

අඩ අඩාවත් ළඟට වී ඉන්නට තිබුණා නම් සැනසීමකි. කඳුළු [illegible] ආශා කරයි.

WWW.EXPRESSLANKA.TK 419

එහෙත් සනසාලන්නට කෙනෙකු නැතිද අඬන හැඬුම් පවා අපරාදේය..

ආදරය ජීවත්වන්නට මහා ලෝබකමක් ඇති කළේය. තමාගේ ඇබින්තං ජීවිතයට ජීවත්වන්නට කියා දුන්නේ මේ ආදරයයි.. අහිම්වන බව දන දනත් තවමත් ඒ පපුවේ එල්ලී ඉන්නේ ඒ නිසාය..

'මාව දලා යන්න එපා මැණිකා..'

ඔහු බැගෑපත් හඬින් කීවේය.

'ඔයා නැතිඋනාට පස්සේ මේ ඔෆිස් එකම පාළුයි.. මට තත්පරයක්වත් ඉන්න හිතෙන්නේ නෑ.'

'මම ඔයාව දලා යනවා නේ බලං ඉන්න බැරි.. ඒ දුක මට දෙන්න. මං බලං ඉන්නවා.. සර් යන්න...'

'මට මං ගැන නෙවේ දුක බබා..'

'පරක්කු වෙනවා මහත්තයෝ.. මේ දවස් ටිකේම ගෙදර ගියේ රෑ වෙලා.. අම්මා පව්..'

'මාත් පව්..'

අසංක වායාව තම අසුන වෙතට ළං කරවාගෙන ඇය ඇඳගෙන උන් ටීෂර්ටය ඔසවා ඇගේ සිනිඳු සුදු බඩට මුහුණ තබාගත්තේය. ඔහුට ඇත්තේ ඔවැනි අහිංසක හිතුවක්කාරකමය. කොල්ලෙකුගේ පපුවේ බිත්ති පලා දමන්නට ඒ ඇතිය.

'මොනවද බඩේ තියං කරන්නේ..'

'බබා කුරු කුරු ගානවා..'

'පැටියෙක්ද දන්නෑ..'

වායා විහිළුවට මෙන් කීවාය. ඔහු ඇය දෙස බැලුවේ දුක්බර ලෙසිනි.

'දුක හිතෙනවද.. බයවෙන්න එපා.. කවදාවත් කාගෙවත් පැටියෙක් මං මගේ බඩට ගන්නේ නෑ.'

'මං පැටියෙක් දෙන්නද..'

ඔහු බඩටත් පහළ උදරය සිපගෙන කීවේය. හිතම ඇවිලී යන්නේ එවිටය.

WWW.EXPRESSLANKA.TK 420

'දෙන්න.. මං ආසාවෙන් හදගන්නම්.. මේ වගේ රත්තරං පැටියෙක්.. තාත්තව හැමදම මතක් වෙන චූටි පුතෙක්..'

'මං කිව්වේ බැන්දට පස්සේ දෙන්නම් කියලා.'

අසංකගේ දෙනෙත් තෙත්විය. ආදරය වෙනුවෙන් ඒ තරම් පරිත්‍යාගයක් කෙල්ලෙකුට කළ හැකිද..

'පැටියෙක්ව මීසක් පැටියගේ තාත්තව මට අයිති නෑ කවදවත්...'

ඇය ඔහුගේ හිස අතගා කීවාය. වායාගේ දෑස් යන්තමින් බොඳවී ගියේය.

'අඩ අඩා පාරේ යන්න බෑ මහත්තයෝ.. මං යන්නද.. අද කොතනටද ඕනේ.'

වායා දේතින්ම ඔහුගේ මුහුණ අල්ලා ඇසුවාය.

'මෙතනට..'

ඔහු දෙතොලට ඇඟිලි තුඩු තැබුවේය. වායා තොල්පට තද කරගෙන සිනාසුනාය. ඊටත්පසු ඇය සිටගෙන ඔහුගේ දෙතොලට පාත්වුනාය. ඔහු ඔහුගේ දෙතොලින් ඒ ලවන් දරාගත්තේ පපුවේ සත්කඩම පැලීයද්දීය. මේ උණුසුම ශින්දරක් වූද එය හදවතේ ඒ සත්කඩම ගිනි තබන බව ඔහු දැන උන්නේය.

'මං යන්නම්.. පරිස්සමින් ගෙදර යන්න හොඳේ..'

යන්නට හැරුනද ඇය ගියේ නැත. අසංක දෙස තවත් මොහොතක් ඇය බලාගත්වනම බලා උන්නාය. එක රැයකට දමා යා නොහැකි මේ ආදරය මුළු ජීවිතයටම දමා යා යුත්තේ කෙසේදැයි කාර්යාලයෙන් එළියට එද්දී වායා සිතුවාය. එහෙත් ජීවිතය සන්තක වූ සියලු ආත්ම ශක්තිය එකතු කරගෙන එසේ කළ යුතුව ඇත.

වායා සමඟ ගෙදර යන්නට නිලංකාද සැරසී උන්නාය.

'එක දවසකට සමුගන්න විනාඩි හතළිස් පහක් යනවා.'

නිලංකා කීවේ අහිංසකව සිනාසීය. වායාගේ දෙනෙත් බරවිය.

'මාත් හිතුවේ ඒකයි කෙල්ලෙ.. සදකාලයටම සමුගන්න කොච්චර කල් යයිද.. ආත්ම ගාණක් ගියත් හිතින් නම් සමුගන්නේ නෑ.. ඒත් මම කොහොම හරි හිත හදගන්නවා.'

[illegible] ආවේ දෙනෙත්

WWW.EXPRESSLANKA.TK 421

බර කරගෙනය. හැමදමත් මේ පියගැට පෙළ බැස ආවේ හිතේ බරකිනි. සමහරවිට සදකාලයටම එසේ විය හැක.

'වායා මිස්..'

පහළ ප්‍රදර්ශනාගාරයට එද්දී අනූෂා තිලංකාත් වායාත් අතරට දුවගෙන ආවාය.

'මම මිස් පහළට එනකල් උන්නේ.'

ඇය තුනී සිනහවක් පා කීවාය.

'ඒ මොකටද කෙල්ලේ..'

'පුංචි උදව්වක් ඉල්ලගන්න.'

ඉතින් උඩට එන්න එපායැ..'

'මං දන්නවනේ මිස් වැඩ.. මිස් පහළට එයි කිය කියා දවසම බලන් හිටියා.'

'හරි.. ඉතින් කියන්න මොකටද බලන් හිටියේ..'

'මට හොඳ ඇඳුමක් තෝරගන්න.'

අනූෂා කියද්දී වායා තිලංකා වෙත හැරී 'අනේ' කියන්නාක් බඳු බැල්මක් හෙළුවාය.

'කෙල්ලෝ ඔක්කොම කතාවෙනවා වායා මිස්ට තරම් ලස්සනට ඇඳුම් තෝරන්න කාටවත් බෑලු.. නේද තිලංකා අක්කේ.'

'ඒක ඇත්ත වායා.'

'මගෙත් වැඩක් ගන්න ඕනැඋනාම උඹලා ඔක්කොම මාව උඩ තියනවා.'

වායා කීවේ සිනාසීගෙනමය.

'අනේ නෑ මිස්.. ඇත්තම කිව්වේ.. අපිට බෑ ඇඳුම් තෝරන්න. තෝරලා ඇඳගෙන යද්දි එළ හරකයි මී හරකයි වගේ අපරාදේ සල්ලි..'

'හරි... මොකටද අද විශේෂයෙන් ඇඳුමක්..'

අනූෂා සිනාසුනේ ලැජ්ජාවෙන් බිම බලාගෙනය. ඇගේ ළපටි කම්බුල් වල මනමාල පැහැයක් නැවරී ඇත.

WWW.EXPRESSLANKA.TK 

'බලන්නකෝ තිලංකා මේකී ඇඹරෙන හැටි.. කියන්න කෙල්ලේ.. මට පරක්කු වෙනවා.'

'එයාගේ අම්මයි තාත්තයි එනවා මාව බලන්න.'

අනුෂා කියද්දී චායා ආදරයෙන් උණුවීගිය දෙනෙත් වලින් ඇයදෙස බැලුවාය.

'ඒක නමයි මේකිගේ මූණ තොරණකට ලයිට් දැම්මා වගේ තියෙන්නේ. නේද චායා.'

'පව්නේ තිලංකා.. මාත් දැක්කා දවසක් පාත්දර දෙන්නාත් එක්ක අත් අල්ලගෙන මෙතනින් බස් එකට නගිනවා..'

'මාත් මිස් දැක්කා.. මං එයාටත් පෙන්නුවා මිස්ව.. අනේ මිස් තෝරලා දෙන්න.. අම්මා කියනවා සාරියක් අඳින්නලු.. මට බෑ මිස් සාරි අඳින්න.. කට්ටිය ඉස්සරහ කඩන් වැටෙයි කියල බයයි.'

'සාරිම ඕන නෑ යන්..'

චායා අනුෂාද කැටුව ප්‍රදර්ශනාගාරය වටා රවුමක් ඇවිද්දේය. යුවතියකගේ ජීවිතයේ ලස්සනම දිනවලදී ඇය සිටිය යුත්තේ චාමෙට නමුත් කැපී පෙනෙන ලෙසය. ඇය එදිනට ඇඳිය යුත්තේ ලස්සන මෙන්ම ඇගේ තැන්පත් බවද මතු කරවන ඇඳුමකි.

චායා අනුෂා වෙනුවෙන් ලාදම් පැහැගත් ඉන්දියානු සල්වාර් ගවුමක් තෝරා ඇය අතට දුන්නාය. අනුෂා එය අතට ගත්තේ ආශාවෙනි.

'හොඳද..'

'අ..නේ.. හරි ලස්සනයි මිස්.. මේ දවස් ටිකේම ෂෝරූම් එක වටේ මම ඇවිද්ද.. මට මේ ඇඳුම ගැන හිතුන්නෑනේ.. මේකට මම ලස්සන වෙයිද මිස්..'

අනුෂා ඇයුවේ සල්වාර් ගවුම තම වතට තබා බිත්තියේ සවිකළ කැඩපතින් එදෙස බලමිනි.

'ලස්සනයි කෙල්ලේ.. බයවෙන්නෙපා.. ඔයාගේ නැන්දම්මට හරි ආස හිතෙයි.'

WWW.EXPRESSLANKA.TK 423

'ඒක තමා මාත් බයේ උන්නේ.'

'ඔය පාටට ගැළපෙන මාලෙකුයි කරාබු දෙකකුයි තියෙනවා මං ගාව.. මං හෙට ගෙනල්ලා දෙන්නම්.'

අනූෂා ඇය දෙස බැලුවේ ආදරයෙනි.

'මිස්ට පින්..'

'පිස්සු කෙල්ල.. මේ කොණ්ඩේ කපාගන්න.. ඔය ඉස්සරහ වැඩියි.'

චායා එතනින් ඉවත්ව ගියේ අනූෂාගේ හිස අතගාගෙනමය. ඇය ප්‍රදර්ශනාගාරය හරහා ගොස් නිලංකාට එකතු වූයේ සිනාසීගෙනමය.

'කෙල්ලට ඇඳුම ගැන හරි ආස ඇති.'

නිලංකා පාරට එද්දී කීවාය.

'පව් නිලංකා.. අපි වගේම දුප්පත් කෙල්ලෙක්නේ.. මං ගාව තියෙනවා සිංහල අවුරුද්දට ගත්ත දාපු නැති ලස්සන සෙරෙප්පු දෙකක්. ඒක කෙල්ලට ගෙනත් දෙන්න ඕන.'

නිලංකා තම මිතුරිය දෙස බැලුවේ උතුරා ගිය ළෙන්ගතු බවකිනි. නිලංකාගේ ජීවිත කාලය තුළ චායා තරම් හෘදයාංගම මිතුරියක් ඇයට හමුවී නැත. ඇගේ ජීවිතයෙන් නිබඳවම ගලා ආවේ මිනිස්කමක සුවඳය. ඊර්ෂ්‍යාව ගැනද නොසිතා නිලංකා චායාගෙන් අසංකගෙන් ආදරයට උදව් කළේ ඒ නිසාය.

'කවදාහරි මාව බලන්න මනමාලයෙක් එන දවසටත් උඹට කියලම ඇඳුමක් තෝරගන්න ඕන.'

නිලංකා කීවේ වැඩිදුර නොසිතාය.

'එදට මං ගානේ උඹට ඇඳුමක් දෙනවා..කොහොමටත් මට ඒ වගේ අවස්ථාවක් මගේ ජීවිතේ එන්නැනේ නිලංකා..'

තමා කියූ දෙය ඔස්සේ ඇය ඒ තරම් දුරක් හිතාවි යැයි නිලංකා නොසිතුවාය.

'අපි ඕවා නොහිතා ඉමු චායා..'

'නොහිතා ඉන්න වෙලා තියෙන්නේ හිතන්න ආස කරනම කෙනා ගැන.. මම දන් පුදුම ලෙඩෙක්..'

වායා දෙනෙත් බිමට බර කරගත්තේ ඒවලට කඳුළු කැට දෙකක් ඉනූ නිසාය.

# 41

කිරිගල් පොත්ත කන්දම පපුව මත තබාගෙන ඉන්නාක් මෙන් බරක් වායාට දැනෙයි. මේ දැනෙන බර ආදරයේ බරයැයි සිතන්නට වායාට ලෝබය. ඒ ආදරයේ බරක් නැත. බර ඒ ආදරය ඉදිරිපිට දෛවය නැඹූ දුක්බර නපුරු ඉරණමය.

දන් ඉස්සර මෙන් නොවේ. නොහිතන මොහොතක ඇගේ හිතම කඩා වැටී ඇයට ඇඬෙන්නට එයි. එවන් මොහොතකදී වායා කරන්නේ අමාරුවෙන් මුළු පපුවම තද කරගෙන සිටීමය. විටෙක මුළු පපුවම හිරවී ගියාක් මෙන් වේදනාවක් දැනෙයි. මේහිරවීම සදාකාලයටම හිරවී ගියා නම් හිතට සනීපයකි. එසේවීනම් උපදින ආත්මයක ඔහු එනතෙක් බලා සිටිය හැක.

එහෙත් මෙ ආත්මයට ඒතරම් ඉක්මණින් සමුදෙන්නට වායාට නොහැක. උපතුපත් ජාති ජාතිත් ඔහුම ලබන්නට නව පින් කළ යුතුය. ගිය ආත්මවල කළ පින් මදිය. පුංචි පිනක් තිබී ඔහුට ආදරය කරන්නට පමණක් තමාට හැකිවීයැයි ඇයට සිතුණි. ඒත් ඒ හිමිවීම සදකාලික හිමිවීමක් කරගන්නට තරම් මහානුභාවසම්පන්න පුණ්‍යකර්මයක් තමා සංසාරයේ කර නැත.

ජීවිතයට හැමදම තිබුනේ අහිමිවීම් පමණි. ජීවිත කාලය පුරාම කළේ ඒ අහිමිවීම් කරපින්නාගෙන ජීවත්වීමය. ඒත් මේ අහිමිවීම් දුක දරාගෙන ජීවත්විය හැකිදැයි ඇයට බොහෝ විටෙක සිතෙයි.

WWW.EXPRESSLANKA.TK 425

'නංගි..'

ලතා කාමරයට එබුණේ රෑ චායා ඇඳට වී බලාගත් අත බලාගෙන සිටිද්දීය.

'එන්න ලතා අක්කේ.'

නෙත්වූ දෙනෙත් නොපිසදම චායා කීවාය. පියදෑමුවද තමා අඬා ඇතිබව මේ ගැහැණිය දනී. ජීවිතයට හෘදයාංගමවූ කෙනෙකුගෙන් කඳුළු සැඟවිය යුතු නැතැයි චායා සිතුවාය.

'බැලුවොත් ඇස් වල කඳුළු පුරෝගෙන බලාගත්ත අත බලාගෙන.. හැමදාම ඔහොම ජීවත්වෙන්න බෑ නංගියේ..'

ලතා කීවේ ඇඳමත වාඩිවී චායාගේ උරහිසට සුරත තබාය. චායා දෙතොල් පට විකාගත්තාය.

'දන්නවා අක්කේ.. එහෙම ඉන්න මාත් ආස නෑ. ඒත් මං කියලා මොනවා කරන්නද.. කැරකිලා කැරකිලා මාව කොහාට වැටෙයිද කියලා මාත් බලං ඉන්නේ..'

'ඇයි මේ දවස්වල ප්‍රශ්නද..'

'මට ඕන ප්‍රශ්න ඔක්කොම විසඳන්න කියලා බොරුවට හරි කියලා එයාගේ හිත හදලා එයාට යන්න දෙන්න... සර්ගේ ජීවිතේ අනතුරේ අක්කේ..'

'මොනවද සර් කියන්නේ..'

'එයා පොඩි ළමයෙක් වගේ..'

'ඔයා වගේ කෙල්ලෙක් ළඟ කොල්ලෙක් පොඩි ළමයෙක් වගේ තමා..'

ලතා පරිස්සමින් චායාගේ මුහුණ බැලුවාය. ඇය දුටුවේ ආදරයේ දුක්බරම දිනවලදී තැලී පොඩිවී ගිය අහිංසක යුවතියකගේ නෙත මුහුණය. ලස්සන කෙල්ලෙක් අඬද්දී තවත් ලස්සනය.

'ගන්න තීරණයක් පුළුවන් ඉක්මණට ගත්තා නම් ඉවරනේ නංගි.. හිතකට උනත් මච්චර වද දෙන එක පව්.. හිත ඔයාගේ උනත් ඔයා දුකෙන් ඉඳිද්දී අම්මා උනත් කොච්චර පිච්චෙනවද.. මට උනත්

WWW.EXPRESSLANKA.TK 426

හරි දුකයි..'

'තීරණයක් ගත්තා අක්කේ.. ඒත් මේ පිස්සු කොල්ලා ඒක හිතන්නෑ..'

'ඔයා බලාගෙන ඉන්නේ එයා ඔයාව දාලා යනකල්ද.. ඊට වඩා නරකද..'

ලතා කියන්නට ගියදේ ගිලගත්තේ චායාගේ මුහුණ අඳුරුවී කළුවී ගිය නිසාය.

'මං.. දා..ලා.. යන්නේ කොහොමද අක්කේ.. එයා මගේ හිත රිද්දවගෙන රිද්දවගෙන ගියා නම් පොඩ්ඩක් හරි හිතලා මං ඈත්වෙනවා. ඒත් එයාට බෑ මගේ හිත රිද්දන්න.. මටත් ඒක කරන්න බෑ.'

ලතා කිසිවක් නොකියා චායාගේ උරහිස පිරිමැද්දය. ආදරයෙන් අවතැන්වූ හදවතකට කිසිවකු පිහිටක් වියයුත්තේ කෙසේද කියා ඇයවත් නොදනී. ගත් තීරණයක් ගැන කියනවා නම් හිත හදගන්නට උදව්වක් කරන්නට තිබුණි.

'ඇඟත් ටිකක් කෙට්ටු වෙලා.. ඔහොම ගියොත් ඔයාව ලෙඩවෙයි..'

හිත කොහොමත් ලෙඩිනි. එය දැන් ජීවිත කාලයටම ලෙඩවී අවසානය.

'මොනා කළත් කමක් නෑ කියලා තීරණ ගන්න.. ඔයාට තියෙන්නේ වටින ජීවිතයක්.. මූණ ටිකක් බලාගන්න එළියටවත් නාපු නිසා මම මේ ආවෙ බලන්න..'

'අනේ ලතා අක්කලගේ ගෙටවත් කාලෙකින් ගොඩවුනේ නෑ.'

'මුකුත් ඔයා හිතන්න එපා.. ඉස්සෙල්ලා හිත සන්සුන් කරගෙන ප්‍රශ්න වලට මුහුණ දෙන්න ශක්තිමත් වෙන්න. මේ දුප්පත් අක්කාගෙන් මොනාහරි උදව්වක් ඕන නම් කියන්න.. මං ඔයාට හරි ආදරෙයි.. මට ඔයාව මගේ නංගි වගේ.. තේරුණාද...'

ලතා කාමරයෙන් ගියේ තවත් වරක් චායාගේ හිස අතගාගෙනය. ජීවිතය කොතනක සිට හදගන්නට ඇත්තමියැයි චායාට සිතුණි.

චායා මූණ හදාගෙන කුස්සියට ගියේ අම්මාව හොයාගෙනය..

WWW.EXPRESSLANKA.TK 427

ඇය උන්නේ පහේ බදිමිනි.. අම්මාගේ පහේ සුවඳ මුළු කුස්සිය පුරාම විහිදී ඇත.

'පහේ බදින්නේ මොනා හදන්නද අම්මේ..'

ඡායා කුස්සියේ වූ පුංචි බංකුවේ වාඩිවී ඇසුවාය.

'පීකුදු ටිකක් ගෙනාව පුතේ.. ඒක හදන්න.. දවස තිස්සෙම ඔයත් ලේ පුච්චගන්නව විතරනේ.. ඒකයි ලේ වඩන කෑමක් ගෙනාවේ.'

අම්මා ගැන ඡායාට පුදුමය. තමාගේ දෛවයට අනුව හැඩගැසෙනවා විනා ඇයද ඊට එරෙහිව වචනයක්වත් කතා නොකරයි.. කතා කරා නම් එයද හිතට සැපකී.

'අම්මේ..'

ඡායා කතා කළේ වෙනස් කටහඬකිනි. පද්මා පීකුදු කරිය ලිප තබා ඡායා අසළම ඉඳගත්තාය.

'කියන්න..'

දියණිය දිග කතාවක් කියන්නට යන බව දැනගෙන මෙන් පද්මා කීවාය.

'සර් කියන්නේ බඳිමු කියලා.. මැඩම් එක්ක කතා කරන්නම්ලු.. මෙහෙ එන්නත් හැදුවා.'

පද්මා මේදේ දියණිය කියන බව දැනගෙන උන්නාය. තම දුවගේ ජීවිතයට කුළුඳුලේ අත පෙවූ ඔහු අකාරුණික කෙනෙකු නොවන බව පද්මා දනී.

'පුතා මොකද කිව්වේ.'

'ඒක තේරුමක් නැති දෙයක් අම්මේ.. එක තැනක තියෙන ගින්දර වටේටම දන වැඩක්.. මැඩම් ඉන්නේ ගොඩාක් අසනීපෙන්.. මේක කිව්ව ගමන් ඒ මනුස්සයට ඉහිලුම් නැතිවෙයි.. මං ගැන හරි ආදරෙන් හිතාගෙන ඉන්නේ.. ඒකත් නැතිවෙයි.. මාව බැල්ලියෙක් වගේ දෙට්ට දයි.. අනික සර්ට ඒ කසාදේ කරගන්නම වෙනවා.. මං කිව්වා මගේ ජීවිතෙන් ඈත්වෙලා යන්න කියලා.'

පද්මාට කිවයුතු යමක් සිතාගත නොහැකි විය. දියණිය මේ ප්‍රශ්නයෙන් අසරණවීම පුදුමයක් නොවේ. ජීවිතයේ එන හැම

WWW.EXPRESSLANKA.TK 428

ප්‍රශ්නයකටම පිළිතුරු ඒත් සමඟ අමුණා එවන්නේ නැත. ඒවා සොයා යා යුතුය. නොවේ නම් ප්‍රශ්න වලින් පැන ආ යුතුය. ඒ දෙකම කළ නොහැකි අවස්ථාද නැත්තේ නොවේ.

"බඳිමු කියලා කිව්වම මටත් හරි ලෝබයි අම්මේ.."

ඇය කීවේ අවංක වේදනාවකිනි.

"මැඩම් ඔයාට මෙච්චර කැමති එකේ සමහරවිට..."

පද්මා කියන්නට ගියදේ කීවේ බාගයටය.

"නෑ අම්මේ.. ඒ ආදරේ කරුණාව එයා ළඟ ඉන්න හොඳම සේවිකාවකට කරන ආදරයක්.. මාව ලේලි කරගන්න තරම් ඒ ආදරේ ප්‍රබල නෑ."

චායා හුල්ලා මෙන් කීවාය. සමහරවිට මැඩම් කැමති වුවහොත් කියා ඇයටද නිකමට සිතුණි. එහෙත් එය අත්හදා බලන්නට ඇයට බියක් ඇත.

"සර්ට මාව දාලා යන්න බෑ.. මම විඳින දුක ගැන එයා හරියට හිතනවා.. කොච්චර තේරුම් කරලා දුන්නත් එයා කියන්නෙම මාව අත්අරින්න බෑ කියලා."

චායා සිමෙන්ති පොළොවේ වැටී තිබූ දිය බිංදුවක් ඇඟිලි තුඩින් ගෙන බිම මලක් ඇන්දය. මල් අඳින්නේ හිතේ බලාපොරොත්තු ඇති විටය. පද්මා ඒදෙස දුක්බරව බලා උන්නාය. දියණියට දියයුතු පිළිතුර කුමක්ද..

"තව මෙහේ ඇවිල්ලා අම්මා එක්ක කතා කරන්නත් ලැජ්ජිය.."

"ආවොත් මටත් ඇඬෙයි පුතේ.."

පද්මා කීවේ හැඟීම්බරවය. ඒ මොහොත දරාගැනීමට ජීවිතය පුරා තමා එකතු කරගත් ආත්ම ශක්තිය ප්‍රමාණවත් නොවන බව පද්මා දනී.

"මං කිව්වා අම්මේ ඒක.. ආවොත් අම්මා අඬ අඬා හරි දෙවියෙක්ට වගේ සළකයි කියලා. වෙන්වෙලා එන්න පුළුවන් කෙනෙක් නම් දහපාරක් එහෙම කරලා මම.. ඒත් ඒක කරන්න හරි අමාරුයි අම්මේ..."

චායාගේ වදන් බොළඳයැයි සිතන්නට තරම් පද්මා හදිසි

WWW.EXPRESSLANKA.TK 

නොවූවාය. ඒ වචන වල බොළඳකම ඉක්මවා ගිය ගැහැණු හිතක උපන් ප්‍රේමයක් ඇත. එයට ගරහන්නට අම්මා වූ තමාට වත් නොහැක.

'මැඩම් සර්ගේ කසාදේ ගැන කලින් තීරණයක් අරගෙන තිබුනේ නැත්නම් මේ ප්‍රශ්න කාලයට බාර දෙන්න තිබුණා වෙන දෙයක් වෙද්දෙන් කියලා.. ඒත් වැඩිම උනොත් තව මාස දෙකයි.. සර්ව සැප්තැම්බර් වල බන්දලා දෙන්න යන්නේ.'

දියණියගේ ජීවිතයේ කුණාටු සමය තව මාස දෙකකින් උදාවෙන බව පමණක් පද්මා තේරුම් ගත්තාය.

'තීරණගන්න ඕන ඔයාලා.. ඔයා අඩ අඩා ආවත් හිනාවෙවී ආවත් මං ඉන්නවා.. කරන්න ඕන මොනවද කියලා මං කොහොමද පුතේ කියන්නේ.. ඕවා ගැන ඔච්චර දන්න ඔයත් පැටලිලා ඉන්නකොට..'

චායාට හීල්ලින. ඇයට තීරණ ගන්නට බයය.. ඔහුගත් තීරණයක් මත පිහිටා ඇයට හිත හදගත හැකි යැයි ඇය සිතන්නීය. ඒත් කළ නොහැකි වුවද එසේ කළ යුතුව ඇත. රැයක් අඩා හෝ සඳුළු පිහදමාගෙන උදේ ජීවිතයට මුහුණ දිය යුතුව ඇත.

'සර් බැන්දටත් පස්සේ හිත තද කරගෙන ඔයාට එතන වැඩට යන්න පුළුවන්ද..'

එසේ කළ හැකිදැයි චායා නොදනී. එහෙත් ඒ රුව වත් නොදක ජීවත්වීම අසීරුය. ඔහු අන්සතුවූ පසු හදවතේ සියළු සවුළු දෙරවල් වසාගෙන ජීවත් වියහැක. ඔහු සමඟ වචනයක් හෝ කතා නොකර සිටිය හැක. එහෙත් ඒ රුව දවසකට වතාවක් වත් නොදුන ජීවිතය ඉදිරියට පවත්වාගෙන යාම අතිශයින් දුෂ්කරය.. එය ආහාර පාන හුස්ම නැතුව ජීවත්වීමකට සමානය.

'මං හිත හදගත්තේ ඒ රස්සාව ගැන හිතලා අම්මේ.. මැරෙනකල් මම සර්ටයි මැඩම්ටයි වැඩ කරනවා. දෙන්නගෙන් කාටහරි හිතිලා මාව එලෙව්වොත් මිසක් මම නවතින්නේ නෑ.'

'ඒක හිත පාරගන්න වැඩක් නේ පුතේ..ඔයාට පුළුවන්ද එහෙම කරන්න.'

තිලංකා කීවාය.

"ඇයි.."

තිලංකා ඉස්සී චායාගේ වරලස සිප බැලුවාය.

"ඒ ෂැම්පූ සුවඳට මං හරි ආසයි."

"අරයත් ආසයි.. ආපු ගමන් මූණයි කොණ්ඩෙයි ඉඹිනවා.."

"තව කොහෙද ඉඹින්නේ.."

තිලංකා සිනාබරව ඇසුවාය.

"මෙතන.. ගියොත් ළඟට එතනට ඔළුව තියං ඉන්නවා.. පුදුම කොල්ලෙක්.."

චායා කීවේ ඇගේ පුළු බඩට අත තබාගෙනය. ඒ හිතුවක්කාර වැඩ සියල්ලටම ඇය ආත්මයෙන්ම ආශා කළාය.

"නැති දවසක ඒ ඔක්කොටම පාළු හිතෙයි."

"ඔන්න පාන්දරම විරහ ගීය කියන්න යනවා.. උදේට මූණ අරගෙන එන්නෙ ඉඹගන්න හිතෙන තරම් ලස්සනම හරියට කෝපි මලක් වගේ..."

"හවසට පරවෙච්ච නිදිකුම්බා මලක් වගේ නේ.."

තිලංකා කිසිවක් කීවේ නැත. කුඩා වීදුරු මේසය මතවූ චායාගේ පුරන පිරිමැද ඇය එදෙසම බලාඋන්නාය.

"ඒක නෙවේ චායෝ.. බඩ්ඩක් අහන්න බලං උන්නේ."

"මොකක්ද.."

"අක්කා බඳින අයියයි තව අපි ටික දෙනෙකුයි ට්‍රිප් එකක් යනවා.. අම්මා අක්කව තනියම එවන්නෑ.. මටත් යන්න කිව්වා.. අම්මටත් පිස්සු.. ඒකි කොල්ලගේ කරේ.. බොරුවට පරිස්සම.. මට තනියම යන්න පාළුයි චායා.. නුවරඑළියෙ යන්නේ දවස් දෙකකට.. එනවද."

"ම..ම.."

"ඔව්.. මේ ඔක්කොම අමතක කරලා ලබන සෙනසුරාදයි ඉරිදයි ගිහිල්ලා එමු.. අපි වෑන් එකක යන්නේ."

WWW.EXPRESSLANKA.TK 431

'යන්න නම් ආසයි.. මං අහලා කියන්නද..'

'කාගෙන්ද අම්මගෙන්ද සර්ගෙන්ද..'

'අම්මා නම් හරි ආසයි මං යනවට.. පහුගිය දවසකත් කිව්වා ඔය හිතේ ප්‍රශ්න හිර කරගෙන ඉන්නැතුව යාළුවෙක් එක්ක කොහේ හරි යන්න කියලත්.'

'මං කියන්නද වැඩක්..'

නිලංකා රහසින් මෙන් කියා වායාට ළංවූවාය.

'මොකක්ද..'

'සර්ටත් වෙනම නුවර එළියෙ එන්න කියමු.. කොහොමද සීතල කඳු අතර කොල්ලත් එක්ක තනිවෙලා රැයක් ඉන්නකොට..'

ඇතුළු හදවතින් වායාට ආශාවක් දැනුණි. එහෙත් තව තවත් ළංවී පාවියන්නේ තව තවත් දුකටම නොවේද..

'පුළුවනත් නම් කියලා මම එන්නම්..'

'ලන්ච් එකේදි මට කියනවද.. මම අක්කට කියන්න ඕන වායා.. ඔයා යන්නේ නැත්නම් මාත් යන්නෑ.. මට පාළුයි.. මං ඒ යන කව්රුවත් දන්නෑ.'

ඔහුගේ වාහනය පහළ නවත්වන හඬ අපූරුවට උඩට ඇසුණි. අද වෙනදාටත් වඩා වේලාසනය.

'අන්න සපුමල් කුමාරය වඩිනවා..පලයන්.'

පාන්දරම ඒ මුහුණ දකගන්නට ලැබීමත් සැනසීමකි. ඔහු අහිමිව ගිය කලෙකනම් මේ රුව කෙසේ දරාගන්නදැයි ඇය සිතුවාය. ඔහුව හැම දවසකම වෙන වෙනම රස විඳිය හැක. අද මුහුණ මොන පාටද.. කමිසය ලස්සනද.. රැවුල කැපුවාද.. ඒ සියල්ල ගැන බොළඳියකසේ ළඟට වී හිතන්නට ඇය ආශා කළාය. එහෙත් හදවත ආශා කරන සියල්ලම පුද දෙන්නට තරම් ඉරණම කාරුණික නැත..

ඔහු පියගැට පෙළ නගින්නට පටන් ගනිද්දීම වාගේ වායා දෙර ඇර කාර්යාලය තුළට ගියාය. උදෙන්ම වායුසමීකරණය ක්‍රියාත්මක කරන්නට ඇය ආශා නැත. පාන්දර ස්වභාවික සීතල ගතට මෙන්ම හිතට [illegible]යකි.

WWW.EXPRESSLANKA.TK 432

අසංක පෙරදා රාත්‍රියේ එක විනාඩියකට වත් ඇහැ පියවාගත්තේ නැත. ඔහු ඊයේ හර්ෂණීගේ නිවසින් පිටවූයේ තෝන්තුවූවෙකු මෙනි. විවාහයට දින සටහන් කර තිබුණි. හරියටම කියනවා නම් විවාහයට තිබුණේ දින හැටකටත් වඩා අඩු කාලයකි. තමාගේ ජීවිතය අඳුරු අගාධයකට තල්ලු වන ඒ අසුන්දර දිනය ඒ තරම් ළඟයැයි සිතන්නට ඔහුට අසීරුවිය.

රාත්‍රිය පුරා කාමරයට වී තිදිමරා ඔහු තීරණයක් ගන්නට උත්සාහ කළේය. කා ගැනවත් හිතා නොව තම ජීවිතය ගැන සිතා තීරණයක් ගතයුතුයැයි අසංක සිතුවේය. ජීවත්වන්නේ තමාය. ජීවිත වල නොසිතූ දේවල් සිදුවේ. අදහාගත නොහැකි දේවල් සිදුවේ. තමාගේත් වායාගේත් සම්බන්ධය ඒ තරම් පුදුම දෙයක් නොවේ.

කවර දුකක් විඳ හෝ සටන්කර වායාව ගෙදරට කැන්දගෙන එන්නට හැකිවුවහොත් ආත්ම ගණනක් තමා ජයග්‍රහණය කළ බව අසංක දනී.

'ගුඩ් මෝනින් සර්..'

ඔහුගේ මුහුණ කඩා වැටී ඇති අයුරු නිලංකා අපූරුවට දැක ගත්තාය. ඒ මුහුණ බලා ඉන්නට බැරි තරම් දුකය.

'මෝනින් නිලංකා..'

අසංක කාර්යාලය තුළට නොගොස් නිලංකා අසළ නතරවිය.

'ඇ..යි.. සර්. සර්ට සනීප නැද්ද.'

'හිතට හරි කරදර නිලංකා.. ඔයාට පුළුවන්නම් මේ හරකිට කියන්න ඕන මල ඉලව්වක් වෙන්න මා එක්ක එන්න කියලා.'

නිලංකා අසංක දෙස බැලුවේ අසරණවය.

'මට තේරෙනවා සර්.. ඒත් වායා ගොඩාක් හිතලා තීරණ ගන්න කෙල්ලෙක්.'

'මම අනාථ වෙලා වගේ ඉන්නේ නිලංකා.'

'සර් හිතන්නේ අර කෙල්ලට දුක නෑ කියලද.. ඒ කෙල්ල එක බත් කටක් කන්න කොච්චර දුක් විඳිනවද.. මටත් හරි දුකයි.'

'මං තීරණයක් ගත්තොත් නිලංකත් මට උදව් කරනව නේද..'

WWW.EXPRESSLANKA.TK 

"සර්ටයි චායාටයි මං හරි ආදරෙයි සර්..මට කරන්න බැරි දෙයක් නෑ. මට පුළුවන් හැම දෙයක්ම කරන්නම්.. ඒත් සර් හැම දෙයක්ම අවුල් කරගන්නැතුව කරන්න."

"දෙන්නෙක් දෙපැත්තේ දුක් විඳිනවට වඩා අවුල් වෙන එක හොඳයි තිලංකා.."

ඔහු තවමත් නොඑන්නේ ඇයිදැයි චායා බුදු පහන තියා හැරෙන අතරතුර සිතුවාය. වෙනද නම් බුදුන්ට වඳින මොහොතකදී වුව ඔහු පිටුපසින් පැමිණ තමාව වැළඳගනී. ඒ පහස බලාපොරොත්තුවෙන් තම ගතද සිතද උණුසුම් වෙයි.

චායා සැකයට කාර්යාලයේ දෙර ඇර බැලුවාය. තිලංකා අසළ හිස බිමට බර කරගෙන ඉන්නා ඔහුව ඇය දුටුවේ එවිටය. චායා දෙර අල්ලාගෙනම බලාගෙනම උන්නාය.

අසංකත් තිලංකාත් චායා දෙස බැලුවේ එකම විටය. චායා පුදුමයෙන් මෙන් සිනාසෙන්නට වෙර දැරුවාය.

"ඉස්සෙල්ලම දවසෙ මෙතනට වෙලා හිටපු හැටි මතකද තිලංකට.."

ඔහු පොඩි දරුවෙකුසේ තිලංකා දෙස බලා ඇසුවේය. චායා දෑතම පිටුපසට බැඳගෙන ඇලුමිනියම් දෙරට බර වූවාය. මේ උදයන ඔහුට මේ සියල්ල මතක් වන්නේ ඇයි.

"දැන් හිතෙනවා එද නාවනම් කියලා."

චායා කීවේ දුක්බරව දෙනෙත බර කරගෙනය.

"එහෙනම් මේ ගින්දර සර්ට නෑනේ.. බලන්න තිලංකා මූණෙ හැටි.. මෙච්චර මම හිත තද කරගෙන ඉන්නවා.. සර්ට බැහැ."

"මට බනින්න එපා චායා."

ඔහු දෙර ඇරගෙන ගියේ එසේ කියාගෙනමය. චායා දැස් කුඩාකර තිලංකා දෙස බලා සුසුමක් හෙළුවාය. මේ ආදරය කවර ආත්මයකදී කළ ආදරයක්ද.. කුමක් වුවද එය ප්‍රබල ආත්මයක් විය යුතුය. නොවේ නම් හිතට මේ තරම් දැඩි හැඟීමක් නොඒ.

ඔහු ආසනයේ වාඩිනොවී පිස්සෙකුසේ කාර්යාලය තුළ ඇවිද්දේය.

WWW.EXPRESSLANKA.TK 434

වායා මොහොතක් ඔහුදෙස බලා උන්නාය. වරෙක ඇය ඒ සුරත දෑඩිව අල්ලාගෙන ඒ මුහුණට එබුනාය. දෑස මලානිකය. ඒවල කප්පරක් දුක ඇත.

'ඇයි රත්තරන් මේ.. සනීප නැද්ද.'

අසංක මේසයට බරවී ඇයව තම දෙපා අතරට ගත්තේය. ඊටත් පසු ඇගේ බඳ හරහා දෑතම යවා ඇයව සිරකර ගත්තාය.

'මෙච්චර ලස්සනට එන්නේ මාව තවත් ලෝබකරන්නද..'

ඔහු ඇසුවේ දුකෙනි.

'කියනව නම් චීත්ත ගවුමක් හරි ඇඳගෙන කොණ්ඩෙට රබර් පටියක් දාගෙන එන්නම්.. නැත්නම් නැවිදින්ම ඉන්නම්.'

'මේක අරගෙන අනින්න බබා.. අනින්න.'

ඔහු මේසය මත තිබූ උල් කතුර ගෙන කීවේය. වායා එය අල්ලා වීසි කළාය.

'අසංක.. ඇයි මහත්තයෝ මේ..'

තොකැපූ රැවුල් කොට මතුවූ මුහුණ සිය සිනිඳු අතැඟිලි වලින් අතගා වායා ඇසුවාය. අසංක ඒ ඇඟිලි තුඩු තම දෙතොල් පත් අතරට ගෙන ගොස් සිපගත්තේය.

'මම ඊයේ රෑ නිදාගත්තේ නෑ බබා..'

'ඇයි ඒ..'

'ජීවිතේ ගැන මුල ඉඳලා හිතුවා. අනාගතය ගැන හිතුවා.'

තමා ගැන මොනවද හිතුවේ කියා අසන්නට ඇයට සිතුණි. එක අතකට ඔහු අනාගතය නම් වූ ලෝකයේදී තමා ගැන නොහිතාම ඉන්නවා නම් හොඳය. ඒ තරමට හිතට සහනයකි.

'මොනවද හිතුවේ.'

'අපි ගැන.. ඔයා ගැන.. අපි දෙන්නගේ අනාගතය ගැන..'

වායා සසල වී ගියේ දෙනුවන් තවත් විශාල කරගත්තාය.

'ඒ අනාගතය හීනයක් අසංක.. හීන ගැන උදේ වෙද්දි අමතක

WWW.EXPRESSLANKA.TK 435

කරන්න.. ඒවා හැබෑවෙන්නෑ කවදාවත්..’

‘මම මගේ හීනේ කොහොම හරි සැබෑ කරගන්නවා. මට ඔයා එක්ක කතා කරන්න ඕන.. මෙහෙම බෑ.’

‘මොනවද මේ කියන්නේ.. කෝ මට බැංකුවට යන්න ඕන.’

චායා අසංකගෙන් මිදෙන්නට ගියේ ඔහු කියූදේ ගැන වැඩිදුර නොසිතාය. අනාගතය ගැන බලාපොරොත්තු ඇති කර ගැනීම ඔහු හිතනා තරම් පහසු නැත.

‘බැහැ.. ඉන්නවා ඔහොම..’

අසංක සැරෙන් කීවේය. ඔහුට සැර මුහුණක් ගත නොහැක. ගත්තද එය විසුළු ස්වභාවයක් ගනී.

‘මොකද හිනාවෙන්නේ..’

‘ගෙරෙව්වට කොටියෙක් වෙන්න බෑ.. ඔයා ප්ලංචි මුව පැටියෙක්..’

‘හරක් පැටියෙක් වෙන්න බෑ මට.. විහිළු නෙවේ බබා.. හැමදෙයක්ම කට ළඟට ඇවිත්.. මාව විශ්වාස කරන්න.. අපි තීරණයක් ගන්න ඕන.’

චායා අසංක පැළඳ උන් ටයිපටිය වඩාත් සුන්දර ලෙස සකස් කළාය.

‘තවත් බලාපොරොත්තු ගෙනත් අඩුක් කරන්න එපා දෙයියනේ.. මාත් අමාරුවෙන් ඉන්නේ.. හිතාගෙන ඉන්නේ වෙන දෙයක් ගැන හිතනවා කියලද... කැවත් බිව්වත් නැවත් නිදාගත්තත් හිතෙන්නේ ඔයා ගැන.. එහෙම හිතක් හදාගන්න හරි අමාරුයි.. තේරුණාද.. ඊයේ රෑ මිස්ලගේ ගෙදර ගියාද..’

‘ඔ..වි.. උන් මාව කන්න හදන්නේ.’

‘මාව හම්බඋනේ නැත්නම් එහෙම හිතෙන්නේ නෑනේ නේද..’

‘නෑ කමයි.. එහෙනම් මේ මගේ දෛවය කියලා හිතල ඒක බාරගන්නවා.’

අසංක දිග සුසුමක් පිට කර කීවේය.

‘හුඟක් එහෙම හිතනවා.. [illegible] මෙහෙම [illegible] අපි නාඩමු..

WWW.EXPRESSLANKA.TK 436

හමුවෙමු මතු මතු ආත්මයේ.. නේද.'

'ඔයා මට හිතාවෙනවද..'

'අඩන්න බැරිකමට හිනාවෙන මේ කෙල්ල ගැන එහෙම හිතන්න එපා රත්තරං.. මං ජීවත්වෙයිද දන්නෙත් නෑ.. අමාරුයි.හරි අමාරුයි.. ඒත්.'

'මේ කෙහෙල්මල් ඔෆිස් එකක් එක්ක මට නිදහසක් නෑ.. ඔයාට නිදහසකුත් නෑ.. මට දවසක් ඔයත් එක්ක ඉන්න ඕන..'

'ඉමු.. මමත් ආසයි.. අන්තිම වතාවට කියලා හිතාගෙන.. මම ආසයි.. කවදද..'

'ළඟදීම.. අද හරි හෙට හරි.. ජීවිතේ වැදගත්ම තීරණේ ගන්න මම යන්නේ.'

'බය කරන්නෙපා මහත්තයෝ.. මට ඒගන්නවත් බැරිවෙයි.'

අසංක ඇයව හිරකරගෙන උන් දෙපාතවත් තදකළේය. ඇය වඩාත් මෘදු ලෙස ඔහුගේ වතට බරවූවාය.

'මේ වීක් එන්ඩ් එකේ නිලංකලගේ ගෙදර කට්ටිය නුවරඑළියෙ ට්‍රිප් එකක් යනවලු.. මටත් කතාකළා.. මාත් යන්නද..'

ජීවිතයට පෙනි පෙනී අහිමිවී යන ඔහුගෙන් තවත් කුමකට ජීවිතයට විවරණ ගන්නවාදැයි වායා හිතුවේ නැත. තවම ඔහු සමුගෙන බව.. තමා ඔහුගෙන් සමුගන්න බව හදවතට දන්වා යවා නැත.

'යන්නම ඕනද..'

'එපා කියනව නම් නොයා ඉන්නම්.. මටත් හිත නිස්කලංක කරගන්න ඕන සර්.. හිත හරියට අවුල් වෙලා.'

අසංක ඒ සුන්දර මූහුණ දෙස බලාගෙන කල්පනා කළේය. නැත.. ඇය අහිමිවියයුතු නැත. කෙදිනකවත් එසේ වියයුතු නැත. මේ සඳ පායා තිබිය යුත්තේ තමාගේ අහසේමය.

'යන්.. මාත් එන්නම්..'

'නිලංකත් කිව්වා.. ඔයාටත් කියමු කියලා.'

'මං සිකුරාද හවසම යනවනම්.. අපි සෙනසුරාද ඈ හම්බවෙමු..

WWW.EXPRESSLANKA.TK 437

එදට හැම දෙයක්ම කතාකරලා ඉවර කරමු.. එක්කෝ අපි එකට ජීවත්වෙමු..'

එසේ කියා අයංක දැඩිව ඇගේ ගෙළ අල්ලාගත්තේය.

'නැත්නම්..'

වායා මිමිණුවාය.

'නැත්නම් එකට මැරෙමු..'

වායා කතා කළේ නැත. ඔහු වෙනුවෙන් ඇයට මිය යා හැක.. එහෙත් ඔහු මියයනු ඇයට බලා සිටිය නොහැක.

'අපි කොහෙද රෑ කතා කරන්නේ.'

'බබා රෑට මං ගාව ඉන්න.. මං හොටෙල් එකක් බුක් කරන්නම්.. ඇයි බයද..'

වායා ගේ ඇස්වල කඳුළු මතුවිය. ඒවා ගලාගියේ නොදැනුවත්වමය.

'ඔයාට ආදරේ කළේ එක රෑයක් නෙවේ ජීවිතේ උදාවෙන හැම රෑකම හැම ආත්මයකම ළඟ ඉන්න.. මේ කෙල්ල ගැන එහෙම හිතන්න එපා පැටියෝ..'

වායා වෙව්ලා ගියාය. ඇය දෙනෙත් මිරිකා ගත්තේ ඒ තරමටම කඳුළු දෙනෙතින් ගලායමින් තිබූ නිසාය.

'අපි රෑට කොහෙද ඉන්නේ.'

'මං දන්න හොඳ හොලිඩේ බංගලාවක් තියෙනවා.. කානේෂන් මල් වත්තක.. එතන හොඳයි..'

'තිලංකලගේ ගෙදර අය මොනාහරි හිතයිද..'

'හිතුවත් මොකද.. අපි බඳින්නනේ යන්නේ.'

වායාට කිසිවක් සිතාගත නොහැක. ඔහු අද කතා කරන්නේ වෙනද මෙන් නොවේ.

'මූකුත් ඕන් නෑ.. මට සීතලට මේ පපුවට වෙලා රෑට ඉන්න තියෙනව නම්..'

අයංකගේ [illegible] ගත්තාය.

WWW.EXPRESSLANKA.TK 438

"අ..සං..ක.."

"ඇයි බබා.."

"ආයි අපි දෙන්නට කවදා එකතු වෙන්න වෙයිද දන්නෑ.. එදට මගේ තියෙන හැම දෙයක්ම ගන්න.."

අසංක ඇගේ හිස අතගෑවේ ආදරයෙනි.

"මට ඕන ඔයාව බබා.. ඔයාගේ ජීවිතය.."

"අපි මෙහෙම ලංවෙලා ඉමු හොඳේ.. මුළු රෑම ඇහැරිලා.."

අසංක කිසිවක් කීවේ නැත. මේ මල හදවත් නටුවෙන් කඩා වීසිකර දැමිය නොහැක. තීරණයක් ගතයුතුය. නුවරඑළියේ සීතල රාත්‍රිය ඒ තීරණය ගන්නට මීටත් වඩා හදවතට බල කරනු ඇත.

"මාව දන් අතාරින්න ර..ත්..තරන්.. නුවරඑළියෙදි ඇති තරම් බඳගන්න."

වායා ඔහුගේ දෙඅතින් මිදී කීවාය. අසංක ඇය දෙස බලා උන්නේ අතිශය පවිත්‍ර ලෝබකමිනි.

WWW.EXPRESSLANKA.TK 439

# 43

අසංක පන්සල් ගියේ තනිවමය... ඇඳගෙන උන් බතික් සරමට උඩින් සුදු කමිසයක් දමාගෙන ඔහු වාහනයට නැග්ගේ පන්සල් යන්නට සිතාගෙන නොවේ... හිත ඒ තරමටම අවුල්ව අවතැන්ව තිබූ නිසාය...

එහෙත් වාහනය ඉබේටම මෙන් පැදවූනේ බෙල්ලන්විල රජමහා විහාරය දෙසටය... කලින් සිතාගෙන ආවාක් මෙන් ඔහු කිසිවක් නොසිතාම පන්සල ඉදිරිපිට වූ විශාල පොල් ගස් හෙවණයට වාහනය නැවැත්වූවේය... රෑ අඳුර කපාගෙන පන්සල දෙසින් ගලා එන ලා කහපැහැති විදුලි පහන් එළිය අයංකාගේ හදවතට ගෙන ආවේ මෘදු හැඟීමකි....

ඔහු වාහනය තුළම පාවහන් ගලවා දමා ඉන් බැස්සේය... පන්සල් යා යුත්තේ තමා නොව තම සිත බව ඔහු දැන උන්නේය... මෙතුවක් අතතින් මෙතනින් පමණක් ගිනි ගත් හදවත දැන් මුළුමනින්ම ගිනි ගන්නට පටන් ගෙන ඇත.

පන්සල අද්දරම වූ කුඩා මල් කඩයකින් ඔහු සුදු නෙළුම් මල් පොකුරක් ගත්තේය.. පසුව පාර පැන හුදෙකලාවේම විහාර බිමට අසංක ඇතුළු විය... ජීවිතේ තමා අසරණ වූ තරම් වනේ වන හතුරෙක්වත් අසරණ නොවේවායි ඔහු පැතුවේය...

ජීවත් විය හැක. එහෙත් ජීවත් වීමට හිත හද ගැනීම දුෂ්කරය අයිරුය... උපන් ගම් බිම් අහිමිවූ සරණාගතයෙකු මෙන් අසංකද උන්නේ අනාථවීය... වැවකම පිපුණු නෙළුම් මල් කඩා පූජා කළද... පත්සල් හතක අඩුහාර දහසේ පහන් පින්කම් කළද මේ අනාථ වූ සිත හදගත නොහැකි බව ඔහු දන උන්නේය...

බෝ මළුවේ සුදු වැලි බිමේ දෙපා ගැටෙද්දී අසංකට වායාව සිහිවිය... මෙවන් රැයක ඇය තමා ළඟ උන්නානම් කියා ඔහුට සිතුණි... ජීවිතය පැල් බැඳගෙන පතන්නේ මහ මෙර නොවේ. එවැනි අහිංසක ඉල්ලීමිය... දෛවය නොදෙන්නේද ඒ ටිකමය...

බෝ මළුව තරමක් පාළුවට ගොස් තිබුණි.. අසංක මල් ආසනය මත මල් තබා බුදුකරුණා නෙත් සහල දෙස බලාගත්වනම බලා උන්නේය... ආදරය කිරීම පවක් දැයි ඔහු බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න කළේය.... ආදරය තරම් අවංකව පවිත්‍රව කළ යමක් තම ජීවිතයේ නැත. හදවතේ හත් අට පොළක් අතගා බැලුවද ඉන්නේ ඇයම පමණි...

සාරා සංඛෙයිය කල්ප ලක්‍ෂයක් පෙරුම් පුරාගෙන පතාගෙන ආ යශෝධරාව අන්තිම ආත්මයේදී දමා ගියේ කෙලෙසදැයි ඔහු සිදුහත් ඇස් දෙක දෙස බලාගෙන ඇසුවේය. හදවතේ මුල් වලට දනුණ එවන් ආදරයක් ඈත් කළේ කවර හිතකින්දැයි ඔහු ඇසුවේය...

උප නුපන් හැම ආත්මයකදීම වායා තමා අසළම සිටින්නට ඇතැයි ඔහු සිතුවේය.... එහෙත් පතාගෙන ආ සෙනෙහසකට මේ ආත්මයේ ළඟ රැදෙන්නට නොදෙන්නේ ඇයිදැයි ඔහු ඇසුවේය...

ටික වේලාවකට පසු අසංක බෝ මළුවේ පාළු තැනකට පැමිණ සුදුවැලි බිම හිඳගෙන සුදු බැම්මට පිට තබා ගත්තේය.. ලා කහ පැහැගත් විදුලි එළිය වැටුණු කුඩා බෝ පත් පවා සෙලවුණේ අප්‍රමාණ දුකකින් යැයි ඔහුට සිතුණි...

අසංක උන්නේ දැඩි තීරණයෙකය. වායාව කෙසේ හෝ හිමි කර ගන්නට ඔහු සිතාගෙන උන්නේය... ඒ තීරණය ගන්නට ඇති එකම බාධකය අම්මාය.. තමා වයා සමඟ විවාහවී සතුටින් සිටිද්දී අම්මා සිත හද ගනු ඇතැයි ඔහු සිතුවේය.. හර්ෂණී සමඟ විවාහ වුවහොත් තමාට කිසිම දිනයක හිත හද ගැනීමට බැරි වෙන බව අසංක දන

WWW.EXPRESSLANKA.TK 

උන්නේය... විවාහ ජීවිතය නම් වූ කාන්තාරයේ තෙතමනයක් නැති ගැහැණියක් සමඟ අනාථ වෙනවාට වඩා සදකාලිකවම තනිකඩව සිටින්නට අසංක සූදානම්ය.. කිසිවක් කර කියා ගත නොහැක්කේ අම්මා නිසාය...

අසංක බෝ මළුවෙන් නැගිට්ටේ එය බැතිමතුන්ගෙන් ටිකෙන් ටික හිස්වී පාළු වී ගිය විටය... පාන්දර වන තුරුම ඔහුට බෝ මළුවට වී සිටින්නට සිත්විය... බෝ පතක වැලි මළුවක බුදු කරුණා නෙත් දහරක ලොව්තුරු බව දැනෙන්නේ ජීවිතයම ප්‍රශ්න වලින් පිරී ඉතිරී ගිය විටකය...

අසංක පන්සලෙන් නික්මී ආවේ ගියාටත් වඩා හිත බර කරගෙනය. එසේ නමුදු ඔහුගේ සිතට එක සහනයක් දැණුනි... ඔහු සිතාගෙන උන්නේ තමා තීරණයක් ගත්තා කියාය. එය වෙනස් නොකරනවා කියාය...

වාහනයේ වායු සමීකරණය ක්‍රියා විරහිත කර අසංක දුම්වැටියක් දල්වාගෙන වාහනයේ පැති වීදුරුව පහත් කර ගත්තේය... බෙල්ලන්විල අත්තිඩිය මාර්ගයේ දෙපස නිදහස් කුරුළු උයනින් හමා ආ සීතල සුළං පොද ලෝබකමක් නැතුවම ඔහු විඳගත්තේය..

අසංකට ගෙදර යන්නට සිතක් නොවීය. ඔහු හයිලෙවල් පාරට වාහනය දමා, වේගයෙන් හෝමාගම දෙසට වාහනය පැදවීය...

ඒ සුදු මුහුණ එක් වරක් බලා ගෙදර යාමේ අහිංසක හිතුවක්කාර ආශාවකින් ඔහුගේ පිරිමි ළය කැවෙමින් තිබුණි...

වාහන තදබදයකින් තොර වූ නිදහස් හයිලෙවල් පාර දිගේ වාහනය වේගයෙන් පැදවිණ... චායාගෙ නිවස ළංවන්නම ඒ මූහුණ දැක ගැනීමේ ආශාව තවත් වැඩෙන්නට විය... එය නම් පුදුමාකාර ආශාවකැයි අසංකට සිතුණි... එක් රැයක් ඒ මූහුණ නොබලා නිදා ගන්නට බැරි තමා ජීවිතයේ උදාවන හැම රැයකදීම ඇයව සඳහටම අහිමි කර ගන්නේ කෙසේදැයි ඔහු සිතුවේය...

ඒ අහිමිවීම ජීවිතයට දරාගත නොහැකි මහා අකුණු පහරකි...

චායාගේ නිවසට යන කුඩා ගුරු පාරට ඔහු වාහනය හැරවූයේ තද අඳුරකින් මුළු පරිසරයම වැසී ගොස් තිබියදීය...

පුදුමයකි... [illegible] දෙස

WWW.EXPRESSLANKA.TK 442

බලාගත්වනමය. ඇයට නින්ද ගියේම නැත. යාන්තමට නින්ද යද්දී චායාට ඔහුව සිහිවෙයි. දෙවනාවක්ම නිදගන්නට ගොස් බැරිම තැන ඇය ඉදිරිපස දෙර ඇරගෙන දෙරකඩට ආවාය...

අසංකගේ වාහනය කුඩා දැල් ගේට්ටුව අසල නතර විය. වාහනයෙන් නික්මී ආ ප්‍රධාන ලාම්පු එළිය කෙළින්ම වැදුනේ චායාගේ මුහුණටය... අසංකගේ ළය පිපිරී යන්නට තරම් ආදරයක් ඇතිවිය. ඔහු මොහොතක් බලාගන්වනම බලා උන්නේය... චායා අසංකගේ වාහනය දුටුවනම හඳුනාගත්තාය.... රෑ ඇඳුමින් පමණක් වැසුනු මෘදු ලැමට ඇගේ දෑතම ගියේ ඉබේටමය. එය දත් දූත් පැලී යැයි ඇයට සිතුණි...

චායා වාහනය ළඟට දුවගෙන ගියේ පපුව හත් අට කඩකට කැඩී වෙන්ව යද්දීය... ජීවිතයේ කෙදිනක හෝ රැයක ඔහු මෙයේ එනබව චායා දැන උන්නාය...

"අ...නේ මහත්තයෝ... ඇ...යි... මේ... රෑ...."

චායා වාහනයට එබී ගැහෙමින් ඇසූවාය.... ඔහු දෙරමත තිබූ ඇගේ සුරත ගෙන දහ දෙළොස් වතාවක් සිප ගත්තේය... ඒ දෑතින් ආවේ විඳගන්නට අමාරු අපූරු සුවඳකි. එය විලවුන් සුවඳක් නොවේ. තමා මේ ලෝකයේ පෙම් කළ එකම යුවතියගේ දෑත මත පමණක් තිබූ ලොවිතුරු ආදර සුවඳකි...

"අසං..ක... ඇයි ර..ත්..ත..ර..න්..."

ඒ වෙද්දී චායාගේ දෑස තෙමී ගොස් අවසානය...

"මට නින්ද යන්නෑ මැණික... මූණ චුට්ටක් බලලා යන්න ආවේ..."

ඔහුගේ දෙනෙත් කඳුළින් දිලිසෙන අයුරු ඇය බොඳව ගිය දෑසින්ම බලා උන්නාය. තමාට මේ තරම් ආදරය කරනා තවත් කෙනෙක් කොහෙන් සොයා ගන්නදැයි චායා සිතුවාය. තුන් ලෝකයේම බැලුවද එවන් හදවතක් සොයා ගත නොහැකි වනු ඇත.

"ම...ට...ත් නි..න්...ද යන්නෑ දෙයියනේ... අනේ ඔයා එද්දි මේ මූණ මවාගෙන අතගගා උන්නේ.. ඒත් ඇයි අසංක මෙහේ ආවේ... මගේ රත්තරන්ට ප්‍රශ්න නේද..."

මං පන්සල් ගියා මැණික...

WWW.EXPRESSLANKA.TK 443

ඔහු අහිංසක කුඩා පිරිමි ළමයෙකු මෙන් කීවේය.

තවමත් ඔහු ඇගේ අත අල්ලා ගත් ගමන්ය.

'පන්සල්.... ගියා...'

'ඔව්.. බෙල්ලන්විල පන්සලට...'

'මැඩම් එක්කද...'

'නෑ තනියම...'

'අ..නේ ඇයි....'

'ජීවිතය ගැන ලොකු තීරණ ගත්තම පන්සල් ගිහිල්ලා මලක් පූජ කරන්න ඕනෙ නේද...'

වායා නිවස දෙස බැලුවාය... අම්මා ඇහැරී නැත.

'යන් මහත්තයෝ ගෙට...'

'අම්මා නිදිද...'

'ඔව්...'

'මට අම්මව බලන්න ඕන...'

'යන්...'

අසංක වාහනයෙන් බැසගත්තේය. ඔහු වායා පිටුපස ඇදුනේ ආශාවෙනි. කළුවර මිදුල මැදදී අසංක වායාගේ රෑ ඇඳුමින් නිරාවරණය වූ උරහිස සිපගත්තේය... වායා ගෙට ගොඩවුණේ ඒ හිස මුදුව පිරිමැදය. ඇගේ පපුවේ තුනී බිත්ති වෙන් වෙන්ව ගැලවී යමින් තිබුණි.

'මේ අපේ දුප්පත් ගේ..'

වායා පෙන්වූ දුප්පත්කමක් අසංක දුටුවේ නැත. ඔහු දුටුවේ පුංචි හුරුබුහුටි ආදර පියසක් පමණි.. තමා ජීවිතයේ දුටු සුන්දරම රෝස මල පිපුණේ මේ වහල යටය. සියල්ල හැරදා පැමිණ මේ ගෙදර වායාත් සමඟ ජීවත් වන්නට ඇත්නම් යැයි ඔහුට සිතුණි.

'මාව අද රෑ ඉඳලා මෙහෙ තියාගන්න...'

ඔහු සෙමෙන් කීවේය.... වායාගේ ඇස්වල තිබූ කඳුළු සටස් ගා බිමට පතිත විය.

WWW.EXPRESSLANKA.TK 444

"පුළුවන් නම් මගේ රත්තරංව මම සසුමල් කුමාරයෙක් වගේ තියාගන්නවා. මගේ අම්මත් තියාගනීවි... ඉඳගන්න මම අම්මට කතා කරන්නම්..."

අසංකව සාලයේ තනිකර වායා ගෙතුළට ගියාය.. ඔහු පුටුවේ වාඩිනොවී සාලයේ මේසය මත තිබූ වායා පාසල් තිල ඇඳුමින් සැරසී ගත් ඡයාරූපය දෙස බලා ගත්වනම බලා උන්නේය... ඒ ඡායාරූපය ගනිද්දී වායාට අවුරුදු දහතක් පමණ වන්නට ඇත... එහෙත් සුන්දරම යුවතියක් සතු සියළු කෝමල රේඛා ඒ රුවේ එදද තිබුණි. ඒ දිනවල සිටම මේ ජීවිතයට ආදරය කරන්නට ලැබුණා නම් කියා ඔහුට සිතුණි...

වායා අම්මාගේ ඇඳ මත වාඩි වූයේ අසරණකමත් අහිංසක ආශාවත් හදවතේ තෙරපෙද්දීය... තමා ආදරය කළ අසිරිමත් කුමාරයාව දෙමව්පියන්ට කුළුදුලේ පෙන්වද්දී ඕනම යුවතියකගේ හදවතේ ඇතිවන ආඩම්බරය ඇයටත් දැණුනි.

"අ...ම්..මේ..."

පද්මා උන්නේ අඩ නින්දේය...

"ඈ...යි පුතේ... මේ මහ රෑ... අදත් නින්ද යන්නේ නැත්ද...

අදනම් කොහොමටවත් නින්ද යන් නෑ.. ඇඳුමක් දගෙන එන්න... ඇයි..."

පද්මා පුදුමයෙන් ඇසුවාය.

"සර් ඇවිත්... අම්මව බලන්න..."

පද්මා පුදුම වූයේ නැත.. ඔහු කෙදිනක හෝ මේ වහළ යටට එන බව ඇය දැනගෙන උන්නාය.

"අනේ මන්ද මේ දරුවා කරන දේවල්..."

"එයා මෙහෙට එන්න ඕන කෙනෙක් නෙවේ අම්මේ..."

වායා ඇඩුම්බරව කීවාය.

"මං දන්නවා දරුවෝ..."

"ඇවිත් ඉන්න හැටි බලන්න... මං වරදක් කළේ නෑ කියලා අම්මට

WWW.EXPRESSLANKA.TK 

හිතෙයි...'

'ඔයාලගේ දෛවය මිසක්ක ඔයාලා වැරදි නෑ. පුතා යන්න මං එන්නම්...'

චායා සාලයට එද්දී ඔහු උන්නේ ඡායාරූපය දෙස බලගත්වනමය... චායා ආශාවෙන් ඒ මුහුණ දෙස බලා උන්නාය...

'ඔය පින්තූරේ ගත්තේ මී ලෙවල් රිසාල්ට් ආපු දවසේ... මං ලස්සනද...'

ඔහු කතා කළේ නැත. තවම ඔහු ඒ රූපය රසවිඳ අහවර නැත.

'කෝ අම්මා...'

'එනවා...'

චායා උන්නේ වශීවී ගිය දෙනෙතින් ඒ දෙනෙත් දෙස බලාගෙනය.

'ඇයි මැණික....'

'අද මුළු ගේම පාටයි...'

පද්මා විනාඩියක් පමණ අසංක දෙය බලා උන්නායා... ඇගේ තුන් හිතම සමතල කන්ද පැටෙව්වාක් මෙන් පිරී ගියේය... දූය නෙමී ගියේ ඉබේටමය. තරුණයෙකුගේ මුහුණේ කලාතුරකින් දකින්නට ලැබෙන පින්බර පවිත්‍ර බව ඔහුගේ මුහුණේ ඇතැයි ඇයට සිතුණි. අතිශය නිෂ්කලංක හදවතක් හිමි වූ තම දියණියගේ සිත මේ මුහුණ ළඟදී ආදරයෙන් පිටාර ගැලීම පුදුමයක් නොවේයැයි ඇයට සිතුණි.

'අම්මේ...'

අසංක දුටුවනම පද්මාට ඇඬෙන්නට ආවේ ඉබේටමය... ඇය දිග සුසුමකින් ළය පුරවා ගත්තාය.

'පුතේ...'

ඇයට ඉබේටම කියවිණි. චායාට ඉවසූ නැතිවිය...

'මං අම්මව බලලා යන්න අම්මෙ ආවෙ.'

අසංක කීයේ පද්මාගේ දෙපා ළඟ පාත්වී ඇයට වදිනා අතරතුරය. පද්මාගේ දෙනෙතින් කඳුළු හෝ ගා වැටුණි. ඇය ඔහුව නැගිට වූයේ ඒ ඇඬුම් මැදය.

'අම්මා ... ... ...'

WWW.EXPRESSLANKA.TK 446

ඔහු අහිංසකව ඇහුවේය... වායා කඳුළු උතුරන දෙනෙත් මිරිකා ගත්තාය..

'මං... මං... තරහ වෙන්නේ කොහොමද...'

'මං ආවේ අම්මගෙන් වායාව ඉල්ලගන්න... ඔයාගේ මේ රත්තරං දූවව ඇරෙන්න මට වෙන කාවවත් බඳින්න බෑ අම්මේ... අම්මා දන්නේ නැතුව ඇති.. සමහරවිට මම අම්මටත් වඩා වායාට ආදරේ ඇති... මට වායාව ඕන අම්මේ...'

ඔහු ඇඩුවේය. දූනෙකු හඬද්දී වියපත් අම්මා කෙනෙකුට බලා සිටිය නොහැක. ඔහු හඬන්නේ කුඩා දරුවෙකු ලෙසය...

'මහත්තයෝ අඬන්නෙපා මහත්තයෝ... අපි බලං ඉන්නේ කොහොමද...'

වායා අසරණව ඔහුගේ උරපතු වලින් අල්ලා මුහුණ මත දේත තැබුවාය...

'ම..ට වායාව දෙනවද අම්මේ...'

පද්මා දියණිය දෙස බැලුවේ පැලී ගිය දෙනෙතිනි.

'මගේ කෙල්ල තව ආත්ම හත අටක් යනකල් ඔයාගෙම තමයි දූනේ... ඒත්.. හිත හද ගන්න බලන්න දූනේ...'

'ඔයා මේ කෙල්ලව හදලා තියෙන්නෙ මලක් වගේ... ඇත්තටම මලක් වගේ.. මං දන්නවා... මේ සුදු අත ඉස්සෙල්ලම ඇල්ලුවෙත් මම... මම මේ අත අල්ලගන්නෙ අතඅරින්න නෙමේඅම්මේ... අතාරින්න බෑ මට ...'

ඔහු වායාගේ දුරත භක්තිමත්ව අල්ලාගෙන කීවේය. වායා දෙතොල්පට තද කර ගත්තේ තවත් ඇඬෙන නිසාය.

'මං දන්නවා ඔයා වගේ හොඳ කොල්ලෙක් තව ආත්ම හත අටක් ගියත් මගෙ කෙල්ලට ලැබෙන්නේ නෑ... ඔයාවගේ මගේ දුප්පත් කෙල්ලට කව්රුවත් ආදරේ කරන්නෙත් නෑ... ඔයාලගේ අනාගතේ මොකක්ද කියලා මං දන්නෙ නැහැ.. මට හිතාගන්නවත් බෑ.. ඒත් මගේ කෙල්ල තනි වුනත් ඔයා මගේ දුවව නාස්ති කළා කියලා මං

WWW.EXPRESSLANKA.TK 

හිතන්නේ නෑ... පුතා වගේ කෙනෙක් ලබන්න මගෙ දුව පින්කරලත් නෑ... ඔයා වගේ බෑන කෙනෙක් ලබන්න මම පින්කරලත් නෑ... අපි දෙන්නා මේ ආත්මේ පින් කරන්නම්. ලබන ආත්මයෙදිවත් ඔයා මගේ කෙල්ලව ළඟ තියාගන්න...'

පද්මා කීවේ මැඩගත් වේදනාවෙනි. මේ තරමට පසුව පිච්චී ගියේ ජීවිතයේ එකම එක දිනයකදී පමණි. ඒ චායාගේ පියා ජීවිතයෙන් සමුගත් දිනයේය. ඒ අහිමිවීම තරමටම මේ වෙන්වීමද චාවාගත නොහැක...

'මුළු ලෝකෙම එරෙහි උනාත් මං චායාව බඳිනවා අම්මේ...'

අසංක කීවේ ශක්තිමත්ව චායාගේ සුරත අල්ලාගෙනය. ඒ සුරතින් ගලාගෙන ආ ලේ පොදක් තම අතදිගේ ළයට ගලනු ඇයට දැනුණි. ඒ ආදරයේ ලේ කැටිති බව ඇය දැන උන්නාය.

'මං වගේම තවත් අම්මා කෙනෙකුට ගින්දර දීලා ඔයාලා බැඳලා වැඩක් නෑ පුතේ... ඔයාව ඔච්චර ලස්සනට හදන්න මට වඩා ඒ අම්මා දුක් විඳලා ඇති...'

'අම්මා චායාට ආදරෙයි අම්මේ....'

'දන්නවා පුතේ... ඒත්.. ඇයි පුතේ අපි තවත් මේ ගැන කතා කරල පසුව පුච්චව ගන්නේ...'

'අම්මට කියන්න චායා මම ඔයාව බඳිනවා කියලා. අපිට අපි නැතුව ජීවත්වෙන්න බෑ කියලා අම්මට කියන්න...'

අසංක චායා වෙත හැරී අසරණව කීවේය..

'අම්මේ... සර්ට බොන්න මොනා හරි...'

'අ...නේ... ඒකත් අමතක වුණා... පුතා කාලද ඉන්නෙ...'

පද්මාගේ වචන තුළ රැඳුනු මව් සෙනෙහේ උණුසුමෙන් අසංකගේ හදවත පිච්චී ගියේය. තමාට අහිමි වුවහොත් අහිමි වන්නේ ජීවිතයේ ලබන වටිනාම බිරිඳ පමණක් නොවේ. ආදරණීය නැන්දම්මා කෙනෙක්ද අහිමි වේ.

'ම...ට කන්න බෑ අම්මේ... ප්ලේන්ටියක් හදලා දෙන්න... මට තිබහයි...'

WWW.EXPRESSLANKA.TK 

පද්මා කුස්සියට ගියේ අඬමිනි. ඔහු වැනි රත්තරන් ආත්මයක් අහිමි වී යාමෙන් පසු තම දියණිය කෙසේ සිතහදගෙන සිටිනවාද කියා ඇය සිතුවාය. අදින් පසු තමාටද සිත හද ගැනීම විශාල ප්‍රශ්නයක් වනු ඇත...

'අම්මට අඬන්න එපා කියන්න බබා.. මං හැමදාම එයාගේ බෑනම තමයි..'.

'ඒක හීනයක් නම්... මගේ අම්මා ඒ හීනෙටත් ආදරේ කරයි රත්තරන්. හරියට මං වගේ... අද අපි තුන්දෙනා ඇඬුවා... මායි අම්මයි අඬන්නම්... ඒත් මහත්තයෝ ඔයා අඬන්න එපා...'

'මට මැණිකගෙ කාමරේ පෙන්නන්න...'

ඔහු කඳුළු වාවගත් සිනහවක් සමඟින් කීවේය. ඇය ආශාවෙන් සුරත දිගු කළාය.

'මගේ චූටි කාමරේ මොනා බලන්නද.. හා එන්න..'

අසංක චායාගේ කාමරයට ගොස් ආශාවෙන් වටපිට බැලුවේය. ඒ කුඩා යහන ලා රෝස පැහැගත් ඇඳ ඇතිරිල්ලකින් සැරසී තිබුණි...

'අද වගේ ඊයෙ මගේ පුංචි කාමරේට මගේ රත්තරන් ආව කියන මතකේ විතරක් මට ඇති... ඒ සුවඳ මට ඇති.. හැම රෑකම නිදි ගනිද්දි මට මෙහෙමම ඔයා බලන් ඉන්නවා මැවිලා පෙනෙයි... මේ කාමරේ ඇතුළට වෙලා මේ පුංචි ඇඳේ වැතිරිලා මං කල්පනා කරලා තියෙන්නෙ ඔයා ගැන විතරයි... මගේ හීනෙ උන්නෙ ඔයා විතරයි..'

චායා අසංකගේ වතට බරවී කීවාය...

'අපි බැන්දට පස්සෙ කොහේ ජීවත්වෙන්න ලැබෙයිද දන්නෑ. ඒත් එක දවසක් හරි මේ පුංචි ඇඳ උඩ අපි නිදගමු.. එච්චරයි මම කියන්නෙ...'

'අසංක...'

චායා වඩාත් ළංව ඒ වතට බර වූවාය.

'ඇයි මැණික...'

'එක පාරක්.. එකම එ..ක පාරක් මගේ ඇඳේ විනාඩියකට නිදගන්න. ඔය කොට්ටෙට මූණ තියලා...'

WWW.EXPRESSLANKA.TK 449

ඔහු ඒ යහනට බරවී ඇය කියූ ලෙසටම ඇගේ කුඩා තිල් රැළි දැමූ කොට්ටයට හිස තැබුවේය. ඒ කොට්ටයම සුවඳය.. ඒ සුවඳ මොන සුවඳද කියා ඔහු නොදනී.

'මට මේ ඇති... මේ සුවඳ ඇති.. හැමදාම හීනෙන් දැනෙනවා ඔයා මගේ ඇඳේ නිදාගෙන ඉන්නවා වගේ. ජීවිතය පුරාම මම මේ දවස රැකගන්නවා...'

ඇය ඒ වතට පත්වී වඩාත් පින්බර ලෙස ඔහුගේ හිස සිපගත්තාය...

'යන් මහත්තයෝ... අම්ම බලත් ඇති...'

'මං ඉක්මනටම මේ ඇඳට එනවා...'

'හීනෙන් හරි එන්න. මං බදාගෙන නිදාගන්නවා...'

'නෑ මැණික හැබැහින් එනවා..'

වායා කිසිවක් කීවේ නැත. ජීවිතය තමාට ඒ තරම්ම කාරුණික නොවන බව ඇය දනී. සිහිනයකට බාධාවක් නැත. එය අනන්තයටම බැලිය හැක. විඳිය හැක.

'තාත්තා ලස්සනට ගේ පොඩ්ඩ හදලා තියෙනවා... හරි ලස්සනයි...'

අසංක සාලයට පැමිණ පද්මාගේ අතින් තේ එක ගෙන කීවාය...

'එයා ජීවිතේම හම්බ කරලා ඔච්චරයි කර ගන්න පුළුවන් උනේ....'

'අම්මා දන්නෙ කොහොමද මං ඉතුරු තේ වලට ආසයි කියලා.'

ඔහු සිනාසී ඇසුවේය. වායා හොරැහින් අම්මා දෙස බැලුවාය...

මොනවද ඇවිත් නොකියන්නේ. පිස්සියෙක් වගේ කියවනවා.. මාත් අහගෙන ඉන්නවා...

ඔහු ඈ වෙත හැරී බැලුවේ භක්තිමත් දෑසිනි. ආදරය කරද්දී තරම් යුවතියක් අන් කිසි තැනක ලස්සන නැත.

'පුතේ දැන් ගෙදර යන්න... අම්මා බලාගෙන ඇති. දැන් රෑ එකොළහටත් කිට්ටුයි.'

'මම තීරණයක් අරගෙන අම්මේ ඉන්නේ...'

දෙදෙනාම කිසිවක් කීවේ නැත. තනිපංගලමේ ගෙදර යන ඔහුගේ හිත රිදවන්නට වායාටද ලෝබ සිතුණි.

WWW.EXPRESSLANKA.TK 450

"මං යන්නම් අම්මේ..."

ඔහු පද්මාගේ මුහුණ දෙස මොහොතක් බලා සිට පහත්වී ඇගේ වියපත් දෙකම්බුල් දයාබර ලෙස සිපගත්තේය. පද්මා ඇවිලී ගිය හදවතින් ඔහුගේ හිස අතගෑවාය... කවර ආත්මයකදී හෝ ඔහු තමාට මූණ ගැසෙන්නට ඇති බවක් ඇයට දැනුණි.

"බුදු සරණයි පුතේ.. පරිස්සමින් යන්න..."

අසංක වායාත් සමඟ කළුවරේම මිදුලට බැස්සේය. ඔහු යන අතරමඟදී ඇගේ සිනිඳු සුදු අතින් අල්ලා ගත්තේය.

"දැන් රෑ වෙලා රත්තරන්... ගෙදර යන්න හොඳේ... මැඩම් බලන් ඇති... මගේ හොඳ පැටියනේ..."

"මේ මූණ දකින් නැතුව ගෙදර යන්න බැරුව ඉන්නේ..."

වායා ලෝබකමින් ඒ මුහුණ දෙස බැලුවාය. මෙවන් රැයක ඔහුව ගෙදර තබා ගන්නට හැකිනම් ...

"මොකද එළුපැටිය කැරකෙන්නේ..."

සනවා ගත් මදහසින් ඇය ඇසුවාය. ඔහු ඉල්ලන්නේ මොනවාද කියා ඇය දනී..

"මං දන්නවා, අම්මට පේනවා... හෙට දෙන්නම්..."

"බෑ... මෙතන කළුවරයි අම්මට පේන්නේ නෑ...."

වායා කළුවර මැද දෙපතුල් වලින් ඉස්සී ඔහුගේ ගෙලත් නළලත් දෙකම්මුලත් සිප ගත්තාය.

"අර ඇඳට වෙලා අද රෑ නිදියගෙන හෙට උදේ යන්න හිතෙනවා."

ඔහු මුහුණ බෙරි කරගෙන කීවේය. ආශාවත් බැඳීම් සුලලිත රැලිති සේ නැගෙන නමුදු මේ දෛවයේ දියබය.. රුදුරු සාගරයය...

"යන්න මහත්තයෝ...."

"බබා නිදගන්න...."

"දැන් නින්ද යන්නෑ අසංක... ඇඳේ සුවඳ තියනවනෙ පෙරළි පෙරළි ඉන්නවා... ඉඹ ඉඹ..."

"මං යන්නම්..."

WWW.EXPRESSLANKA.TK 451

'පරිස්සමෙන් හෙමින් ඩ්‍රයිව් කරන්න.. බුදුසරණයි...'

ඔහු වාහනයට නැග්ග පසුත් ඇය දෙස ලෝබකමින් බලා උන්නාය.

'අම්මට නුවරඑළි ගමන ගැන කිව්වද...'

'හ්ම්... අම්මා නොකිව්වත් දන්නවා ඔයත් යනවා කියලා.7

චායා වාහනයෙන් ඇතුළට අත දමා ඒ වත අතගෑවාය.

# 44

අසංක යන දෙස පද්මා බලා උන්නේ චායාටත් වඩා ලෝබකමිනි.... ඔහු වැනි පසළොස්වක සඳක් කෙල්ලෙකුගේ අහසේ පායන්නේ කලාතුරකින් බව පද්මා දැන උන්නාය.... දියණිය මේ තරමටම ඔහුගේ සෙනෙහස වෙනුවෙන් පැලෙන්නට යන්නේ ඇයිද කියා පද්මා හරියටම තේරුම් ගත්තේ අද්‍ය.

ඔහු ආත්ම හතක ආදරය එක ආත්මයක එකතු කරගෙන දියණිය වෙත එන්නට ඇත... ආදරය කරනවා හැරෙන්නට එවන් පින්බර කුමරුවෙකු ළඟ කෙල්ලෙකුට කළ හැකි අන් යමක් නැත. ආදරය කළ 'යුත්තේ ඔහු වැනි තරුණයෙකුටය... ඔහු වැන්නෙකුට ආත්මය සන්තකයම පුදා වුව ආදරය කළ හැක. එහි දුකක් නැත.

පිරිමියෙකුට ආදරය යනු ජීවිතයම නොවේ. එහෙත් ජීවිතයම පුදා ආදරය කරන පිරිමියෙකු වේ නම් ඔහු වැන්නෙකුට ජීවිතයම පූජා කළද කෙල්ලෙකුට පව් නැත. දියණිය ජීවිතය පුරාම රැකගත් පවිත්‍ර වූ සියල්ල ඔහු වෙත පිදුවද එහි අරුමයක් නැත. අසංක වන් තරුණයෙකු ළඟදී සඟවා ගත හැකි කිසිවක් කෙල්ලෙකුට නැත.

චායා හැරුනේ හුල්ලමිනි. ඒ සුසුමේ හඬ දෙරකඩ උන් පද්මාට

WWW.EXPRESSLANKA.TK 452

පවා ඇසුණි. මේ කුඩා පපුවේ ඇවිලෙන්නේ ලේසි පහසු ගින්දරක් නොවන බව පද්මා දනී. ජීවිතයට සඳුන් අඳුන් අංජනයක් වූ සෙනෙහසම ගින්දරක් වෙද්දී කෙල්ලෙකුට වාවා ගත නොහැකි බව පද්මා දන උන්නාය.

පද්මා සැටියට බර වූයේ අද නින්ද නොයන බව දැනගෙනය. අද චායාද නොනිදන බව පද්මා අත්දැකීමෙන් දැන උන්නාය.

චායා පැමිණ අම්මාගේ දෙපතුල් පාමුල බිම වාඩිවී ඇගේ දෙපා බදාගත්තාය... ඇගේ දෑස තෙමී ගොස් තිබුණි.... දුවගේ කඳුළු සීතලද උණුසුම්ද කියා පද්මාට වටහා ගන්නට අසීරු විය.

'ම...ට මගේ අයංකා නැතුව ඉන්න බෑ අම්...මේ... ඉ...න්..න... බෑ...'

චායා ඇඬුවේ ඉකි බිඳ බිඳය... ඇගේ හිස අතගාද්දී පද්මාටද හැඬුණි... ප්‍රථම අහිමි වීම තම සැමියාය.. චායාගේ පියාය. දූන් දෙවන අහිමි වීමට දෛවය සූදානම්ව සිටී. එය කටුකය.. විඳවා ගැනීම අසීරුය...

'ඔ..යා.. ආදරේ කරල තියෙන්නේ කොච්චර හොඳ දරුවෙකුටද... අද ඔයාට වඩා මට ලෝබයි... එහෙම දරුවෙක් ආත්ම හත අටකට හම්බ වෙන්නේ නෑ... අනේ දෙවියෝ ඔයා දීහා බලලවත් මය දෙන්නව එකතු කරනවනම්.... '

'එයා කාගෙවත් නෙමේ අම්මේ.. මගේ... මගේම තමයි.. කාටවත් බෑ මගේ අයංකාව මගෙන් ඈත් කරන්න...'

චායා අම්මාගේ කකුල දෑඩිව බදාගෙන කීවාය... ඒ ඇගේ කඳුළින් අම්මාගේ මුළු දණහිසම තෙමී ගොස් තිබුණි.

'හිතන්න පුළුවන්ද අම්මේ මං වගේ දුප්පත් කෙල්ලෙක්ට මේ වගේ රත්තරන් කොල්ලෙක් ලැබෙයි කියලා... තාමත් මට අදහන්න බෑ.. හිතාගන්න බෑ...'

'තාත්තට පස්සෙ මං මේ ලෝකෙ දැකපු අහිංසකම පිරිමි කෙනා... මං ඔයාට වැරැද්දක් කියන් නෑ. බනින්නෙත් නෑ... ඔයා එයා මත්තෙ නැහුනත් වැරදි නෑ.... '

"එයා වෙනුවෙන් පුළුවන් තරම් කාලයක් මම බලාගෙන ඉන්නවා... ජීවිතේ නැතිවෙන්න දවසකට කළින් හරි එයා එයි කියලා මං බලාගෙන ඉන්නවා.. එයා මගේ අම්මේ..."

එක ආදරයක් වෙනුවෙන් ජීවිතයක් බලා සිටිය හැකිද... ජීවිත කාලයක් කැප කළ හැකිද... නොහැකි වුවද ඊට වඩා සාධාරණ උත්තරයක් දියණියගේ දෙවයේ නොවන බව පද්මා දනී. ආදරය අමතක කළ හැක. අතීතය ගිනිබත් කළ හැක. එහෙත් ඔහු වැනි හදවතක් අමතක කිරීම දුෂ්කරය.

වායා ඉකි ගසන වේගය කොතරම්ද යත් ඇගේ පිට මත තිබූ පද්මාගේ සුරත දෙදරන්නට විය...

"අඬලා දුන් ලෙඩක් හැදෙනවා මැණික..."

මං ඉඳලා ඉඳලා ආදරේ කළේ මෙහෙම දුක් විඳින්නද අම්මේ... අ..නේ තාත්තවත් මං දිහා බලනවනම්...

"තාත්ත හිටියනම් එයත් පැලෙයි පුතේ... එයා අපිට වඩා මිනිසුන්ගෙ සුවඳ අඳුනනවා... එයා පැලෙයි..."

"හිතට හරි ලෝබයි අම්මේ... දලා යන්න බෑ... කොහොමත් බෑ... එයාට මාව දලා යන්න කිව්වම යන්නෙත් නෑ.. ඔය පේන් නැද්ද අද... එහෙම ගියා නම් කොහොම හරි හිත හදා ගන්නවා... මං හරි අසරණයි අම්මේ..."

"මං දන්නවා පුතේ... අද ඔයා විතරක් නෙමේ මාත් අසරණ උනා..."

ඔහුගේ වැනි ආදරයක් හිතේ තබා ගැනීම පන්සලක්... රජ මහා විහාරයක්... හිතේ තබා ගත්තා හා සමානය. ඒ පින්බර වත්කම් අහිමි වීම යුවතියකට දරා ගත නොහැක.

තමා නැති දවසක දියණියගේ අනාගතයට කුමක් වේද යන්න සිතද්දී පද්මාගේ ඇතුළු හදවතම දැවී ගියේය. ආදරයේ සියළු වත්කම් අහිමි වූද මේ ජීවන වාලුකාවේ දියණිය තනිවෙනු ඇත. එවන් දවසක මෙහෙමවත් ඇය ළඟ තබාගෙන සනසන්නට රැකබලා ගන්නට ඉන්නේ කවුද... කිසිවෙකු නැත.

WWW.EXPRESSLANKA.TK 454

ආදරය මේ තරම් දුර බලාපොරොත්තුවක්ව දියණියගේ ජීවිතයට වැඩියේ ඇයිදැයි පද්මා දුක්බරව සිතුවාය. දැන් හිතා පළක් නැත. ආදරයේ මල් පෙරහැර හත් අට වටයක් දියණියගේ හදවතේ සක්මන් කොට හමාරය. ඔහු මල් පෙරහැරක් නොවේ. හදවතේ වීදි සියල්ල එකවර එකළු කළ සධාතුක කරඬුව ගෙන වඩින රන්දේලි පෙරහැරකි.

'සමහර විට ඔයා නොහිතන විදියට එයාව ඔයාට අයිති වෙයි...'

පද්මා කීවේ බොළඳ ලෙය ඇගේ හිතත් රවටාගෙනය. එවන් හිමිවීමක් ජීවිතයේ ඇත් නම් එය පුදුමාකාර හිමිවීමකි. එවන් එක් හිමිවීමක් වෙනුවෙන් ජීවිතයේ සියල්ල නැති වූවද කම් නැත.

'සර් හිතන්නෙත් එහෙම... කොයි වෙලාවක හරි එයා මැඩම් එක්ක මේ ගැන කතා කරයි. මට බය එදා ඉඳලා මට ඒ මූණවත් බලාගන්න බැරිවෙයි කියලා. එහෙම වුනොත් ජීවත්වෙන්නේ කොහොමද අම්මේ...'

'ඒත් මං එක දෙයක් දන්නවා පුතේ...'

පද්මා දියණියගේ හිස තමා අසලට ගෙන කීවාය... වායා අම්මාගේ උකුලට ගුලි වූවේ දෙනෙත් පියාගෙනය.

'මොකක්ද අම්මේ...'

'එයා නිසා ඔයාට දුකක් විඳින්න උනොත් ඒ එයා නිසා නෙමේ. ඔයාගේ කරුමය නිසා...'

'මං දන්නවා අම්මේ.. ඒකනේ මම සර්ව කාවදවත් වෛර කරන්නේ නැත්තේ... අනේ එයාට බලාගන්න කියලා මැඩම් මට කියනවානම්...'

පද්මාගේ හිතම දැවී ගියේය. එය යුවතියකගේ බොළඳ ආශාවකැයි සිතා අහක දැමිය හැකි දෙයක් නොවේ... ආදරය යනු රැකබලා ගැනීමය... හොවා ගැනීමය... ජීවිතයෙන් කෙල්ලෙක් පතන්නේ ඒ දේ පමණී.

'මැඩම් මට මේ තරම් කරුණාවන්ත කෙනෙක් නොවුන නම් මං සමහර වෙලාවට එයා කියන දේකට කැමති වෙලා යනවා. ඒත්

අම්මේ ඒක කරන්න බෑ... මැඩම් මට සැළකුවේ සේවිකාවකට වගේ නෙමේ. අදත් මට හිතෙන්නේ මම ලොකු වැරැද්දක් කළා කියලා. කවදහරි මම මැඩම්ගේ කකුල් දෙක අල්ලලා වැඳලා කියනවා මට සමාවෙන්න කියලා... මං දන්නවා මැඩම් මට සමාව දෙයි. මට බය ඒ දේ කරන්නවත් මට ඉඩක් නොලැබෙයි කියලා... ඉක්මනටම එයාව හොරු අරගෙන ගියා වගේ මට නැතිවෙනවා.'

ආදරයේ අධිපති දෙවියන් ආදරය කරන්නට උගන්වන ගමන්ම ආදරයේ දුක වටහා ගන්නටද උගන්වනවානම්... එසේ නම් අහිංසක හදවත් වලට මේ තරම් ගින්දරක් නැත. එහෙත් මින්දද මල් හී සර වලින් තුවාලවූ පසුවත් හුදෙකලා වූ පසු ආදර දෙවඟනට ඒ බව අමතක වී යයි.... ආදරයේ දෙවිඳුන් මල් අත්හරින්නේ පෙම්වතුන්ගේ ආලිංගන පිරුන සඳළුතලාවලට පමණි. ඒ ආදරයේ ගින්දරින් දුක් වන අසරණයින්ගේ තනි යහනට ඔවුන් ගොඩවෙන්නේ නැත.

ආදරයේ දුක මේ තරම් කටුක වන්නේ ඒ නිසාය.

'දැන් නිදගන්න පුතේ... අපි පන්සල් ගිහිල්ලා බෝධි පූජාවක් හරි තියලා කියමු...'

'ඔව්... අම්මේ... මටත් දැන් ඉතුරු වෙලා තියෙන්නේ එච්චරයි... මං වගේ කෙල්ලෙක් දිහා බලන්නේනැත්නම් මං පුංචි කාලේ ඉඳලා පූජ කරපු මල් වලට මොනවද අම්මේ උනේ....'

වායා කියන්නේ ඇත්තය... ඇගේ අතින් පින් මියක පවක් සිදුව නැත ඒ පින් මහිමය ආදර වන්දනාවට පරමල් වූයේ ඇයිදැයි කිසිවෙකු නොදනී...

'මං නිදගන්න යනවා අම්මේ.....'

වායා බිම ඉඳගෙන අම්මාට වැන්දය. දුව හිටිහැටියේම තමාට වඳින්නේ හදවතට මහා දුකක් දැනුණු මොහොතට බව පද්මා දනී. ඔහු හැරුණු කොට ඇගේ ජීවිතයට ඉන්නේ තමා පමණි.

වායා ඇඳමත වාඩිවී අසංක හිය තබාගත් කොට්ටය ගෙන මුහුණට තබා සිපගත්තාය... ඔහුගේ සුවඳ තැවරුණු කොට්ටය තෙත් විය. ඇය එහෙමම ඒ කොට්ටය මුහුණට තබාගෙනම ඇඳේ

අපිළිවෙලට ඇලවුණාය...

"හැමදම මේ ඩූවදත් අරගෙන හිතෙන්වත් මං ගාවට එන්න මහත්තයෝ..." වායා අසරණව කීවාය...

× × × × × × × × ×× × × × × × × × × × ×

තම පුතුගේ ඇවතුම් පැවතුම් වල මහා වෙනසක් සිදුව ඇති බව රණතුංග මහත්මිය ඉවෙන් මෙන් වටහා ගත්තාය.. ඔහු මාස ගණනාවක සිට ඉන්නවාට වඩා තිහඬය. සිනාසුනද සිනාසෙන්නේ අඬන්නාක් මෙනි.

පාසලට ඇතුළු කළ ප්‍රථම දිනයේ පාසල් ගේට්ටුව අසළ සිට දුකගත් ඔහුගේ සුන්දර මුහුණ ඇයට සිහිවිය. අසරණකමත් අහිංසකත්වයත් එකට කැටි වූ ඒ මුහුණ තවමත් ඉඳහිට ඇයට සිහිවෙයි.

"අම්ම මාව දාල යන්නෙපා... ඉස්කෝලේ ළඟ ඉන්න... මට ඔයා නැතුව පාළුයි..."

ඒ වදන් රණතුංග මහත්මියට සැනින් සිහිවිය. ඇගේ දෑසම තෙත්ව ගියේ නොදැනුවත්වමය.

ජීවිතයේ සියල්ල අනන්තයටම දරාගන්නට සමත් වූවේ ඒ අහිංසක මුහුණ දෙස බලාගෙනය. බොහෝ දේ අහිමි වී ගිය අතීතය ගැන නොතැවුණේ තමා සන්තකව ගැමුණු කුමාරයෙකු වන් පුත් රුවනක් සිටි නිසාය. රණතුංග මහත්මිය අසීරුවෙන් ජීවිතය දරාගත්තේ අසංක නිසාය.

රණතුංග මහත්මිය සෑහෙන කාලයක් අසංකට තනියම සිටින්නට ඉඩ දුන්නාය. ඒ කරුණු දෙකක් නිසාය. එකක් තමා ගොඩ නැගූ ජීවිතයේ සම්පූර්ණ සතුට ඔහුට විඳින්නට දෙන්නටය. අනෙක වේලාසනම ඔහුගේ විවාහය පිළිබඳව ඇය තීරණයක් ගෙන උන්නාය. හර්ෂණී විවාහ වන වයසට පැමිණෙන තුරු රණතුංග මහත්මිය අසංකට ඇතිතරම් නිදහස දුන්නාය. ජීවිතයේ දුෂ්කරම සමයක තනිවූ තම ජීවිතයට සරණක් වූයේ අයියාය. ඔහුවෙනුවෙන් අසංකව හර්ෂණීට

WWW.EXPRESSLANKA.TK 457

දෙනාවා ඇරෙන්නට වෙන කළ හැකි යුතුකමක් ඇය දන උන්නේ නැත.

කවදා හරි මගේ කෙල්ලව මේ කොල්ලට දීපු දවසට මම නිදහස්. එදට සුදු පුතා මගේ බිස්නස් ටිකයි මගෙ කෙල්ලවයි බලාගනීවි..

අයියා ඒ කතාව කීවේ වරක් දෙවරක් නොවේ. ඒ යුතුකම එහෙමම ඉටු කිරීමට රණතුංග මහත්මිය දිවි හිමියෙන් කැප වූවාය..

තම පුතාට වඩාත්ම ගැළපෙන බිරිඳ හර්ෂණී නොවන බව රණතුංග මහත්මිය දනගෙන උන්නාය. ටික කාලයකින් පසු හර්ෂණී අදහාගත නොහැකි ලෙස වෙනස් යුවතියක් වූවාය. රණතුංග මහත්මියට බියක් නොදනුනේ ඇය සියල්ල මැදත් අසංකට ආදරය කරනැයි සිතූ නිසාය. බොහෝ අඩුපාඩු කම් ආදරය නම් වූ විශාල රැහැනෙන් බැඳ තබාගත හැක.

මේ ජීවිත දෙකට තුදෙකලාවේ ගමන් යන්නට ඉඩ දිය යුතු නැතැයි ඇය තීරණය කළේ අදට වසරකට පමණ ඉහතදීය. ඉක්මනින්ම දෙදෙනාගේ විවාහය සිදුකිරීමට ඇය තීරණය කළේ ඒ නිසාය.

මාස ගණනාවක සිට තම පුතුගේ මුහුණේ ඇති වෙනස වටහාගන්නට රණතුංග මහත්මිය අපොහොසත් වූවාය. දින කිහිපයක සිට ඔහු ඉන්නේ හෙණ වැදුණු ගහක සිටි කුරුළු පැටවෙකු සේ කම්පනයට පත්වීය.

තනිකඩ ජීවිතයේ අවසාන දින කිහිපය ගෙවන අසංකගේ හැනීම් මුළුමනින්ම හර්ෂණී මත පිහිටුවා වටහා ගත නොහැකි බව ඇය දන්නීය. හර්ෂණී පිරිමි දරුවෙකුගේ ආත්මයක් සසල කළ හැකි යුවතියක් දැයි ඇය සිතුවාය. අසංක වෙත වූයේ පුදුමාකාර ගතිගුණය. එක කාලයකට පසු ඔහු අත ඕන තරම් මුදල් තිබුණි. එහෙත් සල්ලිකාර පැළැන්තියේ පිරිමි දරුවන් මෙන් ඔහු ප්‍රමාණය ඉක්මවා නාස්ති වූ දරුවෙකු නොවේ. අසංක ඉඳහිට බියර් එකක් මත්පැන් ටිකක් සිගරට්ටුවක් බොන බව රණතුංග මහත්මිය දනී. එය විශාල වරදකැයි ඇය නොසිතුවාය. ඒද නාලක වැනි අහිංසක මිතුරෙකු සමඟ පමණි. එතනින් ඔබ්බට කාලකන්නි ජීවිතයකට පුතා තල්ලු වී ගියේ නැත. ඇයට තිබූ එකම සැනසීමත් එය පමණි.

කොහේ ගියද ඔහු රෑ නමයට කලින් ගෙදර ආවේය. රෑයක් දෙකක් නිවසින් පිට නොදන්වා ඉඳීම පිරිමි දරුවන්ගේ සාමාන්‍ය වරදකි. එහෙත් ඔහු ඒ වරද නොකළේ තමා මේ විශාල නිවසේ තනිවන බව දන්නා නිසාය. අමාරුවෙන් තෝරාබේරා ගත් ජීවන වටිනාකම් ටිකක් ඔහුට තිබුණි. ඔහු ඒ වටිනාකම් මත පිහිටා ජීවත් වූවේය.

මිනිසුන්ගේ දුකේදී තෙත්වන පපුවක් ඔහුට විය. ඔහු කෑමටික කන්නේ ගෙදර ඉන්න වැඩ කාරයෙකුගෙන් පවා කෑවාද කියා අසාය. පිරිමියෙකුගේ ජීවිතයේ කාරුණික හදවතක් තිබීම දුර්ලභ දෙයකි. අසංක ඒ අතින් සිතනවාටත් වඩා කාරුණිකයැයි රණතුංග මහත්මිය සිතුවාය.

රෑ සිහිනෙන් වගේ මේ සියල්ල රණතුංග මහත්මියට සිතුණි. ඇය ඇඳෙන් නැගිට සීරුවෙන් අසංකගේ කාමරයට ගියාය. ඔහු උන්නේ ඇඳේ අනිත් ඇලයට හැරී බිත්තිය දෙස බලාගෙනය. පුතු නිදි යැයි රණතුංග මහත්මිය සිතුවාය.

ඇය ඇඳේ වාඩිවී අසංකගේ බාහුවකට අත තැබුවාය. අසංක උන්නේ නිදි නැතුවය. ඔහුගේ දෑස් අධික ලෙස රත් පැහැ ගැන්වී තිබුණි.

පුතා නිදි නැති බව ඔහුගේ සුසුම් හඬින්ම රණතුංග මහත්මිය දැන ගත්තාය. රෑ දෙකත් පසුවී ඇත. මේ තරම් රෑ වන තුරු ඔහු නිදි නොලබා මොනවා කල්පනා කරනවා ඇත්ද.. රණතුංග මහත්මියගේ හදවත මහා බියකින් වෙව්ලා ගියේය.

'පුතේ... ඇයි රත්තරන්... නිදියන්නැද්ද...'

අම්මාගේ වචන වල තිබූ තෙතමනයට අසංකගේ දෑස් තෙමී ගියේය. ඔහුට ඇඬෙන්නට මෙන් ආවේය. රෑ වායා හමුවූ පසු හදවතේ ඇතිවූ සංවේගය පුපුරා ගියේ අම්මාගේ වචන වලිනි.

'පුතා... ඇ...යි...'

ඇය ඇසුවේ උගුරෙනි.

'කෝ මේ පැත්ත හැරෙන්න...'

අසංක හිස හැරවීය. ඒ ඇස්වල කඳුළුය. රණතුංග මහත්මියගේ

පපුවේ හෙණයක් පුපුරා ගියේය. මේ සද්ධන්ත ගැමුණු කුමාරයා ඇත්තේ කවර නම් විපතකද...

'ඇයි රත්තරන් අඩන්නේ...'

ඇය පැලී ගිය හඬින් ඇසුවාය.

'මූ...කු..ත් නෑ අම්මේ...'

ඔහු අසරණ ලෙස කීවේය.

'ඒත්... පුතා.. මේ...'

ඇයට ඇඬෙන්නට ආවේය.

'මට හරි පාළුයි අම්මේ...'

රණතුංග මහත්මියගේ පපුව සීතල විය... ඇය ඇඳමත තවත් එහාට වී පුතාගේ හිස තම වියපත් උකුලට ගත්තාය. අසංක කුඩා දරුවෙකු සේ ඒ ඇකයට බරවිය.

'ඔයා මොනවද මට හංගන්නේ...'

'ඕ..ව්.. මං අම්මට දෙයක් හංගනවා... මගේ ජීවිතේ ගැන මට තව හිතන්න ඕන...'

'ඔයා ඕනවට වඩා තනිවෙලා.. ඒකයි.. මැරි කළාට පස්සේ ඔය පාළුව යයි...'

'මට නිස්කලංකයක් නෑ අම්මේ... මාව ටිකක් මේ වැඩ වලින් නිදහස් කරන්න. මං ඇවිත් අම්ම එක්ක කතාකරන්නම්'

'ඇයි... පුතා කොහෙ යන්නද...'

'මං කොළඹින් ටිකක් ඈතට යනවා... දවස් දෙක තුනකට...'

රණතුංග මහත්මියට කිසිවක් හාරා අවුස්සන්නට හිත් නැත. ඒත් පුතා තමන් වෙත යමක් කියන්නට බැරුව ඉන්නා බව ඇය දැන ගත්තාය. එය බලෙන් අසාගන්නවාට වඩා ඔහුම කියනතුරු සිටීම වඩාත් හොඳය.

'කමක් නෑ.. ෂොප්එක වහලා දන්න.. මේ දවස්වල එච්චර බිස්නස් නැහේ..'

'ගිහින් ...'

WWW.EXPRESSLANKA.TK 460

අසංකගේ කතාවෙන් රණතුංග මහත්මිය ඇතුළතින් හෙල්ලී ගියාය. මෙතුවක් දවසකට පුතා එවැන්නක් කියා නැත. පුතාට කතා කරන්නට ඇත්තේ ව්‍යාපාරික ප්‍රශ්නයක් නොවන බව ඇය දනී. එය, තනිකරම ජීවිතය පිළිබඳ ප්‍රශ්නයකි.

'මං දන්නවා පුතා මෝඩයෙක් නෙමේ කියලා... හොඳද... මං ආස නැහැ ඔයා අලුතින් අවුල් වෙනවට... යන්න... ගිහින් එන්න... ගිහින් ආවට පස්සේ මට මුකුත්ම නොකියා ඉන්නවානම් ගොඩක් හොඳයි... එච්චරයි...'

ඇය පුතාගේ හිස අතගා කීවාය. අසංකගේ හදවතට දැනුනේ බලාපොරොත්තු සුන්වූ හැඟීමකි.

'ඔයා වෙනස් වුනේ ඇයි කියලා මං දන්නෑ පුතා.. ඒත් මොකක් හරි ලොකු දෙයක් නැත්නම් ඔයා වෙනස් වෙන්නේ නෑ... මං දන්නවා ඔයා හරි හොඳ කොල්ලෙක්... ඔයා මේ ගෙදරට කීලා ආවා.. ඒත් මං බැනලා තියෙනවද.. ඔයා බීලා ආපු දවසෙත් ඔයාගේ කටින් මට ආවේ ඉස්සර ඔයා ළඟින් ආපු කිරි සුවඳ... දැන් නිදගන්න. ඕනවට වඩා ජීවිතේ ගැන හිතන්නෙපා...'

රණතුංග මහත්මිය පහළට බැසගියේ දෙගිඩියාවෙනි. අසංකගේ ජීවිතයට විශාල දෙයක් සිදුවී ඇතිබව ඇයට දැනුණි. විවාහය කටේ තබාගෙන සිටින මේ මොහොතේ තනිකඩ පිරිමියෙකුට ඇති ප්‍රශ්නය කුමක් දැයි හරියට හඳුනා ගන්නට රණතුංග මහත්මියට ඉවක් තිබුනේ නැත.

එය කුමක් වුවද හෙට අනිද්දාම තමාට එය දැනගන්නට ලැබෙනු ඇත. ඇය සියල්ල දෙස උපේක්ෂා සහගතව ඉවසීමෙන් බලා උන්නාය. අසංක උඩු මහලේ කාමරයට වී සිතුවේ වායා ගැන අම්මාට දැන්මම ඇත්ත කියනවාද නැත්නම් නුවරඑළියට ගොස් ආපසු කියනවාද යන්නය.

හොඳම දේ මේ දේ අම්මාට කීමට අතරමැදියෙකු යොදා ගැනීමය. ඔහුට සිහිවූයේ නාලකය.

WWW.EXPRESSLANKA.TK 

# 45

පාර්ලිමේන්තු ක්‍රීඩාංගණය කෙළවරක වාහනය නවතා අසංක නාලක දෙස බැලුවේය. ඈත පාර්ලිමේන්තු සංකීර්ණයේ දැල්වූ කහ විදුලි බුබුළුවල මෘදු එළිය පරිසරයට සුන්දරව එකතු වී තිබුණි.

'බියර් බෝතල් දෙකත් අරගෙන බැහැපන්... මට උඹත් එක්ක ටිකක් කතා කරන්න ඕන...'

අසංක බැරෑරුම් ලෙස කීවේය. මිතුරාගේ මුහුණේ රැඳී තිබූ තීරණාත්මක බව නාලකට බියපත් කළේය. එහෙත් කවර තත්වයක් යටතේදී වුව ජීවිතයේ හමුවූ මේ ආදරණීය මිතුරාට කොන්දේසි විරහිතව යමක් දෙන්න නාලක සිතාගෙන උන්නේය.

සියල්ලටම වඩා ඔහු තුළ රැඳුන අසංක අව්‍යාජ බවට නාලක ඇලුම් කළේය. මුදල් ගැවසෙන හදවතකින් පලා යන බොහෝ සුන්දර දේ ඔහු වඩාත් සුන්දරව තුරුළු කරගෙන උන්නේය.

'උඹගෙ මූණ අද අර පාර්ලිමන්ට් එකේ දේෂාභියෝගයකට ආපු

WWW.EXPRESSLANKA.TK 462

ආණ්ඩුපක්ෂයේ ඇමති කෙනෙක් වගේ...'

නාලක හඬවතින් සැහැල්ලු වන්නට සිතා කීවේය.

'මං මගේ දෛවය කියන පාර්ලිමන්ට් එකේ ඉන්නේ.. ආණ්ඩු පක්ෂයේ නෙමෙයි නාලක.. විපක්ෂයේ... ඒකයි ප්‍රශ්නේ...'

පාර්ලිමේන්තු ක්‍රීඩාංගණය කෙළවර වූ කන්ඩියේ වාඩිවෙන අතරතුර අසංක කීවේය.

'උඹ අද හරි වෙනස්...'

'ඇත්තටම මම හරි වෙනස් තමා නාලක... මම ඉක්මනටම වෙනස් වෙන්න ඕනේ.. ඕක කඩපන්...'

නාලක බියර් බෝතලය කැඩුවේ කටිනි. ඔහු බියර් වීදුරුවට දමද්දී ඇති වූ පෙණ දෙස බලාගත්වනම බලා උන්නේය.

බියර් උගුර පහළට ගියේ මුළු ගතම සීතල කරවමිනි. නාලක අසංක දෙස අයාගත් නෙතින් බලා උන්නේය.

'මට යාළුවො ගොඩක් ඉන්නවා.. ඒත් මම ආදරේ උඹට විතරයි... උඹ අහගෙනද ඉන්නෙ නාලක...'

'මං දන්නවා අසංක... මට යාළුවෙකුට ඉන්නේ උඹ විතරයි... මං ආදරෙත් උඹට විතරයි...'

මිතුරන් දෙදෙනාම හැඟීම්බර වෙනවා වැඩියැයි කෙනෙකු මේ දෙදෙනා දෙස බලා උන්නා නම් කියනු ඇත. මිතියත්කම නම් ලෝකයේදී මිනිසුන් ඕනවාටත් වඩා අහිංසකය.

අසංක ඈත පාර්ලිමේන්තු සංකීර්ණය දෙස බලාගත්වනම උන්නේය. ඔහුගේ දෙනෙත් තද ලා රතක් විය.

'අසංක... ඇයි කොල්ලෝ...'

නාලක ඇසුවේ හෘදයාංගමවය.

'මං ඉස්සෙල්ලාම මුළු පපුවෙන්ම කෙල්ලෙක්ට ආදරේ කළේ.. ඒ වායාට... උඹට මතකද අර අපේ ෂොප් එක ඩෙකරේට් කරන දවසේ...'

'ඒ දවස අමතක වෙන්නේ නෑ අසංක මතක් කරද්දිත් හිතට සනීපයි...'

'එද උඹ මගේ මේ කරට අත තියලා දෙයක් කිව්වා.. උඹට මතකද...'

'මම ගොඩක් දේවල් කිව්වා...'

'කිව්වා.. ඒත් එක දෙයක් හොඳට පපුවට වැදුනා... එද උඹ කියපු ඒ කතාව තමයි මම එද ඉඳලා මගේ ජීවිතයේ තේමාව කර ගත්තේ..'

'මො...ක...ක්...ද..'

නාලක බියර් වීදුරුව අත තබාගෙන දෑස් ලොකු කරගෙන ඇසුවේය.

'උඹ චායාව පෙන්නලා කිව්වා... අසංක මේක හඳක්.. පුළුවන් නම් උඹේ අහසෙම තියාගනින් කියලා....'

'ඔ..ව්.. මං කිව්වා...'

'ඒක හරි සුන්දර අභියෝගයක් වුණා නාලක...එද ඉඳලා මං කළේ ආදරේ කරන එක. වෙන මොනවත්ම මං කළේ නෑ...'

'ඔව්... උඹ ලස්සනට ආදරේ කළා...'

'ආදරේ කරලම එක දෙයයි තේරුම් ගත්තේ... උඹ කියන්නෙ ඇත්ත... චායා හඳක්... නිකම් හඳක් නෙමේ පසළොස්වක හඳක්... උඹ කියන්නේ ඒ හඳට මගේ අහසින් යන්න කියලද... එතකොට මං ජීවත් වෙන්න ඕන හිස් අහස දිහා බලාගෙනද නාලක... අඳුරුම අඳුරු කළුවර අහස දිහා බලාගෙනද... කියපන් මචං...'

අසංක කියද්දී නාලකගේ පපුව දඩිං බිඩිං ගා පෙරළිනි. ඔහු කියන්නේ බොරුවක් නොවේ. යථාර්ථ සත්‍යයය. පිරිසිදු නිර්මල ඇත්තය.

'කියන්න නාලක.. හඳ නැති දවසට මොනාද කියන්නේ...'

'අමාවක...'

'අන්න හරි.. චායා නැති දවසකට ජීවිතේම අමාවක නේද.. ඒවගේ කෙල්ලෙක් ජීවිතේ ඉඳලා ගියාට පස්සේ ජීවිතේ වටේම ලයිට් දං හිටියත් වැඩක් නෑ නාලක... මට මගේ ජීවිතේම වැරදුනත් කමක් නෑ.. ඒත් මගේ ආදරේ මට දිනන්න ඕන...'

නාලක නිහඬව ඔහු දෙස බලා උන්නේය. මිතුරා එන්නට ඇත්තේ

WWW.EXPRESSLANKA.TK 

තීරණයක් ගෙන බව ඔහු පූර්ව නිගමනයකට එළඹුනේය.

'මං දන්නවා අසංක මට තේරෙනවා.. දේවදූතයා නැතුව පෙරහැර යන්නේ නෑ.. ගියත් වැඩක් නෑ... චායා වගේ කෙල්ලෙක් නැතුව උඹට හෙට ගැන හිතන්න බෑ... ඒත්...'

අසංක නාලක කියන්න ගිය දේ කියන්නට ඉඩ දුන්නේ නැත. ඔහු නාලකව අතින් වැලක්වූවේය.

'මාව අද බය කරන්නෙපා නාලක..'

'ජීවිතයේ ඇත්තට පිටුපාලා තීරණ ගන්න බෑ අසංක... ආදරේදී බොළඳ වෙන්න පුළුවන්.. ඒත් ජීවිතේ උඹ හිතන තරම් අහිංසක නෑ..'

'එ...ක පාරක්... එකම.. එකපාරක් මට ජීවිතේ ටෙස්ට් කරන්න බැරිද.. මගේ කොළ අතින් එක පාරක් මට සෙල්ලම් කරන්න බැරිද... කියපන් නාලක...'

නාලක අඩියක් පමණ ඉස්සී අසංක වෙතට ළං විය.

'පුළුවන්... උඹ ළඟ තුරුම්පු නෑ... එක තුරුම්පුවයි උඹ ළඟ තියෙන්නේ... ඒ තුරුම්පුව කා ළඟවත් නැහැ ඒත් ඒ තුරුම්පුව මදි උඹට දිනන්න..'

'මොකක්ද තුරුම්පුව...'

'උඹේ ආදරේ.. ඒ තුරුම්පුව ඇරෙන්න උඹ ළඟ තියෙන අනිත් තුරුම්පු පේරම උඹට දිනන්න මදි..'

'හොඳ සෙල්ලම් දන්න ඒකෙක් තුරුම්පු නැතුවත් සෙල්ලම් කරලා කපෝති කරනවා...'

'ඇත්ත.. ඒත් උඹට බෑ.... උඹට කපෝති කරන්න වෙන්නෙ උඹේ අම්මව... උඹ වූ දද්දි උඹව වඩාගෙන හැදුවයි කියන මාමාව... පුළුවන්ද උඹට..'

'මේක මගේ ජීවිතේ නාලක... හර්ෂණීට මාව ඕන නෑ. මං ඒක දන්නවා. එයත් මාව බඳින්නෙ කැමැත්තකින් නෙමේ...'

WWW.EXPRESSLANKA.TK 465

'ඒත් උඹලා දෙන්නව බන්දල දෙන්න අනිත් අයට ඕනෙ... මිනිස්සු තීරණ ගන්නේ පසුවේ අඩුක්කරපු දේවල් ගැන හිතලම නෙමේ අසංක...'

අසංක සිය දණහිස මත හිස ගසා ගත්තේය. නාලකට ඔහු කෙරේ මහා දුකක් දැනුණි.. ඔහු මෙසේ අසරණ විය යුතු තරුණයකු නොවේ.

'හරි... මොනවද මං කරන්න ඕන කියපන්...'

නාලක අසංකගේ හිස මත අතකබා ඇසුවේය..

'උඹ මං වෙනුවෙන් ඕන දෙයක් කරනවද..'

'උඹ මං ගැන දන්නව නේද අසංක...'

'ඒකයි මං ආවේ උඹ ළඟට නාලක.. මට වෙන කව්රුවත් නෑ...'

'හිතාගෙන ආපු දේ කියපන්... උඹ අඬනවා මට බලන්න බෑ.. උඹ හිනාවෙලා ඉන්නවා දකින්නයි මට ඕන.. ඒ වෙනුවෙන් මට මොනා හරි කරන්න තියෙනවනම් මං කරන්නම්...'

අසංක බොහෝ වේලාවකට පසු හිස එසවූවේය.

'මේ දේ ඒක කෙරෙන්න ඕන ලස්සනම විදිහට කරන්න පුළුවන් උඹට විතරයි.. මං හොඳට හිතලා මේ කියන්නේ...'

'මං දන්නවා.. වැඩේ කියපන්.. ඒක මොකක් උනත් මං කරනවා...'

අසංක දිග සුසුමකින් ළය පුරවාගත්තේය.

'අපේ අම්මත් එක්ක වායා ගැන කතා කරපන්....'

අසංක කීවේ එපමණකි. නාලකගේ මුළු පපුවම සීතල විය. ඔහු විනාඩි දෙකතුනක් නිහඬව බලා උන්නේය.

'නාලක... උඹට බැරිද.. මේ අසරණයා වෙනුවෙන්.. උඹේ අනාථ වෙච්ච යාළුවා වෙනුවෙන්...'

නාලක අසංකගේ උරහිසට අතක් තබා ඔහු දෙස බැලුවේය. ඒ දෑස්වල තිබුණේ වේදනා බර අධිෂ්ඨානයකි.

'මං ඒක උඹ වෙනුවෙන් කරන්නම්... කරන්න පුළුවන් හොඳම විදිහට කරන්නම්... පන්සලට ගිහිල්ලා පඬුරක් දාලම උඹලගේ ගෙදරට යන්නම්...'

'උඹට පින් නාලක... ගොඩාක් පින්...'

WWW.EXPRESSLANKA.TK 466

'මං යන්නේ උඹ වෙනුවෙන් විතරක් නෙමෙ අසංක, අර දුප්පත් කෙල්ලත් වෙනුවෙන්...'

මිතුරන් දෙදෙනා සෑහෙන වේලාවක් නිහඬව උන්නෝය. දෙදෙනාම සිතුවේ එකම දෙයක් ගැනය. මේ කතාබහේ ප්‍රතිඵලය කුමක් විය හැකිද යන්නය.

'උඹ හිතන ප්‍රශ්නෙට උත්තර අද මං ගාව නෑ අසංක... ඒක දෙවියන්ට බාර දෙමු...'

'පණ තියෙන මිනිහෙක් හැටියට මං ගන්න එකම තීරණේ මේක.. ඊට පස්සේ මං ජීවත් වෙන්නෙ මැරුණ මිනිහෙක් ගාණට... ජීවත් වෙන්න මිනිහෙක්ට තියෙන එකම අයිතිය ඒ මිනිහට නැති උනාට පස්සේ ජීවත් වෙන්නේ කොහොමද නාලක...'

අසංක ඇසුවේ අසරණවය... නාලක බියර් වීදුරුව පුරවා ඔහු අත තැබිය...

'වායා නැති ජීවිතයක් ගැන මට හිතා ගන්න බෑ... කොහොමටත් බෑ...'

'කොහොමටත් අම්මා එක්ක කතා කරන එක හොඳයි... උඹට එක පාරක් උඹේ දෙවියෙන් ප්‍රශ්න කරන්න පුළුවන්... ඒත් මට පොරොන්දු වෙන්න මේ කතාවෙ තීරණය මොකක් උනත් උඹ ඒක දරාගන්නවා කියලා...'

'එක දිගට වතුර නැති උනාම වෙන්නේ මොනවද කියලා අද කියන්න බෑ නාලක.. ඒක දිගටම පිපාසෙන් ඉඳිද්දී විඳලම බලන්න ඕන...'

'මං කවදද අම්මා එක්ක මේ ගැන කතා කරන්නේ...'

'මං හෙට නුවරඑළි යනවා... දවස් දෙක තුනකට.. එන්නෙ ඉරිදා හවස... උඹ ඉරිදා දවල් අපේ ගෙදර ඇවිත් කතා කරපන්...'

'වායත් යනවද...'

නාලක සැකමුසුව ඇසුවේය.

'ඔව්... එයාලා ට්‍රිප් එකක් යනවා. මං තනියම නුවරඑළි යනවා...'

WWW.EXPRESSLANKA.TK 467

'මං යන්නේ උඹ වෙනුවෙන් විතරක් නෙමේ අසංක, අර දුප්පත් කෙල්ලත් වෙනුවෙන්...'

මිතුරන් දෙදෙනා සෑහෙන වේලාවක් නිහඬව උන්නෝය. දෙදෙනාම සිතුවේ එකම දෙයක් ගැනය. මේ කතාබහේ ප්‍රතිඵලය කුමක් විය හැකිද යන්නය.

'උඹ හිතන ප්‍රශ්නෙට උත්තර අද මං ගාව නෑ අසංක... ඒක දෙවියන්ට බාර දෙමු...'

'පණ තියෙන මිනිහෙක් හැටියට මං ගන්න එකම තීරණේ මේක.. ඊට පස්සේ මං ජීවත් වෙන්නෙ මැරුණු මිනිහෙක් ගාණට... ජීවත් වෙන්න මිනිහෙක්ට තියෙන එකම අයිතිය ඒ මිනිහට නැති උනාට පස්සේ ජීවත් වෙන්නේ කොහොමද නාලක...'

අසංක ඇසුවේ අසරණවය... නාලක බියර් වීදුරුව පුරවා ඔහු අත තැබීය...

'ඡායා නැති ජීවිතයක් ගැන මට හිතා ගන්න බෑ... කොහොමටත් බෑ...'

'කොහොමටත් අම්මා එක්ක කතා කරන එක හොඳයි... උඹට එක පාරක් උඹේ දෛවයෙන් ප්‍රශ්න කරන්න පුළුවන්... ඒත් මට පොරොන්දු වෙන්න මේ කතාවෙ තීරණය මොකක් උනත් උඹ ඒක දරාගන්නවා කියලා...'

'එක දිගට වතුර නැති උනාම වෙන්නේ මොනවද කියලා අද කියන්න බෑ නාලක.. ඒක දිගටම පිපාසෙන් ඉදිද්දී විඳලම බලන්න ඕන...'

'මං කවදද අම්මා එක්ක මේ ගැන කතා කරන්නේ...'

'මං හෙට නුවරඑළි යනවා... දවස් දෙක තුනකට.. එන්නෙ ඉරිද හවස... උඹ ඉරිද දවල් අපේ ගෙදර ඇවිත් කතා කරපන්...'

'ඡායත් යනවද...'

නාලක සැකමුසුව ඇසුවේය.

'ඔව්... එයාලා ට්‍රිප් එකක් යනවා. මං තනියම නුවරඑළි යනවා...'

WWW.EXPRESSLANKA.TK 468

'ඒ කෙල්ල ඉල්ලුවොත් ජීවිතයත් දෙයි... ඒත් අසංක...'

'උඹ එහෙම කියන්න එපා නාලක...'

'මං උඹ ගැන දන්නවා මචං...'

'එක දෙයක් කරපන්... අම්මා මොනව කිව්වත් චායාව බේරගනින්.. ඒ කෙල්ල ඇත්තටම මේ ප්‍රශ්නෙදි අහිංසකයි...

ඇත්තටම ඔව් අසංක... ඒ ජීවිතේ එක්ක සෙල්ලම් කරන්න බෑ...'

අසංක චායාව මවා ගත්තේය. නැත. ඒ මල එසේ ලේසියෙන් ගිලිහෙන්නට දිය යුතු නැත. ජීවිත කිහිත්තේ ඉගාළම අත්තක ඒ මල පිපිය යුතුය. නොවේනම් පුබුදුවා ගත යුතුය.

'ඉරිදා උඹ අම්මා එක්ක කතා කරලා මගේ සෙල් එකට කෝල් කරපන්... මං ගෙදර එන්න ඕන මගේ උත්තර ටික හදගෙන...'

'උත්තර දෙන්න බැරි ප්‍රශ්නයක් අම්මා ළඟ තියනවා අසංක...'

'මං ආදරේ කරපු එක මිසක් වෙන වරදක් කරලා නෑ...'

'තීරණය මොනා උනත් ඇන්ටි මානුෂිකව මේ ප්‍රශ්නෙ දිහා බලයි කියලා මට හිතෙනවා... ඇන්ටි උඹට මට වඩා ජීවිතේ විඳලා තියෙනවා...'

අසංක ඉඳගෙන උන් කන්ඩියෙන් නැගිට්ටේ දැඩි හැඟීමකිනි. මිතුරන් දෙදෙනා පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේ ඇවිදිමින් රෑ වෙන තුරු කතා කළෝය.

# 46

නුවරඑළි බලා යන වෑන් රිය චායාගේ නිවස ඉදිරිපිට නතර වූයේ මහා පාන්දරය. චායාට පෙරදා රැය පුරාම නින්ද ගියේ නැත. ඇය ඕනාවටත් වඩා පාන්දර සිටම ඇඳගෙන බලා උන්නාය.

වාහනය ආ පසු චායා පහත්වී අම්මාටත් ලතා අක්කාටත් වැන්දාය. දියණියගේ මුහුණේ කාලයකට පසු සැහැල්ලු බවක් ඇඳී ඇතැයි පද්මාට සිතුණි. මේ මුහුණ එහෙම බලන්නට ඇය ආසා කළාය.

"ආ... මේකත් අරගෙන යන්න කෙල්ලේ... මට රෑ දෙන්න අමතක උනා.."

ලතා එතෙක් වෙලා අත තබාගෙන උන් කහපැහැ ගත් ස්වීටරයක් චායා අත තැබුවාය.

"අනේ හරි ලස්සනයි..."

"ඔය රට ඉන්න අක්කා ගෙනත් දුන්නේ..."

"අක්කේ එහෙනම් මේ දවස් දෙක තුනේ අපේ ගෙදර නිදගන්න හොඳේ..."

චායාට අම්මා ගැන දුක සිතුණි. ඇය ජීවිතයේ විඳි සතුටක් නැත. අම්මාව දමා මේ ගමන යන්නට ඇයට ලෝබය.

"අනේ පුතේ පරිස්සමින්..."

නිලංකාට පද්මා කීවේ නෙත දැසිනි.

"අම්මා බයවෙන්න එපා... මම චායාව බලාගන්නම්..."

එහෙදී තමාටත් වඩා හොඳින් ඇයව බලාගන්නට කෙනෙකු ඉන්නවා යැයි කියන්නට නිලංකාට සිතුණි.

WWW.EXPRESSLANKA.TK 470

'යන්නම් අම්මේ...'

වායා ගමන් මල්ල අතින් ගෙන වාහනයට නැග්ගාය. වාහනය තුළ වූයේ හත් අට දෙනෙක් පමණි.

'මෙන්න අක්කේ වායා...'

වාහනය පණ ගන්වද්දී නිලංකා කීවාය.

'අපේ නංගිගෙ වැඩේම ඔයා ගැන කියන එක.. මධුරිගෙ ෆිල්ම් එකක් යන්න බෑ කියවිල්ල...'

වායාට ලැජ්ජා සිතුණි..

'මේ අපේ අක්කගේ පණ... මේ අපේ නැන්දගෙ දුව... ඉතුරු ටික යද්දි කියන්නම්...'

වායා ඉඳගත්තේ වැන් රිය පසුපසම අසුනේ නිලංකා සමඟය.

'මේ පාන්දර නැවද...'

වායාගේ නෙත කොණ්ඩය දැක නිලංකා ඇසුවාය..

'ඔව්... මාව ගැහෙන්න ගත්තා... නුවරඑළියටත් සීතල ඇති නේද...'

'සීතල ඇති... ඒත් එක්කෙනෙක්ට නම් දැනෙන එකක් නෑ...'

නිලංකා කීවේ අසංකව සිහිවීය. වායා දෙනොල් පට විකාගෙන සිනාසුනාය. ඇත්තටම ඔහුත් දැන් පිටත් වී ඇත්ද...

'කොල්ලත් පාන්දරම ඇහැරිලා එනවා ඇති. මගදි හම්බ වෙයි...'

'මට බය ඔය කඳුවල හයියෙන් එලවන්න ගිහිල්ලා අනතුරක් කර ගනීද කියලා...'

'පිස්සු කෙල්ල.. සර්ට වාහනේ සෙල්ලම් බඩුවක් වගේ....'

ඔහු ගැන සිතීම නිසා පාන්දරම පිවිතුරු වී යැයි ඇයට දැනුණි. වායා නිලංකාගේ උකුලට වමත දමා ගත්තාය.

'ලස්සන පාට... රෑද ගෑවේ..'

වායාගේ නිය පැහැ ගැන්වී තිබූ ලා රෝස පැහැ ගත් නිය ආලේපනය දැක නිලංකා ඇසුවාය. ඒ අතට මොන පාට ආවත් ලස්සනය.

WWW.EXPRESSLANKA.TK 471

'රට නින්ද ගියේ නෑ... ඉතින් අරගෙන ගා ගත්තා...'

'හම්බවෙනකල් ඉවසුමක් නෑ නේද...'

'අක්කලා මොනවා හරි හිතයි නේද නිලංකා...'

'මං අක්කට හැම දෙයක්ම කියලා තියෙන්නේ... අහිංසක ආදරයකට කරන්න පුළුවන් හැම උදව්වක්ම කරයි. අක්කයි අයියයි ලව් කළෙත් ඔහොම තමයි... දැන් අම්මා කිව්වේ අක්කව මගෙ කාමරේ තියාගන්න කියලා. අයියට අර ඉස්සරහ ඉන්න එයගෙ මල්ලි එක්ක නිදාගන්න දෙන්න කියලා... උඹ හිතනවද මූත් කාමර දෙකක නිදාගනී කියලා... මේ නුවරඑළියෙ'

නිලංකා ඇසුවේ මනමාල පාටින් සිනාසෙමිනි.

'දුර යනවා වැඩියි කියලත් හිතෙනවා නිලංකා... ඒත් මම හැරෙන්නෙ කොහොමද..'

'අඩුම ගානේ කෙල්ලේ... මේ දවස් දෙකට කඳුළු නවත්ත ගනින්... ජීවිතේ හැම දවසකම අඬන්න ඕන කියලා නියමයක් නෑනේ....'

'හැම දවසක්ම හිනාවෙන්න දෙන්නෙත් නෑනේ.. එයා ගෙදර ඇවිල්ලා ගියාට පස්සේ හිතට වෙනදාටත් වඩා දුකයි..'

'සර් ලොකු තීරණයක් අරගෙන තියෙන්නේ...'

'මං දන්නවා... සමහර විට කෙල්ලේ අපි හම්බවෙන අන්තිම දවස් ටිකත් මේක වෙයි..'

වායාගේ දෑසට කඳුළු නැගුණි. ඇය දෙනෙත් අඩවන් කරගෙන නිලංකාගේ උරහිසට බර වූවාය.

පාන්දර අරුණැල්ල නුවර පාරට යංතමට වැටී තිබුණි. වායා දිගටම පාර දෙස බලා උන්නාය. ඇය පසුවන හැම වාහනයක් දෙසම පරීක්ෂාවෙන් බලා උන්නාය. සමහර විට ඔහු වේලාසනින්ම නුවරඑළියට යන්නට ඇත.

උදේ ආහාරය සඳහා වාහනය නැවැත්වූයේ පුස්සැල්ලාව කිට්ටුව සුන්දර කුඩා දිය ඇල්ලක් සමීපයේය.

අම්මා වායාට පොළොස් ඇඹුලකුත් සීනි සම්බෝලයකුත් හද

WWW.EXPRESSLANKA.TK 472

දුන්නාය. තිලංකාගේ ගෙදරින් ඉඳි ආප්පත් හාල්මැස්සන් හොදිත් තක්කාලි හොදිත් ගෙනවිත් තිබුණි.

කන්නට ගද්දී චායාට අසංකව සිහිවිය. ඔහු කොහෙන් කනවා ඇත්ද... සමහරවිට බඩගින්නේම වාහනයට වී ඔහු සිටිනු ඇත.

'ඇ...යි...'

චායා පිහාතේ ඉඳිආප්ප අතගාද්දී තිලංකා ඇසුවාය. ඇය සිනාසුනේ වේදනාවෙනි.

'සර් ගෙස්ට් හවුස් එකකින් උදේට කයි... එක්කො පේරාදෙණියෙ නවත්තයි... නැත්නම් පුස්සැල්ලාවේ රෙස්ට් හවුස් එකේ නවත්තයි...'

'පව්...'

චායාට එසේ කියවිණි. මෙය නම් පුදුමාකාර ආදරයක්යැයි තිලංකාට සිතුණි.

තිලංකාගේ සොයුරිය හොදි භාජනයත් අරගෙන තිලංකාත් චායාත් ඉඳගෙන උන් ගල් තලාව මතට ආවාය. චායා ඇය දෙස බලා සිනාසුනේ අහිංසකවය.

'සර්රුත් ආවා නම් අගේට වාඩිවෙලා ඉඳි ආප්ප ටිකක් කනවා නේද චායා නංගී...'

ඇය එය කියද්දී චායා විළියෙන් රතු වූවාය.

'සර් බඩගින්නේ ඇති කියලා චායාට කන්න බැලු අක්කේ...'

තිලංකා සිනාසී කීවාය. චායා බිම බලාගත්තාය.

'අපිත් ආදරේ කළා මෙහෙම ආදරේ කළේ නෑ... බඩගින්නේ ඉන්නෙපා නංගී... සර් මගින් කාල එයි.. දෙන්නත් එක්ක ඩිනර් එක ගන්න පුළුවන්නේ.. නංගී ඔය දෙන්නා ගැන ඇවිත් කියනවා මටත් හරි දුකයි... ඔයා දුක්වෙන්න එපා... මං නම් නංගිට කිව්වේ ඔච්චරටම ආදරෙන් ඉන්න දෙන්නෙක් වෙන්වෙන එකක් නෑ කියලා...'

චායාගේ දෙනෙතට කඳුළු පිරුණේ ඉබේටමය.

'මං කිව්වේ අක්කට.. මතක් කළත් අඬනවා මේ...'

'බබා කන්න... ඔක්කොම අමතක කරලා මේ දවස් දෙකේ සතුටින්

WWW.EXPRESSLANKA.TK 473

ඉන්නා... මොනා වුනත් සර් ඔයාට ආදරෙයිනේ..

චායා කෑවේ ඉඳි ආප්ප කුන හතරක් පමණි. ඇය තේ එකක් රැගෙන කුඩා දිය සිරාව අද්දරට ගියාය. පාවහන් ගලවා එහි දෙපා ඔබාගෙනම ඇය උන්නාය. මෘදු දෙපා නිල් වතුරින් දෙවුනේ වඩාත් සුන්දරවය.

ජීවිතය තවමත් සිහිනයකි. පාට පෙට්ටියේ සියළුම පාට ගෑ සිහිනයකි. ජීවිතයම සිහිනයක් නම් කමක් නැත. එහෙත් සිහිනයෙන් හෙට අනිද්දට විඳවන්නට සිදුවෙනු ඇත...

සිහිනය කෙළවරක් නොමැතිව විඳිනවා ඇරෙන්නට... අද දින ඒ ගැන තවත් සිත සිතා ඉන්නට චායාට හැකිමක් නැත. කොහොමත් මට අඬන්න වෙනවා.. එදාට කෑ ගගහ හරි අම්මා ගාවට වෙලා අඬනවා. ඒත් එයාට කඳුළු නම් පෙන්නන්නේ නෑ...

හෙමින් හෙමින් අවතැන් වන හදවත චායා වාව ගත්තේ එලෙස සිතාය.

බොඳවූ මීදුම් පොකුරු තවමත් කඳුමත කුට්ටි කුට්ටි පිටින් රැඳී ඇත. පරිසරය පුරාම ඇත්තේ සුදුසුදු මිහිදුම් පාටකි. එක යායට පෙනෙන තේ වතු අතරින් ඈත පෙනෙන අහස වඩාත්ම පිවිතුරු පාටය...

මේ මිහිදුම් සළු තිර අතර ඔහු හා ගත කළ දවස් කිහිපය ජීවිතයේ අවසානම මතක පොද වෙව්ව කියා ඇය වේදනාවෙන් සිතුවාය...

දෛවය එය නම්... ජීවිතයේ සියල්ලටම වඩා මේ දවස් කිහිපය මතකයේ තබා ගත යුතුය. ඉතුරු වන්නේද මෙය පමණි. ඔහුගේ ආදරයේ සුවඳ රැඳුණු මේ දවස් කිහිපය පමණි. මේ අතීතය නම් වූ සිතමා පටයේ අවසාන රසබර... දුක්බර රූප රාමුව විය හැක.

WWW.EXPRESSLANKA.TK 474

# 47

කඳුකරයෙන් සමුගෙන යන ඉරේ අවසන් ලා රත පිදුරුතලාගල කඳු වැටියේ ඉහළ බෑවුම මතට සුන්දරව වැටී තිබුණි... සීතල වඩාත් දැඩි ලෙස පරිසරයට මුසුවී තිබුණි... ඇඳගෙන උන් අත් දිග බ්ලවුසයට උඩින් ස්වීටරයක් දමා ගත්තද වායාට මහා සීතලක් නොදැණුනි.

ආදරයකදී එකම වරක් පමණක් යුවතියක් විඳින මිහිර මින්දද රාත්‍රියක් පාමුල ඉන්නා  යුවතියකට අමුතු සීතලක් දැනේන්නේ නැත. ගත හිරිවට්ටන සීතලකට පවා සීතල කළ නොහැකි මහා උණුසුමක් එවන් මොහොතක යුවතියකට දැනෙයි. එකම පපුවකින්.. එකම සුරතකින් පමණක් ඉඳුල් කළ ඇගේ නිර්මල යෞවනත්වයට ඒ උණුසුම රසබරව දැනුණි.

ආදරයේ සන්නාහ සන්නද්ධ බල සේනාවම එකවර යටත් කර ගත් හදවතක්... ඒ ආදරණීය සේනාවට එරෙහිව සටන් නොකරම යටත් වූ හදවතක්... ඒ සේනාවේ සේනාධි නායකයාට සඳ කාලිකවම යටත්ව ඉන්නට පැතූ අහිංසක මානවිකාවන් ඇගේ හදවත තුළම සිටියාය.

දෛවයේ රුදුරු පළිගැනීම් සියල්ලම මැදත් ඇගේ පපුවේ

ආදරවන්තියක සතු සුකොමළ ආදර රේඛා සියල්ලම තුදුපුත්ව තිබුණි. ඒ ඔහු වෙනුවෙනි. ඔහුම වෙනුවෙනි. පතන්නට අන් කිසිවක් නොවූ ජීවිත පූජාවේ එකම ප්‍රාර්ථනය ඔහු විය. ඇය අහිංසක යාදින්නියක පමණක් වූවාය.

ආ පිරිස නැවතුනේ නුවරඑළිය නගරයෙන් කෙළින් අතට විහිදී ගිය බදුලු පාරේ කුඩා නවාතැන් පළකය.

චායා නැවතුම් පළට ආ හැටියේම ඇඟ සෝදා ගත්තාය. යන්තම් රස්නය තිබූ වතුරින් ඇඟ සේදූ පසු හිතටත් ගතටත් දැනුනේ වෙනස්ම ප්‍රබෝධයකි.

'ඔච්චර හැඩවෙන්න එපා... කොල්ලට හරි ලෝබ හිතෙයි මොනවා වෙයිද දන්නෙ නැහැ ඊට පස්සේ...'

චායා මුහුණ පුරා ක්‍රීම් බිංදු දෙකක් ගෙන තවරද්දී තිලංකා කීවාය. ඇය ඇඳගෙන උන්නේ තුවායක් පමණි.

'මොනවා උනත් මට කමක් නෑ...'

'උඹ ආදරේ කරන හැටි දැක්කහම මටත් ආදරේ කරන්න හිතෙනවා...'

'මං ඉගෙන ගෙන ආදරේ කළේ නෑ කෙල්ලේ... මං දන්නෙ එක දෙයයි... ලෝකේ මං ආදරේ එකම එක පිරිමියෙකුට විතරයි. එයාව මට ලැබුනේ නැත්නම්...'

චායා කතාව නැවැත්තුවාය.

'ඔව්..'

'මං මේ ලෝකෙ ආයි කවදාවත් තවත් පිරිමියෙකුට ආදරේ කරන්නේ නෑ...'

තිලංකාට හීල්ලිනි. චායා ඉදිරිපිට ඇත්තේ හදවත හිරි වට්ටන සුළු දෛවයක් බව ඇය දනගෙන උන්නාය. තිලංකා හූල්ලන හඬ ඇසී චායා ඇය සමීපයට ආවාය.

'ඇයි කෙල්ලේ උඹ හූල්ලන්නේ.. මං කතිවෙනවා කියලා උඹ දන්නවා නේද...'

'අසුබ දේවල් හිතන්න එපා චායා....'

සුබ දෙයක් ජීවිතයේ සිදු නොවෙන කල වෙන කුමක් කරන්නද කියා චායා තම හදවතින් ඇසුවාය.

'ඉක්මනට ඇඳුමක් දගෙන යන් ඉස්සරහට...'

'සර් ඇවිත් ඇති නේද.. කීයටද එනවා කිව්වේ රෙස්ට් හවුස් එකට...'

'හයට..'

'උඹ ගියාම මට තමා පාළු..'

'අනේ කෙල්ලේ...'

'කමක් නෑ... මේ ළඟම ඔයයි සර්රුයි ඉන්නවනේ....'

චායා දෙඅත්ල එකට පිරිමැද අත්ල උණුසුම් ගන්වා කොපුල් මත තබා ගත්තාය. නිලංකා ඒ දැක මනමාල පාටට සිනාසුනාය.

'මොකද උඹ හිනාවෙන්නේ..'

චායා අසරණව ඇසුවාය.

'නෑ.. නිකම්..'

'අනේ කියපන්කො.. ඇයි හිනාවුනේ...'

'ඉක්මනට කම්මුල් වල සීතල යයි..'

'ඔහොම උණුසුම් කරන්න ඕන නෑ...'

'නිලංකා මට විහිළු කරනවා..'

'අනේ නෑ චායා..'

'ආදරය කොච්චර ලස්සනද කියලා අද උඹ දිහා බලන් ඉද්දී මට හිතා ගන්න පුළුවන්.. මවා ගන්න පුළුවන්...'

'ආදරේ කොච්චර දුකක්ද කියලා හෙට අනිද්ද දවසක මං දිහා බලද්දී උඹට හිතෙයි...'

'අපි එන දේකට මූණ දෙමු... මං උඹ ළඟ හැමදම ඉන්නවා... යන්...'

චායා කෙටි වරලස බැඳ තිබූ කොණ්ඩ පටිය ගලවා දමා උරහිස

WWW.EXPRESSLANKA.TK 477

දක්වා වරලස මුදා හැරියාය.. ඇගේ මුහුණේ හැබෑ ලස්සන එන්නේ ඒ වරලස එසේ දමූ විටය. ඔහු ඇයව දකින්නට වඩාත්ම ආශා කළේ එහෙමය.

තවාතැන් පළේ මිදුල පුරා තිබූ කානේෂන් පඳුර මත බතික් කානේෂන් මල් පිපී තිබුණි. ඊටත් එහායින් නම නොදන්නා කඳුකර මල් රැසක් පිපී තිබුණි. ඡායා පහත්වී කානේෂන් මලක් නෙලා ගත්තාය.

ඇගේ දෑස තිබුනේ තුරඟ තරඟපිටිය අද්දරින් වැටුණු මාවත දෙසටය. නිලංකාත් ඡායාත් පාර අද්දරටම වන්නට තිබූ පයිනස් ගසක් යටට වී බලා උන්නෝය.

හැන්දෑ වෙද්දී නුවරඑළියට සීතල තවත් වැඩිවෙයි. නුවරඑළිය නගරය නිර්මාණය වී තිබුණේ කඳු මැදය. ඒ සීතල තවත් වැඩිය. කොහොමටත් නුවරඑළිය නගරය සීතල මැදත් අභිංසක සැනකෙළි සිරියකින් දිලෙයි.

අසංක නුවරඑළියට ආවේ දහවල් එකට පමණය. ඔහු පැමිණ මුලින්ම වෙන්කර තිබූ නිවාඩු නිකේතනයට ගියේය. එය ඇත්තටම සුන්දර හුරුබුහුටි නිවසකි විශාල මල් වත්තක් මැදි කර තිබූ ඒ නිවාඩු නිකේතනයට ඇත්තේ කාමර පහක් හයක් පමණි. බොහෝවිට ඒ හෝටල් කාමර වෙන් වෙන්නේ මධුසමය සඳහා එන නව යුවතිපතීන්ගෙනි. සැබැවින්ම මේ නිකේතනය එවන් චමත්කාර ජනක මිහිරි දින කිහිපයක් ගත කරන්නට සොඳුරුම තැනකි. ජීවිතයේ නිර්මලම දින කිහිපයක් රසබරව ගෙවන්නට මේ පරිසරයේ ඇති චමත්කාරයත් අහිංසක ලස්සනත් ඕනවාටත් වඩා වැඩිය.

ජීවිතයේ හිමි වූ වඩාත්ම ආදරණීයම යුවතිය සමඟ ගෙවන සදානුස්මරණීය මොහොත ගෙවන්නට අසංක තෝරා ගත්තේද ඒ නිකේතනයමයි.

ඔහු සීතල නොනකාම හවස් වරුවේ සීතල වතුර නෑවේය. හුදෙකලාව මිහිරි සුවඳකින් පිරී යනවා ඔහුට දැනුණි. ළඟ ළඟ මොහොතක ජීවිතයේ හමුවූ සුන්දරම මල පිපෙන බව දන්නා නිසාම ඊට පෙර මේ විඳින හුදෙකලාව සුන්දර යැයි ඔහුට සිතුණි. අසංක

WWW.EXPRESSLANKA.TK 478

හැන්දෑවේ චායාව ගන්නට එළියට බැස්සේ නිල් ඩෙනිම් කලිසමකුත් සැහැල්ලු සුදු ටී ෂර්ට් එකකුත් පමණක් ඇඳගෙනය. පූදුමයකට මෙන් ඔහුට සීතලක් නොදැනුනි.

අසංකගේ වාහනය ඈත එනවා දකිද්දී චායාගේ පපුව පැලී යන්නට තරම් විය. ඇයට ඉබේටම නිලංකාගේ අත ඇල්ලිණි. ඔහුගේ සුවඳත්... පහසත්... රැදුණු ඒ රුව දැකීම පවා ජීවිතයට සඳ වාසනාවකි.

අසංක ඇතදීම චායාව දුටුවේය. නුවරඑළියට එන හැටන් කඳු මගදිග පුරාම ඔහු කඳුකර මල් රැසක් දුටුවේය. ඒ සියළු මල්වලට වඩා ලස්සන මල ඇය යැයි ඔහුට සිතුණි. මේ මල පිපී ඇත්තේ තමාගේ හදවත නම් වූ මල් වත්තේ නොවේ දැයි ඔහු සිතුවේය. ලෝබකමකට ආශාවකට සමාන අඩම්බරයකින් ඔහුගේ හදවත ඇවිලිනි.

'අද දෙන්නම හරි ලස්සනයි... හරියට හනිමූන් එකට ආව වගෙයි...'

නිලංකා අසංකගේ වාහනය පයිනස් ගස යට නවත්වද්දීම වාගේ කීවාය. තමා කෙසේ වෙතත් ඔහුනම් හැබෑම ලස්සන යැයි ඇයට සිතුණි. දවසින් දවසට ඔහුව දකින්නට ඇති ආශාව හිතේ වැඩිවෙනවා මිසක ඒ රුව අමතක කිරීම දුෂ්කරය.

අසංක වාහනයේ වීදුරුව පහලට කර චායා වෙත නෙත් හෙලුවේය. චායාගේ දෑස් නෙත් වීගෙන ගියේය. ඇය ඉහළට ගත් හුස්ම පහළට දැම්මේම නැත.

'මගේ කෙල්ලව මට දෙනවද නිලංකා...'

අසංක සිනාසමින් ඇසුවේය. චායා බිම බලා ගත්තාය.

'දෙන්න දෙයක් නෑ... අනාරින්න විතරයි තියෙන්නේ... කෙල්ල සර් ළඟ...'

'නගින්න බබා...'

ඔහු දයාබර ලෙස කීවේය.

'නගින්න කෙල්ලේ... මං බෑග් එක ගෙනල්ලා දෙන්නම්...'

'අක්කලාටත් කියන්න ඕනෙ..'

'එයාලා මහන්සියට නිදි... චායා යන්න... මං කියන්නම්...'

චායා නිලංකාගෙන් ගමන් මල්ල ගෙන ආ පදු වාහනයට

නැග්ගාය. ඒත් සමඟම අසංක මෘදුව තනිවම සිනාසුනේය. තමාට නොකියා ඔහු සිනාසෙන්නේ කවර කාරණාවකටද.

'ඇයි...'

'දැන් තමා සුවඳ ආවේ...'

'ඉතින් යන්...'

'කොහෙද...'

අසංක ඇසුවේ නිලංකාට අනවනමිනි.

'ඔයා කැමති ඕන තැනකට... මං එනවනේ රත්තරන්...'

ඔහු ඇගේ උකුලට වැටෙන ලෙස වමත ඒ උකුලට දැමුවේය. වායා එය බලාපොරොත්තුවෙන් උන්නාය... ඒ වමත ඇගේ දේහට සිරවුනේ වඩාත් ආදරණීයවය.

'දැන් සීතල නෑ මට...'

වායා ඔහුගේ අතගෙන ඇගේ කම්මුලකට තබාගත්තාය. ඒ අතින් ගලා ආ හුරු පුරුදු උණුසුම පතාගෙන බලාගෙන උන්නාක් මෙන් දෙකම්මුල් නිවී සැනසී ගියේය...

'ඇයි හුල්ලන්නේ මැණික...'

'අද මට හීනයක් වගේ රත්තරන්... මේ වගේ ලස්සන පළාතක.. රෑ... මං ඔයාගේ ළඟ... හීනෙන් මිසක් හැබැහින් මම ඔයාළඟ මෙහෙම ඉන්නේ කොහොමද...'

'අද මගේ... ඔයාගේ හැම හීනයක්ම මම හැබෑ කරනවා...' ඒ හීනෙ ඔයාගේ විතරක් නෙවේ... මගෙත් හීනෙ....'

'අපි දෙන්නට හීන දෙකක් නෑ අසංක... එක හීනයයි තියෙන්නේ...'

නුවරඑළිය නගරයට ඔවුන් එද්දී රෑ වී තිබුණි. උත්සව සිරියක් ගෙන තිබූ නුවරඑළිය නගරය දෙස වායා බලා උන්නේ ආශාවෙනි.

'අපි කොහෙද නවතින්නේ අසංක...'

'අපේ හනිමූන් එකට මං ඔයා එක්ක නවතින්න හිටිය තැන...'

වායා යමක් කියන්නට කට හද යළිත් එය ගිල ගත්තාය. රසබර හැන්දෑවක් මුසල කතාවකින් අඳුරු කර ගන්නට අද හදවත සූදනම්

WWW.EXPRESSLANKA.TK 480

නැත. කඳුළු වලට මේ දවස් දෙක තුන වත් පවුරු බැඳිය යුතුය.

'කුඩා ස්වීටරයක් මැණිකට අරගෙන දෙන්නද...'

'කාමරේට ගිහිල්ලා මේකත් ගලවනවා... මට සීතල නෑ රත්තරන්...'

වායා කුඩා පපුවේ ඔහුගේ වමත ගුලි කරගත්තාය. ජීවිතයේ එකම සන්තකය මේ අත පමණකැයි ඇය දහස්වන වතාවටත් සිතුවාය.

'දවල්ට කාලද ඉන්නේ...'

'කන්න ගන්න බබා... කෑවුනේ නෑ...'

'මටත් කෑවුනේ නෑ... ඔයා බඩගින්නේ ඇති කියලා මට සිතුණා...'

'අපි රෑට කමු...'

'මං කවන්නද....'

ඔහු සිනාසුනේ මෘදු ලෙසිනි. කඳුමත නැවරුණු මීදුම් පොකුරු පොකුරු කඳු ළැමදට තුරුල්ව යන කඳුකරයේ මිහිරිතම රාත්‍රිය උදාවෙමින් තිබුණි... අසංක වාහනය කඳපොළ පාර දිගේ ඉහළට පැදවූයේ තිවී පහන්වී ගිය ආදරණීය හදවතකිනි.

නුවරඑළිය නගරයට අනන්තවත් පෙම්වතුන් නව යුවතිපතීන් එන්නට ඇත. එහෙත් අද මේ ආවේ ඒ ආදරවන්තයින් සියල්ලටම වඩා සදදරණීය ආදරවන්තයින් දෙදෙනා බව නගරය පවා දැනගෙන උන්නේ නැත.

# 48

ලා රෝස පැහැයකින් දිලුන හෝටල් කාමරයට ආවනම චායාගේ හදවත පිරී ගියේය. ජීවිතයේ උදවන රසබරම රාත්‍රියක් ගත කරන්නට ඔහු තෝරාගෙන ඇත්තේ කොතරම් අපූරු තැනක්ද... මේ හුරුබුහුටි කාමරය ආදර සැනසුම් පොතේ සුන්දරම පිටුවක සටහන් වන බව චායා දැන උන්නාය.

කාමරයට පිවිසුණු මොහොතේම ඇගේ දෙනෙත් දුව ගියේ සුදු යුගලයහන මත තබා තිබූ අළුත් රෝස පොහොට්ටු ඇතුළත් මල් බන්ඩි එක වෙතටය.

එය ගෙනෙන්නට ඇත්තේ ඔහු විය යුතුය.

අසංක කාමරයේ දොර වසා ඇය වෙත සෙමෙන් පැමිණ ඇයව පිටුපසින් බද ගත්තේ මෘදු ලෙසිනි. චායාට ඉහිලුම් නැතිවිය. මේ උණුසුම ලබන්නට ආත්ම කීයක් බලා උන්නාද...

ඔහුගේ දෑතම වැටී තිබුණේ ඇගේ බඳ හරහාය. චායා ඒ අත් වළල්ල මැදම අනිත් අතට හැරී ඔහුව තදින් වැළඳගත්තාය.

දෙදෙනාගේම මුව ගොළු විය. දිවග වියළිනි... එහෙත් ආදරය ලවන් මතට කාන්දු වෙමින් තෙත්ව යමින් තිබුණි. අසංක චායාගේ

WWW.EXPRESSLANKA.TK 482

මූහුණ දේතිත්ම ගෙන සිප ගත්තේ මහා ආදරයකිනි...

ඇගේ සිහින් දෙතොල්පට මත ඔහු බොහෝ වේලාවක් දෙතොල් තබාගෙන උන්නේය. සෙමෙන් රහසින් මෘදුව පිබිදෙන අනුරාගී හිරිමල් හැඟීම් වලට ඔහේ ගලා යන්නට චායා ඉඩ දුන්නාය.

'මට එකපාරක් ඉඹගන්න ඉඩ දෙන්නේ නැද්ද...'

චායා උගුරෙන් මෙන් ඇසුවාය. ඔහු දෙතොල් මුදා ගත්තේ ලැජ්ජාවෙනි. චායා දෙපතුල් වලින් ඉස්සී මුලින්ම ඔහුගේ නළලත සිප ගත්තාය. හවස රැවුල කැපූ නිසා ඔහුගේ මූහුණ වඩාත් මතුවී තිබුණි...

හාදු නාස්ති කර ගන්නට චායාට ලෝබ සිතුණි... රාත්‍රීන් දෙකක් ඉතිරිවී ඇත... ඔහු තමාටම හිමි වී නම් හාදු දෙන්නට ජීවිතයක්ම ඉතිරිවී ඇත. ඒ හිමිවීම ජීවිතයටම ලැබේ නම්...

'ඇ..යි..'

ඔහු ඇගේ මුහුණ දේතින් දේනට ගනිද්දී ඇය ඇසුවාය. අසංක කතා කළේ නැත.

'මොනවද ර..ත්..න..ර..න්.. කල්පනා කරන්නේ....'

'අපේ අනාගතේ ගැන...'

'ඒක නොහිතා අද අපි ඉමු අසංක...'

'මේ මූණ මගේ අනාගතයම විතරක් නොවේ... මගේ මුළු ජීවිතයම... මම නොහිතා ඉන්නද මැණික...'

ඔහු ඇගේ බඳ වටා තවත් දැඩිව සුරත දැම්මේය.

'අද රෑම මාව මෙහෙම ළඟ තියාගන්නවද...'

'ම්...'

'මොනවද කරන්නේ...'

'කවුද..'

'අපි දෙන්නා...'

'මෙහෙමම බලං ඉන්නවා..'

'ඇ... ති... ද...'

'ඇ... ති...'

'එහෙමනම් ඔයා ඒ පැත්තේ... මම මේ පැත්තේ... මැද කොට්ටේ...

හොඳේ...'

'එතකොට හරිද...'

'හරි...'

'බබා එහෙනම් ඇඳ උඩ නිදාගන්න... මම කොට්ටයක් දාගෙන බිම නිදාගන්නම්...'

'අ..නේ... මාව මැරෙයි...'

චායා ඔහුගේ පපුවට තුරුළු වී ගෙනම උන්නාය. ඇගේ දෙනෙතට යහන මත වූ රෝස පොකුර පෙනුණි.

'අරක කවුද ගෙනාවේ...'

'ම...ම... ඇයි...'

'ඇයි ඇඳ උඩ තිබ්බේ...'

'මං හිතලා තිබ්බේ නෑ මැණික... ඔයාව මතක් වෙලා ගත්තේ...'

අසංක චායාව අතින් ඇදගෙනම ගොස් පුටුවේ වාඩිවී ඔහු ගෙනා ගමන් මල්ල විවර කළේය.

'ආ... මං නුවරින් ගත්තේ..'

අසංක සුදු පොලිතින් බෑගයක තිබූ ඇඳුමක් චායා අත තැබුවේය. චායා එය විවර කළේ ආශාවෙනි. එහි වූයේ ලා දම් පැහැගත් සුන්දර සිල්ක් රෑ ඇඳුමකි. චායා එය වතට තබා බැලුවාය. මල් පොහොට්ටු දෙක හරියටම එන්නේ පපුව මැදටය

'ඔයා පව්...'

චායා රෑ ඇඳුම පපුවට ගුලි කරගෙනම ඔහු පාමුල බිම ඉඳගත්තාය..

'අසංක..'

'ඇයි බබා...'

'අද අපේ හනිමූන් එකනම්... නේද...'

ඇය කීවේ ඔහුගේ දෙදණම බදාගෙන එය සිපගෙනය... අසංක ඒ මෘදු හිසකෙස් අතර ඇඟිලි තුඩු යැව්වේ ආශාවෙනි.

'එහෙනම් අර ඇඳේ මැද රතුපාටට තියෙන්නේ මල් පොකුර නෙමේ...'

අසංක කීවේ හැඟීම්බරවය... චායා දෙනෙත් පියා ගත්තාය...

'අසංක...'

WWW.EXPRESSLANKA.TK 484

"ඇයි බබා අඬන්නේ..."

"ජීවිතේ වෙන කව්රු වෙනුවෙන්වත් මට රැකගන්න දෙයක් නෑ රත්තරන්... හැමදෙයක්ම ඔයාට දීලා එක දෙයක් විතරක් මට අරගෙන යන්න බැහැ... අද වගේ දවසක් අපේ ජීවිතයට ආයේ උදවෙන්නෙත් නෑ... මේ ඔයාගේ කෙල්ලනේ... ඔයාගෙම කෙල්ලනේ.. ඔයාට නොදී මං මේවා කාට ඉතුරු කර ගන්නද..."

වායාට ඇඬුණි. ඇය උන්නේ අඬන්නටම නොවේ..

"කවදාහරි මටම දෙන්න ඒ හැම දෙයක්ම ඉතුරු කරගන්න මැණික... මම එනවා... ඔව්... ඔයාව අරගෙන මේ හොටෙල් එකටම හනිමූන් එනවා.... අපි අපේ අනාගතේ වෙනුවෙන් ලස්සනම දේවල් තියාගමු..."

"ඔයා කියනවානම් මං බලං ඉන්නම්... ආවත් නාවත් මේ හිඟන කෙල්ල ඔයා වෙනුවෙන් හැම දෙයක්ම තියාගෙන බලන් ඉන්නවා.."

"අද අපි අඬන්නැතුව ඉමු බබා..."

වායා හිස ඔසවා කඳුළු අතරින් ඔහු දෙස බලා උන්නාය... ආදර දෙවොලේ ඉදිවූ ස්වර්ණමය ප්‍රතිමාව මේ තරම් හැඩ වූයේ කෙසේද..?

"හවස දකිද්දී පපුව පැලෙන්න ගියා... අද හරි ලස්සනයි... හරියට අළුත බැඳපු මනමාලයෙක් වගේ..."

"මං ලස්සනයි... ඔයාගේ ආදරේ පාට මේ මූණේ තියෙන කල්..."

"මං මේක ඇඳගන්නද.. අපි එළියට යනවද..."

"කොහේවත් යන් නෑ... මම ඔයා ළඟටම වෙලා ඉන්න ඕන..."

වායා ඔහුගේ ඇඳුම් බෑග් එක සීරුවෙන් ඇද බතික් සරමත් නිල් අත් දිග ටීෂර්ට් එකත් තෝරා ඔහු අත තැබුවාය.

"මෙහෙම දවසක් හරි එද්දී හරි ලෝබයි..."

ජීවිතය පුරාම ඔහු ළඟට වී ඔහුගේ පාද පරිචාරිකාව වන්නට ඇත්නම් ඔහු වෙනුවෙන් සුන්දරම පතිනියක් විය හැක. ඔහුට දරුවන් හදා දිය හැක. ඒ වරම ඇත්තේ දෙවියන් ළඟය.

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

වායා ගත ගැල්වූ ආලේපනයේ මෘදු සුවඳ කාමරය පුරාම විහිදී තිබුණි. සිසිලස නිසා සුවඳ පිටතට ගලන්නේ නැත. කාමරයේ වූ මෘදු ආලෝකයෙන් අඳුංකර වායා දෙසම බලා උන්නාය. ඇය උන්නේ ඔහු

WWW.EXPRESSLANKA.TK 

ගෙනා රෑ ඇඳුම ඇඳගෙන ඇඳකොනකය. අසංක නාන කාමරයේ දෙරකඩට වී තම සුන්දරම ආදරවන්තිය දෙසම බලා උන්නේය.

පවිත්‍රත්වයේ නිර්මල සඳ දෙව්දුවක් වන් වූ ඇයව ඉඳුල් කරන්නට ඔහුට ලෝබය. මේ තමන් සන්තකයමය. එකතින් එහාට ජීවිතයක් නැත. කිසිවෙකුගේ පා සටහනක් වත් නැති කදූකර බිමක පිපුණු උඩවැඩියා මලක් මෙන් ඇගේ ආත්මය පාරිශුද්ධය. එවන් ගැහැණු වනකට අත තැබිය හැක්කේ ආත්මීය බලාපොරොත්තුවකිනි.

අසංක කාමරයේ ආලෝකය අඩු කළේය. ඔහු තමා ළඟට එන බව ඇය දැන උන්නාය. හැරී බලන්නට ඇයට අවශ්‍ය නැත. ප්‍රේමයේ වත්කම් සියල්ල ඇත්තේ ඔහු වෙනුවෙනි.

අසංක පැමිණ ඇඳ මත වාඩි නොවී ඇය ඇඳේ ඉඳගෙන උන් තැන බිම දණ ඔබා ඒ මතට එබුණේය. වායාගේ දෙනෙත ඒ ගෙලට සිරවිය.

"මෙහෙම ඉන්න එපා රත්තරන්..."

"මට මෙතන නිදගන්න ඕන.."

ඔහු ඇගේ සුන්දර දෙපා මත හිස තැබුවේය. ඒ පැත්තම ඇවිලී ගියේ ඉබේටමය. රෑ ඇඳුමින් පමණක් වෙන්වූ ඒ දෙපා වල මෘදු රස්නය ඔහුගේ කම්මුල් වලට සොඳුරු ලෙස දැනුණි.. ඔහු එලෙසම ඉඳගෙන ඇගේ බඳ බදාගත්තේය.

"අසංක.. නිදිද..."

"අද නිදගන්නේ නෑ බබා.."

ඔහු ඇයව අතහැර ඇය අභියස සිටගත්තේය. වායා නැගිට්ටේ ඔහුගේ පපුවට සමාන්තරවය. ඔවුන්ගේ දෙනෙත් වලින් අනුරාගයටත් වඩා ගලා ගියේ ආදරයයි. වායා ශාන්ත ලෙස අසංකගේ පපුවට හිස තබා ගත්තාය. ඒ තිරුවන් පපුවේ බිත්ති වලින් එන උණුසුම ඇගේ දෙකම්බුල් පූර්ණවන්ත ලෙස උණුසුම් කළේය.

ඔහුගේ ශක්තිමත් උරතලයේ දැඩි බව ඇයට දැනුනේ මලක්මෙන් ඇය යහනේ පැතපෙද්දීය. අසංක ශාන්ත ලෙස ඒ මොලකැටි සිරුර සිප ගත්තේය. මේ සියල්ල තමාට පමණක් උරුම වන්නක් බව ඔහු දනී... ඔහු සීතලට නිරාවරණය වූ ඇගේ මෘදු ළැම සිපගත්තේ ඒ

WWW.EXPRESSLANKA.TK 

වත්කම් පිළිබඳව උපන් භක්තිමත් සිතුවිලි වලිනි...

හදවතේ ඇති වූ ආගන්තුක ගැස්ම තුනී වී ගිය පසු චායා ඔහු දෙස බැලුවාය. තම ළැම තලාවේ හිස තබාගෙන ශාන්තව දෙනෙත් පියාගෙන ඉන්නා ඔහු දකිද්දී ඇගේ තුන් හිතම ඇවිළිණ..

'ඔයා කොච්චර හොඳද...'

ඇය කීවේ එපමණකි. ඔහුට පමණක් හිමි සියල්ල ඔහුට පුදද්දීත් ඔහු සියල්ල විඳගත්තේ මෘදු ලෙසිනි. තමාට හමුවූයේ ආදර මාවතේ හමුවන බාල කොල්ලකරුවෙකු නොවන බව චායා දැන උත්තේ බොහෝ කලකට ඉහතදීය.

ඔහු නැගිට්ටේ ඇගේ උදරයත් සිපගෙනමය. චායාට හීල්ලිනි. ඇය එහෙමම ඔහුගේ උරපතු වලට බර වූවාය.

'අපේ ආදරේ අතීතයට විතරක් අයිති දෙයක් නෙමේ රත්තරන්...'

චායා රහසින් මෙන් කීවාය.

'ඔයත් නැති කාලෙක.. මගේ අම්මත් නැති කාලෙක මං තනිවෙනවා අසංක...'

චායාගේ වචන අසංකගේ ළයට වැටුනේ පිඳුරු තලාගල කන්දටත් වඩා බරවය.

'මං මැණිකව තනි කරන්නේ නෑ... අදත් හෙටත් ඔයාගෙ අනාගතයෙත් මං ඉන්නවා...'

'පුටි පැටියෙක් උන්නනම් මං හදගන්නවා... කිරි පොවනවා.. බත් කවනවා... ඉස්කෝලේ යවනවා... අපේ ආදරේ මං ජීවත් කරවනවා...'

'එකාට දහ දෙනෙක් හදනව.. මම මේ අත සිත්තක්කරේටම ලියව ගන්නවා...'

'හිතං ඉන්නේ කුලියට අරගත්ත කියලද... මගේ ජීවිතේ ඔයාට ඕන්න වෙලා ඉවරයි අසංක...'

'මට ඔයා නැතුව ජීවත් වෙන්න බෑ බබා... ජීවත් වෙන්න මං හිතන්නෙවත් නෑ...'

'උදා නොවෙන අනාගතයකට හීන එකතු කරන්න එපා රත්තරන්... අපි ඕව කතා නොකර ඉමු...'

චායා අසංකගේ පපුවට බරවී දෙනෙත පියාගත්තාය. නිවී සැනසී ගිය ශාන්ත නෙතමනයක් ඇගේ දෑස් වල විය. මෙහෙමම මිය යනවා නම් කියා ඇයට සිතුණි.

නාලකට අම්මා සමඟ කතා කරන්නට කියූ බව චායාට කියන්නට අසංකට සිතුණි. එහෙත් හෙට වනතුරු එයට ඉවසිය යුතුය. දැන්මම කිවහොත් ඇය බිය වනු ඇත.. ලස්සන මේ දවස් දෙකම ඒ ඇස්වල කඳුළින්ම දියවෙනු ඇත.

'ඔයා බැන්ද දවසක කවදාවත් මේ හොටෙල් එකට එන්න එපා... මේ ඇඳ... මේ කාමරේ මේ හෝටලේ මං වෙනුවෙන් ඉතුරු කරලා තියන්න හොඳේ...'

චායාගේ දෙනෙතින් ගිලිහී ගිය දෙකඳුළක් ඔහුගේ පපුවට සීතලට වැටුණි... අසංක චායාගේ හිස වේදනාවෙන් සිප ගත්තේය.

'ජීවිතේ මම මෙහෙම ඉන්නෙත් ඔයා එක්ක විතරයි බබා... මාව රිද්දන්න එපා...'

'අනේ නෑ රත්තරන්... එහෙම හිතන්න එපා.. ඔයා මට වරදක් කරනවා කියලා මට හිතන්නෙ නෑ... අපි ආදරේ කළේ වැරදි ආත්මයක.. ඒකට කමක් නෑ... මේවා කොළඹ යද්දී අමතක කරලා දාන්න...'

මතක් කරන්නවත් මට තියෙන්නේ මෙච්චරයි බබා... ඒ ටික අමතක කරලා කොහොමද...'

'අසංක... ඔයාට මාවමද ඕනේ...'

චායා ඔහුගේ පපුව දෙතොලින් සිපඇසුවාය.

'ඔව්...'

'කොහොමත් මං ඔයාගෙම තමයි.... ඒත් ඔයා මගේ නෙමේනේ... ඔයාගේ ආදරේට උරුම කියන්න පිනක් මට නෑ... ආදරේ විතරක් මදි දෙයියනේ ඒකට...'

'බබා... අපි හැම දෙයක්ම අමතක කරමු... කෝ මට බත් කවනව කිව්ව නේද..'

'දැන් කවන්නද...'

චායා ඇඳෙන් බැස කුඩා ටීපෝව මත රස්නෙට තිබූ කුඩා බඳුන් වලින් එක පිඟානකට බත් බෙදාගත්තාය.

WWW.EXPRESSLANKA.TK 488

අසංකට ප්‍රථම කට කවද්දී ඇගේ ළය දහ දෙළොස් පලකින් ඇවිලිණ.

'අන්තිම කට මට ඔයා කවන්න...'

චායා කඳුළින් පිරුණු දෙනෙත් පිහානට බර කර කීවාය.

මේ කඳුළු වල වන්දිය ගෙවිය යුතුය. ඒ සියල්ලටම හෙට අම්මාත් නාලකත් අතර ඇතිවන කතා බහ සුන්දරව කෙළවර විය යුතුය. එහෙත් එසේ වෙයිද..

# 49

වායා පිබිදුනේ පාන්දරමය... ඇහැරුණ විටම ඇය බැලුවේ අසංක දෙසය... ඔහු කොට්ටයට වැටුණු මලක් මෙනි. නොවේනම් සඳක් මෙනි. ජීවිතයේ එක් වරක් පමණක් යුවතියකගේ හදවතේ නිදන්ගතවන අසීමිත ලෝබකම වායාගේ හදවතේද නිදන්ගත විය...

පෙරදා රාත්‍රිය ඇයට සිහිවිය... ජීවිතය ඒ රාත්‍රියෙන්ම නිමා වූවා නම්... නැතහොත් ජීවිතයම එවන් රාත්‍රියක්ම වූවා නම්... මේ පාළු හුදෙකලා ජීවිතය කොතරම් නම් සුන්දරද...

ඔහු තරම් භක්තිමත්ව.. ආදරණීයව නවත් කිසිම කෙනෙකුට නමාව සිප ගන්නට නොහැකි බව ඇය සිතුවාය... මලක මල් මංජරිය තැවරුණ අනුරාගී රොන් සුණු ආදරයේ මත්මත් දෙතොලින් නෙත් කරන්නට හැම පිරිමියෙකුටම නොහැක... එය ආදරය පිළිබඳ දේව කලාවක් විනා කාම සූත්‍රය නොවේ.

අසංක නොදරුවෙක් මෙනි. රාත්‍රිය පුරා ඔහු වායාගෙන් වින්දේ' අහිංසක අනුරාගයක නිම්හිම් නොවනා උණුසුමකි.

WWW.EXPRESSLANKA.TK 490

'කවදහරි මාව බැන්දෙත් මේ ඔක්කොම මට කියලා දෙන්න වෙයි... ඔන්න.. මං මුකුත්ම දන්නේ නැහැ...'

චායා මූව විසාගෙන කීවාය. ඔහුගේ මුහුණ ආදරයෙන් පිරුණි.

'බැන්දට මම ඉඹින් නෑ..'

ඔහු ඇයගේ උකුලට වැටී කීවේය. ඒ දෙතොල් ඇගේ උදරය මත නතරවී තිබුණි.

'අ...නේ ඇයි ඒ...'

'පළවෙනි අවුරුද්දෙ බලාගෙනම ඉන්නවා...'

'එච්චරටම මට ආදරේද..'

'ඇයි දැනෙන්නේ නැද්ද...'

චායා කතා නොකළාය. ඔහුගේ සෙනෙහස දැනෙන්නේ ආත්මයේ පතුලටය. එය දැනෙනා දෙයක් නොවේ. විඳිනා දෙයකි..

'ඊළඟ අවුරුද්දේ...'

චායා යළිත් ඇසුවාය. ඇගේ මුහුණත් ඔහුගේ මුහුණටම පහත් වූයෙන් ඇගේ වරලසින් අසංකගේ මුහුණ වැසී තිබුණි..

'පොඩ්ඩ පොඩ්ඩ ඉඹිනවා..'

චායාට සිනහව නවත්වා ගත නොහැකි විය. ඔහුට එයේ පොඩ්ඩ පොඩ්ඩ ඉඹින්නට බැරි බව ඇය දන්නීය..

'ඔයාට බෑ රත්තරන් එහෙම කරන්න... ම..ට...ත්. බෑ...'

චායාගේ කඳුළු ඔහුගේ මුහුණ මතට වැටී නෙත් විය. ජීවිතය මේ ටික නොදෙන්නේ ඇයි... එය නොදී තමාව ජීවත් කරවන්නේ ඇයි...

'හැමදම මාව මෙහෙම තියාගන්නව නේද...'

ඔහු ඇසුවේ ඇගේ උකුල මත තවත් ගුලි වීය.. පිරිමියෙකු හුරතල් වෙද්දී ඒ යුවතියට දැනෙන්නේ අම්මා කෙනෙකු දරුවෙකු නිසා විඳින සතුටය. ආඩම්බරයය..

'මේ උකුලේ මට තියාගන්න ලැබෙනවානම් තියාගන්නේ ඔයාවයි... ඔයාගේ...'

චායා කියන්නට ගිය දේ ගිල ගත්තේ ඒ තරම් දුරට සිතා

පලක් නොවන නිසාය.

"කියන්න බබා..."

"මෙතන මං තියාගත්තොත් ඔයාවයි ඔයාගේ පුතාවයි විතරයි..."

අසංකගේ ඇතුළු ළය විඳගෙන ඒ වචන ගලා ගියේය.. ඒ අනාගතය නම්.. එය කොතරම් චමත්කාරජනක විය හැකිද.. දෛවය තමාට මඟ විසි කර යන්නට කියන්නේ ඒ අනාගතය නොවේද...

"මගේ පුතාගේ අම්මා බබා විතරමයි... මාවයි මගේ පැටියාවයි හදලා දෙන්න මැණිකා.."

මේ දුප්පත් කෙල්ලට ඔයාවයි ඔයාගේ පුංචි පැටව් ටිකයි බලා ගන්න දෙනවනම් මෙහෙම තියාගෙන බලාගන්නව මහත්තයෝ.. පාන්දරම ඇහැරෙනවා. නිදාගෙන ඉන්න තාත්තවයි පුතාලා ටිකයි ඉඹලා මං ඔයාලට කෑම හදනවා... ඊට පස්සේ කවනවා... මට වෙන ජීවිතයක් ඕන නෑ..."

චායාට ආයෙත් ඇඬුණි. ඇයට හැඟුනේ අනාගතය පිළිබඳ සුන්දර රූප රාමු පෙළක් ලස්සනට ඇගේ හදවතේ ඇඳුණු නිසාය...

"මට ඒ අනාගතේ දෙන්න බබා... ඔයා නැතුව මටත් ජීවත් වෙන්න බෑ..."

"ම..ට..ත්... බෑ අසංක... හරි ලෝබයි..."

ඔහුගේ දෙනෙත් තෙත්විය. ජීවිතයේ දමා යා හැකි දේවල් අනන්තවත් වේ.. අතහැර දැමිය හැකි දේවල් බොහෝ වෙ. එහෙත් මේ සඳ ජීවිත අහසින් ඈත් කරලිය නොහැක. ඉතිරිවන අමාවකයේ ජීවිතය බලාගැනීම දුෂ්කරය..

චායා පාන්දර අසංකගේ මුහුණ දෙස බලාගෙන මේ සියල්ල සිහිපත් කළාය... කටුසර ජීවනයේ පිපුන එකම ආදර මල මේ මල නම් ඒ මල පර කරලන්නේ ඇයි...

ඇයගේ මෘදු ළය හරහා වැටී තිබූ අසංකගේ අත ඉවත් කරන්නට චායාට ලෝබ සිතුණි. ඒ සුරත එහෙමම ජීවිතයේ හැමදාමත් තම ළය හරහා වැටී ඇත්නම් උදාවන හැම පාන්දරකදීම මේ වත මෙහෙමම තම වම්පස පිපී තිබේනම්..

ආදරයක මහෝඝයක් මීසක වියෝගයත් දරාගන්නට තවම මේ

හදවත් දෙක ළපටි වැඩිය. දෛවය ඔවුනට බලකරන්නේ වෙන් වන්නට නමුදු ප්‍රේමය ඔවුන්ට බල කරන්නේ සදාකාලිකවම එක් වන්නටය.

චායා හෙමින් ඔහු වෙතට හැරුණාය... යෞවනයේ එක් සුන්දර නිමේෂයකදී දුටු ආදරයේ එකම ප්‍රතිමාව... දෙව්රුව මෙය විය...

ඇය ආශාවෙන් ඒ හිස පිරිමැද්දය.. අවුල් වූ ඔහුගේ කොණ්ඩයේ හිසකෙස් අතර රැඳුණ මෘදු බව ඇගේ හදවත තුළ ආදරයක් ඇති කළේය.

ඔහුගේ දෙතොල් මත ඇත්තේ සනීප තෘප්තිමත් සිනහවකි. පෙරදා රැයේ නම පපුව මත නිදගත් ඔහු බිමට වැටුනේ කවර මොහොතක දැයි ඇය සිතුවාය...

ළං වන්නට ළං වන්නට වෙන්වන්නට ඇති හිත අඩුය.. වෙන්වන බව සිතද්දී ඇත් වී ඉන්නටද බියය. ජීවිතයේ යථාර්ථයේ වියෝගය වූ කල හදවත හිස්ය. චායා ඇගේ සිහින් ඇඟිලි තුඩු ඔහුගේ යන්තමින් වැවුනු රැවුල් කොට අා මුහුණ පුරා රැගෙන ගියාය.

"චූටි... මහත්තයෝ..."

ඇයට ඔහුව ඇහැරවන්නට ලෝබ සිතුනත් මේ අපූරු දවස තනිවම ගත කරන්නටද ඇයට ලෝබය. සීත මිහිදුම් පොකුරු කඳුලින් යේදී යමින් අළුත් දවසකට කඳුකරය පිබිදෙන මේ අළුත් උදෑසන තනිවම ඇහැරී සිටින්නට චායාට නොහැක.

"බ..බා ඇහැරුණාද..."

"ම්... තව නිදිමතද..."

ඔහු සුන්දර ලෙස අසමින් ඇගේ ළැමට තවත් බර විය...

"අ...නේ... මේ රැවුල කපන්න වෙයි.."

තුනී රැ ඇළුමේ ඇනී ළයට දැනෙන ඒ රැවුල් කොට වල රිදුම ඇයට ගෙන ආවේ සිනහවකි.

"ඇයි" රැ මෙතනින් වැටුනේ..."

ඇය ඇසුවාය.

"දන්නේ නෑ එහෙමම වැටිලා..."

ඇගේ ළැමදෙන් රැය පුරාම ආවේ අමුතුම සුවඳකි. ඒ සුවඳ ආත්මය පුරාම අමතකව යන සුවඳක් නම් නොවේ...

'ඇයි..'

'අද හරි දුකයි...'

ඇය මිමිණුවාය..

'හැම රැයක්ම ඊයේ රෑ වගේ නම්.. හැම දවසක්ම මේ අද පාන්දර වගේ නම්... ඒත් ඉතින් අද හවස දලා යන්න වෙනවනේ...'

'අද දලා ගියාට ජීවිතේ පුරාම දලා යන්නෙ නෑ බබා..'

අසංක බලා ඉඳිද්දීම ඇය යහනින් බැස්සාය. කාමරයට එපිටින් කඳු දෙසට මුහුණ ලා ඇති දිග ජනේලය විවර කර ඇය විශාල ජනෙල් තිර රෙදි මෑත් කළාය... කඳු නිම්නය පහළ බෑවුම් යට ගලාගෙන ආ නැවුම් හිරු රැස කෙළින්ම වැටුණේ වායාගේ වතටය. ඇගේ සුන්දර වතේ සියළු කෝමල රේඛා හිතුවක්කාර හිරු එළියෙන් වෙන් කර අපූරුවට ඔහුට පෙන්නුවේය.

ඔහු ඒ නිර්මල කෝමල රේඛා විඳගත්තේ දැවුනු රාගයකින් නොවේ. නිවී පහන් වී ගිය ප්‍රසන්න හැඟීමකිනි. මේ පුදුමාකාර යුවතිය තමාගේ ආදරවන්තිය නොව තම බිරිඳ යැයි ඔහු හිතා ගත්තේය...

වායා පහළ කැරටි වගාව දෙස බලාගෙනම උන්නාය... ඊට එහා තිබුණේ සලාද වගාවකි... සියල්ල මත උදෑසන මල් මීදුම් පොකුරු තැවරී තිබුණි. වඩාත් ලස්සන ඒ මීදුම් පොකුරු කපාගෙන හිරු එළිය වගාවට පාත් වෙද්දීය..

අසංක වායාගේ පිටුපසින් පැමිණ ඇගේ බඳ වටා දෑතම යවා ඇයව තමවතට ළං කර ගත්තේය. වායා ඔහුගේ වතවටා අත බර කර ගත්තාය. ඔවුනොවුන්ට ඔවුන්ගේ මුහුණු නොපෙනුනත් ඒ බැල්ම යොමුව තිබුණේ එකම තැනකටය. ඒ අහසේ එහාට මෙහාට යමින් තිබූ දහකාර මීදුම් දල්ලක් වෙතය...

උදරය මත එකට වෙලී තිබූ ඔහුගේ දෑත මත වායා තම දෑතම තැබුවාය...

'අපි අද මොකද කරන්නෙ මහත්තයො...'

WWW.EXPRESSLANKA.TK 494

'මට ඇවිදින්න යන්න බෑ... ඔයා ළඟටම වෙලා ඉන්න ඕන...'

'මටත් බෑ... මෙතනට වෙලා ඉමු... ලස්සනයි නේද...'

'ම්... හනීමූන් එකටත් මෙතනම හොඳයි නේද...'

'හොඳයි.. මිස් කැමති වෙයිද දන්නෑ...'

අයංකට ඉහිලුම් නැති විය. මල් පිහිත තට්ටුවෙන් ගලවා බිමට අතාරින්නාක් මෙන් ඔහුට දුක සිතුණි.

'මං ජීවිතේට එහෙම නටන්න දෙන්නෑ බබා... එන්න මෙතන ඉඳගන්න...'

ඔහු ඇයව අතහැර බෑල්කනියේ තිබූ වේවැල් අසුනට බරවී ඇයට කතා කළේය.. ඇය ඔහු අසළම තිබූ වේවැල් පුටුව මත බරවෙන්නට යද්දී ඔහු ඇගේ අතින් ඇද තම කළවා මත වාඩිකරවා ගත්තේය.

'ඔයා....ට.. බර..ද...'

ඇය සිනාසී ඇසුවාය.

'අ..ර ඈත මීදුම් තියෙනවා නේද..'

'ම්...'

'ඒවා තියෙන්නෙ කොහෙද..'

'කන්ද උඩ...'

'කන්දට මීදුම් බරද....'

'නෑ...හැ..'

'මටත් ඔයාව බර නෑ...'

'අව්ව වැටෙනකොට අයංක මීදුම් දියවෙලා යනවා...'

'ඇත්ත.. ඒත් කන්ද දියවෙන්නේ නෑ බබා... හෙට උදේටත් මීදුම් එනවා...'

ඔහු කියන්නේ ඇත්තය.. ජීවිතය ගැන තර්ක කළ හැක. එහෙත් යාථාර්ථය කටුකය.

'කැමරා එකක් තිබුණනම් මේ මූණ චූටි ෆොටෝ එකක් ගහගෙන මට අරගෙන යන්න.. අර කන්දට පිටුපාල ඉඳිද්දී... මේ දවස් ටිකට මට ඒ ටික ඇති..'

'ඊට වඩා ලස්සන නැද්ද වායා හැමදාම අපි මෙතනට ඇවිත් මේ දවස මතක් කරන එක...'

'එන්න පුළුවන්.. හීනෙන්... ඇවිත් හම්බවෙමු.. ඒත් මේ මූණ මෙහෙම මං අතගාන්නෙ කොහොමද... මං වාඩිවෙලා ඉන්නේ කාගෙ කකුල් දෙක උඩද...'

ඇය ගැන අම්මා සමඟ කතා කරන්නට නාලකට කියූ බව වායාට කියන්නට මේ හොඳම වේලාව යැයි අසංකට සිතුණි.

'ඉතින්... මට මොනවද කියන්න යන්නේ...'

එතෙක් වේලා ඔහුගේ මූණ පුරා ඇඳුණු තුනී හුරතල් බව පරයමින් බැරෑරුම් බවක් ආරූඪ විය.

'මං නුවරඑළි ආවේ අපේ අනාගතේ වෙනුවෙන් හැම දෙයක්ම සූදානම් කරලා බබා..'

ඔහු සාවධානව කීවේය.

'මො..න...ව...ද මේ කියන්නේ... මොනවද කරලා ආවේ...'

ඇය ගැහි ගැහී ඇසුවාය.

'නාලකට කිව්වා අපේ අම්මා එක්ක ඔයා ගැන කතා කරන්න කියලා...'

වායාට කතා කර ගන්නට පවා නොහැකි විය. ඇය හිරිවැටී ගියාය... අසංකගේ උරහිස මත තිබූ ඇගේ සුරත සීතල විය...

'මැ...ඩ...ම්... එක්ක.. මං ගැන...'

'ඔව්... නාලකට කියලා ආවේ... දැන් කතා කරලත් ඇති... හැම දෙයක්ම අම්මට කියන්න කිව්වා. එහෙම නැතුව බෑ බබා...'

වායාව ගැහෙන්නට ගත්තාය. මෙතෙක් දවසක් මේ මුහුණ දෙස බල බලා සිහින දකින්නටවත් ඉඩක් තිබුණි.. හෙට සිට එයත් නොලැබෙන බව ඇය දනී... ඇගේ දෙනෙත් කපාගෙන කඳුළක් ගලාගෙන ගියේය.

'ඇ...යි මහත්තයො එහෙම කළේ... පිස්..සු..ද රත්තරන්ට...'

'වෙන විසඳුමක් නෑ බබා... අපේ අනාගතේ වෙනුවෙන් අපිට සටන් කරන්න වෙනවා බබා... මට වෙන විදිහක් නෑ..'

'ඒත්... ඒ...ත් අනේ මොනවද ඔයා කළේ... මට මේ මූණවත්

WWW.EXPRESSLANKA.TK 496

බලා ගන්න බැරි විදිහට ඇයි මේ මෝඩ වැඩේ කළේ... බලන්න දත් ජීවිතය පුරාවටම මං ඉන්න ඕන මේ මූණ නොදැකද..'

'නැහැ... මේ මූණ ළඟ තියාගෙන...'

ඔහු තරමක් සැරෙන් කීවේය. වායාට ඇඬුණි.

'මැඩම් මාව එලවයි.. මට බනී.. අනේ අසංක මොනවද රත්තරන් හෙට ඉඳල වෙන්නේ...'

'අම්මා එහෙම කරන්නෑ. එයා මට ආදරෙයි... එයාගෙ සතුට මගේත් සතුට.. ඔයා වගේ කෙල්ලෙකුට අම්මා එරෙහි වෙන්නේ නෑ...'

'වෙ...න...වා... ඔයා ජීවිතය ගැන මොනවද රත්තරන් දන්නේ...'

'දන්නවා... හැම දෙයක්ම දන්නවා... ඒත් මට ඔයා නැතුව ඉන්න බෑ.... අද ඉඳලා කොහොමටත් බෑ...'

මොහොතකට කළින් උණුවුණු වී තිබූ වායාගේ වත දත් සීතලය. ඇගේ වත මලම පරවී බිමට කඩා වැටී තිබුණි...'

'අසංක... ජීවිතේ තිබ්බ හීනෙත් මගෙත් ඇත් වුණා කියල මට හිතෙනවා.. මම කොහොමද ඔයාව නොදැක ඉන්නේ... කතා නොකර ඉන්න පුළුවන්.. ඒත් නොදැක ඉන්න බෑ...'

දෙදෙනාම බොහෝ වේලා කතා කළේ නැත... වායාගේ දෙනෙත් කෙළවරින් ගලා ගිය කඳුළක් ඔහුගේ පපුවට වැටී වියළින.

'අපි යමු කාමරේට..'

ඔහු කීවේය... ඇය බැහැයි කියන්නාක් මෙන් හිස වැනුවාය.

'මං උස්සගෙන යන්නද...'

ළදරුවෙකු සේ ඔහු අසද්දී ඇයට ඇඬුණි.... නැත.. ඇයව අහිමි වී ජීවත් විය නොහැක...

අසංක වායාව හරහට ගත්තේය.. කඳුළු පිරී ගිය ඇස්වල තුනී සිනහවක් මතුවිය. වායා ඔහුගේ ගෙළ වටා දේතම යවා එල්ලුනේ සිනහවත් කඳුළුත් මතුවූ ඇස්වලිනි.

'ඈ...යි...'

'මට බයයි අසංක...'

'ඇයි.. බයවෙන්න එපා...'

ඔහු හිමිහිට කීවේය. අසංක ඇයව යහන මත මලක් මෙන් තැබුවේය. ඊට පසු ඒ වතට මෘදුව බර වූයේය.

'ම...ට ඔයාව ලැබෙයිද දෙයියනේ...'

වායාගේ හඬ තුළ අසීමිත බලාපොරොත්තුවක් නොවිනි යැයි කිව නොහැක..

'පොඩි වැඩක් කරන්න තිබුණා...'

ඔහු කීවේ හිතුවක්කාර ලෙස සිනාසෙමිනි.

'මො...ක...ක්..ද...'

'බඩට බබෙක් ගත්ත නම් මට නිකම්ම ඔයාව ලැබෙනවා...'

'එහෙම ඔයාව මගේ කරගන්න මට බෑ අසංක....'

නුවරඑළියේ කඳුපුරා නැවරුණ මීදුම් පොකුරු උදෑසන හිරු නැගෙන විටදී විසිරී ගොස් තිබුණි. එහෙත් කඳුකරයෙන් සීතල පලා ගියේ නැත. පෙම්මය නම් වූ සමනල සිරය පුරා දෛවයේ මීදුම් පොකුරු පහව යනතුරු බලාසිටි මේ ආදරවන්තයන් දෙදෙනා දෙවියන් සදකාලිකව එක් කරයිද

'මාව අතාරින්න වෙයි මහත්තයෝ. ආයෙ අල්ලගන්න බැරි විදිහට මගෙන් ඔයාව අත් ඇරෙයි..'

වායා ඔහුගේ කම්බුල් වලට සීතල දේතම තබා කීවායා...

'මාව ඔයාගෙන් අත ඇරුණොත් ඒ මගේ මරණෙන් විතරයි. ඒත් මම ඔයාවම හොයාගෙන එනවා...'

'අසංක..'

ඔහු හෘදයාංගම ලෙස ඇයව තුරුලට ගත්තේය..

'වායා...බ...බා...'

'ඇයි.. අසංක....'

'අපි මේ මාසේ අන්තිමට බඳිනවා බබා...'

' මොකුත් කියන්න එපා.. අපි අද දවසම මෙහෙමම ඉමු..'

වාය මිමිණුවාය... අසංකගේ දෙතොලට වායාගේ දෙනෙත් කෙළවර තිබූ කඳුළු බිඳු වල ලුණු රස දැනුණි.

'මේක හඳක්... පුළුවන් නම් උඹේ අහසෙම තියා ගනින්..'

WWW.EXPRESSLANKA.TK 498

වරක් නාලක කියූ අයුරු ඔහුට සිහිවිය. මේ තමාගේ ළයට යටවී ඇත්තේ සඳක් නොව සඳ රාජිණියක් යැයි අසංකට සිතුණි. ඔහු ඒ උතුරාගිය ලොවිතුරු හැඟීමෙන්ම ඇගේ මුහුණට පාත් විය.

"ම..ම ඔයාට විතරයි මගේ මේ ලෝකේ ආදරේ..."

අසංක යංනමට හිස ඔසවා වායාගේ දෙනෙත් දෙස බලා කීවේය. ඇගේ මුව මත පවිත්‍ර යැයි... අතිශය පවිත්‍රයයි සිතිය හැකි සිනහවක් මතු විය...

**වායා 2**

**මෙයින් නිමාවූ වගයි...**

**වායාගේත් අසංකගේත් පෙම් කතාවේ**

**ආත්මගත සුවඳත් රැගෙන වායා -3 ළඟදීම පිටවෙනවා.. .**